විභූතිභූෂණ බන්දෝපාධ්‍යාය

අරණ්‍යකට පෙම් බැඳ

වංගබසින් සිංහලෙන් නැගුවේ

චින්තා ලක්ෂ්මි සිංහආරච්චි

Only From
SL-UNLIMITED.COM

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

අරණකට පෙම් බැඳ (පරිවර්තනයකි)

© චින්තා ලක්ෂ්මී සිංහආරච්චි
ප්‍රථම මුද්‍රණය - 1998

ISBN 955 - 96254 - 2 - X

පිටකවරය - සිසිර විජේතුංග

පරිගණක අකුරු සංයෝජනය
- ප්‍රඥ වර්ණ යෝජකයෝ
53 ඒ, තලවතුගොඩ පාර,
මිරිහාන - කෝට්ටේ.

මුද්‍රණය - පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්
37 ශ්‍රී සෝරත මාවත,
ගංගොඩවිල - නුගේගොඩ.

බෙදාහැරීම - දයාවංශ ජයකොඩි සහ සමාගම
101 සහ 112, ඇස් මහින්ද මාවත,
කොළඹ - 10.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

පරිවර්තනය ගැන.....

විභූතිභූෂණ බන්ද්‍යෝපාධ්‍යාය (1894-1950) ලියූ පොථේර පංචලී සහ අපරාජිතයෝ යන නවකතා මීට පෙර මාවතේ ගීතය, අපරාජිත ජීවිතයක් සහ අපූගේ ලෝකය යන නම්වලින් මා විසින් සිංහලයට නගන ලදී. ඒ නවකතාවල එන ප්‍රධාන චරිතය වූ අපූර්වද දැඩි සේ ස්වාභාවික පරිසරයට ඇළුම් කරයි. එම කෘතිවල පමණක් නොව මේ ලේඛකයාගේ හැම නවකතාවකම පාහේ ස්වාභාවික සෞන්දර්යය ගැන සඳහන් වේ. විශේෂයෙන් ඉඡාමතී, තෘෂ්ණාංකුර්, හේ අරණ්‍ය, කතා කම් (එම්බා වනාන්තරය! කතා කරනු.) යන නවකතාවලත් ආරණ්‍යක් නම් වූ පොතේත් පරිසර වර්ණනාවලට වැඩි අවධානයක් යොමු කර ඇත. 'අරණකට පෙම් බැඳ' නමින් කළ පරිවර්තනය ඉහත කී 'ආරණ්‍යක' නම් වංග පොතෙන් කරන ලද්දකි.

විභූතිභූෂණ තරම් අව්‍යාජ ලෙසත් චිත්තාකර්ෂණීය ලෙසත් ස්වාභාවික පරිසරය ගැන විස්තර කළ වෙනත් ලේඛකයකු නොමැති බව එරට විද්වත්හු පිළිගනිති. මේ ග්‍රන්ථය රචනා කර ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 1937 සිට 1939 දක්වා වූ කාල සීමාව තුළය. මෙයට පසුබිම් වී ඇත්තේ ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ භගල්පූර්හි පිහිටි වනගත වතුයායකි. මෙය බුදුන් වහන්සේ වැඩ සිටි බුද්ධගයාවට ආසන්න ප්‍රදේශයක් බව කිව යුතුය. මෙහි සඳහන් වන විවිධාකාර වරිත අතර වන රැජිනටද හිමි වන්නේ විශේෂ තැනකි. 'වනාන්තරය පසුබිම් කර ගත් නවකතාවක් කියවන්නට ලැබීම වංග පාඨකයාට අලුත් අත්දැකීමකි.' යනුවෙන් මේ පොත හඳුන්වා දෙන කතුවරයා පවසයි. මොහු මෙය රචනා කිරීමට වසර කීපයකට පෙර භගල්පූර්හි වනගත වතුයායක වසර හයක් උප කළමනාකරුවකු ලෙස සේවය කළේය. ඒ අත්දැකීම් 'ආරණ්‍යක' මෙන්ම තවත් නවකතා කීපයකට උපයෝගී කර ගන්නා ලදී. මේ නවකතාව පොතක් වශයෙන් පළවීමට පෙර 'ප්‍රවාසී' නම් මාසික සඟරාවේ කොටස් වශයෙන් පළ විය. 'ආරණ්‍යක්' ග්‍රන්ථයේ දහවෙනි සංස්කරණයට පෙර වදනක් සපයන තාරාදාස් බන්ද්‍යෝපාධ්‍යාය මෙය හඳුන් වන්නේ ශාන්ත පරිසරයකදී ඇසෙන විලම්බ ලයකින් වාදනය වන, වස්දඬුවක මිහිරි ස්වර මාලාවක් ලෙසය.

සුන්දර ස්වාභාවික පරිසරය ටිකින් ටික විනාශ වී යද්දී අලුතින් ඉදිවන කොන්ක්‍රීට් වනාන්තරය අතර ජීවත්වීමට සිදුවන මිනිසාට

මෙවැන්නක් කියවීමට ලැබීම භාග්‍යයක් වනු ඇත. සිංහල පාඨකයාටද මෙවැනි කෘතිවලින් නැවුම් අත්දැකීමක් ලැබෙනු ඇත. මුල් පොතේ අඩංගු වෘක්ෂ ලතාදිය සහ සතුන්ගේ විස්තර ඇතුළත් උපග්‍රන්ථයක් මේ පොතට එක් කිරීමේ අදහසක් මා තුළ පැවතිණි. බොහෝ වෑයම් කළත් ඒ සඳහා අවශ්‍ය තොරතුරු සියල්ල එක් රැස් කර ගැනීමට මට නොහැකි වූයේ අප රටේ මෙවැනි දේ කිරීමට ප්‍රමාණත් පහසුකම් නැති නිසාය.

මෙහි අඩංගුවන්නේ ස්වාභාවික සුන්දරත්වය ගැන පමණක් නොවේ. එවැනි වනගත පරිසරයක ජීවත්වන අන්ත දිළිඳු ජනයාගේ ජීවිත දෙස හෙලන සානුකම්පිත දෘෂ්ටියක්ද මෙහි වෙයි. මෙවැනි පොත් විශ්ව සාහිත්‍යයේ වුවද සුලභ නැත. මෙය වංග සාහිත්‍යයෙන් සිංහල පාඨකයාට ලැබෙන විශේෂිත වූ කෘතියක් ලෙස සලකමි.

ස්තුතිය

මෙවැනි පරිවර්තන කිරීමට මට හැකි වනු පිණිස වංග බස ඉගෙනීමට පොතපත හා උපදෙස් සැපයූ පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ඩබ්.එම්.ගුණතිලක මහතාට පළමුවෙන් මගේ ස්තුතිය පිරිනමමි. ඉක්මනින් මේ පොත මුද්‍රණය කර ප්‍රකාශයට හාර දීමේ වගකීම භාරගත් කොළඹ විශ්ව විද්‍යාලයේ සරත් විජේසූරිය මහතාටද දයාවංශ ජයකොඩි සමාගමටද නිතර මෙවැනි පරිවර්තන ගැන විමසමින් අදහස් දක්වන ලේඛක කමල් පෙරේරා මහතාටද මේ නවකතාවේ එන සමහර සංස්කෘත පාඨවල අදහස් ලියා එවූ ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ මහතාටද මගේ ස්තුතිය හිමි වේ.

අත් පිටපත ටයිප් කිරීමේ සිට අනිකුත් සියලුම කටයුතුවලදී මට සහාය වන මගේ සැමියා වන හේමපාලටද, මා කරන පරිවර්තනවල එන කථා පළමුවෙන් ඇසීමට උත්සුක වන මගේ දුතාවන බුද්ධික ඉන්දීවරටද, සෝදුපත් බැලීමේදී සහාය වූ මගේ සොහොයුරා වන සාගරටද මගේ ස්තුතිය හිමිවේ. වංග සාහිත්‍ය කතාවල පරිවර්තන කියවා ඒ ගැන උනන්දු වී අදහස් දක්වා නිතර මා දිරිමත් කරන පාඨකයින්ටද මා ස්තුතිවන්න වන බව කිය යුතුය.

චින්තා ලක්ෂ්මී සිංහ ආරච්චි

අංක 77,
හීරැස්සගල පාර
මහනුවර.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

පිටිසුම

දවස පුරාම කාර්‍යාලයේ වැඩ කර වෙහෙස වූ මම නගරයේ බලකොටුව ළඟ ඇති පිට්ටනිය අයිනේ හිඳ ගතිමි.

මා අසල කොට්ටම්බා ගසක් විය. බලකොටුව වටා වූ දිය අගල දෙස මඳ වේලාවක් බලා සිටියෙමි. මට හැගුණේ මා ලොබ්ටූලියාවේ පිහිටි සරස්වතී වැව අසල හිඳගෙන සිටින බවකි. ඊළඟ මොහොතේ පාරේ ගමන් කළ මෝටර් රථයක නළා හඬක් ඇසී මගේ සිහිනය බිඳී ගියේය.

ඒ වනගත පෙදෙස අත හැර කල්කටා නගරයට පැමිණ බොහෝ කලක් ගතවී ඇතත් අද ඊයේ දෙයක් මෙන් එහි ගත කළ දිවිය ගැන මට මතක තිබේ.

දිනපතා කල්කටා නගරයේ කළබැගෑනිය මැද ගිලී සිටියදී මට වරින් වර ලොබ්ටූලියා බයිහාරය නැතහොත් ආජමාබාද්හි පිහිටි වනගත භූමි භාගය ගැන සිහිපත් වේ. එහි සඳ එළියද, තිමිරයෙන් වැසුණු නිහඬ රාත්‍රියද, ඉළුක් හා මානා පඳුරුවලින් ගහනවූ මිටියාවතද, කෂිතිජය දක්වා විහිදී ගිය අඳුරු පැහැ ගත් පර්වත පේළියද, මධ්‍යම රාත්‍රියේ වනය මැදින් දුවන ගෝනුන්ගේ පා හඬද, මධ්‍යාහ්නයේදී පිපාසිතව සරස්වතී වැව අසලට එන කුළු මී හරකුන්ද, ශිලා ඛණ්ඩයන්ගෙන් ගහන වූ මිටියාවතේ පිපුණු වණ්ණ වත් වන මල්ද, සුපිපි රක්ත වණ්ණ මලින් පිරුණු කැල වනයද සිහිවන විට මට හැගෙන්නේ ඒවා සත්‍ය ලෝකයේදී හමුවූ දේ නොවන බවත් මා නින්දේ සිටියදී සෞන්දර්‍යයෙන් පිරුණු පෘථිවියක සිහිනයක් දකිමින් සිටි බවත්ය.

වනාන්තරය පමණක් නොව එහිදී විවිධාකාර මිනිසුන් ද මට හමුවිය.

කුන්තා- මට එහිදී හමුවූ මුස්ලිම් යුවතිය ගැන සිහිවේ. ඒ දිළිඳු ගැහැනිය බයිහාරයේ මසංගස් කැලයේ ඇයගේ දරුවන් සමග ඇවිදිමින් දරුවන්ගේ කුස පිරවීමට මසං ගෙඩි කඩන අයුරු තවමත් මට මැවී පෙනේ.

මා පිහානේ ඉතිරි කළ බත් ගෙන යාමට පැමිණි ඇය කායිා ාලයේ මිදුලේ කොනක සඳ පහන් රැයේ දැඩි සීතල නොතකා ළිඳ අසල බලා සිටියි.

මට ධාතුරියා ගැන සිහි වෙයි. නැටුම් පෙන්වන ළමයෙකු වූ ධාතුරියා.....

දකුණු පළාතේ ධරම්පුරයේ අස්වනු විනාශ වී ගිය විට ධාතුරියා නටා, ගීත ගයා කෑමට යමක් සොයා ගැනීමට ලොබ්ටූලියාවේ මිනිසුන් අඩු පළාතේ ගම්වලට පැමිණෙයි.

බදින ලද චීන තණ හාල් ටිකක්, උක් පැණි සමග කෑමට ලැබී ඔහුගේ මුහුණේ මතුවූ සතුටු සිනාව මට සිහි වේ. පොකුටු හිස කෙස්ද, ලොකු දෑසක්ද, ගැහැනු ළමයෙකුගේ මෙන් වූ ලාවණ්‍යමය සිරුරක්ද ඇතිව සිටි ඔහු වයස අවුරුදු දහතුනක් පමණ වූ ළමයෙක් විය. ඔහුගේ මා පියන් නැත. කාත් කවුරුවත් නැති දරුවකු නිසා ඔහුට ළමා වයසේදීම තමාගේ දිවි රැක ගැනීම සඳහා මුදල් ඉපයීමට සිදුවිය. සමාජයේ සැඩ පහරකට අසුවී කොතැනකට පාවී යන්නට ඔහුට සිදුවීද?

අහිංසක ධනවතෙකු වූ ධාවතාල් සාහු ගැන මට සිහිවෙයි. මගේ පිදුරු බංගලාවේ කොනක හිඳ ඔහු ගිරයෙන් පුවක් කපමින් සිටියි. සන වනාන්තරයේ කුඩා පැලක් තනාගෙන සිටි දිළිඳු බ්‍රාහ්මණයෙකු වූ රාජු පාංඩේ මී හරකුන් දෙතුන් දෙනෙකු තණ කෑමට යවා ගී ගයමින් සිටියි.

මහාලිබාරුප කන්ද පාමුල පිහිටි වනගත මිටියාවතට වසන්තය පැමිණෙයි. ලොබ්ටූලියා බයිහාරයේ සෑම තැනම කහ පැහැති ගොල්ගෝලි මල් සැණකෙළි පවත්වයි. දහවල හිරු රැස් වැටුණු පරිසරයේ ඇතිවන වැලි කුණාටු නිසා ඈත දිගන්තය අපැහැදිළිව පෙනේ. ඈත පිහිටි මහාලිබාරුප කන්දේ සල් වනයට ගිනි ඇවිලී ඇති අයුරු රාත්‍රියට දිස්වේ.

ඉතා දිළිඳු දරු දැරියන්, ගැහැනුන් හා මිනිසුන්, නොහික්මුණු ධනපතීන්, ගායකයින්, කම්කරුවන්, සිහන්නන්, ආදී විවිධාකාර වූ මිනිසුන්ගේ නුහුරු වූ ජීවන රටා මට දැක ගැනීමට හැකි විය. මිටියාවතේ පිදුරු බංගලාවේ රාත්‍රියට හිඳගෙන දඩයක්කාරයින්ගේ පුදුම උපදවන අත්දැකීම් ගැන ඇසුවෙමි. මධ්‍යම රාත්‍රියේදී මෝහන පූරා රක්ෂිත වනයේ වන මීමුන් දඩයම් කිරීමට ගොස් ඔවුන් සකස් කළ බොරු වල අසල සිටගෙන සිටි කුළු මීමුන්ගේ දේවතාවා ගැන ඇසුවෙමි.

මා සැරසෙන්නේ ඔවුන් ගැන කීමටයි. නූතන ශිෂ්ටාචාරයට හසුවූ මිනිසුන්ගෙන් විරල වූ පෙදෙසකදී හඳුනාගත් විවිධාකාර ජීවන රටාවලට හුරුවූ මිනිසුන් ගැන මට අමතක කළ නොහැක.

එනමුත් ඒ මතකය මට ගෙන එන්නේ සතුටක් නොව දුකකි. ඒ නිදහස් ස්වාභාවික සෞන්දර්යයෙන් යුතු වූ පරිසරය මගේ දායකත්වය ඇතිව විනාශ වී ගියේය. වනයේ දෙවි දේවතාවුන් මට ඒ ගැන කිසි දිනක සමාවක් නොදෙනු ඇත. මා කළ වරද ගැන කිසිවෙකුට පැවසුවොත් සිතේ බර සැහැල්ලු වනු ඇත.

ඒ නිසා මම ඔබට මේ කතාව කියමි.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community
SLUNLIMITED.COM

SL UNLIMITED
The spirit of Sri Lankan e-community



විභූතිභූෂණ බන්දෝපාධ්‍යාය
(1894 - 1950)

01

මෙයින් වසර පහළොවකට පමණ පෙර මම උපාධි පරීක්ෂණයෙන් සමත් වී රැකියාවක් සොයමින් කල්කටාවේ නැවති සිටියෙමි. රැකියා බලාපොරොත්තුවෙන් කොපමණ ඇවිද්දත් එයින් ලැබුණු ප්‍රතිඵලයක් නැත.

එදින සරස්වතී දේවිය පුදන දිනය විය. මා නැවතී සිටි නවාතැනට සෑහෙන කලකින් මුදල් ගෙවීමටද නොහැකි විය. මා එතැනින් එළියට ඇද දමන තත්වයක නොසිටියත් මුදල් ගැන නැවත නැවත මතක් කළ නවාතැන් පාලකයා ඒ වන විට නොසන්සුන් වී සිටි බව නම් කිව හැකිය. අපේ නවාතැනේද සරස්වතී රූපයක් සාදා පූජාවක් පවත්වන ලදී. එදින උදෑසන මට සිතුණේ පුරුදු පරිදි රැකියා සොයමින් නොගොස් තැනින් තැන ඇති දේව රූප හා උත්සව නරඹමින් කාලය ගත කිරීමටය.

මේ වේලාවේ නවාතැනේ අතවැසියා වන ජගන්නාථ පැමිණ මගේ අතට ලියුමක් දුන්නේය. එය මුදල් ගැන මතක් කර නවාතැන් පාලකයා එවූ ලිපියක් බව දුටුවෙමි. එදින විශේෂ දිනයක් වන බැවින් ජයටම කෑම පිළියෙළ වන බවත්, මාස දෙකක හිඟ මුදල් ගෙවීමට ඇති බැවින් අඩු ගණනේ රුපියල් දහයක්වක් ගෙවිය යුතු බවත්, එහි සඳහන් විය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඊළඟ දවසේ සිට මට වෙනත් තැනක් සොයා ගැනීමට සිදුවන බවත් තව දුරටත් එහි සඳහන් විය.

ඔහුගේ ප්‍රකාශයේ කිසිදු වරදක් නැතත් ඒ වන විට මා සන්තකව තිබුණේ රුපියල් දෙකකුත් මාරු කාසි කීපයකුත් පමණි. මම ලිපියට පිළිතුරක් නොයවා නවාතැනින් පිටවූයෙමි. සරසවි පිදුම සඳහා තැන් තැන්වල සංගීත භාණ්ඩ වැයෙන හඬත්, ගීත ගැයෙන හඬත්, මට ඇසිණ. පටු මග කෙළවර ළමයි පිරිසක් කෑකෝ ගසමින් සිටියහ. අහයගේ රස කැවිලි කඩයේ නොයෙක් ආකාරයෙන් සැරසූ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

කැම දිසි පාරට පෙනෙන්නට තබා තිබිණ. මම විද්‍යාලයේ ගේට්ටුව අසලට ගොස් පාර අයිනේ හිඳගෙන මිනිසුන් පූජා හාණ්ඩ සහ මල් මාලා මිලදී ගනිමින් සැරි සරන දෙස බලා සිටියෙමි.

මට සිතුණේ ඉබාගාතේ යන්නටය. ජොරසංකෝ පාසලේ ඉගැන්වීමේ රැකියාව අතහැර දැමූ පසු රැකියාවක් සොයා ගැනීමට මා නොගත් උත්සාහයක් නැත. වෙළඳ කාර්‍යාල, පුවත් පත් ආයතන, පාසල්, ධනවතුන්ගේ නිවාස යනාදී තැන්වල ඇවිද්දෙමි. එක් තැනකට එක් වරක් නොව දස වරක් පමණ පයින් ගැටුවෙමි. හැම තැනකින්ම ලැබුණේ එකම අන්දමේ පිළිතුරකි. 'ඇබෑර්තු නැත'

මීට පෙර මා නැවතී සිටි 'හින්දු හොස්ටල' නම් නවාතැනේදී හමුවූ සතිශ් නම් මිතුරකු මට අහම්බෙන් මුණ ගැසුණි. දැන් ඔහු ආලිපුරයේ නීතිඥයෙකි. ඔහුගේ ජීවිතයේ ඒ වන විටද නව රැකියාව නිසා එතරම් වෙනසක් සිදුවී ඇති බවක් පෙනෙන්නට තිබුණේ නැත. දැනට ඔහුගේ ජීවිතයට පහුරක් වී ඇත්තේ ළමයින්ට උපකාරක පන්ති පැවැත්වීමයි. ජීවන සාගරයේ ගිලෙන්නට යන මට තම් එවැනි පහුරක් තබා බිඳුණු කුඹ ගසක කැබැල්ලක් වත් නැත. මා සිටියේ දියේ ගිලෙන්නට යන මිනිසෙක් උඩ එමින් යළි යට යමින් සිටින තත්වයකය. සතිශ් දුටු විට මට සියල්ල අමතක විය.

"ආ සත්‍යවරණ! කොහේ ද මේ යන්නේ? අපි යමුද හින්දු හොස්ටල් එකේ දේව රූප බලන්න. අපේ පරණ නවාතැනනේ. හවසට භජන් ගීත සංදර්ශනයකුත් තියෙනවා. ඒකටත් යමු. කොලේජ් එකේ හිටපු අවිනාශ් මතක ද? අර පෝසත් ඉඩම් හිමියකුගේ පුතෙක් හිටියේ. දැන් හොඳ ගායකයෙක්. එයා අද භජන් ගීත කියනවා. මටත් ආරාධනා පත්‍රයක් එවලයි තියෙන්නේ. මං ඉඳලා හිටලා ඒගොල්ලන්ගේ එස්ටේට් එකේ වැඩත් කරනවානේ. ඔයාව දැක්කොත් සතුටු වෙයි."

වසර පහකට හයකට පමණ පෙර විද්‍යාලයේ ඉගෙන ගන්නා විට ද විනෝද වීමට අවස්ථාවක් ලැබුණොත් සියල්ල අමතක වන ගතියක් මා තුළ විය. මේ වන විටත් එම ගතිය මගෙන් ඉවත් වී නොතිබුණි. හින්දු හොස්ටල් එකේ දේව රූප බැලීමට ගිය විට මට දවල් කෑමට ආරාධනයක් ද ලැබිණ. අපේ ගම් පළාතේ සිට ආ ශිෂ්‍යයෝ ගණනාවක් එහි වූහ. ආරාධනය ඔවුන්ගෙනි.

"මං නවාතැනට ගිහින් කෑම කාලා හවස සංගීත සංදර්ශනය බලන්න එන්නම්."

මෙසේ කීවත් ඔවුහු එයට කන් නොදී මට නවතින්නට යැයි පෙරැත්ත කළහ. ඔවුන් මගේ කීමට කන් දුන්නා නම් මට ඒ හොඳ දවසේ ද උපවාසයෙන් ගත කිරීමට සිදු වනු ඇත. මැනේජර් එවැනි කර්කශ ලිපියක් එවීමෙන් පසුව ද රුපියලක් වත් නොදී නවාතැනිත් දෙන රස බෝජන අනුභව කළ නොහැක.'ඒකත් හොඳට ගියා' යැයි කියමින් එතැනින් බඩ කට පුරා කෑම කෑ මම ගීත ඇසීම සඳහා පිටත්ව ගියෙමි.

නැවත වරක් ශිෂ්‍ය ජීවිතයේ උද්දාමය මා වෙත පෙරළා පැමිණියේය. මෙවැනි වේලාවට, රැකියාවක් ලැබේද නොලැබේද යන්න ගැන හෝ මැනේජර්ගේ මුහුණ කොරහක් වී ඇද්ද, නැද්ද යන්න ගැන හෝ මතක් වන්නේ කාටද? නවාතැනට මුදල් ගෙවීමට නොහැකි වුවහොත් ඊළඟ දිනයේ සිට සුළං බොන්නට සිදු වන බව සංගීත සාගරයේ කිමිදෙද්දී මට අමතක විය. ධූම්රි සහ භජන් ගීවලින් සමන්විත සන්දර්ශනය අවසන් වන විට රාත්‍රී එකොළහ පමණ විය. මට අවිනාශ් සමග කථා කිරීමට ඉඩ ලැබිණ. 'හින්දු හොස්ටල් එකේ සිටි කාලයේ අප දෙදෙනා විවාද සංගමයක සාමාජිකයෝ වීමු. වරක් සර් ගුරුදාස් බන්දෝපාධ්‍යාය මූලාසනයේ සිටිය දී අපි විවාදයක් පැවැත් වීමු. මාතෘකාව වූයේ 'පාසල්වල අනිවාර්‍ය විෂයයක් ලෙස ආගම ධර්මය ඉගැන්වීම උචිතය' යන්නය. අවිනාශ් යෝජක පිලේ සිටි අතර මම ප්‍රතියෝජක පිලේ වීමි. දෙපැත්තේ ම තර්ක විතර්කවලින් පසු අපේ පිලට ජය අත් විය. එදා පටන් අවිනාශ් සමග දැඩි මිත්‍රතාවක් ඇති කර ගැනීමට මට හැකි විය. විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය හමාර කළ පසු මට ඔහු හමු වූ පළමු වතාව මෙය විය.

"මගේ වාහනේ තියෙනවා. මං ඔයාව ඉන්න තැනට ඇරලන්නම්. සත්‍යා කොහේද ඉන්නේ?"

ඔහු මා නවාතැනේ දොර අසලටම වාහනයෙන් ගෙනවිත් ඇරලීය.

"හෙට හැරිංටන් ස්ට්‍රීට් එකේ අපේ ගෙදරට හවස හතරේ තේ වේලාවට එන්න. අමතක කරන්න එපා. නොම්මරේ තිස් තුනයි- දෙක. ලියලා තියා ගන්න නෝට් බුක් එකේ."

පසු දින හැරිංටන් විදිය සොයා ගියෙමි. ඉන් පසු මිතුරාගේ නිවසත් සොයා ගතිමි. නිවාස විශාල නොවූවත් එහි මිදුලත්, පිටුපසත් උද්‍යානයක් ලෙස සකසා තිබිණ. ගේට්ටුවේ වික්ටෝරියා

මල් වැලක් විය. දොරටුපල්ලා නේපාල ජාතිකයෙකි. පිටත පිත්තල නාම පුවරුවක් විය. නිවසට යන පාර රතු ගලින් බැඳ තිබිණ. පාරේ එක් පසෙක හරිත වණ්ණයෙන් යුතු වූ තණකොළ වවා තිබිණ. අනික් පැත්තේ සේපාලිකා ගසක් සහ අඹ ගසක් විය. ගේ ඉදිරි පිට ලොකු මෝටර් රථයක් නවතා තිබිණ. එය ධනපතියෙකුගේ නිවසක් යයි නොසිතන්නට නම් කිසිදු ඉඩක් නොවී ය. පසි පෙළ දිගේ ඉහළට නැග්ග විට විසිත්ත කාමරය හමු විය. අවිනාශ් මා සාදරයෙන් පිළිගත්තේ ය. පසු ගිය දිනවල මතකය අවදි කරමින් අප දෙදෙනා කථා බහ කළෙමු. අවිනාශ්ගේ පියා, මයිමන්සිංහ, සමින්දාර්වරයෙකු විය. ඔහුගේ පවුලේ අනිත් අය නිවසේ නො සිටියහ. අවිනාශ්ගේ සොහොයුරියගේ විවාහය සඳහා පසුගිය උඳුවප් මාසයේ ගමට ගිය ඔවුහු තවමත් පෙරලා පැමිණ නැත.

අවිනාශ් මා සමග නොයෙක් දේ කථා කළේය.

"දැන් මොකද සත්‍යා කරන්නේ?"

ටික වේලාවකට පසු ඔහු විමසීය

"කලින් ජොරසංකෝවල ඉස්කෝලෙක ඉගැන්නුවා. දැනට මොකුත් කරන්නේ නෑ. ආයිත් උගන්වන්න නම් යන්නේ නෑ කියලයි හිතාගෙන ඉන්නේ. වෙන රක්ෂාවක් කරන්න කියලා උත්සාහ කරනවා. බලාපොරොත්තු තියා ගන්න පුළුවන් තැන් දෙක තුනක් තියෙනවා."

රැකියා ගැන බලාපොරොත්තු තැබීමට හැකි තැන් ඇතැයි යනුවෙන් මා කීවේ අසත්‍යයකි. අවිනාශ් ධනපතියෙකුගේ පුතෙකි. ඔවුන්ට ලොකු වතු යායක් ඇත. ඔහුගෙන් රැකියාවක් ඉල්ලීමට ඇති උවමනාව සැහවීමට මම එසේ කීවෙමි.

අවිනාශ් ටික වේලාවක් කල්පනා කළේය.

"සත්‍යා වගේ දක්ෂ කෙනෙකුට රක්ෂාවක් හොයා ගන්න අමාරු වෙන එකක් නම් නෑ.

මං වැඩක් කියන්න ද ? ඔයා නීතියත් ඉගෙන ගත්තා නේද?"

"නීතිය නම් කළා. ඒ වුනාට නීතිඥයෙක් වෙන්න මං කැමති නෑ"

"අපට අයිති කැලෑ බද එස්ටේට් එකක් තියෙනවා පූර්ණියා දිස්ත්‍රික්කයේ. ඒක අක්කර දහ දාහක් විතර ඉඩමක්. එහෙ වතු පාලකයෙක් නම් ඉන්නවා. ඒ වුනාට එයා ගැන විශ්වාසය තියලා

එච්චර ලොකු ඉඩමක් බාර දෙන්න බෑ. අපි සුදුසු කෙනෙක් හොය හොයා හිටියේ. එහේ යන්න කැමතිද?"

සමහර වේලාවට මිනිසාට තමාගේ කන් අදහා ගැනීමට බැරි අවස්ථා ද ඇතිවේ. අවිනාශ් කීවේ කුමක් ද? රැකියාවක් සොයා කල්කටාවේ අවුරුද්දක් පුරා ඇවිද්ද මට තේ බීමට ආරාධනය කොට මගේ ඉල්ලීමක් නොමැතිව රැකියාවක් ලබා දෙන බව ඔහු කියයි.

එසේ වුවත් ආත්ම ගෞරවය රැක ගත යුතුය. ඉතා අපහසුවෙන් මගේ හිතේ ස්වභාවය සහවාගෙන උදාසීන බවක් පෙන්වා කථා කළෙමි.

"ආ හොඳයි මං හිතලා බලන්නම්කෝ. හෙට අවිනාශ් ඉන්නවද?

අවිනාශ් විවෘත හදවතකින් යුතු වූ කෙනෙකි.

"හිතලා බලන එක පැත්තකින් තියන්න. මං නාත්තට අදම ලියලා යවනවා. මං විශ්වාසවන්ත කෙනෙක් හොයාගත්ත කියලා. අනික් සමින්දාර්ලා ළඟ වැඩ කරලා කට්ට වෙච්ච සේවකයෝ අපට වුවමනා නෑ. ඒ ගොල්ලෝ වැඩි දෙනෙක් හොරු. ඔයා වගේ උගත් බුද්ධිමත් කෙනෙක් තමයි එහාට යවන්න ඕනෑ. කැලෑ එස්ටේට් එකට අපි අලුතින් මිනිස්සු ගෙනිහින් පදිංචි කරවන්නයි ඉන්නේ. අක්කර දහ දාහක් විතර තියෙනවනේ. එච්චර වග කිවයුතු වැඩක් නිකං ආවාට ගියාට කෙනෙකුට පවරන්න බෑ. මං සත්‍යාව අඳුන ගත්තේ අද ඊයේ නෙවෙයි නේ. මම සත්‍යා ගැන හොඳට දන්නවා. මේකට කැමති වෙන්න. මං දැන්මම තාත්තට ලියලා ඇපොයින්මන්ට් ලෙටර් එක ගෙන්නල දෙන්නම්."

* * * * * *

රැකියාව ලැබුණු අන්දම ගැන වැඩි විස්තර කියන්නට අවශ්‍ය නැත. කෙටියෙන් කිව හොත් අවිනාශ්ගේ නිවසේ තේ බීමට ආරාධනා ලැබී ගිය දිනට සති දෙකකට පසු මම මගේ බඩු බාහිරාදියත් රැගෙන බී.එන්. ඩබ්ලිව්. සමාගමේ දුම්රියකින් සැහෙන දුරක් ගමන් කර කුඩා දුම්රිය පොළකින් බැස ගත්තෙමි.

එදින ශීත සන්ධ්‍යාවක් විය. දුර ඈත දක්වා විහිදී ගිය තණ බිමේ අඳුරු සෙවණැලි වැටී තිබිණ. ඈත වන තීරයට ඉහළින් මීදුමක් පැතිරිණ. රේල් පාර දෙපැත්තේ ම ධාන්‍ය කෙත් විය. සිහිල් සැඳෑ සුළඟේ රැඳුණු ධාන්‍ය කෙත්වලින් එන නැවුම් සුවඳ විඳිද්දී මගේ සිතට

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ඇතුළු වුයේ මා ආරම්භ කිරීමට යන ජීවිතය ඉතා පාළු එකක් විය හැකිය යන සිතිවිල්ලයි. ඒ සීත සන්ධ්‍යාව යම් පමණක් පාළු ගතියක් දරයි ද, ඉදිරියෙන් දිස්වන මිටියාවත යම් පමණ පාළු ගතියක් දරයි ද, එපමණ ම පාළු ගතියකින් යුතුව මට ඉදිරි කාලය ගෙවීමට සිදුවනු ඇත.

එදින ගොන් කරත්තයක නැගී මුළු රාත්‍රිය පුරාම සැතපුම් තිහක් පමණ ගමන් කෙළෙමි. කල්කටාවෙන් මා ගෙන ආ කම්බිලි ආදිය බෑගයක් තුළ විය. දැඩි සීතල නිසා ඒවායින් දිය බේරෙන්නා සේ මට දැනිණ. මේ පළාතේ මෙවැනි දැඩි සීතලක් ඇතැයි සිතුවේ කවුරුද? පසු දිනට එළි වූ පසුද ගමන අවසන් වුයේ නැත. අවට පරිසර දර්ශනය ඒ වන විට වෙනස් වී ඇති බව මම දුටුවෙමි. පෙර මෙන් කුඹුරු දකින්නට ලැබුණේ නැත. මිනිසුන්ගේ වාසස්ථානද දකින්නට නොතිබිණ. ඒ ප්‍රදේශයේ ලොකු කුඩා වනරොදවල් සහ තැනින් තැන වූ නිදහස් තණ බිම් මිස වගා බිම් දකින්නට නොලැබිණ.

වතු කායර්‍යාලයට ළඟාවන විට වේලාව පෙරවරු දහය පමණ විය. වනය මැද අක්කර හතරක පහක භූමි භාගයක් එළි පෙහෙළි කොට පිදුරු කුටි කිපයක් තනා තිබිණ. ඒවා වනයෙන් ම ලබා ගත් ලී දඬු බට පතුරු ආදිය උපයෝගී කර ගෙන කටු මැටියෙන් තැනූ ඒවා බව පෙනිණි. මෑතකදී තැනූ ඒ නිවාසවලට ඇතුළු වනවිට අලුත කැපූ පිදුරු, අමු තණකොළ, සහ අමු උණ පතුරු ආදියෙහි ගඳ දැනෙයි. ප්‍රශ්න කළ විට දැනගන්නට ලැබුණේ කලින් වෙන තැනක තනා තිබුණු කායර්‍යාලය ජලය හිඟ කම නිසා ළඟදී එතැනට ගෙන ආ බවයි. අසල දොළ පාරක් තිබුණු නිසා පසුව ආ තැන ජලයෙන් අපහසුවක් නොවිය.

* * * * * *

මා ජීවිතයේ වැඩි කාලයක් ගෙවිවේ කල්කටාවේය. යහළු මිත්‍රාදීන් ඇසුරු කරමින් පුස්තකාල පරිහරණය කරමින්, චිත්‍රපට, නාට්‍ය ආදිය බලමින් පිරිසක් සමග එකතුවී ගී ගයමින් ගත කළ ජීවිතයට වඩා වෙනස් ජීවිතයක් ගැන මට සිතීමට වත් නොහැකි විය. එසේ තිබිය දී රුපියල් ගණනක වේතනයක් නිසා මා ඇවිත් වැටුණු ස්ථානය මෙතරම් පාළු එකක් වේ යැයි මා කිසි දිනක සිතුවේ නැත. දින ගෙවී යයි. ඇත වන ගැබෙන් කඳු මතින් පෙර දිග අහසේ හිරු

උදාවනු පෙනේ. නැවත සවස් භාගයේ තුරු හිස් රතු පැහැයෙන් සිතුවම් කරමින් හිරු බැස යනු පෙනේ. සීත කාලයේ දී පැය එකොළහක් පවතින හිස් දිවා භාගයන් කෙසේ ගෙවන්න ද යන්න මුල් දිනවල මට තිබුණු ලොකුම ගැටළුව විය. වැඩපල වල නිරත වීමෙන් කල් ගෙවා ගත හැකි වුවත් මා ඒ පළාතට ආගන්තුකයකු වූ නිසාත් ඒ පළාතේ මිනිසුන් කථා කරන ප්‍රාදේශීය භාෂාව මට ඒ වන විටත් තේරුම් ගැනීමට නොහැකි වූ නිසාත් වැඩ කටයුතු හරි හැටි සංවිධානය කරගත නොහැකි විය. මා කෙසේ හෝ කාලය ගෙවා ගත්තේ කල්කටාවෙන් ගෙන ආ පොත් කීපය කියවීමෙනි. කායර්‍යාලයේ සේවක හටයෝ නූගත් අය වූහ. ඔවුන්ට මා කියන දේ වත්, මට ඔවුන් කියන දේ වත් තේරුම් ගත නොහැකි විය. මුල් දින දහය කෙතරම් අපහසුවෙන් ගෙවී ගියා ද? මට කීප වරක් ම සිතුණේ මේ රැකියාවෙන් පලක් නැත කියායය. මෙහි පාළුවේ හිඳ නහිනවාට වඩා වේලක් ඇර වේලක් කා කල්කටාවේ ජීවත් වෙන එක හොඳ යැයි මට සිතුණි. අවිනාශ්ගේ ඉල්ලීම නිසා මෙවැනි පාළු කැලයකට පැමිණි මා කෙතරම් ලොකු මෝඩ කමක් කර ගත්තාද? මෙවැනි ජීවිතයක් මා වැන්නෙකුට කිසිසේත් නොගැලපේ.

එදින රාත්‍රියේ මගේ කාමරයේ හිඳගෙන මෙවැනි දේ සිතමින් සිටින විට කායර්‍යාලයේ මහලු ලිපිකරුවා වන ගෝෂ්ඨ චක්‍රවර්ති දොර ඇරගෙන ඇතුළු විය. මෙහි බෙංගාලි බසින් කථා කළ හැකි එකම තැනැත්තා මොහුය. ගෝෂ්ඨ බාබු අඩු ගණනේ අවුරුදු දහ අටක් වත් මේ ස්ථානයේ සිටින්නට ඇත. වර්ධමාන දිස්ත්‍රික්කයේ වනපාශ් දුම්රිය පොළ අසල කිසියම් ගමක. ඔහුගේ නිවස පිහිටියේය.

"ඉදගන්න ගෝෂ්ඨ බාබු" මම කීවෙමි.

ගෝෂ්ඨ බාබු මා පෙන්වූ පුටුවේ නොව වෙනත් පුටුවක වාඩි විය.

"මං තමුන්නාන්සේට කාරණයක් කියන්නයි ආවේ. මෙහේ ඉන්න කිසිම මිනිහෙක් විශ්වාස කරන්න එපා. මේ බෙංගාල දේසේ නොවෙයි. මෙහෙ මිනිස්සු හරි නරකයි."

"බෙංගාල දේසේ මිනිස්සු ඔක්කොම හොඳටම හොඳයි කියලත් කියන්න බෑනේ ගෝෂ්ඨ බාබු"

"ඒක මං දන්නේ නැද්ද මැනේජර් මහත්තයෝ? මං ඉස්සෙල්ලම මෙහෙ ආවේ මැලේරියාවෙන් බේරෙන්න. මෙහෙ ආපු දවස්වල හුහක්

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

කරදර වුණා. මේ කැලේ මැද්දේ ඉඳිල්ල කොහොමට වත් හිතට ඇල්ලුවේ නෑ. දැන් ගෙදර ගිහින් ඉන්නවා තියා පූර්ණියාවලට හරි පැටිනාවලට හරි වැඩකට ගියත් දවස් දෙකකට වඩා ඉන්න හිතෙන්නේ නෑ."

මම ගෝෂ්ඨ බාබුගේ මුහුණ දෙස උපහාසයෙන් යුතුව බැලුවෙමි.

"මොකක්ද කිව්වේ? ඇයි පිට ගිහින් ඉන්න බැරි? කැලෑව ගැන සාංකාවක් ඇති වෙනව ද?"

ගෝෂ්ඨ බාබු මා දෙස බලා මඳක් සිනාසුණේය.

"ඇත්තටම ඒක තමයි හේතුව මැනේජර් මහත්තයා. මහත්තයාටත් පස්සේ තේරෙයි. කල්කටාවේ ඉඳලා ළඟදි තේ ආවේ. මහත්තයාගේ වයසත් අඩුයි. කල්කටාව ගැන හිත නොසන්සුන් වෙන එක අහන්න දෙයක් නෑ. ඒ වුනාට ටික දවසක් මෙහෙ ඉඳලා බලන්නකෝ."

"මොනව බලන්න ද?"

"කැලෑව තමුන්නාන්සෙව වසහ කර ගනියි. ඊට පස්සේ කිසිම කලබලයක්වත් යෙනහක් ඉන්න තැනක්වත් හිතට අල්ලන එකක් නෑ. මට ඒ දේ වුණා මහත්තයා. මං ගිය මාසේ මුංගේර් වලට ගියා නඩුවක වැඩකට. මං කොයි වෙලාවෙ ද එහෙන් එන්නේ කියලා හිටියේ."

දෙවියන් ඒ තත්වයෙන් මා රැක ගනු ඇතැයි මම සිතුවෙමි. එසේ වීමට පෙර මා රැකියාවෙන් අස් වී යනු ඇත.

"තුවක්කුව රෑ දවල් දෙකේම ඉහ ඉද්දර තියාගෙන නිදාගන්න ඕනෑ. මෙතැන එච්චර හොඳ නෑ. මීට කලින් ඔපීස් එකේ හොර කමක් වුණා. ඒ නිසා දැන් මෙහෙ සල්ලි තියා ගන්නේ නෑ."

මම කුතූහලයෙන් යුතුව විස්තර ඇසුවෙමි.

"මොකක්ද කිව්වේ? හොරකම වුනේ කොච්චර කාලෙකට ඉස්සෙල්ලද?"

"ඒ හැටි කාලයක් නෑ. අවුරුදු අටකට නවයකට ඉස්සෙල්ලා. ටික දවසක් ඉන්නකෝ. ඔක්කොම දැනගන්න ලැබෙයි. මේ පළාත ඒ හැටි හොඳ නෑ. ඒ නැතත් මේ කැලෑවේ හොරකම් කරලා මරලා දැම්මත් කවුද බලන්නේ.?"

ගෝෂ්ඨ බාබු යන්නට ගිය විට මම ජනේලය අසලට පැමිණ සිට ගනිමි. ඈත වන රොදට ඉහළින් සඳ පායා තිබුණේය. උදාවන

සඳ පසුබිම් කරගත් ඇලවූ ගසක අත්තක් මට පෙනුණේ ජපන් චිත්‍ර ශිල්පී, හකුසායි විසින් අඳින ලද සිතුවමක් ලෙසිනි.

රස්සාවක් කරන්න වෙන තැනක් සොයා ගන්න මට බැරිවෙයිද? මෙය අනාතුරුදායක තැනක් යයි කලින් දැනගෙන සිටියා නම් මා කිසි දිනක අවිනාශ්ගේ කීමට එකඟ වන්නේ නැත. සිතේ කනස්සලු ස්වභාවය මැද වුව ද පායා එන සඳෙහි සෞන්දර්‍යය මා වශී කළේය.

කාර්‍යාලය අසල කුඩා කඳු ගැටයක් විය. එහි පැරණි විශාල නුග ගසක් විය. එය හඳුන්වනු ලැබුවේ 'ග්‍රාන්ට් මහත්තයාගේ නුග ගහ' යනුවෙනි. එයට කෙසේ ඒ නම වැටුණා දැයි විපරම් කළත් මට දැන ගත නොහැකි විය. දිනක් නිහඬ සන්ධ්‍යාවේ ඇවිදින්නට ගියවිට හිරු බැස යන සැටි බලන්නට මම කඳු ගැටයට නැග ගතිමි.

රෑ බෝවීමට ආසන්න වෙද්දී කඳු ගැටය මුදුනේ පිහිටි නුග ගහ සෙවණේ සිටගෙන බොහෝ දෑතට නෙත් යොමා දිගටම බලා සිටියෙමි. කල්කටාවේ නවාතැන, පාලම මත වූ තිත්පොල, සෑම දාම මෙවැනි වේලාවට මා ගොස් හිඳගෙන සිටින ගෝල්ඩිඝි උද්‍යානයේ බංකුව යනාදිය මට සිහි විය. මම ඒ බංකුව මත හිඳගෙන කොලේජ් විදිය දිගේ වැල නොකැඩී ගමන් කරන ජනකායත්, මෝටර් රථත් දෙස බලා සිටින්නට පුරුදුව සිටියෙමි. හදිසියේ මා කොපමණ දුරකට ඇවිත් සිටි දැයි සිහිවූ විට සිතට වේදනාවක් දැනුණි. රැකියාවක් කිරීමට ඇති උවමනාව නිසා දැන් මා ජනශූන්‍ය අරණක පිදුරු සෙවිලි කළ කුටියක ලැගුම් ගෙන සිටිමි. මෙහි ආශ්‍රය කරන්නට වත් කෙනෙක් නැත. වචනයක් දෙකක් කථා කිරීමට වත් කෙනෙක් මෙහි නැත. මෙහි සිටින වැඩි දෙනා රළු ස්වභාවයෙන් යුක්ත වූ මෝඩ නුගත් මිනිසුන්ය. වැදගත් දෙයක් කථා කළ විට ඔවුන්ට තේරුම් ගත නොහැක. මට දින ගෙවන්නට සිදුවන්නේ මෙබඳු අය සමඟය. මගේ සිත උදාසීන බවට පත් වී කිසියම් බියක් ද දැනෙන්නට විය. ඒ මාසයෙන් ඉතිරි වී ඇති දින කීපයත් ඊළඟ මාසයත් දෑස් පියා ගෙන හෝ සිට ගෙවා දමා අවිනාශ් ට දීඝ් ලිපියක් ලියා රැකියාවෙන් අස්විය යුතුයැයි මම සිතා ගතිමි. ඉන් පසු පෙරලා කල්කටාවට ගොස් උගත් යහළු මිත්‍රාදීන් මුණ ගැසී, ශිෂ්ට සමාජයේ පිළිගෙළ වන කැම කා, ඉහළ මට්ටමේ සංගීතයට සවන් දී, මිනිසුන් අතරට වැදී ඔවුන්ගේ ආනන්දයත් උද්දාමයත් විඳ, ඔවුන්ගේ කට හඬවල් අසා සැනසෙන්නෙමි යැයි සිතා ගත්තෙමි.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මිනිසුන් මැද සිටීමට මා මෙතරම් ප්‍රිය කරන බව හෝ මිනිසුන්ට මා මෙතරම් ආදරය කරන බව හෝ මීට පෙර දැන නොසිටියෙමි. එසේ නැති නම් ඔවුන් අතහැර ඒම ගැන මා සිත කරදර කර ගන්නේ ඇයි?

ජනාධිපති විද්‍යාලය අසල පොත් විකුණන මහලු මුස්ලිම් මිනිසා මට සිහි විය. මම ඔහුගේ පොත් කඩයට ගොස් පැරණි පොත් හා සඟරා පෙරලා බැලීමට පුරුදුව සිටියෙමි. ඒවා අතර හොඳ පොත් තිබුණත් මට ඒවා මිල දී ගැනීමට නො හැකි විය. ඒ වෙළෙන්දා කිට්ටුම නෑයකු මිත්‍රයකු ලෙස මට හැඟුණි. මා බොහෝ දිනකින් ඔහුව දුටුවේ නැති බව මට සිහි විය.

කායික්‍ෂාලයට පසෙක වූ මගේ කාමරයට වැදී මේසය මත තිබුණ ලාම්පුව දැල්වීමි. ඒ අසල පොතක් කියවීමට හිඳ ගත් විටම මුතේශ්වර් සිංහ නම් සේවකයා පැමිණ මට ආචාර කළේය.

"ඇයි මුතේශ්වර්?"

මේ කාලය තුළ ප්‍රාදේශීය හින්දි භාෂාව තරමක් දුරට තේරුම් ගැනීමට පුරුදුව සිටියෙමි.

"සර් මට යකඩ කල්දේරමක් ගෙනැල්ල දෙන්න කියලා ලියන මහත්තයට කියන්න."

"කල්දේරමක් මොකට ද?"

මුතේශ්වර්ගේ මුහුණ බලාපොරොත්තු සහගත බවකින් ආලෝකමත් විය. ඔහු බැගෑපත් ස්වරයෙන් කථා කළේය.

"එයින් එකක් තියෙනවා නම් හරි ලේසියි සර්. ඕනෑ තැනක අරන් යන්න පුළුවන්. බත් උයන්නත් පුළුවන්. බත් බෙදාගෙන කන්නත් පුළුවන්. මොනවා හරි දාලා අරන් තියන්නත් පුළුවන්. කැඩෙන්නෙත් නෑ. මට එක කල්දේරමක් වත් නෑ. මං කොච්චර කාලෙක ඉඳලද හිතාගෙන ඉන්නේ එකක් ගන්න කියලා. ඒ වුනාට මං හුගක් දුප්පත්. පොඩි කල්දේරමක් ඇනා හයයි. එච්චර ගානක් දීල මා එයින් එකක් ගන්නේ කොහොමද? ඒ හින්දයි මං තමුන්නාන්සේ ළඟට ඇවිත් කිව්වේ."

කල්දේරමක් මෙතරම් අගේ කළ යුතු වස්තුවක් දැයි මට සිතිණි. මෙවැන්නක් ලබා ගැනීම සඳහා කෙනෙකු දිවා රෑ සිහින මැවිවේ යැයි මා ඇසුවේ පළමු වරට ය. ඇනා හයක බඩුවක් ලැබුණොත් තම දැනට ස්වර්ගය ලැබුණා සේ සලකන තරම් දිළිඳු මිනිස්සු ලොව සිටිත් ද? මේ පළාතේ මිනිසුන් ඉතා දිළිඳු බව මා අසා තිබුණත්

ඔවුන් මෙතරම් දිළිඳු බව මා දැන සිටියේ නැත. මට ඔවුන් ගැන අනුකම්පාවක් ඇති විය.

පසු දින මගේ අත්සන සහිත ලිපියක් රැගෙන කඩපොළට ගිය මුතේශ්වර් නොම්මර පහේ කල්දේරමක් රැගෙන විත් මගේ කාමරයේ බිම තබා මට ආචාර කළේ ය.

"තමුන්නාන්සෙට පින් සිද්ද වෙන්න මගේ වැඩේ හරි ගියා."

ඔහුගේ සිනාවෙන් ආලෝකමත් වූ මුහුණ දුටු මට සිතුණේ මේ මිනිස්සු හරි අහිංසකයි. කොච්චර කරදරෙන්ද ජීවත් වෙන්නේ?" යනුවෙනි. මෙවැනි සිතිවිල්ලක් මට ඇති වූයේ මෙහි පැමිණි පසු පළමු වරටය.

02

එසේ වුවත් මේ ජීවිතය සමග මට කිසිසේත් ම පැහෙන්නට නොහැකිය. බෙංගාලයෙන් පිට පිහිටි මෙවැනි පළාතකට මා ආවේ පළමු වරටය. වැඩි කාලයක් මා ගතකර තිබුණේ ජනාකීර්ණ කල්කටාවේ ය. වනගත ප්‍රදේශයේ පාළු බව මගේ හදවත මතට ගලක් පටවා ඇතැයි මට දැනෙන්නට විය.

සමහර දිනවල සවස් වරුවේ මම සැහෙන දුරක් ඇවිදිමි. කායික්‍ෂාලය අවට සිටින මිනිසුන්ගේ කඩහඬවල් ඇසෙන සීමාව පසු කර ගියවිට, ගොඩනැගිලි ඉඳුක් පදුරු ආදියට මුවා වී ගිය විට, මහ පොළව මත සිටින්නේ මා පමණකැයි හැඟේ. ඉන් පසු කොපමණ දුර ගමන් කළත් දැකිය හැකි වන්නේ පුළුල් මිටියාවතත් ඒ දෙපස වූ රුක් පෙළත් පමණි. ගඟාරී, කොට්ට, ආදී ගස්ද කටු සහිත උන ගස්ද වේවැල් පදුරුද ඒ අතර වෙයි. අවරට යන හිරු, තුරු හිස් මත රතු සිංදූර සළකුණු තවරයි. වන මල්වලින් සහ තණ පදුරුවලින් නමන සුවඳ සැඳෑ සුළඟේ රැඳෙයි. සෑම පදුරක්ම කුරුලු කිවි බිවියෙන් දොඩමළු වෙයි. ඒ කුරුල්ලන් අතර හිමාලයෙන් එන ගිරවිද වෙති. නිදහසේ බොහෝ ඈතට විහිදුණු තණ නිල්ලෙන් වැසුණු මිටියාවතත් හරිත වර්ණ වනයත් එකතු වී සැණකෙළි පවත් වන්නා සේය.

මේ වෙලාවට මට සිතෙන්නේ මෙහිදී දකින සෞන්දර්‍යය වෙන කොතැනක දී වත් මා දැකනැති බවයි. අවට ඇති සියල්ල මගේ යැයි සිතේ. පෙනෙන තෙක් මානේ සිටින එකම මිනිසා මම වෙමි. මගේ

පාළුව බිඳීමට කිසිවෙක් නොඑති. පාළු සන්ධ්‍යාවේ නිදහස් වූ අහස් තලයට යට සිටින මම ඇත දිගන්තයේ සීමා රේඛාව දක්වා මගේ කල්පනාව විහිදුවා ලමි.

කායශ්‍රීාලයේ සිට සැතපුම් දෙකක් පමණ ඇතින් පිහිටි බැවුම් සහිත භූමියක කුඩා දොළ පාරක් 'සිරි' 'සිරි' හඬින් ගලා බසියි. එහි ඉවුරු දෙපස ලිලී මල්වලින් ගැවසී ඇත. කල්කටා උද්‍යානයේ SPIDER LILY යනුවෙන් නම් කර ඇති මල් වර්ගය එය බව මම හඳුනා ගතිමි. එවැනි මල් වගියක් කැලෑබදව තිබෙණු මා කිසි දිනක දැක නැත. හුදකලා දොළපාරක් අයිනේ පිපුණු ලිලී මල් මෙතරම් සුන්දර බව ද මෙවැනි මුදු සුවඳක් ඒ මගින් සුළඟට එක් කරන බව ද මා මින් පෙර දැන සිටියේ නැත. කීප වරක් එහි ගොස් ඒ අසල නිහඬව හිඳගෙන සිට සැඳෑ අහසේ සිරියත් පරිසරයේ පාළු බවත් විඳින්නට පුරුදු වූයෙමි.

විටින් විට මම අශ්වයා පිට නැගී යමි. මුලින් නම් මට අශ්වයා පිට යාම නුහුරු දෙයක් විය. ක්‍රම ක්‍රමයෙන් හොඳින් අසු පන්නාගෙන යාමට මට හැකි විය. අශ්වයා පිට යාමට හොඳින් පුරුදු වූ විට ජීවිතයේ මීටත් වඩා ආස්වාදයක් ගෙනදෙන දෙයක් නැතැයි මට සිතුණි. ජනශූන්‍ය පරිසරයක ඇත දිගන්තය තෙක් විහිදුණු වනාන්තරයේ නිදහස් අහස් තලය යටින් කිසිම දිනක නිදහසේ අසු පන්නවා නොගිය කෙනෙකුට එය කුමන අන්දමේ ආස්වාදයක් දැයි විස්තර කරන්නට උත්සාහ නොකරමි. කායශ්‍රීාලයේ සිට සැතපුම් දහයක් පහළොවක් දුරින් පිහිටි තැනක මිනින්දෝරු පාටියේ සේවකයෝ වැඩ කළහ. ඒ දිනවල උදෑසන තේ කෝප්පයක් බී සැදලය දමා අශ්වයා පිට නැග්ග විට මා ආපසු එන්නේ සවස් වරුවේය. එසේ නැතහොත් රෑ බෝ වූ විටය. වනයේ තුරු හිස් වලට උඩින් බ්‍රහස්පති තාරකාව දිලෙන්නට වෙයි. සඳ පහන් රාත්‍රිවල මල්වලින් එන සුගන්ධය සඳ එළියට මුසු වෙයි. රුහැයියන් හා සිගාලයින් රංචු ගැසී කරන කැගැසීම් ඇසේ.

මා ආ කායශ්‍රීය සඳහා බොහෝ මහන්සි වීමට සිදු විය. අක්කර දහස් ගණනක වැඩ කටයුතු සංවිධානය කිරීම පහසු කටයුත්තක් නොවේ. මා වත්තට ආ විට දැන ගත් කරුණක් නම් ඒ ඉඩකඩම් නිස් වසරකට පෙර ගංවතුරට යට වී තිබුණු බවය. පරම්පරා ගණනක සිට පැවති ගේ දොර,. ඉඩකඩම් ගංවතුරට අසු වී විනාශ වී ගියාට පසු වෙනත් තැන්වලට ගොස් පදිංචි වූ ගම්වල සිටි මුල් පදිංචි

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

කරුවන්ට නැවත ඒ ඉඩම්වලට ඒමට ඉඩම්හිමි සමින්දාර්වරයා ඉඩ නුදුන් බව ද මට දැනගන්නට ලැබිණ. ඉඩම් හිමියාට අවශ්‍ය වන්නේ අලුත් කණ්ඩායමකට ඉඩම් බදු දීමට ය. එමෙන් ම ගෙවල් දොරවල් නැතිව, අසරණව ඉතා දිළිඳුව සිටින මුල් පදිංචි කරුවන්ට නීති මගින් ඇති අයිතිය පිළිබඳව වංචා කරනු ලැබූ අතර වරින් වර ඔවුන් පැමිණ හඬා වැලපී කන්නලව් කරමින් කරන ලද ඉල්ලීම් ද නොතකා හැර තිබේ.

මා හමුවීමට ද ඒ අයගෙන් බොහෝ දෙනෙක් පැමිණියහ. ඔවුන් වැටී ඇති අසරණ තත්වය දුටු විට අනුකම්පා සිතේ. සමින්දාර්වරයා අණ දී ඇත්තේ පැරණි පදිංචිකරුවන් කිසිවෙකුට ඉඩම් බදු නොදීමටය. පාරම්පරික උරුමයක් ඇති නිසා නීති මගින් කටයුතු කළොත් ඔවුන්ට වාසි අත්විය හැකි වීම ඊට හේතුව විය. සමින්දාර්වරයාට මැරවර බලය ඇත. ගම්වැසියෝ අවුරුදු නිහක් නිස්සේ ඉඩකඩම්, ගෙවල් දොරවල් නොමැතිව පිට පළාත්වල සැරිසරමින් කුළී වැඩ කර ජීවත් වෙති. සමහරු ගොවිතැන් ද කරති. ඒ කාලයේ සිටි ගම් වැසියන්ගෙන් වැඩි දෙනෙක් දැන් මිය පරලොව ගොස් ය. ඔවුන්ගේ දරුවෝ අසරණ වී සිටිති. බල සම්පන්න වූ සමින්දාර්වරයාට විරුද්ධ වීම ඔවුන්ට කළ හැකි දෙයක් නොවේ. එසේ කළහොත් මහෝඝයකට අසු වූ තණ පත් මෙන් ඔවුන් ගසා ගෙන යනු ඇත. මේ ඉඩම්වල අලුතින් පදිංචි කර වීමට මිනිසුන් කොහෙන් සොයන්නද? මුංගේර්, පූර්ණියා, භගල්පූර්, ඡාපරා ආදී, අසල පිහිටි දිස්ත්‍රික්කවලින් පැමිණි මිනිස්සු ඉඩම් බදු ගැනීමට ගෙවිය යුතු මිල ගණන් අසා මන්දෝත්සාහී වූහ. ටික දෙනෙක් පමණක් ඉඩම් කොටස් කීපයක් බදු ගත්හ. මේ වේගයෙන් වැඩ කටයුතු සිදු වුවහොත් අක්කර දහස් ගණනක කැලෑ ඉඩම් බදු දීමට තවත් අවුරුදු විසි පහක්වත් ගත වනු ඇතැයි මට සිතිණ.

අපේ කායශ්‍රීාලයක් වතුයායේ වෙනත් තැනක තිබිණ. එය මගේ කායශ්‍රීාලයේ සිට සැතපුම් දහ නවයක් ඈතින් වනයෙන් වටවූ 'ලොබිටුලියා' නම් ස්ථානයේ පිහිටියේය. එහි කායශ්‍රීාලයක් පිහිටුවීමට අවශ්‍ය වූයේ ඒ අසල පිහිටි ඉඩම් සතුන් ඇති කරන්නන් සඳහා බදු දීමට කටයුතු කළයුතු වූ නිසාය. අක්කර සීයක් පමණ, මසං ගස්වලින් ගහණ වූ ඉඩමක් ද එහි විය. 'ලාක්ෂා කෘමියා' නම් වූ ලාකඩ නිපදවන කුඩා කෘමී සතුන් ඇති කිරීම සඳහා ඒ ඉඩම් භාවිත

විය. ඒ කොටසේ ඉඩම්වල බදු එකතු කිරීම යදහා කාර්‍යාලයක් ඉදිකොට ඒ සඳහා නිලධාරියෙකු ද පත් කර තිබිණ.

මසං කැලය බදු දෙන කාලය පැමිණි විට දිනක් මම අශ්වයා පිට නැගී එහි ගියෙමි. මගේ කාර්‍යාලය සහ ලොබ්ටූලියාව අතර වණිවත් පස් සහිත උස් භූමිභාගයක් විය. එය සැතැපුම් අටක් පමණ දුරක් දක්වා පැතිරිණ. ඒ පළාත 'ථූලකියා බයිහාර' නමින් හැඳින්විණි. විවිධාකාර ගස්වැල්වලින් පිරුණු එහි සමහර තැන්වලදී අශ්වයාගේ ඇඟේ අතු පැටලෙන තරම් කැලය ඝනව වැවී තිබිණ. ඒ කොටස පසු කළ විට තැනිතලාවක් හමු වේ. වානන් නම් වූ වන ගත නදියක් ඒ තැනිතලාව හරහා ගලා බසී. වැසි කාලයට ගඟේ ජලය පිරි තිබුණත් එදින එහි එතරම් ජලයක් නොවීය.

මා එවර ලොබ්ටූලියාවට පැමිණියේ පළමු වරටය. කුඩා පිදුරු කුටි දෙකක් එහි විය. ඒවායේ ගෙබිම පොළොව මට්ටමේම විය. බිත්ති ද කොළ අතුවලින් ආවරණය කර තිබිණ. මම රෑ බෝ වීමට මදක් කලින් එහි ගියෙමි. එහි පැවතියේ මා නැවතී සිටි තැන ඇති සීතලට වැඩි සීතලකි. රෑ වන විට සිරුර ගල් ගැසෙන තරම් සීතල අධික විය.

සේවකයෝ වනයෙන් දර, පරඬැල් අදිය ගෙන අවුත් ගිනි ගොඩක් ගැසුවෝය. මම ඒ අසල අතුලන පුටුවේ හිඳ ගතිමි. අනිත් අය ගිනි ගොඩ වටා හිඳ ගත්හ.

ස්ථානය භාර බදු එකතු කරන්නා කොහෙන්දෝ වෙල් මාළු වගයක් ගෙන ආවේය. කෑම පිළියෙළ කරන්නේ කවුරුදැයි ප්‍රශ්නයක් පැන නැංගේය. මා සමග කෝකියෙකු පැමිණියේ නැත. මා හමු වීමට පැමිණ සිටි කණ්ටුමිශ්‍ර නම් මෛථිලී බ්‍රාහ්මණයෙක් කෑම පිසීම සඳහා යොදවනු ලැබීය.

"මේ ගොල්ලො ඔක්කොම ඇවිත් ඉන්නේ ඉඩම් බදු ගන්නද?" මම නිලධාරියාගෙන් ඇසුවෙමි.

"නෑ සර්, මේ ගොල්ලො ඇවිත් ඉන්නේ බත් කන්න. තමුන්නාන්සේ එනවා කියලා ආරංචි වෙලා දවස් දෙකක් තිස්සේ මෙහාට වෙලා ඉන්නවා. මේ පැත්තේ මිනිසුන්ට ඒක පුරුද්දක් වෙලා. හෙට තව කට්ටියක් එයි. මා මෙවැනි දෙයක් මීට පෙර අසා නොතිබිණ.

"මං ඒ ගොල්ලන්ට එන්න කිව්වේ නැනේ."

"මේ ගොල්ලො හරි දුප්පත් සර්. මේ ගොල්ලන්ට බත් කන්න ලැබෙන්නේ නෑ. ඉරිහු හරි වෙන ධාන්‍ය ජාතියක් හරි අඹරලා හදා ගන්න පිටිවලින් හදන රොටී, තලප වගේ දේ තමයි නිතරම කන්න ලැබෙන්නේ. බත් කන්න ලැබුණොත් ඒ ගොල්ලන්ට දිව්‍ය භෝජනයක් ලැබුණා වගේ. තමුන්නාන්සේ ආවම බත් කන්න ලැබෙයි කියලා තමයි මේ හැමෝම ඇවිත් ඉන්නේ. බලන්නකෝ තව කොච්චර එයිද කියලා."

අපේ බෙංගාලයේ ජනතාව මොවුන්ට වඩා දියුණු යයි මට සිතිණි. බත් කෑමේ ආශාවෙන් බලාපොරොත්තු සහගත ව සිටි ඒ අහිංසක මිනිසුන් එදින රාත්‍රියේ මට ඉතා ප්‍රිය වූයේ මන්දැයි කිව නොහැක. ගිනි ගොඩ වටා හිඳගත් ඔවුහු එකිනෙකා සමග කථා බස් කරනු මට ඇසිණ. පළමුවෙන් ඔවුහු මට ඇති ගෞරවය නිසා දුරට වී සිටියහ. මම ඔවුන් ව ළඟට අඩ ගසා ගත්තෙමි. කණ්ටුමිශ්‍ර නම් තැනැත්තා ඒ අසල ළිපක් බැඳ, දර කෝටු දමා ළිප දල්වා මාළු බදිමින් සිටියේය. එයින් නැගුණ දුමත් සමග අපූරු සුවඳක් නිකුත් විය. ගිනිගොඩින් ඇත් වූ විට අහසින් හිම වැටෙන විටක දී මෙන් දැඩි සීතලක් දැනෙන්නට විය.

කෑම බීම ගෙන අවසන් වූ විට හොඳටම රෑ විය. රෑස්ව සිටි හැම දෙනාම බත් කෑහ. නැවත සියල්ලෝම ගිනි ගොඩ වටා හිඳ ගත්හ. සීතලට සිරුරේ ලේ පවා මිදී යන්නා සේ මට දැනිණ. සමහර විට හිමාලය කඳු වැටියට එතරම් දුරක් නැති නිසා එසේ වන්නට ඇතැයි සිතිය හැක.

කුඩා පිදුරු කුටි දෙකට මදක් දුරින් වූ ගිනි මැලය වටා අපි හිඳගෙන සිටියෙමු. ඒ පිදුරු කුටි දෙකින් එකක් මා සඳහා වෙන් වූ අතර අනික ඉතිරි සියල්ලන් සඳහා විය. අප වටා තිබුණේ අන්ධකාර තුරුවදුළු හා තැනිතලාවයි. හිසට ඉහළින් වූයේ අනන්තය දක්වා විහිදුණු තාරකා පිරුණු ආකාශයයි. මගේ සිතේ නුහුරු නුපුරුදු හැඟීමක් ඇති විය. සැමදා හුරු පුරුදු වූ පෘථිවිය අතහැර වෙනත් පාළු ග්‍රහ ලෝකයක අඥාත වූද, ගුප්ත වූද, ජීවන ධාරාවක් සමග මා මුසු වී ඇතැයි මට හැඟෙන්නට විය.

පිරිස අතර වූ වයස අවුරුදු තිහක් තිස් දෙකක් පමණ විය හැකි තරුණයෙක් මගේ අවධානයට යොමු විය. ඔහුගේ නම ගනෝරී තේවාරි විය. තළුළුලු පැහැයෙන් යුතු වූ ඔහු මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් ඇති කෙනෙක් විය. ඔහුගේ හිසකෙස් වවා තිබුණු අතර

නළලේ දිගටි හැඩයේ මොට්ටුවක් විය. සිරුරේ පොරෝනයක් දවටා සිටි ඔහු ඒ පළාතේ අය අඳින අන්දමේ කබායක් වත් හැඳ සිටියේ නැත. බොහෝ වේලාවක සිට මා දුටුවේ ඔහු අන්‍යයන් දෙස එක්තරා අන්දමක කුළැටි බැල්මකින් බලන බවය. ඔහු කිසිවකුගේ කථාවකට විරුද්ධව කථා නොකළත් අඩුවෙන් කථා කළේ ද නැත.

මා කියූ හැම දේටම ඔහු "සර්" යනුවෙන් කීය.

මේ පළාතේ මිනිස්සු කිසියම් ඉහළ පදවියක් දරන කෙනෙක් කථා කළ විට මඳක් හිස නමා ගෞරවයෙන් යුතු ව

"සර්" යයි කීමට පුරුදුව සිටියහ.

"තේවාරිජී කොහේ ද ඉන්නේ?" මම ඇසුවෙමි.

ඔහු මා දෙස බැලුවේ තමා ගැන විමසනු ලැබීම වැනි ගෞරවයක් අපේක්ෂා නොකළා සේය.

"හීමදාස් ජනපදයේ සර්."

ඉන්පසු ඔහු තමාගේ ජීවිත කතාව කීවේය. ඔහු එය කීවේ එක දිගටම නොවේ. මා ඇසූ දෙයට පිළිතුරු ලෙස කොටස් වශයෙනි.

තේවාරිට වයස අවුරුදු දොළහේදී ඔහුගේ පියා මිය ගියේය. මහලු නැන්දා කෙනෙක් ඔහුට අකුරු උගන්වා හදා වඩා ගත්තාය. ඇය ද ඔහුගේ පියාගේ මරණයෙන් වසර පහකට පමණ පසු මිය ගිය විට තේවාරී රට තොට ඇවිද තමාගේ භාග්‍යය සොයාගෙන යාමට ගමින් පිට විය.

ඔහු පළමු වරට ගියේ පූර්ණියා නගරයට ය. පසුව හගල්පූර් දිස්ත්‍රික්කයේ පිහිටි පාළු ආරණ්‍ය භූමිය වූ ථූලකියා බයිහාරයට ආවේය. උතුරෙන් කුශී ගඟ ඔහුගේ ගමන් මගෙහි සීමාව විය. ගමින් ගමට ඇවිද්ද ඔහු විටෙක දේව පූජා පැවැත්වීය. විටෙක කිසියම් පාසලක ඉගැන්වීය. ඔහු තමාගේ බඩ වියත රැක ගත්තේ ඉතා අපහසුවෙනි. බඩ ඉරිහු පිටියෙන් හෝ වීන තණ හාල් අඹරා ලබා ගත් පිටියෙන් සෑදූ රොටියක් හෝ ඔහුට ලැබුණේ මේ අන්දමටය. මාස දෙකක සිට ඔහුට එවැනි රැකියාවක් හෝ ලැබුණේ නැත.

ගමේ ඔහු ටික කලක් ඉගැන් වූ පාසල වසන්නට සිදු විය. ථූලකියා බයිහාරයේ වන ගත ඉඩම් අක්කර දහස් ගණනක් තුළ ගම්මාන නැත. මේ දිනවල ඔහු එහි මී ගව පල්ලන්ට බදු දුන් ඉඩම් කොටස්වල ගව ගාල්වල ඇවිද ගව පල්ලන්ගෙන් කෑම ඉල්ලා

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ඇවිදියි. එදින මා එන බව අසන්නට ලැබුණු පසු තවත් පිරිසක් සමග ඔහු එහි පැමිණියේය.

"මෙහාට මෙච්චර මිනිස්සු ඇවිත් ඉන්නේ මොකට ද තේවාරිජී?"

"මිනිස්සු කිව්වා ථූලකියා බයිහාරයට මැනේජර් මහත්තයා එන නිසා එහේ ගියාම බත් කන්න ලැබෙනවා කියලා. ඉතින් ඒගොල්ලො එනකොට මාත් ආවා."

"ඇයි මෙහේ මිනිසුන්ට බත් කන්න ලැබෙන්නේ නැද්ද?"

"කොහේ හම්බ වෙනවද සර්? නවගච්චියාවේ මහත්තුරු නම් හැමදාම බත් කනවා. මං හිතන්නේ මං මේ බත් කෑවේ මාස තුනකට පස්සේ. පසු ගිය බිනර මහේ සංක්‍රාන්ති දවසේ රාස බිහාරි සිංගේ ගෙදරට ආරාධනයක් ලැබිලා ගියා. එයා පෝසතෙක් නේ. එහෙන් බත් කන්න දුන්නා. ඉන් පස්සේ ආයිත් බත් කන්න ලැබුණේ නෑ."

එහි ආ මිනිසුන් කාටවත් දැඩි සීතලෙන් බේරීමට උණුසම් ඇඳුම් තිබුණේ නැත. ඔවුන් රාත්‍රිය ගෙව්වේ ගිනි තපිමිනි. පාන්දර සීතල අධික වූ විට ඔවුන්ට කිසිසේත්ම නිදා ගැනීමට නොහැක. ඔවුන් එළිවෙන තුරු ගිනි ගොඩට තව තවත් ළං වෙමින් කල් ගත කළහ. හදිසියේම මා තුළ ඔවුන් කෙරේ දැඩි හිතවත්කමක් ඇති වූයේ මන්දැයි කිය නොහැක. ඔවුන්ගේ දරිද්‍රතාවත්, අහිංසක කමත් රුදුරු ජීවන සංග්‍රාමයේ යුද වැදීමට ඔවුන් තුළ ඇති හැකියාවත් මට ප්‍රිය විය. අන්ධකාර වනාන්තරයේ නිදහස් ආකාශයේ යටින් මල් ඇතුරු සිනිඳු මාවතක ගමන් කිරීමට, දිළිඳුකම ඔවුන්ට ඉඩ නො දෙයි. එසේ වුවත් ඔවුන් නියම මිනිසුන් යයි මට සිතේ. බත් දෙකටක් කෑමේ සතුට ලබන්නට ආරාධනයකින් තොරව හීමදාස්, පර්වතා ආදී ජනපදවල සිට සැතැපුම් අටක් නවයක් පයින් පැමිණි ඔවුන්ගේ සතුට ග්‍රහණය කර ගැනීමේ ශක්තිය කොපමණදැයි සිතා මම පුදුමයට පත් වූයෙමි.

රෑ මැද කිසියම් ශබ්දයක් ඇසී මම නින්දෙන් අවදි වූයෙමි. දැඩි සීතල නිසා පොරෝනයෙන් පිටතට පැමිණීම ද අපහසු දෙයක් විය. මෙවැනි සීතලක් මෙහි ඇතැයි මං කලින් දැන නොසිටි හෙයින් මෙට්ට ඇතිරිලි පොරෝනා ආදිය නොගෙනාවෙමි. මා ගෙන ආවේ කල්කටාවේදී මා පෙරවූ කම්බිලිය පමණි. රාත්‍රියට එය දියෙන් පෙගූ එකක් මෙන් සීතල වේ.

සිරුරට යට වී තිබුණු පැත්ත ශරීර උෂ්ණත්වය නිසා තරමක් උණුසුමට තිබුණත් අනිත් පැත්තට හැරෙන්නට ගිය මට දැනුණේ දුරුතු මහේ රාත්‍රියක සීතල පොකුණක ගිලෙන ලෙසකි. අසල වූ කැලය මැදින් සතුන් රංචුවක් දුවන විට ඇසෙන මිශ්‍ර වූ අඩි ශබ්ද ඇසෙන්නට විය. වියලී ගිය කොළ හා පදුරු වර් වර් හඬින් මැඩගෙන කවුරුන් හෝ එක පිම්මේ දුවන හඬක් ඇසෙන්නට විය.

ඒ කුමක්දැයි තේරුම් ගත නොහැකි වූ මම විෂ්ණු රාම් නමැති හටයාට සහ ගනෝරි ගුරු මහතාට අඩ ගැසුවෙමි. ඔවුහු නිදිමත පෙරෙන ඇස්වලින් යුතුව අවදි වී හිඳ ගත්හ. මිදුලේ දල්වා තිබුණු ගිනි ගොඩ නිවෙන්නට ආසන්න වී තිබිණි. එහි ඉතිරිය පැවති එළියෙන් ඔවුන්ගේ මුහුණුවල උදාසීන ගතියත්, නිදිබර ගතියත් මතු වී පෙනිණ. තේවාරි ඒ දෙසට මඳක් කන් යොමා සිට මෙසේ කීය.

"ගණන් ගන්න එපා සර්. ගෝන්නු රැළක් කැලේ මැදින් දුවන සද්දේ ඔය ඇහෙන්නේ."

ඉන්පසු ඔහු කිසි ගණනක් නැතිව පසෙකට හැරී නිදන්නට සූදානම් විය.

"ඉතින් ගෝන්නු මේ රෑ හදිසියේ ඔය විදිහට දුවන්න හේතුව මොකද්ද?"

විෂ්ණු රාම් මා තැන්පත් කරන අදහසින් මෙන් කථා කළේය.

"කැලේ සතෙක් පස්සෙන් පන්නනවා වෙන්න ඇති සර්. වෙන මොකක්ද?"

"මොන වගේ සතෙක් ද?"

"වෙන මොක්කුද සර්? කැලෑ සත්තුනේ. කොටියෙක් වෙන්නත් පුළුවන්. එහෙම නැති නම් වළහෙක්....."

මා නිදා සිටි කාමරයේ දොර දෙස මගෙ දෙනෙත් ඉබේ ම යොමු විය. එය වියළි ලී පතුරු හා කොළවලින් තැනූ එකකි. දොර පැළැල්ල කෙතරම් සැහැල්ලුදැයි කිව හොත් බල්ලෙකුට වුව එය තල්ලු කර ගෙන ගෙට කඩා වැදිය හැක. මෙවැනි තත්වයක් මැද අසල වූ වනය මැදින් නපුරු සතෙක් ගෝනුන් හඹා යන බව ඇසීමෙන් මගේ සිතට සැනසීමක් ඇති නොවුණු බව කිය යුතු නැත.

ටික වේලාවකින් වටින් ගොඩින් එළිය වැටෙන්නට විය.

දිනෙන් දින ගතවෙද්දී වනාන්තරය මා වසඟයට ගත්තේ ය. එහි ඇති පාළු බවේ ද සන්ධ්‍යා සමයේ රත් පැහැ ගන්නා ගස්

කොළන්වලද කුමන අන්දමේ ආකර්ෂණයක් ඇද්දැයි මට විස්තර කළ නොහැක. මේ වන විට ක්‍රමයෙන් මගේ සිතට ඇතුළු වූ කල්පනාව නම් ඇත දිගන්තය තෙක් විහිදුණු විශාල තැනිතලාව අත හැර, හිරු රැස් වැටෙද්දී පොළොවෙන් නිකුත් වන නැවුම් සුවඳින් ද මෙහි පවතින නිදහසින් ද ස්වාධීනතාවෙන් ද වෙන් වී කල්කටා නගරයේ පවතින කලබැගෑනිය මැදට මට නැවත යා නොහැකි බවයි.

මේ හැඟීම මට හදිසියේ ඇති වූවක් නොවේ. එය මා තුළ ඇති වූයේ වනය ආශ්‍රිත පරිසරයේ සෞන්දර්‍යය නොයෙක් අවස්ථාවල විවිධාකාර වෙස්ගෙන පැමිණ මා වශී කළ පසුය. බොහෝ සන්ධ්‍යා භාගයන් මා වෙතට ආවේ රත් පැහැ ගත් ඔටුනු සිරස දැරූ රජෙක් ලෙසිනි. දහවල්වරුවල සැඩ හිරු රැස් මා වෙතට පැමිණියේ උමතු යක්ෂාවේශයකිනි. රාත්‍රිය සඳ රැස් සේලයෙන් සැරසී පිණි බර වන මල්වල සුවඳ ගත තවරා ගෙන තාරකා මාලා ගෙන පැළඳ ගෙන සුරඟනකගේ වෙසින් මා ඉදිරියට පැමිණියා ය. අන්ධකාර රාත්‍රිය පැමිණියේ යම රජුගේ වරම් ලබා පාතාල ගින්නෙන් රත් වූ කඩුව අතින් ගෙන දිග් විජය කිරීමට එන කාලියගේ ප්‍රතිමූර්තියක් ලෙසිනි.

දිනක් මා ලද අත්දැකීමක් මට ජීවිතයේ කිසිදාක අමතක නොවේ. එදින හෝලී උත්සවය පැවැත්වෙන පුර පෝය දිනයක් විය. කාර්‍යාලයේ ආරක්ෂක හටයෝ තිවාඩු ඉල්ලා ගෙන බෙර ගසමින් විනෝද වූහ. රෑ බෝ වන විටත් නැටුම් ගැයුම්වල කෙළවරක් දක්නට නොලැබිණි. මම මගේ කාමරයේ හිඳ පහනක් දල්වා ගෙන ප්‍රධාන කාර්‍යාලයට යැවීමට අවශ්‍ය වූ ලිපි සකස් කිරීමේ නිරත වී සිටියෙමි. වැඩ අවසන් වී බැලූ විට වේලාව රාත්‍රි එක බව දුටුවෙමි. දැඩි සීතල නිසා සිරුර ගල් වී යන තරම් විය. දුම් වැටියක් දල්වා ගත් මම ජනේලයෙන් පිටතට එබී බැලුවෙමි. මා දුටු දර්ශනයෙන් මම විස්මයට පත් වීමි. මෙදින මා වසඟ කළේ පුර පෝය දවසේ රෑ රැජිණියගේ වර්ණනා විෂය ඉක්ම වූ කිරි බැබලෙන සඳ එළියයි.

රාත්‍රියේ පැවති දැඩි සීතල නිසා මෙහි පැමිණි දා පටන් මෙවැනි වේලාවක මා ගෙයින් පිටතට පැමිණ නැත. ඒ නිසා මෙහි සඳ එළිය සහිත රාත්‍රියක සෞන්දර්‍යය මට මීට පෙර දකින්නට ලැබී නැත. මම දොර හැර පිටතට පැමිණියෙමි. කිසිවෙකු පෙනෙන්නට නැත. ආරක්ෂක හටයෝ මුලු දවසේම විනෝද වීමෙන් පසු වෙහෙසට පත් ව නිදමින් සිටියහ. නිහඬ ආරණ්‍ය භූමියේ, පාළු ජන ශූන්‍ය

පරිසරයේ සඳ රැසින් නැහැවුණු රාත්‍රියේ සුන්දරත්වය ගැන මට වචනයෙන් විස්තර කළ නොහැක. මා කිසි දිනක එවැනි ඡායාවලින් තොරවූ සඳ ඇති රැයක් දැක නැත. ඒ භූමි භාගයේ විශාල ගස් නොතිබිණි. එහි වූයේ විශාල ප්‍රමාණයේ සෙවණැලි නොසාදන ඉඳුක් ආදී පඳුරු කීපයක් පමණි. සුදෝ සුදට දිලෙන වැලි සහිත පොළවක් එහි විය. හිරු රැසින් අඩක් වියලුණු ඉඳුක් වනයට සඳරැස් වැටී සිතේ ගැස්මක් ඇති කරවන තරම් වූ මායාකාරී සෞන්දර්‍යයක් නිර්මාණය කර තිබිණ. කිසියම් උදාසීන, බන්ධන හීන, නිදහස් හැඟීමක් ඇති වී මගේ හදවත සැලෙන්නට විය. ඒ නිහඬ රාත්‍රියේ සඳරැසින් ආලෝකමත් වූ අහස් තලය යට හිඳ අවට බැලූ මට සුරලොවකට ඇතුළු වූවාක් බදු හැඟීමක් ඇති විය. මිනිසුන් සඳහා පනවන ලද කිසිම නීතියක් රීතියක් එතැනට ගැලපෙන්නේ නැත. මධ්‍යම රාත්‍රියක, ජනශූන්‍ය පෙදෙසකට පතිත වූ සඳ එළිය නිසා එය සුරභනුත් සැරිසරන තැනක් බවට පත් විය. මා පමණක් අවසර නැතිව එහි ඇතුළු වීමෙන් කළේ වරදකැයි මට සිතිණ.

ඉන්පසු මම එහි සඳ පහනින් එළිය වූ රාත්‍රීන් බොහෝ ගණනක් දුටුවෙමි. මැදින් මස මැද භාගය වන විට දූඩිලි මල් පිපී මුළු මිටියාවත පුරාම වණ්ඩුවත් මල් පලසක් එළුවා සේ පෙනේ. ඒ සඳ පහනින් ආලෝකමත් වූ රාත්‍රිවල දූඩිලි මල්වල මිහිරි සුවඳ සිත් සේ විඳ්දෙමි. ඒ හැම වාරයකදීම මගේ සිතට නැගුණේ බෙංගාලයේ සිටියදී නම් සඳ එළිය මෙතරම් අසමසම සුන්දරත්වයකින් යුතු වූ දෙයක් බව හෝ එය බියක් උදාසීන භාවයක් මුසු හැඟීමක් ඇති කරවන බව හෝ දැන ගැනීමට කිසියේත් ම නොලැබෙන බවය. ඒ පරිසරයේදී මා දුටු සඳ රැසින් පහන් වූ රාත්‍රිය ගැන වර්ණනා කිරීමට උත්සාහ නොකරමි. එවැන්නක් ගැන අත්දැකීමක් නොලැබූ කෙනෙකුට කනින් අසා හෝ ලියූ දෙයක් කියවා හෝ එය කෙබඳු දැයි අවබෝධ කරගැනීම කළ නොහැකි දෙයකි. එවැනි සුරංගනා ලෝකයක් නිර්මාණය වන්නේ දිගන්තය තෙක් විහිදී ගිය වනාන්තරයක් මැද පවතින පාළු නිසංසල පරිසරයක පමණි. ජීවිතයේ එක් වරක් හෝ එවැනි සඳ පහන් රැයක් දැකිය යුතුම ය. එවැන්නක් නො දුටු අය දෙවියන්ගේ නිර්මාණ අතර වූ අපූරු දෙයක් දැක හඳුනා ගැනීමට අසමත් වූවෝ වෙති.

දිනක් මිණුම් කඳවුරේ සිට ආපසු එද්දී රෑ බෝවීමට ආසන්න විය. මට පාර වැරදුණි. ඒ තැනිතලාවේ තැනින් තැන වන රොදින්

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

වැසුණු කුඩා කඳුගැට හමු වේ. කඳුගැට දෙකක් අතර කුඩා මිටියාවත් ද හමු වේ. මේ ආකාරයෙන් කොතෙක් ඉදිරියට ගිය ද වනයේ කෙළවරක් දැකිය නොහැක. මම කඳුගැටයක් මතට නැග වටපිට බැලුවේ කාය්‍යාල සේවක මහාවීරගේ ගිනි ගොඩ පෙනෙන්ට ඇත්දැයි කියාය. මොන පැත්තකින්වත් ගින්දරක සලකුණක් පෙනෙන්නට තිබුණේ නැත. උස් පහත් බිම් අතර වනයත් අහසත් මිස කිසිවක් පෙනුනේ නැත. අතරින් පතර යල් ගස් සහ ආසාන් ගස් තිබිණ. පැය දෙකක් පමණ ඇවිද්දත් වනයේ කෙළවරක් දකින්නට නො විය. හදිස්සියේ මට මතක් වූයේ අහසේ තාරකා මගින් දිශාව නිර්ණය කර ගත හැකි බවය. ග්‍රීෂ්ම කාලයේ හිසට ඉහළින් පෙනෙන දඩයක්කාරක නම් තාරකාවලිය ගැන මට සිහි විය. එයවත් හත්දින්නන් තරු පොකුරවත් මට සොයාගත නොහැකි විය. තාරකා ඇසුරෙන් දිශාව නිර්ණය කිරීමේ බලාපොරොත්තුව අතහැර මම අශ්වයාට රිසිසේ දුවන්නට ඉඩ හැරියෙමි. සැතැපුම් දෙකක් පමණ ගිය විට කැලෑව මැදින් එළියක් දිස් විය. ඒ දිශාවට ළං වූ විට වනය මැද කොටසක් එළි කර කුඩා පැල්පතක් තනා හිඳගෙන සිටි මිනිසෙක් කුමක් දෝ වැඩක් කරමින් සිටියේය.

අශ්වයාගේ කුර ගැටෙන හඬ ඇසූ මිනිසා තිගැස්සී නැගිට්ටේය.

"කවුද?"

ඉන්පසු මා හඳුනාගත් ඔහු වහා ළඟට අවුත් ඉමහත් සැලකිල්ලෙන් යුතුව අශ්වයා පිටින් මා බිමට බැස්ස වූයේය.

ඒ වන විට පැය හයක් පමණ එක දිගටම අශ්වයා පිටේ සිටීමෙන් මම හෙම්බත් වී සිටියෙමි. එදින බොහෝ වේලාවක් මිණුම් කඳවුරේ සුපවයිසර්වරයාගේ පිටුපසින් කැලෑවේ තැනින් තැනට සැරිසරන්නට මට සිදු විය.

ඒ මිනිසා එළා දුන් පැදුරක් මත හිඳගතිමි.

"මේ උන්නැහේගේ නම මොකක්ද?"

"ගනූ මහතෝ. මං ගංගෝතා කුලේ කෙනෙක්."

මේ පළාතේ ගංගෝතා කුලේ අයගේ ජීවිකාව වූයේ ගොවිතැනත්, ගවයන් ඇති කිරීමත්, බවත් ඒ වන විට මම දැන සිටියෙමි. එසේ වුවත් මේ මිනිසා මේ පාළු කැලය මැද කුමක් කරන්නේ දැයි මම කල්පනා කළෙමි.

"මෙහාට වෙලා මොකද කරන්නේ? ගම කොහේද?"

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"මං මෙහේ මී හරක් ඇති කරනවා සර්. අපේ ගෙවල් තියෙන්නේ හැතැප්ම විස්සක් විතර ඈත, උතුරු ධරම් පුරේ, ලඟමනියා ගමේ."

"මෙහේ බලා ගන්නේ තමුන්ගේම මී හරක් ද? කී දෙනෙක් විතර ඉන්නවද?"

ඒ මිනිසා ගර්වයෙන් යුතුව පිළිතුරු දුන්නේය.

"පස් දෙනෙක් ඉන්නවා."

"පස් දෙනෙක්?" මම පුදුමයට පත් වූයෙමි. සැතපුම් විස්සක් පමණ ඈතින් පිහිටි ගමක සිට ආ මොහු මී හරක් පස් දෙනෙක් පමණක් ඇති කිරීමට මේ කැලෑව මැද පැලක් අටවා ගෙන සිටියි. දිනෙන් දින මාසයෙන් මාසය මේ කුඩා පැල්පතේ ඔහු කාලය ගෙවා ගන්නේ කෙසේ ද? තියටර්, බයිස්කෝප් ආදිය බලා විනෝද වෙමින් කල්කටා නගරයේ ගත කළ තරුණයෙකු වූ මට එය තේරුම් ගත නොහැකි විය.

එසේ වුවද ඒ පළාත ගැන වැඩිපුර අත්දැකීම් ලබන විට ගනූ මහතෝ එසේ සිටින්නේ ඇයිදැයි මට තේරුම් ගත හැකි විය. ඔවුන්ගේ ජීවන රටාව ඒ අනුව හැඩ ගැසී ඇති බව මට තේරුම් ගියේය. ඔහුගේ මී හරකුන් පස් දෙනා ඇති කිරීමට නම් ඔවුන්ට සිත් සේ කන්නට දීමට නම් කැලෑවේ පැලක් සාදාගෙන තනිව සිටිය යුතු යැයි ඔහු කල්පනා කරයි. ඒ ගැන පුදුම වීමට දෙයක් නැත.

ගනූ අමු සල් කොළවලින් දිග සුරුට්ටුවක් ඔතා ගෞරවයෙන් යුතුව මගේ අතට දුන්නේය. ගිනි ගොඩේ එළියෙන් මම ඔහුගේ මුහුණ දුටුවෙමි. ඔහු උස් වූ තළලක් හා සෘජු නාසයක් ඇති කාල වණ මිනිසෙකි. මුහුණේ අහිංසක ගතියක් ඇත. දැස්වල තැන්පත් බැල්මකි. ඔහු අවුරුදු හැට ඉක්ම වූ කෙනෙකැයි සිතිය හැක. ඔහුගේ හිසකෙස් සියල්ල පැසී තිබුණත් සිරුර මනා ලෙස වැඩී තිබිණ. මහලු වයසේදී වුව ද ඔහුගේ සිරුරේ මාංශ පේශී වෙන් වෙන්ව කැපී පෙනිණ. ඔහු ගින්නට තවත් දර දමා සල් කොළ සුරුට්ටුවක් දල්වා ගත්තේය. ගින්නෙහි අලෝකයෙන් පැල්පත තුළ වූ පිත්තල භාජන දෙක තුන දිලිසෙන්නට විය. ගිනිගොඩින් එහා පැත්ත බැලූ විට පෙනුණේ අන්ධකාරයේ ගිළුණු මහ වනය පමණි.

"ගනූට තනියම මෙහේ ඉන්න කොට කැලේ සත්තු ගැන එහෙම බය හිතෙන්නේ නැද්ද?"

"මේක අපේ රස්සාවනේ සර්. බය වෙලා පුළුවනැයි? දවසක් මේ පැල ළඟටම කොටියෙක් ආවා. මගේ ළඟ ඉන්න වහු පැටවු

දෙන්නා ඇද ගෙන යන්න තමයි ඇවිල්ලා තියෙන්නේ. මට සද්දේ ඇහිලා බෙලෙක්කවලට ගහලා සද්ද කළා. පන්දම් පත්තු කළා. කෑ ගැහුවා. එදා රෑ මට නින්ද ගියෙත් නෑ. සීතල කාලෙට රෑ තිස්සේ නරි කෑ ගහනවා."

"මෙහේ ඉඳන් කන්නේ මොනව ද? කඩයක් පළාතකවත් නෑ. බඩු ගන්නේ කොහෙන්ද? හාල් පරිප්පු වගේ දේවල්වත් ගන්න තැනක් නෑ නේද?"

"කඩේකින් බඩු ගන්න තරම් සල්ලි අපි ළඟ කොයින්ද සර්? අපි බෙංගාලි මහත්තුරු වගේ දෙවේලට බත් කනවයැ? අක්කරයක විතර හේනත් වවලා තියනවා. ඒකේ පල ගන්න බෝග ජාති තම්බලා කනවා. තව නිවිති කොළත් කැලේට වැවිලා තියෙනවා. මැදින් මහට ගුඩම් ගෙඩි පල ගන්නවා. ලුනුදාලා අමුවෙන් කන්න පුළුවන්. තව පිපිඤ්ඤා වගේ ගෙඩි ජාතියකුත් තියෙනවා. පලතුරු හැදෙන කාලෙට මේ පළාතේ දුප්පත් මිනිස්සු දිගටම කන්නේ ඒවම තමයි. පලතුරු වාරෙට ළමයි රංචු පිටින් කැලේට එනවා ගෙඩි කඩන්න."

"දවස ගානේ ඇට ජාතියි නිවිති වගේ දේවලුයි කන කොට එපා වෙන්නේ නැද්ද?"

"මොනවා කරන්න ද හාමුදුරුවනේ අපේ දුප්පත් කමට? අපට මහත්තුරුන්ට වගේ බත් කන්න පුළුවන් කමකුත් නෑ. මේ පළාතෙන් ම රාස බිහාරි සිංටයි නන්දලාල්ටයි විතරයි දෙවේල බත් කන්න ලැබෙන්නේ. මුළු දවසේම මී හරකුන්ගේ පස්සේ ගිහින් මහන්සි වෙලා ගෙදර ආවහම කොච්චර බඩගිනි වෙනව ද? ඒ වෙලාවට කීඳෑවොඋනත් අල්ල ගෙන කන්න පුළුවන්."

"ගනූ කල්කටා නගරේ දැකලා තියෙනවද?"

"නෑ. ඒ ගැන අහලා නම් තියෙනවා. හගල්පුරේ නම් එක පාරක් ගිහින් තියෙනවා. හරි විශාල නගරේ. එහේදී වාහනයක් දැක්කා. හරි පුදුමයි. අදින්න අශ්වයෝවත් නැතිව ඒවා නිකම්ම පාර දිගේ දුවනවා."

ඒ වයසේදී ඔහුගේ ශරීර සෞඛ්‍යයත්, උද්යෝගිමත් භාවයත් දැක මම පුදුමයට පත් වීමි. ගනූගේ ජීවිතය ගැට ගසා ගැනීමට එකම ආධාරකය වූයේ මී ගවයින් ටික දෙනාය. මේ පළාතේ මී කිරි මිල දී ගන්නේ කවුරු ද? කිරිවලින් ගිතෙල් සාදා මාස දෙක තුනක් තිස්සේ ඒවා එකතු කොට සැතැපුම් නවයක් ඈතින් පිහිටි ධරම්පුරයේ කඩමණ්ඩියට ගොස් විකුණන ඔහුගේ දිවි රැකෙන්නේ

හේන්වලින් ලබාගන්නා ධාන්‍ය වර්ගයකින්ය. මේ පළාතේ දිළිඳු අයගේ ප්‍රධාන ආහාරය වන්නේ හේන්වලින් ලබා ගන්නා ධාන්‍ය වර්ගයකි. ගනු එදින රාත්‍රියේ පැමිණ මා කායර්‍යාලයට ඇරලවා ගියේ ය. මට ගනුව කෙතරම් හිතට ඇල්ලුවාදැයි කිව හොත් කීපවරක් සැන්දෑවට එහි ගොස් ඔහුගේ පැල්පත ඉදිරිපිට දැල් වූ ගිනි මැලය අසල හිඳගෙන ඔහු සමග කතා කරමින් සිටීමට පුරුදු වූයෙමි. ඒ පළාතේ පැරණි සිදුවීම් ගැන කීමට ඔහු තරම් දක්ෂයෙක් තවත් නැත.

ගනු බොහෝ අද්භූත සිද්ධීන් පිළිබඳව මට විස්තර කළේය. පියාඹන සර්පයා, පණ ඇති පාෂාණය, උපන් හැටියේ දණ ගැ ළමයා ආදී නොයෙකුත් කතාන්තර ඔහු මට කීය. ඒ ජනශූන්‍ය පරිසරයේ සිට ගනුගේ කථා අසද්දී මට ඒවා ඉතා රසවත් විය. කල්කටා නගරයේදී ඒ කතා ඇසුවා නම් ඒවා අස්වාභාවික අසත්‍ය ඒවා බව මට හැඟෙන්නට ඉඩ තිබිණි. පරිසරය ද කතාව රසවත් බවට පත් කරන බව කතා ඇසීමට කැමති අය පමණක් දන්නා කරුණකි. ගනු කියූ කතාවලින් මා වඩාත් ම පුදුමයට පත් වූයේ මී ගවයින්ගේ දේවතාවා පිළිබඳ විස්තරය ඇසීමෙනි. ඒ කතාවල අපූරු නිමාවක් ඇත. ඒවා පුදුසු අවස්ථාවලදී සඳහන් කරන්නෙමි. ගනු මට කියූ කතන්දර සුරංගනා කතා නොවේ. ඒවා ඔහුගේ අත්දැකීම් ය. වනාන්තරයේ සෞන්දර්‍යාත්මක පරිසරය මැද මුළු ජීවිතය ම ගෙවා ඇති ඔහු වනගත ජීවිතය පිළිබඳ විශේෂඥයෙකි. ඔහු කී දේ ඉවත දැමිය නොහැක. බොරු ගොතා කීමේ මානසික තත්වයක් ඔහුට ඇතැයි නොසිතේ.

03

ග්‍රීෂ්ම කාලය පැමිණි විට දිනක් එහා කන්දේ සිට කොක්කු රැනක් පියාඹා විත් ග්‍රාන්ට් මහත්තයාගේ නුග ගස මුදුනේ වැසුවෝ ය. ඇත සිට බලන විට තුරු මුදුණ සුදු මල් පොහොට්ටුවලින් පිරි ඇති බවක් පෙනී ගියේය.

අඩක් වියළුණු මානා කැලය අසල මේසය හා පුටුව තබා ගත් මම ලියකියවිලිවල වැඩ කරමින් සිටියදී මුනේශ්වර් සිං පැමිණ මට කථා කළේ ය.

"නන්දලාල් එනවා තමුන්නාන්සේ හම්බ වෙන්න."

ටික වේලාවකට පසු වයස අවුරුදු පනහක් පමණ වන කෙනෙක් අප ඉදිරියට පැමිණ ආචාර කළේ ය. මම ඔහුට හිඳ ගැනීමට යයි කීවෙමි. බංකුවේ හිඳගත් ඔහු මල්ලකින් කුඩා ගිරයක් ද පුවක් ගෙඩි දෙකක් ද පිටතට ගෙන පුවක් කපන්නට පටන් ගත්තේ ය. පසුව කැපූ පුවක් කැබලි ටික දැතින් ගෙන මහත් සැලකිල්ලෙන් යුතුව මට දිගු කළේය.

"මේ පුවක් ටික ගන්න."

මේ ආකාරයට පුවක් කා මට පුරුද්දක් නැතත් ආචාරශීලී බව රැකීමට අවශ්‍ය නිසා ඒවා අතට ගත්තෙමි.

"කොහේ ඉඳලද ආවේ? මොකද්ද උවමනාව?"

එයට පිළිතුරු වශයෙන් තමාගේ නම නන්දලාල් බවත්, තමා බ්‍රාහ්මණයකු බවත්, මෙහි සිට සැතැපුම් එකොළහක් පමණ දුරින් ඊශාන දිශාවේ පිහිටි සුංටියා නම් ගමක තමාගේ නිවස පිහිටි බවත් ඔහු පැවසි ය. තමා ගොවිතැන් කරන අතර මුදල් පොළියට දීම ද කරන බවත් ඔහු සඳහන් කළේ ය. ඔහු පැමිණ සිටියේ ඊළඟ පෝය දිනයේ තමාගේ නිවසට එන්නට යයි ආරාධනා කරන්නටය. ඔහුට අනුග්‍රහය දක්වා මා ඒ නිවසට ගිය හොත් එය වාසනාවක් කොට සලකන බව ඔහු පැවසුවේ ය.

සැතැපුම් එකොළහක් ඇතින් පිහිටි තැනකට ගිනි ගහන අව්වේ යාමට මට උවමනාවක් නොවූවත් නන්දලාල් බොහෝ පෙරැත්ත කළ නිසා ඒ ආරාධනය නොපිළිගෙන සිටීමට නොහැකි විය. ඒ හැරත් ඒ පළාතේ ගෘහ ජීවිතය ගැන දැන ගැනීමට කුතුහලයක් ද මා තුළ තිබිණ.

ඊළඟ පුර පෝය දිනයේ දහවල් වූ විට දිගු මානා පදුරු අතරින් කාගේ දෝ ඇතෙකු එන බව මම දුටුවෙමි. ඇතා කායර්‍යාලය අසලට ආ විට එය නන්දලාල් විසින් මා කැඳවාගෙන යාමට එවන ලද එකෙකු යයි දැන ගන්නට ලැබිණ. ඊට වඩා අඩු කාලයකදී මට අශ්වයා පිට නැගී එහි යාමට හැකියාව තිබුණු නිසා ඇතෙකු එවීමේ අවශ්‍යතාවක් නම් නොවීය.

කෙසේ වුවත් මම ඇතා පිට නැගී නන්දලාල්ගේ නිවසට යාමට පිටත් වූයෙමි. ඇතා පිට නැංග විට හරිත වර්ණ වනාන්තරය පෙනුණේ මට පහළිනි. මගේ හිස අහසේ ගැවෙන්නාක් මෙන් මට දැනුණි. ඇත දිගන්තයේ දිස් වූ නීල වර්ණ පර්වත පෙළින් වට වූ මහ වනය මායා ලෝකයක් නිර්මාණය කර තිබිණ. මම ඒ මායා ලෝකයේ වැසියෙකු

SL UNLIMITED
The spirit of Sri Lankan e-community
SL-UNLIMITED.COM

විමි. මට සිතුණේ වළාකුළුවලට යටින් හරිත වර්ණ මහ වනයට උඩින් නිල්වන් වායුගෝලය බිඳගෙන මා ඉදිරියට ඇදෙන ලෙසකි.

සීත කාලය අවසානයේ වුව ද දිය වලවල් රතු හංසයින්ගෙන් පිරී තිබිණ. උෂ්ණ කාලය පැමිණි විට උන් පලා යනු ඇත. ගමන යන අතරතුරදී ඉතා දිළිඳු ගම්මාන හමු විය. මනසා නම් නාග දෙවිදුවගේ කෝවිල් ද තැනින් තැන විය. දුම්කොළ වගාවන්ද මානා සෙවිලි කළ දිළිඳු පැල්පත්ද වරින්වර හමු විය.

ඇතා සුංඩියා ගමට ඇතුළු වන විට මා දුටුවේ පාර දෙපස මිනිසුන් මා පිළිගැනීමට පෙළ ගැසී සිටින බවය. ගමට ඇතුළු වී මඳ දුරක් ගිය විට නන්දලාල්ගේ නිවස හමු විය. මැටි ගසා තනන ලද මානා සෙවිලි කළ කුටි දහයක් පමණ එහි විය. ඒවා වටා විශාල මිදුලක් විය. මා නිවසට ඇතුළු වත් ම වෙඩි මුර දෙකක් ඇසී මම තිගැස්සී ගියෙමි. එවිට ම නන්දලාල් සිනාමුසු මුහුණින් යුතුව පැමිණ මා කැඳවාගෙන නිවස තුළට ගියේය. ඉඩකඩ ඇති කාමරයක තිබුණු පුටුවක ඔහු මට හිඳගැනීමට සැලැස්වූයේය. එය ඒ පළාතේ වඩුවන් විසින් රළු අන්දමින් තැනූ පුටුවක් විය. අවුරුදු දහයක් පමණ වයසැති දැරියක් මා ඉදිරිපිටට පැමිණ බන්දේසියක් ඇල්ලුවාය. කුඩා හාජනයක දැමූ සුවඳ තෙල් වර්ගයක් ද බුලත් හා පුවක් ද වියළි රටඉඳි ටිකක් ද එහි විය. ඒවායින් කුමක් කරන්නදැයි මා දැන සිටියේ නැත. මම අසරණයෙකු මෙන් සිනාසි ඇඟිලි තුඩට තෙල් ස්වල්පයක් ගත්තෙමි. දැරිය සමග වචනයක් දෙකක් ද කථා කළෙමි. දැරිය බන්දේසිය මා ඉදිරිපිට තබා යන්නට ගියාය.

ඉන්පසු කෑම බීම ගැනීමේ වාරය පැමිණියේය. නන්දලාල්ගේ සංග්‍රහය කෙබඳු එකක්දැයි මට සිතාගත නොහැකි විය. මා ඉදිරියේ තිබුණු විශාල පිත්තල බන්දේසිය අපේ පළාතේ දුර්ගා පූජාව පිළියෙල කිරීමට ගන්නා හාජනයක් තරම් ලොකු විය. ඒ මත අලි කන් පමණ විශාල වූ 'පූරි' තබා තිබිණ. නිවිති ආදී එළවළු කීපයක් ද සියඹලා හොද්දක් ද, මී කිරිවලින් තැනූ ආහාර වර්ග ද එහි විය. එහි වූයේ මා කිසි දිනක දැක නැති අන්දමකට පිළියෙළ කළ ආහාරයි. මිදුලේ සිටි මිනිසුන් මා දෙස බලා සිටියේ අමුතු සතෙකු දෙස බලන ආකාරයට ය. ඔවුන් නන්දලාල්ගේ පිරිවර බව මට පසුව දැන ගන්නට ලැබිණ.

රෑ බෝ වීමට පෙර මා ආපසු යාමට සැරසුණ විට නන්දලාල් කුඩා බන්දේසියක් මගේ අතට දුන්නේ ය.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

"තමුන්නාසෙට තෑග්ගක්."

මම පුදුමයට පත් වූයෙමි. බන්දේසියේ ලොකු මුදලක් විය. මෙවැනි මුදලක් මට තෑගි දීමට කිසිදු හේතුවක් නැත. නන්දලාල් අපේ වතුයායට අයත් කෙනෙක් ද නොවේ. තෑග්ගක් ප්‍රතික්ෂේප කිරීම එය දෙන තැනැත්තාට කරන අවමානයකි. ඒ නිසා මම එයින් රුපියලක් පමණක් ගෙන බන්දේසිය ආපසු දුන්නෙමි.

"මහත්තයගේ දරුවන්ට මේකෙන් මොනවා හරි අරන් දෙන්න" යි මම කීවෙමි.

නන්දලාල් පෙරැත්ත කරන්නට විය. මම ඔහුට ඇහුම් කන් නොදී පිටතට පැමිණ ඇතා පිට නැංගෙමි.

පසුදින නන්දලාල් මගේ කාර්‍යාලයට පැමිණියේ ය. ඔහු සමග ඔහුගේ වැඩිමහල් පුත්‍රයා ද විය. මම ඔවුන් ව සැලකිල්ලෙන් යුතුව පිළිගතිමි. එසේ වුවත් ඔවුන් මගෙන් කෑම බීම පිළිගැනීමට එකඟ නොවූහ. මෛථිලි බ්‍රාහ්මණයෝ අනිත් බ්‍රාහ්මණ වංශිකයකුගෙන් වුවද ආහාර නොපිළිගනිති. ටික වේලාවක් නිශ්ඵල කථා බහෙහි යෙදීමෙන් පසුව නන්දලාල් මට පැත්තකට අඩ ගසා තමාගේ වැඩිමහල් පුතා මේ පළාතේ බදු එකතු කරන ප්‍රධාන නිලධාරි තනතුර බලාපොරොත්තු වන බව කියා ඒ තනතුරට ඔහුව පත් කරන ලෙස මගෙන් ඉල්ලා සිටියේ ය. මම පුදුමයට පත් වූයෙමි.

"ඒ තනතුර හිස් වෙලා නැනේ. ඒකට කෙනෙක් ඉන්නවනේ."

නන්දලාල් මට ඉහි මරමින් කථා කළේය.

"තමුන්නාන්සේනේ ලොක්කා. තමුන්නාන්සෙට ඕනෑ නම් මොනවද කරන්න බැරි?"

මම තවත් පුදුමයට පත් වූයෙමි.

"ඒ මොන කතාවක්ද? මෙහේ බදු එකතු කරන්නා හොඳට වැඩ කරනවනේ. එයාව අස් කරන්නෙ මොන වැරැද්දකටද?"

"තමුන්නාන්සෙට සල්ලි කොච්චර ඕනැද? හැන්දෑවෙම මං කියන ගානක් ගෙනත් දෙන්නම්. මගේ ළමයට ඒ තනතුර අරන් දෙන්නම ඕනෑ. කීයක් ඕනෑද කියන්න. රුපියල් පන්සියක්?"

නන්දලාල් පෙර [illegible]නයේ මට අඩ ගසා සංග්‍රහ කළේ ඇයිදැයි මට ඒ වනවිට තේරුම් ගොස් තිබිණ. මේ පළාතේ මෙවැනි කපටි මිනිසුන් සිටින බව දැන සිටියා නම් මා කිසි දිනක එහි යන්නේ නැත. මා වැටුණේ ලොකු අමාරුවකය.

නන්දලාල්ට කරුණු පැහැදිලි කොට ආපසු යැව්වත් ඔහු බලාපොරොත්තුව අත්හැරියේ නැති බව මට වැටහිණි. පසුදිනක මා පිටතට යද්දී නන්දලාල් මා හමුවීමට මග බලාගෙන සිටියේය. කුමන අසුභ මොහොතක මා මොහුගේ ආරාධනය පිළිගෙන ඒ නිවසට ගියාදැයි මට සිතිණ. මට පූරි දෙකක් කන්නට දී ඔහු මා මෙතරම් අපහසුවකට පත් කරන බව දැන සිටියා නම් මා කිසි දිනක ඒ පළාතකටවත් යන්නේ නැත.

නන්දලාල් මා දැක කුළුපග ලෙස සිනාසුණේය.

"ආයුබෝවන්!"

"හ්ම්... මේ පැත්තේ ආවේ.....?"

තමුන්නාන්සේ කාරණේ දන්නවානේ. රුපියල් එක් දාස් දෙසීයක් දෙන්නම්. මගේ පුතාට අර රස්සාව අරන් දෙන්න."

"තමුසෙට පිස්සුද නන්දලාල්? රස්සාවල් දෙන්න මං මේකෙ අයිතිකාරයද? ඉඩම් අයිතිකාරයින්ට කියලා බලනවා. ඒ නැතත් දැනට ඉන්න මිනිහගේ මොන වැරැද්දකටද ඒ මිනිහව අස් කරන්නේ?"

මම වැඩිදුර කථාවට නොගොස් අශ්වයා පිට නැගී යන්නට ගියෙමි. මගේ රළු ප්‍රතික්‍රියාව නිසා නන්දලාල් මගේ ලොකුම සතුරා බවට පත් විය. මුලදී නන්දලාල් කෙතරම් භයානක මිනිසෙකුදැයි මා තේරුම්ගෙන නිබුණේ නැත. ඔහු තරහ කර ගැනීමේ විපාක පසු කලක මට හොඳින් ම භුක්ති විඳීමට සිදුවිය.

සැතැපුම් දහයක් පමණ ඈතින් පිහිටි තැපැල් හලේ සිට අපේ කාර්‍යාලයට ලියුම් ගෙන ඒම මේ වනවිට අත්‍යවශ්‍ය දෙයක් වී තිබිණ. එතරම් ඈත සිට දිනපතා ලිපි ගෙන ඒමට අපහසු වූ නිසා සතියකට දෙවරක් පමණක් ඒ සඳහා කෙනෙකු යොදා ගන්නා ලදී. මධ්‍යම ආසියාවේ පිහිටි ජන ශූන්‍ය ටක්ලා මකාන් කාන්තාරයේ කුඩාරම් ගසාගෙන සිටි ප්‍රසිද්ධ දේශ ගවේශකයකු වූ ස්වේන් හෙඩින් ද මෙවැනි උනන්දුවකින් යුතුව ලියුම් එනතුරු බලා සිටින්නට ඇත. මා මෙහි පැමිණ ගත වූ මාස හත අට තුළදී මට දකින්නට ලැබුණේ වනාන්තරය පමණි. හැන්දෑවට හිරු බැස යන සැටි, රාත්‍රියට අහසේ තාරකා දිළිසෙන සැටි, සඳ පායන සැටි, වනයේ ගෝනුන් දුවන සැටි ආදිය බලමින් අවට ලෝකයා සමග සියලු සබඳකම් අතහැර සිටියෙමි. නැවත බාහිර ලෝකයක් සමග සබඳතාවක් වර්ධනය වන්නේ තැපෑලෙන් එන ලිපි කීපය මගිනි.

එදිනත් ජවාහිර්ලාල් ලියුම් ගෙන ඒමට තැපැල් හලට ගියේය. වෙනදා නම් දහවල් වන විට ඔහු ආපසු පැමිණෙයි. මමත් බෙංගාලි ජාතික ලිපිකරු මහතාත් වරින්වර වනය දෙස බලමින් සිටියෙමු. කාර්‍යාලයේ සිට සැතැපුම් එකහමාරක් පමණ දුරින් උස් වූ කඳු ගැටයක් මැදින් පාර වැටී තිබුණි. ජවාහිර්ලාල් එතැනින් එන විට කාර්‍යාලයේ සිට බලන කෙනෙකුට හොඳින් පෙනේ. මධ්‍යාහ්නය පැමිණියත් ජවාහිර්ලාල් පේන තෙක් මානයේ වත් නැත. මම ගෙතුළටත් පිටතටත් ඇවිදිමින් කාලය ගෙවිවෙමි. මෙහි කාර්‍යාලයේ වැඩ කටයුතු රාශියක් කිරීමට තිබේ. විවිධාකාර වාර්තා යැවීම, දෛනික වියදම් වාර්තා පිළියෙළ කොට අනුමත කරවා ගැනීම, ප්‍රධානීන් එවන ලිපිවලට පිළිතුරු යැවීම, බදු එකතු කරන්නන්ගේ ආදායම් පිළිබඳ වාර්තා පරීක්ෂා කිරීම ආදී වැඩ කටයුතු රාශියක් කිරීමට ඇත. පූර්ණියා, භගල්පූර් ආදී ස්ථානවල උසාවිවල පවරා ඇති නානාප්‍රකාර වූ ඉඩම් නඩු සඳහා වැඩ කටයුතු කරන්නට සිදුවී තිබේ. ඒවා ගැන වාර්තා ඉල්ලූ විට යැවිය යුතු ය. ලොකු කුඩා වැඩ රාශියක් දිනපතා නියමිත පරිදි කළ යුතු ය. ඒවා කලට වේලාවට නොකළොත් ටික දිනකදී ඉවර කිරීමට නොහැකි තරම් වැඩ රාශියක් ගොඩ ගැසේ. ලියුම් ආ විට නැවත වැඩ එකතු වේ. නගරයෙන් එන විවිධාකාර ලියුම් අතර එක් එක් කාර්‍යයන් සඳහා වෙනත් තැන්වලට යාමට කරන නියෝගද වේ.

වේලාව සවස තුන පමණ වන විට ජවාහිර්ලාල්ගේ සුදු තලප්පාව ඈත හිරු එළියෙන් දිලිසෙනු දක්නට ලැබිණ. බෙංගාලි ලිපිකරු මහතා කෑගසන්නට විය.

"මැනේජර් මහත්තයා. මෙහෙ එන්න. අන්න ලියුම් කාරයා එනවා."

මම පිටතට පැමිණියෙමි. ටික වේලාවකින් ජවාහිර්ලාල් කඳු ගැටයෙන් බැස ආ නිසා ඔහුගේ රුව කැලෑ රොදින් වැසී ගියේය. මම දුර දක්නය ගෙන්වා ගෙන බැලුවෙමි. ඈත වනය මැද උස් මානා පඳුරු අතරින් ඔහු පැමිණෙනු මට පෙනිණ. ඔහු එනතුරු ම වෙනත් වැඩක් කිරීමට මට සිත් දුන්නේ නැත.

එය කෙබඳු නොඉවසිලිවන්ත අපේක්ෂාවක්ද? යම් දෙයක් ලබා ගැනීමට අපහසු වනවිට ඒ හේතුවෙන් එහි වටිනාකමද වැඩි වී පෙනෙන බව මට මේ කුඩා සිද්ධියෙන් වැටහී ගියේය. මිනිසා යම්

යම් දේවල වටිනාකම තීරණය කරන්නේ තමාගේ මනසිනි. අප ප්‍රාර්ථනා කරන දෙය කෙබඳු වුවත් අපි එයට එක් එක් මට්ටමේ වටිනාකම් ආරෝපනය කර එය විශාල බවට හෝ කුඩා බවට පත් කර ගනිමු.

ජවාහිර්ලාල් කාර්‍යාලය ඉදිරිපිට වූ පටු වැලිතලාව පසු කර එනු දැක මම පුටුවෙන් නැගිට්ටෙමි. ලිපිකාර මහතා ඔහු එන පෙරමගට ගියේය. ජවාහිර්ලාල් පැමිණ ආචාර කොට ලියුම් මිටිය සාක්කුවෙන් ගෙන ලිපිකාර මහතා අතට දුන්නේය.

එහි මගේ නමටද ලියුම් දෙකක් විය. ඒවායේ අත් අකුරු මට ඉතා හුරුපුරුදු ඒවා විය. ලිපි කියවන අතරතුර අසල වූ වනය දෙසට නෙත් යොමු කළ මම පුදුමයට පත් වූයෙමි. මා ඇවිත් සිටින්නේ මා කිසි දිනක පැමිණීමට අදහස් නොකළ පැත්තකටය. කල්කටාවේ වාසය හැර දමා මෙවැනි තැනක නැවතීමට මා තුන් හිතකින්වත් සිතුවේ නැත. මම විදේශීය සහරාවකට දායක මුදල් කලින් ගෙවා සිටියෙමි. එදින ඒ සහරාවක්ද ඇවිත් තිබුණේය. එහි කවරයේ 'ගුවන් තැපෑලෙනි' යනුවෙන් ලියා තිබිණ. ජනාකීර්ණ කල්කටා නගරය මැද සිටියදී නම් ගුවන් යානය නම් විද්‍යාත්මක සොයා ගැනීමේ වටිනාකම ගැන කිසි දිනක වටහාගත නොහැක. වනය මැද සිටින විට සෑම දෙයක් ගැනම අමුතුවෙන් සිතා පුදුම වීමට අවකාශ ලැබේ. ඇත්ත වශයෙන්ම යමක් ගැන සිතා බැලීමේ පුරුද්ද මා තුළ ඇති වූයේ මෙහි පැමිණි පසුය. මෙහි පැමිණි පසු කවදාවත් නැති අන්දමට මගේ සිත ගැන අවබෝධ කර ගැනීමට මට හැකි විය. මෙහි පවතින නොයෙක් අපහසුකම් මැද ඉන් ලැබෙන සතුට එක්තරා මත් ගතියක් ඇති කරන්නාක් මෙන් මට හැඟී ගියේය.

මම මහ සාගරයක් මැද පිහිටි පාළු දූපතක තනි වූවකු සේ නොවෙමි. මෙහි සිට සැතැපුම් තිහකට පමණ ඈතින් දුම්රිය පොළක් තිබේ. එහි ගොස් දුම්රියක නැග පැයක් ඇතුළත පූර්ණියා නගරයට යා හැකිය. පැය තුනක් ඇතුළත මුංගේර්වලට යා හැක. එසේ වුවද දුම්රිය පොළ දක්වා යන ගමන ඉතා දුෂ්කර වූ එකකි. ඒ නගරවලට යාමෙන් මට යම්කිසි වාසියක් සැලසෙතොත් ඒ අපහසුව විඳ ගත හැකි ය. මා ඒ නගර දෙකේ සිටින කිසිවකු හඳුනන්නේ නැත. ඒ නිසා එහි යාමෙන් මට අත්වන ප්‍රයෝජනයක්ද නැත.

කල්කටාවේ සිට මෙහි පැමිණීමෙන් පසු යහළු මිත්‍රාදීන් ඇසුරු කිරීමට නොලැබීම මෙතරම් ඉවසීමට අපහසු දෙයකැයි මා කිසි දිනක

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

සිතුවේ නැත. මගේය කිව හැකි යමක් ඇත්නම් ඒ සියල්ලම ඇත්තේ කල්කටාවේය. පූර්ණියා සහ මුංගේර්වල සිටින්නේ කවුරුද? වතුයාය අයිතිකරුවන්ගේ අනුමැතිය පරිදි නිවාඩු නොගෙන මට කල්කටාවට යා නොහැක. ඒ හැරත් දින හතරක පහක නිවාඩුවකට පමණක් ලොකු මුදලක් වැය කර එහි යාමට සිත් දෙන්නේ ද නැත.

සැප හා දුක අතර මාස කීපයක් ගත විය. ඉන්පසු මට මුහුණ දීමට සිදුවූයේ මින් පෙර නොවූ විරූ අත්දැකීමකටය. දුරුතු මාසයේ තරමක වර්ෂාවක් පැවතුණත් ඉන්පසු දිගටම නියං කාලයක් ඇති විය. නවම්, මැදින්, බක්, වෙසක් යන මාස හතරේ ම වැසි වැස්සේ නැත. ඒ සමගම ඉවසිය නොහැකි ග්‍රීෂ්මයක් ද දරුණු ජල හිඟයක් ද ඇති විය.

ග්‍රීෂ්මයක් හා ජල හිඟයක් ඇති වූ බව කීමෙන් ඒ බියකරු තත්වය ගැන පැහැදිලි කළ නොහැක. උතුරෙන් ආජමාබාද් හි සිට දකුණෙන් ක්‍රිෂ්ණ පුර දක්වා ද, නැගෙනහිරින් ථූලකියා බයිහාරයේ සිට බස්නාහිරින් මුංගේර් දිස්ත්‍රික්කයේ සීමාව දක්වාද, තිබුණු තරමක් දියකඩිති, ඇළ, දොළ, පොකුණු, වැව් ආදී ජලාශ සියල්ලම පාහේ සිදී ගියේය. ළිං පතුළ හාරා බැලුවත් දිය හමුවූයේ කලාතුරකිනි. ළිං පතුළෙන් දිය ඉනුවත් කුඩා බාල්දියක් පිරවීමට පැය ගණනක් ගත වේ. හැම දෙසින්ම මැසිවිලි හඬ ඇසෙන්නට විය. මුලින් නම් වතුයායේ නැගෙනහිර පැත්තේ සැතැපුම් හත අටක් ගිය විට මෝහන පුරාහි රක්ෂිත වනය අසලින් ගලා බසින කුශී නදිය ගැන විශ්වාසයක් තැබිය හැකි විය. වතුයායත් මෝහන පුරාහි රක්ෂිත වනයත් අතරින් ගලා බසින කුඩා ගඟක් ද විය. එය නේපාලයේ වගුරු බිම් ආශ්‍රිත වනගත පෙදෙස හරහා පැමිණි ගංගාවකි. වැල්ල මත කුඩා ගල් කැටවලින් සලකුණු වූ ගංගාවක පිය සටහන් හැරෙන්නට ඒ වන විට ජලය දක්නට ලැබුණේ නැත. වැල්ල හාරා බැලූ විට මතුවන දිය පොද එකතු කර ගැනීමට ඈත ගම්වල සිට ගැහැනු කළ රැගෙන පැමිණියෝය. දහවල ගතවන තෙක් වැල්ල හෑරුවත් ඔවුන්ට කළයක් පිරෙන්නට දිය නොලැබේ. ලැබෙන දිය ද මඩ සහිතය.

පෙර කී ගඟේ නම මිඡී නදියයි. එය වතුයායට ඉතා ඈතින් පිහිටි නිසා අපට එයින් ප්‍රයෝජනයක් ගත හැකි නොවේ. අපේ කාර්‍යාලය අසලද ලොකු ළිඳක් තිබුණේ නැත. එහි වූ කුඩා ළිඳෙන් බීමට ජලය ටිකක් එකතු කර ගැනීම ඉතා අපහසු කාර්‍යයක් විය. බාල්දි දෙක තුනක් එකතු කරගැනීමට දවසම ගතවේ.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

දවාලට පිටතට ආ විට ගිනි විසුරුවන තඹ පැහැගත් අහස දෙසත් අඩක් මැරී ගිය පඳුරු දෙසත් බැලූ විට සිතට බියක් ඇති වේ. භාත්පස පරිසරය ගින්නෙන් දැවෙන්නාක් මෙනි. රත් වූ සුළඟ ද සිරුර දවමින් හමා යයි. දහවල පවතින සැඩ හිරුරැස් බියකරු ස්වභාවය ගැන මා මීට පෙර දැන සිටියේ නැත. දෑසින් නුදුටුවේ නම් එවැන්නක් ගැන සිතා ගැනීමටවත් නොහැක. විටින් විට බටහිර දිශාවෙන් වැලි කුණාටුද ඇති වේ. කායස්ථාලයේ සිට බැලූ විට අවට සියල්ල දුවිල්ලෙන් වැසී ඇති බව පෙනේ.

සමහර දිනවල රාම්ධනියා නම් මුරකරුවා පැමිණ "ළිඳේ වතුර නෑ සර්." යයි කියයි. සමහර දිනවල ඔහු බොහෝ වෙහෙස වී ළිං පතුළ හාරා පැය ගණන් මහන්සි වී මඩ වතුර බාල්දි බාගයක් ගෙන එයි. මේ දරුණු ග්‍රීස්ම කාලයේ එය ද ඉතා වටිනා දෙයකි.

දිනක් දහවල් කායස්ථාලය පිටුපස වූ ඉහත කී අරළු ගස යට වූ කුඩා සෙවණේ හිඳ අවට බැලුවෙමි. එවැනි දහවලක් මා කිසිදිනක දැක නැත. මෙවැන්නක් දැකිය හැක්කේ මෙහි දී පමණි. උපන්දා සිට බෙංගාලයේ දිවා භාගයන් මා දැක ඇත. පොසොන් මාසයේ සැඩ හිරුරැස් සහිත දිවා කාල දැක ඇත. මෙවැනි රුදුරු ස්වභාවයක් එහි නැත. මෙහි ඇති රෞද්‍ර රාක්ෂස ස්වභාවය දැක මම ගල් ගැසී සිටියෙමි. හිරු විශාල ගිනි බෝලයක් වැනිය. කැල්සියම්, හයිඩ්‍රජන්, යකඩ, නිකල්, කොබෝල්ට් ආදී නම දන්නා සහ නොදන්නා මූල ද්‍රව්‍යවල සංයෝග සියල්ල ගිනියම් වූ ඒ ගෝලාකාර උදුනේ දැවෙයි. එහි ගිනිදලු අවකාශයේ ස්ථරය බිඳ දමා ඵුලකියා බයිහාර් සහ ලෝධ්‍රයි ගමේ තණ බිම දක්වා පැතුරුණු, ආරණ්‍ය භූමියට පැමිණ හැම තණ පතකම ඇති සාරය උරා බී වියළා දමා ඇත දිගන්තය දක්වා සියල්ල දවා, විනාශයේ තාණ්ඩව ලීලාවක් ප්‍රදර්ශනය කරයි. ඈත බැලූ විට තැනිතලාවේ නලියන තාප තරංග පෙනේ. ඊටත් එහා ගිනි අව්වෙන් නිර්මාණය වූ නොපැහැදිලි මී දුමක් වැන්නක් පෙනේ. ගිනියම් වූ දවාලේ අහස කිසිසේත් නිල් පැහැයෙන් දිස් වන්නේ නැත. එය තඹ පැහැතිය. කොතැනක වත් කුරුල්ලෙකු දක්නට නැත. කුරුලු රංචු පළාත හැර ගොස්ය. මේ දවාලේ ඇත්තේ කිතම් අද්භූත සෞන්දර්‍යයක්ද? දැඩි රස්නය ගණන් නොගෙන මම ඉහත කී ගස යට මඳ වේලාවක් සිටියෙමි. ස්වේන් හෙඩින් නම් දේශ ගවේශකයා විස්තර කරන ටක්ලාමකාන් කාන්තාරය හෝ සහරා හෝ ගෝබී

කාන්තාරය මා දැක නැතත් මේ ගිනි ගහන අව්වේ රාක්ෂස ස්වරූපය දැක ඒ ස්ථාන ගැන නොපැහැදිලි අවබෝධයක් මා තුළ ඇති විය.

කායස්ථාලයේ සිට සැතැපුම් තුනක් ඈතින් වනයෙන් වට වූ කුඩා වැවක ජලය ටිකක් තිබිණ. පසුගිය වැසි සමයේ එහි බොහෝ මාළුන් සිටි බව අසන්නට ලැබිණ. වැව ඉතා ගැඹුරු නිසා එහි ජලය අන්තිමට සිඳී ගොස් තිබුණේ නැත. එසේ වුවත් ඒ ජලයෙන් කිසිවෙකුට ප්‍රයෝජනයක් ගත හැකි වූයේ නැත. ඊට පළමුවෙනි හේතුව නම් ඒ අසල මිනිස් වාසයක් නොවීමය. දෙවැනි හේතුව නම් ජලය ඇති තැනට ළඟා වීමට නම් ඉණ තෙක් මඩේ එරෙන්නට සිදුවීමය. වතුර ගත් පසු වැවෙන් ගොඩ ඒමට ලැබේදැයි සැක සහිතය. අපහසුවෙන් ලබාගත්තත් ඒ ජලය බීමට හෝ නෑමට සුදුසු නැත. ජලය සමග මිශ්‍ර වූ කිසියම් පදාර්ථයක් නිසා එයින් අප්‍රසන්න දුගඳක් ද නිකුත් වේ.

දිනක් සවස් කාලයේ උණුසුම් සුළං සහ හිරු රශ්මිය අඩු වූ විට මම අශ්වයා පිට නැගී පෙර කී වැව් ඉස්මත්තේ උස් මට්ටමේ පිහිටි වැලි පාරට පැමිණියෙමි. ග්‍රාන්ට් මහතාගේ තුග ගස පිටුපසින් හිරු බැස යනු මම දුටුවෙමි. අශ්වයාට වැවේ වතුර ටිකක් බොන්නට දුන්නොත් කායස්ථාලයේ ඇති ජලයෙන් කොටසක් ඉතිරි කරගත හැකි නිසා මම වැවට යන්නට සිතුවෙමි. මඩ තිබුණත් අශ්වයාට එහි ළඟා විය හැකිවනු ඇත. වැව අසලට ගිය විට පුදුම දර්ශනයක් මට දකින්නට ලැබිණ. ඉතිරිව ඇති දිය කඩිත්ත අසල මඩ සහිත බිමේ එක් පැත්තක ලොකු කුඩා සර්පයින් දහදෙනෙක් පමණද, තවත් පැත්තක විශාල මී හරකුන් තුන් දෙනෙකුද, වතුර බොනු මට පෙනිණ. ඒ සර්පයෝ සියල්ලෝම මෙහි සාමාන්‍යයෙන් දක්නට ලැබෙන විෂ සහිත උරගයෝ වූහ.

මී හරකුන් දුටු මට මතක් වූයේ මේ වර්ගයේ උන් මා කිසි දිනක දැක නැති බවය. ලොකු අං යුගළක් සහිත ඔවුන්ගේ විශාල සිරුරු දිගු ලෝමවලින් වැසී තිබිණ. අසලක ගම්මානයක් හෝ මී ගව ගාලක් තිබුණේ නැත. මේ මී හරකුන් කොහේ සිට පැමිණියා දැයි මට සිතා ගත නොහැකි විය. බදු මුදල් දීමට සිදුවන නිසා සමහර විට කිසිවකු කැලේ කොතැනක හෝ හොරෙන් මී ගව ගාලක් පවත්වා ගෙන යන්නටද ඉඩ තිබේ. මම ආපසු හැරී කායස්ථාලයට පැමිණි විට මුනේශ්වර් සිං හමුවිය. ඔහුට මා දුටු දේ පැවසූ විටම ඔහු නිගැස්සුණේය.

"දෙයියෝ සාක්කි! හනුමාන් දෙයියෝ තමයි අද තමුන්නාන්සේව ආරක්ෂා කරලා තියෙන්නේ.

ඒ හිලෑ මී හරක් නොවෙයි. කුළු හරක්. මෝහන පුර කැලෑවේ ඉඳලා වතුර බොන්න එන්න ඇති. එහෙත් වතුර නැතිව ඇති. ඒක හින්දා තමයි මෙහේ ඇවිත් තියෙන්නේ."

ඉක්මනින් කායර්‍යාලයේ අනික් සේවකයන්ට මේ කතාව දැනගන්නට ලැබුණු විට හැමෝම එක හඬින් කීවේ මෙයයි.

"තමුන්නාන්සේ නම් බේරිලා තියෙන්නේ අනූ නවයෙන්. කොටියෙකුට අහු වුනත් බේරෙන්න පුළුවනි. කුළු හරකාට අහු වුනොත් නම් ගැලවිල්ලක් නෑ. මේ රෑ බෝවෙච්ච වෙලාවේ පාළු තැන දී කඩා පැන්නා නම් අශ්වයා පිට ගිහිල්ලා බේරෙන්න හම්බ වෙන්නේ නෑ."

ඉන්පසු කැලයෙන් වට වූ මේ කුඩා වැව වන සතුන් දිය බීම සඳහා රැස්වන ප්‍රධාන ස්ථානයක් බවට පත් විය. නියඟය දැඩිවත්ම සූර්ය රශ්මියේ දැඩි බවත් වැඩි වී අවට පැතිර ගිය දාහය ද වර්ධනය විය. පෙර කී වැවට කොටින්ද, කුළු මීමුන් ද, මුවන් ද, දිය බීමට එනු මිනිසුන් දැක තිබුණි. ඒ අතර වල් ඌරන් ද, ගෝනුන්ද, සිටින්නට ඇත. ඒ පළාතේ මේ වර්ගවල සතුන් වැඩිපුර දකින්නට ලැබේ. මම දිනක් සඳ ඇති රැයක අශ්වයා පිට නැගී දඩයම් කිරීමට වැව දෙසට ගියෙමි. මා සමග ආරක්ෂක භටයෝ තුන් දෙනෙක් ද වූහ. අපි තුවක්කු දෙක තුනක් රැගෙන ගියෙමු. එදා රාත්‍රියේ මා දුටු දර්ශනය මට කිසි දාක අමතක නොවේ. ඒ ගැන තේරුම් ගැනීමට පාළු සඳ පහන් රැයක් ද ඇතට විහිදුණු තැනිතලාවක් ද සිතින් මවා ගත යුතු ය. මුළු වනයේම පැතිර ගිය අපූරු නිහඬතාවක් ගැන ද සිතා ගත යුතු ය. අත්දැකීමක් නැති කෙනෙකුට එය කෙබඳු අන්දමේ නිහඬතාවක්දැයි වටහා ගැනීම අපහසුය. අඩක් වියළුණු තණ පඳුරුවල ගන්ධය උණුසුම් සුළඟේ රැඳී තිබිණ. මිනිස් වාසයෙන් බොහෝ ඈතට පැමිණි නිසා දිශාව ගැන හැඟීමක්ද අප තුළ නොවීය.

එක් පසෙක ගෝනුන් දෙදෙනෙකු නිහඬව දිය බොමින් සිටියදී තවත් පසෙක හයිනාවෝ දෙදෙනෙක් දිය බිවූහ. ගෝන්නු දිය බොන ගමන් හයිනාවන් දෙස බලති. හයිනාවෝ ද විටින් විට ගෝනුන් දෙස බලති. ඒ දෙගොල්ලන් අතර මාස දෙක තුනක් වයස් වූ කුඩා ගෝන පැටවෙක් ද විය. එවැනි අනුකම්පා උපදවන දසුනක් මා මින් පෙර දැක නැත. මර බිය පසෙක තබා පවස නිවා ගැනීමට සැරසෙන

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

වන සතුන්ගේ අසරණ සිරුරුවලට වෙඩි උන්ඩ යැවීමට මගේ සිත ඉඩ දුන්නේ නැත.

වෙසක් මාසය ද ගෙවී ගියේය. කොතැනකවත් දිය පොදක් සොයා ගැනීමට නැති තරම් විය. ඒ අතරතුර විපතට පත් වූ මිනිසුන් ගැන ද අසන්නට ලැබිණ. මේ වන විට එසේ අතරමං වන මිනිසුන් මිය යාමට ද ඉඩ ඇති බවට සැක පහළ විය. ඊට හේතුව වූලකියා බයිහාරයේ සිට ග්‍රාන්ට් මහතාගේ නුග ගස දක්වා පැතුරුණු විශාල තෘණ භූමිය අතරතුර කොහේ හෝ දියපොදක් සොයා ගැනීමට අසීරු වීමය. පතුළටම වියළී ගිය වැවක් දෙකක් තිබුණත් මං මුලාවූවනට එවැන්නක් වත් සොයා ගැනීම අසීරු දෙයක් විය.

දිනක් එවැනි සිද්ධියක් සිදු විය.

එදින සවස හතර පමණ වනතුරු පැවැති දැඩි රස්නය නිසා මට වැඩ කරන්නට සිත් දුන්නේ නැත. මම පොතක් රැගෙන කියවන්නට වීමි. මේ වේලාවේ රාම් බිරිජ් සිං පැමිණ බටහිර පැත්තේ පිහිටි කඳු ගැටය මත අමුතු අන්දමේ පිස්සකු වැනි මිනිසෙකු දක්නට ලැබුණු බව දැන්වීය. ඒ මිනිසා ඇත සිට කුමක්දෝ කියන්නට උත්සාහ කරන බවද ඔහු කීවේය. පිටතට ගොස් බැලූ විට ඈත කඳු ගැටය මතින් කිසිවකු මත් වූවකු මෙන් වැනි වැනී අප සිටින පැත්තට එනු දක්නට ලැබිණ. සේවකයින් සියලු දෙනාම ඒ දෙස කට ඇරගෙන බලා සිටිනු දුටු මම ඒ මිනිසා කැඳවාගෙන ඒමට භටයින් දෙදෙනෙකු පිටත් කර යැව්වෙමි.

මිනිසා කායර්‍යාලය අසලට කැඳවාගෙන ආ විට ඔහු සුදු පාට ධෝතියක් ඇඳි, පැහැපත් සිරුරක් ඇති හොඳ පෙනුමක් ඇති කෙනෙකු බව දුටුවෙමි. ඔහු කමිසයක් ඇඳ සිටියේ නැත. ඒ අවස්ථාවේ නම් ඔහුගේ පෙනුම බියකරු විය. ඔහුගේ කට දෙපැත්තෙන් සෙම බේරිණ. වදමල් මෙන් රතු වී තිබුණු ඔහුගේ දෑස්වල උමතු බැල්මක් විය. මා සිටින කුටියේ පිලේ වතුර බාල්දියක් විය. ඒ දුටු ඔහු උමතුවෙන් මෙන් ඒ දෙසට දිවීමට සැරසිණ. මුනේශ්වර් සිං තත්වය තේරුම් ගෙන ඉක්මනින් බාල්දිය එතැනින් ඉවත් කළේය. ඔහුව පිලේ හිඳුවා කට අරවා බැලූ විට දිව ඉදිමී තිබෙන බව දුටුවෙමි. අපහසුවෙන් දිව මුඛයේ පසෙකට කරවා කටට ටිකින් ටික දිය වත් කර පැයකට පමණ පසු තත්වය මඳක් සුව අතට හැරිණ. උණුසුම් ජලයට දෙහි යුෂ දමා බොන්නට දී සෑහෙන වේලාවකට පසු ඔහුට සම්පූර්ණ සුවය ලැබිණ. ඔහුගේ නිවස පැවිනාවේ පිහිටි බවත්,

ලාකඩ කර්මාන්තය කිරීම සඳහා ලාක්ෂා කෘමීන් ඇති කිරීමට මසං කැලයෙන් කොටසක් බදු ගැනීමේ අරමුණෙන් ඔහු පූර්ණියා නගරයේ සිට දින දෙකකට පෙර පිටත් වූ බවත් දැන ගන්නට ලැබිණ. මෙහි ඒමට පිටත් වූ දිනයේ දහවල් වන විට වතුයායට ඇතුළු වීමට හැකි වුවත් ටික වේලාවකින් ඔහුට පාර වැරදී ඇත. එකම වර්ගයේ ගස් වැල් සහිත මගක පිට පළාතක කෙනෙකුට පාර වැරදීම ගැන පුදුම වීමට දෙයක් නැත. දරුණු හිරු රශ්මිය මැද රත් වූ සුළංවලින් පීඩා විඳිමින් ඔහු මුළු දවල් වරුවම ඇවිද්දේය. කොහේ වත් දිය බිඳක් සොයා ගන්නට නැත. මිනිසෙකු පෙනෙන තෙක් මානයේ නැත. අන්තිමේ දී රෑ බෝවූ විට ගසක් යට නිදාගත් ඔහු පසු දින උදයේ සිට ඇවිදීමට පටන් ගත්තේය. ඔහුගේ කල්පනාව හරි හැටි තිබුණා නම් හිරු දෙස බලා දිසාව සොයා ගත හැකිව තිබුණි. අඩු වශයෙන් ඔහුට ආපසු පූර්ණියා නගරය දෙසට වත් යාගත හැකිව තිබුණි. එසේ වුවද මංමුලා වී බියට පත් වූ ඔහු වරක් ඒ අතටත් වරක් මේ අතටත් දුවමින් මුළු දවස තිස්සේම කෑ ගසමින් මිනිසුන් කැඳවීමට උත්සාහ දරා ඇත. මිනිසුන් කොහෙන් හොයන්නද? ථූලකියා බයිහාරයේ මසං කැලයේ සිට ලොබිටුලියා දක්වා වර්ග සැතපුම් දහයක් දොළහක් පමණ ප්‍රදේශයක විසිරුණු වනාන්තරය මිනිසුන්ගෙන් තොරය. ඔහුගේ කෑගැසීම කිසිවෙකුටවත් නෑසීම ගැන පුදුම වන්නට දෙයක් නැත. ඔහු ඒ තත්වයට පත් වීමට හේතු වූ තවත් කරුණක් නම් වනය මැද දී ඔහුට යකින්නක් මුණ ගැසුණා යයි සිතීමය. යකින්න ඔහු මරනු ඇතැයි ඔහු බිය විය. ඔහු එන විට කමිසයක් හැඳ සිටියේය. ඉවසිය නොහැකි ග්‍රීෂ්මයත් පිපාසයත් හේතුවෙන් හටගත් දැවිල්ල නිසා ඔහු එය ගලවා දැමීය. එය මග කොහේ හෝ වැටෙන්නට ඇත. වාසනාවකට මෙන් අපේ කායශ්‍යාලය අසල උස් කණුවක සිට වූ හනුමාන්ගේ රතු කොඩිය ඈත සිට නොදැක්කා නම් ඔහුට සිදු වන්නේ කිසිම පිළිසරණක් නොමැතිව මිය යන්නටය.

* * * * * *

තද නියඟය හා ජල හිඟය පැවති කාලයේ දහවලක නිරිත දිගින් සැතපුමක් පමණ ඈතින් දරුණු ලැව් ගින්නක් ඇති වූ බවත් එය අප සිටින දිසාවට පැතිරෙන බවත් දැනගන්නට ලැබිණ. සියල්ලෝම වහා පිටතට පැමිණ බැලූහ. ඝන දුම් රොටුවක් මැද රතු

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

පැහැති ගිනි දළු බුර බුරා අහස දෙසට නැගෙනු අපි දුටුවෙමු. ඒ වන විට බටහිර දිගින් හැමූ වියළි සුළඟට හා දැඩි සූර්ය තාපයට හසුවූ තණකොළ හා ගස් වැල් වියළී කරවී තිබුණි. ඒවා තිබුණේ එක ගිනි පුපුරක් වැටුණත් වෙඩි බෙහෙත්වලට ගිනි ඇවුළුණු ආකාරයට ගිනි ගන්නා තත්වයේය. පෙනෙන තෙක් මානයේ ඝන අඳුරු පැහැගත් දුම් රොටු සහ ගිනි සිළු විය. 'වට' 'වට' හඬක් ද දිගටම ඇසෙන්නට විය. වාත වේගයෙන් දිව එන කැපැල් දුම්රිය මෙන් අපේ පිදුරු බංගලා කීපය දෙසට ගින්න ඇදී එයි. සියල්ලන්ගේම තොල කට වියළී ගොස් ඇත. එතැන සිටියොත් ගින්නෙන් පිළිස්සී මිය යන්නට ඉඩ තිබේ.

සිත සිතා ඉන්නට කාලයක් නැත. කායශ්‍යාලයේ අත්‍යවශ්‍ය ලියකියවිලිද, ඔප්පු, පිඹුරු පත් ආදියද, මුදල්ද, තිබිණ. ඒ අතර මගේ බඩු බාහිරාදියද විය. මේ සියල්ලම විනාශ වීමට ඉඩ තිබේ. ආරක්ෂක භටයෝ වියළී ගිය මුවින් යුතුව බියපත්ව කථා කළහ.

"ගින්න ළඟටම එනවා සර්."

"බඩු ටික ඔක්කොම එළියට අදින්න. ඉස්සෙල්ල සල්ලියි ලියකියවිලියි ගන්න." මම කීවෙමි. කිප දෙනෙක් ගින්න පැතිරී ඇති ප්‍රදේශය සහ කායශ්‍යාලය අතර තුර ඇති බිම් කඩ හැකි තරම් පිරිසිදු කිරීමේ නිරතව සිටියහ. වනය මැද මී ගව ගාල් පවත්වා ගෙන ගිය ගාල් කරුවෝ කීප දෙනෙක් ගින්න දැක කායශ්‍යාලය බේරා ගැනීම සඳහා දිවගෙන ආහ. බටහිරින් එන සුළඟේ වේගය දැක ඔවුහු කායශ්‍යාලයට විපතක් විය හැකි බව අනුමාන කළහ.

ඒ අතර දකින්නට ලැබුණේ දුර්ලභ දර්ශනයකි.

කැලේ බිඳගෙන ප්‍රාණ භයෙන් යුතුව දුවන ගෝන්නුද හිවල්ලුද, කන් ඉහළට ඔසවා ගත් හාවෝද, පැටවුන් සහිත වල් ඌරෝද, අපේ මිදුල හරහා මෙලෝ හසරක් නැතිව දුවමින් සිටියහ. ඒ අතරට ගවගාල්වල ඇති කරන මී හරක්ද, එකතු වී සිටියෝය. ගිරා රංචුවක් හිසට ඉහළින් පියාසර කළහ. ඒ පිටුපස රතු හංසයින් රංචුවක්ද පියාඹූහ. නැවත ගිරා රංචුවක් පියාසර කළහ. රාම්බිරිජ් සිංහ ඒ දැක පුදුම වී බලා සිටියේය.

"චතුර කොහේවත් නෑ. මේ හංසයෝ කොහේ ඉඳලා ආවද ඕයි රාම් ලගන්?"

ඔහුගේ කථාව අසා ගෝෂ්ය මුහුරි කෝපයට පත්විය.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"අනේ මේ නිකං හිටපං. මෙහෙ අපි පණ බේරා ගන්න නහිනවා. මේ වෙලාවේ රතු හංසයෝ කොහෙන් ආවද කියලා හොයලා ඇති වැඩක් තියෙනවද?"

මිනිත්තු විස්සකින් පමණ ගින්න ළඟටම ආවේය. ඉන්පසු දහයක් පහළොවක් පමණ කණ්ඩායමක් වූ අපි ගින්න සමග විශාල සටනක් ගෙන ගියෙමු. ගිනි නිවීමට ජලය කොහේවත් නැත. අපේ ආයුධ වූයේ අඩක් අමු ගස්වල අතුකොළ සහ පොළොවේ ඇති වැලිය. සියල්ලන්ගේම මුහුණු ගින්නෙන් හා අව් රශ්මියෙන් යකුන්ගේ මෙන් කළු වී තිබිණි. සිරුරුවල අළු හා දැලි තැවරී තිබිණ. අත්වල නහර ඉලිප්පී ආවේය. වැඩි දෙනෙකුගේ සිරුරුවල දිය බුබුළු නැගිණ. කායශ්‍රාලයේ සියලු ලියකියවිලි, පෙට්ටගම්, ඇඳන්, මේස, අල්මාරි ආදිය එළියට ඇද දමා විසුරුවා තිබිණ. බඩු කොහේ කොහේ දැමුවේ දැයි කාටවත් මතක නැත.

"සල්ලි ටිකයි ඔප්පු තිරප්පු ටිකයි විතරක්වත් පරිස්සම් කරලා තියා ගන්න."

මම ලිපිකරු මහතාට කීවෙමි.

කායශ්‍රාලය අසල පිරිසිදු කළ බිම් තීරුව මගින් ඇති කළ බාධකය අසලට පැමිණි ගින්න එතනින් නැවතී උතුරු දකුණු දිසාවට පැතිර ගියේය. අප විසින් කෙසේ හෝ ඒ වනාවේ කායශ්‍රාලය බේරා ගන්නා ලදී. අපි බඩු බාහිරාදිය නැවත ඇතුළට ඇද ගත්තෙමු. එසේ වුවත් විනාශකාරී කැදර ගිනි සිළු මුළු රාත්‍රිය පුරාම ඇත ආකාසය රතු පැහැ ගන්වමින් ඉහළ නගින්නට විය. පසුදා උදය වනවිට ගින්න මෝහනපුරාහි රක්ෂිත වනයේ සීමාව දක්වා පැතිරී ගියේය.

දෙතුන් දිනකින් අපට ආරංචි වූයේ කුශී නදිය අසල කුළු හරකුන් කීප දෙනෙකු, විටාවත් දෙදෙනෙකු සහ ගෝනුන් ගණනාවක් ගං ඉවුරෙන් පහතට වැටී වැළලී ගොස් ඇති බවය. ඔවුන් ගින්නට බිය වී දුවද්දී වැටෙන්නට ඇත. රක්ෂිත වනයේ සිට කුශී නදියට සැතපුම් නවයක පමණ දුරක් විය.

04

වෙසක් පොසොන් මාස ගෙවී ගොස් ඇසල මාසය ළඟා විය. ඇසල මාසයේ මුල් භාගයේ වතු කායශ්‍රාලයේ බදු සංවත්සරය

පැවැත්විණි. මේ පළාතේ වාසය කරන මිනිසුන් වැඩිපුර දැක මුණ ගැසී නැති හෙයින් ඒ විශේෂ දිනයේ බොහෝ දෙනෙකුට ආරාධනා කොට භෝජන සංග්‍රහයක් පැවැත්වීමේ ආශාවක් මා තුළ පහළ වී තිබිණ. ළඟ පාතක ගමක් නැති නිසා ගනෝරී තේවාරි ලවා ඇත ගම්වල මිනිසුන්ට කෑමට ආරාධනා කරවුවෙමි. පෙර දිනයේ අහස වැහි වළාකුළුවලින් බරවී පොද වැහි වැස්සේය. සංවත්සර දිනයේ මහ වැසි වසින්නට පටන් ගත්තේය. දහවල් වන විටම ධාරානිපාත වර්ෂාව නොතකා මිනිස්සු පැමිණෙන්නට පටන් ගත්තෝය. ඔවුන්ට නොතෙමී ඉන්නට තැනක් සකස් කිරීම ඉතා අපහසු කරුණක් විය. පිරිස අතර සිටි ගැහැනුන්ගෙන් වැඩි දෙනෙක් ළමා ළපටින් රැගෙන පැමිණ සිටියහ. කායශ්‍රාලයේ කාමරවල ඔවුන්ට හිඳ ගැනීමට පිළියෙළ කර දුන්නෙමි. පිරිමි අය හැකි ආකාරයට තැන තැන රැඳී සිටියෝය.

නිවෙස්වලට ආරාධනා කොට දන් දීමේ සිරිතක් මෙහි නොවීය. මේ තරම් දිළිඳු පළාත් තිබිය හැකි දැයි මා දැන සිටියේ නැත. බෙංගාලය කෙතරම් දිළිඳු වුවත් එහි සාමාන්‍ය මිනිසුන්ද මොවුන් සමග සසඳන විට පොහොසත් යයි සිතේ. ඔවුන් ධාරානිපාත වර්ෂාව මැද කෑමට ආවත් ඔවුන්ට දීමට තිබුණේ පිසූ වීන තණහාල්, ඇඹුල් වූ මුදවාපු කිරි, පැණි සහ අග්ගලා පමණි. ඒ පළාතේ සාමාන්‍ය භෝජන සංග්‍රහයක් සඳහා සොයා ගත හැකි වූයේ ඒවා පමණි.

අවුරුදු දහයක් දොළහක් පමණ වයස් වූ නාඳුනන කොලුවෙක් උදේ සිට බොහෝ වෙහෙස වූයේය. ඈත ගමකින් පැමිණි දරුවෙක් වූ ඔහුගේ නම බිශුයා විය. උදේ දහයට පමණ ඔහු කෑමට යමක් ඉල්ලුවේය. ගබඩා කාමරයේ වගකීම ලොබ්වුලියාවේ බදු එකතු කරන්නාට පැවරී තිබුණේය. ඔහු ළමයාට වීන තණහාල් ටිකක් හා ලුනු ටිකක් දුන්නේය.

මම පසෙක සිට බලා සිටියෙමි. ළමයා දීප්තිමත් කාල වර්ණයෙන් යුතු විය. මුහුණ සුන්දරය. ඔහු කළු ගලෙන් නෙළූ ශ්‍රී කෘෂ්ණගේ පිළිරුවක් සේය. තමාගේ කිළිටි ධෝතියේ කෙළවරට ධාන්‍ය ටික දමා ගන්නා වෙලාවේ ඔහුගේ මුහුණේ කෙතරම් සුන්දර සිනාවක් රැඳී තිබුණේද? කෙතරම් නැති බැරි වුවත් බෙංගාලි දරුවකු නම් තණහාල් ලැබී සතුටුවෙනවා තබා ඒවා කිසි දිනක අනුභව කරන්නේවත් නැති බව තම් මට පැවසිය හැක. වරක් වීන තණහාල්වල රස බැලුවොත් ඒවා රසවත් ආහාරයක් යයි කිසිසේත් කිව නොහැක.

වර්ෂාව මැද කෙසේ හෝ කෑම පිළිගන්වා අවසන් කර ගැනීමට හැකි විය. නොනවතින වර්ෂාව මැද ගැහැනු තුන් දෙනෙක් මිදුලේ සිට තෙමී තෙත බරිත වී සිටින බව මම සවස් වරුවේ දුටුවෙමි. ඔවුන් බොහෝ වේලාවක සිට එතැන ඉන්නට ඇත. ඔවුන් සමග කුඩා දරුවෝ දෙදෙනෙක්ද වූහ. ඔවුන්ගේ බත් පතට පිසූ තණහාල් බෙදා තිබුණත් මුදවාපු කිරි හෝ පැණි ඔවුන්ට දී තිබුණේ නැත. ඔවුන් කායශාලයේ දොර දෙස බලා සිටියහ. මම බදු එකතු කරන්නාට කතා කොට ඒ ගැන විමසුවෙමි.

"ඒ ගොල්ලන්ට කවුද ඔතන ඉඳන් කන්න දුන්නේ. ඒ ගොල්ලෝ එතැන ඉන්නේ මොකද? මෙච්චර වහිද්දී මිදුලේ ඉන්දෙව්වේ ඇයි?"

"ඒ ගොල්ලෝ දෝෂාද කුලේ අය. ඒ ගොල්ලෝ ගෙයි පිලට වත් ගත්තොත් ගෙදර තියෙන කෑම බීම අයින් කරන්න වෙනවා. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ගංගෝතා කුලවල කවුරුවත් ඒවා කන්නේ නෑ. ඉතින් ඒ ගොල්ලන්ට ඉන්න දෙන්නේ කොහේද?"

මා ඒ දිළිඳු දෝෂාද කුලයේ ගැහැනුන් කීප දෙනා ඉදිරියට තෙමී තෙමී ගිය විට සේවකයෝ කලබල වී ඔවුන්ට කෑම බෙදන්නට වූහ. තණහාල්, පැණි සහ දියාරු වූ මුදවාපු කිරි මොවුන් විසින් අනුභව කරන ලද ප්‍රමාණය දැසින් නුදුටුවොත් විශ්වාස කළ නොහැක. කෑම කෑමේ උනන්දුව දැක ඒ දෝෂාද ගැහැනුන්ට තවත් දිනයක රසැති කෑම වර්ග පිළියෙළ කරවා කන්නට දීමට මම තීරණය කළෙමි. සතියකට පමණ පසු මම බදු එකතු කරන්නා ලවා ඒ දෝෂාද ගම්මැද්දේ ගැහැනුන් කීප දෙනෙකු සහ ඔවුන්ගේ ළමා ළපටින් ගෙන්වා ලුවි නම් රස කැවිල්ලද, මුදවාපු කිරි, වට්ටි ආදියද සහිත රසවත් භෝජන සංග්‍රහයක් පැවැත් වූයෙමි. ජීවිතයේ කවදාවත් එවැනි භෝජන සංග්‍රහයක් භුක්ති විඳීමට ඔවුන් බලාපොරොත්තු නොවන්නට ඇත. ඔවුන්ගේ විස්මයෙන් හා ආනන්දයෙන් එළිය වූ මුහුණු බොහෝ දිනක් යනතුරු මගේ මතකයේ රැඳුණි. අර ඉබාගාතේ ඇවිදින ගංගෝතා කුලයේ ළමයා වන බිශුයාද ඒ කණ්ඩායම අතර සිටියේය.

මිණුම් කඳවුරේ සිට මා අශ්වයා පිට නැගී ආපසු එමින් සිටියදී මානා කැලයේ පදුරක් අසල හිඳගෙන සිටි මිනිසෙක් බැද කැබිලි කරගත් කවිපි වැනි දෙයක් කමින් සිටියේය. භාජනයක් නොමැති නිසා රෙදි පොට කෙළවරේ ඔහු ඒවා ඔතාගෙන සිටියේය. මිනිසෙකුට එතරම් කෑම ගොඩක් කත හැකි දැයි මට සිතා ගත නොහැක. මා

දුටු මිනිසා කෑම අනුභවය නවත්වා නැගිට මට ගෞරවයෙන් යුතුව ආචාර කළේය.

"මැනේජර් මහත්තයා මං කෑම ටිකක් කෑවා. මට සමාවෙන්න."

මිනිසෙක් පාළු තැනක තමන්ගේ පාඩුවේ හිඳ කෑම කෑවාට සමාව ඉල්ලන්නේ මන්දැයි මට තේරුම් ගියේ නැත.

"හා. හා. කන්න. කන්න. නැගිටින්න එපා. මේ උන්නැහේගේ නම මොකක්ද?"

මිනිසා ඒ වනවිට ද හිඳ ගත්තේ නැත. වරදක් කළ කෙනෙකු මෙන් යටහත් පහත්ව පිළිතුරු දුන්නේය.

"සර් මේ අසරණයාගේ නම ධාවතාල් සාහු."

ඔහුගේ වයස අවුරුදු හැටකට වැඩි යයි කිව හැක. කෙට්ටු දිගු සිරුරක් ඇති ඔහු කාලවර්ණ තැනැත්තෙක් විය. හැඳ සිටියේ හොඳටම කිළිටි වූ රෙද්දකි. දෙපාවල සෙරෙප්පු නොවීය.

ධාවතාල් සාහු මට ප්‍රථමයෙන් හමුවීයේ එසේය. කායශාලයට පැමිණි පසු රාම්ජෝති නම් බදු එකතු කරන්නාගෙන් මම ඔහු ගැන ප්‍රශ්න කළෙමි.

"ධාවතාල් සාහු කියල කෙනෙක් අඳුනනවද?"

"එහෙමයි සර්. මේ පළාතේ ධාවතාල් සාහු ගැන නොදන්න කෙනෙක් ඉන්නවද? මිනිහා ලොකු පෝසතෙක්. ලක්ෂපතියෙක්. මේ පැත්තේ හැම මිනිහම වගේ මිනිහට ණයයි. ගෙදර තියෙන්නේ නවගව්වියාවේ."

රාම්ජෝත්ගේ කථාව ඇසූ මම පුදුමයට පත් වූයෙමි. ලක්ෂපතියෙකු නම් වනය මැද හිඳගෙන කිළිටි රෙදි පොටක ඔතා ගත් කවිපි කයිද? අපේ පළාත්වල ලක්ෂපතියන් ගැන නම් එසේ සිතීමට අමාරුය. මොහු ධාවතාල් ගැන අතිශයෝක්තියෙන් කියන්නට ඇතැයි මම සිතුවෙමි. එසේ වුවත් අනික් අයගෙන් ඔහු ගැන ඇසුවත් ඔවුන් කීවේද එයට සමාන දෙයකි.

"ධාවතාල් සාහුද? මිනිහගේ වත්කම මෙච්චරයි කියලා කියන්න බෑ."

ඉන්පසු දිනක් තමාගේ කාර්යයක් සඳහා ධාවතාල් සාහු මා හමුවීමට පැමිණියේ ය. ටිකෙන් ටික ඔහු සමග කතාවට වැටුණු මට තේරුම් ගියේ ඉතා අමුතු චරිතයක් ඇති මිනිසෙකු හඳුනා ගැනීමට

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මට අවස්ථාව ලැබුණු බවය. විසිවන සියවසෙහි මෙවැන්නන් සිටීදැයි නුදුටුවොත් කෙනෙකු විශ්වාස නොකරනු ඇත.

ධාවතාල්ගේ වයස අවුරුදු හැට තුනක් පමණ විය. කායශ්‍යාලයට ගිනිකොන පැත්තේ වනය කෙළවරේ සිට සැතපුම් දොළහක් පමණ දුරින් නවගවිඡියා නම් ගමක ඔහුගේ නිවස පිහිටියේ ය. මේ පළාතේ සාමාන්‍ය මිනිස්සු, වැවිලි කරුවෝ, ඉඩම් හිමියෝ, ව්‍යාපාරිකයෝ පවා මොහුගේ ණය කරුවෝය. එසේ වුවද අපූරුම කරුණ වන්නේ මුදල ණයට දී ඒවා ආපසු ගැනීමට කිසි දිනක බල නොකිරීමය. බොහෝ මිනිසුන් ඔහුට මුදල් යෑහෙන ප්‍රමාණයක් වංචා කර ඇත. ඔහු මෙන් වූ අහිංසක මිනිසෙකුට මුදල් ණයට දෙන කායශ්‍යය කිසි සේත් ම නොගැලපේ. එසේ වුවද මිනිසුන්ගේ බලවත් ඉල්ලීම් ඔහුට ඉවත දැමිය නොහැක. හොඳ පොළියක් ලැබෙන නිසා රැකියාවක් වශයෙන් මෙය කිරීම සුදුසු යයි ඔහු සිතයි. දිනක් ධාවතාල් මා මුණ ගැසෙන්නට පැමිණියේය. ඔහු රෙදි කැබැල්ලක ගැට ගැසූ පැරණි ඔප්පු තිරප්පු වගයක්ද ගෙන ආවේය.

"සර් කරුණාකරලා මේ ලියකියවිලි ටික පොඩ්ඩක් බලනවද?"

ඒවා පරීක්ෂා කළ විට රුපියල් හත් අටදාහක් වටිනා බැදුම්කර එහි ඇති බවද, නියමිත කාලයට නීතිමය පියවරක් නොගැනීම නිසා ඒවායේ වලංගු කාලය ඉකුත් වී ඇති බවද මට පෙනී ගියේය. රෙදි පොටේ තවත් තැනක දිරාපත් වූ තවත් ලියවිලි ගොඩක් විය.

"මේ ටිකත් බලන්න සර්. මං හිතුවේ මේවා ටවුමට ගිහිල්ලා පෙරකදෝරු මහත්තයෙකුට පෙන්නන්න ඕනෑ කියලා. ඒ වුනාට මං ඒ වැඩේ කවදාවත් කරලත් නෑ. කරන්න හිතන්නෙත් නෑ. මං ගිහින් සල්ලි ගැන මතක් කලාම හුහ දෙනෙක් දෙන්නම් දෙන්නම් කිය කියා මග අරිනවා."

ඒ ලියවිලි ද බැලූ විට ඒවාද යල් පැනගිය ඒවා බව පෙනිණි. එනැනම රුපියල් හාර පන්දාහක ණය බැඳුම් කර විය. මේ අහිංසක මිනිසාව හැම දෙනා විසින් ම රවටනු ලැබ ඇත.

"සාහුජී. මේ වැඩේ සාහුජීට හරියන්නේ නෑ. රාස බිහාරි සිංහගේ ගොරෝසු ගති තියෙන රාජ්පුත්වරුන්ට තමයි මේ පළාතේ සල්ලි පොළියට දෙන රස්සාව කරන්න පුළුවන් වෙන්නේ. ඒ ගොල්ලෝ පොලු අරන් සටන් කරන මිනිස්සු හත් අට දෙනෙක් තියාගෙන ඉන්නේ. ඒ මිනිස්සු ණය කාරයන්ගේ කුඹුරුවලට අශ්වයා පිටින්

ගිහිල්ලා බලෙන් අස්වැන්න අරන් ඇවිල්ලා ණයයි පොළියයි පියවා ගන්නවා. සාහුජී වගේ අහිංසක අයගෙන් ණයට ගන්න සල්ලි කවුරුවත් ආපසු දෙන්නේ නෑ. මීට පස්සෙ කාටවත් සල්ලි ණයට දෙන්න එපා."

ධාවතාල්ට මේ ගැන කරුණු කියා අවබෝධ කරවිය නොහැක.

"හැමෝම එහෙම වංචා කරන්නේ නෑ සර්. තාමත් ඉර හඳ පායනවානේ. දුප්පත් මිනිසුන්ට පිහිට වෙන අය තාමත් ඉන්නවා. සල්ලි පොදි ගහගෙන ඉන්න පුළුවන් ද? පොළියට නොදී ඉන්න බෑ. මේක මගේ රස්සාව නේ සර්."

මොහුගේ මේ තර්කය මට තේරුම් ගියේ නැත. පොළිය ගැන ආසාවෙන් මුදල් නැති කර ගැනීම කෙබඳු රැකියාවක් දැයි මම නොදනිමි. ධාවතාල් සාහු මා ඉදිරි පිටම නොමැළවුණු මුහුණින් යුතුව රුපියල් පහළොස් දාහක පමණ යල් පැනගිය ණයකර ඉරා දැමුවේය. ඔහු එය කළේ අහක දමන කඩදාසි මිටියක් ඉරා දමන පරිද්දෙනි. ඔහුගේ අත වෙව්ලුවේ නැත. කටහඬේ ස්වරය වෙව්ලුවේද නැත. බෝග විකුණලා සල්ලි ටිකක් හොයා ගත්ත සර්. දෙමව්පියන්ගෙන් උරුම වෙච්ච එක සතයක් වත් නිබුණේ නෑ. මං හම්බ කරපු දේවල් නිසා මටමයි පාඩු වුනේ. මේ වගේ රස්සාවල් කරන්න ගියාම ලාබ පාඩු දෙකම වෙනව සර්."

"ඒක නම් ඇත්ත තමයි."

එසේ වුවත් මෙතරම් ලොකු පාඩුවක් සන්සුන් ලෙසද, උදාසීන ලෙස ද ඉවසිය හැක්කේ ඉතා ටික දෙනෙකුට පමණි. පොහොසත් මිනිසුන් තුළ පවතින මානය මුසු ආටෝපය ඔහු තුළ මා දුටුවේ එක් සිද්ධියක දී පමණි. රතු රෙදිවලින් මැසූ පසුම්බියකින් ඔහු වරින් වර ගිරයක් ගෙන පුවක් ගෙඩියක් ලියා කටේ දමා ගනියි. ඔහු මා දෙස බලා වරක් සිනා මුසු මුහුණින් යුතුව මෙසේ කීය.

"හැමදාම පුවක්වලට මට ලොකු වියදමක් යනවා."

ලොකු පාඩුවක් වූ විට එය උපහාසයට ලක් කිරීම දාර්ශනික බවේ ලක්ෂණයක් නම් ධාවතාල් සාහු මෙන් වූ දාර්ශනිකයකු මා දැක නැත.

ඒ පළාතේ නිතර ඇවිදින විට මට කුම්භකාර ජයපාලගේ කොළ අතු සෙවිලි කළ කුඩා පැල්පත හමු වේ. කුම්භකාර යනුවෙන් විශේෂණ පදයක් යෙදුවත් ඔහු බ්‍රාහ්මණ වංශිකයෙක් විය.

පැරණි අත්තික්කා ගසක් අසල ජයපාලගේ නිවස පිහිටියේ ය. ඔහු විසුවේ තනිවම ය. වයස් ගත කෙනෙකු වූ ඔහු කෙට්ටු උස් සිරුරක් ඇති අයෙක් විය. ඔහුගේ සුදු හිසකෙස් දිගට වැවී තිබිණ. මා ඒ අසලින් යනවිට ඔහු තම පැල්පතේ ඉදිරි දොර අසල තිහඩ ව සන්සුන් ව හිඳගෙන සිටින ආකාරය දක්නට ලැබේ. ජයපාල දුම් බොනු හෝ වෙනත් වැඩක් කරනු දක්නට ලැබෙන්නේ නැත. ගීතයක් හෝ නොකියා ඒ අන්දමින් නොසොල්මනේ කෙනෙකුට එක දිගට හිඳගෙන සිටින්නට හැකිදැයි මට සිතාගත නොහැක. ජයපාල පිළිබඳව මට ඇති වූයේ විස්මයක් හා කුතූහලයකි. එතැනින් යන හැම වරම ඔහුගේ පැල්පත ඉදිරියේ අශ්වයා නවත්වා ඔහු සමග වචන දෙක තුනක් කථා කර යාමට මම පුරුදු වූයෙමි.

"ජයපාල. මෙතැන ඉඳගෙන මොකද කරන්නේ?"

"ඔහේ නිකං ඉඳගෙන ඉන්නවා සර්."

"ජයපාලගේ වයස කීයද?"

"කියන්න දන්නේ නෑ හාමුදුරුවනේ. කුශී ගහේ මහ ගංවතුර කාලේ මං මී හරක් දක්කගෙන යන්න තරම් ලොකුයි."

"කසාද බැන්දේ නැද්ද? ළමා ළපටි හිටියේ නැද්ද?"

"පවුල මැරුණේ අවුරුදු විසි පහකට විතර කලින්. දුවලා දෙන්නෙක් හිටියා. ඒගොල්ලොත් අවුරුදු දහතුනකට දාහතරකට ඉස්සෙල්ලා මැරිලා ගියා. දැන් මම තනියම ඉන්නේ."

"මෙතැන තනියම ඉන්නේ කොහොම ද? කා එක්කවත් කතා කරන්නේ නෑ. වැඩක් පලක් කරන්නේත් නෑ. ඔහොම ඉන්න පුළුවන් ද? පාළු නැද්ද?"

ජයපාල විස්මය රැඳි දෙනෙතින් මා දෙස බැලුවේය.

"මොන පාළුවක් ද? මං මේ අපූරුවට ඉන්නේ. මට මෙහෙම ඉන්න පුළුවන්."

මට ජයපාලගේ කතාව විශ්වාස කළ නොහැකි විය. කල්කටාවේ ඉගෙන ගන්නා විට මා පුරුදු වී සිටියේ වැඩක් නැති විට යහළුවන් සමග සතුටු සාමිචියේ යෙදෙන්නට ය. නැතිනම් පොතක් කියවන්නට ය. සමහර විට චිත්‍රපටි බැලීමට හෝ ඇවිදීමට යාමට මම පුරුදුව සිටියෙමි. මෙවැනි දේ නොමැතිව මිනිසුන් කාලය ගෙවා ගන්නේ කෙසේදැයි මට තේරුම්ගත නොහැකි විය. පසුගිය කාලය ඇතුළත ලෝකය කොපමණ වෙනස් වී ඇද්ද? පසුගිය විසි අවුරුද්දක

පමණ කාලය ඇතුළත දවසේ වැඩි කාලයක් තමාගේ නිවසේ දොරකඩ හිඳගෙන සිටි ජයපාල වෙනස් වන ලෝකය ගැන දන්නේ මොනවාද? මම පාසලේ පහළ පන්තියේ ඉගෙන ගන්නා කාලයේදී ඔහු මේ අන්දමින් හිඳගෙන සිටින්නට ඇත. මා උපාධි විභාගය සමත් වන විටත් ඔහු මේ අන්දමින් හිඳගෙන සිටින්නට ඇත. මම මගේ ජීවිතයේ මුහුණ දුන් විවිධාකාර සිදුවීම් සමග ජයපාලගේ විචිත්‍ර බවක් නැති පාළු ජීවිතයේ සිදුවීම් සංසන්දනය කරන්නට වීමි.

ජයපාලගේ නිවස ගමේ මැද හරියට වන්නට පිහිටා ඇතත් ඒ අසල පැවැති විශාල මුඩු බිම් ද ඉරිහු කෙත් ද නිසා ඒ අසල වෙනත් ගෙයක් නොවීය. ථූලකියා යනුවෙන් හැඳින්වෙන්නේ ඉතා කුඩා ගමකි. එහි නිවාස ඇත්තේ දහයක් පහළොවක් පමණි. එහි ගම් වැසියෝ වතු යායට අයත් ඉඩම්වල මී හරකුන් ඇති කිරීම තම ජීවනෝපාය කර ගත්හ. මී හරකුන් පසුපස ඇවිද වෙහෙස වන ඔවුහු රාත්‍රියට අහල පහළ අය සමග එකතු වී ගිනි මැල වටා හිඳගෙන සල් කොළවලින් සාදාගත් සුරුට්ටු උරමින් කතා බහ කිරීමට පුරුදු වී සිටිති. අපේ පළාතේ මෙන් දුම් පයිප්පවලට දුම්කොළ දමා පිළියෙළ කර බීමට මෙහි සිටින මිනිස්සු පුරුදු වී නොසිටියාහ. ගමේ මිනිසුන්ගෙන් කවුරුන් හෝ ජයපාල සමග කතා කරමින් සිටිනු මා දැක නැත.

පැරණි අත්තික්කා ගස මුදුනේ කොක්කු රැනක් වසා සිටිති. ඇත සිට බලන කෙනෙකුට පෙනෙන්නේ ගස මුදුනේ සුදු මල් පිපී ඇති බවය. එතැන සන සෙවණැලි සහිත පාළු තැනකි. කුමන දිශාව බැලුවත් අතින් අත අල්ලා රවුමට සිට ගත් කුඩා දරුවන් පෙළක් සේ වූ නිල්වන් කඳු පෙළක් ඇතින් පෙනේ. මා අත්තික්කා ගස යට සෙවණේ නැවතී ජයපාල සමග කථා බස් කරද්දී ඒ සුවිසල් රුක් සෙවණේ වූ ශාන්ත සුවයත් ගෙහිමියාගේ සන්සුන් මඳවේගී ජීවන රටාවත් මා තුළ එක්තරා අන්දමක බලපෑමක් ඇති කරන්නට විය. තැන තැන දුව පැන ඇවිදීමෙන් ඇති ඵලය කුමක්දැයි එහි සිටින විට හැඟේ. නිවී සැනසිල්ලක් සිතට ලබා දෙන ශාන්ත රුක් සෙවණ කෙතරම් අපූරු ද? අතීතයේ සියවස් ගණනාවක් පසු කර ගමන් ගත් කාලයේ වඩදියට හසු වී නිතැතින්ම පාවී යාමට හැකි වේ නම් එය කෙතරම් පහසු දෙයක් ද?

ජයපාලගේ ජීවන ධාරාවේ බලපෑමෙන්ද හාත්පස වූ බාධා-බන්ධන රහිත ස්වාභාවික පරිසරයේ බලපෑමෙන්ද මම උදාසීන,

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

සන්සුන්, චංචල රහිත කෙනෙකු බවට පත් වීමි. එපමණක් නොව මීට පෙර මා තුළ නොවූ විරූ ඇසක් අලුතෙන් විවෘත වූ සේය. මම වෙනදා නොසිතූ ආකාරයකට සිතන්නට පටන් ගතිමි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ නිදහස් තෘණ භූමියටත්, අඳුරු නිල්වන් වනගත පරිසරයටත් මම දැඩි ලෙස ආදරය කරන්නට වීමි. පූර්ණියා හෝ මුංගේර් නගරවලට වැඩකට ගියත් ආපසු එනතුරු සිත සාංකාවෙන් බර වන තරමට ඒ ඇල්ම බලවත් වේ. ආපසු වනයට ඇතුළු වන්නේ කොයි වේලාවේදැයි සිත නොඉවසිලිමත් වේ. ජනශූන්‍ය පරිසරයේ වැටෙන සඳ එළිය, හිරු බැස යනවිට දැකින අපූරු දර්ශනය, දිගන්තය තෙක් විහිද ගිය වෙසක් මහේ වැහි වළා, තාරකා පිරුණු සරත් සමයේ රාත්‍රිය යනාදිය ගැන සිහි වී ඒවා අතරට වැදී සැහවෙන්නේ කොයි වේලාවේදැයි සිත නොසන්සුන් වේ.

මා ආපසු එන ගමනේදී නූතන ශිෂ්ටාචාරයට අයත් මිනිසුන් සිටි ගම්ද, මුකුන්දි නම් බදු එකතු කරන්නාගේ සීමා කනුවද පසුකර වන සීමාවට ඇතුළු වූයෙමි. එවිට ඈත දිගන්තය තෙක් විහිදුණු නිල්වන් වනය- තෘණ භූමිය-ස්ථූප හැඩය ගත් ගල් පර්වත - ගිරවුන්ගේ නද දීම්-ගෝනුන් රැළ-හිරු එළිය-නිදහස් ලෙස පැතිරී ගිය ධරණී තලය යන මේ සියල්ල මා මොහොතකින් වසඟ කර ගත්තේය.

05

එදා සඳ එළිය හොඳින් පැතිරී තිබුණි. ඇට කටුවලට කා වදින තරමේ සීතලක් පැවතුණු ඒ දිනයේ මම ප්‍රධාන කාර්‍යාලයේ සිට ලොබ්ටූලියාවේ පිහිටි උප කාර්‍යාලයේ වැඩ බැලීමට ගියෙමි. එහි හැම දෙනාම කෑම කා අවසන් වන විට රාත්‍රී එකොළහ පමණ වේ. කෑම බීම ගෙන අවසන් වී කුස්සියේ සිට පිටතට පැමිණ බැලූ විට මහ රෑ දැඩි සීතල නොතකා ගැහැනු කෙනෙක් කාර්‍යාලය මිදුලේ සිට ගෙන සිටින බව සඳ එළියෙන් දුටුවෙමි.

"කවුද අතන හිටගන ඉන්නවා පේන්නේ?"

මා මෙසේ ඇසූ විට බදු එකතු කරන නිලධාරියා පිළිතුරු දුන්නේ ය.

"ඒ තමයි සර් කුන්තා. තමුන්නාන්සේ එන බව අහලා ඊයේ ඇවිත් මගෙන් ඇහුවා, මැනේජර් මහත්තයා එනවා නේද කියලා. මගේ දරුවන්ට කන්න දෙන්න උන්නැහේ ඉතුරු කරන බත් ටික අරන් යන්න එනවා කියලාත් කිව්වා. මං කිව්වා හා කියලා."

අප කතා කරමින් සිටියදී බලෝයා නම් සේවකයා මා ඉතිරි කළ පරිප්පු මිශ්‍ර බත්, මාළු කැබලි, ඵලවළු සහ කිරි මිශ්‍ර බත්, යන සියල්ල රැගෙන ගොස් ගැහැනිය ගෙන ආ පිත්තල භාජනයකට දැම්මා ය. ගැහැනිය ඒවා රැගෙන යන්නට ගියා ය.

වැඩ කටයුතු සඳහා දින දහයක් පමණ මම ලොබ්ටූලියාවේ නැවතී සිටියෙමි. සැමදාම මහ රෑ ඒ ගැහැනිය මා ඉතිරි කරන කෑම ටික රැගෙන යාම සඳහා දැඩි සීතල ද නොතකා ළිඳ අසල සිටගෙන සිටිනු මම දුටුවෙමි. සීතලෙන් බේරීමට පොරෝනයක්වත් ඈ ළඟ නොතිබුණු බව පෙනෙන්නට තිබිණ. ඇය තමාගේ සාරි පොට පොරවාගෙන සිටියාය. සැමදාම ඇය එලෙස සිටිනු දුටු මම කුතූහලයෙන් යුතුව ඒ ගැන බදු එකතු කරන්නාගෙන් විමසුවෙමි.

"හැමදාම බත් ගෙනියන්න එන කුන්තා කවුද? මේ කැලේ කොහේ ද ඉන්නේ? දවල්ට නම් පේන්න නෑ."

"මං පස්සේ විස්තරේ කියන්නම්කෝ සර්."

ගෙය තුළ දර පතුරු දල්වා ගිනි ගොඩක් ගසා තිබිණි. මම ඒ අසල පුටුවක් තබාගෙන අයවැය සකස් කරන්නට වීමි. එදිනට කළ වැඩ කොටස සෑහේ යයි මට සිතුණ විට ලියකියවිලි පසෙකින් තබා බදු එකතු කරන්නාගේ කතාව ඇසීමට සූදානම් වූයෙමි.

"මේ අහන්න සර්. අවුරුදු දහයකට විතර ඉස්සෙල්ලා මේ පළාතේ දේවි සිං කියලා බොහොම බල සම්පන්න රාජපුත්වරයෙක් හිටියා. ගංගෝතා කුලයේ අයයි, ගොවි කුලවල අයයි ඒ මිනිහට බොහොම බයෙන් හිටියේ. දේවි සිං කළේ ඒ ගොල්ලන්ට පොළියට සල්ලි දෙන එක. මිනිහා ළඟ පොලු හරඹ කාරයෝ හත් අට දෙනෙක් හිටියා. හරියට ණය ගෙව්වේ නැති නම් මිනිස්සු පොලු හරඹවලින් බය ගන්නලා ණයයි පොළියයි එකතු කළා. ඒ කාලේ දේවි සිං දැන් ඔය ඉන්න රාස බිහාරි සිං වගේ තමයි.

දේවි සිං ජෞනපුර් දිස්ත්‍රික්කයේ ඉඳලා ඇවිත් පූර්ණියාවල පදිංචි වුණා. එහේ ඉඳලා මෙහේ ඇවිත් මෙහේ මිනිසුන්ව බය ගන්නගෙන වගේ ජීවත් වුණා. මෙහේ ඇවිත් අවුරුදු කීපයකට පස්සේ මිනිහා බරණැසට ගියා. එහේ මුස්ලිම් බායිජී කෙනෙකුගේ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ගෙදර ගීත අහන්න ගිහින් බායිජීගේ අවුරුදු පහළොවක විතර දුවෙක් එක්ක යාළු වුණා. ඊට පස්සේ ඒ කෙල්ලත් එක්ක පැනලා ඇවිත් මෙහේ හිටියා. ඒ වෙන කොට දේවි සිංගේ වයස අවුරුදු විසි අටක් විතර ඇති. මෙහේ ඇවිත් මිනිහා ඒ කෙල්ලව කසාද බැඳගෙන හිටියා. කෙල්ල බායි ජී කෙනෙකුගේ දුවක් බව දැන ගත්තම දේවි සිංගේ පවුලේ අය, සහෝදරයෝ එහෙම, මිනිහගෙන් කන බොන එක පවා නවත්තලා පවුලෙන් අයින් කළා. සල්ලි බලේ නිසා දේවි සිංමේ කිසි දෙයක් ගණන් ගත්තේ නෑ. පස්සේ බොරු ආටෝපේ පෙන්නාගෙන ජීවත් වෙන්න ගිහින් නිකරුණේ සල්ලි නාස්ති කළා. රාස බිහාරි එක්ක නඩු කියන්න ගිහින් හැමදේම නැති කර ගත්තා. දේවි සිං මැරිලත් ගිහින් දැන් අවුරුදු හතරක් වෙනවා.

මේ කුන්තා තමයි ඒ දේවි සිංගේ පවුල. එක කාලයක් මෙයා දිලිසෙන බ්‍රොකේඩ් රෙද්දෙන් රැළි අල්ලපු දෝලාවක නැගලා කුශී ගහයි කලබලියා ගහයි එකතු වෙන තැනට නාන්න යනවා. සූකිරි වගේ රස දේවල් තමයි කෑවේ. එහෙම හිටපු ගෑනි දැන් මේ තත්වෙට වැටිලා. බායි ජී කෙනෙකුගේ දුවක් නිසා කවුරුවත් මෙයාව තමන්ගේ කුලයට වැද්ද ගන්නේ නෑ. මිනිහගේ නෑයින්වත්, ගංගෝතා කුලේ අයවත් කුන්තාව ගෙදරට වැද්ද ගන්නේ නෑ. අස්වනු නෙළන කාලෙට කුඹුරුවලින් තිරිඟු කපාගෙන ගියාම බිම වැටිලා තියෙන ඉරිඟු ඇට අහුල අහුලා කුඹුරක් ගානේ ඇවිදින කුන්තා මාස දෙක තුනක්වත් ඒවායින් ළමයින්ට කන්න දෙනවා. බඩ පිරෙන්න කන්න නොලැබුණත් කුන්තා කාටවත් අත පානවා මං දැකලා නෑ. තමුන්නාන්සේ සමිංදාර්ගේ මැනේජර් නිසා රජෙක් වගේ කියලා සලකලා ඉතුරු කරන දේ අරන් යන්න එනවා. ඒක නින්දාවක් නෙමෙයි කියලයි කුන්තා හිතන්නේ."

"අර බායි ජී කෙනෙක් කියලා කිව්ව මෙයාගේ අම්මා ඊට පස්සේ මෙයා ගැන හොයලා බැලුවේ නැද්ද?"

"මං නම් කවදාවත් අහලා නෑ කුන්තාගේ අම්මා එයා ගැන හෙව්ව බවක්. කුන්තාගේ අම්මා එයා ගැන හෙව්වේ නෑ. මෙයා දුක් විඳ විඳ කොහොම හරි දරුවන්ව රකිනවා. එක කාලයක් නම් මේ තරම් ලස්සන කෙනෙක් පළාතේම හිටියේ නෑ. දැන් ඉතින් කනවැන්දුම් වුනාට පස්සේ දුක් විඳලම ඒ ලස්සන ගිහිල්ලා. ඔය කුන්තා හරි තැන්පත් කෙනෙක්. ඒ වුනාට මේ පැත්තේ මිනිසුන්ට එයාව පෙන්නන්න බෑ. දැක්කම නහය අකුල ගන්නවා. බායිජී කෙනෙකුගේ දුවෙක් කියලා හෙළා දකිනවා."

"ඒ වුනාට මේ රෑ මැද ලොබ්ටූලියා ගමට කැලෑව මැදින් යන්නේ කොහොමද? හැතැප්ම එක හමාරක් විතර තියෙනවා නේද?"

"ඒවාට බය වෙලා පුළුවන්ද සර්? තනියම තමයි කැලෑවේ මැදින් යන්න වෙන්නේ. කවුද ඉන්නේ ගිහින් ඇරලන්න?"

ඒ දුරුතු මාසයයි. ඒ මාසයට නියමිත ගනුදෙනු ගැන වැඩ කටයුතු අවසන් කොට මම ආපසු නවාතැනට ආවෙම්. නවම් මස මැද භාගයේදී පමණ තණ බිම් කොටසක් බදු දීම පිණිස මට නැවත ලොබ්ටූලියාවට යාමට සිදු විය.

ඒ වන විට ද සීතල මදක්වත් අඩු වී නොතිබිණ. බටහිර දිසාවෙන් හැමූ සුළඟ නිසා රෑ වන විට සීතල දෙගුණ විය. දිනක මම වතු යායේ උතුරු සීමාව පැත්තේ ඇවිදින්නට ගියෙමි. බොහෝ ඈතට විහිදී ගිය මසං කැලයේ සැහෙන දුරක් ගමන් කළෙමි. ජාපරා සහ මජෑපූර් දිස්ත්‍රික්කවලින් ආ මිනිසුන් මසං කැලය බදුගෙන ලාක්ෂා කෘමීන් ඇති කොට ලාකඩ කර්මාන්ත පවත්වා ගෙන ගොස් බොහෝ මුදල් උපයති.මසං කැලය මැදදී මට පාර වැරදිණි හදිසියේ ගැහැනියකගේ හැඬුම් ශබ්දයක් මගේ කනට වැටුණේය. ඒ සමගම දරු දැරියන් කීප දෙනෙකුගේ විලාප හඬ ද කර්කශ රළු පිරිමි හඬකින් කිසිවෙකුට බනින හඬ ද ඇසිණ. මඳ දුරක් ඉදිරියට ගොස් බැලූවිට මසං කැලය බදු ගත් අයගේ සේවකයකු ගැහැනියකගේ කෙස් වැටියෙන් අල්ලා ගෙන ඇදගෙන එන ආකාරය දුටුවෙමි. ගැහැනිය හැඳ සිටියේ ඉරී ගිය කිළිටි සාරියකි. හඬමින් සිටි කුඩා දරු දැරියන් කීප දෙනෙක්ද එහි සිටියහ. සේවකයින්ගෙන් එක් අයෙකුගේ අතෙහි වූ කුඩයක මසං ගෙඩි ටිකක් විය. මා දුටු සේවකයෝ වඩාත් ධෛර්‍යවත් වී විස්තර කියන්නට වූහ. ඔවුන් කියූ දෙයෙහි සාරාංශය නම් බදු ගත් ඉඩමෙන් මේ ගැහැනිය මසං ගෙඩි සොරකම් කරද්දී අසු වී ඇත. ඇය බදු එකතු කරන නිලධාරියාට අල්ලා දීම පිණිස ඈද ගෙන යද්දී මා හමු වීමෙන් ඔවුහු වඩාත් සතුටට පත් වූහ.

මා පළමුවෙන් ම කළේ ඇය ඔවුන්ගේ ග්‍රහණයෙන් මුදවා ලීම ය. ගැහැනිය බියෙන් හැකිළී අසල වූ මසං පඳුරට මුවා වී සිට ගත්තා ය. ඇගේ අසරණ විලාසය දුටු මා තුළ දැඩි අනුකම්පාවක් ඇති විය.

ඔවුහු මේ කාරණය පහසුවෙන් අතහැර දැමීමට සූදානම් නොවූහ. මම ඔවුන්ට කරුණු පහදා දුනිමි.

"මේ අහනවා. අසරණ දුප්පත් ගෑනියෙක් තමන්ගේ දරුවන්ට කන්න දෙන්න ඇඹුල් මසං ගෙඩි ටිකක් කඩා ගත්තට ලාකඩ

කර්මාන්තෙට සිද්ධ වෙන පාඩුව මොකද්ද? ඔය ගෑනු කෙනාට යන්න දෙන්න."

"තමුන්නාන්සේ දන්නේ නෑ. මෙයාගේ නම කුන්තා. ලොබ්ටූලියාවේ ඉන්නේ. මෙයාට හොරකම් කරලා පුරුදුයි. ගිය අවුරුද්දෙත් මසං හොරකම් කරලා අතටම අහු වුණා. මේ පාරවත් දඬුවමක් නුදුන්නොත්."

මම නිගැස්සී ගියෙමි.

කුන්තා! මා ඇය හඳුනා නොගත්තේ රාත්‍රියේ මිසක දිවා කාලයේ මා ඇය දැක නො තිබීම නිසා ය. මා ඒ සේවකයින්ට බැන වැදී ඇයව නිදහස් කළෙමි. ඇය පොළොව පලා ගෙන යාමට තරම් වූ ලැජ්ජාවකින් යුතුව තම දරුවන් සමග යන්නට ගියාය. ඇය යද්දී මසං කුඩයත් කෙක්කත් එතැන ම දමා ගොස් තිබිණ. ඇය එසේ කරන්නට ඇත්තේ බියත් ලැජ්ජාවත් නිසා වන්නට ඇත. මම එහි සිටි කෙනෙකුට ඒවා කායර්‍යාලයට ගෙනැවිත් දෙන්නැයි කීවෙමි. මා ඒවා අත් අඩංගුවට ගත්තා යයි සිතා ඔවුහු සතුටු වූහ. කායර්‍යාලයට පැමිණ බනවාරී ලාල් නම් බදු එකතු කරන නිලධාරියාට කතා කළෙමි.

"බනවාරිලාල්. ඔය ගොල්ලන්ගේ පළාතේ මිනිස්සු මෙච්චර නපුරු ඇයි?"

මා එසේ ඇසූ විට බනවාරිලාල් කණගාටු විය. ඔහු ගුණ යහපත් කෙනෙකු බවත් අන් අය සමග සසඳන විට උණුවෙන හදවතක් ඇති කෙනෙකු බවත් මම දැන සිටියෙමි. කුන්තාගේ කුඩයත් කෙක්කත් මම සේවකයකු අතේ කුන්තාගේ නිවසට පිටත් කර හැරියෙමි.

එදායින් පසු කුන්තා ඉතිරි වූ බත් ගෙන යාමට කායර්‍යාලයට නො ආවා ය. ඇය නො එන්නට ඇත්තේ ලැජ්ජාව නිසා වන්නට ඇත.

සීත කාලය හමාර වී වසන්ත කාලය එළඹිණ.

අපේ වතුයායේ ගිනිකොන පැත්තේ මායිමේ සිට සැතපුම් පහළොවක් පමණ දුරින් නැතහොත්, ප්‍රධාන කායර්‍යාලයේ සිට සැතපුම් තිහක් පමණ දුරින්, මැදින් මාසයේ හෝලි උත්සව දිනයේ ගම්බද සැණකෙළියක් පැවැත්වෙන බව මට දැනගන්නට ලැබිණ. මම එහි යාමට තීරණය කර ගතිමි. බොහෝ දිනකින් මහ සෙතගක් එකතු වී සිටිනු මට දකින්නට ලැබුණේ නැත. ඒ පළාතේ සැණකෙළි

පැවැත්වෙන්නේ කෙසේ දැයි දැන ගැනීමේ කුතුහලයක් ද මා තුළ විය. එසේ වුවද කායර්‍යාලයේ සේවකයෝ එහි නොයන ලෙස මගෙන් නැවත නැවත ඉල්ලා සිටියෝය. එහි යන මාර්ගය ඝන වනාන්තරයෙන් වටවූ කඳු පර්වත සහිත ඉතා දුෂ්කර වූවකි. එලෙසම මගදී ව්‍යාඝ්‍රයන් හා කුඵ මීමුන් හමු වේ යැයි බියක් ද පවති. ඒ අතර තුර ගම්මාන තිබුණත් ඒවා පිහිටියේ එකිනෙකට බොහෝ ඈතිනි. කරදරයක් වුව හොත් පිහිටට ඒමට ඒ ගම්වල අයට හැකි නොවේ යැයි සේවකයෝ කීහ.

ජීවිතයේ කවදාවත් මගේ සිතේ ඇති ධෛර්‍යය උරගා බැලීමේ අවස්ථාවක් මට ලැබුණේ නැත. කල්කටාවට පෙරළා ගියහොත් නැවත මෙවැනි අවස්ථාවක් ලැබේද? ව්‍යාඝ්‍රයින් හා කුඵ මීමුන් ගැන අසන්නට වත් ලැබේද? එවැනි යමක් කළ හැකි වන්නේ මෙහි සිටින කාලය තුළම ය. අනාගතයේ දී මගෙන් කතා අසන්නට එන මුනුබුරු මිනිබිරියන්ගේ උනන්දු සහගත මුහුණු හා ඔවුන්ගේ දෙනෙත්වල බැල්ම ගැන කල්පනා කොට මුනේශ්වර්, නවීන් බාබු, බදු එකතු කරන නිලධාරියා යන සියල්ලන්ගේම බාධා කිරීම් ගණන් නොගෙන සැණකෙළිය පැවැත්වෙන දිනයේ උදේ පාන්දර අශ්වයා පිට නැගී ගමන යන්නට පිටත් වූයෙමි. අපේ වතුයායේ මායිම පසු කිරීමට පැය දෙකක් පමණ ගත විය. ගිනිකොන දිග මායිමේ කැලෑව වඩාත් ඝන එකක් විය. එහි පාරක් නොමැති තරමය. අශ්වයා පිට නැගී මිස වාහනයකින් එහි යෑම කළ නොහැකි විය. මගදී තැනින් තැන ගල් තලා හමු විය. සල්ගස් හා දිගු මානා පඳුරු අතරින් වැටී තිබුණු මාර්ගය උස් පහත් වෙමින් ඉදිරියට විහිදුණේය. වරින් වර වැලි සහිත කඳුද රතු පස් සහිත බිම් තීරුද කුඩා කඳු ගැටද හමු විය. කටු පඳුරු සහිත ළඳු කැලෑ දිගටම හමු විය. මම නිදහසේ අශ්වයාට යන්නට ඉඩ දුනිමි. අශ්වයා විටෙක වේගයෙන් ද විටක සෙමින් ද ගියේය. එකාකාරී වේගයෙන් අශ්වයා ගෙන යාමද අසීරු කාර්‍යයක් විය. අපිළිවෙළට තිබූ මාර්ගයේ විසිරුණු ගල් තලා නිසා අශ්වයාගේ ගමනේ වේගය බිඳ වැටුණි. අශ්වයා විටෙක පිම්මේ දුවමින්ද විටෙක සැහැල්ලු පාගමනින් යමින්ද ගමන් කළ නිසා වතුයායේ මායිම පසු කිරීමට පැහෙන වේලාවක් ගත විය.

මම කායර්‍යාලයෙන් පිටවෙද්දී සතුටින් ඉපිළී ගොස් සිටියෙමි. රැකියාවට ආ දා පටන් ඒ පළාතේ නිදහස් තැනිතලාව හා වනාන්තරය, ක්‍රමයෙන් මට ගම රට අමතක කර දැමීමට සමත් විය.

ශිෂ්ට සමාජයේ විවිධාකාර වූ පහසුකම්ද, බඩු බාහිරාදියද, පුරුදුද, මට අමතක කරවීමට ඒ පරිසරය සමත් විය. මට මගේ යහළු මිත්‍රාදීන් පවා අමතක වීමට ආසන්න වී තිබිණ. අශ්වයා සෙමින් ගියත් වේගයෙන් ගියත් මට කමක් නැත. ගල් පර්වතය පාමුල වසන්තයේ පුපුෂ්පිත රක්ත වර්ණ වූ කැල මල් සැණකෙළි පවත්වයි. කන්දට ඉහළිනුත් පහළිනුත් සෑම තැනම ජූප්සි මලින් බරවූ ගස්වල අතු බිමට නැමී ඇත. ධාතුප ගස්වල කිරි පුදු පැහැති මල්වල මුහුණු හිරු දෙසට නැමී ඇත. ඒවායේ මුදු සුවඳ අලස මධ්‍යාහ්නයට එක් වී ඇත. මා කොපමණ දුර ආවාදැයි මට මතක නැත.

එසේ වුවද ආ මග කෙතරම් දුරක් දැයි සිහියේ තබා ගැනීම වැදගත් කරුණක් විය. කල්පනාවෙන් නොගියොත් මංමුලා වීමට ඉඩ තිබේ. වතුයායේ සීමාව පසු කිරීමටත් පෙර ඒ බව මම හොඳින් අවබෝධ කර ගතිමි. ටික දුරක් කල්පනාවෙන් තොරව ගොස් බැලූ විට මට ඇතින් පෙනුණේ දුම්වන් නිල් පැහැයෙන් යුතු වූ විශාල වන තීරය ක්ෂිතිජය දක්වා විහිද ගොස් ඇති බවය. මෙතරම් විශාල වනාන්තරයක් මෙතැනට කොයින් ද? ඒ සැණකෙළිය අසල මෙතරම් ඈත දක්වා විහිදුණු වනාන්තරයක් ඇති බව කායශ්‍රීාලයේ කිසිවකු මට කියා තිබුණේ නැත. ඊළඟ මොහොතේ මා අනුමාන කළේ මට මග වැරදී ඇති බවය. ඉදිරියේ වූ වන රේඛාව මෝහනපුරාහී රක්ෂිත වනයේ කොටසක් විය නොහැකි ද? ඒ වනය පිහිටියේ අපේ කායශ්‍රීාලයට ඊශාන දිගිනි. ඒ පැත්තේ එළිපෙහෙළි වූ පාරක් තිබුණේ නැත. කිසිවකු ඒ පළාතේ පයින් ගමන් කරන්නේ ද නැත. කුමන දිශාව බැලුවත් දිස් වන්නේ එකම ආකාරයට ය. හැම පැත්තේ ම කඳු හා තැනිතලාද, එකම ආකාරයේ මලින් පිරුණු ගස්ද පෙනෙන්නට විය. සැඩ හිරුගේ කම්පනය වන තාප තරංග හැම පැත්තෙන් ම දිස් විය. වගකීමෙන් තොර මිනිසෙකුට මේ පරිසරයේ දී මංමුලා වීමට වැඩි වේලාවක් ගත නොවේ.

මම අශ්වයා ආපසු හැරවුයෙමි. කල්පනාවෙන් යුතුව පරිස්සමින් යායුතු ස්ථානය නිගමනය කොට එක් මග සලකුණක් දුර සිට අනුමානයෙන් අරමුණු කර ගෙන ඉදිරියට ගමන් කළෙමි. කෙළවරක් නැති මහා සමුද්‍රයේ නැවක් නියම දිශාවට රැගෙන යාමත්, අහසේ ගුවන් යානයක් නියම මාර්ගයේ පදවාගෙන යාමත්, පාරක් නොමැති මහ වනයක අශ්වයා පිට නැගී යාමත් එකම ආකාරයේ කර්තව්‍යයෝ

වෙති. මේ ගැන අත්දැකීම් ඇති කෙනෙකුට නම් ඒ බව වටහා ගැනීම දුෂ්කර නොවේ.

නැවත හිරු රැසින් නැහැවුණු, පත්‍ර රහිතව මල් පොකුරුවලින් පමණක් සැදුණු තුරු පෙළක් හමු විය. වන මල් වලින් නික්මුණු මුදු මිහිරි සුගන්ධය වාතයට එක් වී තිබිණ. ගලින් තැනුණු ස්ථූපයන් සේ වූ විවෘත ගල් පර්වත පෙළක්ද මලින් පිරුණු කැල ගස්ද පසු කර මම ඉදිරියට ඇදුණෙමි. ඒ වන විට හොඳට ම දහවල් වී තිබිණි. වතුර ටිකක් බොන්නට ඇත්නම් හොඳ යයි මට සිතිණි. මගදී හමුවිය හැකි කාරෝ නදිය හැරෙන්නට ජලය ඇති වෙනත් තැනක් ගැන මා දැන සිටියේ නැත. වතුයායේ මායිම පසු කළේ කොයි වේලාවේදැයි මට හරිහැටි මතක තිබුණේ නැත. කාරෝ නදියට තව බොහෝ දුර යා යුතු යයි සිහිවන විට පිපාසය වැඩි වැඩියෙන් දැනෙන්නට විය.

වතුයායේ ඒ පැත්තේ මායිමේ ඉද්ද කනුවක් හෝ, මහාවීරගේ කොඩි ගස මෙන් වූවක් සිටුවන්නට යයි මා මුකුන්දි නම් බදු එකතු කරන්නාට කියා තිබුණි. මා මීට පෙර ඒ පැත්තේ මායිමට කිසි දිනක පැමිණ නැත. මෙදින එහි පැමිණි විට මා දුටුවේ ඔහු ඒ ඉල්ලීම ඉටු කර නැති බවය. "මොන පිස්සු ද? කල්කටාවෙන් ආපු මැනේජර් මහත්තයා මායිම බලන්න මේ කැලේ බිඳගෙන එයි ද? ඔකට නහින්න ඕනැ නෑ. මායිම ඔය තියෙන විදිහට තිබිච්චදෙන්." යයි ඔහු සිතන්නට ඇත.

මා ආ පාරට මඳක් දුරින් වූ තැනකින් දුමක් නැගෙනු දුටු මම එහි ගියෙමි. වනය මැද කිසියම් පිරිසක් කැලෑ දර කැබලි කර දර අහුරු සකස් කරමින් සිටියහ. ඔවුහු ශීත කාලයට ගම්වලට ගෙන ගොස් දර අහුරු විකුණති. මේ පළාතේ දිළිඳු ජනයා ගිනි කබලක දර අහුරු දල්වා ගිනි තැපීමෙන් සීතල මකා ගනිති. පෙසා එකකට දර අහුරු සේරු හතරක් බැගින් විකුණනු ලැබේ. සමහරුන්ට ඒ මිලට වත් අහුරු ගැනීමට මුදල් නැත. මෙතරම් වෙහෙස වී දර අහුරු සකස් කර එවැනි මිලකට විකුණා ඇති ඵලය කුමක්දැයි මට සිතා ගත නොහැකි විය. මා මෙහි ආ දා පටන් දුටු දෙයක් නම් මෙහි මුදල් කියන දෙය අප සිටින පළාතේ මෙන් පහසුවෙන් ලබාගත හැකි දෙයක් නොවන බවයි.

නෙල්ලි කැලයක් මැද වියළි මානා සෙවිළි කළ කුටිවලින් යුතුවූ වාඩියක් එහි විය. එහි සිටි පිරිස ලොකු මැටි බඳුනක ඉරිහු තම්බා සල් කොළවලට බෙදා ගෙන කෑමට සූදානම් වී සිටියහ. ලුනු හැරෙන්නට

ඉරිහු කෑමට වෙනත් දෙයක් ඔවුන්ට නොතිබිණ. ඒ අසල වූ ලොකු වලක දර අතු වගයක් දැල්වෙමින් තිබුණේය. ළමයෙක් එතැන හිඳගෙන දිග අමු සල් අත්තකින් දර අතු ඒ මේ අත හරවමින් සිටියේය.

"අර වලේ මොනවද පුච්චන්නේ?" මම ඇසුවෙමි. සියල්ලෝම කෑම ගැනීම නවත්වා නැගිට බියපත් වූ නෙත්වලින් මා දෙස බැලූහ.

එක් මිනිසෙක් ගොත ගසමින් කතා කළේය.

"දර අඟුරු හදනවා සර්."

අශ්වයා පිට නැගී සිටි මා දුටු ඒ මිනිසුන් මා වන සංරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු යැයි සිතන්නට ඇත. මේ පළාතේ වනය, රජයට අයත් වූවකි. මෙහි අවසර නැතිව දර කැපීම හෝ දර අඟුරු තැනීම තහනම්ය.

මා වන සංරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නොවන බව කියා ඔවුන්ගේ බිය දුරු කෙළෙමි. බිය වීමට දෙයක් නැති බවත් නිදහසේ දර අඟුරු සකස් කර ගන්නා ලෙසත් කී මම ජලය ටිකක් ඉල්ලා සිටියෙමි. කෑම ගනිමින් සිටි කෙනෙක් දිවගොස් හොඳින් මදින ලද කෝප්පයකට පිරිසිදු දිය ටිකක් ගෙනැවිත් මට දුන්නේය. ඒ ජලය කොහෙන් දැයි ඇසූ විට අසල දිය පාරක් ඇති බව ඔවුහු කීය. "දිය පාරක්?" ඒ ඇසූ මා තුළ කුතුහලයක් ඇති විය. මෙහි දිය පාරවල් ඇති බව මා මීට කලින් අසා තිබුණේ නැත.

"දිය පාරක් නොවෙයි සර්. උල්පතක්. ගලක් මැදින් ටික ටික වතුර උනනවා. පැයකට බෝතල් බාගයක් විතර එකතු වෙනවා. හොඳ පිරිසිදු වතුර ටික. ඒ වගේම සීතලයි." ඔවුහු කීය.

මම එතැන බැලීමට ගියෙමි. එය කෙතරම් සුන්දර ස්ථානයක් ද? පාළු අරණේ ගල් තලාව මතට සරත් හා වසන්ත කාලවල කුරුල්ලන් ජල ක්‍රීඩා කරන්නට පැමිණෙනු ඇත. වඩාත් ඝන වනය ඇති කොටසේ මල් ගස්වලින් වට වූ එක්තරා පහත් බිමක කලු ගල් තලාවක් ක්ෂය වී ගොස් වලක් සෑදී තිබිණ. එය ස්වාභාවිකව තැනුණු ගල් කෝප්පයක් වැනිය. ඒ මතට නැමුණු සුපුෂ්පිත පියාල් අතු ඝන අඳුරු සෙවණක් නිර්මාණය කර තිබිණ. සල් පොකුරුවලින් නිකුත් වන සුවඳ පරිසරය සුවඳවත් කළේය. ගල් කෝප්පය තුළට ජලය බින්දු වශයෙන් එකතු විය. ඊට මඳ වේලාවකට පෙර දිය ගෙන ගොස් තිබුණු නිසා ඒ වන විට එහි තිබුණේ ජලය ස්වල්පයකි.

"මේ උල්පත ගැන වැඩි දෙනෙක් දන්නේ නෑ සර්. අපි කැලේ නිතරම ඇවිදින නිසා තමයි ඒ ගැන දන්නේ."

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

එතැනින් පිටත් වී පැයක් පමණ ගිය පසු කාරෝ නදිය හමු විය. උස් වූ වැලි ඉවුරුවලින් යුතු වූ එහි සෑහෙන ජල ප්‍රමාණයක් විය. ගඟේ එක් කොටසක් බේසමක් සේ පිහිටා තිබුණි. ගඟ දෙපස බොහෝ ඈතට යන තෙක් විහිදුණු වාලුකා තීරය අව්වට ලෙලදුන්නේය. අශ්වයා පිට නැගී ගඟ හරහා යාමට උත්සාහ කළෙමි. ගඟට බැස්ස විට සෑදලයේ ගෑවෙන මට්ටමට ජලය තිබිණ. මම ඉතා පරිස්සමින් ද සිරුවෙන්ද එගොඩ වූයෙමි. ගඟෙන් එගොඩ කෑල මල්වලින් පිරුණු වනයක් විය. එහි දකින්නට ලැබුණේ උස්, පහත් වූ වර්ණවත් ගල්තලා සහ මලින් පිරි ගිය කෑල ගස්මය. ඒ පළාත මට පෙනුණේ කෑල මල් සැණකෙළියක් ලෙසය. වරක් ඈත කැලයෙන් කුඑ මීමකු පිටතට එනු මම දුටුවෙමි. එෆ ගල් තලාවක් මත සිට පයින් පොළොව අවුස්සන්නට විය. රේන්ස් පටිය තදින් අල්ල ගත් මම බියපත් ව බලා සිටියෙමි. පෙනෙන තෙක් මානයේ කිසිවකු නැත. කුඑ මීමා අං දෙක එල්ල කර ගෙන මා වෙතට පැනගෙන ආවොත් කුමක් කරන්නද? මා එසේ සිතමින් සිටින විට වාසනාවකට මෙන් එෆ නැවත ආපසු හැරී වනයට වැදී නොපෙනී ගියේය.

ගඟෙන් එගොඩ වී ටික දුරක් ගිය විට ඉතා චමත්කාර ජනක දර්ශනයක් දකින්නට ලැබිණ. ඒ වන විටත් සෑඩ හිරු රැස් සහිත දහවල් කාලය ගෙවී ගොස් තිබුණේ නැත. සන්ධ්‍යා කාලයේ පවතින සෙවණැලි හෝ රාත්‍රී කාලයේ පවතින සඳ එළිය හෝ නොමැති වෙනස් පාරිසරික තත්වයක් එහි විය. ඒ සෑඩ හිරු රැසින් තැවෙන නිහඬ මධ්‍යාහ්නයේ එක් පැත්තකින් වනයෙන් වට වූ දීර්ඝ වූ ගල් පර්වත පෙළක්ද තව පැත්තකින් පියෝරයිට් පාෂාණවලින් ගහණ වූ උස් බිම් හා තැනිතලා පෙළක්ද විය. සුදු පැහැති ගෝල්ගෝලි මල් හා රතු පැහැති ධාතුප මල්වලින් යුතු වූ වනයක් ඊළඟට හමු විය. එය ඇත්ත වශයෙන්ම අපූරු ස්ථානයක් විය. එවැනි මලින් ආකීර්ණ වූ තැනක් හෝ එවැනි උද්දාමයෙන් පිරුණු වන සෞන්දර්යයක් මා ජීවිතයේ කිසි දිනක දැක නැත. එය දහවල දැඩි හිරු රැසක් සමග මුසු වූ විට කෙතරම් සිත් ගන්නා සුලු ද? ඉහළ ආකාශය ඝන නීල වර්ණයෙන් දිස් වේ. අහසේ කොතැනකවත් කුරුල්ලෙකු දක්නට නැත. පොළොවේ පේන තෙක් මානයේ මිනිසෙකු හෝ සතෙකු හෝ දක්නට නැත. ඇත්තේ දැඩි නිහඬතාවක් හා පාළු බවකි. වටපිටාව දෙස බැලූ මම ස්වභාවයාගේ පාළු සුන්දරත්වය මැද ගිළී ගියෙමි. හාරතයේ මෙවැනි තැනක් ඇතැයි මා මින් පෙර දැන සිටියේ

නැත. ඇරිසෝනා හෝ නවාජෝ කාන්තාරවල දර්ශන මා චිත්‍රපටවල දැක ඇත. හඩිසන්ගේ පොත්වල ගිලා නදියේ බේසමක් සේ සෑදුණු කොටසක් ගැන සඳහන් වේ. මට මේ පරිසරය දුටු විට ඒ සියල්ල සිහිපත් විය.

සැණකෙළි බිමට ළඟා වන විට දහවල් එක පමණ විය. එය විශාල සැණකෙළියකි. මා ආ මාර්ගයේ වම් පසින් දිගු පර්වත පෙළක් සැතැපුම් හයක් පමණ දුරක් එන තෙක් දර්ශනය වෙමින් පැවතිණ. පර්වත පේළිය කෙළවර වූ කඳු බෑවුමේ සල් හා කෑල වනයක් මැද සැණකෙළිය පැවැත්විණි. එය වෙනදාට සති පොළක් පැවැත්වෙන තැනකි. මහිශවාඩි, කඩාරි, තීන් ටෝංගා, ලඡමනියා, හිමදාස්, මහාලිඛාරූප ආදී ළඟ හා ඈත පිහිටි නානාවිධ ජනපදවලින් මිනිසුන් එහි පැමිණ සිටියහ. එහි වැඩි ගණනක් සිටියේ ගැහැනුය. පිටිසර තරුණියෝ හිස්වල පියාල් මල් හෝ ධාතුප මල් ගසා ගෙන සිටියහ. සමහරු බඳින ලද කොණ්ඩාවල ලී පනා ගසා සිටියහ. වැඩි දෙනා මනා හැඩයෙන්ද ලාලිත්‍යයෙන්ද යුතුවූ සිරුරු ඇති වූ අය වූහ. ඔවුහු මහත් විනෝදයෙන් යුතුව බාල වර්ගයේ පබළු මාල, ජපන් හෝ ජර්මන් සබන් පෙට්ටි, බට නලා, කණ්ණාඩි, සුවඳ වර්ග ආදිය මිල දී ගනිමින් සිටියහ. පිරිමි අය පයිසාවට දහය ගණනේ කළු සුරුට්ටු මිල දී ගත්හ. ළමයි තලබෝල, අග්ගලා සහ තෙලෙන් බදින ලද කෑම ආදිය මිල දී ගත්හ.

හදිසියේ ගැහැනු කෙනෙක් විලාප දී හඬනු අසා මම තිගැස්සී ගියෙමි. කඳු පළාතෙන් පැමිණි තරුණ තරුණියන් පිරිසක් සිනා කවට බස් පවසමින් සිටියහ. ඇඬුම් ශබ්දය ඇසුණේ ඒ දෙසිනි. කුමක් සිදු වී ඇත්දැයි දැන ගැනීමේ කුතුහලයක් මා තුළ ඇති විය. එහි සිටි කෙනෙකුගෙන් විමසූ විට දැනගන්නට ලැබුණේ පිට ගමකට අලුතෙන් කැන්දන් ආ මනාළියකට තමාගේ මාපියන්ගේ ගමින් ආ ගැහැනු කෙනෙකු හමු වූ බවත් එවැනි අවස්ථාවල හඬ නගා හැඬීම එහි සිරිත බවත්ය. ගමේ මිතුරියක, අසල්වැසියෙකු හෝ නෑයෙකු මුණ ගැසුණු විට එකිනෙකාගේ ගෙළ වැළඳ ගනිමින් හඬා වැටීම ඔවුන්ගේ සිරිත වෙයි. නොදන්නා කෙනෙකුට සිතෙන්නේ ඔවුන්ගෙන් කිසිවකු මිය යන්නට ඇතැයි කියා ය. එසේ වුවත් එය ආදර සැලකිළි පෙන්වීමේ එක් ක්‍රමයකි. එසේ නොකළොත් නින්දාවට ලක් වේ. තමාගේ ගමේ කෙනෙකු හමු වී ටත් පසුවත් නොහඬන්නේ නම් එයින්

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ප්‍රකට වන්නේ ඇය තමාගේ මාපියන් ආදීන් අමතක කොට සැමියාගේ නිවසේ සතුටින් කල් ගෙවන බවකි. මේ පළාතේ අය එය ලැජ්ජා විය යුතු කරුණක් ලෙස සලකති.

එක් තැනක පොත් කඩයක් විය. හින්දියෙන් ලියැවුණු ගුලේ-බකාවලී, ලයිලා-මජ්නු, වේතාල කතා, ප්‍රේම සාගරය, ආදී පොත් එහි විය. සමහරු පොත් හරව හරවා බලමින් සිටියහ. ඇනටෝල් ප්‍රාන්ස් සඳහන් කරන පරිදි ප්‍රංශයේ පමණක් නොව මේ වනගත සැණකෙළි බිමේ ද මුදල් වියදම් නොකර පොත් කියවන පාඨකයින් සිටින බව මම තේරුම් ගතිමි. මුදල් වියදම් නොකර කියවන්නට ලැබේ නම් වැඩි දෙනෙකු පොත් මිල දී ගන්නේ නැත. වෙළෙන්දාගේ ව්‍යාපාරික ඥානය තියුණු එකක් විය.

"පොත් ගන්නවද? ගන්නේ නැත්නම් පොත් අත ගගා ඉන්නේ නැතිව තියලා ගිහින් වැඩක් බලා ගන්නවා." සාවධානී ලෙස එහි නැවතී හිඳ පොත් කියවන පාඨකයින් දෙතුන් දෙනෙකුට ඔහු කියනු මට ඇසිණ. සැණකෙලි භූමියට මදක් ඈතින් වූ තැනක සල් ගස් යට බොහෝ දෙනා කෑම පිළියෙළ කොට අනුභව කරනු මම දුටුවෙමි. එක් පසෙක එළවළු ආදිය විකුණන තැනක් ද විය. අමු සල් කොළ ගොටුවලට වේලන ලද මාළු විකුණනු මම දුටුවෙමි. අමු පැපොල්, වියළි මසං ගෙඩි, පේර, කව්පි ආදියද එහි විකිණීමට තබා තිබිණ.

හදිසියේ කිසිවෙකු මට අඬගසනු ඇසිණ.

"මැනේජර් මහත්තයා"

හැරී බැලූ විට ලොබ්ටූලියාවේ බදු එකතු කරන නිලධාරියාගේ සහෝදරයා වන බ්‍රහ්ම මහතෝ සෙනහ අතරින් මා ඉදිරියට ආවේය.

"සර් කොයි වෙලාවෙද ආවේ? කා එක්කද ආවේ?"

"බ්‍රහ්මා මෙහේ සැණකෙළිය බලන්න ආවද?"

"නෑ සර්. මං තමයි සැණකෙළිය බදු අරගත්තේ. එන්න. එන්න. යමු අපේ කුඩාරමට"

සැණකෙළි බිමේ එක් පසෙක ඔහුගේ කුඩාරම විය. බ්‍රහ්මා ඉතා ගෞරවයෙන් මා එහි කැඳවාගෙන ගොස් පැරණි හාන්සි පුටුවක ඉඳගත්නට සැලැස්විය.

බ්‍රහ්මාගේ සේවකයෙකු යයි සිතිය හැකි මිනිසෙක් එහි සිටියේය. මා එවැනි කෙනෙකු කිසි දිනක දැක නැත. කාල වර්ණ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මිනිසකු වූ ඔහුගේ වයස අවුරුදු පනහක් හෝ හැටක් විය හැක. උඩු කය නිරුවත්ව සිටි ඔහුගේ හිසෙහි පැසුණු හා නොපැසුණු හිසකෙස් හරි හරියට තිබිණි. ඔහුගේ අතේ වූ ලොකු මල්ලක් පුරා කාසි තිබිණ. කිහිල්ලේ වූයේ අභ්‍යාස පොතකි. ඔහු සැණකෙළියේ සිටි වෙලෙන්දන් ගෙන් බදු එකතු කරමින් ඇවිදින්නට ඇත.

ඔහුගේ දෑස්වල වූ අසරණ පෙනුමත් මුහුණේ වූ අසාමාන්‍ය, දීන බැගෑපත් භාවයත් දුටු මම පුදුමයට පත් වූයෙමි බ්‍රහ්මා මහතෝ රජෙකු හෝ අධිකරණ නායකයකු හෝ දඬුවම් පැමිණවීමට බලයක් ඇත්තකු හෝ නොව වතුයායකට අයත් ප්‍රදේශයක වෙසෙන සාමාන්‍ය මිනිසෙකි. සැණකෙළිය බදු ගත්තෙකු වුවත් ඔහු ඉදිරියේ මෙතරම් නිවට විය යුතු ද? මා කුඩාරමට ගිය විට බ්‍රහ්ම මහතෝ මා ගෞරවයෙන් පිළිගත් බව දුටු ඒ මිනිසා වඩාත් ගෞරවයෙන් හා බැගෑපත් බැල්මකින් මා දෙස බැලුවේය. වරකට දෙකකට වඩා මා දෙස බැලීමට ඔහු තුළ ධෛර්‍යයක් නොවීය. ඔහු මා දෙස මෙතරම් හීන දීන බැගෑපත් බැල්මක් හෙලන්නේ ඇයි? ඔහුගේ දිළිඳු කම නිසා ද? ඔහුගේ මුහුණේ කුමක් සටහන් වී ඇද්දැයි දැන ගැනීමට මම කිප වරක් ඔහු දෙස බැලුවෙමි. ' Blessed are the meek for theirs the kingdom of heaven' යන කියමන මට සිහිපත් විය. මෙවැනි බැගෑපත් මුහුණක් ඇත්තෙන්ම මා කිසිදිනක දැක නැත.

බ්‍රහ්මා මහතෝගෙන් මම ඔහු ගැන විමසුවෙමි. ඔහු බ්‍රහ්මාගේ ගම් පළාත වන කඩාරි ප්‍රදේශයේ කෙනෙකු බවත් ගංගෝතා කුලයේ කෙනෙකු වූ ඔහුගේ නම ගිරිධාරි ලාල් වන බවත් දැන ගනිමි. කුඩා පුතෙකු ඇරෙන්නට ඔහුගේ පවුලේ වෙනත් කිසිවෙකු නැති බවත් බ්‍රහ්මා පැවසුවේ ය. ඔහු ඉතා දිළිඳු කෙනෙකු බව මම අනුමාන කළෙමි. මේ දිනවල බ්‍රහ්ම ඔහුට සැණකෙළියේ කඩ වලින් මුදල් එකතු කිරීමේ කාර්යයෙහි යොදවා ඇත. ඔහුට කෑම දී දිනක වැටුප වශයෙන් ඇනා හතරක් ලැබේ. මට ගිරිධාරි ලාල් ඉන් පසුවත් හමු විය. ඒ අවස්ථාවලදී ඔහු ඉතා අසරණ තත්වයේ පසු විය. මා නොයෙක් ආකාරයේ මිනිසුන් දැක ඇතත් ගිරිධාරි ලාල් තරම් සරල ස්වභාවයෙන් යුතු වූ අහිංසක කෙනෙකු දැක නැත. බොහෝ කාලයක් ගත වූ පසු වැඩි දෙනෙකු අමතකව ගොස් සිතේ සටහන් වී ඇති ටික දෙනා අතරින් ගිරිධාරි ලාල්ද එක් අයෙකි.

සවස් වේගෙන ආවේය. එවේලේම මා ආපසු යාමට පිටත් විය යුතු නිසා ගමන් ඇරඹීමට සැරසුණෙමි. ඒ දුටු බ්‍රහ්මා මහතෝ

අහසින් බිමට වැටුනු කෙනෙකු මෙන් විය. කුඩාරමේ සිටි අනෙක් අය කට ඇරගෙන මා දෙස බලා සිටියහ. සැනපුම් තිහක් පමණ වූ කැලෑ පාරේ අවේලාවේ ගමන් කිරීම කළහැකි දෙයක් නොවන බව ඔවුන්ගේ මතය විය.

"මහත්තයා කල්කටාවෙන් ආපු කෙනෙක් නිසා මේ පැත්තේ පාරවල් වල හැටි දන්නේ නෑ. ඒකයි මේ වෙලාවේ යන්න හදන්නේ. හැතැප්ම දහයක් විතර යද්දී ඉර බහියි. හඳ එළිය තියෙන්න පුළුවන්, ඒ වුනාට පාර දෙපැත්තේම ඝන කැලෑව. කොහේවත් මනුස්සයෙක් නෑ. ව්‍යාඝ්‍රයෝ එළියට එන්න පුළුවන්. කුළු මී හරක් මුණ ගැහෙන්න පුළුවන්. මේ මසං ගෙඩි පැහෙන කාලේ. වලස්සු නම් නොවැරදීම හම්බ වෙන්න පුළුවන්. කාරෝ ගඟේ එහා ඉවුරේ මහාලිබාරුප කැලේ පාර දිගේ යද්දී ළඟදී කරත්ත කාරයෙක්ව කොටියෙක් ඇදගෙන ගියා. ඒ අසරණයා තනියම කැලෑ පාරේ කරත්තේ දක්කාගෙන ඇවිත් තියෙනවා. ඕක නම් කරන්න බැරි දෙයක් සර්. රෑට කාලා බීලා මෙහේ නවතින්න. මට අනුකම්පා කරලා මේ අසරණයාගේ පැලට ආව එකේ මෙහේ නැවතිලා නිවාඩු පාඩුවේ හෙට යන්න." බ්‍රහ්මා කිවේය.

ඒ පුර හඳ ඇති රෑයේ පාළු කඳු පාරේ තනිව අශ්වයා පිට නැගී යාමේ ආශාව මට මැඩගත නොහැකි විය. ජීවිතයේ නැවත මට මෙවැන්නක් කිරීමට අවස්ථාව නොලැබෙනු ඇත. මේ මට ලැබෙන අවසාන වාරය විය හැක. මා එන විට දුටු වන පර්වත ආදිය, පුර හඳ ඇති රෑයක නැවත දකින්නට නොලැබුණොත් මෙතරම් මහන්සි වී එහි පැමිණීමෙන් පලක් නැතැයි මට සිතිණ.

සියල්ලන්ගේම බලවත් පෙරැත්තය නොතකා මම ගමනට පිටත් වූයෙමි. බ්‍රහ්මා මහතෝ කී පරිදිම කාරෝ නදිය අසලට ළඟාවීමට ටික වේලාවකට පෙර අවරදිග උස් නොවූ පර්වත මාලාව පිටු පසින් හිරු විශාල රතු පැහැති ගිනි බෝලයක් සේ අස්තංගත විය. කාරෝ නදී තීරයේ වැල්ල දෙසට අශ්වයා හරවා බසින්නට සූදානම් වන විටම හදිසියේ හිරු බැස යාමත් ඒ සමගම ඈත කළු පැහැති රේඛාවක් මෙන් දිස් වූ මොහන්පුරා රක්ෂිත වනයට ඉහළින් පුන්සඳ නැඟ ඒමත් එකවර සිදුවුණු දැක වශී වූ මම අශ්වයාගේ රේන්ස් පටි .නදින් අල්ල ගෙන නැවතී බලා සිටියෙමි.

මගදී කඳු බෑවුමේද තැනිතලාවලද තැනින් තැන වූයේ ඝන නොවූ කැලයයි. හතර වටේ ඇත්තේ කෙතරම් දැඩි පාළුවක්ද? දහවල්

කාලයේද ඒ පාළුව ඒ අයුරුම විය. සඳ පෑයූ පසු මට සිතුණේ මා නුහුරු නුපුරුදු, සෞන්දර්‍යාත්මක සුරංගනා ලොවක් මැදින් ගමන් කරන්නා සේය. විටින් විට ව්‍යාඝ්‍රයන් හමුවේය යන බියද මා තුළ විය. සැණකෙළියේ බ්‍රහ්මා මහතෝ සහ කාර්‍යාලයේ සියල්ලන්ම පාහේ මේ පාරේ තනිවම නොයන්නට යයි කී බව මට සිහිවිය. නන්ද කිශෝර් ගෝසායී නම් වූ කෙනෙක් මාස දෙක තුනකට පෙර කාර්‍යාලයේ හිඳගෙන මහාලිබාරුප කැලයේ දී කොටියෙක් මිනිසෙකු ඇදගෙන ගොස් කා දැමූ අයුරු ගැන කී විස්තරය මට සිහිපත් විය. වනයේ තැනින් තැන වූ ලොකු මසං ගස් පල බරින් බිමට නැමී තිබුණි. ඉදුණු මසං ගෙඩි ද, වියළී ගිය ගෙඩිද බිම වැටී තිබිණ. ඒවා කෑමට වලසුන් ඒමට හොඳටම ඉඩ කඩ ඇත. මේ වනයේ කුඑ මීමුන් නොසිටියත් මෝහන පුරා වනයේ සිට එකෙකු දෙන්නෙකු මා එද්දී දුටුවා මෙන් පැනගෙන එන්නට ද බැරි නැත. මට තව සැතපුම් පහළොවක් පමණ පාළු වනය මැදින් ඉදිරියට යාමට ඇත.

මා තුළ වූ බිය ජනක හැඟීම අවට පරිසරයේ සෞන්දර්‍යය තවත් වැඩි කළේය. මා ගිය මාර්ගය දකුණු පැත්තේ සිට උතුරට ගමන් කර පසුව නැගෙනහිර දෙසට හැරිණ. පාර අසලම උස් නොවූ ගල් පර්වත පේළියක්ද, ඒවා පාමුල ගෝල්ගෝලි සහ කැල ගස්ද අනිත් පැත්තේ සල් ගස්ද විය. සඳ නැගෙත්ම ගස්වල සෙවණැලි කෙටි වන්නට විය. කිසියම් වන මල් වර්ගයකින් එන සුවඳක් මුළු තැනිතලාවම සුවඳවත් කළේය. බොහෝ ඈත කඳු ආශ්‍රිත ගම්වල වෙසෙන ගෝත්‍රික ජනයා හේත් ගොවිතැන් කිරීම සඳහා වනයට ගිනි තබා තිබුණි. එය මා මින් පෙර නුදුටු අමුතු දර්ශනයක් විය. කඳු වැටිය හරහා ගිනි වැටක් සැරසිල්ලක් සේ පෙනෙන්නට විය.

මා මේ පළාතට නොඑන්නට බෙංගාලයට එතරම් ආසන්නයෙන් මෙවැනි ජන ශූන්‍ය ආරණ්‍ය බිමක් හෝ දීර්ඝ වූ ගල් පර්වත මාලා හෝ ඇති බව කිසිවකුට පැවසුවත් විශ්වාස නොකරනු ඇත. ඇරිසෝනාවේ ගල් පර්වතවලින් ගහන කාන්තාරයේ හෝ රොඩේසියාවේ බුෂ්වෙල්ඩර් ප්‍රදේශයේ හෝ දකින්නට ලැබෙන දර්ශනවලට මෙය කුමන අන්දමකින් වත් දෙවෙනි නොවනු ඇත. මේ පළාත්වල වන සතුන්ගෙන් වන අනතුරුද අඩු නැත. රෑ බෝ වූ විට ව්‍යාඝ්‍රයින්ට හා වලසුන්ට බියේ කිසිවෙකු මේ පළාතේ ඇවිදින්නේ නැත.

මේ නිදහස් ධවල වර්ණ වූ සඳ එළියේ වනය මැදින් ගමන් කරද්දී මට සිතුණේ මේ එක්තරා අන්දමක වෙනස් ජීවිතයත් බවයි.

ගෙයි බිත්ති අතර හිරවී ජීවත් වීමට හෝ පවුල් ජීවිත ගත කිරීමට හෝ අකමැති වර්ගයේ මිනිසුන්ට මෙවැනි ජීවිතයක් ගැලපේ. කල්කටාවේ සිට ආ දිනවල මෙහි පැවති දැඩි පාළුව මහ වනගත ජීවිතයේ කටුක බව මට කෙතරම් ඉවසීමට නොහැකි වුවත් දැන් මට සිතෙන්නේ මේ ජීවිතය හොඳ බවයි. මේ කටුකවූද, රූක්ෂවූද වනගත පරිසරය, එහි ඇති ස්වාධීන නිදහස් බව නමැති මන්ත්‍රයෙන් මතුරා මා වසඟ කරගෙන ඇත. නගරයේ සිර කූඩුවට වැදීමට තවත් හිත් දෙන්නේ නැත. ගල් තලා මැද සල් හා කැල ගස් මැදින් නිදහස් ආකාශ තලය යට පරිපූර්ණ වූ චන්ද්‍රාලෝකය අතර නිදහසේ අශ්වයා පන්නාගෙන යාමේ ආස්වාදය සමග මම ලෝකයේ කිසිම සම්පතක් හුවමාරු කර ගැනීමට කැමති නොවන්නෙමි.

සඳ එළිය තවත් දීප්තිමත්ව බැබලෙන්නට විය. සඳ එළියේ දීප්තිය නිසා තාරකා නොපෙනී යන තරම් විය. වට පිට බැලූ විට මට සිතුණේ එය මා මෙතෙක් කල් දැන හඳුනාගෙන සිටි පෘථිවිය නොව සිහින භූමියක් බවය. ඒ දිගන්තය තෙක් විහිදී ගිය සඳ එළිය අතරින් ගැඹුරු රාත්‍රියේදී අලෞකික වූ ජීවීහු පොළවට බසිති. ඔවුහු තපස් රැකීමට හෝ සිහින ලොවේ සැරි සැරීමට පැමිණෙන අය වෙති. වනමල්වලට ආදරය නොකරන, සුන්දරත්වය නොහඳුනන, ක්ෂිතිජ රේඛාව කිසිදිනක අත වනා තමා ළඟට කැඳවා නැති අය කිසිකලක පෘථිවිය හරිහැටි හඳුනා නොගනිති. මහාලිබාරුප වනයේ කෙළවර සිට සැතැපුම් හතරක් ගමන් කළවිට මට අපේ වතුයායේ සීමාවට පිවිසීමට හැකි විය.

* * * * * *

දිනක් මා කාර්‍යාලයේ වැඩ කරමින් සිටියදී හදිසියේ බෙර වයන හඬක් ඇසී පිටත බැලුවෙමි. කොහේදෝ සිට ආ පිරිසක් කාර්‍යාලය මිදුලේ නැවතී බෙර වයමින් සිටියහ. ශබ්දය ඇසුණු කාර්‍යාල සේවකයෝ සහ ආරක්ෂක භටයෝ පැමිණ බෙර වාදකයින් වටකර ගත්හ. ඔවුන්ගෙන් කෙනෙකු කැඳවා ඒ ගැන විමසීමට සැරසෙන විට මුක්තිනාථ සිං නමැති ප්‍රධාන ආරක්ෂක භටයා පැමිණ මට ආචාර කළේය.

"කරුණාකරල ටිකක් එළියට එනවද? සර්."

"ඇයි මුක්තිනාථ මොකද්ද මේ කලබලේ?"

"දකුණු පළාතේ මේ පාර කුඹුරු පාළු වෙලා සර්. ඒ මිනිස්සු ජීවත් වෙන්න විදිහක් නැතිව නැටුම් කණ්ඩායමක් හදාගෙන ගමින් ගමට යනවා. අද මෙහෙ ඇවිත් තියෙන්නේ සර්ට නැටුම් පෙන්නලා යන්නයි. සර් අවසර දුන්නොත් නැටුම් පෙන්නයි."

නැටුම් කණ්ඩායමේ අය කායශ්‍යාල කාමරය ඉදිරිපිට අවුත් සිට ගත්හ. මුක්තිනාථ සිංහ ඔවුන්ට රහ දැක්විය හැක්කේ කුමන අන්දමේ නැටුමක්දැයි විමසීය. කණ්ඩායමේ සිටි අවුරුදු හැටක් පමණ විය හැකි යයි සිතිය හැකි කෙනෙක් ඉදිරියට පැමිණ ආචාර කළේය.

"අපට හෝ හෝ නැටුමයි කැරකෙන නැටුමයි පෙන්නන්න පුළුවනි."

නැටුම් කණ්ඩායම දෙස බැලූ මට සිතුණේ නැටීමට ඇති හැකියාව කෙසේ වෙතත් බඩ වියත රැක ගැනීමේ බලාපොරොත්තුවෙන් හැම වයසකම වූ විවිධාකාර පුද්ගලයින් රැසක් එකතු වී ඇති බවයි. ඔවුහු බොහෝ වේලාවක් ගී කියමින් නැටුහ. සවස් වරුවේ පැමිණි ඔවුහු සඳ පායන තෙක් ම අත්වැල් අල්ලාගෙන ගී කියමින් කැරකී නැටුහ. ඔවුන්ගේ නැටුම් හා ගායනා විලාසය මට නුපුරුදු ඒවා විය. ඉතා ඈත දක්වා පැතිරුණු නිදහස් ස්වාභාවික වටාපිටාවේ නිහඬ තුරුවදුළුවලින් වටවී නිද දිගන්තය තෙක් විහිද ගිය සඳ එළියේ නරඹන විට ඒ නැටුම් ගැයුම් අවට පරිසරයත් සමග හොඳින් ගැලපේ යැයි මට සිතිණි. ඔවුන් ගැයූ එක් ගීයක අරුත මෙසේය.

ළමා වියෙහිදී මම අපුරුවට කල් ගත කළෙමි.
අපේ ගම පිටුපස වූ කඳු මුදුනේ කෝද් වනයක් විය.
මම පැසුණු ඵල නෙලමින් එහි ඇවිද්දෙමි.
එවකට මම ආදරය කුමක්දැයි නොදැන සිටියෙමි. පියාල් මල් කඩා මාල ගෙතුවෙමි.
මගේ ජීවිතය සතුටින් ගෙවී ගියේය.
දිනක් මම දොළ අයිනේ කුරුල්ලන් දඩයම් කිරීමට ඇවිද්දෙමි.
මගේ අතේ බට තුවක්කුවක් විය.
තුඹ මල් මල් සාරියක් ඇඳ දිය ගෙන යන්නට ආවෙහිය.
මා දුටු තුඹ ' වී. වී. කුරුල්ලන් මරන්නේ ඇයි දැ' යි මගෙන් ඇසුවෙහිය.
මම ලැජ්ජා වී බට තුවක්කුව විසි කළෙමි.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

වනයේ කුරුල්ලෝ ඉගිළී ගියෝ ය. එසේ වුවත් මගේ හදවත නමැති කුරුල්ලා ඔබගේ ප්‍රේමය නමැති දැලේ සදහටම හසු විය.

මගේ තුවක්කුවෙන් කුරුල්ලන් දඩයම් කිරීමට ඉඩ නොදී ඔබ මට කළේ කුමක්ද?

සොඳුරිය ! ඔබට එසේ කරන්නට වටිනවාද?

ඔවුන්ගේ බස මට සම්පූර්ණයෙන් ම වැටහුණේ නැත. ඒ නිසා ඒ ගීත මට වඩාත් අපූරු යයි හැඟිණ. කඳු පළාත් හා පියාල් මල් වනය ගැන ගැයූ ගීත ප්‍රිය උපදවනු ඇත්තේ වනය තුළ හිඳ අසද්දීම ය. ඔවුන්ගේ ගාස්තුව ඇනා හතරක මාරු කාසි පමණි.

කායශ්‍යාලයේ නිලධාරීන් මට එක හෙලාම කීවේ මෙයයි.

"වැඩිපුර සල්ලි දුන්නොත් ඒ ගොල්ලන්ගේ ලෝබ කම වැඩිවෙයි සර්. මේ ගොල්ලන්ට හුහක් තැන්වලින් සල්ලි හම්බ වෙන්නේ නෑ. වැඩි මුදලක් දුන්නොත් දුප්පත් මිනිසුන්ට මේ ගොල්ලන්ගේ නැටුම් අඩු මුදලකට බලන්න වෙන්නේ නෑ සර්."

මම පුදුමයට පත් වූයෙමි. පැය කිපයක් වෙහෙස වූ පසුවද දහ අට දෙනෙකුගෙන් පමණ සමන්විත කණ්ඩායමකට එවැනි මුදලක් සෑහේද? මුදල බෙදී ගිය විට එක් අයෙකුට පයිසා එකක් වත් නොලැබේ. අපේ කායශ්‍යාලයේ නැටුම් පෙන්වීමට එතරම් දුරක් ගෙවා වනය හරහා පාළු මගක පැමිණි මොවුන්ට මුළු දවසටම ලැබෙන වේතනය මෙයයි. අද රාත්‍රියේ නැටුම් පෙන්වන්නට වෙනත් ගමක් ළඟ පාතක නැත.

ඔවුන්ට රාත්‍රී ආහාරය සපයා එහි නැවතීමටද ඉඩ කඩා සපයා දුනිමි. පසුදින උදැසන ඔවුන්ගේ නායකයා කැඳවා රුපියල් දෙකක් දුන් විට ඔහු මගේ මුහුණ දෙස පුදුමයෙන් බලා සිටියේය. කිසිවෙකු නැටුම් බලා කෑම බීම සපයන්නේ නැත. ඒ හැරත් රුපියල් දෙකක ගාස්තුවක් කිසිවෙකු දෙන්නේද නැත.

ඔවුන්ගේ කණ්ඩායමේ අවුරුදු දොළහක් පමණ වයස් වූ ධාතුරියා නම් ළමයෙක් සිටියේය. ඔහුගේ මුහුණ ක්‍රිෂ්ණ දෙවියන්ගේ මෙන්විය. පොකුටු නිසකෙස් සහිත ඔහුගේ කාල වර්ණ මුහුණේ ශාන්ත සුන්දරත්වයක් විය. කණ්ඩායම ඉදිරියට අවුත් පළමුවෙන් ගායනය ආරම්භ කළේ ඔහු ය. පයේ ගිගිරි බැඳ නටන විට ඔහුගේ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

දෙතොල් අග සිනාවක් මතු වී තිබිණ. අතපය සුන්දර ලෙස හසුරුවා නැටූ ඔහු ලස්සනට ගීතද ගායනා කළේය.

කුසගින්න නිවා ගැනීමේ බලාපොරොත්තුවෙන් ඒ ළමයා නැටුම් කණ්ඩායමට එකතු වී ඇවිදියි. ඔහුට හැමවිටම මුදල් නොලැබේ. කෑමට ලැබෙන්නේ ද ලුනු ඉසින ලද බාල වර්ගයේ සහලින් පිළියෙළ වූ කෑමය. ඉඳහිට ඒ සමග එළවළුවක්ද ලැබේ. එය ද කැලෑ ගෙඩි වර්ගයක් පිසිමෙන් සාදන ව්‍යංජනයක් හෝ නිවිති හොද්දකි. එසේ නැතහොත් දුම්මැල්ල හොද්දකි. කුමක් කෑමට ලැබුණත් ඔහුගේ සිනාරැල්ල කිසිදාක මැකී නොයයි. ඔහු මනා සෞඛ්‍යයෙන් යුක්තවූද ලාලිත්‍යයෙන් යුක්ත වූද ළමයෙකි.

මම කණ්ඩායමේ නායකයාට කතා කළෙමි.

"ධාතුරියාව මෙහේ තියලා යන්න. ඔපීසියේ වැඩක් කරලා කාලා බීලා ඉන්න බැරියැ?"

නායකයා වූයේ පෙර කී මහලු තැනැත්තාය. අවුරුදු හැටක් පමණ වූ වයසේ දී ඔහුද කුඩා ළමයෙකු සේය.

"කොල්ලට මෙහේ ඉන්න බැරි වෙයි සර්. මෙයා ගමේ මිනිස්සුත් එක්ක එකටමයි ඉන්නේ. ඒ නිසා තමයි හොඳට ඉන්නේ. තනි වුනාම කොල්ලට සාංකාව වගේ හිතෙයි. පොඩි එකානෙ සර්. ආයිත් දවසක මං එක්ක එන්නම්කෝ සර් ළඟට."

06

මහ වනයේ නොයෙක් කොටස් මිනින්දෝරුවන් විසින් මනින ලදී. කායාලයේ සිට සැතපුම් හයත් ඇතින් බෝමායිබුරු කැලයේ අපේ මිනින්දෝරුවකු වන රාමචන්ද්‍ර සිංහ ටික දිනක සිට ඒ කායාලයෙහි නිතර වී සිටියේය. රාමචන්ද්‍ර සිංහ දින තුනක සිට උමතු වී සිටින බව දිනක් උදෑසනක මට දැන ගන්නට ලැබිණ.

සිදු වූ දේ අසා මම තවත් අය සමග ඉක්මනින් එහි ගියෙමි. බෝමායිබුරු කැලය සන කැලෑවක් නොවීය. එළිමහන් ස්ථාන ඇති ඒ තණ බිමේ තැනින් තැන සනව වැඩුණු පඳුරු ද අතරින් පතර ලොකු ගස් ද විය. ඒවායේ අතු පතරින් නැවත කුඹ ගසක බැඳි කඹ

මෙන් වූ මහත වැල් එල්ලෙමින් තිබිණ. එය මුළුමනින්ම මිනිස් වාසයෙන් තොර ප්‍රදේශයක් විය.

සනව වැඩුණු ගස් වැල්වලට මඳක් දුරින් විවෘත පිට්ටනියක් මැද මානා සෙවිලි කළ පැල්පත් දෙකක් විය. ඉන් එකක් අනෙකට වඩා මඳක් විශාල විය. රාමචන්ද්‍ර සිටියේ එහිය. අනිත් පැලේ ඔහුගේ අත් උදව් කාරයා නැවතී සිටියේය. රාමචන්ද්‍ර තමාගේ ලෑලි මැස්ස මත දෙනෙත් පියාගෙන වැතිරී සිටියේය. ඔහු අප දැක කලබල වී නැගිට හිඳ ගත්තේය.

"මොකද වුනේ රාමචන්ද්‍ර? කොහොම ද දැන්?"

රාමචන්ද්‍ර දෑත් එක්කොට වැඳ නිහඬව සිටියේය. ඔහුගේ අත් උදව්කාර අස්රජී නමින් හැඳින්වුණු තරුණයා මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේය.

"මහත්තයෝ මේක පුදුම කතාවක්. ඇහුවොත් විශ්වාස කරන එකකුත් නෑ. මං මීට කලින් ඇවිත් මේ ගැන දන්වනවා. ඒ වුනාට අපේ මහත්තයාව මෙතන දාලා යන්නේ කොහොමද? මේකයි වුනේ. කිප දවසක ඉඳලා මිනින්දෝරු මහත්තයා කිව්වා බල්ලෙක් ඇවිත් රෑට කරදර කරනවා කියලා. මං නිදා ගන්නේ අර පොඩි පැලේ. මහත්තයා නිදා ගන්නේ මෙහේ. දවස් දෙක තුනක් ඔය විදිහට ගත වුණා. හැමදාම මහත්තයා කියනවා රෑට කොහෙන්දෝ සුදු බල්ලෙක් එනවා කියලා. මහත්තයා මැස්ස උඩ මෙට්ටෙ එළාගෙන නිදා ගන්නවා. බල්ලා ඇවිත් මැස්ස යට ඉඳන් කෙඳිරි ගානවලු. ඇහේ ඇතිල්ලෙන්නෙ එනවලු. දවස් හතරකට කලින් මහත්තයා මට අඬගහලා කිව්වා බල්ලා ඇවිත් ඉන්නවා පොල්ලකුත් අරන් ඉක්මනට එන්න කියලා. මහත්තයා උගේ වලිගේ අල්ලගෙන ඉන්නේ කියලත් කිව්වා. මං නැගිටලා ලාම්පුවකුයි පොල්ලකුයි අරගෙන දිව්වා. ඒ වෙලාවේ මං දැක්ක දේ කිව්වට සර් විශ්වාස කරන එකකුත් නෑ. ඒ වුනාට මං මොකටද සර්ට බොරු කියන්නේ. මං දැක්කා ගෑනියෙක් ගේ ඇතුලේ ඉඳන් කැලේ පැත්තට යනවා. මං ඉස්සෙල්ලා හැංගිලා හිටියා. පස්සේ කාමරේට ගියාම මහත්තයා නිදාගත්ත තැන අත ගගා ගිනිපෙට්ටිය හොයනවා දැක්කා. මහත්තයා ඇහුවා බල්ලා දැක්කද කියලා.

මං කිව්වා බල්ලෙක් නම් දැක්කේ නෑ මහත්තයා. කවුද ගෑනු කෙනෙක් නම් යනවා දැක්කා කියලා. මහත්තයා කිව්වා තමුසේ මාත්

එකක් විහිළු කරනවද? මේ රෑ මැද කැලේ මැද්දට ගෑනු කෙනෙක් එයිද කියලා. මං බල්ලගෙ වලිගේ අල්ලගෙන හිටියේ. උගේ දිග කන් දෙකත් මගේ ඇඟේ ගෑවුනා. ඌ මැස්ස යටට රිංගලා කෙදිරි ගගා හිටියේ. තමුසේ මත්වෙන ජාති බොන්න පටන් අරන් මං හිතන්නේ. මං හෙඩ් ඔපීස් එකට රිපෝට් කරනවා. තමුසේ ගැන, කියලා මහත්තයා මට බැන්නා.

පස්සෙන්දා රෑ මං නුහක් රෑ වෙනකල් නැගිටලා හිටියා. ඊට පස්සේ මට නින්ද යාගෙන එනකොට මිනින්දෝරු මහත්තයා කථා කළා. මං මගේ පැලේ දොර ළඟට දුවගෙන එනකොට ගෑනියෙක් උතුරු පැත්තේ වැට අයිනෙන් කැලේ පැත්තට යනවා දැක්කා සර්. එතකොටම මාත් ඒ පැත්තට ගියා බලන්න. ඒ ටිකට වැඩි දුරක් යන්න බෑ. අපි නිතරම කැලේ කරක් ගහන අයනේ. ඕකෙ හැම අස්සක් මුල්ලක් ගැනමම අපි දන්නවා. මං කොච්චර හෙව්වද සර්. ගෑනි ගිය සලකුණක් වත් නෑ. අන්තිමේදී මට සැක හිතිලා බිමට එළියක් අල්ලලා බැලුවා. අඩි සලකුණක්වත් නෑ, මගේ සෙරෙප්පු දෙකේ සලකුණු ඇරෙන්න.

මං එදා මේ කථාව මිනින්දෝරු මහත්තයට කිව්වෙ නෑ. මේ කැලේ මැද්දේ ඉන්නේ අපි දෙන්නා විතරනේ සර්. බයට මගේ ඇඟේ මයිල් කෙලින් වුණා. මේ කැලේ ගැන එක එක නරක කතා මිනිස්සු කියනවා. එක සැරයක් අපේ සීයා පූර්ණියාවල ඉඳලා කව්පි විකුණපු පල්ලිත් අරන් හද එළිය තියෙන රෑක අශ්වයා පිටේ නැගිලා ඇවිත් තියෙනවා. අර කන්ද උඩ තියෙන නුග ගහ ළඟින් එනකොට දැකලා තියෙනවා නුග ගහ යට ගෑනු ළමයි ටිකක් අත්වැල් බැඳගෙන නටන හැටි. මේ පැත්තේ අය ඒගොල්ලන්ට කියන්නේ 'ඩාමා බානු' කියලයි. උන් එක ජාතියක අමනුස්සයෝ වගයක්. උන් කැලේ මැදලු ඉන්නේ. උන්ට මිනිසුන්ගේ සිහිය විකල් කරලා මරලා දාන්නත් පුළුවන්ලු.

මම පස්සෙන්දා මිනින්දෝරු මහත්තයගෙ පැලට ගිහින් රෑ තිස්සෙම ඇහැරිලා හිටියා. රෑ මැදවෙන කොට නිදිමත වෙයි කියලා මං අවදි වෙලා ගණන් මිණුම් හද හදා හිටියා. හදිසියේ සද්දයක් ඇහිලා ඔලුව උස්සලා බැලුවම මිනින්දෝරු මහත්තයා නිදාගෙන හිටිය මැස්ස යටට මොකෙද්දෝ රිංගනවා දැක්කා. පාත් වෙලා මැස්ස යට බැලුවම මං ගැස්සිලා ගියා. අඳුරයි එළියයි මැද මං දැක්කා ගෑනියෙක් මැස්ස යට ඉඳගෙන මං දිහා හිනා වෙවී බලන් ඉන්නවා. මං ඒක හොඳටම දැක්ක බව සර්ගේ ඇඟේ අත ගහලා

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

දිවුරන්න පුළුවන්. ඒ ගෑනිගේ කලු පාට කෙස් වැටියත් මං හොඳටම දැක්කා. මං ලන්තෑරුම තියාගෙන ගණන් හද හදා හිටියෙ. ඒක තිබුණේ ටිකක් ඈතින්. ලන්තෑරුම අරන් හොඳට බලන්න කියලා හිතාගෙන ඒක ගන්න ගියාම මොකෙද්දෝ මැස්ස යට ඉඳලා ගියා. දොර ළඟට එළිය වැටිලා තිබුණා. මං දැක්කා ලොකු බල්ලෙක් පැනලා යනවා. ඌ නම් සුදුම සුදුයි සර්. උගේ ඇඟේ කලුපාට ළකුණක් වත් නෑ.

මිනින්දෝරු මහත්තයා නැගිටලා ඇහුවා මොකද කියලා මං කිව්වා එච්චර ගණන් ගන්න දෙයක් නෑ. නරියෙක් හරි බල්ලෙක් හරි කාමරේ ඉඳලා දිව්වා කියලා. මහත්තයා ඇහැව්වා බල්ලෙක්? ඌ මොන විදියෙ බල්ලෙක් ද කියලා. මං කිව්වා සුදු පාට එකෙක් කියලා. මිනින්දෝරු මහත්තයා බලාපොරොත්තු කඩවෙච්ච කෙනෙක් වගේ ඇහැව්වා හොඳට දැක්කද ඌ සුදු පාට ද කලු පාටද කියලා. මං කිව්වා සුදු පාට එකෙක්මයි කියලා.

මං ටිකක් පුදුම වුණා. ඌ සුදු වුණත් කලු වුණත් මහත්තයට ඒකෙන් ඇති පලේ මොකක්ද කියලා මට හිතුණා. මහත්තයා නිදා ගත්තා. ඒ වුණාට මගේ හිතට බයකුයි නොසන්සුන් කමකුයි දැනුණ නිසා කොහොමටවත් ඇහැපිය වුණේ නෑ. පහුවෙනිදා පාන්දර මැස්ස යට හොඳට හොයලා බැලුවම කලු පාට කෙස් රොදක් තිබුණා. මේ තියෙන්නේ ඒක. මේ ගෑනු කෙනෙකුගේ හිස කෙස්. මේක කොහොමද මෙතෙන්ට ආවේ? කලුපාට සිනිඳු කෙස් රොදක්. සුදු බල්ලෙකුට එච්චර දිග කලු මයිල් තියෙන්න විදිහක් නෑ. මේ මං කිව්වෙ ගිය ඉරිදා වෙච්ච දේ. ඒ කියන්නේ දවස් තුනකට ඉස්සෙල්ලා. එදා ඉඳලා මිනින්දෝරු මහත්තයගෙ ඔළුව නරක් වෙලා. මං දැන් බයේ ඉන්නේ ඊළඟට මගේ වාරෙ එයි කියලා සර්."

එය සුරංගනා කථාවක් සේ පෙනුණත් කෙස් රොද අතට ගෙන බැලූ මට කිසිවක් තේරුම් ගත නොහැකි විය. එය ගැහැනියකගේ හිස කෙස් රොදක් බවට නම් කිසිම සැකයක් නැත. ඒ නරුණයා මත්පැන් නොබොන බව හැම දෙනාම එක හඬින් කීහ.

කිසිවකු නොමැති තැනිතලාවේ තිබුණේ මිනින්දෝරු කුටි දෙක පමණි. ලොබ්ටුලියා ගම තිබුණේ සැතපුම් භයකට ඇතිනි. ගැහැනියකට එතරම් ඈතක සිට මධ්‍යම රාත්‍රියේ මෙහි පැමිණිය හැකිද? වල් ඌරන්ට හා ව්‍යාඝ්‍රයින්ට බියෙන් එහි කිසිවෙකු රෑ බෝවූ පසු එළියට වත් බසින්නේ නැත.

ඔහුගේ කථාව ඇත්තක් නම් මෙහි තේරුම් ගත නොහැකි කිසියම් ගුප්ත දෙයක් ඇත. මේ පාළු ජන ශූන්‍ය තැනිතලාව මැදින් විසිවන සියවසට ගමන් කිරීමට පාරක් නැත. දහ නවවන සියවසට වත් ඒ මැදින් ගමන් කළ නොහැකි බව පෙනේ. අතීත යුගවල සිට එන ගුප්ත වූ අන්ධකාරයකින් තවමත් මේ පළාත වැසී ගොස් ඇත. ඒ නිසා මෙවැනි දේ මෙහි සිදු වීම අරුමයක් නොවේ. එහි ඇති තාවකාලික කුටි කඩා දමා රාමචන්ද්‍ර මිනින්දෝරුවා සහ ඔහුගේ අත් උදව්කාර තරුණයා කායර්ාලයට කැඳවාගෙන ගියෙමි. රාමචන්ද්‍රගේ තත්වය ක්‍රමයෙන් නරක අතට හැරෙන්නට විය. අන්තිමේදී ඔහු හොඳටම උමතු විය. ඔහු මුළු රාත්‍රිය පුරාම කෑ ගසන්නටත් විටෙක බනින්නටත් තවත් විටෙක ගී ගයන්නටත් විය. දොස්තර කෙනෙකු කැඳවා ඔහුට පෙන්නුවත් කිසිම වෙනසක් වූයේ නැත. අන්තිමේ දී අයියා කෙනෙකු පැමිණ රාමචන්ද්‍ර කැඳවාගෙන ගියේය.

මේ සිද්ධියට ඇදිය යුතු තවත් කතාවක් ඇත. එය මෙයින් මාස හත අටකට පසුව සිදු වූ දෙයක් වුවත් ඒ ගැන ද සඳහන් කරමි.

බක් මාසයේ දිනක් පුද්ගලයෝ දෙදෙනෙක් කායර්ාලයට පැමිණිය හ. එක් අයෙක් වයස අවුරුදු හැටක්, හැට පහක් පමණ විය හැකි මහලු කෙනෙකු වූ අතර අනිකා වයස විස්සක් පමණ වූ ඔහුගේ පුත්‍රයා විය. ඔවුහු බාලියා දිස්ත්‍රික්කයේ සිට වතුයායට පැමිණ තණබිම් කොටසක් බදු ගෙන හරකුන් ඇති කරමින් සිටි අය වූහ. ඔවුන් තණ බිම් බදු ගැනීමට එන විට ඉතිරිව තිබුණේ බෝමායිබුරු වනයේ ඉඩම් කොටසක් පමණි. මම එයින් කොටසක් ඔවුන්ට බාර දුනිමි. මහල්ලා දිනක් තම පුත්‍රයා සමග පැමිණ ඒ බිම් කොටස ගැන කථා කළේය.

"හොඳ සරුවට හැදිච්ච තණකොළ ටික සර්. හරි අපූරු කැලයක්, මහත්තයා උදව් නොකරන්න එච්චර හොඳ තැනක් අපට හම්බවෙන්නේ නෑ."

ඒ වනවිට රාමචන්ද්‍රගේ කතාව මට සිහිපත් වූයේ නැත. මතක් වුණත් මා ඒ ගැන කියන්නට යන්නේද නැත. හේතුව ඒ අසා ඔහු බිය වී ඉඩම අත්හැර යන්නට ඉඩ ඇති නිසා ය. රාමචන්ද්‍රගේ ප්‍රශ්නයෙන් පසු ළඟ පාත අය ඒ පැත්තේ ඉඩම් මිල දී ගැනීමට උනන්දු නොවූහ.

එයින් මාසයකට පමණ පසු වෙසක් මාසයේ දිනක් මහලු මිනිසා කායර්ාලයේ දැඩි කෝපයකිනි. තැතිගත් ඔහුගේ පුත්‍රයා පිටුපසින් සිටගෙන සිටියේය.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"මොකද වෙලා තියෙන්නේ?"

මහල්ලා කෝපයෙන් වෙව්ලමින් කථා කළේ ය.

"මං සර් ළඟට මේ වදුරව එක්ක ආවේ නඩුවක් කියන්න. තමුන්නාසේට කියලා මූට සෙරෙප්පුවෙන් ගස්සවන්න කියලා තමයි එක්ක ආවේ."

"ඇයි මොකද වුණේ?"

"මට තමුන්නාන්සෙත් එක්ක කියන්නත් ලැජ්ජයි. මේ වදුරා මෙහාට එක්ක ආපු ටික දොහට මේකාගෙන් ගන්න දෙයක් නෑ. දැන් දවස් හත අටක ඉඳලා මං දැකලා තියෙනවා අපේ ගේ ඇතුළේ ඉඳලා ගැනියෙක් එළියට යනවා. අපි ඉන්නේ දිගින් රියන් හත අටක් විතර වෙන මානා හෙවිළි කරපු පුංචි පැලේ නේ. මගේ ඇහැට දූවිලි ගහන්නත් එච්චර ලේසිත් නෑ. මං දවස් දෙකක්ම දැකලා මේකාගෙන් ඒ ගැන ඇහුවා. මේකා අහසෙන් බිමට වැටුණා වගේ පුදුම වෙලා කියනවා මේ මොකවත් දන්නේ නෑ කියලා. තව දවස් දෙකක් ඔය දේම දැක්කට පස්සේ මං මූට අල්ලගෙන හොඳටම තඩි බෑවා. දෑස් ඉදිරිපිටම ළමයි නරක් වෙන හැටි බලන්න සර්. මං පෙරේදත් ඒකම දැක්කා. ඒකයි මං මේ එක්ක ආවේ. සර්ට කියලා දඩුවම් කරවන්න."

මට එක්වරම රාමචන්ද්‍ර මිනින්දෝරුවාගේ කතාව මතක් විය.

"රෑ කොයි වෙලාවෙද දැක්කේ?"

"පාන්දර. එළිවෙන්න පැය දෙකතුනකට කලින්."

"හොඳටම දැක්කද ගැනියෙක් කියලා?"

"මට තාම හොඳට ඇස් පේනවා සර්. ගැනියෙක් ම තමයි. වයසින් අඩුයි. එක දවසකට සුදු සාරියක්, එක දවසකට රතු එකක්, තව එක දවසක් කලු එකක් තමයි ඇඳලා හිටියේ. දවසක මං පස්සෙන් ගියා බලන්න. මානා කැලේ මැද්දේ කොයි පැත්තට පැනලා ගියාද කියලා මට හොයා ගන්න බැරි වුණා. ආපසු ඇවිත් බලන විට කොල්ලා හොඳටම නිදි වගේ ඉන්නවා. මං කතා කළාම ගැස්සිලා ඇහැරුණා, ඇත්තටම නින්දෙන් අවදි වුණා වගේ. මේ ලෙඩේට වෙන බෙහෙතක් නැති හින්දා තමයි තමුන්නාන්සේ ගාවට එක්ක ආවේ."

මම තරුණයා පසෙකට කැඳවා ප්‍රශ්න කළෙමි.

"මොනවද තමුසේ ගැන මේ කියන්නේ?"

තරුණයා මගේ දෙපා අල්ලා වැඳ කතා කරන්නට විය.

"මං කියන දේ විශ්වාස කරන්න සර්. මං මේ ගැන බින්දු මාත්‍රයක්වත් දන්නේ නෑ. මුළු දවසේම හරකුන්ට තණකොළ කවන්න

ඇවිදිනවා. රෑ වෙන කොට මැරුණා වගේ නින්ද යනවා. පාන්දර වෙලයි ඇහැ ඇරෙන්නේ. ගෙට ගිනි තිබ්බත් මට දැනෙන එකක් නෑ."

"කවදාවත් මොකෙක් වත් ගෙට රිංගනවා දැක්කේ නැද්ද?"

"නෑ සර්, මං නිදා ගත්තට පස්සේ මොනවා වෙනවද කියලා දන්නේ නෑ."

මේ ගැන මම තවත් කතා නොකෙළෙමි. මා තරුණයා පැත්තකට අඩ ගසා හොඳටම තරවටු කරන්නට ඇතැයි සිතූ මහල්ලා සතුටු විය. දවස් පහළොවකට පසු තරුණයා මා හමුවීමට පැමිණියේ ය.

"සර්ට කියන්න දෙයක් තියෙනවා. මං ගිය සැරේ තාත්තත් එක්ක ඔපිසියට ආවම සර් මොකද මගෙන් ඇහුවේ මොකෙක් හරි ගෙට රිංගනවා දැක්කද කියලා?"

"ඇයි එහෙම ඇහුවේ?"

"මට මේ දවස්වල හරියට නින්ද යන්නේ නෑ සර්. තාත්ත බනින නිසා හරි, වෙන කාරණයක් නිසා හරි මට වෙනදා වගේ නින්ද යන්නේ නෑ. කීප දවසක ඉඳලා මං දකිනවා කොහේදෝ ඉඳලා සුදු පාට බල්ලෙක් රෑට එනවා. රෑ මැද එන්නේ. සමහර දවස්වලට ඌ මං නිදාගන්න මේට්ටේ ළඟම ඉන්නවා දකිනවා. මං නැගිටලා සද්ද කළාම ඌ පැනලා යනවා. සමහර දවල්වලට මං නැගිටින කොටම පැනලා යනවා. ඌ කොහොමද දන්නේ මං නැගිටින වෙලාව? මේ විදිහට මං කීප දවසක් දැක්කා. ඒ වුණාට ඊයේ රෑ සිද්ධ වුණේ වෙන දෙයක්. තාත්තා මේ බව දන්නේ නෑ. මං හොරෙන් ආවේ සර්ට කියන්න. ඊයේ රෑ මැද ඇහැරිලා බලන කොට කොයි වෙලාවෙ හරි බල්ලා ගෙට ඇවිත් බව දැක්කා. ඌ හෙමින් සැරේ ගෙයින් එළියට ගියා. ඌ ගිය පැත්තේ බිත්තියේ ජනේලයේ සිදුරක් තිබුණා. බල්ලා පිටවෙලා ගිහින් ඇහැපිය ගහන්නත් කලින් මං ඒ සිදුරෙන් දැක්ක ගැනියෙක් ජනේලේ අයිනෙන් කැලේ පැත්තට යනවා. මං එතකොටම එළියට ආවා. කවුරුවත් පේන්න හිටියෙ නෑ. මං තාත්තට කිව්වෙත් නෑ. වයසක මනුස්සයා නිසා. මේ මොකද්ද කියලා මට නම් තේරෙන්නේ නෑ."

"ඒ ඇහේ මායාවක් වෙන්න ඇති. එහෙ ඉන්න බය නම් මෙහාට ඇවිත් නිදා ගන්න."

මම ඔහුව අස්වසමින් කීවෙමි. තරුණයා තමාගේ දුබල කම ගැන ලැජ්ජා වන්නට ඇත. ඔහු යන්නට ගියේ ය. එසේ වුවත් මගේ සිතේ නොසන්සුන්කම දුරු වුයේ නැත. නැවත වරක් යමක් අසන්නට

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ලැබුණොත් කායික්‍යාලයේ ආරක්ෂක භටයින් දෙදෙනෙකු රාත්‍රියට නිදාගැනීම සඳහා එහි යවන්නට මම තීරණය කළෙමි.

ඒ වනවිට මෙය කෙතරම් භයානක දෙයක්දැයි මා තේරුම් ගෙන සිටියේ නැත. අනතුර සිදුවුයේ නොසිතූ පරිදිය.

දින තුනකට පසු උදැසන අවදි වූ විට මට අසන්නට ලැබුණේ පෙර දින රාත්‍රියේ බෝමායිබූරු කැලයේ මහලු මිනිසාගේ පුත්‍රයා මිය ගොස් ඇති බවය. මම එවේලේම අශ්වයා පිට නැගී එහි යාමට පිටත් වීමි. එහි ගිය විට මා දුටුවේ ඔවුන් සිටි පැල පිටුපස මානා සහ ඉළුක් පදුරු සහිත කැලය මැද තරුණයාගේ මළ සිරුර වැටී ඇති බවය. ඔහුගේ මුහුණේ පිළිබිඹු වුයේ දැඩි භීතියට පත් වූවකුගේ ස්වභාවයකි. ඔහු කිසියම් බියකරු දෙයක් දැක මිය යන්නට ඇතැයි සිතිය හැක. තරුණයාගේ පියා පැවසූ අන්දමට ඔහු රෑ මැද අවදි වී ඇත. පුත්‍රයා නිදන නැන නොසිටි නිසා ලන්තෑරුමක් ගෙන ඔහු එළිවන තුරු ඇවිද ඇත. මෘත දේහය හමු වී ඇත්තේ එළි වූ පසු ය. තරුණයා හදිසියේ නින්දෙන් නැගිට කිසිවකු පිටුපසින් කැලය මැදට යන්නට ඇතැයි සිතිය හැක. මළ සිරුර අසල පොල්ලක් තිබීමෙන් ඒ කරුණ සනාථ විය. ඔහු කවුරුන් පසුපස යන්නට ඇත්දැයි කීමට අසීරුය. ඊට හේතුව සිනිඳු වැල්ල මත තරුණයාගේ පා සටහන් හැරෙන්නට වෙනත් මිනිසකුගේ හෝ සතෙකුගේ පා සලකුණක් නැති වීම ය.

මළ සිරුරේ කිසිම තුවාලයක සලකුණක් නොතිබිණ. වන මැද සිදු වූ මරණය ගැන වැඩි දුර පරීක්ෂණ කිරීමට මගක් නො විය. එහි පැමිණි පොලිස් නිලධාරීහු කිසිවක් කර ගත නොහැකි ව ආපසු ගියහ. ඒ සිද්ධියෙන් පසු හිරු බැස ගිය පසු කිසිවෙක් ඒ පළාතට යාමට බිය වූහ. ටික දිනක් යන තුරු මා තනි ව කාමරයේ සිටිද්දී පිටත වූ ධවල වර්ණ, ඡායා නොමැති, පාළු, උදාසීන සඳ පහන් රාත්‍රීන් දැක කිසියම් බිය ජනක හැඟීමකින් මගේ ආත්මය කම්පා විය. මට කල්කටාවට පලා යන්නට සිතිණ. මේ පළාත එතරම් යහපත් තැනක් නොවන බවත් සඳ එළියෙන් දිලෙන නිශා රැජින හෝ සුරංගනා කතාවල එන රාක්ෂය රැජින වැන්නියක් හෝ කිසිවකු වසඟ කර සිහිමුලා කොට මරා දැමීමට බැරි කමක් නැති බවත් මට සිතෙන්නට විය. මේ වනය මිනිසුන් වාසය කරන තැනක් නොව ඉජ්ජ වූද, සිරුරු නොමැති වූද, ජීවීන්ගේ රාජ්‍යයකි. බොහෝ කාලයක සිටි මෙහි වසන ඔවුහු මෙහි ස්ථිර පදිංචි කරුවෝ වෙති. හදිසියේ

ඔවුන්ගේ ගුප්ත රාජ්‍යයට අවසර නොමැති ව මිනිසුන් ඇතුළු වීම ගැන ඔවුහු අමනාප වී සිටිති. අවස්ථාවක් ලැබුණු විට ඔවුහු ඊට පලිගෙන මිස අත නොහරිති.

රාජු පාණ්ඩේ මට මුලින් ම හමු වූ දිනය අදත් හොඳින් මතක තිබේ. මා කාර්‍යාලයේ වැඩ කරමින් සිටින විට කඩවසම් පෙනුමක් ඇති පැහැපත් සිරුරෙන් යුතු වූ බ්‍රාහ්මණයෙක් පැමිණ මට ආචාර කර සිටියේය. ඔහු වයස පනහ ඉක්මවූවකු සේ පෙනිණ. ඔහු මෙන් මනාව වැඩුණු දේහයක් ඇති කෙනෙකු බෙංගාලයේ තරුණයන් අතර වත් දැකිය හැක්කේ කලාතුරකිනි. නළලේ තිලකයක් තබා සිටි ඔහුගේ උරයේ සුදු පැහැති උතුරු සළුවක් විය. අතේ තිබුණේ කුඩා පොට්ටනියකි.

මා ඔහු ආ කාරණය විමසූ විට තමා බොහෝ දුර සිට පැමිණි බවත් ඉඩමක් ලැබුණොත් වගා කිරීමට කැමති බවත් ඔහු පැවසීය. තමා ඉතා දිළිඳු බව කී ඔහු තමාට ඉඩම් බද්දට ගැනීමට නොහැකි නිසා අඳේට වැඩ කිරීමට බිම් කොටසක් ලබා දිය හැකි දැයි මගෙන් විමසී ය.

සමහර මිනිස්සු තමාගේ තත්වය ගැන හරි හැටි විස්තර කිරීමට අසමත් වෙති. එසේ වුවත් ඔවුන්ගේ මුහුණු දුටු විට ඔවුන් ඉතා අසරණ බව වැටහේ. රාජු පාණ්ඩේ දුටු විට ඔහු ධරම්පුරයේ සිට මෙහි පැමිණ ඇත්තේ ලොකු බලාපොරොත්තුවකින් බවත් වගා කිරීමට ඉඩමක් නොලැබුණොත් දුකින් යුතුව ආපසු යා හැකි බවත් මට සිතුණි. ලොබ්ටුලියාවට උතුරු පැත්තේ කැලයෙන් අක්කරයක පමණ කොටසක් ඔහුට දුන්නෙමි. කැලය එළි පෙහෙලි කරන මුල් වසරේදී බදු මුදලක් දීම අනවශ්‍ය බවත් ඉන් පසුව ඇනා හතර බැගින් බදු ගෙවිය යුතු බවත් මම ඔහුට දැන්වූයෙමි. ඒ වන විට මොහු කුමන අන්දමේ කෙනෙකුදැයි මට තේරුම් ගෙන නොසිටියෙමි.

රාජු පැමිණියේ බිනර හෝ වප් මාසයේය. වැඩ කටයුතු අධික වීම නිසා මට ඔහු ගැන මුළුමනින්ම අමතක විය. ඊළඟ වසරේ සිත කාලය අවසානයේදී මා ලොබ්ටුලියාවේ පිහිටි කාර්‍යාලයේ සිට ආපසු එද්දී ගසක් යට හිඳගත් කෙනෙකු පොතක් බලමින් සිටින බව දුටුවෙමි. මා දුටු ඒ තැනැත්තා පොත වසා වහා නැගිට්ටේය. ඔහු රාජු පාංඩේ බව මම දුටුවෙමි. කලින් වසරේ ඉඩම බාර දුන් පසු ඔහු එක් දිනක්වත් කාර්‍යාලයට නොආවේය. ඊට හේතුව කුමක්දැයි මගේ සිතේ කුතුහලයක් පැන නැගිණි.

"රාජු පාංඩේ මෙහේද තාම? මං හිතුවා ඉඩම අතැරලා යන්න ගියා කියලා. මුකුත් වගා කළේ නැද්ද?"

බිය නිසා රාජුගේ මුහුණ වියළී කුඩා වී ගියේ ය. ඔහු ගොන ගසන්නට විය.

"ඔව් සර් මේ පාර නම් මුකුත්....."

මට තරමක් තරහ ගියේය. මොහු හොඳින් කථා කර වැඩ කරවා ගැනීමට හපනෙකු යයි මට සිතිණ.

"අවුරුද්දක් හමාරක්ම ඔපීස් එක පැත්තේවත් ආවේ නෑ. එස්ටේට් එකේ අය රවට්ටලා අස්වැන්න ගෙදරට අරගෙන ගියා නේද? බිම් පංගුව දෙන්න පොරොන්දු වුණා මතක නැද්ද?"

රාජු විස්මය රැඳී තමාගේ ලොකු දෑස්වලින් මා දෙස බැලුවේය.

"අස්වැන්න? මට ඒකෙන් පංගුවක් දෙන්න ඕනෑ කියලා මතක වුනෙත් නෑ සර්. මං වැව්වේ චීන තණ හාල්."

මට ඔහුගේ කථාව විශ්වාස කළ නොහැකි විය.

"තණහාල් ඒවද මෙච්චර කල් කෑවේ ? වෙන බෝග වගා කළේ නැද්ද? ඇයි ඉරිතු වැව්වේ නැද්ද?"

"නෑ සර්. මහ කැලේ මං තනියම නේ ඉන්නේ. පොඩි කොටසක් විතරයි බිම්කොටලා හදා ගත්තේ එන්න සර්. කරුණාකරලා පොඩ්ඩක් ඇවිත් බලන්න."

මම රාජුගේ පිටු පසින් ගියෙමි. කැලෑව වැවී තිබුණ නිසා අශ්වයා පිටින් යාමද අසීරු විය. ටික දුරක් ගිය විට රටුම් හැඩයට එළි පෙහෙළි කළබිම් කොටසක් හමු විය. එහි මානා සෙවිලි කළ කුඩා පැල්පත් දෙකක් විය. එතන රාජු වාසය කළ අතර අනෙක ඔහුගේ ධාන්‍ය ගබඩාව විය. මලු හෝ ගෝනි නොමැති නිසා ධාන්‍ය බිම ගොඩ ගසා තිබිණ.

"රාජු මේච්චර කම්මැලියෙක් කියලා මං හිතුවෙ නෑ. මේච්චර කාලෙකට අක්කරයක්වත් එළි පෙහෙළි කරගෙන නෑ නේද?"

රාජු බියෙන් යුතුව පිළිතුරු දුන්නේය.

"වැඩ කරන්න වෙලාව මදි සර්."

"ඇයි දවස තිස්සේ මොනවද කරන්නේ?"

රාජු ලැජ්ජාවට පත්ව නිහඬ විය. රාජුගේ පැල්පතේ බඩුමුට්ටු වැඩි පුර නිබුණේ නැත. එක් මුට්ටියක් ඇරෙන්නට ලෝහ භාජන කිසිවක් එහි නොවීය. ඔහු බත් පිසින්නේ ඒ මුට්ටියේ විය හැක. ඇත්ත

වශයෙන් ම කිව හොත් ඔහුට ඒ මුට්ටියේ උයන්නට හාල් නැත. ඔහු වීන තණහාල් පිස අමු සල් කොළවලට බෙදාගෙන අනුභව කරයි. ජලය ලබා ගැනීමට කුඩා පොකුණක් ඒ අසල ඇත. ඔහුට ඊට වැඩි දෙයක් අවශ්‍ය නොවේ.

පැලේ එක් මුල්ලක ගලින් තැනූ රාධා හා කෘෂ්ණගේ කුඩා පිළිම දෙකක් තිබිණ. ඒවායේ සිංදුර තවරා තිබිණ. ඒ දැක මට සිතුණේ රාජු දෙවියන් කෙරෙහි භක්තිමත් වූවකු බවය. ගලින් සකස් කළ පුදසුන වන මලින් සරසා තිබිණ. ඒ අසල පොත් කීපයක්ද විය. තමාට වැඩ කිරීමට වේලාව නැතැයි ඔහු පවසන්නට ඇත්තේ පුද පූජා පැවැත්වීමට සැහෙන කාලයක් ගතවන බැවිනි.

රාජු ගැන මට මුලින් තේරුම් ගියේ එවිටය. රාජු හින්දි ලිවීමට හා කියවීමට හොඳින් දනී. ඔහුට සංස්කෘත භාෂාව පිළිබඳවද සාමාන්‍ය දැනීමක් ඇත. පොතක් රැගෙන ගස් කොළන් අතරට වී හිඳගෙන සිටියත් ඔහු වැඩි වේලාවක් පොත් කියවන්නේ නැත. ඇත ආකාශය දෙස බලාගෙන ඔහු බොහෝ වේලාවක් ගත කරයි. දිනක් ඔහු කටු පැනකින් සටහන් පොතක කුමක්දෝ ලියනු මම දුටුවෙමි. රාජු කවි ලියනවාවත්දැයි මට සිතුණි. ඔහු කෙතරම් ලැජ්ජාශීලී නිහඬ මිනිසෙකුදැයි කිවහොත් ඔහුගෙන් වචනයක් ගැනීම ඉතා අසිරු ය. තමා ගැන කිසිම දෙයක් කීමට ඔහු කැමති නැත.

"රාජුගේ ගෙදර කවුරු කවුරු ද ඉන්නේ?"

"හුඟ දෙනෙක් ඉන්නවා. පුත්තු තුන් දෙන්නයි. දුවල දෙන්නයි. කණුවැන්දුම් වෙච්ච නංගී කෙනෙකුයි"

"ඒ ගොල්ලෝ ජීවත් වෙන්නේ කොහොමද?"

රාජු අහස දෙසට දෑත් එසවීය.

"දෙයියො තමයි උන්ව ජීවත් කරවන්නේ. උන්ට කන්න දෙන්න තමයි මං මෙහෙං ඉඩම් කෑල්ලක් ඉල්ල ගත්තේ. පොළොව කොටල හරියට හදා ගන්න පුළුවන් වුනොත්....."

"ඒ වුනාට අක්කරයක් වගා කරලා ලොකු පවුලක් රකින්න පුළුවන් ද? ඒ නැතත් තමුසෙ වැඩිපුර මහන්සි වෙන්නෙත් නැනේ."

රාජු එයට පිළිතුරක් නුදුන්නේය. ටික වේලාවකට පසු ඔහු කථා කළේය.

"අපේ ජීවිත කාලය හරිම කෙටියි සර්. කැලේ කපන්න ගිහාම කොයි තරම් දේවල් මතක් වෙනවද? එතකොට මං ඉඳගෙන කල්පනා

කරනවා. මේ කැලෑබද පළාත හරි අපූරුයි. කොච්චර මල් පිපෙනවද මෙහේ? කුරුල්ලෝ කෑ ගහනවා. හුළඟත් එක්ක දෙවියොත් පොළොවට ඇවිත් පය ගහනවා. මුදල්වලට ලෝභ කම් කරන ගනුදෙනු කරන තැන්වල හුළඟත් විසයි. ඒ තැන්වල දෙවියෝ වැඩ ඉන්නේ නෑ. මෙහේදි කැති පොරෝ අතට ගත්තම දෙවියෝ ඇවිත් ඒවා උදුරා ගන්නවා. ලෞකික සැප සම්පත්වලින් ඈතට යන්න හිතෙන දේවල් කනට ළං වෙලා කියනවා.

රාජු කවියෙකු පමණක් නොව දාර්ශනිකයකුද වන බව මට පෙනී ගියේය.

"ඒ වුනාට රාජු දෙව්වරු කියන්නේ නෑ නේද ගෙදරට වියදම යවන්න එපා, දරුමල්ලෝ බඩගින්නේ තියන්න කියලා? ඔය කථා අත ඇරලා වැඩ කරන්න. නැති නම් මං ඉඩම ආපහු ගන්නවා."

තවත් මාස කීපයක් ගත විය. මම වරින් වර රාජුගේ නිවසට යාමට පුරුදුව සිටියෙමි. මට ඔහුගේ ඇසුර ප්‍රිය විය. ඒ පාළු ලොබ්ටුලියා කැලයේ මානා සෙවිලි කළ කුඩා පැල්පතේ ඔහු කල් ගෙවන්නේ කෙසේදැයි මට තේරුම් ගත නොහැකි විය. සත්‍ය වශයෙන් ම රාජු පවිත්‍ර ස්වභාවයෙන් යුතු වූ මිනිසෙක් විය. බාල වර්ගයේ වීන තණහාල් හැර වෙනත් බෝගයක් වගා කිරීමට ඔහුට නොහැකි විය. හත් අට මාසයක්ම සිනාමුසු මුහුණින් යුතුව ඔහු අනුභව කළේ ඒවාය. ඔහු කිසිවකු හමු වීමට ගියේ නැත. කථා බහ කරමින් සිටියේද නැත. එයින් ඔහුට කිසිම අපහසුවක් දැනුණේද නැත. ඔහු හොඳින් කල්ගත කළේය. දහවලට රාජුගේ ඉඩම අසලින් යන විට අව්වේ සිට ඔහු වැඩ කරනු දැකිය හැක. සන්ධ්‍යා කාලයේදී ඔහු නිහඬව හරිතකි ගසක් යට හිඳගෙන සිටිනු දැකි හැක. සමහර දිනවල ඔහුගේ අතේ සටහන් පොතක් තිබිණ; ඇතැම් විට නොතිබිණ.

"රාජු මං තව ඉඩම් කෑල්ලක් දෙන්නම්. හොඳට වගා කරන්න. නැතිනම් ගෙදර මිනිස්සු කන්න නැතිව මැරෙයි."

දිනක් මම ඔහුට කීවෙමි. රාජු තැන්පත් ශාන්ත පුද්ගලයෙකි. ඔහුට යමත් තේරුම් කර දීමට එතරම් මහන්සි විය යුතු නැත. ඔහු තව ඉඩම් කොටසක් ලබා ගත්තේය. එසේ වුවද මාස පහක් හයක් යනතුරුම ඉඩම් කොටස එළි පෙහෙළි කර ගැනීමට ඔහුට නොහැකි විය. උදැසන අවදි වන ඔහු පූජා පවත්වා භගවත් ගීතාවේ ගාථා කියා අවසන් වන විට උදේ දහය පමණ වේ. ඉන්පසු පැය දෙකක් පමණ වැඩ කරන ඔහු නිවසට පැමිණ කෑම පිළියෙළ කර අනුභව

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

කරයි. එයින් පසු සවස පහවන තුරු වැඩ කරයි. සැන්දෑවේ ගසක් යට හිඳගෙන කල්පනා කරන ඔහුට රෑ බෝ වූ විට ගාථා කියා පූජා පැවැත්වීමට ඇත.

ඒ වසරේ රාජු ඉරිහු සිටවීය. තමාගේ අනුභවයට එයින් කොටසක්වත් නබා නොගෙන ඔහු ඒ සියල්ලම ගමට යැවීය. ඒවා රැගෙන යාමට පැමිණියේ ඔහුගේ වැඩිමහල් පුත්‍රයා ය. රාජුගේ පුතා කාර්‍යාලයට පැමිණි විට මම ඔහුට බැන වැදුණෙමි.

"නාත්තට මේ කැලේ මැද්දේ තනියම ඉන්න ඇරලා හොඳට ගෙදරට වෙලා ඉන්නවා නේද? ලැජ්ජා නැද්ද ඔහොම ඉන්න? ඇයි ඔයගොල්ලොත් ඇවිල්ලා මහන්සි වෙලා වැඩක් කරන්නේ නැත්තේ?"

* * * * * *

ඒ දිනවල ශුයෝර්මාරි ගමේ දරුණු කොලරා වසංගතයක් පැතිර යන බව මට කාර්‍යාලයේ සිටියදී ආරංචි විය. ශුයෝර්මාරි ඈත පිහිටි ගමකි. අප සිටින තැනට සැතැපුම් දහයක් පමණ දුරින් කුශී සහ කලබලියා ගංගා අසල පිහිටි ඒ ගමේ මිනිස්සු කොලරා වසංගතය නිසා මිය යමින් සිටියහ. කුශී ගංගාවේ දිනපතා මිනී පාවෙන්නට පටන් ගත්තේය. මිනී ආදාහන කරන්නට මගක් නොවූ හෙයින් මිනී ගඟට දමන්ට පටන් ගෙන තිබිණි. රාජු පාංඩේ වෙදකම් කිරීම පිණිස එහි ගිය බව මට දැන ගන්නට ලැබිණි. රාජු වෙදෙකු බව මම ඉන් පෙර දැන නොසිටියෙමි. මා ද හෝමියෝපති චිකිත්සාව ටික කාලයක් ඉගෙන ගෙන, බෙහෙත් අත පත ගා තිබුණු නිසා වෙදුන් හිඟ ඒ පළාතේ රෝගීන්ට කිසියම් උපකාරයක් කළ හැකිදැයි බැලීමට මට සිත් විය. මා කාර්‍යාලයේ සිට එහි යද්දී තවත් කීප දෙනෙක් මා සමග එහි ගියහ. ශුයෝර්මාරි ගමේදී රාජු පාංඩේ හමු විය. ඔහු මල්ලක බේත් හේත් දමාගෙන ගෙයින් ගෙට ඇවිදිමින් සිටියේය. මා දැක සතුටට පත් වූ ඔහු මට ආචාර කළේය.

"සර් ආපු එක කොච්චර එකක්ද? මේ මිනිස්සු ටික බේරා ගන්න පුළුවන් වුනොත් කොච්චර හොඳ ද?"

මා ඒ පළාතේ සිටින බලවත් ම රජයේ නිලධාරියා ලෙස හෝ ප්‍රසිද්ධම වෛද්‍යවරයා ලෙස හෝ ඔහු සැලකූ බව පෙනිණි.

රාජු බෙහෙත් දෙන්නේ ණයට බව මම දුටුවෙමි. සනීප වූ පසු මුදල් දෙන පොරොන්දුව පිට ඔහු ලෙඩුන්ට ප්‍රතිකාර කරන්නට ඇත.

පැල්පතින් පැල්පතට දර්ශනය වූයේ දිළිඳු කමේ ප්‍රතිමූර්තියම ය. සමහර ගෙවල් මඩු ආකාරයට තැනූ ඒවාය. පිදුරු සෙවිළි කළ, කුඩා කුටිවලින් සමහරක ජනෙල් නැති හෙයින් ගෙතුළට වාතාශ්‍රයක් නොලැබිණ. සෑම නිවසක ම පාහේ රෝගීහු එක් කෙනෙක් හෝ දෙදෙනෙක් කිලිටි ඇතිරිල්ලක වැතිරී සිටියහ. වෛද්‍ය ප්‍රතිකාර හෝ පෝෂ්‍ය ආහාර ඔවුන්ට නොලැබිණ. රාජු තමාට හැකි පමණින් රෝගීන් බේරා ගැනීමට කටයුතු කරන්ට ඇත. කැදවීමක් නොමැතිවම නිවෙස්වලට ගොස් ඔහු ප්‍රතිකාර කළේය. පෙරදා රාත්‍රිය පුරා ඔහු කුඩා රෝගී ළමයෙකු අසල හිඳගෙන සාත්තු කර තිබේ. කුමක් කළත් වසංගතයේ පැතිරීම වැඩි වූවා මිස අඩු වීමක් දක්නට ලැබුණේ නැත.

රාජු ඒ ගමේ නිවසකට මා කැඳවා ගෙන ගියේය. එහි වූයේ එක් කාමරයකි. බිම එළූ තල් කොළ පැදුරක වයස පණහක පමණ රෝගියෙක් වැතිර සිටියේය. අවුරුදු දාහතක දහඅටක පමණ ගැහැනු ළමයෙක් ඔහු ඉදිරියේ හිඳගෙන කඳුළු වගුරුවමින් සිටියා ය. රාජු ඇයව අස් වැසුවේ ය.

"අඬන්න එපා දුවේ. මේ මහත්තයත් ඇවිල්ලා ඉන්නේ. බය වෙන්න එපා. ලෙඩාට හොඳවේවි."

ඔවුන්ට පිහිට වීමට මට හැකියාවක් නොමැති වීම ගැන මම ලැජ්ජාවට පත් වූයෙමි.

"මේ ලෙඩාගේ දුවෙක්ද?"

"නෑ සර්. ඔය ලෙඩාගේ පවුල. ඔය කෙල්ලට කාත් කවුරුවත් නෑ. කණුවැන්දුම් වෙච්ච අම්මා විතරයි හිටියේ. මේ මනුස්සයාට කෙල්ල බන්දලා දුන්නට පස්සේ අම්මත් මැරිලා ගියා. මේ මනුස්සයා බේර ගන්න උදවු කරන්න සර්. නැතිනම් මේ කෙල්ලටත් මහපාර තමයි."

රාජුගේ කථාවට උත්තර දෙන්නට යද්දී රෝගියාගේ ඉහ ඉද්දර බිත්තියේ රාක්කයක විවෘත භාජනයක් මගේ නෙත ගැටිණ. එහි හිල් බත් ටිකක් විය. එහි මැස්සෝ දහ දෙනෙක් පමණ වසා සිටියහ. දරුණු කොලරා රෝගයක් වැළඳුණු කෙනෙකු ගෙයි සිටියදී රෝගියා සිටින තැනට මදක් දුරින් නොවැසූ භාජනයක කෑම තබා තිබීම කෙතරම් භයානක දෙයක්ද?

දවස තිස්සේම රෝගියාට සාත්තු කිරීමෙන් පසු දිළිඳු තරුණිය ඒ බත් ටික ලුනු මිරිස් සමග කන්නට සිතා සිටින්නට ඇත. එය විෂ

බීජ සහිත බතකි. එහි හැම බත් ඇටයකම මරණයේ බීජ තැවරී ඇත. තරුණියගේ කඳුළු පිරුණු අහිංසක මුහුණ දෙස බැලූ මගේ සිරුර කිළිපොලා ගියේය.

"ඔය බත් ටික විසි කරන්න කියන්න. මේ කාමරේ කෑම තියන්නවත් හොඳද?"

මම රාජුට කීවෙමි. තරුණිය පුදුමයට පත්වී මා දෙස බැලුවාය. 'බත් විසි කරන්නේ ඇයි? ඒක විසි කරලා මොනවද කන්නේ? යයි ඇය සිතන්නට ඇත. ඒ බත් ගමේ යකැදුරු ගෙදරින් පෙරේදා රෑයේ ඇයට ගෙනැවිත් දී තිබිණි.

මේ පළාතේ අයට බත්, අපේ පළාතේ අයට බුරියානිමෙන් වූ විශේෂ කෑමක් බව මට සිහිවිය. එසේ වුවද මම දැඩිව සිටියෙමි.

"දැන්මම ඔක අරන් ගිහින් එළියට විසි කරනවා."

තරුණිය බියෙන් නැගිට ගොස් බත් ටික විසි කළාය.

ඇගේ සැමියා බේරා ගැනීමට නොහැකි විය. රාත්‍රියේදී ඔහුගේ අවසන් හුස්ම වානයට එක් විය. තරුණිය බොහෝ සේ හැඬුවාය. රාජුද ඒ සමග හඬන්නට විය.

රාජු තවත් නිවසකට මා කැඳවා ගෙන ගියේය. එය රාජුට දුර නෑ කමක් ඇති කෙනෙකුගේ නිවසකි. පළමු වරට එහි පැමිණි රාජු නැවතී කෑම බීම ගත්තේ ඒ නිවසිනි. එහි සිටි මව සහ දරුවාට එකවර කොලරාව වැළඳී තිබිණ. රෝගීන් දෙදෙනා එක ළඟ කාමර දෙකක වෙන වෙන ම සිටියහ. ළමයාගේ වයස අවුරුදු හතක් අටක් පමණ විය. දෙදෙනාම එකිනෙකා දැකීමට නොසන්සුන් ව සිටියහ.

ළමයා පළමුවෙන් මිය ගියේය. ඒ බව මවට දන්වනු නොලැබිණි. මගේ හෝමියෝපති වෙද කමින් මවගේ තත්වය තරමත් හොඳ අතට හරවා ගැනීමට හැකි විය. මව දරුවා ගැන ම විමසන්නට වූවා ය.

යාබද කාමරයෙන් කිසිම හඬක් නැසෙන්නේ මන්ද? දරුවාගේ තත්වය දැන් කෙසේද? යනාදී ප්‍රශ්න ඇය නිතර ඇසුවා ය.

"එයාට නින්ද යන්න බෙහෙත් දීලයි තියෙන්නේ. එයා නිදි."

අපි හොර රහසේ දරුවාගේ මළ සිරුර කාමරයෙන් පිටතට ගෙන ගියෙමු.

ගමේ මිනිස්සු සනීපාරක්ෂක පුරුදු ගැන කිසිවක් දැන නොසිටියහ. ගම අසල වූ පොකුණ රෙදි සේදීමටද ස්නානය කිරීමට ද භාවිතා කළ අතර බීමට ගත්තේද ඒ ජලයමය. දිය නැමත් බීමත්

එකම ජලාශයෙන් නොකළ යුතු බව කීවත් ඒ බව ඔවුන්ට වටහා දීමට මට හැකි වූයේ නැත. බොහෝ දෙනා එකිනෙකා අතහැර පලා යමින් සිටියහ. එක නිවසක රෝගියකු පමණක් සිටියදී අනෙක් අය පලා ගොස් සිටිය හ. රෝගී තැනැත්තා ඒ නිවසේ ගෙහිමියාගේ බෑණා විය. ඔහුගේ බිරිඳ ගිය වසරේ මිය ගොස්ය. ඔහුගේ තත්වය නරක නිසා හෝ වෙන කාරණයක් නිසා හෝ ගෙදර අනෙක් අය ඔහුව අතහැර දමා ගොස් සිටියහ. රාජු දිවා රෑ ඔහුට සාත්තු කිරීමෙහි නිතර විය. මම බෙහෙත් පිළියෙළ කර දුනිමි. අන්තිමේ දී ඔහුගේ දිවි බේරුණේය. මාමණ්ඩියගේ නිවසට වී ඔවුන් සඳහා මුදල් උපයමින් දුක් විඳින්නට ඔහුට තවත් ණය තිබේ යැයි මට සිතිණි.

රාජු තම මුදල් පසුම්බිය හැර ලෙඩුන්ට ප්‍රතිකාර කිරීමෙන් ලැබුණු මුදල් ගණිනු මම දුටුවෙමි.

"කීයක් හම්බ වෙලා තියෙනවද රාජු?"

රාජු මුදල් ගණන් කිරීමෙන් පසු පිළිතුරු දුන්නේය.

"රුපියලකුයි ඇනා තුනකුයි තියෙනවා."

ඔහු එයින් තෘප්තිමත් වී සිටියි. ඒ පළාතේ අයට සුළු මුදලක්වත් පහසුවෙන් දකින්නට ලැබෙන්නේ නැත. රුපියලක් හා ඇනා තුනක් යනු ඒ පළාතේ හැටියට ලොකු ගණනකි. දින පහළොවක පමණ කාලයක් තිස්සේ වෛද්‍යවරයෙකු ලෙසද සාත්තු සේවකයකු ලෙසද රාජු කෙතරම් මහන්සි වූයේද?

එදින මධ්‍යම රාත්‍රියේ ගමෙන් හැඬුම් වැළපුම් හඬවල් ඇසෙන්නට විය. තවත් එක් අයෙකු මිය යන්නට ඇත. රාත්‍රිය පුරා අපට නින්ද ගියේ නැත. ඒ දිනවල ගමේ වැඩි දෙනෙක් නිදා ගත්තේ නැත. ගමේ මිනිස්සු ගෙවල් ඉදිරිපිට ලොකු දර කොට පුළුස්සා ගිනිගොඩවල් ගසා ගෙන්දගම් දවති. ඔවුහු ගිනිගොඩ වටේ හිඳ කතාකරමින් සිටීමට පුරුදුව සිටිති. ලෙඩ රෝග හා මරණය ගැන හැර වෙනත් දෙයක් ගැන ඔවුහු කථා නො කරති. සියල්ලන්ගේ ම මුහුණුවල බියක් හා ව්‍යසනයක සලකුණු ඇත. ඊළඟට පැමිණෙන්නේ කාගේ වාරය දැයි සැකයක් ඔවුන්ගේ මුහුණුවල රැඳී ඇත.

රාත්‍රියේදී අපට ආරංචි වූයේ ළඟදී සැමියා මළ තරුණියට කොලරාව වැලඳී ඇති බවය. එහි ගොස් බැලූ විට ඇය තමාගේ ස්වාමියාගේ නිවස අසල වූ ගව මඩුවක වැතිරී සිටින බව දුටුවෙමි. තමාගේ ගෙට පැමිණ නිදා ගැනීමට ඇති බිය නිසා ඇය එහි වැතිරී සිටියාය. කොලරා රෝගියෙකුට සාත්තු කළ බැවින් කිසිවකු ඇයව

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

නිවසට වැද්ද ගෙන නැත. ගව මඩුවේ පැත්තක ඇති පිදුරු ගොඩක් මත කබල් පැදුරක් එළා වැතිරී සිටි ඇය වේදනාවෙන් නොසන්සුන්ව සිටියාය. රාජුත් මමත් ඒ අසරණිය බේරා ගැනීමට බොහෝ උත්සාහ කළෙමු. ලන්තෑරුමක් හෝ ජලය ටිකක් හෝ ඉල්ලා ගැනීමට අහල පහළ කිසිවෙක් නො වූහ. කිසිවකු ඇය දෙස එබී බැලීමට වත් නො පැමිණියහ. ඒ දිනවල කොලරාව වැළඳුණු රෝගියෙකු සිටින පළාතකටවත් යාමට කිසිවෙකු කැමති වූයේ නැත.

පසුදාට එළිවිය.

රාජු නාඩි ශාස්ත්‍රය හොඳින් දනී. ඇගේ නාඩි බැලූ ඔහු "ලෙඩාගේ තත්වය නම් හොඳ නෑ සර්." යයි කිවේය. මා කුමක් කරන්නද? මම දොස්තර කෙනෙකු නොවෙමි. එසේ වූවා නම් සේලයින්වත් දෙන්නට තිබුණි. දොස්තර කෙනෙක් පළාතකවත් නැත.

උදෑසන නවය පමණ වනවිට ඇය මිය ගියාය.

අප දෙදෙනා නොසිටියේ නම් ඇයගේ මෘත දේහය කිසිවෙකු දකීද යන්නද සැක සහිතය. අප දෙදෙනාගේ බලවත් ඉල්ලීම නිසා එඩේර කුලයේ මිනිස්සු දෙදෙනෙක් පැමිණ උණ බට වල ආධාරයෙන් මළ සිරුර තල්ලු කරගෙන මෙන් ගහ දෙසට ගියෝය.

"මෙහෙම වෙච්ච එකත් හොඳයි සර්. දරුවෙක්වත් නැතිව කණවැන්දුම් වෙලානේ හිටියේ. මොකුත් නොතේරෙන කෙල්ලක්නේ. කවුද කන්න බොන්නවත් දෙන්නේ? කවුද බලන්න ඉන්නේ?"

"ඔය ගොල්ලන්ගේ පළාතේ අය හරි නපුරුයි රාජු" මම කීවෙමි.

ඇය මහත් උවමනාවෙන් කෑමට නබාගත් බත් ටික කන්නට නොදී විසි කරන්නට සිදු වීම ගැන මගේ සිතේ මහත් වේදනාවක් රැඳී තිබිණ.

* * * * * *

නිහඬ දවාලේ ඈත මහාලිඛාරූප කඳු වැටිය හා වනාන්තරය අපූරු ගුප්ත ස්වභාවයකින් දිස්වෙයි. කන්දට නැග ඇවිද එන්නට මා කීප වරක් සිතුවත් ඒ සඳහා වේලාවක් නොතිබිණ. මහාලිඛාරූප කඳු වැටිය තෙනෙකුට ළඟා වීමට දුෂ්කර වූ රුස්ස වනයක් බවත් එය නයි පොළඟුන්ගෙන්ද කොටි වළසුන්ගෙන්ද ගහණ වූ ස්ථානයක් බවත්, මට අසන්නට ලැබිණ. ඒ පළාත දුර්ලභ වූ වන කපුරු මල්වලින් පිරී ඇති බවද මට දැනගන්නට ලැබිණ. කඳු මුදුන නයින්ගෙන් පිරුණු තැනක් යයි ප්‍රසිද්ධ වී ඇති බැවින් දර කපන්නෝ පවා එහි කිසිදාක නොගියහ.

ඈත දිගන්තයේ නිල් පැහැති රේඛාවක් මෙන් දෘශ්‍යමාන වන කඳු වැටිය දහවල් සහ සවස් කාලවලදී මගේ සිතේ සිහිනමය සිතිවිලි අවදි කරවයි. එය සුරංගනා ලොවක් යයි මට සිතෙයි. එහි සඳ එළිය, පාළු බව, නිහඬ ගුප්ත ස්වභාවය, සුන්දරත්වය, කුරුලු කූජන, වනමල් යන සියල්ලම මට නුහුරු ඒවා විය. ජීවිතයේ කවදාවත් නොලැබූ සැනසීමක්, සතුටක් මට එයින් ලැබේ. ඊටත් වඩා මහාලිඛාරූප පර්වත පෙළත් මෝහන පුරා රක්ෂිත වනයේ සීමා රේඛාවත් මගේ කුතුහලය අවුස්සයි. උදේ හවා එය කෙබඳු සුරංගනා ලෝකයක් මගේ මනසේ නිර්මාණය කරයිද?

දිනක් මම කඳු වැටිය නැගීම සඳහා පිටත්ව ගියෙමි. අශ්වයා පිටින් ගොස් එහි ඇති පර්වත පේළි දෙක අතරින් යන්නට සිතා ගතිමි. දෙපසින්ම දිස්වූ පර්වත සානු වනයෙන් වටවී තිබිණි. විවිධාකාර පදුරු මැදින් වැටුණු පටු මග විටින් විට උස් පහත් වෙමින් ඉදිරියට විහිදිණි. කුඩා දොළපාරවල් ගල් බොරළුවලින් ගහන මං ඔස්සේ ගලා බසිනු මට දැකගත හැකිවිය. කපුරු මල් පිපී තිබෙනු මට දකින්නට නොලැබුණේ සරත් කාලයේ ඒ වර්ගයේ මල් නොපිපෙන බැවිනි. එසේ වුවද වනයේ හැම අතම වූ සේපාලිකා ගස්වල දස දහස් ගණන් මල් පිපී තිබිණ. රුක් මුල්වලද, ගල් තලා මතද, දොළ පාර අයිනේද පොරි විසුරුවා දැමුවාක් මෙන් තිබුණේ සේපාලිකා මල්ය. එහි තවත් බොහෝ වන මල් පිපී තිබුණි. වර්ෂා කාලය අවසානය බැවින් සුපුෂ්පිත වූ රුක් අත්තන වනයක්ද, කුඹුක් සහ පියාල් ගස්ද විවිධාකාර තුරු ලතාද, ඕකිඩ් මල්ද මම දුටුවෙමි. සියලුම මල්වල සුවඳ එකට මුසුවී බමරුන් මෙන්ම මිනිසුන් ද මත් කරවීමට සමත් වී යැයි මට සිතිණි.

මෙපමණ කල් මා ඒ කඳු වැටිය පෙනෙන තෙක් මානයේ සිටියත් ඒ සෞන්දර්‍යමය භූමිය මට නුහුරු විය. මහාලිඛාරූප වනය සහ පර්වත ගැන මිනිසුන් මට අනතුරු අඟවා තිබිණ. එය කොටි වළසුන්ගෙන් හා සර්පයන්ගෙන් ගහණ වූ වනයක් බව මා අසා තිබුණත් ඒ ප්‍රකාශ අතිශයෝක්තියෙන් කී ඒවා බව මට වැටහී ගියේය.

ක්‍රමයෙන් පාර දෙපස සන කැලයෙන් වැසී ගොස් ඇති අයුරු මම දුටුවෙමි. විශාල ගස් කොළන් එකට එතී පාරට ඉහළින් වියනක් නිර්මාණය වී තිබිණ. ඝනව එකට වැඩුණු අඳුරු තුරු වදුළු පාමුල් මිවන පඳුරු ද අලුතෙන් හට ගන්නා පැළද විය. ඉදිරිපස බැලූ විට මාර්ගය උස් බිමකට විහිදී යන බව දුටුවෙමි. වනය තවත් අඳුරු

පැහැ වෙමින් පැවතිණ. පහළ සිට බලන විට ඉදිරියේ වූ උස් විවෘත පර්වත ශිඛරයන්ට මදක් පහළින් වූ මහගස්, ගැට නෙටුල් පඳුරු සේ කුඩාවට පෙනිණ. එතැන අපූරු ගැඹුරු සිරියාවක් විය. මම පර්වතය මතට නගින්නට අසු මෙහෙයුවෙමි. සෑහෙන දුරක් නැග්ග පසු පියාල් ගසක් යට අශ්වයා බැඳ ගල් තලාවක හිඳ ගතිමි. වෙහෙසට පත් වූ අශ්වයාට විවේකයක් දීම මගේ බලාපොරොත්තුව විය.

ඒ උස් වූ පර්වත මුදුන මෙවර වම් පසින් පෙනෙන්නට විය. පර්වතවලින් ගහණ වූ පළාත්වල සිදුවන මේ සිද්ධිය මා දැක තිබේ. ඉදිරියට යද්දී දෙපස සම්පූර්ණයෙන් වෙනස් දර්ශනයන් දෙකක් පෙනෙන්නට වෙයි. උතුරු පැත්තෙන් පෙනෙන්නාසේ පෙනෙන දර්ශනය මඳ දුරක් ඉදිරියට ගිය විට බටහිර පැත්තෙන්ද දිස්වේ.

මම බොහෝ වේලා නිහඬව හිඳගෙන සිටියෙමි. අසලින් ගලා බසින දොළ පාරක හඬින් වනයේ ගැඹුරු පාළු බව තවත් වර්ධනය කළේය. මා වටේම වූයේ උස් වූ ගිරි ශිඛරයන් ය. ඊට ඉහළින් වූයේ සරත් සමයේ නිල් ආකාශයයි. කෙතරම් කාලයක සිට මේ වනය මේ ලෙසම පවතින්නට ඇත්ද? ඈත අතීතයේ දිනක ආර්‍යයෝ කඳු මාවත් පසු කර පළමුවෙන්ම පංජාබයට ඇතුළු වනවිට ද මේ වනය මේ අයුරින්ම තිබෙන්නට ඇත. සිදුහත් කුමාරයා සිය දේවිය අතහැර අභිනිෂ්ක්‍රමණය කළ ඒ අතීත රාත්‍රියේ දී ද මේ ගිරි ශිඛර සඳ කිරණ වැදී අද මෙන්ම සිනාසෙන්නට ඇත. තමසා නදී තීරයේ පැල්පතක හිඳගෙන වාල්මීකි, රාමායනය ලියද්දී අවරට යන හිරුගේ ප්‍රතිබිම්බය තමසා නදියේ අඳුරු දිය කඳ තුළට වැදී දිලෙන සැටිද අසපුව ආශ්‍රිතව සිටි මුව රැළ පුරුදු තැනට ගමන් කරනු ද දැක ඇත. එදින ද බටහිර අහසේ හිරුගේ අවසන් රන්වන් ආලෝකයෙන් මහාලිඛාරූපයේ පර්වත ශිඛර අදත් මගේ දෑස් ඉදිරිපිට දිස්වන අන්දමට වර්ණවත් වන්නට ඇත. චන්ද්‍රගුප්ත රජු සිංහාසනාරූඨ වෙද්දී, ග්‍රීක රජකු වන හෙලිඕඩෝරස් ගරුඩ ද්වජ ස්ථම්භය නිර්මාණය කරද්දී, සංයුක්තා කුමරිය ස්වයංවර සභාවේදී පෘථිවිරාජට මල් මාලය දමද්දී, සාමගඩි යුද්ධයෙන් පැරදී ගිය අවාසනාවන්ත දාරා අග්‍රාවේ සිට දිල්ලියට පලා යද්දී, චෛතන්‍යවරු ශ්‍රීවාස්ගේ නිවසේ ස්තෝත්‍ර ගයද්දී, පලාශීවල යුද්ධය පවතිද්දී, මහාලිඛාරූපයේ පර්වත ශිඛරත් වනාන්තරයත් මෙලෙස ම පවතින්නට ඇත. ඒ කාලවලදී ද මේ සත වනයේ කිසිවකු වාසය නොකරන්ට ඇත.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

කැලය අසල වූ ගම්මානයක් මම දුටුවෙමි. එහි වූයේ පිදුරු සෙවිළි කළ නිවෙස් කීපයක් පමණි. ඒ ගමේ මිනිසුන් වී ඇට තලා ලී කැබළි දෙකක් භාවිතා කර තැනූ උපකරණයකින් තෙල් ලබා ගන්නා අයුරු මම දුටුවෙමි. එහි සිටි අවුරුදු අසූවක් අනූවක් පමණ වයසැති මහලු ස්ත්‍රියක් මට දකින්නට ලැබිණ. ඇගේ සිරුරේ නහර ඉලිප්පී තිබිණ. ඇය අව්වේ හිඳගෙන හිසේ උකුණන් ඉවත් කරමින් සිටියාය. ඇය දුටු මට හාරතචන්ද්‍රගේ මහලු වෙස්ගත් අන්නපූර්ණා සිහිවිය. මේ මහලු ස්ත්‍රිය මේ පළාතේ පවතින සංස්කෘතිය පිළිබිඹු කරන ප්‍රතිමූර්තියක් ලෙස ගතහැක. වනය ආශ්‍රිත ගම්වල අවුරුදු දහස් ගණනක් තිස්සේ මිනිස් වාසස්ථාන පැවතිණ. යේසුස් වහන්සේ කුරුසයට තබා ඇණ ගසද්දී ද අද මෙන්ම මොවුන් වී ඇට තලා මේ ලෙසම තෙල් ලබා ගන්නට ඇත. අවුරුදු දහස් ගණනක් තිස්සේ සන මිදුම පවතිද්දී බට තුවක්කු හා මැලියම් තැවරූ ලී භාවිතයෙන් කුරුල්ලන් දඩයම් කළ මිනිස්සු අදත් එයම කරති. අවට ලෝකය ගැන හෝ දෙවියන් ගැන හෝ සෙවීමට ඔවුන්ගේ උනන්දුවක් නැත. ඒ මැහැල්ල දවසින් දවස සිතන්නේ මොනවාදැයි දැන ගැනීමට මා තුළ දැඩි කුතුහලයක් ඇති විය. එය මට දැන ගතහැකි නම් මම මගේ වසරක වැටුප වුවද පරිත්‍යාග කිරීමට කැමැත්තෙමි.

හැම ජාතියකම මිනිසුන් තුළ ශිෂ්ටාචාරයේ බීජ තැන්පත් වී ඇත. කල් ගත වන විට ඔවුන් ශිෂ්ටාචාරයෙන් ඉදිරියට ගමන් කරන්නේ ඒ නිසාය. එසේ වුවත් සමහර ජාතීන් වසර දහස් ගණනක් ම එක තැන සිටින්නේ මන්ද? නොදියුණු තත්වයක සිටි ආර්‍යයෝ වසර පන්දාහක් පමණ කාලයක් තුළ දී වේදය, උපනිෂද්, භගවත් ගීතා වැනි ග්‍රන්ථ ද පුරාණ, කාව්‍ය ආදිය ද ලියූහ. ජ්‍යොතිර් විද්‍යාව, ජ්‍යාමිතිය, වෛද්‍ය විද්‍යාව ආදිය ගැන පොත් ලියූහ. දේශ දේශයන් ජය ගත්හ. සමහර අධිරාජ්‍ය බිඳ වැටෙන්නට ක්‍රියා කළහ. චීනස් ද බිලෝ ප්‍රතිමාව, පාර්ථේනන්, තාජ් මහල්, කොලෝන් හි කැතිඩ්‍රල් ආදී කලා කෘති නිර්මාණය කළහ. දර්බාරි කානඩා ආදී සංගීත රාග ද ෆිෆ්ත් සිම්ෆනි (Fifih symphony) ආදී සංගීත ඛණ්ඩ ද නිර්මාණය කළහ. අහස් යානය, නැව, දුම්රිය, ගුවන් විදුලිය, විදුලි බලය ආදී දේ සොයා ගත්හ. එසේ වුවද පැපුවා නිව්ගිනියාවේද ඕස්ට්‍රේලියාවේ ද ආදී වාසීන් සහ හාරතයේ මුණ්ඩා, කෝල, නාග, කුකී යනාදී නම්වලින් හැඳින්වෙන ගෝත්‍රිකයින් ද මේ වසර පන්දහස තිස්සේ සිටි තැන ම සිටින්නේ මන්ද?

අතීතයේ කිසියම් දවසක අප ජීවත් වන ගොඩබිම මහ මුහුදක්ව පැවතිණි. කැම්බියන් යුගයේදී ඒ මහ මුහුදේ රළ පෙළ ගැටුණු තැන අද විශාල පර්වතයක් තිබෙන්නට ඉඩ තිබේ. මම වන අරණ මැද තනිව හිඳගෙන අතීත යුගයේ තිබුණු නීල මහා සාගරයක් පිළිබඳව සිහින මවන්නට වීමි.

පුරා යත්‍ර ස්‍රෝතඃ පුලිනමධුනා තත්‍ර සරිතාම් (පෙර දිනයේ යම් තැනක දිය පහරක් වීද එතැන දැන් වැලිතලාවකි.) මේ පර්වත මුදුනේ ඒ අමතක ව ගිය මහා ජලාශයේ කැළඹී ගිය රැලි මාලාවේ සලකුණු ඉතිරි වී ඇති බවට සැකයක් නැත. භූ විද්‍යාඥයින්ගේ දෑසට එය හමුවනු ඇත. ඈත යුගයන්හි වාසය කළ, දැන් සිටින ජීවීන්ට වඩා වෙනස් වූ, ජීවීන්ගේ සලකුණු පොසිල ලෙසින් ගල් කැබලි මත සටහන් වී තිබෙනු කෞතුකාගාරවලට ගිය විට දැක ගන්නට ලැබේ.

සවස් කාලයේ හිරු රැස්, මහාලිඛාරූප කඳු වැටියට ඉහළින් දිස් විය. සේපාලිකා වනයේ සුවඳවත් වූ වාතය හේමන්ත කාලය සිහි කරවීය. තවත් එතැන රැඳී සිටීම සුදුසු නැතැයි මට සිතිණ. ඉදිරියේ ඇත්තේ අව පස එකොළොස්වක රාත්‍රියකි. වනය මැද නරි රංචුවක් කෑ ගසනු ඇසිණ. වළසකු හෝ ව්‍යාඝ්‍රයකු මා යන මග අවුරා සිටින්නට ඉඩ ඇත.

ආපසු එද්දී ගල් පොත්තක් මත සිටි මොනර ජෝඩුවක් දුටුවෙමි. මගේ අශ්වයා දැක බිය වූ මොනරා ඉගිළ ගියේය. සෙබඩ සෙලවුණේවත් නැත. මෙහි මොනරු සිටින බව මිනිසුන් කීවද මම විශ්වාස නොකෙළෙමි. මහාලිඛාරූපයේ ව්‍යාඝ්‍රයන් ඇතැයි කියන කතාවද මෙ ලෙසින්ම සත්‍ය විය හැකි බැවින් වැඩි වේලා රැඳී සිටීම නුවණට හුරු නැත.

07

ගම සිහි වී සිතට සාංකාවක් දැනීම එක්තරා චමත්කාරජනක අත්දැකීමකි. කිසිදාක තමාගේ ගම අතැර නොගොස් එකම තැනක වාසය කරන අය එහි ඇති අරුමය නොදනිති. ඈත පළාතකට ගොස් නෑදෑ හිත මිත්‍රාදීන්ගෙන් වෙන් වී දිගු කාලයක් සිටින විට බෙංගාලය ගැනත්, එහි වැසියන් ගැනත්, ගම ගැනත් ආදරණීය හිත මිත්‍රාදීන් ගැනත්, හදවත හඬා වැටෙන ආකාරය ගැන ඔවුහු නොදනිති. ගමින්

ඈත සිටිද්දී අතීතයේ සිදු වූ ඉතා කුඩා නොවැදගත් සිදුවීම් පවා අපූරු සිද්ධි ලෙස හැඟේ. එවැනි දේ නැවත කිසිදාක සිදු නොවේ යයි සිතේ. මහ පොළොව පාළු වී අතැයි හැඟේ. බෙංගාලයේ හැම වස්තුවක්ම අතිශයින්ම ප්‍රිය වේ.

එවැනි දේ නැවත කිසිදාක සිදු නොවේ යයි සිතේ. මහ පොළොව පාළු වී ඇතැයි හැඟේ. බෙංගාලයේ හැම වස්තුවක්ම අතිශයින්ම ප්‍රිය වේ.

වසර ගණනක් වන ගත පෙදෙසක සිටීමෙන් මම එවැනි තත්වයකට පත් වූයෙමි. නිවාඩු ඉල්ලා ප්‍රධාන කාර්යාලයට ලියන්නට කීප වරක්ම සිතුවත් වැඩ හැම විටම ගොඩ ගැසී තිබුණ නිසා එසේ කිරීමට සිතේ පැකිළීමක් ඇති විය. එසේ වුවද ඒ කොටි වළසුන් හා ගෝනුන් ජීවත්වන ජනශූන්‍ය පළාතේ, වසරින් වසර තනි වී සිටීම කෙතරම් ලොකු හිරිහැරයක්ද? විටෙක මගේ සිත වෙහෙසට පත් වේ. මට බෙංගාලය අමතක වී ගොස් ඇත. බොහෝ කාලයක් දුර්ගා දේවතාවිය වෙනුවෙන් පවත්වන උත්සව දකින්නට ලැබුණේ නැත. වරක උත්සවයේ බෙර හඬ මට කොපමණ කාලයකින් අසන්නට ලැබුණේ නැද්ද? දේවාලවල හජන් ගී හඬ අසන්නට මට බොහෝ කාලයකින් අවස්ථාවක් නොලැබිණ. වෙයක් මස උදැසන කුරුලු කූජන නැසී කෙතරම් කාලයක් ගත වී ඇත්ද? සන්සුන් බෙංගාලි ගෘහ ජීවිතය මට සිහි වේ. නිවෙස්වල මිටි බංකුවල පෙළට තැබූ පිත්තල භාජන, පාට කළ පිටියෙන් කරන සැරසිලි, සිරිකතගේ පිළිරුව ඉදිරියේ වූ කවඩි බෙල්ලන් සහිත වට්ටිය යනාදිය අමතකව ගිය අතීත සිහිනයක් වැනිය.

සීත කාලය අවසන් වී වසන්තය පැමිණි විට මගේ සිතට වැඩි සාංකාවක් දැනෙන්නට විය. මම එවැනි අවස්ථාවක අශ්වයා පිට නැගි සරස්වති වැව පිහිටි ප්‍රදේශයට ගියෙමි. එහි වූ මිටියාවත අසල දී අශ්වයා පිටින් බැස ඉදිරිපස දෙස බලා සිටියෙමි. ඉදිරියේ පෙනෙන්නට වූ පස් ගොඩලි මත ඉඳුක් හා මානා පඳුරු වැවී තිබුණි. ඉහළින් වූයේ සන නීල ආකාශයයි. එක්තරා කටු සහිත ගස් විශේෂයක දම්පාට මල් රැසක් පිපී තිබුණි. මලේ විශේෂ සුන්දරත්වයක් නොතිබුණත් දස දහස් ගණන් මල් එකට පිපී ඇති විට දම් පැහැති සාරි අතුරා ඇත්තාක් සේ දිස් වෙයි. වර්ණයෙන් හෝ විසිතුරු බවින් තොර මානා පඳුරුවලට ඉහළින් ඒ මල් ගස්, වසන්ත උත්සවයක් පවත්වන්නාසේ ය. ඊට ඉහළින් වූ පැරණි විශාල වෘක්ෂයක් මොවුන්ගේ බොළඳකම

ගැන අවඥාවෙන් හා උපේක්ෂාවෙන් වෙන දිසාවක් දෙස බලා සිටින්නා සේය. ඒ දම් පැහැති වන මල්, ළඟ එන වසන්තය ගැන මගේ කනට කොදුරා කීය. දොඩම්, පින්න, අඹ, මට හුරුපුරුදු කෑල ආදී ගස් මෙන් නොව නාම ග්‍රෝත්‍ර හීන, රුවෙන් අඩු, කටු ගසක මල් මට වසන්තය ගැන සිහිපත් කරවීය. වසන්තයේදී උයනක් පාසා, වනයක් පාසා පිපෙන මල් රාශියේ පළමු උදාහරණය වූයේ ඒ මල් වර්ගයයි. මම බොහෝ වේලා එතැන රැඳී සිටියෙමි. බෙංගාලයේ හැදුණු වැඩුණු මට වනාන්තරයේ කටු ගස් සියොළඟ මලින් සරසාගෙන වසන්තය ගැන කිම තුපුරුදු අත්දැකීමක් විය. එය කෙතරම් සිත් ගන්නාසුළුද? නිම්නයට ඉහළින් පිහිටි තවමත් මල් පිපී නැති ආරණ්‍ය භූමිය ධ්‍යානයට සමවැදුණු, උදාසීන සන්‍යාසියකු මෙන් සිටියදී නිම්නයේ වූ කටු ගස පැවැත් වූ වසන්ත උත්සවය සමඟ මගේ හදවත බැඳී ගියේය.

එය මගේ ජීවිතයේ විචිත්‍ර වූ මොහොතකි. මම බොහෝ වේලා එතැන සිටියෙමි. මගේ හිසට ඉහළින් වූ නිල් අහසේ තාරකා එකින් එක මතු වන්නට විය. ඒ වේලාවේ අශ්වයකුගේ කුර ගැටෙන හඬින් තිගැස්සී බැලූ විට පූර්ණ චන්ද්‍ර නම් මිනින්දෝරුවා නායා බයිහාරයේ බටහිර මායිම මනින්නට ගොස් වැඩ හමාර කර කාර්‍යාලයට පෙරලා පැමිණෙන බව දුටුවෙමි. ඔහු මා දැක අශ්වයා පිටින් බැස්සේ ය.

"සර් මෙතැන?"

"මං ඇවිදින්න ආවා."

"රෑ බෝ වෙන වෙලාවෙ මෙතැන තනියම ඉන්න එක හොඳ නෑ. අපි යමු ඔපිස් එකට. මේක එච්චර හොඳ තැනක් නොවෙයි. මගේ හවුල්කාරයා දැකලා තියෙනවා ලොකු කොටියෙක් පදුරු අස්සේ ඉන්නවා. යමු සර්."

බොහෝ ඇත පූර්ණ චන්ද්‍රගේ හවුල් කාරයා ගීයක් ගයනු ඇසිණ.

"දයා හොයි ජී....."

එදා සිට ඒ කටු සහිත ගස්වල මල් දකිද්දී මගේ සිතේ ගම රට ගැන ඇති සාංකාව ඉස්මතු වේ. පූර්ණ චන්ද්‍රගේ අත් උදව්කාර ජටුලාල් සෑම සවසකම තමාගේ කුටියේ හිඳ රොටී පුච්චමින් ඒ ගීතයම කියන්නට විය.

"දයා හොයි ජී....."

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මැදින් මස ළඟා වෙද්දී ගමේ දී මෙන් හිමිදිරියේ අඹමල් කැකුළුවල සුවඳ රැඳුණු සෙවණක සිට කෝකිල කූජන ඇසීමේ වාසනාව නැවත කිසි දිනක නොලැබේ යයි මට සිතිණ. මේ වනයේ ව්‍යාඝ්‍රයකු හෝ කුළු මීමකු අතින් කවදා හෝ මට මිය යන්නට සිදු වේ යැයි ද මට සිතිණ.

එවැනි දෙයක් සිදු වුවද ඈත වනාන්තරය ඒ අයුරින්ම නොසෙල්වී පවතිනු ඇත. ඈත ක්ෂිතිජය එවැනි ම අපැහැදිලි උදාසීන බවකින් යුතුව බලා සිටිනු ඇත.

මේ අතර රාස බිහාරී සිංගේ නිවසින් හෝලි උත්සවයට සහභාගි වන්නැයි මට ආරාධනයක් ලැබිණ. රාස බිහාරී ඒ පළාතේ දාමරිකයකු ලෙස ප්‍රසිද්ධ වූ කෙනෙකි. ජාතියෙන් රාජපුත්වරයකු වූ ඔහු කාරෝ නදිය අසබඩ වූ රජයට අයත් ඉඩම් අත්පත් කරගෙන සිටින කෙනෙකි. ඔහු වෙසෙන තැන කාර්‍යාලයේ සිට සැතැපුම් දොළහක් පමණ ඈතින් ඊශාන පැත්තේ මෝහනපුරා රක්ෂිත වනය අසල පිහිටියේය.

ආරාධනය නොපිළිගෙන සිටීම යහපත් දෙයක් නොවූවද රාස බිහාරී සිංගේ නිවසට යාමට බලවත් අකමැත්තක් ද මගේ සිතේ තිබුණි. ඔහු ඒ පළාතේ ගංගෝතා කුලයේ දිළින්දන්ගේ ප්‍රභුවරයකු විය. ඔහු දිළින්දන් තළා පෙලා ඔවුන්ගේ රුධිරය උරා බී පොහොසත් වූ අයෙකි. ඔහුගේ දැඩි පාලනයට හා අඩන්තේට්ටම් වලට ඇති බිය නිසා කිසිවකු ඔහුට විරුද්ධව කට හෙල්ලුවේවත් නැත. ඔහුගෙන් වැටුප් ලබන ඉඩකඩම් හුක්ති විඳින සටන්කරුවෝ පොලු අතින් ගෙන නිතර සැරිසරති. කිසිවකු අල්ලාගෙන එන්නට යයි ස්වාමියා අණ දුන් විට ඔවුහු ඒ තැනැත්තා කුදළාගෙන අවුත් ඔහුට හාරදෙති. යම් විටක අසවලා මට හරිහැටි ගරුසරු දැක්වුයේ නැතැයි රාසබිහාරිට සිතුණොත් ඉන්පසු ඒ අසරණයාට ගැලවිල්ලක් නැත. කපටි කමින්, බලපුළුවන්කාරකමින්, හා උපායෙන් රාසබිහාරී ඔහුට පාඩමක් උගන්වා මිස අත හරින්නේ නැත.

රාසබිහාරී ඒ පළාතේ රජ කරගෙන සිටින බව එහි ගිය අවස්ථාවේ මට පෙනී ගියේය. ඔහුගේ වචනයට අසරණ දිළිඳු මිනිස්සු වෙව්ලා සිටිති. තරමක පොහොසත් අය පවා ඔහුට විරුද්ධව කිසිවක් කීමට ධෛර්‍යවත් නොවෙති. රාසබිහාරීගේ පොලු හරඹ කරුවෝ දාමරිකයින් ලෙස ඒ පළාතේ ප්‍රසිද්ධය. පොලිසියද රාසබිහාරිට අවනතය. ලොකු ලොකු නිලධාරීහු රාසබිහාරිගේ ආරාධනය

පිළිගෙන ඔහුගේ නිවසට පැමිණ ආගන්තුක සත්කාර භුක්ති විඳිති. අපේ වතුයායේ සිටින්නන් කෙරෙහි ද සිය අණසක පැතිරවීමට රාසබිහාරි සිං උත්සාහ කළේ ය. මම එය වැලැක් වූයෙමි. තමාගේ ප්‍රදේශයේ ඕනෑ අන්දමකට ක්‍රියා කළත් අපේ වතුයායේ කෙනෙකුගේ කෙස් ගහකටවත් අත තැබීම මා ඉවසන්නේ නැති බව මම ඔහුට පැහැදිළිව ම දැන් වූයෙමි. පසුගිය වසරේ කිසියම් කරුණකට මගේ කායාලයේ මුකුන්දි නම් නිලධාරියාද ගණපත් නම් බදු එකතු කරන්නාද රාසබිහාරිගේ පොලු සටන් කරුවන් සමග ගැටුමක් ඇතිකර ගත්තේය. පසුගිය ජූලි මාසයේද සුළු ගැටුමක් ඇති විය. එයට පොලිසියද මැදිහත් විය. පොලිසියේ ලොකු නිලධාරියකු පැමිණ එය සමථයකට පත් කිරීමෙන් පසු ගත වූ මාස කීපය ඇතුළත රාසබිහාරි සිං අපේ වතුයායේ කිසිම දෙයකට මැදිහත් වූයේ නැත.

ඒ රාසබිහාරිගෙන් හෝලි උත්සව දිනයේ තමාගේ නිවසට පැමිණෙන්නැයි ආරාධනයක් ලැබීම ගැන මම පුදුමයට පත් වූයෙමි. මම ගණපත් නම් බදු එකතු කරන්නා කැඳවා ඔහුගේ අදහස විමසුවෙමි.

"කවුද දන්නේ සර් ඔය මිනිහගේ යටි අදහස මොකද්ද කියලා? මිනිහට මොනවද කරන්න බැරි? සර්ව එහාට කැඳවන්නේ මොකට ද කියලා කවුද දන්නේ? මං නම් කියන්නේ නොගිහින් ඉන්න එක හොඳයි කියලා."

ඔහු මෙසේ කියූ නමුත් ආරාධනය නොපිළිගෙන සිටීම ද කළ නොහැකි දෙයක් විය. එය තමාට කළ අවමානයක් ලෙස රාසබිහාරි සලකනු ඇත. හෝලි උත්සවය රාජපුත්වරුන්ගේ ප්‍රධානතම උත්සවයක් ලෙස සැලකේ. මා නොගියොත් එසේ කරන්නේ ඔහුට ඇති බිය නිසා යයි සිතන්නටද ඉඩ තිබේ. එසේ සිතීම මට මහත් මදි කමකි. සිදුවන ඕනෑ ම දෙයකට මුහුණ දීමට සිතාගෙන එහි යා යුතු යයි මම තීරණය කළෙමි.

කායාලයේ සේවකයෝ මට නොයෙක් අයුරින් කරුණු පැහැදිළි කිරීමට උත්සාහ කළහ. මහලු මුනේශ්වර් සිං මෙසේ කීවේය.

"සර් ගියාට කමක් නෑ. ඒ වුනාට සර් මේ පැත්තේ මිනිසුන්ගේ හැටි දන්නේ නෑ. අපි හැරෙන්න ඉස්සරවෙලා උන් මිනී මරලත් ඉවරයි. මේකෙ ඉන්නේ නැහැදිච්ච එවුන්. ඉගෙන ගත්ත අය මෙහෙ නෑ. රාසබිහාරි කියන්නේ භයානක මිනිහෙක්. ඔය මිනිහා මේ

වෙනකොට කී දෙනෙක් මරලා තියෙනවද? ඔය මිනිහට කරන්න බැරි දෙයක් නෑ. මිනී මරන්න, ගෙවල් ගිනි තියන්න, බොරු නඩුවලට පටලවන්න, ඔය වගේ මිනිහෙක් තවත් නෑ."

මම ඒ කථා කිසිවක් ගණන් නොගෙන රාසබිහාරිගේ නිවසට ගියෙමි. ඒ පළාතේ පොහොසතුන්ට පමණක් ඇති ආකාරයේ ගඩොළින් තැනූ බිත්ති සහිත නිවසක් ඔහු සතු විය. නිවස ඉදිරිපිට වූ පෝටිකෝවේ කනුවල තාර ගා තිබිණ. ඒ අසල ලනු ඇඳක් දෙකක් විය. මිනිස්සු දෙදෙනෙක් එහි හිඳගෙන අමුත්තන්ට දුම් ඉරීම සඳහා වෙන් කර තිබූ ගඩුගුඩාවකින් දුම් උරමින් සිටියහ.

මගේ අශ්වයා මිදුලට ළඟා වූ විට කොහේදෝ සිට 'ඩුම්' 'ඩුම්'හඬින් වෙඩි දෙකක් පත්තු විය. රාසබිහාරි සිංගේ මිනිස්සු මා හඳුනාගෙන, පිළිගැනීමේ සිරිතක් ලෙස ඒ වෙඩි පත්තු කළ බව මම තේරුම් ගතිමි. එසේ වුවත් ගෙහිමියා පෙනෙන්නට සිටියේ නැත. ගෙහිමියා එනතුරු අශ්වයා පිටින් බැසීම සිරිත නොවේ.

ටික වේලාවකට පසු රාසබිහාරි සිංගේ සොහොයුරා වන රාසඋල්ලාස සිං පැමිණ විනීත ලෙස දෑත් දිගු කොට මා පිළිගත්තේය.

"එන්න. එන්න. සර්. තමුන්නාන්සේ අපේ දුප්පත් පැලට ආපු එක අපට ලොකු ගෞරවයක්."

ඔහු එසේ කී විට මගේ සිතේ වූ නොයන්සුන්කම පහව් ගියේය. රාජපුත් ජනයා ආගන්තුකයින් වශයෙන් පිළිගන්නා අයට අනතුරක් නොකරති. කිසිවකු මා පිළිගැනීමට නොපැමිණිය හොත් අශ්වයා හරවාගෙන ආපසු යන්නට මම සිතාගෙන සිටියෙමි.

මිදුලේ බොහෝ දෙනා සිටියහ. එයින් වැඩි දෙනෙක් ගංගෝතා ජනයා වූහ. ඔවුන් ඇඳ සිටි ඇඳුම් ඉරී ගිය කිළිටි ඒවා වුවත් හෝලි උත්සවයේ දී ඉස ගන්නා පාට වතුරෙන් ඒවා වර්ණවත් වී තිබිණ. ඔවුහු ආරාධනා ලැබ හෝ නොලැබ ධනවතාගේ නිවසේ පැවැත්වෙන හෝලි උත්සවයට සහභාගි වීමට පැමිණි අය වූහ.

පැය බාගයකට පමණ පසුව රාසබිහාරි සිං පැමිණියේය. ඔහු මා දැක පුදුමයට පත් වූ බවක් පෙනිණි. මා ආරාධනය පිළිගෙන ඔහුගේ නිවසට පැමිණේ යැයි ඔහු සිහිනෙන්වත් බලාපොරොත්තු නොවූයේ ය. කෙසේ වෙතත් රාසබිහාරි උනන්දුවෙන් යුතුව මා පිළිගත්තේය.

ඔහු ඒ අසල වූ කාමරයකට මා කැඳවාගෙන ගියේය. ගමේ වඩුවන් විසින් රළු අන්දමින් සාදන ලද ඇඳි පුටු දෙක තුනක් ද බංකුවක් ද එහි විය. බිත්තියේ රාක්කයක සඳුන් හා සින්දූර් කල්ක ගැල් වූ ගණදෙවි රූපයක් විය.

ටික වේලාවකට පසු ළමයෙක් ලොකු බන්දේසියක් රැගෙන මා ඉදිරියට ආවේය. හෝලි උත්සවයේ දී ඉස ගන්නා ජලයට මුසු කරන පාට කුඩුද, මල් ටිකක්ද, මුදල්ද, එනසාල්, සූකිරි ආදියද, මල් මාලයක්ද එහි විය. රාසබිහාරි සිංහ පැමිණ මගේ නළලේ පාට කුඩු ටිකක් තැවරුවේය. මම ද ඔහු අනුගමනය කර එහි වූ මල් මාලය අතට ගතිමි. ඊළඟට කළ යුත්තේ කුමක්දැයි නොදත් මා බන්දේසිය දෙස බලා සිටින විට රාසබිහාරි කථා කළේය.

"මේක තමුන්නාන්සේට තෑග්ගක්. ගන්න."

මම සාක්කුවෙන් තව කාසි කීපයක් ගෙන බන්දේසියේ තිබුණු මුදල්වලට එකතු කළෙමි.

"මේවායින් මිනිසුන්ට රස කැවිලි අරන් දෙන්න,"

ඉන්පසු රාසබිහාරි තමාගේ ඵේශ්වර්‍යයන් පෙන්වා දීමට මා කැඳවාගෙන ගියේය. ඔහුගේ ගව ගාලේ ඵළදෙන්නු හැටක් පමණ සිටියහ. ඉස්තාලයේ අශ්වයෝ හත් අට දෙනෙක් වූහ. එයින් දෙදෙනෙකුට අපූරුවට නටන්නට හැකි යැයි දැනගන්නට ලැබිණ. වෙනත් වේලාවක ඒ නැටුම් මට පෙන්වන බව ඔහු කීය. ඇතෙකු මිල දී ගන්නට ද ඔහු අදහස් කරයි. ඇතෙකුගේ හිමි කරුවකු නොවන තැනැත්තෙකු වැදගතකු යයි ඒ පළාතේ අය පිළිගන්නේ නැත. තිරිඟු අස්වැන්න ටොන් ගණනින් ඔහුට ලැබේ. අසූවක් පමණ දෙනා දිනකට ඔහුගේ නිවසින් කෑම ගනිති. උදෑසන ස්නානය කිරීමෙන් පසු ඔහු සූකිරි සෑහෙන ප්‍රමාණයක් අනුභව කොට කිරි බෝතල් එක හමාරක් පමණ බොයි. කඩපොලින් ගන්නා සූකිරි ඔහු පාවිච්චි නොකරයි. ඔහු කන්නේ විශේෂ සූකිරි වර්ගයකි. ඒ අන්දමින් සූකිරි කෑම ධනවතුන්ගේ සිරිතකි.

ඉන්පසු රාසබිහාරි මා වෙනත් කාමරයකට කැඳවාගෙන ගියේය. ඒ කාමරයේ වහලේ ඉරිඟු කරල් දහස් ගණනක් එල්ලා තිබිණ. ඒවා ඊළඟ වසරේ පැළ කිරීමට වෙන් කළ ඒවා විය. කිරි බෝතල් සිය ගණනක් එක්වර උණු කිරීම සඳහා පිළියෙළ කළ ලෝහ භාජනයක් ඔහු මට පෙන්වීය. ඔහුගේ පවුලේ අයගේ පරිභෝජනය සඳහා දිනකට කිරි විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ. කඩු, පොරෝ,

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

පොලු, හෙල්ල. පලිහ, ආදී ආයුධ සහිත ගබඩාවක් ලෙස භාවිත කළ කුඩා කාමරයක් ඔහු මට පෙන්වීය.

රාසබිහාරිට පුත්තු හය දෙනෙක් වූහ. වැඩිමහලු පුත්‍රයාගේ වයස අවුරුදු තිහක් පමණ විය. වැඩිමහල් පුතුන් හතර දෙනා පියා මෙන්ම උස් සිරුරු ඇත්තෝ වූහ. ඔවුහු රැවුළු වවා සිටියහ. ආයුධ ගබඩාව සහ රාසබිහාරිගේ පුතුන් දැක මට සිතුණේ කුසගින්නේ පසුවන දිළිඳු ගංගෝතා ජනයා මොවුන්ට බියෙන් හැකිළී සිටීම ගැන පුදුම වීමට කාරණයක් නැති බවය.

රාසබිහාරි මාන්නක්කාර මිනිසෙකි. ඔහු ආශ්‍රය කරන අය නිරන්තරයෙන් පරිස්සම් විය යුතුය. ගංගෝතා මිනිස්සු සිය ස්වාමියාට කළයුතු ගරු සත්කාර පිළිබඳව දැඩි අවධානයකින් පසුවිය.

රාසබිහාරිගේ පවුලට ඇති පමණ කිරිද, ඉරිඟුද, තිරිඟුද, සූකිරිද ලැබෙන අතර එපමණට ගරු සැලකිලි ද ලැබේ. එසේ ම එහි නිතර පොලු හරඹ ද දක්නට ලැබේ. ඔහු කෙතරම් ධනය රැස් කර ගෙන සිටියත් පලක් නැතැයි මට සිතිණ. දැකුම්කලු පින්තූරයකින්වත් ඔහුගේ නිවස සරසා නැත. හොඳ පොතක් පතක් අහලකවත් නැත. කව්විවි, පුටු ආදිය කෙසේ වෙතත් හොඳ කොට්ට මෙට්ට සහිත ඇඳක් වත් එහි නැත. බිත්තිවල හුනු පැල්ලම්ය. හැම තැනම බුලත් කහටය. ගෙයි පිටුපස කානුවේ කුනු පිරී ඇත. ඔහුගේ දරුවෝ අකුරු ඉගෙන ගත්තේ නැත. ඔවුන් ඇඳ පැළඳ සිටි ඇඳුම් හා පාවහන් අපිරිසිදුය. පසුගිය වසරේ මාසයක් ඇතුළත ඔහුගේ දරුවන් තුන් හතර දෙනෙක් වසූරිය වැළඳී මිය ගොස්ය. අසරණ ගංගෝතා ජනයාට ඔහුගේ ලොකුකම් පෙන්වා ගෙන සිටීමේ ඇති ඵලය කුමක්ද?

භෝජන සංග්‍රහය සඳහා පිළියෙළ කර තිබූ කෑම බීම ප්‍රමාණය දැක මම පුදුමයට පත් වූයෙමි. මෙතරම් කෑම වර්ග රාශියක් කෙනෙකුට කෑ හැකි ද? අලි කන් මෙන් වූ පූරිද, නානා විධ ව්‍යංජන වර්ගද, මුදවාපු කිරි අග්ගලා, වට්ටි, යනාදිය ඇතුළත් කෑමවලින්, වේල් හතරකට පමණ සෑහෙන ප්‍රමාණයක් මට බෙදා තිබිණ.

කෑම ගෙන අවසන් වී පිටතට පැමිණි විට සවස් වී තිබිණ. ගංගෝතා මිනිස්සු මිදුලේ හිඳගෙන බදින ලද වීන තණහාල්, මී කිරි සමඟ සතුටින් අනුභව කරමින් සිටියහ. පාට ජලයෙන් ඇඳුම් වර්ණවත් වූ අතර ඔවුන්ගේ මුහුණුවල සිනා රැඳී තිබිණ. රාස බිහාරිගේ සොහොයුරා ගංගෝතා මිනිසුන්ට කෑම බීම දීම ගැන බලමින්

ඇවිද්දේය. භෝජන සංග්‍රහය සඳහා ඔවුන්ට ලැබී තිබුණේ සාමාන්‍ය දෙයක් වුද එය භුක්ති විඳිද්දී ඔවුන්ගේ සතුටේ අඩුවක් නොවීය.

බොහෝ දිනකට පසු ළමා නැටුම් ශිල්පී ධාතුරියාගේ නැටුම් බැලීමට මට එහිදි අවස්ථාව ලැබිණ. ධාතුරියා පෙර වතාවේ දුටුවාට වඩා මඳක් වැඩී සිටියේය. ඔහුගේ නැටුම් ද පෙරට වඩා හොඳය. හෝලි උත්සවයේදී නැටුම් දැක්වීමට ඔහුව ගෙන්වා තිබිණ.

මම ඔහුව ළඟට කැඳවුයෙමි.

"මාව අඳුනන්න පුළුවන්ද ධාතුරියා?"

ධාතුරියා මට සිනාසී ආචාර කළේය.

"එහෙමයි සර්. තමුන්නාන්සේ වත්තේ මැනේජර් මහත්තයා නේද? සැප සනීප කොහොමද සර්?"

ඔහුගේ මුහුණේ මිහිරි සිනාවක් විය. ළමයා දෙස බැලූ විට ඔහු ගැන දයාවක්, අනුකම්පාවක් ඇති වේ. තමාගේ යයි කිවහැකි කාත් කවුරුවත් නැති ඔහුට නැටුම් ගැයුම් දැක්වීමෙන් තමාගේ ජීවිකාව තනිව ගෙන යාම සිදු වී ඇත. ඔහුට සිය හැකියාවන් පෙන්වීමට සිදු වී ඇත්තේ රාසබිහාරි වැනි ධනයෙන් උදම් වූ කමකට නැති මිනිසුන් ඉදිරිපිටය.

"මෙහෙ රෑ මැද වෙනකල් නැටුම් පෙන්නන්න වෙනවා. නේද? කීයක් ලැබෙනවද ධාතුරියාට?"

"ඇනා හතරක් හම්බ වෙනවා. බඩ පුරා කන්නත් ලැබෙනවනේ."

"මොනවද කන්න දෙන්නේ?"

"මුදවාපු කිරි එහෙම හම්බ වෙනවා. අග්ගලත් දෙයි. ගිය අවුරුද්දෙත් දුන්නානේ."

ලැබෙන්නට යන කෑම බීම ගැන ධාතුරියා සතුටට පත් වී සිටියේය.

"හැම තැනම මය ගානමද හම්බ වෙන්නේ?"

"නෑ සර්. රාසබිහාරි සිං කියන්නේ පෝසත් කෙනෙක්නේ. ඇනා හතරක් දීල කන්නත් දෙනවා. ගංගෝතා ගෙදරක නැටුමකට ඇනා දෙකයි දෙන්නේ. කන්න දෙන්නේ නෑ. ඒ වුනාට ඉරිහු සේරු බාගයක් දෙනවා."

"ඉතින් ජීවත් වෙන්න තරම් ආදායම් ලැබෙනවද?"

"දැන් නැටුම් නටලා වැඩක් නෑ මහත්තයා. ඉස්සර තමයි නැටුම් නටන අයට හොඳ. දැන් මිනිසුන්ට කරදරයි: කවුද නැටුම් බලන්නේ? නටන්න නොලැබෙන කොට මං කුඹුරුවල වැඩ කරනවා.

ගිය අවුරුද්දේ තිරිහු කපන්න ගියා. මොනවා කරන්නද සර් ජීවත් වෙන්නත් එපායැ? මං මෙච්චර අමාරුවෙන් ගයාවට ගිහින් කැරකෙන නැටුම් ඉගෙන ගත්තා. ඒක බලන්න කෙනෙක් නෑ. ඒ නැටුම්වලට අනිත් ඒවට වැඩි මුදලක් අය කරනවා."

නැටුම් දැක්වීමට අපේ කායශාලයට එන්නැයි මම ධාතුරියාට ආරාධනා කළෙමි. ධාතුරියා කලා කරුවෙකි. කලා කරුවෙකු සතු නිදහස් ස්වභාවය ඔහු තුළ විය.

සඳ පායා ආ විට රාසබිහාරි සිංගෙන් සමුගෙන අශ්වයා පිට නැගී ඔහුගේ මිදුල පසු කරත්ම මට ගරු කිරීමක් වශයෙන් වෙඩි දෙකක් පත්තු විය.

නිදහස් තණ බිම මැදින් වැටී තිබුණ වැලි සහිත මාර්ගයට සඳ එළිය වැටී දිලිසුණේය. දුර ඈත කුරුල්ලෙකු නද දෙන හඬ මගේ සවනට වැටුණේ විශාල ජනශූන්‍ය තණ බිමේ අතර මං වූ අසරණ මගියෙකුගේ වැළපුමක් සේය.

පිටුපසින් කවුරුන්දෝ මා අමතන හඬක් මට ඇසිණ.

"මැනේජර් මහත්තයා."

"ආපසු හැරී බැලූ විට ධාතුරියා අශ්වයා පසුපස දුවගෙන එනු දුටුවෙමි. මම අශ්වයා නැවැත්වූයෙමි.

"ඇයි ධාතුරියා?"

ධාතුරියා හති දමමින් සිටියේය. ටික වේලාවකට පසු ඔහු ගොත ගසමින් ලැජ්ජාවෙන් යුතුව කථා කළේය.

"සර්ගෙන් අහන්න දෙයක් තියෙනවා."

"මොකද්ද කියන්නකෝ" මම ඔහුව උනන්දු කරවීමි.

"සර් ගම් පළාතේ යනකොට මාව කල්කටාවට එක්ක යන්න පුළුවන්ද?"

"එහේ යන්නේ මොකටද?"

"මං කවදාවත් කල්කටාවට ගිහින් නෑ. එහේ නැටුම්වලට හොඳ නැනක් තියෙනවා කියලා මං අහලා තියනවා. මං හොඳ නැටුමක් ඉගෙන ගත්තට මෙහේ බලන්න කවුරුවත් නැති එක ගැන මට දුකයි. නැටුවේ නැතිනම් කැරකෙන නැටුම අමතක වෙලත් යයි. මං කොච්චර අමාරුවෙන්ද ඒක ඉගෙන ගත්තේ. මං ඒක ඉගෙන ගත්න වෙච්ච මහන්සිය ගැන කියන්නද සර්?"

ඒ වනවිට මම ගම පසුකර පැමිණ සිටියෙමි. ඉදිරියේ වූ නැතිතලාවට සඳරැස් වැටී බැබළුණේය. රාසබිහාරිට හොරෙන් මා

හමුවීමට ධාතුරියාට අවශ්‍ය වන්නට ඇත. මම ධාතුරියාගේ කථාව අසන්නට සිතාගෙන මලින් බරවූ කපු පුළුන් ගසක් යට වූ ගල් පොත්තක් මත හිඳ ගතිමි.

"එහෙනම් කියන්නකෝ ධාතුරියාගේ විස්තරේ."

"මිනිස්සු කිව්වා ගයා දිස්ත්‍රික්කයේ හිටල්දාස් කියලා නැටුමට දක්ෂ කෙනෙක් ඉන්නවා කියලා. එයා කැරකෙන නැටුමට ප්‍රසිද්ධ කෙනෙක්ලු. මං ඒ නැටුම කොහොම හරි ඉගෙන ගන්නවා කියලා හිතා ගත්තා. ගයාවට ගිහින් ගම්න් ගමට ඇවිද ඇවිද මං හිටල්දාස්ව හෙව්වා. කවුරුවත් එහෙම කෙනෙක් ගැන දැනගෙන හිටියේ නෑ. අන්තිමේදී මං එඬේර කුලයේ අයගේ හරක් ගාලක නවාතැන් ගත්තා. එදා රෑ මිනිස්සු වගයක් ඒ නැටුම ගැන කතාවෙනවා මට ඇහුණා. එදා සීතල දවසක්. මං පිදුරු ටිකක් බිම අතුරලා ගාලේ අයිනක හාන්සි වෙලා හිටියේ. ඒ කතාව ඇහුන විතරයි මං නැගිටලා ඒ මිනිස්සු ළඟට ගිහින් ඉඳ ගත්තා. මට ඒ වෙලාවේ ඇති වෙව්ව සන්තෝසේ කියලා නිම කරන්න බෑ සර්. මට දැනුණේ රටක් රාජ්‍ය ජයක් ලැබුණා වගෙයි. ඒ ගොල්ලෝ නම් හිටල්දාස් ගැන දැනගෙන හිටියා. එතැන ඉඳලා හැතැප්ම තිස් ගාණක් එහා තීන්ටාංගා කියලා ගමක හිටල්දාස් ගුරුතුමා ඉන්නවා කියලා ඒ ගොල්ලන්ගෙන් දැන ගන්නට ලැබුණා."

ඒ ළාබාල කලාකරුවා තුළ ඇති උනන්දුව මට ඉතා ප්‍රිය උපදවන කරුණක් විය.

"ඉතින් ඊට පස්සේ?"

"මං පයින්ම එහේ ගියා. හිටල්දාස් කියන ගුරුතුමා හම්බ වුණා. සුදු පාට රැවුල දිගට වවල තිබුණු වයසක ගුරුතුමා මා දැකලා ඇහුවා මොනවද ඕනෑ කියලා. මං කිව්වා මං කැරකෙන නැටුම් ඉගෙන ගන්නයි ආවෙ කියලා. ගුරුතුමා පුදුම වෙලා බලා හිටියා. දැන් කාලේ කොල්ලෝ ඒ නැටුමට කැමති වෙනවද? ඒක මිනිසුන්ට අමතක වෙලත් ගිහිල්ලා. මං කිව්වා ගුරුතුමාට මට ඒක උගන්වන්න කියලා. මං තමුන්නාන්සෙව හොයා ගෙන මේ තරම් දුරක් ආවේ ඒකටමයි කියලා මං කිව්වම ගුරුතුමාගේ ඇස්වලට කඳුළු ආවා. පරම්පරා හතක ඉඳලා අපි මේ නැටුම රැක ගෙන එන්නේ. මට දරුවො නෑ. මං මෙච්චර වයසට යනකල් පිට කෙනෙක් ඇවිදින් ඒ නැටුම ඉගෙන ගත්තෙත් නෑ. මේ ළමයා විතරයි ආවේ. හොඳයි මං මේ ළමයට උගන්වන්නම් කියලා මට නැටුම් ඉගැන්නුවා.

ඉතින් බලන්න සර්. මං මෙච්චර අමාරුවෙන් ඉගෙන ගත්ත දේ ගංගෝතා මිනිසුන්ට පෙන්නනලා ඇති වැඩක් නෑ. කල්කටාවේ නැටුම්වලට තැනක් තියෙනවලු මාව එහේ එක්ක යනවද සර්?"

"මේ ගැන කතා කරගන්න අපේ ඔපිස් එක පැත්තේ දවසක එන්නකෝ."

ධාතුරියා සතුටු වී යන්නට ගියේය. ඔහු මෙතරම් අපහසුවෙන් උගත් ගැමි නැටුම බලන්නට කල්කටාවේ දී උනන්දු වෙන්නේ කවුරුද? මේ අසරණයා එහි ගොස් තනිවී කුමක් කරන්නද? ඔහු එහිදී අතරමං වනු ඇත.

08

සොබා දහම් රැජිනිය තමා කෙරෙහි හක්තිමත් වූවන්ට දෙන්නේ අමිල ධනයකි. කාලයක් තිස්සේ නොකඩවා ඇයට සේවය කළහොත් මිසක කිසිවෙකුට එම ධනය නොලැබේ. සොබාදහම් රැජිනිය ඊර්ෂ්‍යා සහගත බවක්ද පළ කරයි. ස්වාභාවික පරිසරයට ඇළුම් කරන තැනැත්තා ඒ සමගම විසිය යුතුය. ඒ අතර වෙනත් අතකට හිත යොමු කළොත් අමනාපයට පත්වන ඇය තමාගේ මුහුණ ඔහුට නොපෙනෙන්නට සළුපොටකින් සඟවා ගනියි.

එසේ වුවත් යමෙකු සියල්ල අමතක කොට ස්වභාව සෞන්දර්යයේම ඇලී ගැලී සිටීනම් ඇය ඒ තැනැත්තාට ආනන්දයේද, සෞන්දර්යයේද, ශාන්තියේද, වරප්‍රසාද නොමදව ලබා දෙයි. කෙනෙකු උමතු කරවන තරම් වූ සුන්දරත්වයක් පෙන්වා දිවා රෑ දෙකේ විවිධාකාරයෙන් ඔහුව වශී කරවයි. ඔහු තුළ නව දෘෂ්ටියක් අවදි කරවයි. මනසේ ආයුෂ වැඩි කරවයි. සුර ලොවක සීමාවන් කරා ඔහුව කැඳවා ගෙන යයි.

මම මගේ අත්දැකීම් කීපයක් ගැන පමණක් ලියමි. මා ලද අමිල අත්දැකීම් ගැන කියන්නට ගියොත් එහි කෙළවරක් දැකිය නොහැකි වනු ඇත. මට කීමට උවමනා කරන දේවලින් කොටසක්වත් කියාගත නොහැකි වනු ඇත. කීවත් ඒවා අසන්නට කැමති කෙනෙක් සොයා ගැනීමට අපහසුය. හදවත පත්ලෙන්ම ස්වාභාවික පරිසරයට ඇළුම් කරන අය ඇත්තේ කීයෙන් කීදෙනා ද?

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මුළු තැනිතලාව පුරා දුඹලි මල් පිපී වසන්තය පැමිණි බව දන්වයි. ඒ මල් ඉතා දැකුම්කළුය. කහ පැහැති දුඹලි මල් තාරකා හැඩයෙන් යුක්තය. දිගු වැලක ආකාරයෙන් පොළොව බදාගෙන වැඩෙන දුඹලි ශාකවල පුරුකක් ගානේ කහපාට තාරකා හැඩයේ මල් පිපේ. උදෑසන තණබිමේ හා පාර දෙපස ආලෝකමත් කරමින් මල් පිපී ඇති බව දකින්නට ලැබේ. හිරුරැස් දැඩි වත්ම ඒ මල් හැකිළී නැවත පොහොට්ටුවක හැඩය ගනියි. පසුදින උදෑසන වන විට ඒවා නැවත විකසිත වෙයි.

රතු කැල මල් වසන්තය දැකිය හැකි වන්නේ මෝහන පුරා රක්ෂිත වනයේ සහ අපේ වතුයායේ සීමාවෙන් එහා පිහිටි මහාලිඛාරූප නම් ගල් පර්වතවලින් ගහන වූ ප්‍රදේශයේය. අපේ වතුයායේ සිට ඉතා ඈතින් පිහිටි ඒ ප්‍රදේශයට අශ්වයා පිටින් යාමට පැය තුනක පමණ කාලයක් ගත වේ. බක් මහට පිපෙන සල්මල් පොකුරුවල සුවඳින් ඒ පළාතම සුවඳවත් වේ කෝකිලයින් සැලළිහිණියන් ආදි මිහිරි ගී ගයන කුරුල්ලන් මෙහි නද දෙන්නේ නැත. මේ ජනශූන්‍ය පාළු ආරණ්‍ය භූමියේ නන්නත්තාර වූ ස්වභාවයට ඔවුන් ඇළුම් කරන්නේ නැතිවා වෙන්නට ඇත.

වරින් වර බෙංගාලයට ආපසු යාම සඳහා මගේ හදවත නොසන්සුන් වෙයි. බෙංගාලයේ ඒ සුමධුර වසන්ත කාලය වෙත මම කල්පනා ලෝකය තුළින් පිය නගමි. ස්නානය කිරීමෙන් තෙත් වූ ඇඳුම් සහිතව පොකුණක පැන් තොටක් අසලින් ගමන් කරන තරුණ බිරිඳකගේ රුවක් මනසින් දකිමි. මිදුල කෙළවරවූ මල් පිපුණු පින්න කැලයත්, දොඩම් මල්වල සුවඳින් පිරුණු, සෙවණැලි වලින් ගැවසුණු, සන්ධ්‍යාවනුත් මම සිතින් මවා ගනිමි. මගේ ගම් පළාත මා හරි හැටි හඳුනා ගත්තේ පිට පළාතකට පැමිණි පසුය. තමාගේ ගම් පළාත සිහිවන විට සිතට ඇතිවන වේදනාව ගැන ගමේ සිටිය දී කිසි විටක දැන ගත නොහැක. මෙය ජීවිතයේ වැදගත් අත් දැකීමකි. මෙවන් අත්දැකීමක් නොමැති කෙනෙකුට කිසියම් ශ්‍රේෂ්ඨ වූ විඳනයක් ලබා ගැනීමේ වාසනාව නොලැබී යයි.

එසේ වුවත් වරින් වර නොයෙක් අයුරින් කීමට උත්සාහ කළත් මට හරි හැටි තේරුම් කළ නොහැකි කරුණක් වන්නේ ස්වාභාවික පරිසරයේ ඇති අසීමිත වූද දුර්ලභ වූද සිරුරේ ලොමු ඩැහැ ගන්වන සුළු වූද, සෞන්දර්යයේ සැඟවී ඇති රහසයි. දැසින් නුදුටු කෙනෙකුට එය කෙබඳු එකක්දැයි මා කෙසේ විස්තර කරන්නද?

ජනශූන්‍ය විශාල ලොබ්ටුලියාවේ, දිගන්තය තෙක් විහිදුන ඉඳුක් හා මානා කැලය මැදින්, නිහඬ සැන්දෑවල තනිව අශ්වයා පිටින් යද්දී පරිසරයේ මේ ස්වරූපය මගේ හදවත අසීමිත ගුප්ත හැඟීමකින් පිරවීමට සමත් වෙයි. විටෙක එය බියක් ලෙසින් ද, විටෙක විරාගී, උදාසීන බවක් ලෙසින්ද, විටෙක මිහිරි සිහිනයක් ලෙසින්ද, විටෙක දෙස් විදෙස්වල මිනිසුන්ගේ හදවත්වල උපදින වේදනාවක් ලෙසින්ද, මගේ හදවතට දැනේ. එය කිසියම් සම්භාව්‍ය සංගීත බණ්ඩයක් සේය. තාරකාවල ක්ෂීණ වූ ආලෝකයේද, සඳ පහන් රැයේ හුදකලාවූ පළඟැටි නාදයේ ද, කඩා වැටෙන උල්කාවක අග්නියේ ආලෝකයේ ද රිද්මය එහි සැඟවී ඇත.

කිසිවෙකුට පවුල් පන්සල් වී තැන්පත් වීමට අවශ්‍ය නම් ස්වභාව ධර්මයේ ස්වරූපය නොදකින එක වඩා හොඳය. ස්වභාව ධර්මයේ මෝහනීය වූ මායාකාරී බව මිනිසා තම නිවසින් ඉවත් කිරීමට සමත් වෙයි. එය ඔහු උදාසීන, හුදකලා. විරාගී, ඉබාගාතේ යන කෙනෙකු බවට පත් කරවයි. හැරී ජොන්ස්ටෝන්, මාර්කෝපෝලෝ, හඩියන්. ෂැකල්ටන් වැන්නෙකු බවට ඔහු පත් කරවයි. සොබා දහම් රැජිනිය එවැන්නෙකුට පවුල් පන්සල් වී සිටින්නට ඉඩ නොදෙයි. වරක් සොබා දහම් රැජිනියගේ ඇමතුම අසා ඇගේ නිරාවරණය වූ රූපය ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටු කෙනෙකුට නිවසට කොටු වී පවුල් ජීවිතයක් ගත කිරීම කළ නොහැක්කකි.

මධ්‍යම රාත්‍රියේ තනිව ගෙයින් පිටතට පැමිණ බැලූ විට අන්ධකාර තණ බිමේ සෙවණැලි පළවා හරිමින් සඳ එළිය වැටී දිලෙන අයුරු මා දැක ඇත. ඒ සෞන්දර්යය කෙනෙකු උමතු කරවන තරමේ එකකි. මා මෙය අතිශයෝක්තියෙන් කියන දෙයක් නොවේ. දුබල සිත් ඇති කිසිවෙකු වෙතොත් ඒ රුව ඔහුට නොපෙන්වීම යහපත්ය. එය විනාශකාරී රුවකි. හැම දෙනාටම එහි සුන්දරත්වය දරාගත නොහැක.

එසේ වුවද ස්වභාව ධර්මයාගේ ඒ රූපය දැකීම වාසනාවක් ලෙස සැලකිය යුතු බවද සත්‍යයකි. මෙවැනි ජනශූන්‍ය විශාල නිදහස් ආරණ්‍ය භූමියක්, පර්වත මාලාවක් හෝ මිටියාවතක් සෑම තැනම දකින්නට නොලැබේ. ගැඹුරු නිශා රැජිනගේ අන්ධකාරය හෝ සඳ පහන ඒ පරිසරය සමග මුසු වූ විට මැවෙන දර්ශනයද දුලබ එකකි. එවැනි ගැලපීම් සුලභ වේ නම් මහ පොළොව කවීන් ගෙන්ද, සෞන්දර්යවේදීන් පිළිබඳ උමතු වූවන්ගෙන්ද, පිරී යනු ඇත. සොබා දහම්

රැජිනගේ සුන්දරත්වය ප්‍රත්‍යක්ෂ ලෙස කියන්නට හැකි වූ තවත් අවස්ථාවක් ගැන දැන් සඳහන් කරමි.

දිනක් පූර්ණියා නගරයේ සිට එහි සිටින නීතිඥයෙකුගෙන් මට විදුලි පණිවිඩයක් ලැබිණ. ඔහු මට දන්වා තිබුණේ පසුදින පෙරවරු දහයට පෙර මා එහි සිටිය යුතු බවය. එසේ නොකළොත් ලොකු නඩුවකින් අපට අවාසි වනු ඇතැයි ද ඔහු දන්වා තිබුණේය.

අපේ වතුයායේ සිට පූර්ණියා නගරයට සැතපුම් පනස් ගණනක් විය. පූර්ණියා දක්වා යන රාත්‍රි දුම්රියක් තිබුණත් පණිවිඩය ලැබුණු පසු සැතපුම් දාහතක් දුර ගෙවා දුම්රිය පොළට යාමට කාලයක් තිබුණේ නැත.

මම එවේලේ ම අශ්වයා පිට නැගී ගමන පිටත් වීමට තීරණය කළෙමි.

එසේ වුවද ගමන දීර්ඝ වූද, අනතුරුදායක වූද, එකක් විය. විශේෂයෙන් වනගත ප්‍රදේශයේ රාත්‍රිකාලයේ ගමන් කිරීම අනතුරු සහිතය. ඒ නිසා සූජන් සිං නම් බදු එකතු කරන නිලධාරියාද මා සමග යාමට පැමිණියේය.

රෑ බෝ වන වෙලාවේ අපි දෙදෙනා අශ්වයින් පිට නැගී ගමන් ඇරඹුවෙමු. එදින පුර පෝයට පසුව එළඹුණු තුන්වන දිනය විය. ගමන පිටත් වී ටික දුරක් ආ විට සඳ නැගී ආවේය. පැහැදිලි සඳ එළියෙන් වනයේ තැනිතලා බිම අමුතු ආකාරයකට දිස් විය. සූජන් සිං සහ මම එක පෙළට අශ්වයින් පිට ගමන් කළෙමු. විටෙක කුඩා උස් බිම්වලට නැගෙමින් ද යළි බසිමින් ද ගමන් කළ අපට මාර්ගයේ වැලි පස මතට සඳඑළිය වැටී සුදට දිලිසෙනු පෙනිණ. අතරින් පතර පඳුරු කීපයක් තිබුණත් බොහෝ දුරක් යන තෙක් පෙනුණේ ඉළුක් හා උස් තණ පඳුරුවලින් ගහන තැනිතලාවමය. සූජන් සිං නොයෙක් දේ කියමින් ගියේය. ක්‍රමයෙන් සඳ නැගෙත්ම වනයත් වැලිතලාවත් පැහැදිලිව පෙනෙන්නට විය. පහත මට්ටමේ වූ වනයේ තුරු හිස් බොහෝ දුරක් දක්වා සරල රේඛීයව දිස් විය. පේන තෙක් මානයේ එක් පසෙකින් වූයේ පතනයි. අනික් පසින් ඝන වනයයි. ඈතින් වඩා උස් නොවූ පර්වත පේළියක් දිස් විය. ජනශූන්‍ය, පාළු, බිමක් වූ එහි මිනිස් වාසයක් කොහේවත් නැත. කිසිම මිනිස් හඬක් හෝ ප්‍රතික්‍රියාවක් හෝ නැත. අපි දෙදෙනා කිසියම් නොදන්නා ග්‍රහලෝකයක පාළු මගක යන ජීවීන් දෙදෙනෙකු සේය.

එක් තැනක දී සූජන් සිං අශ්වයා නතර කළේය. කුමක් සිදුවීදැයි බැලූ විට අසල වූ වනයේ සිට වල් ඌරු දෙනක් තමාගේ පැටවුන් පිරිවරාගෙන පාර හරහා යනු දුටුවෙමු.

"වල් ඌරෝ තව හොඳයි සර්. මේ හරියේ කුළු මීමුන්ගෙන් තමයි බේරෙන්න බැරි. ළඟදීත් කුළු මීමෙකුට අහුවෙලා මිනිහෙක් මරලා තිබුණා." සූජන් සිං කීය.

තවත් ටික දුරක් ගිය විට කළු පාටට කුළු මීමකු දකින්නට ලැබුණි.

"අශ්වයා බය වෙයි සර්, නවත්ත ගන්න." සූජන් සිං එසේ කීය. අන්තිමේ දී ඌ සෙලවෙන්නේ වත් නැති බව පෙනී සෙමෙන් සෙමෙන් ඉදිරියට ගොස් බැලූ විට එය කුළු මීමෙකු නොව කුඩා මඩුවක් බව පෙනී ගියේය. අපි නැවත අශ්වයින්ට නිදහසේ දිව යාමට ඉඩ හැරියෙමු. සඳ එළියේ හුදකලා වූ කුරුල්ලෙක් කොහෙදෝ සිට ටිප්-ටිප්-ටිප්-ටිප් යයි නද දුන්නේය. අශ්ව කුර වලින් වැලි පාර ඇවිස්සී තිබිණ. මොහොතක් වත් නතර වීමට ඉඩක් නැත. හැකි ඉක්මනින් ඉදිරියට යා යුතුය.

බොහෝ වේලා එකම ආකාරයට සිටීම නිසා පිට රිදුම් දෙන්නට විය. සෑදලය රත්වී තිබිණ. අශ්වයා ගමන් වේගය වෙනස් කොට හැල්මේ යන්නට විය. කිසිවක් දැක අශ්වයා බිය පත් වී හදිසියේ නතර වුවහොත් අශ්වයා පිටින් ලිස්සා වැටීමට ඉඩ ඇති නිසා බොහෝ ඈත දක්වා දෑස් දල්වා බලමින් ගමන් කළෙමි. වනය මැදින් යාමට නියම පාරක් නොවූ හෙයින් යා යුතු මග අප තීරණය කළේ තැනින් තැන ගැට ගසා තිබුණු දිගු තණ පඳුරු දැකීමෙනි.

"සර් මේක නියම පාර නොවෙයි වෙන්න ඇති. අපට පාර වැරදිලා."

සූජන් සිං කීවේය. මම හත්දින්නන් තරු ඇති දිශාව බලා ධ්‍රැව තාරකාව සොයා ගතිමි.

"පූර්ණියා ටවුම අපේ එස්ටේට් එකේ ඉඳල හරි උතුරින් තියෙන්නේ. ඒ නිසා මේ පාර හරි."

"නෑ. සර්. කුශී ගහ පහුකරලා උතුරු පැත්තට යන්න තියෙන්නේ. දැන් ඊශාන පැත්තට ගිහින් ගහ හොයා ගන්න ඕනෑ."

අන්තිමේදී අපට නියම පාර හමු විය.

සඳ මුදුන් වීගෙන ආවේය. එය කෙතරම් අපූරු සඳ එළියක්ද! ඒ රාත්‍රිය කෙතරම් සොඳුරුවීද! එක් පසෙකින් තණ පඳුරුය. අනෙක්

පස ඇති පාළු වැලි තලාවට සඳ එළිය වැටී ඇත. මෙවැනි පරිසරයකට සඳ එළිය වැටී ඇති අයුරු දැක නැති කෙනෙකුට එය කෙබඳු එකක්දැයි වටහා දීම අසීරුය. මෙවැනි නිදහස් ආකාශය යට පාළු, උදාසීන ගැඹුරු, සඳ පහන් රැයක, වනයට, පර්වතවලට, තැනිතලාවට, හා වැලි තලයට වැටුණු සඳ එළිය මේ අයුරින් දැක ඇත්තේ කීයෙන් කී දෙනාද?

අශ්වයෝ දෙදෙනාම හති දමමින් සිටියහ. සුළඟේ සීතලක් පැවතුණද අපට ඩහදිය දමා තිබුණේය. වනයේ කපු ගසක් යට අශ්වයින් නවත්වා මිනිත්තු දහයක් පමණ අපි විවේක ගත්තෙමු. ඒ කපු ගසේ මල් පිපී තිබුණි. ඒ අසලින් ගලා ගිය කුඩා අතු ගඟක් ඉදිරියේ දී වැඩි දුරක් නොගොස් කුශී ගඟට වැටෙයි. වනයෙන් වටවූ ඒ ප්‍රදේශයේ පාරක් පෙනෙන්නට නොවීය. එහි තිබුණු ගස් වැල් එතරම් උසට වැඩී තිබුණේ නැත. අප දෙදෙනාට සෑහෙන දිය පිපාසයක් ඇති වී තිබුණි.

සඳ එළිය මලානික වෙමින් පැවතිණ. ඈත බටහිර දෙසින් දිස් වූ පර්වත පේළිය පිටුපසින් සඳ බැස යාමට ආසන්න විය. සෙවණැලි දික් වන්නට විය. කුරුලු හඬක්වත් අපට ඇසුණේ නැත. තැනිතලාවත් වනාන්තරයත් අඳුරින් වැසී ගියේය. පාන්දර හැමූ සුළඟේ සීතලක් රැඳී නිබිණ. වේලාව බැලූ විට පාන්දර හතර බව පෙනිණ. අඳුර මැදින් වල් අලි රංචුවක් මුණ ගැසෙනු ඇතැයි යන බියක් ද දැනෙන්නට විය. මධු වනය නමින් හැඳින්වෙන අසල වූ කැලයේ වල් අලි සිටිති.

දෙපස වූ කුඩා කඳු ගැට අතරින් වැටුණු මාර්ගය දිගේ ඉදිරියට යද්දී අපට කඳු මත වූ පත්‍ර රහිත ගෝල්ගෝලි මල් ගස්ද කැල ගස් ද පෙනෙන්නට විය. රාත්‍රිය අවසානයේ සඳ බසිද්දී අඳුරු වන පර්වත අමුතු ආකාරයකින් දිස්විය. පෙර දිග අහස ආලෝකවත් වෙමින් පැවතිණ. ඉන් පසු හිමිදිරි උදෑසන සුළං හමන්නටත් කුරුලු ගීත ඇසෙන්නටත් පටන් ගත්තේය. අශ්වයාගේ සිරුරෙන් ඩහදිය ගලන්නට විය. අපේ අශ්වයින් හොඳ බැවින් මෙතරම් දුරක් වේගයෙන් පැමිණීමට හැකි විය. අප පිටත් වුණේ රෑ බෝවී ගෙන එද්දීය. දැන් එළිවී ඇත. ඉදිරියේ වූ මාර්ගයේ අවසානයක් තවමත් දකින්නට නැත. දකින්නට ඇත්තේ ඒකාකාරී වූ වනයත් පර්වතත් පමණි.

ඉදිරියේ වූ පර්වත පිටුපසින් රතු සින්දූර තැවරූ ගෝලයක් ලෙසින් හිරු නැඟ ආවේය. පාර අයිනේ වූ ගමක් අසල නැවතුණු අපි කිරි මිලදී ගෙන බීවෙමු. ඉන්පසු තවත් පැය දෙකක් ගමන් කළ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

අපි පූර්ණියා නගරයට ළඟා වූයෙමු. එහිදී රාජකාරී වැඩ කටයුතු නිම කරගත්තත් ඒ අතරතුරද මට නිතරම මතක් වූයේ අප ආ මාර්ගය ගැනමය. මගේ හවුල් කරුවාට උවමනා වූයේ වැඩ කටයුතු අවසන් කළ වහාම ආපසු යාමටය. සඳ පහන් රැයේ අප ආ මාර්ගයේ අශ්වයා පිටින් යාමේ විචිත්‍ර වූ අත්දැකීම් නැවත ලැබීමට ඇති ආශාවෙන් මම ඔහුගේ අදහසට එකඟ නොවුයෙමි.

එදින රාත්‍රියේ සඳ මදක් පමාවී පැවූ නිසා පාන්දර වැඩි කාලයක් සඳ එළිය පැවතිණ. එය කෙබඳු සඳ එළියක්ද, කෘෂ්ණ පක්ෂයේ සඳ, වන පර්වත මත ශාන්ත වූද, නිසසල වූද, ආශ්චර්‍ය්‍ය මත්වූද සිහින ලෝකයක් මවා පැවේය. පර්වත සානුවල පිපුණු කහ පැහැති ගෝල්ගෝලි මල්, උස් පහත් වෙමින් දිව ගිය මාර්ග යන සියල්ල එකතු වී කිසියම් ඈත වූ ලෝකයක් වෙතට මා ගෙන ගියේය. මරණයෙන් පසු කිසියම් නොපෙනෙන නොදන්නා ලෝකයකට සිරුරු නොමැතිව ආත්මය ගමන් කරන බව මට සිහි විය. බුදුන් වහන්සේ දෙසූ නිර්වාණය ගැනද මට සිහිපත් විය. එහි සඳ නොනැගුණත් අන්ධකාරයක් නැත.

බොහෝ දිනකට පසු ඒ නිදහස් ලෝකය අත හැර ආ මම ජනාකීර්ණ කල්කටා නගරයේ කුඩා පටු මගක පදිංචිව සිටියෙමි. බිරිඳගේ මහන මැසිමේ ශබ්දය අසමින් සිටිද්දී එදා ලද අපූරු ආස්වාදයත්, සඳ එළිය පැතිරී ගුප්ත බවකින් පෙනෙන්නට වූ වනාන්තරයේ ශෝභාවත්, ගැන මට සිහිවිය. රාත්‍රිය අවසානයේ සඳ බැස යද්දී අඳුරු කඳු මතවූ ගෝල්ගෝලි මල් ගස් ගැනත් වියළි තණ පඳුරුවලින් නැගුණු නැවුම් සුවඳ ගැනත් කල්පනා කළෙමි. මා ඉන්පසු මනෝ ලෝකයේ දී කී වාරයක් අශ්වයා පිට නැඟී පූර්ණියා නගරයට සඳ පහන් රාත්‍රිවල වනය මැදින් ගොස් ඇත්ද?

බක් මාසයේ දිනකදී සීතා පුරය නම් ගමේ සිටි රාඛාල් බාබු නම් දොස්තර කෙනෙකු පෙරදින රාත්‍රියේ හදිසියේ මියගොස් ඇති බව මට ආරංචි විය.

ඔහුගේ නම ඊට කලින් මා අසා තිබුණේ නැත. එවැන්නෙකු එහි සිටින බවක් වත් මා දැන සිටියේ නැත. අවුරුදු විස්සක් පමණ කාලයක් නිස්සේ ඔහු එහි සිටි බව මට අසන්නට ලැබිණ. ඒ පළාතේ ඔහු ගැන හොඳ ප්‍රසිද්ධියක් තිබුණු බවත් ඔහු විවාහ වී ඒ පළාතේම අඹු දරුවන් සමග සිටි බවත් මිනිස්සු කීහ.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

තමාගේ මිනිසුන්ගෙන් තොර වූ පළාතක හදිසියේ බෙංගාලි ජාතිකයකු මිය ගිය විට ඔහුගේ අඹු දරුවන්ට කුමන කලදසාවක් යනු ඇද්ද යන්න ගැනත් ඔහුගේ අවමංගල කටයුතු නිසි පරිදි චාරිත්‍රානුකූලව සිදු වේද යන්න ගැනත් මගේ සිත නොසන්සුන් විය. මගේ ප්‍රථම කර්තව්‍ය වූයේ එහි ගොස් ශෝකයෙන් පීඩිත වූ ඔහුගේ දරු පවුල ගැන සොයා බැලීමය.

ඒ ගම අපේ කාර්‍යාලයේ සිට සැතැපුම් විස්සක් ඇතින් කඩාරි වත්ත කෙළවර පිහිටි බව මට දැනගන්නට ලැබිණ. මම දහවල් වන විට එහි ළඟා වූයෙමි. මිනිසුන්ගෙන් විමසූ විට රාඛාල් බාබුගේ නිවස සොයාගත හැකිවිය. ලොකු කාමර දෙකකින් ද කුඩා කාමර තුනකින් ද සමන්විත වූ නිවසේ ඒ පළාතේ සාදන අන්දමේ විවෘත ආලින්දයක්ද විය. එය බෙංගාලි ජාතිකයෙකුගේ නිවසක් යයි හඳුනා ගැනීමට කිසිදු සලකුණක් නොවීය. ආලින්දයේ වූ ලනු ඇඳත් මිදුලේ වූ හනුමාන් ඕවජයත් ඒ පළාතට අයත් ඒවාම විය.

මා කළු ඇමතුම අසා අවුරුදු දොළහක් පමණ වයසැති ළමයෙක් ගෙයින් පිටතට පැමිණියේය. "කාව හම්බ වෙන්නද ආවේ?" ඔහු හින්දියෙන් ඇසුවේය.

ඔහුගේ මුහුණ දුටු විට ඒ බෙංගාලි ළමයෙකු යයි මට සිතුණේ නැත. ඔහුගේ හිසේ එක් කෙස් රොදක් පමණක් දිගට වවා තිබිණ. ඔහුගේ මුහුණුවරද හින්දුස්ථානී ළමයෙකු සේ වූයේ කෙසේ ද?

මම ඔහුට මා කවුරුදැයි හඳුන්වා දුන්නෙමි.

"ගෙදර වැඩිහිටි කෙනෙක් ඉන්නවා නම් එන්න කියන්න."

මා එසේ කී විට ඔහු කීවේ ගෙදර වැඩිමහලු දරුවා ඔහු බවයි. තමාට බාල සහෝදරයින් දෙදෙනෙකු සිටින බව ඔහු පැවසුවේය.

"ඔය ළමයගේ අම්මට කියන්න මට අම්මත් එක්ක කතා කරන්න ඕනෑ කියලා."

ටික වේලාවකට පසු ළමයා පැමිණ මා ගෙතුළට කැඳවාගෙන ගියේය. රාඛාල් බාබුගේ බිරිඳ වයස අවුරුදු තිහක් පමණ වූ කෙනෙකි. හැඬීම නිසා ඇගේ දෑස් ඉදිමී තිබිණ. ඒ නිවසේ බඩු බාහිරාදිය දිළිඳු නිවසක ඒවා මෙන් විය. පිලේ ඉරුණු ඇතිරිලි සහිත ඇඳන් දෙකක් විය. ඒ පළාතේ අය භාවිතා කරන ආකාරයේ පිත්තල භාජන කීපයක් ද දුම් උරන පයිප්පයක්ද පැරණි ට්‍රංක පෙට්ටියක්ද ගෙයි පෙනෙන්නට විය.

"මම බෙංගාලි කෙනෙක්. මං මේ කිව්වුව ඉන්නේ. මට රාඛාල් බාබුගේ මරණය ගැන ආරංචි වුණා. ඒ නිසයි ආවේ. මං හිතනවා මං මොනවා හරි මේ අය වෙනුවෙන් කරන්න ඕනෑ කියලා. මගේ උදව්වක් ඕනෑ නම් ලැජ්ජා වෙන්නේ නැතිව කියන්න."

රාඛාල් බාබුගේ බිරිඳ දොරට මුවාවී සිට සෙමින් හඬන්නට වූවාය. මම ඇයට සැනසිලි බස් කියා මා ආ කාරණය නැවත මතක් කර දුන්නෙමි. රාඛාල් බාබුගේ බිරිඳ මුවාවී සිටි තැනින් එළියට ආවාය.

"තමුන්නාන්සේ මට සහෝදරයෙක් වගේ. මේ කරදර වෙලාවේ දෙයියෝ තමයි තමුන්නාන්සේව මෙහාට එව්වේ." යයි ඇය හඬමින් කීවාය.

ටිකින් ටික ඔවුන්ගේ සියලු විස්තර මට දැනගත හැකිවිය. මේ බෙංගාලි ජාතිකයාගේ පවුල කරදර අවස්ථාවේ කිසිවක් කර ගියා ගත නොහැකිව ඉතා අසරණ වී සිටින බව මට පෙනී ගියේය. රාඛාල් බාබු අවුරුද්දක් තිස්සේම ඔත්පල වී ඇදේ සිට ඇත. ඔහුට ප්‍රතිකාර කිරීමට හා ගෙදර නඩත්තුවට නිවසේ තිබුණු මුළු සේසතම අවසන් වී ඇත. මියගිය තැනැත්තා වෙනුවෙන් ඉටු කෙරෙන දාන මානාදී කටයුතු කිරීමට පවා මුදලක් ඇය ළඟ නැත.

රාඛාල් බාබු හුඟ කාලෙක ඉඳලා නේද මේ පැත්තේ ඉන්නේ? සල්ලි හම්බ කරලා තිබුණේ නැද්ද?"

මා අමුත්තෙකු වුවද රාඛාල් බාබුගේ බිරිඳගේ ලැජ්ජාව මා ඉදිරියේ බොහෝ දුරට මඟ හැරී ගියා සේය.

ඇත පළාතක ජීවත් වෙද්දී කරදරයක වැටුණු වෙලාවේ තමාගේ ජාතියේ කෙනෙකු හමුවී ඇය අස්වැසිල්ලක් ලැබූ බව ඇයගේ මුහුණ දෙස බැලූ විට මට තේරුම් ගියේය.

"කලින් කොච්චර සල්ලි හම්බ වුනාද දන්නේ නෑ. මාව බැන්දේ මීට අවුරුදු පහළොවකට ඉස්සෙල්ලා. කලින් බැඳලා හිටපු එක්කෙනා මැරුණට පස්සේ තමයි මාව කැන්දන් ආවේ. අමාරුවෙන් තමයි ගෙදර නඩත්තුව ගෙනිව්වේ. මේ පළාතේ ලෙඩ්ඩු බලලා බෙහෙත් දුන්නට වැඩි දෙනෙක් සල්ලි දෙන්නේ නෑ. ඉරිහු, තිරිහු වගේ දේ තමයි ඒ වෙනුවට දෙන්නේ. ගිය අවුරුද්දේ නවම් මාසේ ඉඳලා එයා අසනීප වෙලා හිටියා. එදා ඉඳලා කිසිම මුදලක් අපි ළඟ තිබුණේ නෑ. මේ පැත්තේ මිනිස්සු නරක අය නොවෙයි. තම තමන් ළඟ තිබුණු තිබුණු විදිහට ඉරිහු, තිරිහු එහෙම සැරින් සැරේ අපට ගෙනත් දුන්නා.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ඒකෙන් තමයි අපි ජීවත් වුනේ. නැතිනම් අපි මෙලහකට කන්න නැතිව මැරිලා."

"අක්කගේ දෙමාපියන්ගේ ගම කොහේද? එහාට දැන්නුවද?"

රාඛාල් බාබුගේ බිරිඳ ටික වේලාවක් නිහඬව සිටියාය.

"එහේ දන්වන්න කවුරුවත් නෑ. මං අපේ අම්මා තාත්තාගේ ගෙදර තියෙන තැනවත් දන්නේ නෑ. මං අහලා තියෙනවා ඒක මුර්ශිදාබාද් පැත්තේ කියලා. මං පොඩි කාලෙ ඉඳලා සාහේබ්ගංජයේ අක්කා කෙනෙකුගේ ගෙදර තමයි හැදුණේ. මගේ අම්මා තාත්තා මැරිලා. මං බැන්දට පස්සේ අක්කත් මැරිලා ගියා. අක්කා බැඳලා හිටිය එක්කෙනා ආයිත් කසාදයක් කර ගත්තා. එයින් පස්සේ ඒ ගෙදරත් එක්ක අපේ කිසිම සම්බන්ධයක් නෑ."

"රාඛාල් බාබුටත් නෑයෝ කවුරුවත් නැද්ද?"

"ගමේ නෑයෝ ඉන්නවා. සහෝදරයොත් ඉන්නවා කියලා මං අහලා තියෙනවා. ඒ අය කවදාවත් අපි ගැන හොයලා බැලුවෙ නෑ. එයත් ගමට ගියේ නෑ. ඒ නිසා ඒ ගොල්ලොත් එක්ක අපේ සම්බන්ධයක් නෑ. ඒ අයට දැන්නුවත් එකයි. නැතත් එකයි. බරණැස්වල මාමා කෙනෙකුත් ඉන්නවලු. එයාගෙත් ඇඩ්‍රස් එක දන්නේ නෑ."

මොවුන් කෙතරම් අසරණ වී ඇද්ද? තමාගේ යයි කිව හැකි කිසිවකු නැති දුර පළාතකට වී නොදරුවන් දෙතුන් දෙනෙකු සමග අතරමං වී සිටින කණවැන්දුම් කාන්තාව ගැන සිතන විට සිතට බරක් දැනෙන්නට විය. අවස්ථාවේ හැටියට කළයුතු දේ කර මම කාර්‍යාලයට පැමිණියෙමි. ඉන්පසු ප්‍රධාන කාර්‍යාලයට ලියා අවසර ලබා ගෙන වතුයායේ මුදල්වලින් රුපියල් සීයක් ලබාගෙන එයින් රාඛාල් බාබුගේ දානමය පින්කම්වල කටයුතු සිදුකර අවසන් කළෙමි.

ඉන්පසු මම කීප වරක් එහි ගොස් ඔවුන් ගැන සොයා බැලුවෙමි. වත්තේ මුදල්වලින් ඔවුන්ට මාසයකට රුපියල් දහය ගණනේ ආධාරයක් දීමට වැඩ කටයුතු පිළියෙළ කර පළමු මාසයේ මුදලත් රැගෙන මම එහි ගියෙමි. ඇය ඉතා සැලකිල්ලෙන් හා ළෙන්ගතුකමින් යුතුව මා පිළිගෙන කතාබහ කළාය. නෑ හිත මිතුරන්ගෙන් ඈත් වූ ඒ පළාතේ සොහොයුරියක මෙන් වූ ඇගේ සෙනෙහස මට ඉතා ප්‍රිය විය. ඉඩ ලැබුණු අවස්ථාවල මා එහි ගියේ ඒ නිසාය.

* * * * * *

ලොබ්ටුලියාවට උතුරු දෙසින් වැවක් තිබුණි. මිනිසුන් එය හැඳින්වූයේ සරස්වතී වැව යන නමිනි. එය තුන් පැත්තකින් ඝන වනාන්තරයෙන් වට වී තිබිණ. අප සිටින පැත්තේ හෝ ලොබ්ටුලියාවේ එවැනි වනයක් නොතිබිණ. ඒ වනය සුවිශාල වෘක්ෂයන්ගෙන් ගහණ වූ එකක් විය. ජලාශයක් අසල වූ නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ විවිධාකාර වූද විචිත්‍ර වූද ගස් වැල්වලින් සමන්විත වූ විශාල වනාන්තරය විසින් සරස්වතී වැවේ නිල්වන් ජල තලය අර්ධ කවාකාරව වට කරගනු ලැබිණ. එහි එක් පැත්තකින් පමණක් නිදහස් තැනිතලාවක් විය. එතැන සිට බලන විට නැගෙනහිර පැත්තේ ඉතා ඈතට යන තෙක් විහිදුණු නිල් අහසත් ඈත ගල් පර්වත දෙපළත් දිස්වෙයි. ඒ නිසා වැවේ නැගෙනහිර පැත්තේ ඉවුරේ හිඳගෙන වම් පැත්තත් දකුණු පැත්තත් බැලූ විට සරස්වතී වැවේ ඇති අපූරු සුන්දරත්වය දැකිය හැක. වම් පසින් වූ ඝනව වැඩුණු තුරු ලතා දෙස බලද්දී එහි හරිත වර්ණ සෞන්දර්‍යය මැද ගිළී ගොස් මට මා ගැනම අමතක වී යයි. දකුණු පසින් වූ පැහැදිලි නිල් ජල තලයෙන් එපිට ඈත දක්වා විහිදුණු නිදහස් ආකාශයත්, අපැහැදිලි ලෙස දිස් වූ පර්වත පේළියත්, දෙස බැලූ විට හදවත බැලුමක් මෙන් පිම්බී පොළොවෙන් ඉහළට එසවී යන්නා සේ දැනේ. සමහර අවස්ථාවල මම එහි ගොස් ගල් පොත්ත මත තනිව හිඳගෙන සිටීමට පුරුදුව සිටියෙමි. විටෙක වනය මැද නිදහසේ ඇවිද්දෙමි. තවත් විටෙක සුවිසල් රුක් සෙවණක හිඳ කුරුලු කූජනවලට සවන් දුන්නෙමි. විටින් විට එහි ගොස් විවිධ පැළෑටි වර්ග හා මල් එකතු කරගෙන ආවෙමි. ඒ පරිසරයේදී විවිධාකාර කුරුල්ලන්ගේ නාද මට අසන්නට ලැබිණ. අප සිටි වත්තේ එතරම් කුරුල්ලන් නැත. නොයෙක් ආකාර වූ පළතුරු කෑමටත් උස් තුරු මත කුඩු සෑදීමටත් ඉඩ ලැබෙන නිසා වැව අවට කුරුල්ලන්ගෙන් ගහන වීමට හේතු වන්නට ඇත. ඒ අවට විවිධාකාර වූ වන මල් ද පිපේ. එහි බොහෝ පළතුරු ද ඇත.

වැව් ඉවුරේ ඝනව වැඩුණු වනාන්තරය සැතපුම් තුනක් පමණ දිගටද සැතපුම් එකහමාරක් පමණ පළලටද විහිදී තිබුණි. වැව අයිනේ සිට තුරු වදුළු අතරින් වැටුණු කුඩා අඩිපාරක් විය. මම ඒ පාර දිගේ ඇවිදින්නට පුරුදුව සිටියෙමි. එහි ගමන් කරද්දී විටින් විට වැවේ නිල් පැහැති ජලයත් ඊට ඉහළින් යටිකුරු කළ පාත්‍රයක් වැනි වූ ආකාශයත් දිගන්තයට මුසු වූ පර්වත පේළියත් නෙත ගැටේ. 'සර'

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

'සර' හඬ නංවමින් මඳ සුළං හමයි. කුරුල්ලෝ ගී ගයති. වන මල් වලින් එන සුවඳ නැහැයට දැනේ.

දිනක් මම ගසකට නැග අත්තක් මත හිඳ ගත්තෙමි. එදා මා ලැබූ සතුට වෙනත් ආස්වාදයක් සමග සංසන්දනය කළ නොහැක. මගේ හිසට ඉහළින් වූයේ විශාල වනස්පතීන්ගේ හරිත වර්ණ පත්‍ර රාශියකි. තුරු වදුළ අතරින් නිල් පැහැති ආකාශය දිස්විය. අසල වූ එක් විශාල මල් වැලක හටගත් මල් පොකුරු සුළඟේ සෙලවෙන්නට විය. බොහෝ පහළින් ගස මුල තෙමුණු පස් සහිත පොළොවේ ලොකු බිම් මල් පිපී තිබිණ. එහි පැමිණි විට බොහෝ වේලා කල්පනා කරමින් ගත කරන්නට සිතේ. නොයෙක් ආකාර වූ නැවුම් හැඟීම් සිතට එයි. ලෞකික බව ඉක්මවා යන කිසියම් ආකාරයක හැඟීමක් හදවත පතුලේ සිට සෙමින් සෙමින් අවදි වෙයි. එය ගැඹුරු ආස්වාදයක් ඇතිකර හැම වෘක්ෂ ලතාවකම හෘද ස්පන්දනය මගේ හදවතේ ස්පන්දනය වන රුධිරයත් සමග මුසුවී ඇතැයි මට සිතේ.

අප සිටින වත්තේ එතරම් විචිත්‍ර වූ කුරුලු සමූහයක් නැත. එය වෙනත් ලෝකයක් සේය. එහි වූ වෘක්ෂ ලතා සහ ජීවිහු වෙනත් ආකාරයක් ගනිති. මට හුරු පුරුදු වූ වසන්තයක සිරියාව ලොබිටූලියාවේ නැත. එහි කෝකිල හඬක් නොඇසේ. වසන්තයේදී පිපෙන හුරු පුරුදු මල්ද එහි නැත. එහි ඇත්තේ රූක්ෂ වූද කර්කෂ වූද ස්වභාවයකි. එහි සුන්දරත්වයක් ඇතත් එය මාධුර්යයෙන් හීන වූ එකකි. එසේ වුවද එහි වූ විශාලත්වයත්, රූක්ෂ බවත් මගේ සිත වසඟ කරවයි. එය සංගීතයේ භාවිත වන කෝමල ස්වර නොමැති රාගයක් වැනිය. චෞ තාලය අනුව මාල්කෝන්ස් රාගයෙන් ගැයෙන ධ්‍රැපද් ගීයක් වැනිය. එහි මිහිරි බවට ළං නොවූවත් ගැඹුරු ලෙස උච්ච ලෙස හදවත වෙනත් තලයක් කරා ළඟා කරවයි.

සරස්වතී වැව ඒ සමග සසඳන විට ධ්‍රුම්රී ගායනයක් සේය. එහි කෝමල මිහිරි ස්වර මගින් හදවත මෘදු බවට පත් කරවා සිහින ලොවකට කැඳවා ගෙන යයි. මැදින් බක් මාසවලදී නිසසල දවාලකදී වැව් ඉවුරේ ඇති රුක් පෙළ යට හිඳගෙන කුරුලු කුජනවලට සවන් දෙන විට හදවත බොහෝ දුර ගමන් කරයි. කොහොඹ ගස්වල සුවඳත් මල් සුවඳත් වාතයේ රැඳී ඇත. ජලයේ ඕළු මල් පිපෙයි. මම එහි බොහෝ වේලාවක් ගත කර සවස් වූ විට නැගිට නවාතැනට යමි.

නාඩා බයිහාරයේ ඉඩම් මිනිසුන්ට බෙදා දීම සඳහා මණින්නට පටන් ගත් විට මට නිතර එහි යෑමට සිදු විය. ආපසු එහි සිට සැතපුම් දෙකක් ඇතින් ගිනිකොන පැත්තේ පිහිටි සරස්වතී වැව අසලට යමි. ඒ වැව අසල වූ තුරු වදුලු අතරින් ඇවිදීමට ඇති ආශාව නිසාය.

දිනක් මම සවස තුනට පමණ එහි පැමිණියෙමි. දැඩි හිරු රශ්මි බොහෝ දුරක් දක්වා විහිදුණු තණ බිම් පසු කර ඩහදියෙන් පෙහි ගිය සිරුරින් යුතුව පැමිණ වැව් ඉවුරේ රුක් සෙවණ යටින් ගමන් කළෙමි. තණ බිමේ සිට වැව දක්වා සැතපුම් එකහමාරක් පමණ දුරක් විය. මම අශ්වයා ගසක බැඳ පඳුරක් යට ඉටි රෙද්දක් එළා හාන්සි වූයෙමි. බිමට පහත් වූ අතු සහිත පඳුර යට වැතුරුණු විට පිටත සිට බලන කෙනෙකුට මා නොපෙනෙන තරම් විය. ඊට ටිකක් ඉහළින් වූ ශක්තිමත් කඳක් ඇති ගසක වැල් එති එහි අපූරු සෙවණක් නිර්මාණය වී තිබිණ. මා සිටි තැනට මදක් දුරින් වූ ගසක කොළ පැහැති ගෙඩි වර්ගයක පොකුරු මගේ පපුවට ඉහළින් එල්ලෙමින් තිබිණ. තවත් ගසක මල් බරවූ අතු මා සිටි තැන වූ පඳුරේ අතු සමග පැටළී තිබිණ. ඒ මල් ඉතා කුඩා ඒවා නිසා ළඟට මිස දුරට නොපෙනේ. එසේ වුවද එහි සුවඳ කෙතරම් ඉමිහිරිවීද? ඒ නම නොදන්නා කුඩා වන මලේ සුවඳින් පඳුර යට පරිසරය සුවඳවත් විය.

සරස්වතී වැවේ කුරුලු රජ දහන ගැන මම කලින් ද සඳහන් කළෙමි. මෙතරම් කුරුල්ලන් රාශියක් දැන්නම් දකින්නටවත් නොලැබේ. එහි නොයෙක් ආකාර වූ විවිධ වර්ණයන්ගෙන් යුක්තවූ කුරුල්ලෝ රාශියක් සිටියහ. නයිටින්ගේල්, සැළලිහිණියා, හර්ට්ට්, ගිරවා, වලි කුකුළා, කුරුලුගොයා, බට්ටිච්චා, පරවියා, කහ කුරුල්ලා, ආදීහු ඒ අතර වූහ. උස් තුරු මුදුන්වල උකුස්සා, රාජාලියා ආදී කුරුල්ලෝ වූහ. සරස්වතී නිල් ජලයේ කොකා, රතු හංසයා, මැණික් කුරුල්ලා, කාංක් ආදී කුරුල්ලෝ වූහ. මා සිටි පඳුරට ඉහළින් වූ පරිසරය කුරුල්ලන්ගේ හඬින් දොඩමළු විය. වෙනත් තැනකදී නම් ඔවුන්ගේ උද්යෝගිමත් නාදයට අප සවන් දෙන විට එයට උන් නොකැමැති බව පළ කරතත් මා සිටි තැනට මදක් දුරින් පැද්දෙන අතු මත හිඳ කිචි බිචි ගෑ කුරුල්ලෝ මා ගණන් නොගත්තෝය.

කුරුල්ලන්ගේ මේ බිය නැති බව මා තුළ මහත් සතුටක් ඉපද වූ කරුණක් විය. මා වැනිරී සිටි තැනින් නැගිට හිඳ ගත්තත් ඔවුහු

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

බිය නොවූහ. සමහරු මඳ දුරක් ඉගිලී ගියත් ඈතට පලා ගියේ නැත. ටික වේලාවකින් ඔවුහු නටමින් ගයමින් මා අසලටම පැමිණියහ.

මා පළමු වරට අසල වනයේ සිටින මුවකු දැක්කේ මෙහි දීය. අප සිටින වත්තේද මුවන් සිටින බව අසා තිබුණත් දැක තිබුණේ නැත. මා පඳුර යට වැතිර සිටිය දී කිසියම් හඬක් ඇසී බැළූ විට සනව එකට එතී වැඩී තිබුණ ගස් කොළන් සහින පැත්තේ මුවෙකු සිටින බව දුටුවෙමි. හොඳින් බැළූ විට ඌ මුව පැටවෙකු බව මට තේරුම් ගියේය. ඌ තමාගේ ලොකු දෑස් අයා මා දෙස විස්මයෙන් යුතුව බලා සිටියේය. මේ කුමන අන්දමේ ජීවියකුදැයි ඌ සිතන්නට ඇත.

ටික වේලාවක් යනතුරු මුව පැටියාත් මමත් නොසෙල්වී නිහඬව සිටියෙමු. සුළු මොහොතකට පසු තවත් හොඳින් මා දෙස බැලීමට මෙන් මඳක් ඉදිරියට පැමිණීමට සුදානම් වූයේය. උගේ දෑස්වල මිනිස් දරුවෙකුගේ මෙන් කුතුහලයට පත් බැල්මක් විය. ඌ තවත් ඉදිරියට පැමිණීමට පෙර මගේ අශ්වයා පා සොලවා සිරුර ගසා දැමූ විට මුව පැටියා චකිතයට පත්ව පඳුරු මැදින් උගේ මවට ආරංචිය දැන්වීමට මෙන් පැන දිව්වේය.

ඉන්පසු තවත් ටික වේලාවක් පඳුර යට හිඳගෙන සිටියෙමි. තුරු වදුළු අතරින් වැවේ නිල් ජලතලය අඩ සඳක හැඩයෙන් ඇත පර්වත පෙළේ පාමුල දක්වා විහිදී තිබෙන්නාක් සේ පෙනුණි. අහස නිල් පැහැයක් ගත්තේය. එහි වළාකුලක සේයාවක්වත් පෙනෙන්නට නොවීය. වැවේ ජලචර පක්ෂී රංචුව කලබල කරන්ට පටන් ගෙන සිටියහ. මැණික් කුරුල්ලෙක් උස් තුරු නිසක හිඳ වරින් වර හඬ දී තමාගේ උදහස ප්‍රකාශ කරන්නට විය. වැව අයිනේ වූ ලොකු තුරු හිස් මත කොක්කු රැළක් වසා සිටියෝය. ඈත සිට බැළූ විට උන් දිස් වූයේ සුදු මල් පොකුරු සේය.

හිරු රැස් ක්‍රමයෙන් රතු පැහැ ගත්තේය. වැව් ඉවුරෙන් එහි පිහිටි පර්වත මුදුන් තඹ පැහැයෙන් දිස්වන්නට විය. කොක්කු රංචුවක් පියාපත් ගසා ඉගිලෙන්නට පටන් ගත්හ. ගස්වල කරටි මත වැතිරී තිබුණු හිරු රැස් ඉවත් වන්නට විය.

කුරුලු කුජන හඬ වැඩි විය. නම නොදන්නා වන මල් වලින් එන සුගන්ධය තදින් දැනෙන්නට විය. යැන්දෑ වෙන්නට වෙන්නට එහි සුවඳ වඩාත් තියුණු ලෙසද, මිහිරි ලෙසද දැනෙන්නට විය.

කෙහෙන්දෝ ආ මුගටියෙක් මා දෙස ඇසි පිය නොහෙලා බලා සිටියේය.

මෙය කෙතරම් සැනසිලිදායක පරිසරයක්ද! මෙහි ඇත්තේ කෙතරම් හුදකලා ජනශූන්‍ය බවක්ද: මා එහි ගත කළ පැය තුනහමාරක පමණ කාලය තුළ මට ඇසුණේ කුරුලු හඬ පමණි. ඒ හැර වෙනත් හඬක් මට අසන්න ලැබුණා නම් කුරුල්ලන්ගේ යාම් ඒම් නිසා ගස්වල අතුවලින් නැගෙන හඬත්, වියළි පත්‍ර බිම පතිත වන හඬත්ය. මිනිසෙකුගේ සේයාවක්වත් එහි දකින්නට නොවීය.

විවිධ වූද විචිත්‍ර වූද වෘක්ෂ රාජයෝ මගේ හිසට ඉහළින් පෙනෙන්නට වූහ. ඉර බැස යන වේලාවේ රන්වන් හිරු එළිය පතිත වීමෙන් ඔවුන් කෙරෙන් පල වූයේ අමුතුම සෝබාවකි. බොහෝ ගස්වල කරටිය දක්වා වැල් එතී තිබිණ. ඒ පළාතේ හිංයෝරා' නමින් හැඳින්වෙන වැල් වර්ගයක් විය. මා එය නම් කළේ හොම්රා වැල් යනුවෙනි. ඒ වැල් වර්ගය ගසේ මුදුන් කරටිය දක්වා ගොස් ගස වැළඳ ගනියි. මේ වැලේ මල් පිපෙන කාලයයි. පිච්ච මල් වැනි සුදු පැහැති කුඩා මල් පිරී විශාල තුරු හිස් එළිය වෙයි. එහි සුවඳ ඉතා චමත්කාර ජනකය. ඒවායේ සුවඳ බොහෝ දුරට අබ මල්වල සුවඳට සමාන වුවද එතරම් සැර ගතියක් නැත.

වැව අසල වනයේ සේපාලිකා ගස් බොහෝ වෙයි. බැලූ බැල්මට සමහර ස්ථාන පෙනෙන්නේ එය සේපාලිකාවලින්ම සැදුම් ලත් වනයක් ලෙසිනි. විශාල ගල් තලා මත යරත් සමයේ උදෑසන සේපාලිකා මල් විසිරී තිබෙනු දක්නට ලැබේ. කිසියම් වර්ගයක රළු තෘණ වර්ගයක් ඒ ගල්තලා අසල කටු ගස් වර්ගයක් සමග එතී වැඩේ. ඒ පඳුරු මතද සේපාලිකා මල් විසිරී තිබුණි. එය සෙවණ ඇති තෙතමනය පවතින ස්ථානයක් නිසා උදෑසන වැටුණ මල් වියළී ගොස් තිබුණේ නැත.

සරස්වතී වැවේ මෙතරම් සෞන්දර්‍යයක් මා දුටුවත් මිනිසුන් මේ අසල ව්‍යාඝ්‍රයින් කොටියන් සිටින බව කියා එහි පැමිණීමට බිය වෙති. සඳ එළිය ඇති රැයක ඈත දක්වා පැතිරුණු වැව් තලයේ සිරියාව දැකීමට ඇති ආශාව නිසා බනවාරී ලාල් රවටා පුරපෝය දිනයක ආජමාබාද්හි පිහිටි ප්‍රධාන කාර්‍යාලයට යනබව අහවා අශ්වයා පිට නැගී එහි ගියෙමි.

එදින මට ව්‍යාඝ්‍රයන් දකින්නට නොලැබුණත් මායාකාරී වන දෙවි ලියන් සඳ එළියෙන් නෑවුන වැව් ජලයේ ජල ක්‍රීඩා කරන්නට

නියත වශයෙන්ම මධ්‍යම රාත්‍රියේ පැමිණෙන බව මට හැඟී ගියේය. පරිසරයේ දැඩි නිහඬතාව අතරින් නැගෙනහිර පැත්තේ ඉවුර දෙසින් සිවලුන්ගේ හූ හඬ වරින් වර ඇසෙන්නට විය. ඈතින් පිහිටි පර්වත පේළියත් වන සිරසත් අපැහැදිලිව නෙත ගැටුණි. සඳ එළියේ පින්නෙත් බරවූ වාතයේ හොම්රා වැල්වල මල්වලින් එන මුදු සුවඳ දැනෙන්නට විය. මා ඉදිරිපිට වූ වනයත් පර්වත පේළියත් අතර වූ ඈතට විහිදුණු තරංග රහිත වැව් තලය මතට සඳ රැස් වැටී තිබිණ. මඳ සුළං රැළි අතර දිස් වූ සඳ එළිය දිව්‍යමය ස්වභාවයක් පළ කළේය. හොම්රා ලතාවල කුඩා සුදු පැහැති මල් සහිත තුරු හිස් මතට සඳ එළිය වැටුණු විට ඒවා සුරලියන් විසින් එලන ලද සේල සේ දිස් විය. කෑමියෙක් රැහැයියෙකුගේ හඬට සමාන හඬකින් එක දිගටම හඬ තලන්නට විය. ගසකින් කොළයක් දෙකක් බිම පතිත වන හඬත්, වියළුණු කොළ මතින් 'සර' 'සර' ගා සතෙකු පලායන හඬක් මට ඇසිණි.

වන දෙවිලියන් මා සිටියදී එහි නොඑනු ඇතැයි මට සිතුණි. මටද බොහෝ වේලා යනතුරු පිනි බාමින් එහි රැඳී සිටිය නොහැක. මම පැයක් පමණ එහි ගතකර ආපසු ආවෙමි.

සරස්වතී වැවට වන දෙවිලියන් පැමිණෙන බවට කට කතාවක් ඇති බව මට අසන්නට ලැබිණි. නිකිනි මාසයේ දිනයක වත්තේ උතුරු මායිමේ වූ මිනුම් කඳවුරේ රාත්‍රිය ගත කිරීමට මට සිදු විය. මා සමග රසුවර් ප්‍රසාද් නම් මිනින්දෝරුවාද සිටියේය. ඔහු කලින් රජයේ රැකියාවක නිරතව සිටියේය. මෝහන පුරා රක්ෂිත වනය හා මේ පළාතේ වනාන්තරය ගැන ඔහු අවුරුදු විසිපහක පමණ කාලයක සිට දනී. ඔහුට සරස්වතී වැව ගැන කී විට ඔහු කිවේ මෙයයි.

"සර් ඕක මායාකාරී වැවක්. ඔතැනට රෑට සුරංගනාවියෝ එනවලු. හඳ එළිය තියෙන දවස්වල රෑට ඒ ගොල්ලෝ ඇවිත් අර ගල් තලාව උඩ ඇදුම් තියලා දියට බහිනවලු. බැරි වෙලාවත් ඒක දකින කවුරු හරි දියට බැස්සොත් ගිලිල මැරෙනවා. දියට බැහැපු සුරංගනාවියන්ගේ මුහුණු නෙළුම් මල් වගේ වතුරෙන් උඩට මතුවෙලා පේනවලු. මං නං කවදාවත් දැකලා නෑ. ඒ වුනාට පත්තේ සිං කියලා හෙඩ් සර්වේයර් කෙනෙක් හිටියා. එයා දවසක් දැකලා තියෙනවා සුරංගනාවියෝ නාන හැටි. දවසක් එයා රෑ මැද වැව ළඟින් වැටිල තියෙන පාර දිගේ තනියම මිනුම් කඳවුරට ගිහිල්ලා තියෙනවා. පහුවදා උදේ එයාගේ මළ කඳ වැවේ පාවෙනවා අපි දැක්කා. එයාගේ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

කනක් මාළු කඩාගෙන කාල තිබුණ. අර විදියට අවේලාවේ ඔතැනට නම් දායිත් යන්න එපා සර්."

ඒ සරස්වතී වැව අසලදී එක් දහවලක මට විශේෂ පුද්ගලයෙකු හමු විය. මිනුම් කඳවුරේ සිට ආපසු එද්දී මම වැව අයින දිගේ වැටී ඇති පාරේ සෙමින් සෙමින් අසු පිටින් ආවෙමි. තුරු වදුලක් අතර හිඳගත් මිනිසෙක් පොළව හාරා කුමක්දෝ කරමින් සිටිනු මම දුටුවෙමි. මා පළමුවෙන් සිතුවේ මොහු අල හැරීමට පැමිණි කෙනෙකු බවය. මෙහි වැවෙන වැල් වර්ගයක විශාල අල සෑදේ. ආයුර්වේද ඖෂධයක් ලෙස භාවිත කරන මේ අල සෑහෙන මිළකට අලෙවි කළ හැක. මම කුතුහලයෙන් යුතුව අශ්වයා පිටින් බැස ඔහු ළඟට ගියෙමි. ඔහු අල හාරන්නේ නැති බවත් කිසියම් බීජ වර්ගයක් පැළ කරන බවත් දුටුවෙමි. ඔහු කලබල වී මා දෙස බැලුවේය. හිස කෙස් පැසී තිබුණු ඔහු තලතුනා වයසේ කෙනෙක් විය. ඔහු අසල හන නූලෙන් වියන ලද මල්ලක් විය. එය තුළින් කුඩා ඉස්කෝප්පයක මිටක් පෙනෙන්නට තිබිණ. ඒ අසල පස් ඉවත් කිරීම සඳහා ගන්නා උපකරණයක් ද තැන තැන විසිරුණු කඩදාසි ගුලි කීපයක් ද විය.

"මේ කවුද? මෙහේ මොකද කරන්නේ?"

"මේ වත්තේ මැනේජර් මහත්තයද?"

"ඔව්. තමුසේ කවුද?"

"ආයුබෝවන් සර්. මම තමුන්නාන්සේගේ ඔපීසියේ බදු එකතු කරන බනවාරි ලාල්ගේ බාප්පගේ පුතා."

වරක් බනවාරි ලාල් මොහු ගැන මට පවසා ඇති බව මට සිහිපත් විය. ආජමාබාද්හි ප්‍රධාන කාර්‍යාලයට ලිපිකරුවකු අවශ්‍ය වී තිබුණ නිසා හොඳ කෙනෙකු ඒ සඳහා සොයා දෙන්නට යැයි මම බනවාරි ලාල්ට කීවෙමි. ඔහු කණගාටු වී කීවේ මෙයට ඉතා සුදුසු ඔහුගේ බාප්පාගේ පුතෙකු සිටින බවත් ඔහු අමුතු අන්දමේ විකාර ගති ඇති උදාසීන පුද්ගලයෙකු නිසා මේ සඳහා කැඳවා ගත නොහැකි බවත්ය. ඔහුගේ අත් අකුරු ඉතා අලංකාර බවත් ඔහු මෙන් දැන උගත් කෙනෙකු පළාතේ වත් නැති බවත් බනවාරි පැවසුවේය.

"ඇයි? එයා මොකද කරන්නේ?" මම ඇසුවෙමි.

"මිනිහගේ එක එක විදිහේ පිස්සු වැඩ තියෙනවා. සර්. අතන මෙතන ඇවිදීම එක පිස්සුවක්. හරියට රස්සාවක් කරන්නේ නැහැ. කසාද බැන්දට පවුල රකින්න බලන්නේ නැහැ. කැලෑවල ඇවිද ඇවිද

ඉන්නවා. ගේ අත ඇරලා ඇවිද්දට සන්නාසියෙකුත් නොවෙයි. එයා එක විදිහක මිනිහෙක්."

බනවාරිලාල් එසේ හඳුන්වාදුන් ඔහුගේ බාප්පාගේ පුතා මොහුය.

මගේ කුතුහලය වැඩිවිය.

"මෙතැන මොනවද හිටවන්නේ?"

ඔහු හොර රහසේ කළ ක්‍රියාව මා දුටු හෙයින් ඔහු ලැජ්ජාවට හා අධෛර්යට පත්විය.

"මුකුත් නෑ. මේ මල් ඇට වගයක්."

මම පුදුමයට පත් වීමි. මොහු හිටවන්නේ කුමන මල් ඇට වර්ගයක්ද?

මෙය ඔහුගේ ඉඩමක්ද නොවේ. මෙහි ඇත්තේ සන කැලෑවකි. ඔහු කුමන ගසක බීජයක් මෙහි සිටවනු ඇද්ද. එයින් ඔහුට අත්වෙන වාසිය කුමක් ද? මම ඒ ගැන ඔහුගෙන් විමසුවෙමි.

"එක එක විදිහේ මල් ඇට ජාති තියෙනවා සර්. මං පූර්ණියා වලදී දැක්ක එක සුදු මහත්තයෙකුගේ වත්තේ රටින් ගෙනැවිත් පැළ කරපු අපූරු මල් වැලක් තියෙනවා. ඒකේ ලස්සන රතු මල් පිපිලා තිබුණා. මං ඒ ජාතියේ මල් ඇට ටිකකුයි, තවත් එක එක විදියේ මල් ඇට ජාතියි, දුර ඉඳලා එකතු කරගෙන ගෙනාවා. මෙහේ කැලේ ඒ ජාතියේ මල් වැල් නෑ. ඒ හින්දයි මං ඒවා හිටෙව්වේ. මේවා පැළ වුනොත් අවුරුදු දෙකක් ඇතුළත පදුරු දාලා ලස්සනට හැදෙයි."

ගස් සිටුවීමේ පරමාර්ථය ගැන අසා මා තුළ ඔහු ගැන ගෞරවයක් ඇති විය. ඔහු ආත්මාර්ථය ගැන නොසිතා බොහෝ දුරකට පැතිරී ඇති වන භූමියේ සෞන්දර්‍යය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් තමාගේ මුදලත් කාලයත් වැය කොට ඇත. මෙය ඔහුට අයත් ඉඩමක්ද නොවේ. ඔහු කෙතරම් අමුතු කෙනෙක්දැයි මට සිතිණි.

මම යුගල් ප්‍රසාද් පසෙකට කැඳවාගෙන ගොස් ඔහු සමග ගසක් යට හිඳ ගතිමි.

"මං මීට ඉස්සරත් මේ වැඩේ කරලා තියෙනවා සර්. ලොබ්ටුලියාවේ ඔය තියෙන මල් ගස්, මල් වැල් මං අවුරුදු දහයකට දොළහකට ඉස්සෙල්ලා ගෙනාපු ඒවා. සමහර ඒවා පූර්ණියාවේ කැලෙන් ගෙනාපු ඒවා. කීපයක් දකුණු භගල්පුරේ, ලක්ෂ්මීපුර

කැලෙන් ගෙනාපු ඒවා. දැන් ඒවායේ මල් පිපිලා පළාතම මල් උයනක් වෙලා."

"මේ වැඩේට බොහොම කැමතියි වගේ."

"ලොබ්ටුලියාවේ කැලේ හරි අපූරු තැනක්අර පොඩි පොඩි කඳු ගැටවල පදුරුවල අලුතින් මල් පිපෙනවා දකින්න මං හුඟ දවසක ඉඳලා හරි ආසාවෙන් ඉන්නේ."

"මගේ හිත මේකට කොහොම යොමු වුනාද කියලා මං සර්ට කියන්නම්. අපේ ගෙදර තියෙන්නේ ධර්මිපුර පළාතේ. අපේ ගමෙන් හැතැප්ම විස්සක් විතර එහා කුඹී ගංගාව අයිනේ තැනකට මං පොඩි කාලේ මී හරක් දක්කාගෙන ගිහින් තියෙනවා. එහේ ඒ ජාතියේ මල් පිපිලා තියෙනවා මං දැක්කා. මං එහෙන් මල් ඇට ගෙනැල්ලා ගමෙක් හිටෙව්වා. දැන් අපේ ගමේ පාරවල් අයිනේ කැලෑ පදුරුවල, ගෙවල් පිටි පස්සේ තියෙන මුඩු බිම්වල, හාණ්ඩාරී මල් පිපෙනවා. එයින් පස්සේ එහෙම දේවල් කරන්න මගේ හිත යොමු වුණා. සමහර මල් වර්ග නැති පළාත්වලට ඒවා අරං ගිහිල්ලා හිටවන එක තමයි මගේ විනෝදාංශය. ජීවිතේ පුරාම මං මේ විදිහට ඇවිද්ද. මම ඒකට දැන් ඇබ්බැහි වෙලා."

යුගල් ප්‍රසාද් මේ පළාත් වනාන්තරවල පිපෙන වනමල් ගැන සහ වෘක්ෂලතාදිය ගැන හොඳින් දන්නා බව මට පෙනී ගියේය. ඔහු ඒ විෂය ගැන විශේෂඥයෙක් බවට කිසිම සැකයක් නැත.

"ඇරිස්ටොලෝකියා වැල ගැන දන්නවද?"

ඒ මල් වර්ගය කෙබඳුදැයි විස්තර කළ විට ඔහු මෙසේ කීය.

"ඔය කියන්නේ පරවිමල් වැල් ගැන වෙන්න ඕනෑ. අර පරවියෝ වගේ මල් පිපෙන්නේ. ඒවා මේ පැත්තේ නෑ. පැට්නාවල මහත්තුරුන්ගේ උයන්වල තියෙනවා."

ඔහුගේ දැනුම ගැන මම පුදුම වූයෙමි. මෙවැනි සෞන්දර්‍යය පුදන්නන් පහසුවෙන් මුණ ගැසීමට නොලැබේ. වනයෙන් වනයට ඇවිද මල් සිටුවීමෙන් ඔහුට ඇති ප්‍රයෝජනයක් හෝ එයින් උපයන මුදලක් හෝ නැත. ඔහු අන්ත දිළින්දෙකි. එසේ වුවත් ඔහු වනයේ සෞන්දර්‍යය සම්පත වැඩි දියුණු කිරීමෙන් වෙහෙසට පත් නොවෙයි. එයින් තමාට වාසියක් නැතැයි ඔහුගේ උනන්දුවත් පරිශ්‍රමයත් මඳක් වත් අඩු නොවෙයි.

"සරස්වතී වැව ළඟ තියෙන කැලේ වගේ කැලයක් මේ පළාතේ වත් නෑ මහත්තයා. කොච්චර ගස් වැල් ජාති මෙහේ තියෙනවද?

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

වැවේ ලස්සන බලන්න. මෙහේ නෙළුම් පැළ කළොත් පැළවේවි කියලද මහත්තයා හිතන්නේ. ධරම්පුරේ පැත්තේ පිටිසර ගම්වල පොකුණුවල නෙළුම් තියෙනවා. මං හිතාගෙන ඉන්නේ නෙළුම් අල ගෙනැල්ලා පැළ කරන්න.

මේ කාර්යයේ දී ඔහුට උදව් වීමට මම සිතා ගත්තෙමි. අප දෙදෙනා එකතු වී අසල වූ වනාන්තරය නා නා විධ අලුත් වන මලින් සරසන්නට ඉටා ගත්තෙමු. එයින් පසු එය නොකර බැරි තරමට මාද එයට ඇබ්බැහි විය. යුගල ප්‍රසාද්ට හරි හැටි කෑමක් බීමක් පවා නොලැබෙන බවත් ඔහුගේ පවුලේ අයද දුක් විඳින බවත් මම දැන සිටියෙමි. මම ප්‍රධාන කාර්යාලයට ලියා ආජමාබාද් කාර්යාලයේ ලිපිකාර රැකියාවක් ඔහුට ලබා දුනිමි.

ඒ වසරේ මම කල්කටාවෙන් විදේශීය වන මල්වල බීජ පැකැට්ද කඳු පළාතකින් වල් පිච්ච අතුද ගෙන අවුත් සරස්වතී වැව අවට වනයේ සිට වූයෙමි. යුගල් ප්‍රසාද්ගේ උනන්දුව හා සතුට පෙරටත් වඩා වැඩි විය. ඒ ගැන ඇති උනන්දුව හා සතුට කාර්යාලයේ අයට නොපෙන්වන ලෙස මම ඔහුට අවවාද කළෙමි. ඔහු පිස්සකු යයි කාර්යාලයේ අය සිතනු ඇත. මාද ඊට ඇඳන්නට ඔවුන් අමතක නොකරනු ඇත. ඊළඟ වසරේ වැස්ස ලැබුණු විට අප පැළ කළ ගස් වැල් පුදුම අන්දමින් වැඩෙනු දක්නට ලැබිණ. වැව අයිනේ පස ඉතා සරුසාර විය. අප පැළ කළ ගස්වැල් ඒ පළාතේ දේශගුණයට ගැලපෙන ඒවා විය. කල්කටාවෙන් ගෙන ආ මල් ඇට පැකට්වලින් සමහරක් පමණක් පැළ වූයේ නැත. ඒ හැම පැකැට්ටුවකම මල්වල නමද මල් ගැන කෙටි විස්තරයක් ද අඩංගු විය. පාටක් පෙනුමක් ගැන විස්තර කියවා හොඳ ඒවා තෝරමින් ඒවා පැළ කළෙමි. ඒ අතර 'වයිට් බිම්' 'රෙඩ් කැම්පියන්' සහ 'සිව්වර්ට් ' අසාමාන්‍ය ලෙස වැඩෙන්නට විය. 'පොක්ස් ග්ලෝව්' සහ 'වුඩ් ඇනිමොන් ' ද සාමාන්‍ය ලෙස වැඩෙන්නට විය. එසේ වුවත් බොහෝ මහන්සි ගත්තත් 'ඩග් රෝස් ' සහ 'හනිසකල්' පැළ කර ගැනීමට නොහැකි විය.

කහ පැහැති ධාතුයා මල් පැළ ටිකක් වැව අයිනේ පැළ කළෙමි. ඉක්මනින් එහි මල් පිපෙන්නට විය. යුගල ප්‍රසාද් පූර්ණියාවේ කැලෑවෙන් බොයිරා මල් වැල්වල බීජ ගෙනැවිත් තිබිණ. පැළ හටගෙන මාස හතක් පමණ ගතවූ පසු අසල වූ පදුරු දක්වා ඒ වැල් පැතිරී ගොස් තිබෙනු දක්නට ලැබිණ. බොයිරා ලතාවේ මල් දැකුම්කලු මෙන්ම සුවඳවත්ද විය.

හේමන්ත කාලය ළඟා වීමට පෙර දිනක බොයිරා ලතාවල සිය ගණනක් මල් කැකුළු හටගෙන ඇති බව දුටු මම යුගල ප්‍රසාද්ට ඒ බව දැන් වූයෙමි. ඔහු ලිවීම අතහැර දමා ආජමාබාද් කාර්යාලයේ සිට සැතපුම් අටක් ඈතින් වූ සරස්වතී වැව අසලට දුවමින් අවුත් ළඟා විය.

"මිනිස්සු කිව්වා සර්, බොයිරා වැල් මෙහේ පැළ කළත් මල් පිපෙන්නේ නෑ කියලා. ඒ වුනාට බලන්නකෝ මල් කැකුළු තියෙන තරම්."

'වයිට් ක්‍රොප්ට්' නම් වූ ජලජ පැළෑටියක අල ගෙනවුත් වැවේ පැළවීමට හැරියෙමි. ඒවා ඉක්මනින් පැළවී වැඩෙන්නට වූ විට යුගල ප්‍රසාද් බිය වූයේ නෙළුම් මල්වලට ඇති තැන ඒ පැළෑටි අත්පත් කර ගනු ඇතැයි කියාය.

බෝගන්විලා අතු ගෙනවිත් වනයේ පැළ කිරීමට සිතුණත් ඒ මල් වර්ගය නගරයේ කෘත්‍රිම උද්‍යාන සමග කෙතරම් බැඳී ඇද්දැයි කිවහොත් මට බියක් ඇති වූයේ වැව අසල දිස්වූ වන සිරියට එයින් හානියක් සිදුවනු ඇතැයි කියාය. යුගල ප්‍රසාද් ද මෙවැනි දේ ගැන සිතන්නේ මා සිතන පරිදිමය. ඔහුද බෝගන්විලා පැළ කිරීමට විරුද්ධ විය.

මේ සඳහා මගෙන් වියදම් වූ මුදලද සුළු පටු නොවේ. කාරෝ නදියේ එගොඩ ඉවුරේ ජයන්ති පර්වතය පිහිටි වනාන්තරයේ අමුතු ආකාරයේ මල් වර්ගයක් පිපෙන බව දිනක් ගනෝරි තේවාරි කියනු ඇසිණ. ඒ පළාතේ ඒ. මල් හඳුන්වන්නේ 'දූඹියා මල්' යනුවෙන්. කහ ශාකයේ වැනි කොළ ඇති ඒ ගස් රියන් දෙක තුනක් උසට වැඩේ. එක ගසක රිකිලි හතරක් පහක් හටගෙන ඒ හැම රිකිල්ලකම කහ පාට මල් හතරක් පිපේ. ඉතා සුන්දර පෙනුමක් ඇති ඒවා මිහිරි සුවඳින් ද යුක්ත වන අතර රාත්‍රියේ දී බොහෝ ඈතට සුවඳ විහිදුවයි. ඒවා පැළ කළ විට ඉතා ඉක්මනින් පදුරු දමා වසර දෙක තුනක් යන විට සන සැරේට වැඩෙනු ඇතැයි ඔහු කීවේය.

ඒ ගැන ඇසූ විට ඒ මල් පැළ ගෙනෙන තෙක් මගේ සිතට සැනසීමක් නොවීය. ගනෝරි කීවේ වර්ෂා කාලයේ හැර අනෙක් කාලවල ඒවා පැළ නොවන බවයි. ඒවායේ අල ගෙනැවිත් පැළ කළ යුතු බවද හොඳින් ජලය නොලැබුණොත් පැළ මැරී යනු ඇතැයි ද ගනෝරි කීවේය.

මම මුදල් දී ඒවා ගෙන ඒමට යුගල් ප්‍රයාද්ව පිටත් කළෙමි. ඔහු බොහෝ අමාරුවෙන් ජයන්ති පර්වතය අසල ඝන කැලයෙන් අල කැබලි දහයක් දොළහක් පමණ එකතු කරගෙන ආවේය.

09

වසර තුනක් පමණ ගෙවී ගියේය.

මේ තුන් අවුරුද්ද අතුළත මා තුළද සැහෙන විපර්යාසයක් සිදු විය. ලොබ්ටූලියාවේ හා ආජමාබාද්හි වන සෞන්දර්‍යය මගේ දෑස්වල මායා අඳුන් තවරා මට නගරය ගැන අමතක කරවීය. ජනශූන්‍ය පරිසරයත්, තාරකා පිරුණු ආකාශයත් මා වසඟ කළ තරම කෙතරම් දැයි කිවහොත් කිසියම් අවශ්‍යතාවකට පැටිනාවලට ගොස් නැවතීමට සිදුවූ විට තාර දැමූ පාරවල් ඇති සීමාවෙන් මිදී ලොබ්ටූලියා බයිහාරයට ළඟා වන්නේ කොයි මොහොතේ දැයි සිතා මනස නොසන්සුන් වෙයි. යටිකුරු කළ පාත්‍රයක් වැනි ආකාශය යටින් තණ බිමෙන් තණ බිමට ද වනාන්තරයෙන් වනාන්තරයට ද ගමන් කරද්දී තාර දමා පිළියෙළ කළ මාර්ග හෝ ගඩොළින් තැනූ ගේ දොර හෝ හමු නොවේ. ඒ පරිසරයේ දී මෝටර් රථවල නළා හඬ ද නොඇසේ. රාත්‍රී නින්දේ දී ඈත වනාන්තරයේ සිට කෑගසන සිඟාලයින්ගේ හඬ සවන වැකේ.

විටෙක ගෝනුන් රැලක් කැලය මැදින් දිවයන හඬක් හෝ කුළු මීමකු නගන රළු හඬක් හෝ ඇසේ.

මගේ සේවා ප්‍රධානියන් නිතර නිතර මට ලිපි එවා විමසන්නට වූයේ මේ දිනවල ඉඩම් කොටස් කර මිනිසුන්ට බදු දීමට ක්‍රියා නොකරන්නේ මන්දැයි කියාය. මට පැවරුණු ප්‍රධාන කාර්‍යය්‍යක් වූයේ එය බව මම දැන සිටියෙමි. එසේ වුවත් මිනිසුන් පදිංචි කරවා එබඳු සුන්දර පරිසරයක් විනාශ කිරීමට ඉඩ දීමට මගේ සිත නොනැමෙයි. ඉඩම් බදු ගන්නා අය එසේ කරන්නේ ඒ ඉඩම් ගහ කොළින් සරසන්නට නොවේ. ඔවුන් ඒවා එළි පෙහෙලි කොට බෝග වර්ග සිටවනු ඇත. ගෙවල් දොරවල් තනා එහි පදිංචි වනු ඇත. හුදකලා සුන්දර තණබිම්, වනාන්තර, ජලාශ, පර්වත සහිත මේ පරිසරය ජනපදයක් බවට පත්වනු ඇත. එය ජනාවාස වනු දැක බියපත් වන

දෙව්දුව එක පිම්මට පලා යනු ඇත. මිනිසුන් මෙහි පැමිණ මේ මායාකාරී වන උයනේ වශී කරවන සුළු සෞන්දර්‍යය්‍ය මකා දමනු ඇත.

ඒ ජනපදය මට පැහැදිලිව මනසින් දැකිය හැක. පැටිනාවලට, පූර්ණියා හෝ මුංගේර්වලට යන විට එවැනි ජනපද මග දිගට හමුවේ. අපිරිසිදු සිරුරු ඇති මිනිසුන්ගේ මැටියෙන් තැනූ වාසස්ථානද ගොම ගොඩවල්ද එක් රැස් වූ කුනු රොඩු හා ගව ගාල් ආදියද මග යද්දී නෙත ගැටේ. කිළිටි රෙදි හැඳගත් ස්ත්‍රී පුරුෂයන්ද අඩ සඳ හැඩයේ වූ රිදී මාල පෙති පැළඳ ගත් දරු දැරියන්ද එහි දැකිය හැක. ළමයි දූවිලි සහිත පාරේ හිඳගෙන ක්‍රීඩා කරති. වටිනා සම්පතක් නැතිකරගෙන අප ලබන්නේ මොනවාද? මෙවැනි විශාල වූ බාධා බන්ධන රහිත, උද්යෝගය ඇති කරවනසුලු, සෞන්දර්‍යය්‍යමය වූ, වනාන්තරයක් රටකට සම්පතකි. වෙනත් රටක නම් මෙය ජාතික වනෝද්‍යානයක් කරනු ඇත. වැඩ කර වෙහෙසට පත්වූ නගරයේ මිනිසුන් වරින් වර මෙහි පැමිණ ස්වාභාවික පරිසරයේ උපකාරයෙන් තමාගේ මනස නැවුම් බවට පත් කරගෙන ආපසු යනු ඇත. දැන්නම් එවැන්නක් සිදු වීමට ඉඩක් නැත. ඉඩම් හිමියෝ තම ඉඩම් වගා සඳහා බදු නොදී නිකරුනේ තබා ගෙන සිටින්නේ නැත.

ඉඩම් හිමියාගේ වතුයාය කොටස් කර වගාව පිණිස මිනිසුන්ට බදු දීමේ වගකීම භාරගෙන මම මෙහි පැමිණියෙමි. මා ඒ වන සෞන්දර්‍යය්‍ය විනාශ කිරීමට පැමිණියත් මෙහි පැමිණි පසු ඒ අපූරු වන සුන්දරිය සමග ප්‍රේමයෙන් බැඳුණෙමි. මම ඉඩම් බදු දීමේ කාර්‍යය්‍ය ක්‍රමයෙන් කල් දමමින් සිටියෙමි. අශ්වයා පිට නැගී සෙවණැලිවලින් පිරුණු සවස් වරුවලද මුතු මෙන් බබලන සඳ එළිය ඇති රාත්‍රිවලද තනිව ඇවිදින්නට ගිය විට ඒ පරිසරය දකින විට මට හිතෙන්නේ මගේ දායකත්වය ඇතිවම පරිසරය විනාශ වී යනවා නොවේදැයි කියාය. සඳ එළිය වැටී උදාසීන බවක් පල කරන ගල් තලා සහිත හුදකලා තණ බිම නැමැති මායාකාරී සුන්දරිය මගේ සිත කෙසේ වසඟ කරගෙන ඇද්ද?

එසේ වුවත් මා කරන්නට පැමිණි කාර්‍යය්‍ය නොකර සිටීමට නොහැකි වනු ඇත. නවම් මස කෙළවරදී ඡටු සිං නම් රාජ්පුත් වරයෙකු පැමිණ අක්කර තුන්සිය ගණනක් බදු ගැනීමට ලියකියවිලි අත්සන් කළ විට මම දැඩි සාංකාවට පත්විමි. එතරම් බිම් ප්‍රමාණයක්

බදු දුන්විට වනයෙන් බොහෝ කොටසක් විනාශ වී යනු ඇත. ඔවුන් ඒ සුන්දර තුරු ලතාද තුරු වදුළුද, වන ගොමුද, අනුකම්පා විරහිත ලෙස කපා දමනු ඇත.

ඡටු සිං ඉඩම්වල ඇවිදින්නට පටන් ගත්තේය. මම ඔහුගේ ලියකියවිලි ප්‍රධාන කාර්‍යාලයට යවා වනය විනාශ කිරීම තරමක් හෝ ප්‍රමාද කිරීමට උත්සාහ කළෙමි.

දිනක් දහවල් වරුවක මම ලොබ්ටූලියා වනයට උතුරින් පිහිටි නාඨා බයිහාරයේ නිදහස් තණබිම මැදින් ගමන් කරමින් සිටියෙමි. පාර අයිනේ ගල් පොත්තක් මත කිසිවකු හිඳගෙන සිටිනු මට දකින්නට ලැබුණි. මම ඔහු අසලටම පැමිණ අශ්වයා නැවැත්වූයෙමි. එහි සිටි මිනිසාගේ වයස අවුරුදු හැටක් පමණ විය. කිළිටි ඇදුම් ඇඳ සිටි ඔහුගේ උරයේ ඉරී ගිය උතුරු සළුවක් විය.

පාළු තණ බිම අසල තනිව හිඳගෙන මොහු කුමක් කරනවාදැයි දැනගැනීමට මා තුළ කුතුහලයක් ඇතිවිය.

"මේ මහත්තයා කවුද? " ඔහු ඇසුවේය.

"මං මේ ළඟ ඔපීස් එකේ වැඩ කරනවා."

"ආ. මේ මැනේජර් මහත්තයද?"

"ඇයි? මොකක් හරි උවමනාවක් තියෙනවද? මං තමයි මැනේජර්."

මිනිහා නැගිට දෑත් ඔසවා මට ආචාර කළේය.

"සර් මගේ නම මටුකනාථ පාංඩේ. මම බ්‍රාහ්මණයෙක්. තමුන්නාන්සේ මුණ ගැහෙන්න කියලා තමයි ආවේ.

"ඒ මොකටද?"

"මං හරි දුප්පත් සර්. හුහක් දුර ඉඳලා පයින් එන්නේ සර් ගැන අහලා. දවස් තුනක් ඉඳලා පයින්මයි ආවේ. තමුන්නාන්සේගේ උදව්වෙන් ජීවත් වෙන්න මාර්ගයක් හොයා ගන්න කියලා හිතාගෙනයි ආවේ."

"මේ කැලෑ පාරේ එද්දී දවස් තුනක් තිස්සේ කෑවේ මොනවද?"

මටුකනාථ ඔහුගේ කිළිටි උතුරු සළුවේ කොනක ගැට ගැසූ බදින ලද කව්පි ඇට ටිකක් පෙන්වීය.

"මං කව්පි ඇට ටිකක් අරගෙනයි ගෙදරින් ආවේ. එයින් ටික ටික තමයි මගදි කෑවේ. මං හුහ දවසක ඉඳලා රස්සාවක් හොය හොයා ඇවිදිනවා සර්. කව්පි ඇට ටික ඉවර වෙන්නත් ළඟයි. ආයිත් කන්න දෙයක් හොයලා දෙන එක දෙවියන්ට බාරයි."

ආජමාබාද් සහ නාඨා බහිහාරයේ ජනශූන්‍ය තණබිම ඔස්සේ, උතුරු සළුවේ ධාන්‍ය ටිකක් ගැට ගසාගෙන මොහු කුමන රැකියාවක් බලාපොරොත්තුවෙන් පැමිණියාදැයි මට තේරුම් ගත නොහැකි විය.

"හගල් පූර්, පූර්ණියා, පැටිනා, මුංගේර් වගේ තැන්වලට යන්නේ නැතිව මේ කැලේට ආවේ මොකටද පාංඩේ ජී? මෙහේ ඇවිත් මොනවා කරන්නද? මෙහේ මිනිස්සු ඉන්නවද? පාංඩේ ජීට මොනවා දෙන්නද?"

මටුකාථ මගේ මුහුණ දෙස බලාපොරොත්තු කඩ වූ විලාසයෙන් බැලුවේය.

"මෙහේ රස්සාවක් හොයා ගන්න ලැබෙන්නේ නැද්ද මහත්තයා? මං කොහේ යන්නද? අර කිව්ව ලොකු නගරවල මං අඳුනන කව්රුවත් නෑ. මං ඒ වගේ පාරවල් දන්නේ නෑ. මං එහේ යන්න බයයි. ඒ හින්දයි මෙහේ ආවේ."

ඔහු දුකට පත් අසරණ අහිංසක මිනිසෙකු යැයි මට තේරුම් ගියේය. මා ඔහු කාර්‍යාලයට කැඳවාගෙන ගියෙමි.

ටික දිනක් ගත විය. මටුකනාථට වැඩක් සොයා දීමට මට නොහැකි විය. ඔහු කිසිම වැඩක් කිරීමට දැන සිටියේ නැත. ඔහු තරමක් දුරට සංස්කෘත භාෂාව ඉගෙන ගෙන ඇති නිසා බ්‍රාහ්මණ ගුරුවරයෙකු ලෙස ආගමික ග්‍රන්ථ ඉගැන්වීමට හැකියාවක් තිබෙන බව නම් මට පෙනී ගියේය. ඔහු කුඩා පාසලක උගන්වා ඇත. ඔහු මා අසල හිඳගෙන වේලාවේත් අවේලාවේත් ශ්ලෝක කියවන්නට වූයේ මගේ ආස්වාදය සඳහා එය හේතු වේ යැයි සිතාගෙනය.

ඔහු දිනක් මට මෙසේ කීවේය.

"මට ඔපීස් එක ළඟ පොඩි ඉඩම් කැල්ලක් දෙන්න සර්. සංස්කෘත උගන්වන්න ඉස්කෝලයක් දාන්න."

"ඉස්කෝලයක් දාලා කාට උගන්වන්නද පණ්ඩිත් ජී. කුළු මීමුන්ටයි, ගෝනුන්ටයි පාඩම් කියා දුන්නට, රුසු වංශය කියෙව්වට තේරුම් ගන්න පුළුවන් ද?"

මටුකනාථ ඉතා අහිංසක කෙනෙකි. ඔහු වැඩි දුර හිතන්නේ මතන්නේ නැතිව සංස්කෘත පාසලක් ආරම්භ කිරීමට උත්සාහ කරයි. මා සිතුවේ මා කියූ දෙය අසා එය නිශ්ඵල දෙයක් බව ඔහු තේරුම් ගනු ඇතැයි කියාය. එසේ නමුත් ටික දිනක් නිහඬව සිට ඔහු ඒ ගැන මට නැවත මතක් කළේය.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"අසරණ මට අනුකම්පා කරලා මට සංස්කෘත පන්තියක් දාන්න පිළියෙළ කරලා දෙන්න සර්. උත්සාහ කරල බැලුවම මක් වෙනවද? මේකත් නැති වුනොත් මං කොහේ යන්නද?"

මා වැටුණේ අසීරු තත්වයකටය. මොහු පිස්සෙකුදැයි මට සිතිණි. ඔහුගේ මුහුණ දෙස බැලුවිට අනුකම්පාවක් ඇතිවේ. ඔහුට ලෝකයේ ඇති කටුක බව ගැන නොතේරේ. ඔහු ඉතා අහිංසක, කිසිවක් හරි හැටි තේරුම් නොගන්නා කෙනෙකු වුවත් දැඩි විශ්වාසයක් හා සැක රහිත බවක් ඔහු තුළ ඇත. ඒ විශ්වාසය කවුරුන් කෙරෙහිදැයි මම නොදනිමි.

මා ඔහුට ඉඩමක් දීමට කැමති බවත්, රාජු පාංඩේ මෙන් එහි ගොවිතැනක් කරගෙන සිටිය හැකි බවත් මම පැහැදිලි කර කීවෙමි. මටුකනාථ යටහත් පහත්ව කීවේ ඔවුන්ගේ වංශයේ අය පරම්පරා ගණනක සිට බ්‍රාහ්මණ ගුරුවරුන් ලෙස වැඩ කළ බවත් ගොවිතැන් ගැන කිසිවක් නොදන්නා බවත් ඒ නිසා ඉඩම් ලබාගෙන පලක් නොවන බවත්ය.

ධර්මය ඉගැන්වීමේ නිරත වන පණ්ඩිත ගුරුවරයෙකු මෙවැනි පරිසරයකට ආවේ මැරෙන්නටදැයි ඇසීමට හැකියාවක් තිබුණත් ඔහුට රළු වදනක් කීමට සිත නැමුනේ නැත. මට ඔහුව ඉතා ප්‍රිය විය. අන්තිමේදී ඔහු විසින් නැවත නැවත කරන ලද ඉල්ලීම නිසා කායශ්‍යාලය අසල කුටියක් තැනවූයෙමි.

"මෙන්න මටුකනාථජීගේ ඉස්කෝලේ. දැන් බලමු ඉගෙන ගන්න ගෝලයෝ එයිද නැද්ද කියලා."

මටුකනාථ පූජාවක් පවත්වා බ්‍රාහ්මණයින් දෙතුන් දෙනෙකුට දානයක් දී පාසල විවෘත කළේය. ඒ දුෂ්කර පළාතේ විශේෂ දානයක් පිළියෙළ කර ගැනීමට අවශ්‍ය දේ නොලැබේ. ඔහු තමාගේ අතින්ම පිටි අනා පූරි සාදා වන ධුංධුල්වලින් තැනූ හොද්දක් පිළියෙළ කළේය. ඔහු ඊට පෙර මී ගව ගාලකින් මී කිරි ගෙන අවුත් මුදවාපු කිරි සාදා තබාගෙන සිටියේය. ඔහු දනට ආරාධනා කළ බ්‍රාහ්මණයින් අතර මම ද සිටියෙමි.

පාසල විවෘත කර ටික දිනක් යනතුරු මටුකනාථ ඉතා සතුටින් සිටියේය. ලෝකයේ මෙවැන්නන් දැකිය හැක්කේ කලාතුරකින් යයි මට සිතුණි.

උදැසන ස්නානය කොට පැමිණ, ඉදි කොළවලින් වියූ පැදුරක හිඳගන්නා ඔහු පොතක් දිග හැර සංස්කෘත සූත්‍ර සජ්ඣායනය

කරයි. ඔහු එසේ කරන්නේ තමා ඉදිරියේ සිටින කෙනෙකුට උගන්වන පරිද්දෙනි. ඔහු උස් හඬින් කියවන දේ කායශ්‍යාල කාමරයේ වැඩ කරන මට ද ඇසේ. ඒ අසන සජ්ජන් සිං නම් බදු එකතු කරන්නා මෙසේ කියයි.

"පණ්ඩිත්ජී අමු පිස්සෙක්, බලන්න සර් කරන දේ."

මාස දෙකක් මේ අන්දමින් ගෙවී ගියේය. මටුකනාථ ශිෂ්‍යයින් නැති පාළු කුටියේ හිඳ උනන්දුවෙන් යුතුව පාසලේ වැඩ කටයුතු පවත්වා ගෙන යන්නට විය. විටෙක උදැසනද විටෙක සන්ධ්‍යාවේද ඔහුගේ හඬ ඇසේ. මේ අතර සරස්වතී දේවිය පුදන දිනය පැමිණියේය. හැම වසරේම කායශ්‍යාලයේ මේ උත්සවය පවත්වනු ලැබේ. වෙන තැන්වල මෙන් මේ වන පෙදෙසේ ප්‍රතිමා නෙළීමට සිටින්නේ කවුරුද? මටුකනාථ තමාගේ පාසලේ දී ප්‍රතිමාවක් තනා වෙනම පූජාවක් පවත්වන්නට යන බව මට අසන්නට ලැබිණ. වයස අවුරුදු හැටක් සම්පූර්ණ කළද ඔහුගේ උනන්දුව කෙතරම් වීද? ඔහු තැනූ කුඩා ප්‍රතිමාව බැලීමට මා ගිය විට ඔහු සිනාමුසු මුහුණින් යුතුව කථා කළේය.

"මහත්තයෝ, මේක අපි පරම්පරා ගණනක ඉඳලා පවත්වා ගෙන එන දෙයක්. අපේ තාත්තාත් හැම අවුරුද්දේම මේ පූජාව පවත්වන හැටි මං පොඩි කාලෙ ඉඳලම දැකලා තියෙනවා. මේ පාර මගේ ඉස්කෝලෙත්....."

මොහු පාසලක් ගැන කථා කරතත් පාසල ඇත්තේ කොහේදැයි කීවේ නැත.

සරස්වතී පූජාවට දින දහයකට දොළහකට පමණ පසු මටුකනාථ පැමිණ තමාගේ පාසලට ශිෂ්‍යයකු ඇතුළත් වූ බව මට දැන්වීය.

මටුකනාථ තමාගේ ශිෂ්‍යයා මා ඉදිරියට කැඳවාගෙන ආවේය. අවුරුදු දාහතරක් හෝ පහළොවක් පමණ වූ කාලවර්ණ, කෙට්ටු සිරුරක් ඇති, ඉතා දිළිඳු, මෛථිලී බ්‍රාහ්මණ පවුලක ළමයෙකු වූ ඔහුට ඇඳ සිටි වස්ත්‍රය හැරෙන්නට වෙනත් ඇඳුමක්වත් තිබුණේ නැත.

මටුකනාථගේ උනන්දුව බලන්නට වටිනා එකක් විය. තමාටද කෑම බීම සපයා ගැනීමට නොහැකිව තිබියදී ඔහු ශිෂ්‍යයා පෝෂණය කිරීමටද බාර ගත්තේය. ඔහුගේ කුල සිරිත එය විය. පාසලේ ශිෂ්‍යයින් නැති අඩුව බොහෝ දිනකට පසුව පිරිමැසුණු බැවින් ද ඉගෙනීමේ

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

ආශාවෙන් පැමිණි බැවින් ද ඔහුව ආපසු හරවා යැවීමට මටුකනාථට නොහැකිය.

මාස දෙකක් ඇතුළත තවත් ශිෂ්‍යයින් දෙතුන් දෙනෙකු පාසලට ඇතුළත් වූ බව මම දුටුවෙමි. ඔවුන් කෑම ගත්තේ වේලක් ඇර වේලක් වශයෙනි. වත්තේ සේවය කරන ආරක්ෂක හටයෝ ඉරිහු, වීන තණහාල්, පිටි ආදිය සම්මාදම් දී උපකාර කළහ. මම ද ඔවුන්ට තරමක් උපකාර කළෙමි. ළමයි කැලයෙන් නිවිති කොළ රැගෙන ආහ. සමහර විට දිනකට එක වේලක් ඔවුන් ඒවා තම්බා කන්නට ඇත. මටුකනාථගේ තත්වය එබඳු විය. රාත්‍රි එකොළහ දොළහ වනතුරු පාසල ඉදිරිපිට වූ අරළු ගසක් යට හිඳගන්නා මටුකනාථ ළමයින්ට ඉගැන්වූයේය. විටෙක අඳුරේ ද විටෙක සඳ එළියේ ද ඔහු ළමයින්ට ඉගැන්වීය. තෙල් නැති කම නිසා රාත්‍රියට පහන් දැල්වූයේ නැත.

මටුකනාථ තුළ වූ එක් විශේෂ ගති ගුණයක් දැක මම පුදුමයට පත්වූයෙමි. ඉඩම් කොටසක් ලබාගෙන එහි පාසලක් සාදවා ගැනීමට අමතරව ආර්ථික වශයෙන් වෙන කිසිම උපකාරයක් ඔහු මගෙන් ඉල්ලුවේ නැත. තමාට මෙය කරගෙන යාමට අපහසු නිසා ඒ සඳහා උපකාර කරන්නට යයි ඔහු මට කීවේ නැත. ඔහු තමාගේ අපහසුකම් වෙන කිසිවෙකුට පැවසුවේ නැත. සේවක හටයින් උපකාර කළේ ද සිය කැමැත්තෙනි.

වෙසක් මාසයේ සිට බිනර මාසය වන විට මටුකනාථගේ ගෝලයින් සංඛ්‍යාව ඉහළ නැංගේය. පියා විසින් එළවන ලද, මව විසින් ඉගෙන ගන්නට යයි පෙරැත්ත කොට එවන ලද, ළමයි වැඩි මහන්සියක් නොමැතිව කෑම ලැබෙන නිසා නොයෙක් දෙසින් පැමිණ පාසලට එකතු වුහ. ළමයින් දෙස බැළූ විට පෙනී යන්නේ ඔවුන් කලින් මී හරකුන් බලාගන්නට ඇති බවය. කිසිවෙකුගේ මුහුණක බුද්ධියේ ප්‍රභාවක් සුළු වශයෙන්වත් දකින්ට නොවීය. මටුකනාථ කාව්‍ය, ව්‍යාකරණ ආදිය උගන්වන්නේ මොවුන්ටදැයි මට සිතිණ. ඉගැනීමේ මුවාවෙන් ඔහු වැනි අහිංසක මිනිසෙකු රවටා කෑම බීම ලබා ගැනීමට මොවුන් පැමිණ ඇත. මටුකනාථට ඒ ගැන අවධානයක් නැත. ඉගැන්වීමට ශිෂ්‍යයින් ලැබීම නිසා ඔහු ඉමහත් සතුටට පත්වී සිටියි.

පාසලේ ශිෂ්‍යයින්ට කෑමට කිසිවක් නොමැති හෙයින් නිරාහාරව සිටින බව මට දිනක් ආරංචි විය. නිරාහාර වූවන් අතර මටුකනාථද විය.

මම ඔහුව ගෙන්වා ඒ ගැන විමසූ විට ඒ කතාව ඇත්තක් බව දැනගනිමි. වත්තේ ආරක්ෂක හටයින් සම්මාදන් කර ලබා දුන් ඉරිහු හා ධාන්‍ය සියල්ල අවසන් වී ඇත. කීප දිනක් ම රාත්‍රියට ගෙන ඇත්තේ තැම්බූ නිවිති කොළය. මේ වනවිට ඔවුන් ඒවා කෑමට ගන්නේ ද නැත. වැඩි දෙනෙකුට නිවිති කොළම තම්බා කෑමෙන් අසනීප වී ඇත.

"දැන් මොකද කරන්නේ ඉස්කෝලේ මහත්තයා?"

"මට මොකුත් හිතා ගන්න බෑ සර්. පොඩි එවුන් ටික බඩගින්නේ හිටියොත්....."

මම ඔවුන් හට දෙතුන් දිනක් සඳහා හාල්, පිටි, පරිප්පු, සහ ගිතෙල් ලබා දීමට කටයුතු කළෙමි.

"ඉස්කෝලේ නිකං පවත්වගෙන යන්නේ කොහොමද ඉස්කෝලේ මහත්තයා? ඕක නවත්තල දාන්න. තමුන් කන්නෙ මොනවද? හැමදාම ළමයින්ට කන්න දෙන්නෙ මොනවද?" මම කීවෙමි.

මගේ කතාවෙන් ඔහු කනස්සල්ලට පත් වූ බව පෙනී ගියේය.

"එහෙම කරලා කොහොමද සර්? හදා ගත්ත ඉස්කෝලේ අත ඇරලා දාන්න පුළුවන් ද? මේ අපේ පරම්පරාගත රස්සාවනේ."

මටුකනාථට මේවා තේරුම් කර දිය නොහැක. ඔහුට ඉගැන්වීමට ශිෂ්‍යයින් ටික දෙනෙකු ලැබී තෘප්තිමත්ව සිටින බව මම දුටුවෙමි.

මටුකනාථට පින් සිදු වන්න අපේ වත්තෙන් කොටසක් තාපස ආශ්‍රමයක සිරියක් ඉසිළුවේය. පාසලේ ශිෂ්‍යයෝ මහ හඬින් පාඩම් කියවූහ. අවබෝධයක් නොමැතිව ශ්ලෝක සජ්ඣායනා කළහ. මේ අතර ඔවුහු කායශාලයේ රාක්කවලින් පළතුරු සොරකම් කළහ. මිදුලේ ඇති මල් ගස්වල අතු කඩා බිඳ දමමින් මල් කඩාගෙන ගියහ. සමහර අවස්ථාවලදී ඔවුහු කායශාල සේවකයින්ගේ බඩු මුට්ටුද සොරකම් කළහ. කුමක් හෝ නැතිවූ විට ආරක්ෂක හටයින් කියන්නට වූයේ එය පාසලේ ළමයින්ගේ වැඩක් බවය.

දිනක් බදු එකතු කරන්නකු මුදල් පෙට්ටිය නොවසා මඳකට කාමරයෙන් පිටවී ඇත. ඒ අතර තුර පැමිණි කවුරුන් හෝ මුදල් වලින් කොටසක් හා ඔහුගේ රන් මුදුව සොරකම් කරගෙන ගොස් ඇත. ඒ ගැන හටයින් අතර සැහෙන කලබගෑනියක් ඇති විය. මටුකනාථගේ එක් ශිෂ්‍යයෙකු ළඟ තිබී කීප දිනකට පසු මුද්ද හමු විය. ශිෂ්‍යයා එය ඉන පටියේ බැඳගෙන සිටිනු දුටු කෙනෙකු කායශාලයට පැමිණ කී පසු බඩුත් සමග හොරා අල්ලා ගන්නා ලදී.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මම මටුකනාථට එන්නට යයි පණිවිඩයක් යැව්වෙමි. ඔහු සත්‍ය වශයෙන් ම අහිංසකයෙකි. ඔහුගේ හොඳ කමින් ප්‍රයෝජන ගත් තක්කඩි ශිෂ්‍යයෝ තම තමන්ට රිසි සේ හැසිරුණහ. මා ඔහුට කිවේ පාසල වසන්නට උවමනාවක් නැතත් ශිෂ්‍යයින් කීප දෙනෙකු පාසලෙන් අස් කළයුතු බවය. ඉතිරි අය මා ලබා දෙන ඉඩම් කොටසේ තමන්ගේ ඩහදිය මහන්සියෙන් වැඩ කර ඉරිහු, වීන තණහාල් සහ ඵලවළු ආදිය වවා ජීවත් විය යුතු බවත් මම ඔහුට දැන්වූයෙමි. එයින් ලබා ගන්නා අස්වැන්නෙන් ඔවුන්ට ජීවිතය පවත්වා ගෙන යා හැකි බවත් මම පැවසුවෙමි.

මටුකනාථ මේ යෝජනාව ගැන ශිෂ්‍යයින්ට දැන්වූයේය. ශිෂ්‍යයින් දොළොස් දෙනෙකු අතරින් අට දෙනෙකු එය ඇසූ විටම පලා ගියහ. ඉතිරි වූයේ හතර දෙනෙකු පමණි. මා සිතන්නේ ඔවුන්ද නැවතුණේ ඉගෙනීමට ඇති ආශාව නිසා නොව වෙන කළ හැකි දෙයක් නොමැති බැවිනි. කලින් කී පරිදී මී හරකුන් බලාගත් ඔවුන්ට දැන් ගොවිතැන් කිරීමට සිදු වී ඇත. මටුකනාථ ඉන්පසු අපහසුවක් නොමැතිව පාසල පවත්වා ගෙන යන්නට විය.

ජටුසිංට සහ වෙනත් අයට ඉඩම් බෙදා දෙන ලදී. අලුතින් බෙදා දුන් ඉඩම් ප්‍රමාණය අක්කර පන්සියයක් පමණ විය. නාඨා බයිහාරයේ පොළොව බොහෝ සරු සාර නිසා ඒ හරියේ ඉඩම් සියල්ල එකවර බෙදා දීමට සිදුවිය. තණබිම් කෙළවරවූ වනය ඉතා ශෝභා සම්පන්න විය. කීප දිනක් සවස් කාලයේ අශ්වයා පිටින් එද්දී මට සිතුණේ නාඨා බයිහාරයේ ඒ වනාන්තරය රට තුළ තැබූ 'බියුටි ස්පොට්' එකක් බවය. එය දැන් මැකීගෙන යයි.

වනාන්තරය ගිනි තබා ඇති අයුරු මම ඈත සිට දුටුවෙමි. තරමක් හෝ ගිනි තැබුවේ නැත්නම් ඒ ඝන කැලෑව කපා දැමිය නොහැක. එනමුත් එහි එක දිගටම ලදු කැලෑව තිබුණේ නැත. දිගන්තය තෙක් විහිදුනු තණ බිමෙහි තැනින් තැන කැලෑ රොදවල් විය. ඒ අතර විවිධාකාර වෘක්ෂ ලතා හා වනමල් කෙතරම් විද?

'වට' 'පට' හඬින් වනය ගිනිගන්නා හඬ මට දුරට ඇසුණි. එහි තිබුණු ශෝභා සම්පන්න වූ ලතා මණ්ඩප කීයක් විනාශ වී ගොස් ඇද්දැයි මම ඇතින් හිඳගෙන කල්පනා කරන්නට විමි. සිතට වේදනාවක් දැනුණු නිසා මම ඒ දෙසට නොගියෙමි. මිනිසාට සදා කල්හිම සතුටක් ළභා කරවීමට සමත් වූ අපේ දේශයේ පිහිටි මෙතරම්

විශාල සම්පතක් ධාන්‍ය ටිකක් ලබා ගැනීම සඳහා විනාශ කිරීමට සිදු වී ඇත.

ඉල් මස මුල භාගයේ දිනක් මම ඒ ස්ථානය බැලීමට ගියෙමි. මුළු මිටියාවතම වගා කර තිබුණි. අතරින් පතර ගෙවල් තනා ඒවායේ මිනිස්සු පදිංචි වී සිටියහ. මිනිස්සු තමන්ගේ අඹුදරුවන්ද ගව මහීෂාදීන් ද රැගෙන අවුත් ඒ ප්‍රදේශය ජනපදයක් බවට පත් කර ගෙන සිටියහ.

සීත කාලය මැද අබ කෙත් කහ පැහැති මල් වලින් ආලෝක මත් වෙද්දී ඒ සමග සසඳන්නට හැකි වෙනත් දසුනක් නොවීය. අක්කර පන්සියක් ඈතට විහිදුණු මිටියාවත කහ පැහැති සළුවකින් වසා ඇතිසේය. ඒ අතර තුර බාධකයක් නැත. ඉන්ද්‍රනීල මාණික්‍යයක පැහැය ගත් ආකාශයට යටින්, පෙනෙන තෙක් මානයේ ඇත්තේ කහ පැහැයෙන් වැසුණු ධරණී තලයයි. මේ දර්ශනයත් නරක නැතැයි මට සිතුණි.

දිනක් මම නව ජනපදය බැලීමට ගියෙමි. ජටු සිං හැර අන් සියල්ලෝම දිළින්දෝ වූහ. ඔවුන් සඳහා රාත්‍රි පාසලක් විවෘත කිරීමට මට සිතුණි. අබ කෙත් අයිනේ දුව පැන ඇවිදින කුඩා දරු දැරියන් දුටු මගේ සිතට එවැනි අදහසක් ඇතුළු විය.

එසේ වුවද නව ජානපදිකයෝ ඉක්මනින් මහා කලබැගෑනියක් ඇති කළහ. ඔවුන් මඳක් වත් සාමකාමී අය නොවන බව මට පෙනී ගියේය. දිනක් මා කාර්‍යාලයේ සිටියදී, නාඨා බයිහාරයේ වැසියන් අතර දබරයක් හටගෙන ඇති බව මට දැනගන්නට ලැබිණ. ඉඩම් කෙළවර වූ බිම් තීරුව සඳහා හටගත් මතභේදයක් නිසා දබරය හටගෙන තිබුණි. අක්කර දෙකක් වගා කළ අය අක්කර හතරක අස්වැන්න අයිති කර ගැනීමට වෙර දැරූහ. අබ පැසෙන්නට ටික දිනකට පසු ජටු සිං තමාගේ ගම් පළාතේ සිට පොල්ලෙන් හා හෙල්ලෙන් සටන් කර පුරුදු රාජපුත්වරු රාශියක් හොරෙන් ගෙන්වා ගෙන සිටින බව ද මට ආරංචි විය. ඒ කුමක් සඳහාදැයි තේරුම් ගත හැක. තමාට අයිති අක්කර සිය ගණනෙන් ලැබෙන අස්වැන්නට අමතරව බලහත්කාරයෙන් මුළු නාඨා බයිහාරයේම අස්වැන්න අයිති කරගැනීමට ඔහු සැරසෙයි.

"මේ පැත්තේ සිරිත ඕක තමයි සර්. පොලු හරඹ පෙන්වන අයට තමයි අස්වැන්න ලැබෙන්නේ." කාර්‍යාලයේ නිලධාරීහු කීය.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

පොලු හරඹවල ශක්තිය පෙන්වීමට නොහැකි වූ සාමාන්‍ය මිනිස්සු කායශ්‍රීාලයට පැමිණ විස්තර කියා හඬා වැළපුනෝය. ඔවුහු අහිංසක දිළිඳු ගංගෝතා කුලයේ මිනිස්සු වූහ. ඔවුන් එක් එක්කෙනා අක්කර දෙක තුනක ඉඩම් ප්‍රමාණයක කැලය කපා ගොවිතැන් කළ අය වූහ. තමාගේ අඹු දරුවන් ද කැටිව ආ ඔවුහු ඉඩම් අයිතේ පැල්පත් තනාගෙන වාසය කළහ. දැන් ඔවුන්ගේ වසරක පරිශ්‍රමය බලහත්කාර කමට යට වී නිරර්ථක වීමට යයි.

මම කායශ්‍රීාලයේ හටයින් දෙදෙනෙකු එහි කුමක් සිදුවේදැයි බලාගෙන එන්නට පිටත් කර හැරියෙමි ඔවුන් ආපසු දිවගෙන අවුත් මට දැන්වූයේ හීමදාස් කොලනියේ බිහිසුනු දබරයක් හටගෙන ඇති බවය.

එවිටම බදු එකතු කරන සජ්ජන් සිං ඇතුළු හට පිරිසක් කැටුව මම සිද්ධිය වූ තැනට යාමට පිටත් වූයෙමි. දුර සිටම මහා කලබගෑනියක් ඇසෙන්නට විය. නාඝා බයිහාරය මැදින් කුඩා දොළ පාරක් ගලා බසියි. වැඩි කලබලයක් ඇසුනේ ඒ පැත්තෙන් ය.

දොළ අයිනට ගොස් බැලූ විට එහි ඉවුරු දෙපැත්තේ මිනිසුන් එක් රැස් වී සිටින බව දුටුවෙමි. එහා ඉවුරේ ජානපදිකයින් හැටක් හැත්තෑවක් පමණ ද මෙහා ඉවුරේ ජටූ සිංගේ පොලු සටන්කාර රාජ පුත්වරු තිහ හතළිහක් පමණ ද සිටියහ. එගොඩ සිටි අය මෙගොඩට පැමිණීමට උත්සාහ කළත් මෙගොඩ සිටි අය එයට බාධා කළහ. මේ අතර මිනිස්සු දෙදෙනෙක් තුවාල ලබා සිටියහ. ඔවුහු එගොඩ සිටි කණ්ඩායමට අයත් අය වූහ. ඔවුන් තුවාල වී දියට වැටුණු විට ජටූ සිංගේ මිනිස්සු එක් අයෙකුට පොරොවෙන් ගැසීමට උත්සාහ කළහ. මෙගොඩ සිටි අය ඔහුව ඔසවාගෙන ආහ. කෙනෙකු ගිලෙන තරම් ජල ප්‍රමාණයක් එහි විය. එය ශීත කාලය වූ බැවින් දැඩි සීතලක් ද විය.

අපේ කණ්ඩායම දුටු දෙපිරිසම දබරය නවත්වා ඉදිරියට ආහ. දෙපැත්තේම අය කතා කළේ මහා භාරතයේ යුධිෂ්ඨිර වැන්නවුන් ලෙසය. විරුද්ධ පිලේ අය දුර්යෝධන වැන්නවුන් ලෙස ඔවුහු හැඳින්වූහ. කලබැගෑනිය මැද කවුරුන් හරිදැයි කවුරුන් නිවැරදිදැයි තෝරා බේරා ගැනීම අපහසු කරුණක් විය. මම දෙපැත්තේම අයට කායශ්‍රීාලයට එන්නැයි කීවෙමි. තුවාල කරුවන් දෙදෙනෙකු සිටියත් ඔවුන්ගේ තුවාල එතරම් බරපතල ඒවා නොවීය. මම ඔවුන්ට ද කායශ්‍රීාලයට පැමිණෙන්නට යයි දැන්වූයෙමි.

ජටූ සිංගේ මිනිස්සු තමන් සවස් වරුවේ එන බව කීවෝය. දබරය ඇරඹුනේ යයි මා සිතා ගත්තත් ඒ වන විට මා ඔවුන්ගේ තරම හරි හැටි තේරුම් ගෙන නොසිටියෙමි. සවස් වන විට මට ආරංචි වූයේ කලහය නැවත ඇවිලී ඇති බවය. සැනපුම් පනහක් දුරින් පිහිටි නවගච්ඡියාවේ පොලිසියටද අශ්වාරෝහක පණිවිඩකරුවෙකු යවා මම නැවත කලහය සිදුවන තැනට ගියෙමි. ඔවුන් ඒ වනවිට දබර කරමින් සිටියහ. ජටූ සිංගේ පිරිස වැඩි වී තිබිණ. රාසබිහාරි සිං නමැති රාජපුත්වරයාද නන්ද ලාල් නමැති ගබඩාකාරයාද ජටූ සිංගේ සහාය පිණිස පිරිස් එවා ඇති බව මට දැනගන්නට ලැබිණ. ජටූ සිං එහි නොසිටියත් ඔහුගේ සොහොයුරෙකු වන ගජාධර සිං අශ්වයා පිට නැගී අවුත් මදක් ඇතින් සිටියේය. මා එනු දුටු ඔහු එතැනින් ඉවත් වූයේය. මෙවර රාජපුත්වරුන් දෙදෙනෙකු අත තුවක්කු තිබෙනු මම දුටුවෙමි.

එගොඩ ඉවුරේ සිට රාජපුත්වරු කෑ ගසා මා ඇමතූහ.

"තමුන්නාන්සේ මෙතැනින් අයින් වෙන්න. අපි මේ ගංගෝතා වදුරොත් එක්ක මේක බේරා ගන්නම්."

මා කැටුව ගිය පිරිස මගේ කිමට දෙපිරිස අතර සිට ගත්හ. නවගව්යා පොලිසියට මා මේ කාරණය දැන්වූ බවත් මේ වනවිට පොලිසිය අතර මග එනු ඇති බවත් මම ඔවුන්ට දැන්වූයෙමි.

"ඔය තුවක්කු ගෙනාවේ මොකටද? තුවක්කු පාවිච්චි කළොත් අනිවාර්‍යයෙන් හිරේ යන්න වෙනවා. නීතිය හරි තදයි."

තුවක්කු අතින් ගත් මිනිසුන් දෙදෙනා මදක් පස්සට වූහ. මම එහා ඉවුරේ සිටි ගංගෝතා කුලයේ මිනිසුන් අමතා දබර කර ගැනීමට උවමනාවක් නැති බව කියා තම තමන්ගේ නිවෙස්වලට ආපසු යන ලෙස ඔවුන්ට දැන්වූයෙමි. මාද මගේ නිලධාරීන් හා හටයින්ද සිටින බැවින් කිසිවකුට ඔවුන්ගේ අස්වැන්න උදුරා ගැනීමට ඉඩ නොදෙන බව මම ඔවුන්ට පැවසුවෙමි.

ගංගෝතා කණ්ඩායමේ නායකයා මගේ කතාව ගැන විශ්වාසය තබා තමාගේ පිරිසත් සමග ඉවත්ව ගොස් මඳක් ඇතින් පිහිටි ගසක් යට සිට ගත්හ.

"ඔතන නවතින්න එපා. ගෙවල්වලට යන්න. දැන් පොලිසියෙන් එනවා." මම කීවෙමි.

රාජ්පුත්වරු එතරම් පහසුවෙන් අවනත වන අය නොවූහ. ඔවුහු කුමක්දෝ කරුණක් ගැන එකිනෙකා සමග සාකච්ඡා කරන්නට වූහ. මම සජ්ජන් සිං ඇමතුවෙමි.

"සජ්ජන් සිං මේ ගොල්ලෝ මොකද්ද කරන්න හදන්නේ. අපටත් පහර දෙයිද දන්නේ නෑ."

"සර්, අර නන්දලාල් කියන ගබඩාකාරයා මේකට ගෑවිච්චි එක තමයි බය. ඕකා මහා තක්කඩි පල් හොරෙක්."

"එහෙනම් ලෑස්ති පිට ඉන්න. කාටවත් ගහෙන් එගොඩට යන්න දෙන්න එපා. පැය දෙකක් විතර පාලනය කර ගත්තොත් ඇති. ඉන් පස්සේ පොලිසියෙන් එයි."

රාජ්පුත්වරු කතා බහ කොට කුමක් දෝ දෙයක් ගැන තීරණය කර ගන්නට ඇත. ඔවුන්ගෙන් කීප දෙනෙක් අප ඉදිරියට පැමිණියෝය.

"සර් අපි එගොඩට යනවා."

"ඒ මොකටද?"

ඇයි අපට ඒ පැන්තේ ඉඩම් නැද්ද?"

"පොලිසියෙන් ආවම ඒක කියලා බේරා ගන්නවා. පොලිසිය එනකල් තමුසෙලාට එහා පැත්තට යන්න දෙන්න බෑ."

"අපි එස්ටේට් එකට සල්ලි ගොඩක් දීලා ඉඩම් බදු ගත්තේ පාඩු විඳින්නද? සර් ඇයි මෙහෙම අසාධාරණ කම් කරන්නේ?"

"ඒ කතාව පොලිසිය ආවහම කියනවා."

"එහෙනම් අපට එහා පැත්තට යන්න දෙන්නේ නෑ?"

"නෑ. පොලිසිය එනකල් යන්න දෙන්න බෑ. අපේ එස්ටේට් එකේ කෝලාහල කර ගන්න ඉඩ දෙන්න බෑ."

මේ අතරතුර වත්තේ සේවය කරන හටයින්ගෙන් තව පිරිසක් පැමිණ අපට එකතු වූහ. පොලිසිය මග එන බව ඔවුහු පැවසූහ. ජටු සිංගේ පිරිස ක්‍රමයෙන් එකා දෙන්නා බැගින් ඉවත් වන්නට වූහ. එදා කලහය සිංසිදුණත් වරින් වර ගුටි බැට දීම්, පොලිස් මැදිහත් වීම්, ඇන කොටා ගැනීම් සිදු වන්නට විය. දිනෙන් දින ඒ සිදුවීම් වැඩි වූවා මිස අඩු වීමක් නොවීය. ජටු සිං වැනි දාමරික රාජ් පුත්වරයෙකුට එකවර එතරම් විශාල ඉඩම් ප්‍රමාණයක් බදු දීමේ ප්‍රතිඵලයක් ලෙස මෙවැනි තත්වයක් උදාවූ බව මට තේරුම් ගියේය. මම දිනක් ජටු සිං කැඳවා මේ ගැන විමසුවෙමි. මේ ගැන තමා කිසිවක් නොදන්නා බවත් තමා වැඩි කාලයක් පිට සිටින බවත් ඔහු

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

කැඳවාගෙන ආ මිනිසුන් කරන දේ ගැන තමාට වගකිය නොහැකි බවත් ජටු සිං පැවසීය.

ඔහු ඉතා කපටි ප්‍රයෝගකාරයෙකු බව මට තේරුම් ගියේය. මෙවැන්නෙකු සමග කෙලින් කතා කොට වැඩක් නොවන හෙයින් ඒ සඳහා වෙනත් ක්‍රියා මාර්ගයක් සොයා ගත යුතුය.

එයින් පසු මම ගංගෝතා මිනිසුන් හැර වෙනත් කිසිවෙකුට ඉඩම් බදු දීම නවත්වා දැමුවෙමි. එසේ නමුත් කලින් සිදු වූ වැරැද්දට පිළියමක් යෙදීමට මට නොහැකි විය. නාඨා බයිහාරයේ සාමය සඳහටම මැකී ගියේය.

සැතපුම් දොළහක් ඈතට විහිදුණු අපේ වත්තේ උතුරු පැත්තේ අක්කර පන්සියයක හයසියයක පමණ වූ ප්‍රදේශයක අලුතින් මිනිස්සු පදිංචි වූහ. දුරුතු මාසයේ අවසානයේ දිනක උවමනාවකට එහි යාමට මට සිදුවිය. ඔවුන් ඒ පළාතේ මුහුණුවර මුළුමනින්ම වෙනස් කර ඇති බව එහිදී ගිය විට මට පෙනී ගියේය.

වූලකියාවේ වනාන්තරය පසු කළ විට පෙනෙන තෙක් මානයේ වූයේ මල් පිපී ඇති අබ කෙත්ය. වම්පැත්ත, දකුණුපැත්ත, ඉදිරියෙන්ද සුවිශාල කහ ඇතිරිල්ලක් එලුවා සේ අබ කෙත් කහ මලින් සැරසී තිබිණ. කොතැනක වත් හිස් ඉඩක් නොතබා ඇත නිල්වන් පර්වත මාලාවෙන් සීමාවූ සක්වල වළල්ල දක්වා එය පැතිරී තිබිණ. සීත කාලයේ වලාකුළු රහිත නිල් අහස හිසට ඉහළින් පෙනෙන්ට විය. ඒ සුන්දර කෙත් යාය අතර තැනින් තැන මානා සෙවිලි කළ පැල්පත් විය. නිදහස් තැනිතලාවේ තැනූ පැල්පත්වල මේ කාලයේ පවතින දැඩි සීතල මැද ඔවුන් අඹු දරුවන් සමග කෙසේ වාසය කරනවාදැයි මම සිතුවෙමි.

අස්වනු නෙලා ගැනීමට වැඩි කාලයක් ඉතිරිව නොතිබිණ. මේ අතර නොයෙක් පළාත්වලින් කුළී වැඩ සඳහා කම්කරුවෝ එහි පැමිණෙමින් සිටියහ. ඔවුන්ගේ ජීවන රටාව අමුතුය. පූර්ණියා, තරායි, සහ ජයන්ති නමින් හැඳින්වෙන කඳු පළාත්වලින් ද උතුරු භගල්පුරයෙන්ද අඹු දරුවන් සමග ආ කම්කරුවෝ අස්වනු ලබා ගන්නා කාලයේ කුඩා පැල්පත් අටවා ගෙන නැවතී සිටිති. අස්වනු කැපීමට සහභාගි වන ඔවුහු අස්වැන්නෙන් කොටසක් කුලිය වශයෙන් ලබා වැඩ අවසන් වූ විට ඒ පැල්පත් අතහැර යති. ඊළඟ වසරේ ඔවුහු නැවත එති. ඔවුන් අතර නොයෙක් කුලවලට අයිති මිනිස්සු වූහ.

ඔවුන් ගෙන් වැඩි දෙනා ගංගෝතා කුලයේ අය වූ අතර ක්ෂත්‍රිය හා බ්‍රාහ්මණ කුලවල අය පවා ඒ අතර සිටියහ.

මේ පළාතේ සිරිත නම් අස්වැන්න ලබන විට කෙතටම ගොස් බදු එකතු කිරීමයි. එසේ නොකළහොත් ඒ දිළිඳු ජනයා කල් යන විට බදු ගෙවීමට අසමත් වෙති. බදු එකතු කර ගැනීම පිණිස මට ඵුල්කියා බයිහාරයේ කීප දිනක් නැවතී සිටීමට සිදු විය.

"සර්ට නවතින්න එහේ පොඩි කුඩාරමක් ගහලා දෙන්නද?" බදු එකතු කරන්නා ඇසුවේය.

"මට පොඩි පැලක් හදල දෙන්න."

"මේ සීතලේ සර්ට පැලක ඉන්න පුළුවන්ද?"

"එහෙම හොඳයි. පැලක් හදන්නකෝ."

මානා සෙවිළි කළ කුටි හතරක් එක ළඟ සාදවන ලදී. ඉන් එකක් මට නිදා ගැනීම පිණිස ද එකක් කෑම පිළියෙළ කිරීම පිණිස ද වෙන් කරන ලදී. අනිත් ඒවා හටයින් දෙදෙනෙකු හා බදු එකතු කරන්නෙකු සඳහා ද වෙන් විය. ඒ පැල්පත්වල දොර කවුළු වෙනුවට බිත්තියේ කපොල්ලක් සකස් කර තිබිණ. ඒවා වැසීමට පිළිවෙළක් නැත. රාත්‍රියට සීතල පින්න කුටිය තුළට වදියි. දොර වෙනුවට ඇති විවරය උස නැති නිසා කුටියට ඇතුළු විය යුත්තේ කොන්ද නමා ගෙනය. පොළොව මත ඝනකමට දිගු තණ කොළ අතුරා ඒ මත බුමුතුරුණු හා ඇතිරිලි එලා නිදා ගැනීමට පිළියෙළ කර තිබිණ. මගේ කුටිය දිගින් රියන් හතක් ද, පළලින් රියන් තුනක් ද විය. කුටිය කෙළින් සිට ගැනීමට අසීරු වූයේ එහි උස රියන් තුනක් පමණක් වූ නිසාය.

ඒ කෙසේ වෙතත් ඒ කුටියට මම ඉතා ප්‍රිය කළෙමි. එතරම් සුව පහසුවක් හා සතුටක් කල්කටාවේ තට්ටු තුන හතරක මන්දිරයකවත් නැත. බොහෝ දිනක් මෙවැනි පරිසරයක සිටීමෙන් ඇති වූ ප්‍රතිඵලයක් ලෙස මා වනයටම ඇබ්බැහි වී ඇත. රුචිකත්වයත්, දෘෂ්ටියත්. හොඳ නරක දැකීමත් යන හැම දෙයක් ම කෙරෙහි නිදහස් වන ගත පරිසරයේ ප්‍රභාවය බලපා ඇත. මට ඒ පැල්පත සුව පහසු එකක් ලෙස දැනුණේ ඒ නිසා වන්නට ඇත.

පැලට වැදුණු විට මට මුලින්ම ප්‍රිය වූයේ ළඟදී කපන ලද තෘණවල නැවුම් සුවඳයි. වර්ග අඩි දෙකක් පමණ වූ කුඩා කවුළුවෙන් පිටත බැළූ විට මගේ නෙත ගැටුණු, ඈත දක්වා විහිදුණු, අබ කෙත්වල කහ පාට මල් රැස ඊළඟට මගේ සිත ඇද ගත්තේය. මේ

SL UNLIMITED The Spirit of Sri Lanka's Community

දර්ශනය අලුත්ම එකකි. කුටිය තුළ වැතුරුණු විට මට දැනුණේ පොළව මත එළන ලද කහ පැහැති බුමුතුරුණක් මත මා වැතිරී සිටින බවය. හමා එන සුළඟේ අබ මල්වල සුවඳ තියුණු ලෙස රැඳී තිබිණ. දැඩි සීතලක් ගතට දැනෙන්නට විය. බටහිර දිගින් එන සුළඟේ අඩුවීමක් නොවීය. තදින් හැමූ සිහිල් සුළඟ නිසා දැඩි හිරු රැස් මැද වුවද සිරුර දියෙන් තෙමූ කලක මෙන් සීතලක් දැනිණි. බයිහාරයේ මසං කැලය අසලින් අශ්වයා පිට නැගී එන විට ඈත පිහිටි වඩා උස් නොවූ කඳු ගැට පෙළින් එහා හිරු බැස යන අයුරු මා දැක ඇත. ඒ අවස්ථාවල මුළු අපරදිග අහසම වර්ණවත් වී යයි. විශාල ගිනි බෝලයක් මෙන් හිරු බැස ගොස් මුහුදේ ගිළී යන්නට ඇත. මෙහි සිටින විට පෘථිවියේ ගමන පැහැදිලිව ප්‍රත්‍යක්ෂ ලෙස දැකිය හැක. බොහෝ වේලා සිටින විට බටහිර දිග චක්‍රවාටය අයිනේ වූ භූ තලය මා දෙසට කැරකී එන්නා සේ පෙනෙයි.

හිරු බැස යාමත් සමගම දැඩි සීතලක් ඇතිවේ. මුළු දවස පුරාම අශ්වයා පිට නැගී එහා මෙහා ගොස් වෙහෙස වී රෑ බෝවූ විට කුටියට පැමිණෙන මම පැල ඉදිරිපිට ගිනි ගොඩක් ගසා ඒ අසල හිඳ ගනිමි.

ඒ සමගම අන්ධකාරයෙන් වැසුණු වනාන්තරයට ඉහළින් වූ ආකාශයෙන් අසංඛ්‍යය වූ තාරකාවෝ බොහෝ ඈත විශ්වයේ ආලෝක දූතයින් ලෙසින් පෘථිවියේ මිනිසුන්ගේ දෑස් ඉදිරිපිට පෙනී සිටිති. තාරකා දැල්වෙන නිවෙන විදුලි පහන් සේ අහසේ දිස්වෙයි. හත්දින්නත් තරු ආදී තරු පොකුරු මා බෙංගාලයේ සිටියදී කවදාවත් මේ තරම් හොඳින් දැක නැත. නිතරම බලාසිටීම නිසා ඒ තාරකාවලි මට හොඳින් හුරු පුරුදු ඒවා බවට පත් විය. පහළින් ඝන අඳුරින් වැසුණු වනාන්තරයත්, පාළු ගුප්ත ස්වභාවයත්, අඳුරු රාත්‍රියත්, මට හිත මිතුරන් සේ හැඟෙන අසංඛ්‍ය වූ තාරකා රාශියත් මා වටකර ගෙන සිටියි. සමහර දිනවල අඳුරු සමුද්‍රය අසල ඈතින් පෙනෙන ප්‍රදීපාගාරයක එළියක් සේ, පෑයූ අඩ සඳ පෙනෙයි. ඝන අඳුර මැද විටෙක උල්කා පතිත වනු පෙනේ. දකුණෙන් හා උතුරෙන් ද, පෙර දිගින් හා බටහිරින් ද, ඊශාන හා නිරිත දෙසින් ද උල්කාපාත දිස් වේ. මිනිත්තුවෙන් මිනිත්තුව තත්පරයෙන් තත්පරයට එක දෙක බැගින් උල්කා පතිත වේ.

සමහර දිනවල ගනෝරි තේවාරි සහ තවත් බොහෝ දෙනා මගේ කුටිය අසලට රැස් වෙති. නානා ප්‍රකාර දේවල් ගැන එහිදී කතා

බහ කෙරෙයි. දිනක් එහිදී මට අමුතු කථාන්තරයක් අසන්නට ලැබිණි. මෝහන පුරා වනයේ සිටින කුළු මීමුන් ගැන අපි කතා කරමින් සිටියෙමු. දශරථ සිං නම් රාජ්පුත්වරයෙක් තණ බිමක් බදු ගැනීමට පැමිණ සිටියේය. ඔහු කාලයක් වනයේ ඇවිද හුරු පුරුදු කෙනෙකි. හොඳ දඩයක්කාරයෙකු ලෙස ඔහු ප්‍රසිද්ධය.

"සර්, මේ මෝහනපුරා කැලයේ කුළු මීමෝ දඩයම් කරන්න ගිහින් මං එක දවසක් කුළු මීමුන්ට පිහිට වෙන දේවතාවා දැක්කා." යයි දශරථ සිං පැවසීය.

ගනු මහතෝ වරක් මෙවැන්නකු ගැන කියූ බව මට මතක් විය.

"විස්තරේ කියන්නකෝ."

"සර් මේක වෙලා හුහක් කල් වෙනවා. කුඹී ගහේ පාලම තාමත් හදලා නෑ. ඒකේ පාලම් පාරුවක් තියෙනවා. කරත්ත පිටින් බඩුයි, මිනිස්සුයි පාරුවට පටවලා තමයි එගොඩ කරන්නේ. මට ඒ දවස්වල අශ්ව නැටුම් ගැන පිස්සුවක් තිබුණා. ඡටූ සිංටත් ඒ පිස්සුව තිබුණා. ඡටූ සිං සැණකෙළි පොළෙන් අශ්වයෝ අරන් එනවා. අපි දෙන්නා ඒ අශ්වයින්ට නැටුම් උගන්වනවා. ඊට පස්සේ වැඩි මිලකට විකුණනවා. අශ්ව නැටුම් දෙජාතියක් තියෙනවා. එකකට 'ජමෙයිති' කියනවා. අනෙක් ක්‍රමයට 'පනෙයිති' කියනවා. 'ඡමෙයිති' දන්න අශ්වයෝ වැඩි මිලකට අලෙවි කරන්න පුළුවන්. ඡටූ සිං ඒ ජාතියේ නැටුම් උගන්වන්න හපනෙක්. අපි දෙන්නා අවුරුදු තුන හතරක් ඇතුළත හොඳ ගානක් හම්බ කළා.

මෙහෙම ඉන්න කොට ඡටූ සිං යෝජනා කළා, ලයිසන් අරගෙන කුළු මීමුන් අල්ලන රස්සාව කරමු කියලා. අපි සල්ලි දීලා කැලෑ නිලධාරීන්ගෙන් පෝමිට් එකක් ගත්තා. ඊට පස්සේ ටික දවසක් කැලේ කුළු මීමෝ යන එන තැන් බල බලා ඇවිද්දා. එච්චර විශාල කැලේ අපට එක කුළු මීමෙක් වත් හම්බවුනේ නෑ. අන්තිමේදී අපි කැලේට හුරු පුරුදු ගෝත්‍රික මිනිහෙක් මේකට යෙදෙව්වා. ඒ මිනිහා අපට බට කැලයක් මැදියන් යන පාරක් පෙන්නලා කිව්වා රෑ මැද ඒ පාර දිගේ කුළු මීමෝ රංචුවක් වතුර බොන්න යනවා කියලා. අපි ඒ පාරේ ගැඹුරු වලක් කපලා උඩින් බට පතුරු කොළ එහෙම දාලා බොරු වලක් හැදුවා. රෑට රංචුව පිටින් යන කොට කුළු මීමෝ ඒකට වැටෙයි කියලා හිතුවා.

SL UNLIMITED The spirit of Sri Lankan e-Community

අර මිනිහා කිව්වා ඔය ගොල්ලෝ මොනවා කළත් මං එකක් කියන්නම්. මේ කැලේ කුළු මීමුන්ට මොකුත් කරන්න ඔය ගොල්ලන්ට බෑ. මෙහේ කුළු මීමුන්ගේ ආරක්ෂාවට කෙනෙක් ඉන්නවා කියලා.

අපි පුදුම වෙලා ඇහැව්වා ඒ කවුද කියලා.

ඒ නාකි මනුස්සයා කිව්වා ඒ තමයි' ටාංඩිබාරෝ' කියන කුළු මීමුන්ගේ දේවතාවා කියලා. එක කුළු මීමෙකුටවත් කරදරයක් කරන්න එයා ඉඩ දෙන්නේ නෑ කියලා.

ඕවා බොරු කතා. අපි ඕවා පිළිගන්නේ නෑ. අපි උඹලා වගේ වැද්දෝ නෙමෙයි, රාජ්පුත්වරු කියලා, ඡටූ සිං කිව්වා. ඊට පස්සේ වෙච්ච දේ ඇහැව්වොත් සර් පුදුම වෙයි. දැනුත් මතක් වෙන කොට ඇහේ හිරිගඩු පිපෙනවා. අපි දෙන්නා රෑ මැද කැලේ තිබුණු බට පදුරකට මුවා වෙලා සද්ද නැතුව හිටියා කුළු මීමුන්ගේ අඩි සද්දේ ඇහුනා. උන් ළඟම එනවා. කුළු මීමෝ බොරුවලට ටිකක් ඈතින් එද්දී අපි එකපාරටම දැක්කා, බොරුවල අයිනේ ඉඳලා රියන් හයක් විතර දුරින් කළු උස මිනිහෙක් අත්දෙක උස්සගෙන සද්ද නැතිව හිටගෙන ඉන්නවා. ඒ මිනිහ කොච්චර උසද කියනවා නම් එතන තිබුණු ලොකු බට පදුර විතරම උසයි. කුළු මීමෝ රංචුව ඒ දැකලා නැවතුණා. ඊට පස්සේ කලබල වෙලා එහාට මෙහාට පැනලා ගියා. එකෙක් වත් බොරුවල ළඟට ආවේ නෑ. තමුන්නාන්සේ විශ්වාස කරනවා නම් විශ්වාස කරන්න මේක අපි ඇහින් දැක්ක දෙයක්.

ඊට පස්සේ දඩයක්කාරයෝ දෙතුන් දෙනෙකුගෙන් ඇහැව්වාම ඒ ගොල්ලෝ කිවේ මේ කැලේ කුළු මීමෝ අල්ලන බලාපොරොත්තුව අතහරින්න කියලයි. අපට එකෙක් වත් අල්ල ගන්න කුළු මීමුන්ගේ උදව් කාරයා ඉඩ දෙන එකක් නෑ කියලා ඒ ගොල්ලෝ කිව්වා. අපි සල්ලි දීල ගත්ත පෝමිට් එකෙනුත් වැඩක් වුනේ නෑ."

දශරථ සිංගේ කතාව අවසන් වන විට ලොබ්ටුලියාවේ බදු එකතු කරන්නා කතා කළේය.

"අපි පොඩි කාලේ ඉඳලම ඔය ගැන අහලා තියෙනවා. කුළු මීමෝ ආරක්ෂා කරන දේවතාවෙක් ඉන්නවා. ඒ දේවතාවා උන්ට විපතක් වෙනවද කියලා ඇහැ ගහගෙනයි ඉන්නේ."

ඒ කතාව ඇත්තද බොරුද යන්න ගැන සිතා බැලීමට මට උවමනාවක් නොවීය. කතාව අසන අතරතුර අඳුරු අහසේ දඩයක්කාරයා යැයි නම් ලද තාරකාවලිය දෙස බැළුවෙමි. නිහඬ

වනාන්තරයට ඉහළින් අඳුරු අහස යටිකුරු වූ බඳුනක් මෙන් දිස් විය. ඈත වන මැද වළි කුකුළෙකු හඬ දෙනු ඇසිණ. අඳුරු නිහඬ අහසත්, අඳුරු නිහඬ පෘථිවියත් සීතල රාත්‍රියේ ළං ළංව හිඳගෙන එකිනෙකාගේ කන්වලට කුමක්දෝ කොදුරන්නාසේ ය. බොහෝ ඈත මෝහනපුරා වනාන්තරයේ කාලවර්ණ සීමාරේඛාව දෙස බලාගෙන මින් පෙර නෑසූ විරූ වන දේවතාවකු ගැන අසද්දී මගේ සිරුර කිළිපොලා ගියේය. එබඳු සීත රැයක ගිනිගොඩක් අසල හිඳගෙන එවැනි කතා ඇසීමට මම ඉතා ප්‍රිය කළෙමි.

10

මා දින පහළොවක් එහි නැවති ගංගෝතා ජනයා, නැතහොත් ඉඩම් නැති දිළිඳු බ්‍රාහ්මණයින් ගතකරන අන්දමේ වනයට හුරු වූ ජීවිතයක් ගත කළෙමි. මා එසේ කල්ගත කළේ මගේ උවමනාවටම නොවේ. එසේ නොකර බැරි නිසාය. වනාන්තරය මැද මට හුරු පුරුදු කෑම බීම කෙසේ සොය ගන්නද? කැලයෙන් සොයා ගත හැකි ගම්මැල්ල වැනි කරල් වර්ගයකින් සෑදූ හොද්දක් සමග බත් කෑවෙමි. හටයෝ පැණි රස අල වර්ගයක් වනයෙන් සොයාගෙන ආවෝය. සමහර අවස්ථාවල ඒවා උයා කෑවෙමි. මාළු, කිරි, ගිතෙල්, ආදී කිසිවක් ලබා ගැනීමට ක්‍රමයක් නොවීය.

වනයෙන් මොණර වලිකුකුළු ආදී සතුන්ගේ මස් පහසුවෙන් සොයාගත හැකි වුවත් දඩයම් කිරීමට තුවක්කුවක්ද ළඟ තිබුණත් කුරුල්ලන් මැරීමට ඇති අකමැත්ත නිසා නිර්මාංශ ආහාරම අනුභව කළෙමි.

වූලකියා බයිහාරයේ දී මිනිසුන්ට ව්‍යාඝ්‍රයන්ගෙන් උපද්‍රව සිදුවේ. දිනක් එවැන්නක් සිදු විය. එදින ඇට කටු දක්වා කා වදින සීතලක් තිබිණ. රාත්‍රි දහය පමණ වන විට වැඩ කටයුතු නිමවා වෙනදාට කලින් නිදා ගත්තෙමි. රාත්‍රියේ මිනිසුන්ගේ කෑ ගැසීමක් නිසා මගේ නින්ද කැඩුණි. වනාන්තරය අසල වූ තැනක මිනිසුන් එක් රැස් වී කෑ ගසන හඬ මට ඇසුණි. මම වහා නැගිට පහන දැල්වූයෙමි. වත්තේ හටයෝ වහා අසල වූ පැලෙන් පිටතට පැමිණියහ. කුමක් සිදු වීදැයි සිතමින් සිටින විට එක් මිනිසෙක් මා

වෙතට දුවගෙන ආවේය. "මැනේජර් මහත්තයා, තුවක්කුවත් අරන් ඉක්මනට එන්න. කොටියෙක් ඇවිත් පොඩි දරුවෙක් ඇදගෙන ගිහිල්ලා."

වනය අයිනේ සිට රියන් දෙසීයක් පමණ ඈතින් අබ කෙත මැද ගංගෝතා කුලයේ ඩෝමන් නම් කම්කරුවෙක් අඹු දරුවන් සමග සිටියේය. ඔහුගේ බිරිඳ මාස හයක කුඩා දරුවෙක් සමග පැල්පත මැද නිදාගෙන සිටියාය. ඉවසිය නොහැකි සීතල නිසා පැල්පත මැද ගිනි දල්වා තිබිණ. එහි දුම් පිටවීමට සකස් කර තිබුණු කවුළුවෙන් ඇතුළු වූ කොටියා කුඩා දරුවා ඩැහැගෙන පලාගොස් ඇත.

"කොහොමද දන්නේ නෑ දැනගත්තේ කොටියෙක් කියලා. සමහර විට නරියෙක් වෙන්නත් පුළුවන්." යයි මට සිතිණි. එනමුත් එහි ගිය විට ඒ පැමිණියේ කොටියෙකු බවට කිසිම සැකයක් ඇති නොවූයේ කුඹුරේ මෘදු පසෙහි පැහැදිළිවම අඩි සළකුණු තිබූ බැවිනි.

බදු එකතු කරන්නා හා හටයෝ වත්තට නරක නාමයක් ලැබෙනවාට අකමැත්තෙන් හඬ නගා කියන්නට වූයේ "මේ අපේ වත්තේ ඉන්න කොටියෙක් නොවෙයි සර්. මෝහනපුරා රිසව් ෆොරස්ට් එකෙන් ආපු එකෙක්. බලන්න අඩි සළකුණුවල ලොකු." යනුවෙනි.

කොහෙන් පැමිණි කාගේ කොටියෙකු වුවද අපට වෙනසක් නැත.

"මිනිස්සු ගෙන්නලා පන්දම් පත්තු කරගෙන කැලේ මැදට ගිහින් බලමු."

රාත්‍රියේ එතරම් විශාල කොටියෙකුගේ අඩි සලකුණු දුටු සියල්ලෝම බියෙන් තැති ගෙන සිටියහ. කිසිවෙක් වන මැදට යාමට එකඟ නොවූහ. බැන වැදී බල කිරීමෙන් පසු මේ සඳහා මිනිසුන් දහ දෙනෙකු පමණ එකතු කර ගැනීමට හැකි විය. පන්දම් අතට ගෙන බෙලෙක්කවලට ගසා ශබ්ද කරමින් පිරිස කැලයට වැදී වනයේ නොයෙක් ස්ථානවල සොයා බැලූ නමුත් කිසිදු පලක් නොවීය.

පසුදින පෙරවරු දහයට පමණ අප සිටි තැනට සැතපුම් දෙකක් ඈතින් ගිනිකොන දිග පැත්තේ වූ ස්ථානයක ඝන වනය මැද විශාල ගස්ක් යට කුඩා දරුවාගේ ලෙයින් වැකුණු සිරුරේ කොටස් හමු විය.

එයින් පසු අව පක්ෂයේ අඳුරු බිහිසුණු රාත්‍රි කීයක් ගෙවී ගියාද?

ප්‍රධාන කාර්‍යාලයේ සිට බාංකේ සිං නම් සාජන්ට්වරයා ගෙන්වා ගතිමි. ඔහු දඩයක්කාරයෙකි. ව්‍යාඝ්‍රයන්ගේ හැසිරීම ගැන ඔහුට හොඳ අත්දැකීමක් ඇත. ඔහු මෙසේ කීවේය.

"සර් මිනී මස් කන්න පුරුදු වෙච්ච කොටියා හරි තක්කඩියා. තව කී දෙනෙක් මරයිද දන්නේ නෑ. පරිස්සමින් ඉන්න වෙයි."

හරියට දින තුනකට පසු රෑ බෝවීගෙන එන වේලාවේ ගොපලු ළමයෙක් කොටියෙකු විසින් ඇදගෙන යන ලදී.

ඉන්පසු මිනිස්සු රාත්‍රියට නිදා ගැනීම අත් හැරියහ. රාත්‍රි කාලයේදී මිනිස්සු එහි අමුතුම සෝෂාකාරී පරිසරයක් ඇති කළහ. බොහෝ දුරක් දක්වා විහිදුණු බයිහාරයේ හැම කුටියකින්ම භාජනවලට ගසා ශබ්ද කරනු ඇසේ. තැනින් තැන ගිනි දල්වා තිබේ. බාංකේ සිං සහ මම තුවක්කු රැගෙන මාරුවෙන් මාරුවට මුර කරන්නට වීමු. ඉන්පසු ව්‍යාඝ්‍රයන්ගෙන් පමණක් නොව වෙනත් වන සතුන්ගෙන් ද කරදර ඇති විය. මෝහනපුරා වනාන්තරයෙන් පැමිණි කුළු මීමුන් රැලක් කෙත් වතු පාළු කරන්නට වූහ.

මගේ පැල්පත ඉදිරිපිට හටයින් ගිනි ගොඩක් ගසා තිබිණ. විටින් විට ඔවුහු එයට දර දැමූහ. අසල වූ පැලේ සිටි හටයෝ කතා බහ කරණු මට ඇසිණ. මම පැලේ බිම නිදාගෙන සිටියෙමි. ඉහ ඉද්දර වූ කවුළුවෙන් බැලූ විට ඝන අන්ධකාරයෙන් වැසුණු තණ බිම පෙනිණ. ඈත අහසේ ක්ෂීණ වූ තාරකා එළියෙන්, අසල වූ වනාන්තරයේ මායිම නෙත ගැටිණ. අඳුරු අහස දෙස බලද්දී මට සිතුණේ මිය ගිය ග්‍රහ ලෝකවල සිට හිම සහිත පින්න රැගත් සුළඟක් පොළොව දෙසට හමා එන බවයි. ඇතිරිළි පොරෝනා ආදිය දියෙන් පොහවා ඇත්තාසේ සීතලට දැනෙයි. ගිනි ගොඩ නිවී යාමට ආසන්නය. එය කෙතරම් ඉවසිය නොහැකි සීතලක් ද? ඒ සමග නිදහස් තැනිතලාවේ සිට බාධාවක් නොමැතිව හිමෙන් සිහිල් වූ සුළඟ හමයි. මෙවැනි දවස්වල මෙතරම් දැඩි සීතලක් මැද මේ මිනිසුන් සීතල පොළොවේ වැතිරී රාත්‍රිය ගෙවන්නේ කෙසේද? ඒ අතර අස්වැන්න, කුළු මීමුන්, වල් ඌරන් වැනි සතුන්ගෙන් ආරක්ෂා කර ගන්නේ කෙසේ ද? නපුරු සතුන්ගෙන් වන උපද්‍රවවලින් ද මෙහි අඩුවක් නැත.

අපේ බෙංගාලයේ ගොවීන් මෙතරම් කරදර උසුලනවාද? එතරම් සරුසාර පොළොවක, ගැම්මි පරිසරයක් මැද, නිරුපද්‍රිතව ගොවිතැන් කළත් ඔවුන්ගේද දුක් නිවෙන්නේ නැත.

මගේ කුටියේ සිට රියන් දෙකුන් සීයක් ඈතින් දකුණු භාගල්පුරයේ සිට අඹු දරුවන්ද සමග පැමිණි කම්කරු පිරිසක් කුඩා පැල්පත් තනාගෙන සිටියහ. ඔවුන් පැමිණ සිටියේ අස්වනු කැපීම සඳහාය. දිනක් සවස ඔවුන්ගේ පැල්පත් අසලින් මා එන විට මිදුලේ ගිනි ගොඩක් දල්වා සියල්ලෝම ඒ වටා හිඳගෙන සිටිනු මම දුටුවෙමි.

ඔවුන් ගත කරන ජීවිතය ගැන කිසිවක් නොදන්නා නිසා ඒ ගැන සෙවීමට මට සිතුණි.

"මොකද කරන්නේ මාමේ?" මම එතැන සිටි මහලු පුද්ගලයෙකුගෙන් ඇසුවෙමි. ඔහු නැගිට මට ආචාර කොට ගිනි තැපීමට ආරාධනා කළේය. සීත කාලයේදී නිවසට එන අමුත්තන්ට ගිනි තැපීමට ආරාධනා කිරීම ඔවුන්ගේ සිරිතයි.

මම එහි ගොස් හිඳ ගතිමි. පැල්පත තුළට එබී බැලූවිට බිම ඵලන මෙට්ට හෝ ගෙයක බඩු මුට්ටු වශයෙන් සැලකිය හැකි කිසිවක් එහි නැති බව දුටුවෙමි. පැල්පත තුළ බිම, වියළි තණකොළ අතුරා තිබිණ. ලොකු පිත්තල භාජනයක් හා ලෝහ මුට්ටියක් පමණක් එහි තිබිණ. ඔවුන් ඇඳ සිටි ඇදුම් හැර වෙනත් ඇදුම් එහි තිබුණේ නැත. කෙසේ වෙතත් මේ ඉවසිය නොහැකි සීතලේ ඔවුන් පොරවන්නේ මොනවාද?

මම ඒ ගැන ඔවුන්ගෙන් විමසුවෙමි.

මහලු තැනැත්තාගේ නම නක්ෂේදි භකත්ය. ඔහු ගංගෝතා කුලයේ කෙනෙකි. ඔහු මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේය.

"ඇයි මහත්තයෝ පැල ඇතුළේ මුල්ලක තිබුණු දහයියා ගොඩ දැක්කේ නැද්ද?"

මට ඔහු කී දේ තේරුම් ගත නොහැකි විය.

"දහයියා? රෑට ගිනි ගොඩවල් ගහන්න ගන්නවාද?"

නක්ෂේදී මගේ නොදන්නා කම දැක සිනාසුණේය.

"ඒකට නොවෙයි මහත්තයා. දහයියා ගොඩ අස්සේ රිංගලා ළමයි නිදා ගන්නවා. අපිත් දහයියාවලින් ඇහ වහගෙන නිදා ගන්නවා. දැක්කේ නැද්ද මෙහේ දහයියා හොණ්ඩර ගණනක් තියෙනවා. හරි උණුහුමයි. කම්බිලි දෙකක් පෙරෙව්වත් එච්චර උණුහුමක් නෑ. ඒ නැතත් අපිට කොයින්ද පොරවන්න කම්බිලි?"

අප කථා කරද්දී කුඩා දරුවෙකු නිදිකරවූ මවක් පැලේ මුල්ලක තිබුණු දහයියා ගොඩෙන් දරුවාගේ දෙපාවල සිට ගෙළ දක්වා වසා මුහුණ පමණක් පිටතට සිටින සේ තබනු දුටුවෙමි. මිනිසා අනෙකුත්

මිනිසුන් ගැන කෙතරම් දුරට සොයා බලන්නේ දැයි මට සිතිණ. මා මෙවැනි දේ ගැන මීට පෙර අසා තිබුණේ ද නැත. මා අපේ රටේ ජීවත් වන මිනිසුන් ගත කරන ජීවිතය කුමක්දැයි ඇත්ත වශයෙන්ම දැන ගත්තේ එදිනය.

ගිනි ගොඩේ එහා පැත්තේ හිඳගත් තරුණියක් කුමක්දෝ කෑමක් පිළියෙළ කරනු මම දුටුවෙමි.

"මොනවද උයන්නේ?"

"ඝාටෝ"

"ඝාටෝ කියන්නේ මොනවද?"

"මේ බෙංගාලි මහත්තයා කොහෙන් පාත් වුනාද දන්නේ නෑ. පිස්සුද කොහේද? ලෝකේ තියෙන කිසි දෙයක් දන්නේ නෑ." යනුවෙන් තරුණිය සිතන්නට ඇත. ඇය හඬ නගා සිනාසුණාය.

"ඝාටෝ කියන එක දන්නේ නැද්ද මහත්තයා. හාල් තම්බලා බත් උයනවා වගේ ඉරිහු කැලි තම්බපුවම කියන්නේ ඝාටෝ කියලා."

ඇය මගේ නොදන්නා කම ගැන අනුකම්පා කොට මුට්ටියේ ඉදෙන ඉරිහුවලින් ටිකක් ගෙන පෙන්වූවාය.

"මොනවත් එක්කද මේවා කන්නේ?"

ඇය සිනාමුසු මුහුණින් යුතුව පිළිතුරු දුන්නාය.

"ලුනු දාලා කනවා. වැංජනයක් එක්කත් කනවා. වෙන මොනවා එක්ක කන්නද?"

"වැංජන හදලා තියෙනවද?"

"මේක බැවම හදනවා."

තරුණිය කුළැටි කමක් නැති එකියක වූවාය.

"කල්කටාවෙද මහත්තයගේ ගෙවල් තියෙන්නේ?"

"ඔව්"

"එහේ කොයි වගේද? කල්කටාවේ ගස් නැතිලු නේද? එහේ තියෙන ඔක්කොම ගස් වැල් කපා දාලලු."

"කවිද කිව්වේ?"

"අපේ පැත්තේ කෙනෙක් කල්කටාවේ ගිහින් වැඩ කරනවා එයා නමයි කිව්වේ. ඒ කොයි වගේ පැත්තක්ද මහත්තයා?"

ඒ අභිංසක පිටිසර තරුණියට නූතන යුගයේ විශාල නගරයක ස්වරූපය හැකි පමණ පැහැදිලි කර දීමට මම උත්සාහ ගතිමි. ඇය කොයිතරම් දුරට මා කිවූ දේ තේරුම් ගත්තාදැයි මම නොදනිමි.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"කල්කටාව බලන්න හරි ආසයි. ඒ වුනාට අපිට කවිද ඕවා පෙන්නන්න ඉන්නේ?"

ඉන්පසු ඇයට බොහෝ දේ ගැන කිව්වෙමි. අවට අන්ධකාරය සන වෙමින් පැවතිණ. කෑම පිළියෙල කිරීම අවසන් වූ පසු පැල්පත තුළ තිබුණු ලොකු භාජනය ගෙනැවිත්, පිසගත් ඉරිහු එයට හලන ලදී. එය මනට ලුනු ඉස ළමා ළපටින් සමග ගෙදර සියල්ලෝම එය වටේ හිඳගෙන කන්නට පටන් ගත්හ.

"ඔය ගොල්ලෝ මෙහේ වැඩ ඉවරවුනාම ගමට යනවද?" මම ඇසුවෙමි.

නක්ෂේදී පිළිතුරු දුන්නේය.

"ගමට යන්න තව හුහක් කල් තියෙනවා. මෙහේ වැඩ ඉවර වෙලා ධරම්පුර පළාතේ ගොයම් කපන්න යනවා. මෙහේ නැති වුනාට එහේ ගොවිතැන් කෙරෙනවා. ඒක ඉවර වුනාම මුංගේර් පළාතේ තිරිඟු කපන්න යනවා. ඒ වැඩ ඉවර වෙනකොට පොසොන් මහ විතර වෙනවා. ඊළඟට ආයිමත් අබ අස්වැන්න ගන්න කාලේ එනවා. ඊට පස්සේ ටික දවසක් වැඩ නැතුව ඉන්න වෙනවා. නිකිණි බිනර මාසවල ඉරිහු අස්වැන්න ගන්න කාලේ එනවා. ඒ ඉවර වුනාට ධරම්පුරේ යනවා. අපි මේ විදිහට මුළු අවුරුද්දේම පළාතෙන් පළාතට ඇවිදිනවා. කොහේ හරි අස්වනු කපන කොට අපි එහේ යනවා. නැතිනම් අපි මොනවද කරන්නේ?"

"ඔය ගොල්ලන්ට ගෙවල් දොරවල් නැද්ද?"

මෙවර තරුණිය කථා කළාය. වයස අවුරුදු විසි පහක් පමණ වූ ඇය සෞඛ්‍ය සම්පන්න වූද, කාලවර්ණ වූද, වාර්නිස් ආලේප කලාක් මෙන් වූ, මට සිලිටු සිරුරක් ඇති කෙනෙක් වූවාය. කථා බහ කිරීමට දක්ෂ වූ ඇය දකුණු බිහාරයේ වැසියන්ට ආවේණික වූ ප්‍රාදේශීය හින්දි බස සිත් ගන්නා ලෙස උච්චාරණය කළාය.

"ඇයි නැත්තේ මහත්තයා? ඔක්කොම තියෙනවා. ඒ වුනාට අපිට ගෙවල්වල ඉඳලා බෑ. අපි එහේ යන්නේ ග්‍රීෂ්ම කාලේ ඉවර වුනාම. නිකිනි මහේ මැදක් වෙනකල් ගෙදර ඉන්නවා. ඊට පස්සේ ආයිත් පිට පළාත්වලට යන්න වෙනවා අපට රස්සාව ලැබෙන්නේ පිට පළාත්වලනේ. ඒ නැතත් පිට පළාත්වල කොච්චර නම් දේවල් තියෙනවද බලන්න. අස්වනු කපන කාලෙට තමුන්නාන්සේගේ වත්තට එක එක පළාත්වලින් කොයි තරම් මිනිස්සු එනවද? කොච්චර නැටුම් ගැයුම් බලන්න පුළුවන්ද? තමුන්නාන්සේ ඒවා

දැකලා නැද්ද? කොහොම දකින්නද? තමුන්නාන්සේලාගේ පළාතම කැලේට යටවෙලා ගිහින්නේ. තව දවස් පහළොවක් විතර යනකොට මෙහාටත් ඒ ගොල්ලෝ එයි. ඒ දවස්වලට කාටත් හම්බකරන්න පුළුවන්නේ."

සතර වටින් ම ඇත්තේ පාළුවයි. ඈත වූ පැල්පත්වල සිටින කවුරුන් හෝ අඳුරේ සිට බෙලෙක්කවලට පහර දෙනු ඇසේ. ආරක්ෂා රහිත දුර්වල බිත්ති ඇති පැල්පත් තුළට වී දරුණු වන සතුන්ගෙන් ගහන වූ වනාන්තරය අයිනේ රාත්‍රිය ගත කරන ඔවුන් තුළ කෙතරම් ධෛර්‍යයක් තිබිය යුතුද? මොවුන්ගෙන් එක් අයකුගේ දරුවකු මව් තුරුළේ සිටියදී වන සතකු විසින් පැහැරගෙන යන ලද්දේ මීට දින කීපයකට පෙරය. මොවුන්ට එවැනි දෙයකට මුහුණ පාන්නට සිදු නොවේ යයි විශ්වාසයෙන් යුතුව කිව හැකිද? ඒ සිද්ධියෙන් පසුව වුවද ඔවුන් විශේෂයෙන් බියපත්ව පරිස්සම් වන බවක් මට පෙනුනේ නැත. එසේ සිටිනවා නම් මොවුන් මෙතරම් රෑ බෝ වනතුරු නිදහස් අහස් තලය යට හිඳගෙන කථාබහ කරමින් කෑම පිළියෙළ නොකරනු ඇත.

"ටිකක් කල්පනාවෙන් ඉන්න. මිනීමස් කන කොටියෙක් ගැවසෙන බව දන්නවා නේද? ඌ හරි භයානකයි. ඒ වගේම කපටියි. පැල ඉස්සරහ ගිනිගොඩ දිගටම පත්තු වෙන්න අරින්න. ගේ ඇතුළටම වෙලා ඉන්න. රෑ දාවල් කියලා වෙනසක් නෑ. පරිස්සමින් ඉන්න ඕනෑ. මහ කැලයක් ළඟනේ ඉන්නේ."

මා මෙසේ කී විට තරුණිය පිළිතුරු දුන්නාය.

"අපිට ඕවා පුරුදුයි මහත්තයෝ. අපි හැම අවුරුද්දෙම ගොයම් කපන්න පූර්ණියා පළාතට යනවනේ. එහේ කඳු පැතිවල වල් අලින් ඉන්නවා. ඒ පැත්තේ කැලේ මීටත් වඩා භයානකයි. ගොයම් කපන කාලෙට වල් අලි ඇවිත් මිනිසුන්ට කරදර කරනවා."

තරුණිය ගිනි ගොඩට තවත් පරඬැල් ටිකක් දමා ඉදිරියට පැමිණ හිඳ ගත්තාය.

"එක පාරක් අපි අබිල්කුවා කියන කන්ද ළඟ හිටියා. දවසක් මං එළියේ ළිපේ උය උයා ඉන්න කොට මං දැක්කා රියන් පනහක් විතර ඇතින් වල් අලි හතර පස් දෙනෙක් ඉන්නවා. කළුගල් පරුවත වගේ තමයි කළුවරේ උන්ව පෙනුනේ. උන් අපේ පැල දිහාවටයි. ආවේ. මං පොඩි එකාව වඩාගෙන ලොකු කෙල්ලගෙ අතින් ඇදගෙන ගිහින් පැල ඇතුළේ තියලා ආවා. ළඟපාතක කවුරුවත් පේන්න

හිටියේ නෑ. එළියට ඇවිත් බලන කොට උන් පැල ළඟටම ඇවිත් නැවතිලා ඉන්නවා. මගේ උගුර කට වේලිලා ගියා. අලින්ට කළුවරේ හොඳට ඇස් පේන්නෙ නෑ. ඒ වුනාට උන්ට මිනිසුන්ගේ ඉව දුර ඉඳලාම දැනෙනවා. ඒ වෙලාවේ හුළඟ වෙන අතකට යන්න ඇති. ඒ මොනවා වුනත් උන් ඒ විදිහට ටික වේලාවක් නැවතිලා ඉඳලා වෙන පැත්තකට යන්න ගියා. වල් අලින්ට බයේ රෑ තිස්සේ බෙලෙක්කවල තට්ටු කර කර ගිනි ගොඩවල් ගහලා තමයි එහෙත් හිටියේ. මෙහේ කුළු මී හරක්. එහේ වල් අලි. අපට දැන් ඕවා පුරුදුයි."

බොහෝ රෑ වූ නිසා මම මගේ කුටියට පෙරළා ගියෙමි.

දින පහළොවකට පමණ පසු ථූලකියා බයිහාරයේ මුහුණුවර සම්පූර්ණයෙන්ම වෙනස් වී ගියේය. අබ කරල් වියලා මැඩ, බීජ රෑ ස් කර ගැනීමත් සමගම විවිධාකාර මිනිස්සු, නොයෙක් පළාත්වලින් එහි පැමිණීමට පටන් ගත්හ. පූර්ණියා, මුංගේර්, ජාපරා ආදී පළාත්වලින් මාර්වාරි ජාතියට අයත් වෙළෙන්දන් ඇතුළු විවිධාකාර මිනිස්සු බඩු පොට්ටනි ද රැගෙන තරාදි ද රැගෙන පැමිණියහ. ඔවුන් සමග කම්කරුවෝද කරත්තකරුවෝද පැමිණියහ. රසකැවිලි වෙළෙන්දෝ තාවකාලික මඩු තනාගෙන රසකැවිලි කඩ දැමූහ. එවේලේම සාදන ලද වෙල්ල වැහුම්, අග්ගලා ආදී රසකැවිලි ඒ කඩවලින් මිලදී ගතහැකි විය. මනි බඩු කාරයෝ විවිධාකාර වූ ලාභ වර්ගවල සෙල්ලම් බඩු, විසිතුරු බඩු, වීදුරු භාණ්ඩ, ප්‍රතිමා, සිගරට්, සබන් ආදී දේද රෙදිපිළිද ගෙන ආහ.

මේ අතර නැටුම්, ගැයුම්, නාටක ආදිය පෙන්වා මුදල් උපයන නානාප්‍රකාර මිනිස්සුද පැමිණියහ. ඔවුන් විවිධාකාර නැටුම් පෙන්වා, රාම සීතා කතාව ආදිය රඟපා බැතිමතුන්ගේ පූජාවන් එකතු කර ගත්හ. තවත් කෙනෙකු මුහුණේ සිංදූර තවරා හනුමන්තා මෙන් හැඳ පැළඳ ගෙන පූජාවල් එකතු කිරීමට පැමිණියේය. සැමටම මෙය මුදල් උපයන කාලයක් විය.

පසුගිය වසරේ ජනශූන්‍ය ථූල්කියා බයිහාරය නමැති තැනිතලාව සවස් වූ විට ගමන් කිරීමට බිය උපදවන තැනක් විය. මේ වසරේ එහි පවතින උද්යෝගිමත් ස්වභාවය දැක මා තුළද චමත්කාරජනක හැඟීමක් ඇති විය. හැම පැත්තෙන්ම බාලක බාලිකාවන්ගේ සිනා හඬ අසන්නටත්, දුව පැන ඇවිදීම් දකින්නටත් ලැබිණ. ළමයින් නලා පිඹිමින් යන හඬද කුඩා දරුවන් නැළවීමට ගන්නා සෙලවූ විට නද

දෙන සෙල්ලම් බඩුවල හඬද, නැටුම් ශිල්පීන්ගේ ගෙජ්ජි හඬද නිසා බයිහාරය පුරා සැණකෙළියක සිරි ගත්තේය.

බලා සිටියදී ජනගහනය වැඩි වන්නට විය. අලුත් පැල්පත්ද, දිග මඩුද එක් රැයකින් ඉදි විය. මෙහි ගෙයක් සැදීමට කිසිදු වියදමක් යන්නේ නැත. කැලේ ඉඳුක් මානා වැනි ද්‍රව්‍යද, කණු සඳහා ගස්ද ඇත. පන් වැනි ශාක වර්ගයක් වියලා බිත්ති බැඳීම සඳහා යොදා ගනී. අමු ද්‍රව්‍ය නොමිලේ ලැබෙන බැවින් වැය කිරීමට අවශ්‍ය වන්නේ ශ්‍රමය පමණි.

ථූලකියාව භාර බදු එකතු කරන නිලධාරියා මට ඇවිත් දැන්වූයේ පිටින් ආ සියලු දෙනාම මෙහි පැමිණ ඇත්තේ මුදල් ඉපැයීමට බවත් ඔවුන්ගෙන් වත්තේ අයිති කරුවන්ට බද්දක් අය විය යුතු බවත්ය.

"තමුන්නාන්සේ ඔපීස් එකේ වැඩ පුරුදු විදිහට කරගෙන යන්න. මම එක්කෙනා බැගින් සර් ළඟට එවන්නම්. ඒ අයගේ හැටියට මුදලක් නියම කරන්න."

මේ කායර්‍යය නිසා මට විවිධාකර මිනිසුන් මුණ ගැසීමට අවස්ථාව ලැබිණ.

උදේ පාන්දර සිට පෙරවරු දහය වනතුරු ද දහවල් තුනේ සිට රෑ වෙනතුරු ද මම කායර්‍යාලයේ වැඩ කළෙමි.

"මේ මිනිස්සු වැඩි දවසක් මෙහේ ඉන්නේ නෑ. අස්වැන්න ගත්තට පස්සේ ගනු දෙනු ඉවර වුනාම හැමෝම පැනලා යනවා. ඊට ඉස්සර වෙලා බදු සල්ලි එකතු කර ගන්න ඕනෑ." බදු නිලධාරියා කීවේය.

දිනක් මාර්වාරී තොග වෙළෙන්දන් කීප දෙනෙකු කමතක සිට අබ කිරනු මම දුටුවෙමි. මොවුන් අහිංසක ගැමියන් රවටන බව මට තේරුම් ගියේය. මම බදු එකතු කරන නිලධාරීන්ට ඔවුන්ගේ තරාදි පරීක්ෂා කර බලන ලෙස කීවෙමි.

ඔවුහු වංචනික තොග වෙළෙන්දන් තුන් හතර දෙනෙකු අල්ලාගෙන විටින් විට මා වෙතට කැඳවා ගෙන ආහ. මා ඔවුන් වත්තෙන් පිටමං කරවූයෙමි. මෙතරම් අමාරුවෙන් අහිංසක ගැමියන් ලබාගත් අස්වැන්න වංචනික ලෙස ගෙනයාමට ඉඩ දිය නොහැක. අඩු ගණනේ මේ වත්ත තුළවත් එවැනි ක්‍රියා වැළැක්විය යුතුය.

තොග වෙළඳුන් පමණක් නොව නොයෙක් අන්දමේ මිනිසුන් ගැමියන් ඉපයූ දේ උදුරා ගන්න අපේක්ෂාවෙන් සෑදී පැහැදී සිටින බව මට දකින්නට ලැබිණ.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

මෙහි එතරම් මුදල් භාවිතයක් නොවිය. ගැමියන් මිලදී ගත් බඩු සමග අබ හුවමාරු කර ගනිති. බඩුවේ වටිනා කමට වඩා වැඩි වටිනා කමකින් යුතු වූ අබ වෙළෙන්දාට දීමට ඔවුන්ට සිදුවේ. විශේෂයෙන් ගැහැනු අය කපටි කම් නොදන්නා අහිංසක අය වෙති. කුමක් හෝ කියා ඔවුන් රවටා වෙළෙන්දෝ දිය යුතු මිල මෙන් තුන් හතර ගුණයක් වටිනා අබ පහසුවෙන් ලබා ගනිති. පිරිමි වුවද විශේෂයෙන් මෙවැනි කපටිකම්වලින් බේරීමට නොදනිති.

ඔවුහු වෙළෙන්දන්ගෙන් පිටරට සිගරට් මිල දී ගනිති. සෙරෙප්පු සහ කමිස ආදියද ගනිති. අස්වැන්න ගෙට ගත් විට ඔවුන්ගේ නිවෙස්වල සිටින ගැහැනුන්ට නොයෙක් දේ ගැනීමට අවශ්‍ය වේ. ඔවුන්ට වර්ණවත් රෙදිපිළිද, විදුරු හා එනැමල් බඩුද, මිලදී ගැනීමට අවශ්‍ය වේ. රස කැවිලි කඩවලින් ගොටුවල දැමූ අග්ගලා, වෙල්ල වැහුම් ආදිය ගැනීමටද අවශ්‍ය වේ. ගීත ඇසීමට ද නැටුම් බැලීමටද ඔවුන් උපයන දේවලින් වැඩි කොටසක් වැය වේ. රාම දෙවියන්, හනුමාන් ආදීන්ට පූජාවන් තැබීමටද ඉඩම් හිමියන්ට හා ඔවුන්ගේ හමුදාවට මුදල් දෙන්නටද ඔවුන්ට සිදුවේ. ඉවසිය නොහැකි සීතලේ, රෑ නිදිමරාගෙන, වල් ඌරන්ගෙන් හා කුඑ මීමුන්ගෙන් කුඹුරු බේරා ගෙන, ව්‍යාඝ්‍රයන්ගෙන් හා සර්පයින් ගෙන් වන උපද්‍රවවලින් බේරී, යමක් උපයා ගත්තා නම් ඒ සියල්ල මේ දින පහළොව ඇතුළත කැමැත්තෙන්ම වැය කිරීමට ඔවුන් පසුබට වන්නේ නැත.

ඔවුන් තුළ දක්නට නිබුණු එක් හොඳක් නම් මත්පැන් පානය නොකිරීමයි. ගංගෝතා ගැමියන් හෝ ඉඩම් නොමැති දිළිඳු බමුණන් අතර මත්පැන් බීමේ සිරිතක් නොවිය. සමහරු කංසා භාවිතයට හුරුවී සිටියත් ඔවුන් ඒවා කොහෙන්වත් මිලදී ගන්නේ නැත. ඔවුහු ලොබ්ටූලියා හෝ ථූලකියා තණ බිමෙන් කංසා සොයාගෙන එයි. එය තහනම් කිරීමට කිසිවකු නැත.

දිනක් මුනේශ්වර් සිං පැමිණ මට දැන්වූයේ වත්තට අය වියයුතු බදු මුදල නොදී වංචා කළ මිනිසෙකු වේගයෙන් පලා යමින් සිටින බවය. මා අණ දුන්නොත් ඔහුව අල්ලා ගෙන පැමිණිය හැකි බව ඔහු කීවේය. මා ඒ තක්කඩියා අල්ලාගෙන ඒමට අණ දුනිමි.

පැයක් ඇතුළත හටයින් පස් දෙනෙක් ඒ මිනිසා අල්ලාගෙන මා ඉදිරියට කැඳවාගෙන ආවේය.

ඒ මිනිසා දුටු මට කථා කරගත නොහැකි විය. ඔහුගේ වයස අවුරුදු හැටකට අඩු යයි සිතිය නොහැක. ඔහුගේ හිස කෙස් සුදු

ව තිබුණු අතර කම්මුල් යටට ගිලී තිබිණ. ඔහුගේ මුහුණ දුටු මට සිතුණේ බොහෝ දිනක් කුසගින්නේ සිට මෙහි පැමිණි ඔහුට බඩ පුරා කන්නට ලැබෙන්නට ඇති බවයි. ක්‍රිෂ්ණගේ ළමාවිය දක්වන ජවනිකා රඟ පෑ ඔහු පසුගිය දින කීපයේ හොඳ මුදලක් උපයා ගත් බවත් ග්‍රාන්ට් මහතාගේ නුග ගස් අසල තනා ගත් පැලක නැවතී සිටි බවත් මට දැනගන්නට ලැබිණ. අස්වනු නෙලන කාලය අවසන් වීමට ආසන්න නිසා ඔහුගෙන් බදු මුදල් අයකර ගැනීමට වත්තේ හටයින් කීප වරක්ම ගියත් පසුව දෙන බව කියා මගහැර ඇත. හදිසියේම තමාගේ බඩු බාහිරාදියත් පොදි බැඳගත ඔහු ගමට යාමට පිටත් වූ බව මුනේශ්වර් සිංට දැනගන්නට ලැබී ඇත. ඒ මිනිසා පූර්ණියා නගරය දෙසට යන පාරේ ගමන් කරන බව දුටු මුනේශ්වර් සිං හඬ නගා කථා කළ විට ඔහු වේගයෙන් දුවන්නට පටන් ගෙන ඇත.

හටයින් කී සමහර දේ මට විශ්වාස කිරීමට අපහසු විය. එයින් එකක් නම් ක්‍රිෂ්ණගේ බාල කාලය රඟ දැක්වීමට ඔහුට ඒ වයසේදී හැකි වේද යන්නයි. දෙවැන්න නම් ඔහුට එතරම් වේගයෙන් දුවන්නට හැකිද යන්නය.

එහි සිටි සියල්ලෝම ඒ කාරණා දෙකම සත්‍ය බව දිවුරා කීය. මම රළු ස්වරයෙන් ඔහු ඇමතුවේය.

"වත්තේ අයිති කාරයින්ට ගෙවන්න තියෙන බදු මුදල් දෙන්න ඕන බව දන්නේ නැද්ද?

තමුසෙට මෙහෙම දෙයක් කරන්න හිතුණේ මොකද? තමුසෙගෙ නම මොකද්ද?"

මිනිසා සුළඟට අසුවූ ළාදල්ලක් මෙන් ගැහෙමින් සිටියේය. ඔහුව අල්ලාගෙන එන්නට යයි මා අණ දුන් විට හටයන් ඔහුව ගෙන ආවේ කුදලාගෙනය. මේ මහලු නැට්ටුක්කාරයාට ඔවුන් කිසිසේත්ම මෘදු ලෙස සැලකුවේ නැති බව මට තේරුම් ගියේය.

මිනිසා වෙව්ලමින් තමාගේ නම දශරථ යයි පිළිතුරු දුන්නේය.

"කුලේ මොකද්ද? ගෙදර කොහෙද තියෙන්නේ?"

"අපි ඉඩම් නැති බ්‍රාහ්මණයෝ සර්. ගෙවල් තියෙන්නේ මුංගේර් පළාතේ. සාහේබ්පුරේ පැත්තේ."

"ඇයි පැනලා ගියේ?"

"නෑ මං පැනලා යන්නේ මොකටද? පැනලා ගියේ නෑ සර්."

"හා හොඳයි. එහෙනම් බදු ගෙවනවා."

"සල්ලි නෑ සර්. මං කොහෙන් බදු ගෙවන්නද? නැටුම් පෙන්නලා ලැබිච්ච අබ ටික විකුණලා තමයි මේ ටිකේ මං කෑවේ බිව්වේ."

"ඔය කතා අහන්න එපා සර්. ඕවා බොරු කතා. ඔය මිනිහා පහුගිය ටිකේ සැහෙන්න හම්බ කළා. මිනිහගේ ළඟ සල්ලි තියෙනවා. අපට අවසර දුන්නොත් ඇදුම් අස්සේ සල්ලි හංගගෙන තියෙනවද කියලා සෝදිසි කරන්න පුළුවන්."

මිනිසා බියපත්ව වැඳගෙන මෙසේ කීවේය.

"ඉන්න සර්. මං කියන්නම්, මා ළඟ සල්ලි කියක් තියෙනවද කියලා."

ඔහු ඉනේ සඟවාගෙන තිබුණු රෙදි ගැටයක් පිටතට ගෙන එය දිගහැර එහි තිබූ මුදල් මට පෙන්වීය.

"මේ බලන්න සර් මා ළඟ තියෙන්නේ ඇනා දහතුනයි. මට කාත් කවුරුවත් නෑ. මේ නාකි මට කවුද කන්න අඳින්න දෙන්නේ? මම මේ කාලෙට නැටුම් පෙන්න පෙන්න කමතින් කමතට ඇවිදලා කියක් හරි හම්බ කරගන්නවා. ඊළඟට තිරිඟු කපන කාලේ වෙනකල් ඒකෙන් තමයි ජීවත් වෙන්නේ. ඒකට තව මාස තුනක් තියෙනවා. මට හම්බවෙන දේ යන්තම් කන්න බොන්න විතරයි සැහෙන්නේ. මෙහෙන් කියනවා බදු සල්ලි ඇනා අටක් දෙන්න කියලා. ඒක දුන්නම මට ඉතුරු වෙන්නේ ඇනා පහයි. මාස තුනක් ගෙවාගන්න ඇනා පහකින් පුළුවන්ද?"

"ඔය අතේ තියෙන පොට්ටනියේ මොනවද තියෙන්නේ. කෝ ගන්නවා එළියට බලන්න."

මිනිහා පොට්ටනිය දිග හැර පෙන්නුවේය. එහි කුඩා කණ්ණාඩියක් ද, බෙලෙක් තහඩුවෙන් තැනූ ඔටුන්නක්ද මොණර පිල් මිටියක් ද, කම්මුල් වල ගැම සඳහා පාට කුඩු ද, ඇට මාලයක් ද විය. ක්‍රිෂ්ණගේ ළමා විය රඟ දැක්වීම සඳහා අවශ්‍ය වන උපකරණ එහි විය.

"බලන්න සර්, මට බට නලාවක් නැනේ. හොඳට හදපු ලොකු බට නලාවක් ඇනා අටකට අඩුවෙන් ගන්න බෑ. මෙහේ නම් බට කැල්ලක් අරගෙන රහපෑවා. මෙහේ ඉන්න ගංගෝතා කුලේ මිනිස්සු රවටන්න ලේසියි. අපේ මුංගේර් පළාතේ මිනිස්සු නම් හොඳට දැනුම් තේරුම් ඇති අය. බට නලාව නැතිව රහපෑවොත් මට හිනාවෙයි. සල්ලි දෙන එකකුත් නෑ."

SL UNLIMITED
The spirit of Sri Lankan e-community
SL-UNLIMITED.COM

"හොඳයි. එහෙනම් තමුසෙට බදු සල්ලි ගෙවන්න බැරි තම් ඒ වෙනුවට නැටුම් පෙන්නලා යනවා."

මා මෙසේ කී විට මහල්ලාගේ දෑතට ස්වර්ගය පහළ වූවාසේය. ඔහු කම්මුල්වල පාට තවරා ගෙන මොණර පිල් කළඹ හිසේ තබාගෙන වැනි වැනී දැත් සොලවමින් වයස අවුරුදු දොළහක ළමයෙකු ලෙස නටන්නටත් ගයන්නටත් පටන් ගත්තේය. ඒ දුටු මට පළමුවෙන් සිනාසිය යුතුද එසේ නැතිනම් හැඬිය යුතුද යන්න තීරණය කරගත නොහැකි විය.

හටයෝ කටේ රෙදි හිර කරගෙන සිනා නවත්වා ගැනීමට දැඩි වෙහෙසක් ගත්හ. ඔවුන්ට වත්තේ කළමණාකරු ඉදිරිපිට මහල්ලාට උසුළු විසුළු කරමින් නිදහසේ සිනාසීමට නොහැකිය. සිනාව සහවා ගැනීමටද නොහැකිය.

මේ ආකාර වූ නැටුමක් මා කවදාවත් දැක නැත. වයස අවුරුදු හැටක් වූ මහල්ලෙක් විටෙක පොඩි ළමයෙකු මෙන් නෝක්කාඩු ගතියෙන් තොල් නොපිට හරවාගෙන, සිතින් මවාගත් ශ්‍රී කෘෂ්ණගේ මව වූ යශෝධා ඉදිරිපිටින් ගමන් කරයි. ශ්‍රී කෘෂ්ණ වෙඩරු සොරකම් කළ වරදට යශෝධා ඔහුගේ දැත් බැඳ තිබූ නිසා අමතාපය දක්වමින් තම දෑතම ඔසවා දැස් පිස දමමින් කුඩා ළමයෙකු සේ හඬයි. මේ සියල්ල දැක මම බඩ අල්ලාගෙන සිනාසෙන්නට වීමි. එය නම් බලන්නට වටිනා ජවනිකාවකි.

නැටුම හමාර විය. මම අත්පුඩි ගසා ඔහුට ප්‍රශංසා කළෙමි.

"මේ වගේ රහපෑමක් මං කවදාවත් දැකලා නෑ දශරථ. හරි අපූරුයි. හොඳයි මං තමුසෙව බද්දෙන් නිදහස් කළා. ඔන්න මගෙන් සන්තෝසෙට රුපියල් දෙකකුත් (මෙය ඇනා තිස් දෙකකට සමාන වේ.) හරි අපූරු රහපෑම."

නව දින දහයක් දොළහයක් අතරතුර අබ මිලදී ගැනීම් අවසන් වූ විට පිටින් ආ මිනිසුන් නම තමන්ගේ ගම් රටවල් බලා යන්නට ගියහ. කඩ අස්කරන ලදී. නැට්ටුක්කාරයෝ හා මනිබඩු වෙළෙන්දෝ මුදල් ඉපයීමට වෙනත් ස්ථාන සොයා ගියහ. පිටින් පැමිණි කුළී කරුවන්ගෙන් සමහරෙක් මෙපමණ දවස් සිටියේ වැඩිපුර නැටුම් ගැයුම් බැලීම සඳහාය. ඒ වන විට ඔවුන් ද ගමන් ඇරඹීමට ලක ලෑස්ති වෙමින් සිටියහ.

දිනක් මා ඇවිදින්නට ගොස් ආපසු එද්දී කලින් දැනහඳුනාගත් නක්ජේදි හකත්ගේ පැල්පතට ගියෙමි.

රෑ බෝ වීමට වැඩි කාලයක් ඉතිරිව නොතිබිණ. දිගන්තයෙක් විහිදුණු වූල්කියා බයිහාරයේ බටහිර පැත්තේ වූ හරිතවර්ණ වන රේඛාව අතරින් ගින්දර පැහැයෙන් යුතු වූ විශාල හිරු අවරට යමින් පැවතිණ. විශේෂයෙන් සීත කාලයට හිරු අවරට යන දර්ශනයේ අමුතු සුන්දරත්වයක් දැකිය හැක. මා විටින් විට සවස් වරුවේ මහාලිඛාරූප කන්දට නැග ඒ විස්මය ජනක දර්ශනය දැකීමේ බලාපොරොත්තුවෙන් බලා සිටින්නට පුරුදුව සිටියෙමි.

නක්ජේදී මා දැක වහා නැගිට දැත් එක්කොට නළලේ තබා මට ආචාර කළේය.

"ඒයි මංචි. මහත්තයාට ඉඳගන්න දෙයක් ගෙනැත් එලාපන්."

නක්ජේදීගේ පැල්පතේ මැදි වයසේ ගැහැනියක් සිටියාය. ඇය ඔහුගේ බිරිඳ බව අනුමාන කර ගැනීමට අපහසුවක් ඇති වූයේ නැත. ඇය නිතරම ගෙයින් පිටත වැඩපල කරනු දකින්නට ලැබිණ. දර කඩාගෙන ඒම, දර කැපීම, ඈත පිහිටි හිමදාස් ගමේ පිහිටි ළිඳෙන් වතුර ගෙන ඒම යනාදියේ ඇය නිරතව සිටිනු නිතර දක්නට ලැබිණ. මංචි යනුවෙන් අමතනු ලැබුවේ දිනක් මට වල් අලින් ගැන කියූ තරුණියයි. මංචි වියළි තෘණ වර්ගයක නැටි වලින් තනන ලද පැදුරක් ගෙනැවිත් එළුවාය.

ඇය සිනාසෙමින් හිස සොලවමින් දකුණු බිහාරයේ ගැමියන්ගේ හින්දි බස සිත්ගන්නා ලෙස උච්චාරණය කරමින් කථා කළාය.

"දැක්කද මහත්තයා බයිහාරයේ මේලාව? මං කිව්වා නේද? නැටුම්, ගැයුම්, එක්ක විනෝද වෙන්න දේවල් කොච්චර තිබුණද? මහත්තයා ඒවා දැක්කා නේද? මහත්තයා හුඟ කාලෙකින් මේ පැත්තේ ආවේ නෑ. ඉඳගන්න. අපි හෙට විතර මෙහෙන් යන්නේ ඉන්නේ."

ඔවුන්ගේ පැල්පතේ දොර ළඟ අඩක් වියළුණු තණකොළ ගොඩක් මත පැදුරු එළා මම එහි හිඳ ගතිමි. එතැන සිට බලද්දී හිරු බැස යාම හොඳින් දැනගත හැක. අසල වූ වනය මත මෘදු රන්වන් ආලෝකයක් වැටී තිබිණ. වචනයෙන් විස්තර කළ නොහැකි ශාන්තියක් හා නිහඬතාවක් විශාල බයිහාරය පුරා පැතිර ගියේය.

මංචිගේ කතාවට උත්තර දීමට මදක් පමාවිය. ඇය තවත් වරක් කුමක්දෝ විමසූ නමුත් ඇගේ භාෂාව මට තුනුරු නිසා කීදේ හොඳින් තේරුම් ගියේ නැත. කුමක් කියන්නදැයි සිතාගත නොහැකි

වූ මම වෙනත් ප්‍රශ්නයක් මගින් එය යටපත් කිරීමට මහන්සි ගත්තෙමි.

"ඔය ගොල්ලෝ හෙටම යනවද?"

"ඔව් මහත්තයා."

"කොහාටද යන්නේ?"

"පූර්ණියාවල ක්‍රිෂ්ණගංජය පැත්තට යනවා." පසුව ඇය මෙසේ ද කීවාය.

"නැටුම් එහෙම දැක්කද මහත්තයා? මේ පාර හොඳට සින්දු කියන්න පුළුවන් මිනිස්සු ආවා. එක දවසක් මිනිහෙක් කටින් ඩොල්කි ගැහුවා. මහත්තයා දැකලා තියෙනවද එහෙම එකක්. හරි ශෝක් මහත්තයා."

මංචි දැරියක මෙන් නැටුම් ගැයුම් දැක විනෝද වෙන බව මට පෙනී ගියේය. තමා දුටු දේවල් මහා උනන්දුවෙන් යුතුව සතුටු ස්වරයෙන් ඇය විස්තර කරන්නට වූවාය.

නක්ෂේදී මෙහිදී ඇයගේ කතාව වලක්වන්නට උත්සාහ දැරුවේය.

"ඔය ඇති බං. මහත්තයා කල්කටාවේ කෙනෙක්. උඹට වඩා හුඟක් දේවල් දැකලා තියෙනවා. මේකි ඕවට හරි ආසයි මහත්තයා. අපි මෙහේ මේව්වර දවස් හිටියෙත් ඔය නිසා තමයි. කමතේ පෙන්වන නැටුනුයි යන එන සෙනහයි බලලා යමු කියපු නිසයි අපි මේව්වර දවස් හිටියේ. මේකි තවම පොඩි එකියක් වගේ."

මංචි නක්ෂේදිගේ කවුරුන්දැයි මෙපමණ කලක් මා විමසුවේ නැත. මා සිතා සිටියේ ඇය නක්ෂේදිගේ දියණියක කියාය. නක්ෂේදිගේ කතාවෙන් ඇය ඔහුගේ දියණිය වන බවට මා තුළ සැකයක් ඇතිවූයේ නැත.

"නක්ෂේදිගේ දුව බැන්දේ කොයි පළාතෙන්ද?"

නක්ෂේදි පුදුමයට පත් විය.

මගේ දුව? මට දීග දෙන්න දුවෙක් කොයින්ද සර්?"

"ඇයි මේ මංචි? නක්ෂේදිගේ දුව නෙවෙයිද?" මගේ කථාවට හැමටම කලින් කොක්හඬ ලා සිනාසුණේ මංචිය .නක්ෂේදිගේ මැදි වයසේ බිරිඳ මුහුණ සාරි පොටින් වසාගෙන ගෙතුළට රිංගා ගත්තාය.

නක්ෂේදි ලැජ්ජාවට පත්වූවෙක් සේ කතා කළේය.

"මොන දුවෙක්ද සර්. මේ මගේ දෙවෙනි ගෑනි."

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"ඕහ්!"

ඉන්පසු සියල්ලෝම මඳ වේලාවක් නිහඬව සිටියෝය. මා කොතරම් ලජ්ජාවට පත්වූවාද කිව හොත් කිවයුතු දෙයක් සිතාගත නොහැකි විය.

"ගිනි ගොඩක් ගහන්න ඕනෑ. හරි සීතලයි." මංචි කීවාය.

ඇත්ත වශයෙන්ම ඒ වන විට සීතල වැඩිවෙමින් පැවතිණ. හිරු අවරට යනවාත් සමගම හිමාලය කන්ද පහතට බැස්සා සේ සීතලක් දැනෙයි. ඒ වෙලාවේ අහසේ පහළ කොටසේ බැස යන හිරුගේ රත් පැහැය තැවරී තිබුණු අතර අහසේ ඉහළ කොටස අඳුරු නිල් පැහැයක් ගත්තේය.

පැල්පතට මඳක් ඉදිරියෙන් වූ වියළි උස් තණ පඳුරකට මංචි ගිනි තැබුවාය. අඩි දහයක් පමණ දිග වියළි තණකොළවලට වහා ගින්දර ඇල්ලුවේය. අපි ගිනිගත් තණ පඳුරු අසලට ගොස් හිඳ ගතිමු.

"මහත්තයා මේකි තාමත් පොඩි එකියක් වගෙයි. බඩු මුට්ටුවලට හරි ආසයි. මේ පාර වැඩ කළාට අපට අබ හොණ්ඩර කීපයක් ලැබුණා. ඒකෙන් හොණ්ඩර දෙකක් විතරම වියදම් වුනේ මේකි ආස කරන දේවල් අරන් දෙන්න තමයි. මං ඇහුවා දහඩිය මහන්සියෙන් හම්බ කරලා ගත්තු දේවලින් ඔය වගේ දේවල් ගන්නවද කියලා. ඇහුවේ නෑ. අඩන්න පටන් ගත්තා. පස්සේ මං කිව්වා එහෙනම් ගනින් කියලා."

"තරුණ බිරිඳකගේ මහලු සැමියෙකු වූ නිසා එහෙම නොකර බෑ තමයි." මට සිතිණ.

"ඇයි මං කිව්වේ පස්සේ තිරිඟු කපන කොට මේලාවෙන් මං මොකුත් ගන්නේ නෑ කියලා. හොඳ බඩු ටිකක් මෙහෙන් හම්බ වුණා." යයි මංචි කීවාය.

නක්ෂේදි කෝපයෙන් යුතුව කථා කළේය.

"ලාබෙට? මෝඩ ගෑනියෙක් හම්බවෙලා හොඳට රවට්ට ගත්තා කඩකාරයෝ. ලාබෙට? අබ සේරු පහක් අරගෙන පනාවක් දුන්නා මහත්තයා. ගිය අවුරුද්දේ තිරිඟු කපන කොට.....?"

"හොඳයි මහත්තයා මං ගේන්නම් ගත්තු ඒවා. මහත්තයම කියන්න ලාබද නැද්ද කියලා."

මංචි පැළ තුළට දිව ගොස් තෘණ නැටි වර්ගයකින් වියන ලද පෙට්ටියක් ගෙන ආවාය. එහි පියන ඇර එතුළ ඇති දේ එකින් එක පිටතට ගෙන මා ඉදිරියේ පිළිවෙළට තබන්නට වූවාය.

"බලන්න මේ ලොකු පනාව. අබ සේරු පහකට අඩුවෙන් මෙහෙම එකක් දෙයිද? පාටේ ලස්සන බලන්න. අපුරුයි නේද? මෙන්න මේ සබන් කෑල්ල හරි සුවඳයි. මේකටත් අබ සේරු පහක් ගත්තා. ලාබයි නේද මහත්තයා?"

ඒවා ලාභයට ගත්තා යයි මට කිසි යේත්ම කිව හොහැකි විය. මෙවැනි සබන් කැටයක් කලකටාවේ ඇනා එකකට වැඩි නොවේ. අබ සේරු පහක් අඩු ගණනේ ඇනා හත අටක්වත් මිල වේ. පිටිසර ගම්වල වෙසෙන ගැහැනු කිසිම බඩුවක මිලක් ගැන නොදනිති. ඔවුන් රැවටීම ඉතා පහසුය.

මංචි තවත් බඩු පෙන්වූවාය. ඇය මහත් සතුටකින් යුතුව විටෙක එකක්ද, විටෙක තවත් එකක්ද මට පෙන්වූවාය. කොණ්ඩයට ගසන කටුවක්ද, බොරු ගල් ඇල්ලූ මුද්දක්ද, පිහන් මැටියෙන් තැනූ රූපයක්ද, කුඩා එනැමල් දීසියක්ද, මහත රිබන් පටි කීපයක්ද ඒ අතර විය. ගැහැනුන් ප්‍රිය කරන භාණ්ඩ හැම රටකම හැම පළාතකම එක සමාන ඒවා විය. වනගත පිටිසර තරුණියක් වූ මංචිගේද නගරයේ වෙසෙන ඇගේ උගත් සොහොයුරියන්ගේද රුචිකත්වය සමානය. බඩු බාහිරාදිය එකතු කිරීමත් ඒවා අයිති කර ගැනීමත් ඔවුන්ගේ ස්වාභාවික රුචිකත්වය අනුව කෙරෙන දෙයකි. මහලු නක්ෂේදී කෝපයට පත් වූවාට කරන්නට දෙයක් නැත.

එසේ නමුත් ඇය වඩාත් ප්‍රියකරන දෙය අන්තිමට පෙන්නන්නට වෙනම තබා ගත් බව මා කලින් දැන සිටියේ නැත.

මෙවර ඈ ආඩම්බරය මුසුවූ සතුටකින්ද මහත් උනන්දුවකින්ද එය පිටතට ගෙන මට පෙන්වූවාය.

එය නිල් හා කහ පැහැයෙන් යුතු වූ පබළු මාලයක් විය.

ඇයගේ මුහුණේ ඒ වෙලාවේ කෙබඳු සතුටක් හා ආඩම්බරයක් වීද, නාගරික උගත් තරුණියන් මෙන් සිතේ සතුට සහවාගෙන සිටීමට ඇය පුරුදු වී සිටියේ නැත. එවැනි භාණ්ඩ ටිකක් අත්පත් කර ගැනීම නිසා ඇය තුළ ඇති වූ සතුට තුළින් එක් පිරිසිදු සරල ස්ත්‍රී ගති ස්වභාවයක් ප්‍රකට විය. ගැහැනු සිතක ඇතිවූ හැඟීම් මේ අන්දමින් පැහැදිලිව දකින්නට නාගරික සමාජයේදී පහසුවෙන් නොලැබේ.

"කියන්න, බඩු ටික හොඳද?"

"හරි අපූරුයි."

"මේකට කීයක් විතර යයිද කල්කටාවෙදී මහත්තයලා අර ගත්තොත්?"

"අපි පබළු මාල පාවිච්චි කරන්නේ නැනේ. කොහොම වුනත් ඇනා හයකට වැඩි වෙන එකක් නෑ. කීයක් ගත්තද මෙහෙදි ඕකට?"

"අබ සේරු දාහතක් ගත්තා. වැඩිද?"

ඇය කෙතරම් රැවටී ඇද්දැයි කියාපෑමෙන් පලක් නැත. නිකරුණේ නක්ෂේදිගෙන් බැණුම් අස්සවා ඇයගේ සිතේ ඇතිවූ අපූරු සතුට විනාශ කළ යුතු නැත.

මගේ නොදන්නා කම නිසා මේ වසරේ වැඩකටයුතු මේ අන්දමින් සිදු විය. වෙළෙන්දන්ගේ බඩුවල මිල ගැන මා මීට වඩා සොයා බැලිය යුතුව තිබිණ. මෙතැනට ආගන්තුකයකු වූ මා මෙහි සිදුවන දේ ගැන කෙසේ දැනගන්නද? අස්වනු නෙලා ගන්නා කාලයට සැණකෙළි පැවැත්වෙන බව වත් මා කලින් දැන සිටියේ නැත. ඊළඟ වසරේ මෙවැනි දේ සිදු නොවන්නට වග බලා ගත යුතුව ඇත.

පසුදින උදැසන නක්ෂේදී අඹු දරුවන් රැගෙන යන්නට ගියේය. යාමට පෙර බදු ගෙවීමට මගේ කුටියට පැමිණියේය. ඒ සමග මංචිද පැමිණියාය.

පබළු මාලය ගෙල පැළඳගෙන සිටි ඇය සිනාමුසු මුවින් කථා කළාය.

"ආයෙත් බිනර මහේ ඉරිහු කපන කාලෙට එන්නම්. එතකල් මහත්තයා ඉන්නවා නේද? අපි නිකිනි මහට අච්චාරු දානවා. මහත්තයටත් ගේන්නම්කෝ."

මට මංචි ඉතා ප්‍රිය විය. ඇය ගිය විට මට දුකක් ඇති විය.

11

මෙවර මට අපූරු අත්දැකීමක් ලබන්නට අවස්ථාව උදාවිය.

මෝහනපුරා රක්ෂිත වනයට දකුණින්, සැතපුම් පහළොවක් විස්සක් පමණ දුරින් බීඩි එතීම සඳහා කොළ ලබාගන්නා ගස්ද සල් ගස්ද සහිත කැලෑ ඉඩමක් වෙන්දේසියේ විකුණන බව අපට දැනගන්නට ලැබිණි. අපේ ප්‍රධාන කාර්යාලයෙන් විදුලි පුවතක්

මගින් මට දැන්වූයේ බීඩි කොළ ගස් සහිත ඉඩම මිලදී ගැනීමට කටයුතු පිළියෙළ කරන ලෙසය.

කටයුතු සංවිධානය කිරීමට පෙර ඉඩම බැලීම අවශ්‍ය විය. එහි කුමක් ඇද්දැයි පරීක්ෂා කර නොබලා වෙන්දේසියේදී ඉඩම ඉල්ලිය නොහැක. ඉඩම වෙන්දේසි කරන දිනය ළංවූ නිසා විදුලි පුවත ලැබුණුදාට පසුවදා උදේම මම එහි යාමට පිටත් වූයෙමි. මා ගමන් ඇරඹීමට පෙර සේවක පිරිසක් බඩු බාහිරාදිය ඔසවාගෙන උදේ පාන්දරින්ම පිටත් වූහ. මා සහ බදු නිලධාරී බනවාරි ලාල් මෝහනපුරා වනයේ මායිමේ පිහිටි කාරෝ ගංගාව පසුකරන විට ඔවුන් හමුවීමට කථාකර ගෙන තිබුණි.

කාරෝ යනු කඳු පළාතේ සිට එන සිහින් කයක් ඇති ගංගාවක් විය. දණක් පමණ උසට ඇති ජලය ගල් බොරළු මතින් ගලා බසියි. අපි දෙදෙනා ගහෙන් එගොඩ වීමට අසුන් පිටින් බැස්සෙමු. එසේ නොකළා නම් ලිස්සන සුළු ගල් මත යද්දී අශ්වයින් ඇද වැටෙන්නට ඉඩ තිබිණ. ගහේ ඉවුරුවල වැලි තලා විය. අශ්වයා පිටින් ඉවුරේ ගමන් කිරීමද අසීරු විය. සිනිඳු වැල්ලේ පය තැබූ විට දණ තෙක් එරී යයි. අපි ගහේ එගොඩ ඉවුරට ළඟා වන විට දහවල් එකොළහ පමණ විය.

"මෙහේ නැවතිලා කෑම උයලා කාලා යන්න වෙයි සර්. මීට පස්සේ වතුර තියෙන තැනක් හම්බ වෙයිද කියන්න බෑ." යයි බනවාරිලාල් කීය.

නදිය දෙපස ජනශූන්‍ය වනාන්තරයකි. එසේ වුවත් එය විශාල වනාන්තරයක් නොවීය. ඝනව වැඩී ඇති නමුත් වඩා විශාල නොවූ සල් හා වෙනත් ගස්වලින්ද, ගල් පර්වතවලින්ද ගහන වූ එහි මිනිසෙකුගේ සලකුණක් වත් නැත.

කෑම පිළියෙළ කර අනුභව කිරීම හැකි තරම් කෙටියෙන් කිරීමට සිතූ නමුත් එතැනින් නැවත ගමන් ඇරඹෙන විට දහවල් එක පමණ විය.

කෙතරම් හවස් වන තුරු ඇවිද්දත් වනයේ කෙළවරක් දැකීමට හැකි වූයේ නැත. මට සිතුණේ තවත් දුර ගමන් නොකොට විශාල ගසක් යට නැවතී රාත්‍රිය ගෙවීම හොඳ බවය. අපට වනගත ගම්මාන දෙකක් මගදී හමු විය. එකක් කුලපාල් නම් වූ අතර අනික බරුවි විය. අප ඒ ගම්මාන පසු කරද්දී සවස තුන පමණ වී තිබිණ. රෑ

බෝවන තුරු ගමන් කළත් වනාන්තරය පසු කිරීමට නොහැකි වන බව කලින් දැන සිටියා නම් ඒ ගමක නැවතී රාත්‍රිය ගෙවා ගැනීමට කටයුතු යොදා ගත හැකිව තිබිණ.

රෑ බෝවීමට ආසන්න වන විට පසු කරන්න සිදු වූයේ වඩාත් ඝනව වැඩුණු වදුළු සහිත වනාන්තරයකි. ඊට පෙර එළිමහන් ස්ථාන හමුවිය. එයින් පසු ක්‍රමයෙන් විශාල වෘක්ෂයන්ගෙන් සෑදුණු වදුළෙන් අප ගමන් කළ පටු මාර්ගය වට කර ගත්තා සේය. හතර වටේම පැතිර ගිය වෘක්ෂ ලතාදිය නිසා අහස නොපෙනෙන තරම් වූ නිසා ඒ ප්‍රදේශය වෙන ස්ථානවලට වඩා අඳුරු විය.

තැනින් තැන හමු වූ එළිමහන් ප්‍රදේශවල දී වනයේ අනුපම වූ ශෝභා සම්පන්න ස්වභාවය ප්‍රකට විය. කුඩා සුදු මල් වර්ගයක් පිපී, සෙවණැලිවලින් ගහන සන්ධ්‍යාවේ තුරු හිස් ආලෝකමත් කළේය. මිනිසුන්ගේ දැස් සීමාවෙන් එපිට, ශිෂ්ට සමාජයේ සීමාවෙන් බොහෝ ඈත්වූ තැනක වන රැජිණිය මෙතරම් සුන්දර ලෙස සැරසී සිටින්නේ කවුරුන් වෙනුවෙන්ද?

"ඒ තේදඩි මල් පොකුරු. මේ කාලෙට ඕවා පිපෙනව සර්. වැල් ජාතියක පිපෙන්නේ." යයි බනවාරිලාල් කීවේය.

දැස් යොමුවන හැම පැත්තේම තුරු හිස් හා පඳුරු මත, නිලට හුරු සුදු පැහැයක් ගත්, මල් පොකුරු දිස් වූයේ කපු පුළුන් රොදවල් වනය පුරාම විසුරුවා දැමුවා සේය. මම විටින් විට අශ්වයාගේ ගමන නවත්වා අවට පරිසරය දෙස බලන්නට වීමි. සමහර තැන් ලස්සන වුවත් ඒ දෙස බැළූ විට හදවතේ කිසියම් උදාසීන හැඟීමක් ද ඇතිවේ. මා කෙතරම් දුර පැමිණ ඇත්දැයි මට සිහිවෙයි. මා සිටින්නේ ශිෂ්ට සමාජයෙන් බොහෝ ඈත පිහිටි ජනශූන්‍ය ලෝකයක උදාසීන වූද, රූප සම්පන්න වූද, වන සෞන්දර්‍යය මැදය. ලෝකය හෝ මිනිසුන් සමග කිසිම සබඳතාවක් නැති එහි ඇතුළු වීමට අපට අයිතියක් ද නැත. ඒ පරිසරයේ අයිතිය ඇත්තේ වන සතුන්ට හා වෘක්ෂ ලතාදියටයි.

වරින් වර වනාන්තරයේ සිරිය බලන්නට මා නැවතී බලා සිටීම නිසා අපගේ ගමන තවත් ප්‍රමාද වන්නට ඇත. අසරණ බනවාරි ලාල් මා යටතේ වැඩ කළ කෙනෙකු නිසා කිසිවක් නොකීවත් සිතින් නම් මෙසේ කියන්නට ඇත.

"මේ බෙංගාලි බාබුගේ නම් ඔළුව හොඳ නෑ. ඒක මට හොඳටම විශ්වාසයි. වත්ත අයිතිකාරයෝ මෙයාට කියලා කොව්වර කලක් තමුන්ගේ වැඩ කර ගනියිද කියන්න බෑ."

මගදී විශාල ගසක් යට අපි නැවතුණෙමු. අපේ කණ්ඩායමේ පිරිස දහදෙනෙක් පමණ වූහ.

"ලොකු ගිනිගොඩක් ගහන්න. හැමෝම මේ කිට්ටුවම ඉන්න. විසිරිලා ඉන්න එපා. රෑට එක එක විදියේ අනතුරු වෙන්න ඉඩ තියෙනවා." බනවාරි ලාල් කීය.

මම ගසක් යටට ගොස් අකුලන පුටුව දිගහැර ගෙන හිඳගතිමි. එහි සිට බැළූ විට බොහෝ ඈතට යන තෙක් නිදහස් ආකාශය පෙනිණ. ඒ වන විටත් හොඳටම අඳුර වැටී තිබුණේ නැත. අවට කැලයේ තුරු හිස් දහස් ගණන් සුදු මල් පොකුරු වලින් වැසී තිබිණ. පසෙක තිබුණු අඩක් වියළුණු දිගු තණකොළ පඳුරු රන් පැහැයෙන් දිස් විය. අව්ව වැටුණු පොළොවින් නැවුම් සුවඳක් නික්මුණි. වියළි තෘණවලින් හා කිසියම් මල් විශේෂයකින් නික්මෙන සුවඳක් එක්වී අපූරු සුවඳක් දැනෙන්නට විය. බන්ධන වලින් මිදුණු සහනශීලී හැඟීමක් සිතට දැනෙන්නට විය. මෙවැනි විශාල ජනශූන්‍ය පාළු තැනිතලාවකදී මිස වෙනත් තැනකදී එවැනි හැඟීමක් හිතට නොඑයි. ඒ නිදහස් ජීවිතයේ උද්දාමය ගැන අත්දැකීමක් නැති කෙනෙකුට ඒ ගැන වටහා දීම ඉතා දුෂ්කරවූ කටයුත්තකි.

මේ අවස්ථාවේදී අපේ කම්කරුවකු පැමිණ බනවාරි ලාල්ට පැවසුවේ තමා දර අහුලන්නට කැලයේ මඳ දුරක් ගිය විට දුටු දෙයක් ගැනය. අප නැවතුණු ස්ථානය එතරම් හොඳ නැති බවත් එය භූත ප්‍රේතයින් ගැවසෙන තැනක් බැවින් ඉවත්ව යාම හොඳ බවත්ය.

"යමු සර් අපි ගිහින් ඒක මොකද්ද කියලා බලලා එමු." බනවාරි ලාල් කිවේය.

කැලෑව මැදින් ටික දුරක් ගිය විට කම්කරුවා කථා කළේය.

"අන්න අතන සර්. ගිහින් බලන්න. ඒ වුනාට ළඟටම යන්න එපා."

වනය මැද කටු පඳුරක් අතරින් උස් කණුවක හිසක් මතුවී තිබිණ. එහි කිසියම් විසුළු මුහුණක් කැටයම් කර තිබිණ. එය රාත්‍රියට දුටුවොත් බය හිතෙන අන්දමේ එකකි.

එය මිනිසුන් විසින් සාදන ලද්දක් බවට සැකයක් නැත. එනමුත් ජනශූන්‍ය වනය මැදට එවැනි කණුවක් ආවේ කෙසේදැයි අපට තේරුම්ගත නොහැකි විය. එය කෙතරම් පැරණි එකක්ද යන්න පවා අපට සිතාගත නොහැකි විය.

අපි රාත්‍රිය එම ස්ථානයේම ගත කළෙමු. උදෑසන නැගිට එතැනින් පිටත් වූ අපි පෙරවරු නවය පමණ වන විට යායුතු තැනට ළඟා වීමු.

එහි ගිය විට අපට ඉඩම අයිතිකරුවාගේ සේවකයකු හමු විය. ඔහු අපට ඉඩම පෙන්වමින් ඇවිද්දේය. වියළී ගිය ඇළකින් එගොඩ පැත්තේ තිබුණු කණුවක් හදිසියේ මගේ නෙත ගැටිණ. එයද පෙර දින සවස දුටු කණුව මෙන් වූ එකක් විය. එවැනි විසුළු මුහුණක් එහිද කොටා තිබිණ.

මා අසල සිටි බනවාරි ලාල්ටද එය පෙන්වූයෙමි. ඉඩම් හිමියාගේ සේවකයා ඒ පළාතේ කෙනෙකු වූ නිසා ඒ ගැන කීමට දැන සිටියේය.

"ඔය වගේ තව කණු තුන හතරක් කැලේ මැද්දේ තියෙනවා. ඉස්සර ඉඳලා මේ පළාතේ හිටපු වන වාසීන්ගෙන් පැවතෙන රජ කෙනෙක් ඉන්නවා. ඒ රජ්ජුරුවන්ගේ බල ප්‍රදේශය පෙන්වන සීමාවේ තමයි කණු හිටවලා තියෙන්නේ.

"කොහොමද දන්නේ?"

"ඔය ගැන අපි ඉස්සර ඉඳලම අහලා තියෙනවා. මහත්තයා. ඒ රජ පෙළපත තාම තියෙනවනේ."

ඒ ගැන දැනගැනීමට මා තුළ ඇති වූයේ දැඩි කුතුහලයකි.

"කොහේද ඒ රජ්ජුරුවෝ ඉන්නේ?"

මිනිසා එක් දිසාවකට ඇඟිල්ල දිගු කොට පෙන්විය.

"අර පැත්තේ කැලේ උතුරු සීමාවේ පොඩි ගමක් තියෙනවා. එහේ තමයි රජ්ජුරුවෝ ඉන්නේ. මේ පළාතේ ඒ රජ්ජුරුවෝ හරි ප්‍රසිද්ධයි. උතුරෙන් හිමාළය කන්ද, දකුණේ කුඩා නාගපුරය, නැගෙනහිරින් කුශී ගඟ, බටහිරින් මුංගේර් පළාත, කියන සීමාවල්වලට මැදිවෙච්ච හැම කැලයක්ම, පර්වතයක්ම තියෙන ප්‍රදේශයේ ආණ්ඩු කළා කියන්නේ මේ ගොල්ලන්ගේ මුතුන් මිත්තෝ තමයි."

වරක් ගනෝරි තේවාරි ගුරු මහතා මේ පළාතේ ආදී වාසීන්ගෙන් පැවත එන්නන් තවමත් සිටින බව පවසා තිබුණු බව මට සිහිවිය. ඒ පළාතේ කඳු ආශ්‍රිත ප්‍රදේශවල වාසය කරන මිනිස්සු

ඔහුට රජ කෙනෙකුට සේ සලකන බවද ඔහු කීවේය. ඉඩම් නිලධාරියාගේ සේවකයාගේ නම බුද්ධු සිං විය. බුද්ධිමත් සේවකයෙකු වූ ඔහු බොහෝ කලක් ඒ පළාතේ සේවය කර ඇති නිසා පළාතේ ඓතිහාසික තොරතුරු ගැන හොඳින් දැන සිටියේය.

බුද්ධු සිං ඒ ගැන තවත් විස්තර කීවේය.

"මෝගල් රජ කාලේ මේගොල්ලෝ මෝගල් රජ්ජුරුවන්ගේ සේනාවත් එක්ක යුද්ධ කරලා තියෙනවා. මේ කැලේ මැදින් සේනාව බෙංගාලයට යද්දී දුනු වලින් විදලා සටන් කරලා තියෙනවා. අන්තිමේදී මෝගල් රජවරු ප්‍රදේශාධිපතිවරු පත්කරන කල් මේගොල්ලන්ගේ රාජ්‍යය තමයි තිබුණේ. මේගොල්ලෝ වීරකම් වලට නම් දරාපු අය තමයි. දැන් නම් වීරකම් කරන්න කවුරුවත් නෑ. ඉතිරි වීරයෝ ටිකත් 1862 අවුරුද්දේ සාංවතාල් කැරැල්ලෙන් පස්සේ නැති වුණා. ඒ කැරැල්ලේ නායකයා තාමත් ජීවතුන් අතර ඉන්නවා. එයා තමයි දැන් ඒගොල්ලන්ගේ රජ්ජුරුවෝ. නම දෝබරූ පන්නා වීරවර්දි. දැන් හුඟක් වයසයි. ඒ වගේම දුප්පත්. ඒ වුනත් මේ පළාතේ ආදිවාසීන්ගෙන් පැවත එන මිනිස්සු තාමත් එයාට රජ කෙනෙකුට වගේ ගරු කරනවා. ආණ්ඩු කරන්න රාජ්‍යයක් නැතත් රජෙක් කියලා සලකනවා."

රජු හමුවීමට දැඩි ආශාවක් මා තුළ ඇති විය.

රජෙකු බැහැදැකීමට යද්දී තෑගි බෝග ආදිය රැගෙන යා යුතුය. රජෙකුට නිසි ගෞරවය නොදැක්වුවහොත් එයින් හානියක් සිදුවිය හැකිය.

දහවල් එකට පමණ අල වර්ග, පලතුරු සහ ලොකු කුකුළන් දෙදෙනෙකු අසල වූ ගමෙන් මිලදී ගතිමි. අප පැමිණි කාර්‍යය කළයුතු දෑ නිම කොට දහවල් දෙකට පමණ රජු මුණගැසීමට යාමට බුද්ධු සිංට කථා කළෙමි.

බුද්ධු සිං එහි යාමට එතරම් උනන්දුවක් දැක්වූයේ නැත.

"සර් මොකටද එහේ යන්නේ? ඒගොල්ලෝ සර්ලට මුණ ගැහෙන්න තරම් වටින්නේ නෑ. රජ කෙනෙක් වුනාට නොදියුණු මිනිසුන්ගෙන් කෙනෙක් නේ. සර්ලන් එක්ක හරි හරියට කථා කරන්න තරම් වටින්නේ නෑ."

ඔහුගේ කථාවට කන් නොදී මම බුද්ධු සිං සහ බනවාරි ලාල් සමග එහි ගියෙමි.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

රාජධානිය ඉතා කුඩා එකක් විය. එහි වූයේ ගෙවල් විස්සක් විසිපහක් පමණි. මැටියෙන් තැනූ කුඩා ගෙවල් හොඳින් පිරිසිදු කොට තිබිණ. ඒවායේ බිත්ති මැට්ටෙන් කපරාරු කර, සර්පයින්, නෙළුම් මල්, මල් වැල්, ආදී රූප එහි මතුපිට අඹා තිබිණ. කුඩා ළමයි සෙල්ලම් කරමින් ද ගෙවල්වල ගැහැනු වැඩ කරමින් ද සිටිනු අපට දක්නට ලැබිණ. කුඩා සහ තරුණ ගැහැනු ළමයි හුරුබුහුටි හා මටසිලිටි සිරුරු ඇත්තෝ වූහ. හැම දෙනාගේ ම මුහුණුවල කිසියම් සුන්දරත්වයක් විය. අප එහි යනවිට සියල්ලෝම පුදුමයෙන් අප දෙස බලා සිටියහ.

බුද්ධු සිං එහි සිටි ගැහැනු කෙනෙකුගෙන් රජු කොහේ දැයි විමසුවේ ඔවුන්ගේ බසිනි.

"මං දැක්කේ නම් නෑ. කොහේ යන්නද? ගෙදර ඇති." යැයි ඇය පිළිතුරු දුන්නාය.

රජුගේ නිවස අනිත් නිවෙස්වලින් වෙන් වූයේ කලු ගල් තාප්පයකින් වටවී තිබීම නිසාය. ගමට පිටුපසින් එතරම් උස් නොවූ ගල් පර්වතයක් විය. ගල් ගෙන එන්නට ඇත්තේ එතැනින්ය. රජුගේ නිවසේ දරු දැරියෝ රාශියක් වූහ. එයින් කිප දෙනෙක් ඉතා කුඩා දරුවෝ වූහ. හැම දරුවකුගේම ගෙලෙහි පබළු මාලයක් සහ විවිධාකාර ඇට වර්ගවලින් තැනූ මාලයක් විය. එයින් දෙතුන් දෙනෙක් ඉතා ලස්සන අය වූහ. බුද්ධු සිං කථා කළ විට වයස අවුරුදු දහසයක් පමණ වූ ගැහැනු ළමයෙක් පිටතට දිව ආවාය. ඇය අප දැක පුදුමයට පත් වූවාය. ඇය මඳක් බිය පත් වූ බව ඇයගේ බැල්මෙන් ප්‍රකට විය.

බුද්ධු සිං ඇයගෙන් රජු කොහේ දැයි විමසීය. ඇය කවුරුදැයි මම බුද්ධු සිංගෙන් විමසුවෙමි.

"රජ්ජුරුවන්ගේ මිණිබිරියක්." ඔහු කීවේය.

රජු වැඩි කාලයක් ජීවත් වූ නිසා එහි මැදි වයසේ හා තරුණ වයසේ සිටින වැඩි දෙනෙකුට රජකම ලබා ගැනීමේ අවස්ථාව මග හැරෙන්නට ඇත.

"මා එක්ක එන්න. සීයා ගල් පරුවතේ ගාව ගල්පොත්තක ඉඳගෙන ඉන්නවා." ඇය කීවාය. අපට පාර පෙන්වීමට පැමිණි තරුණිය ඇත්තෙන්ම රජ කුමරියක් නොවේදැයි මට සිතිණ. ඇගේ මුතුන් මිත්තෝ මේ ආරණ්‍ය භූමියේ කලක් සිය අණසක පැතිර වූහ. ඇය එවැනි පරම්පරාවක කෙනෙකි.

මම බුද්ධු සිංට ගැහැනු ළමයාගේ නම කුමක්දැයි විමසන්නට කීවෙමි.

"එයාගේ නම භානුමතී." යයි ඔහු කීවේය.

"ශහ්. හරි ලස්සන නම, භානුමතී! භානුමතී කුමරිය!"

භානුමතී සෞඛ්‍ය සම්පන්න වූද ලාලිත්‍යයෙන් යුක්ත වූද යුවතියකි. ඇගේ මුහුණේ කිසියම් සුන්දරත්වයක් විය. එසේ වුවද ඇය ඇඳ සිටි ඇඳුම් දියුණු සමාජයේ නම් සුන්දරත්වය රැක දෙන සුළු ඒවා නොවීය. ඇගේ හිස කෙස් වියළී තිබිණ. ගෙලේ ඇට මාලයක් හා කවඩි මාලයක් ද විය.

"ඔය ගොල්ලො එතැනට යන්න. සීයා අර ගහ යට ඉඳගෙන හරක් බලනවා."

ඇගේ කථාවෙන් මම පුදුමයට පත් වීමි.

"මේ පළාතේ රජ්ජුරුවෝ, දෝබරු පන්නා වීරවර්දි, හරක් බලනවා?"

කිසිවක් ඇසීමට ප්‍රථම යුවතිය යන්නට ගියාය. තව ටිකක් ඉදිරියට ගිය විට බතායින් ගසක් යට සිටි මහල්ලෙක් සල් කොළවල දුම්කොළ ඔතා දුම් පානය කරනු අපි දුටුවෙමු.

"ආයුබෝවන් රජතුමනි!" බුද්ධු සිං කීවේය.

රජුට හොඳින් කන් ඇසෙන නමුත් ඇස් පෙනීම දුර්වල බව මට පෙනී ගියේය.

"කවුද? බුද්ධු සිං ද? තව කවුද ඇවිල්ලා ඉන්නේ?"

"බෙංගාලි බාබු කෙනෙක්. තමුන්නාන්සේ බලන්න ඇවිත් ඉන්නවා. තෑගි බෝගත් අරන් ඇවිත් තියෙනවා. ඒවා බාර ගන්න."

මම තෑගි බෝග ටික රැගෙන ගොස් මහල්ලා ඉදිරියේ තැබුවෙමි.

"තමුන්නාන්සේ මේ පළාතේ රජ්ජුරුවෝ කියලා අහලා අපි හුඟක් දුර ඉඳලයි තමුන්නාන්සේ බලන්න ආවේ."

මහල්ලාගේ දිගටි මුහුණ දෙස බැලූ මට සිතුණේ තරුණ වයසේදී ඔහු ඉතා කඩවසම් කෙනෙකු වූ බවට සැකයක් නැති බවය. ඔහුගේ මුහුණේ බුද්ධිමත් ගතියක් පිළිඹිඹු විය. මහල්ලා සතුටට පත්විය. මා දෙස හොඳින් බැළූ ඔහු "ගෙවල් කොහේද තියෙන්නේ?" යයි විමසීය.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

"කල්කටාවේ."

"ඕහ්! හරි දුරයිනේ. මං අහලා තියෙනවා ඒක ලොකු නගරයක් කියලා."

"තමුන්නාන්සේ කවදාවත් එහේ ගිහිල්ලා නැද්ද?"

"නෑ අපට නගරෙට යන්න පුළුවන්ද? අපි කැලේට වෙලා හොඳින් ඉන්නවා. ඉඳගන්න. භානුමතී කොහේද ගියේ. භානුමතී?

යුවතිය දිව ආවාය.

"ඇයි සීයේ?"

"මේ බෙංගාලි මහත්තයයි ඒ එක්ක ආපු අනිත් අයයි අද අපේ ගෙදරින් තමයි කෑම කන්න ඕනේ."

"නෑ. නෑ. ඕන නෑ. අපි දැන් යනවා. තමුන්නාන්සේ එක්ක කතා කරලා ඉක්මනට යන්නයි ආවේ. අපි හිටියා කියලා....."

දෝබරු පන්නා එයට එකඟ වූයේ නැත.

"නෑ. එහෙම බෑ. භානුමතී මේවා මෙතැනින් අරන් යන්න."

මා දුන් ඉඟිය අනුව බතවාරි ලාල් ඒ බඩු බාහිරාදිය අසල වූ රජ ගෙදරට ගෙන ගියේය. භානුමතී ඔහු පිටුපසින් ගියාය. මහල්ලාගේ ආරාධනය නොපිළිගෙන සිටීමට මට නොහැකි විය. ඔහු දෙස බැළූ විට මගේ සිත ගෞරවයෙන් පිරී ගියේය. සාංචනාල් අරගලයේ නායකයා වූද ආදි වාසියෙකු වුවත් පැරණි උසස් පෙළපතකට අයත් වූද වීර දෝබරු පන්නා මට කෑමට නවතින්න යයි ඉල්ලා සිටියේය. එය අණ දීමක් වැනිය.

දෝබරු පන්නා ඉතා දිළිඳු කෙනෙකු බව මට වැටහිණ. ඔහු හරකුන් බලන බව දැක කලින් මා පුදුම වුවත් පසුව මට සිහි වූයේ භාරත ඉතිහාසයේ මොහුටත් වඩා ලොකු රජවරු පවා සමහර අවස්ථාවල හරකුන් බැලීමටත් වඩා පහත් රැකියාවල නිරතව සිටි බවයි.

රජු සල් කොළවලට දුම්කොළ දමා සුරුට්ටුවක් මෙන් ඔතා මට දුන්නේය. ගිනිපෙට්ටියක් නොතිබුණු නිසා ගස යට තිබුණු ගිනි ගොඩින් කොළයක් පත්තු කර සුරුට්ටුව දල්වා ගත්තෙමි.

"තමුන්නාන්සේලා මේ පළාතේ හිටිය පුරාණ රජ පෙළපතක අයනේ. තමුන්නාන්සේලා දකින්න අපි පින් කරලා තියෙනවා." මම කීවෙමි.

"දැන් මොනවද අපේ ඉතුරු වෙලා තියෙන්නේ ? අපි සූරිය වංශයේ අය. මේ පේන පරුවතවල, කැලෑවල, හැම තැනම අපේ අණසක තමයි තිබුණේ. මං තරුණ කාලේ කොම්පැණි සුද්දොත් එක්කත් සටන් කරලා තියෙනවා. දැන් මං වයසට ගිහිල්ලා. යුද්දෙත් අපි පැරදුණාට පස්සේ දැන් අපේ ගත යුත්තක් නෑ."

මේ ආරණ්‍යයෙන් පිටත පිහිටි පෘථිවියේ වෙනත් භූමියක් ගැන විස්තර දෝබරු පන්නා නොදන්නා සේය. මා ඔහුගේ කථාවට පිළිතුරු වශයෙන් යමක් කියන්නට සැරසෙන විට එතැනට තරුණයෙක් පැමිණියේය.

"මේ ඉන්නේ මගේ මුණුබුරෙක්. ජගරු පන්නා. මෙයාගේ තාත්තා මෙහේ නෑ. ලඡමනියාපුරේ කෙනෙක් හම්බවෙන්න ගිහින්. ජගරු මේ මහත්තුරුන්ට කෑමට දේවල් ලෑස්ති කරන්න උදව් වෙන්න."

ශක්තිමත් මාංශ පේශි සහිත, මනා හැඩයෙන් යුතුවූ, සිරුරක් ඇති ඒ තරුණයා අලුතින් වර්ධනය වන සල් ගසක් සේය.

"මහත්තයා ඉත්තෑ මස් කනවද?" ඔහු මගෙන් ඇසීය.

පසුව ඔහු තමාගේ මුත්තනුවන් දෙස බලා මෙසේ කීය.

"කන්දෙන් එහා පැත්තේ කැලේ මං උගුලක් අටවලා තිබ්බා. ඊයේ රෑ ඉත්තෑවෝ දෙන්නෙක් අහුවෙලා හිටියා."

රජුට පුතුන් නිදෙනෙකු සිටින බවත්, ඔවුන්ට ද දූ පුතුන් දහදෙනෙකු පමණ සිටින බවත් මට දැනගන්නට ලැබිණ. රජ පවුලේ සියල්ලෝම ඒ ගමේ එකට වාසය කරති. ඔවුන්ගේ ප්‍රධාන ජීවිකාව වූයේ හරකුන් ඇති කිරීම හා දඩයම් කිරීමයි. අවට වනයේද කඳුවලද වාසය කරන වෙනත් ගෝත්‍රික ජනයා නොයෙක් දේ ගැන උපදෙස් ගැනීමට රජු සොයා එන විට කිරි, පලතුරු, අල වර්ග ආදියත් කුකුළන්, එළුවන්, කුරුල්ලන් ආදී සතුන්ගේ මස් ද ගෙන එන බව මට දැනගන්නට ලැබිණ.

"තමුන්නාන්සේලා ගොවිතැන් කරන්නේ නැද්ද?"

මා එසේ ඇසූ විට දෝබරු පන්නා ගර්වය මුසු ස්වරයකින් පිළිතුරු දුන්නේය.

"අපේ පෙළපතේ අය ඒ වගේ රස්සාවල් කරන්නේ නෑ. දඩයම් කිරීම අපට ආඩම්බරයක්. එක කාලයක් අපි හෙල්ලෙන් තමයි දඩයම් කළේ. හෙල්ලෙන් දඩයම් කිරීම තමයි, අපි වීර කමක් විදිහට සලකන්නේ. දුනු ඊතලවලින් දඩයම් කරලා වැඩක් නෑ. මගේ ලොකු

පුතා මුංගේර්වල ඉඳලා තුවක්කුවක් ගෙනැවිත් තියෙනවා. මම නම් අල්ලන්නේවත් නෑ ඒක. හෙල්ලෙන් දඩයම් කිරීම තමයි නියම දඩයම."

භානුමති නැවත පැමිණ ගලින් තැනූ භාජනයක් අප ඉදිරියේ තබා යන්නට ගියාය.

"ඔය තෙල් ඇගේ ගාගන්න. මේ ළඟ තියෙනවා හොඳ අපූරු දොළපාරක්. හැමෝම ගිහින් නාලා එන්න."

රජුගේ කීම පරිදි දොළපාර වෙත ගොස් නාගෙන ආ විට රජු තමාගේ නිවසේ කාමරයකට අප කැඳවාගෙන ගියේය.

භානුමති හාල් සහ අල වර්ගයක් කුඩයක දමා ගෙනැවිත් දුන්නාය. ජගරු අමු සල් කොළවල එතූ ඉත්තෑ මස් ගෙනැවිත් දුන්නේය.

භානුමති නැවත ගොස් කිරි හා මී පැණි ගෙනාවාය. අපේ කෑම පිළියෙළ කරන කෝකියා පැමිණ නොසිටි නිසා බනවාරි ලාල් අල තැම්බීමට සූදානම් විය. මම ළිප දල්වන්නට උත්සාහ කළෙමි. එතැන තිබුණු ලොකු දර කැලි දමා ගිනි දැල්වීම අපහසු කටයුත්තක් විය. මා දෙතුන් වරක් ළිප දැල්වීමට උත්සාහ කළ විට භානුමති වහා දිව ගොස් වියළී ගිය කුරුඵ කුඩුවක් ගෙනැවිත් ළිපට එබූ විට මඳ වේලාවකින් හොඳින් ගිනි ඇවිළුණි. ඉන්පසු ඇය මඳක් ඈතට වී බලා සිටියාය. භානුමති රජ කුමරියක් වුවත් විවෘත හදවතක් ඇති, සැහැල්ලු, සරල ගති ඇති තරුණියක් වූවාය.

දෝබරු පන්නා රජු මුළුතැන් ගෙයි දොර අසල හිඳගෙන සිටියේ අමුත්තන්ට කිසියම් දෙයක අඩුපාඩුවක් වේ නම් ඒ ගැන සොයා බැලීමටය. අප කෑම පිළියෙළ කොට අනුභව කළ පසු ඔහු මෙසේ කීය.

"අපේ ගෙවල් දොරවල් එතරම් හොඳ නෑ. තමුන්නාන්සේලා මෙහේ ඇවිත් කරදර වුණා. මේ කැලේ මැද්දේ පර්වතයක් උඩ අපේ පෙළපතේ ඉස්සර හිටපු රජවරුන්ගේ වාසස්ථානවල නටබුන් තාමත් තියෙනවා. මං අහලා තියෙනවා ඉස්සර කාලේ අපේ මුතුන් මිත්තෝ හිටියේ එහේ කියලා. දැන් එහෙම කාලයක් නෑ. අපේ මුතුන් මිත්තෝ පුද පූජා කරන දෙවියෙකුත් එහෙ වැඩ ඉන්නවා."

මා තුළ දැඩි කුතුහලයක් ඇති විය.

"අපි එහේ ගියාට තමුන්නාන්සේගේ විරුද්ධත්වයක් නැද්ද?"

"මොනවට විරුද්ධ වෙනවද? ඒ වුනාට එහේ බලන්න කියලා විශේෂ දෙයක් දැන් නෑ. කමක් නෑ යමු. මාත් එනවා. ජගරූ යමු මාත් එක්ක."

අවුරුදු අනූ දෙකක් වයස් වූ මහල්ලෙකු පර්වතයට නැගීමට කැඳවාගෙන ගොස් කරදර කළයුතු නැති නිසා මම ඊට විරුද්ධ වීමි. ඔහු එය ගණන් නොගෙන සිනාසුණේය.

"ඔය පර්වතේට මට නිතරම යන්න වෙනවා. ඔතන තමයි අපේ පෙළපතේ අයගේ සොහොන් තියෙන්නේ. හැම පෝයටම අපට එහේ යන්න වෙනවා. යමු මං ඒකත් පෙන්වන්නම්."

අප සිටි තැනට ඊසාන දිග පැත්තේ පිහිටි ධංජරී නම් වඩා උස් නොවූ පර්වත පේළියක් එක් තැනකදී නැගෙනහිර දිසාවට හැරී පිහිටීම නිසා ඒ අතර කුහරයක් මෙන් සෑදී තිබිණ. ඊට පහළින් තැනිතලාවක් විය. පර්වත සානුවේ වූ වනාන්තරය පහළින් වූ තැනිතලාව දක්වා පැතිර ගොස් තිබුණේ දොළ පාරක් කන්දක සිට පහතට ගලා එන්නාක් මෙනි. ඒ කොටසේ තිබුණේ ඝන වනාන්තරයක් නොව විවෘත භූමියකි. තුරු හිස් මතින් ඇත දිගන්තයේ පිහිටි නිල්වන් පර්වත පේළිය පෙනිණ. මා සිතන අන්දමට ඒ පර්වත පේළිය ගයාව හෝ රාම්ගර් පළාතේ පිහිටි ඒවාය. පේන තෙක්මානයේ වූයේ තැනක උස්වුද, තැනක මිටි වූද වෘක්ෂයන්ගෙන් සෑදුණු වන භූමියකි. ඇතැම් තැනක විශාල වෘක්ෂයන්ගෙන් යුතු තුරු වදුළු වූ අතර තවත් තැනක සල් සහ කෑල ගස් වල පැළ එක ගොන්නට වැවී තිබිණ. අපි වනය මැදින් වූ අඩි පාර දිගේ කන්දට නැග්ගෙමු.

එක තැනක ලොකු ගල් තලාවක් අඩක් පසින් වැසී තිබිණ. ඊට පහළින් කුඹල් කරුවන් මැටි පුළුස්සන වළක් මෙන් වූ කුහරයක් විය. වලට ඉහළින් සල්පැලවලින් යුතු වූ තුරු ගොමුවක් විය.

"මේ කුහරය ඇතුළෙන් යන්න වෙනවා. මාත් එක්ක එන්න. බයවෙන්න එපා. ජගරූ ඉස්සර වෙලා යන්න."

"අපි පණ අතින් අරගෙන මෙන් කුහරය තුළට වැදුණෙමු. එය තුළ කොටි වලසුන් සිටින්නටද ඉඩ තිබේ. ඒ නැතත් එහි සර්පයින් නම් අනිවාර්‍යයෙන්ම සිටීමට ඉඩ තිබේ.

කොන්ද නමාගෙන එහි ඇතුළු වී ටික දුරක් ගියවිට කෙලින් සිට ගැනීමට හැකි තැනකට පිවිසුණෙමු. එහි වූයේ දැඩි අඳුරකි. මද වේලාවක් යද්දී දැස් අඳුරට හුරුවූ විට නම් එතරම් අපහසුවක් දැනුණේ නැත. අප පිවිසී ඇත්තේ රියන් විස්සක් පමණ දික් වූද රියන් පහළොවක් පමණ පළල් වූද විශාල ගල් ගුහාවක් තුළටය. ටික දුරක් ගිය විට තවත් ගල් ගුහාවක් හමු විය. අපි එතුළට යාමට උනන්දුවක් නොදැක්වීමු. ගුහාවේ වහළ එතරම් උස් නොවීය. මිනිහෙකුට අත් එසවූ විට වහළ ඇල්ලිය හැක. එතුළින් නික්මුණේ අප්‍රසන්න වූ දුහදකි. වවුල් තිප්පොලක් වූ එහි උරුලෑවන්, නරින්, වල්බාවන් ආදීන්ද සිටින බව අසන්නට ලැබිණ. බනවාරි ලාල් මට රහසින් කතා කළේය.

"අපි එළියට යමු සර්. වැඩි වෙලා මෙතන ඉන්න එක හොඳ නෑ."

දෝබරූ පන්නාගේ මුතුන් මිත්තන් විසූ ගිරි දුර්ග ප්‍රාසාදය එයයි.

ඇත්තෙන්ම එය ස්වාභාවිකව පිහිටි ගල් ගුහාවකි. සතුරු ආක්‍රමණවලින් බේරීම පිණිස ඔවුන් පුරාණ කාලයේ මෙවැනි තැන්වල වාසය කරන්නට ඇත.

"මේකේ නව පැත්තකින් රහස් දොරටුවක් තියෙනවා. ඒ ගැන කාටවත් කියන්න අපට අවසර නෑ. ඒක අපේ පෙළපතේ අය විතරයි දන්නේ. දැනට මෙහේ කවුරුවත් පදිංචි වෙලා හිටියේ නැතත් ඒ ගැන කියන්න බෑ."

අපේ ඇඟට ලේ ඉනුවේ පිටත පැමිණි පසුවය.

ඉන්පසු තවත් ටික දුරක් නැංග විට පර්වත මුදුනේ සෑහෙන භූමි ප්‍රමාණයක් වසා පැතිර ගිය එල්ලෙන මුල් සහිත විශාල නුග ගසක් දක්නට ලැබිණ.

"කරුණාකරලා සපත්තු සෙරෙප්පු ගලවලා එන්න."රජු කීය.

නුග ගස යට විශාල ඇඹරුම්ගලක් මෙන් වූ ගලක් විය. එය තමාගේ පෙළපතේ අයගේ සොහොන් බිම බව රජු කීවේය. විශාල නුග ගස යට වූ භූමිය පුරාම කළුගල්වලින් සොහොන් කොත් සාදා තිබිණ. සමහර සොහොන් කොත් ඉතා පැරණි ඒවා විය. මට පෙනුණේ නුග ගසේ සිට බැස බිමට සවි වූ ශක්තිමත් මුල් ඒ සොහොන් කොත් අඩුවලින් අල්ලාගෙන සිටින ලෙසකි. ඒවා ගසේ කඳ තරම්ම මහත්වී තිබිණ. සමහර සොහොන් කොත් මුල්වලින් වැසී ගොස් තිබිණ. ඒවා කෙතරම් පැරණි දැයි එයින්ම පෙනේ.

"මේ වගේ නුග ගහක් ඉස්සර එතන තිබිලා නෑ. වෙන වෙන ගස් තමයි තිබුණා කියන්නේ. නුග පැළයක් මෙතන ඉබේ හැදිලා

අනින් ඔක්කොම ගස් මරාගෙන පැතිරිලා තියෙනවා. මේ නුග ගහ කොච්චර පරණද කියනවා නම් මේකේ කඳක් කියලා එකක් හොයා ගන්න බෑ. මුල් තමයි කඳන් වගේ වෙලා තියෙන්නේ. මේවා කපලා දැම්මොත් පෙනෙයි තව සොහොන් කොත් කොච්චර යටවෙලා තියෙනවද කියලා."

නුග ගස යට සිටගත් විට මා තුළ ඊට කලින් නොවූ විරූ අපූරු හැඟීමක් පහළ විය. රජු දුටු විටද එවැන්නක් මගේ හිතට ඇතුළු වූයේ නැත. (ඔහු දුටු විට මුලින්ම මට සිතුණේ ඔහු මහලු සාංවතාල් කුළී කරුවෙකු සේය කියාය.) රජ කුමරිය දුටු විට මට එවැන්නක් සිතුණේ නැත. (නිරෝගී ගැමි තරුණියක හා ඇයගේ වෙනසක් මට නොපෙනුණි.) පැරණි රාජ ප්‍රසාදය දුටු විට ද මා තුළ අමුතු හැඟීමක් ඇති නොවිය. (එය හුතයින් අරක් ගත් තැනක් ලෙස හෝ සර්ප විමානයක් ලෙස මට පෙනුණි) එසේ වුවත් පර්වතය මත වූ සුවිශාල පැරණි නුග ගස යට තිබුණු සොහොන් භූමිය දුටු විට නම් අපූරු විචිත්‍ර හැඟීමක් මා තුළ පහළ විය.

ඒ ස්ථානයේ ගාම්භීර බවත්, ගුප්ත බවත්, පෞරාණික බවත් විස්තර කළ නොහැක. ඒ වන විට සවස් වී තිබිණ. රන්වන් ඉර අව්ව තුරුපත් මතද, නුග ගහේ මුල් මතද, ඇතින් පෙනෙන ගිරි මුදුන් හා වනය මතද වැතිරී තිබිණ. සවස් කාලයේ සනවූ සෙවණැලි ඒ ඇති පැරණි සොහොන් බිමට තවත් ගැඹුරු හා ගුප්ත බවක් දී ඇත්තා සේය.

මිසරයේ සිටි පැරණි රජවරුන්ගේ සොහොන් බිම් පිහිටි තිබිස් නගරය අසල වූ 'වැලි ඔප් ද කිංස්' යන ප්‍රදේශය අදත් ලෝකයේ සංචාරකයින් ඇදී එන තැනකි. ප්‍රචාරය නිසා විශාල හෝටල් සංචාරකයින් පැමිණෙන කාලයට ජනාකීර්ණ වේ. 'වැලි ඔප් ද කිංස් ' නමින් හැඳින්වෙන ස්ථානය අතීතයේ මීදුමින් යම් පමණ අඳුරු වේද, සංචාරකයින්ගේ වටිනා සිගරට් සුරුට්ටුවල දුමින් ඊටත් වඩා අඳුරු වේ. එසේ වුවද එය සමග සසඳන විට ගුප්ත බවින් හෝ වටිනා කමින් අඩු නැති ඈත අතීතයේ අනාර්‍ය රජවරුන්ගේ සොහොන් කොත් පර්වත වළල්ලකින් වටවී සැහවී පවතී. ඉදිරියට ද එසේ පවතිනු ඇත. මිසරයේ පාරාවෝ රජවරුන්ගේ මෙන් ඔවුන්ගේ සොහොන්බිමේ ආටෝපයක්, ආලෝකයක් හෝ ඓශ්වර්‍යයක් නැත. ඊට හේතුව ඔවුන් දිළිඳු වීමයි. ඔවුන්ගේ සංස්කෘතියත්, සභ්‍යත්වයත්

මිනිසාගේ ආදිම යුගයේ නොදියුණු තත්වයේ පැවති ආකාරයේ ඒවා වෙයි. ඔවුන්ගේ ගුහා ආශ්‍රිතව ගොඩනැගුණු රාජ ප්‍රාසාද, සොහොන්කොත් සහ සීමා දක්වන කණු ආදිය නොදියුණු තත්වයේ ඒවා විය. ඒ සවස් කාලයේ සෙවණැලි අතර, පර්වත මත වූ විශාල නුග ගස යට හිඳ ඈත අතීතයේ පැවති ලෝකයක් දුටුවෙමි.

ආර්‍ය්‍ය ජනයා වයඹ දිග කඳු වැටි පසුකර අනාර්‍ය්‍ය ආදී වාසීන් විසින් පාලනය කරන ලද ප්‍රාචීන භාරතයට මහෝඝයක් සේ ප්‍රවිෂ්ට වූහ. භාරතයේ පසුකාලීන ඉතිහාසය වූයේ මේ ආර්‍ය්‍ය ශිෂ්ඨාචාරයේ කතාවයි. අනාර්‍ය්‍යයින්ගේ ඉතිහාසය කොතැනක වත් සඳහන් නොවේ. එය ලියැවී ඇත්තේ සැහවී ඇති ගල් ගුහා තුළ හා වනයේ අන්ධකාරය මැද දිරාපත් වූ ඇට සැකිලිවලය. ජයග්‍රාහී ආර්‍ය්‍ය ජනයා ඒ ලියවිලි කියවීමට කිසි විටෙක මහන්සි ගත්තේ නැත. අදත් ඒ පරාජිත වූ ආර්‍ය්‍ය ජනයා හෙළා දකිනු ලැබූ, අමතක කර දැමූ ජන කොට්ඨාශයකි. ශිෂ්ටාචාරයෙන් ආඩම්බර වූ ආර්‍ය්‍ය ජනයා ඔවුන් දෙස කවදාවත් හැරී නොබලති. ඔවුන්ගේ සංස්කෘතිය තේරුම් ගැනීමට උත්සාහ නොකරති. මමත් බනවාරිත් ඒ ජයග්‍රාහී ජාතියට අයත් වූවෝ වෙමු. මහලු දෝබරු පන්නා, තරුණ ජගරු හා භානුමති ඒ පරාජිත පැගුණ ජනයා නියෝජනය කරන්නෝ වෙති. අපි දෙගොල්ලේ සෑදෑ අඳුරේ මුහුණට මුහුණ ලා සිටියෙමු. ශිෂ්ටාචාරවීම නිසා ඇතිවූ ගර්වය නිසා මම දෝබරු පන්නා මහලු සාංවතාල් කුලිකරුවකු සේ දුටුවෙමි. භානුමති කුමරිය ගැමි තරුණියක සේ දුටුවෙමි. ඔවුන් මට ආඩම්බරයෙන් පෙන්වූ රාජ ප්‍රාසාදය හුතයන් අරක් ගත් තැනකට උපමා කළෙමි.

රාත්‍රී අඳුරෙන් සොහොන් බිම හා නුග ගස් සෙවණ වැසී යන්නට පෙර අපි පර්වතයෙන් බැස ආවෙමු.

ආපසු එන අතරමගදී එක් තැනක රතු සිංදූර් තැවරූ සෘජු ගලක් හමුවිය. ඒ අසල මිනිසුන් විසින් සිටුවන ලද දහස්පෙතියා සහ සන්ධ්‍යාමණී මල් ගස් විය. එයට ඉදිරියෙන් සින්දූර තැවරූ තවත් ගලක් හමුවිය. එය දේවාලයකි. බොහෝ කලක පටන් රජ පෙළපතේ කුලදේවතාවන් සඳහා එය වෙන්වී තිබෙන්නට ඇත. කලින් මෙහි නර බිලි පූජා සිදුවී ඇත. දැන් ඒ වෙනුවට පරවියන් හා කුකුළන් බිලි දෙන බව අසන්නට ලැබිණ.

"ඒ දෙවියන්ගේ නම මොකද්ද?" මම ඇසුවෙමි.

"ටාංඩිබාරෝ. කුළු හරකුන්ගේ දේවතාවා." යනුවෙන් දෝබරු පන්නා රජු පිළිතුරු දුන්නේය.

පසුගිය ශීත කාලයේ ගනු මහතෝ කිවූ කතාව මට සිහිවිය. "ටාංඩිබාරෝ කියන්නේ නිතරම සෝදිසියෙන් ඉන්න දෙවි කෙනෙක්. ඒ දෙවියෝ නොහිටින්න අංවලටයි හමටයි ඇති ආසාව නිසා මිනිස්සු කුළු හරක් වද කරලා ඉවරයි. උන් මොකක් හරි උගුලක වැටෙන්න යනවා නම් දෙවියෝ ඉස්සරහට ඇවිත් අත් උස්සලා උන්ව නවත්වනවා. හුහක් මිනිස්සු දැකලා තියෙනවා ඒක." දෝබරු පන්නා කීය.

බොහෝ දිනකට පසු කල්කටාවට පැමිණි විට පොසොන් මාසයේ ග්‍රීෂ්ම දිනයක රියකරුවෙකු එහි වූ මීහරකුන් දෙදෙනෙකුට විස පොවා අනුකම්පා විරහිත ලෙස මරා දමන අයුරු දුටුවෙමි. එදින මට සිතුණේ "අහෝ ටාංඩිබාරෝ දෙවියනි! මෙය කුඩා නාග්පුරය හෝ මධ්‍ය ප්‍රදේශයේ ආරණ්‍ය භූමිය හෝ නොවේ. ඔබගේ දයාවූ හස්තයෙන් මොවුන් කෙසේ බේරා ගන්නද? මේ විසිවෙනි සියවසේ ආර්‍ය්‍ය සභ්‍යත්වයක් ඇති කල්කටාවයි. පරාජිත ආදිවාසී දෝබරු පන්නා මෙන්ම ඔබද අසරණය." කියාය.

මම නටාදාහි සිට බස් රථයකින් ගයාවට ගොස් එන්නෙමි යයි කියා එතැනින් පිටත් වූයෙමි. බතවාරි මගේ අශ්වයා රැගෙන කුඩාරමට ගියේය. ආපසු එද්දී තවත් වරක් මට හාතුමති කුමරිය හමුවිය. ඇය මට දීම පිණිස මී කිරි බඳුනක් ගෙන රජුගේ නිවස ඉදිරියේ රැඳී සිටියාය.

12

දිනක් රාජු පාංඩේ මට දන්වා එවුයේ ඔහුගේ කුඹුරේ වීන ධාන්‍ය ඌරන් විසින් වනසනු ලබන බවය. ඒ අතර වූ උල් දත් සහිත ලොකු වල් ඌරන් පලවා හැරීමට බෙලෙක්කවලට ගසා ශබ්ද කරනු ඇරෙන්නට ඔහුට කළ හැකි දෙයක් නොවිය. එත්තෙන් කිසියම් උදව්වක් නොලැබුණොත් ඔහුගේ අස්වැන්න සියල්ලම විනාශ වනු ඇත.

ඒ ගැන අසා තුවක්කුවත් රැගෙන සවස් වරුවක මම එහි ගියෙමි. රාජුගේ ඉඩමත්, පැල්පතත් තිබුණේ බයිහාරයේ සන කැලෑව මැදය. එහි වෙනත් අය පදිංචිව සිටියේ නැත. ඔහුගේ ධාන්‍ය කෙතට වන සතුන්ගෙන් බොහෝ හානි සිදු වූ නිසා අස්වැන්නද අඩු වී ඇති බව පෙනිණ.

මා යන විට රාජු කුඹුරේ වැඩ කරමින් සිටියේය. ඔහු මා දැක දුවගෙන ආවේය. ඔහු මගේ අශ්වයා ගෙන ගොස් අසල වූ අරළු ගහේ බැන්දේය.

"රාජු හුහ කාලෙකින් දැක්කෙත් නෑ. ඔපිස් එක පැත්තේ ආවේ නැත්තේ ඇයි?" මම ඇසුවෙමි.

රාජුගේ පැල්පත වටේම දිගට වැඩුණු තෘණ පඳුරු විය. ඒ අතර තුර කේංද් සහ අරළු ගස් විය. ඔහු මේ පාළු වනයේ තනිව සිටින්නේ කෙසේද? දවස ගෙවෙද්දී වත් කිසිවෙකු සමග කථා බහ කිරීමට මගක් මෙහි නැත. මොහු පුදුම කෙනෙකු යයි මට සිතිණ.

"කොහේවත් යන්න වෙලාවක් නෑ සර්. කුඹුර පරිස්සම් කරලම මගේ හොඳ පණ යනවා. ඒ මදිවට හරක් බලන්නත් තියෙනවනේ."

මී හරකුන් තුන්දෙනෙකු ඇති කිරීමටත් අක්කර හාගයක ඉඩමක් වගා කිරීමටත් කාලය ගත කළ විට ඔහුට කිසිවෙකු ආශ්‍රය කිරීමටවත් වේලාවක් නැතිවූයේ කෙසේ දැයි ප්‍රශ්න කිරීමට මට උවමනා වුවත් ඊට පෙර රාජු තමාගේ දින චරියාව පිළිබඳ විස්තරයක් කළේය. ඒ ඇසූ මට පෙනී ගියේ ඔහුට හුස්ම ගැනීම්වත් වේලාවක් නැති බවය. කුඹුරේ වැඩ කිරීම, හරකුන් බැලීම, කිරි දෙවීම, වෙඩරු සෑදීම, දිනපතා දේව පූජා පැවැත්වීම, රාමායනය කියවීම, කෑම පිසීම ආදී වැඩ වට්ටෝරුව අසා සිටින විට මටද මහන්සියක් දැනුණි. මේ හැරෙන්නට රාත්‍රිය පුරා අවදිවී බෙලෙක්කවලට ගැසීම්ටද ඔහුට සිදුවේ.

"කොයි වෙලාවටද වල් ඌරෝ එන්නේ?" මම ඇසුවෙමි.

"ඒක හරියට කියන්න බෑ සර්. රෑ වුනාම තමයි එළියට එන්නේ. බලාගෙන ඉන්නකෝ. එතකොට පෙනෙයි කොච්චර එනවද කියලා."

එසේ වුවද වඩාත්ම මා තුළ කුතූහලය අවුස්සන සුළු කාරණය වූයේ රාජු මේ පාළු ස්ථානයේ තනිව සිටින්නේ කෙසේද කියාය. මම ඒ ගැන ඔහුගෙන් විමසුවෙමි.

"මට ඒක පුරුදු වෙලා මහත්තයා. මං හුහ කාලෙක ඉඳන් තනියම තමයි ඉන්නේ. එහෙම ඉන්න එක මට දුකක් නෙවෙයි. මං

නිදහසේ ඉන්නවා. මුළු දවසේම වැඩ කරලා හැන්දෑ වෙන කොට හජන් ගීත කියලා, දෙවියන් සිහිකරලා දවස ගෙවා ගන්නවා."

රාජු, ගනු මහතෝ, ජයපාල වැනි බොහෝ දෙනෙක් මෙහි සිටිති. ඔවුන් තුළින් මම මට නුහුරු වූ නව ලෝකයක් දුටුවෙමි.

රාජු සමහර දේවලට තදින් ආසා කරන බව මම දැන සිටියෙමි. ඔහු තේ බීමට ඉතා කැමතිය. කැලය මැද සිටියදී තේ කොළ සිනි සපයා ගැනීමට පහසුවක් නැත. මේ නිසා මම තේ කොළ සිනි රැගෙන ආවෙමි.

"රාජු තේ වත්කරන්න ලෑස්ති කරන්න. මං ඕන කරන දේවල් ගෙනාවා."

රාජු මහත් සතුටකින් යුතුව භාජනයකට වතුර දමා ළිපේ තැබීය. තේ වත් කළත් එහි එක් පිත්තල භාජනයක් හැරෙන්නට වෙනත් බඳුනක් නොවීය. මට පිත්තල බඳුනට තේ හදා දී ඔහු වතුර උණු කළ ලොකු භාජනයෙන්ම තේ බොන්නට විය.

රාජු හින්දි ලියන්නට කියවන්නට දැන සිටියත් බාහිර ලෝකය ගැන ඔහු කිසිවක් දැන සිටියේ නැත. කල්කටාව ගැන ඔහු අසා ඇතත් ඒ නගරය ගැන වැඩි යමක් ඔහු දැන සිටියේ නැත. බොම්බාය හෝ දිල්ලිය ගැන ඇති ඔහුගේ දැනුම වන්දයා ගැන ඇති දැනුම මෙන් අපැහැදිළි එකක් විය. නගරවලින් ඔහු දැක තිබුණේ පූර්ණියා නගරයයි. එහිද ගොස් සෑහෙන කලක් ගතවී ඇත. එහි ගොස් ඇත්තේ ටික දිනකටය.

"රාජු මෝටර් වාහන දැකල තියෙනවද?"

"නෑ. සර්. මං අහලා තියෙනවා ඒවා ගොන්නුවත් අශ්වයින් වත් අදින්නේ නැතිව දුම් දාගෙන නිකම්ම දුවනවා කියලා. මේ වෙන කොට පූර්ණියා ටවුමටත් මෝටර් වාහන ඇවිල්ලලු. මං හුඟ කාලෙකින් එහේ ගියේ නැනේ. අපි දුප්පත් මිනිස්සුනේ. ටවුන් වලට යන්න සල්ලි එපායැ?"

කල්කටාවට යාමට කැමති දැයි මම රාජුගෙන් විමසුවෙමි. යාමට කැමති නම් ඔහුව කැඳවාගෙන ගොස් කල්කටා නගරය පෙන්වීමට මට හැකි බවත් ඒ සඳහා මුදල් අවශ්‍ය නැති බවත් මම කීවෙමි.

"ටවුම කියන්නේ මහ නරක තැනක් මහත්තයා. එහේ හොරු, දාමරිකයෝ, සූදු කාරයෝ පිරිලාලු. එහේ ගියාම තමන්ගේ කුලේ පිරිසිදු කමත් නැති වෙනවලු. එහේ හැමෝම මහ නක්කඩි මිනිස්සු.

අපේ ගමේ එක මිනිහෙක් කොහේදෝ ටවුමක ඉස්පිරිතාලෙකට ගියාලු, කකුලෙ අමාරුවකට බෙහෙත් ගන්න. දොස්තර පිහියකින් කකුල ටිකක් කපලා ඇහුවලු මට සල්ලි කීයක් දෙනවද කියලා. එයා කිව්වලු රුපියල් දහයක් දෙන්නම් කියලා. එතකොට දොස්තර කකුලෙන් තව ටිකක් කපලා ආයිත් ඇහුවලු සල්ලි කීයක් දෙනවද කියලා. එයා කිව්වලු තව රුපියල් පහක් දෙන්නම් දොස්තර මහත්තයෝ තවත් කකුල කපන්න එපා කියලා. දොස්තර ඒ සල්ලි මදි කියලා කකුල කපන්න පටන් ගත්තලු. ඒ දුප්පත් මිනිහා අඬද්දී දොස්තර කකුල සම්පූර්ණයෙන්ම කපල දැම්මලු. බලන්න සර් වෙච්ච වැඩේ."

රාජුගේ කථාව අසා මට සිනාව නවත්වා ගත නොහැකි විය. අහසේ දේදුන්න පායා ඇති විටෙක දිනක් ඔහු මට කීවේ "ඔය පේන දේදුන්න නගින්නේ වේ තුඹසකින් මහත්තයා. මං මගේ ඇස් දෙකෙන් දැකලා තියෙනවා." යනුවෙනි.

රාජුගේ පැල්පත ඉදිරියේ උස් ගසක් විය. අපි ඒ ගස යට හිඳගෙන තේ බීවෙමු. දැස් යොමු වන හැම පැත්තේම වූයේ ඝන කැලෑවයි. කේංද්, නෙල්ලි ආදී ගස් ද මල් වැල්වලින් වැසී ගිය පඳුරු ද, එහි විය. මල් වලින් නිකුත් වූ මුදු සුවඳක් සන්ධ්‍යා වාතය මිහිරි බවට පත් කළේය. මට සිතුණේ එවැනි තැනක හිඳ තේ බීමට ලැබීමත් ජීවිතයේ සොඳුරු අත්දැකීමක් බවය. එවැනි තැනිතලාවක් අසල වනයෙන් වට වූ පැල්පතක් ඉදිරියේ රාජු වැනි මිනිසකු සමග ගත කිරීමේ අවස්ථාවක් පහසුවෙන් හමුවේද? මේ අත්දැකීම විචිත්‍ර වූ එකක් මෙන්ම ලබා ගැනීමට අපහසු එකකි.

"රාජුගේ පවුල එක්ක එන්නේ නැත්තේ මොකද? ඔව්වර මහන්සි වෙලා කෑම උයාගෙන කන්න වෙන්නේ නැනේ එතකොට." මම කීවෙමි.

"පවුල දැන් නෑ සර්. අවුරුදු දාහතක්, දහ අටක් වෙනවා මැරිලා. එයින් පස්සේ මට ගෙදර ඉන්න හිතෙන්නේ නෑ."

රාජුගේ ජීවිතයට සම්බන්ධ වූ ආදර කතාවක් ඇත. රාජු කී කථාව ඇසූ විට එය හැඳින්විය යුත්තේ ආදර කතාවක් කියා මිස අන් නමකින් නොවන බව සිතිණ.

රාජුගේ බිරිඳගේ නම සරයූ විය. ඒ කාලයේ රාජුගේ වයස අවුරුදු දහ අටක් වූ අතර සරයූ දහහතර වන වියේ පසු වූවාය. ඒ කාලයේ උතුරු ධරම් පුරයේ ශ්‍යාම්ලාල් නම් ගමේ සරයූගේ පියාගේ පාසලේ රාජු ව්‍යාකරණ උගනිමින් සිටියේය.

"කොච්චර කල් ඉගෙන ගත්තද?" මම ඇසුවෙමි.

"ඒ තරම් කාලයක් නෙවෙයි මහත්තයා. අවුරුද්දක් විතර ඉගෙන ගත්තා. විභාගෙට ඉන්න බැරිවුණා. අපි ඉස්සෙල්ලම අදුන ගත්තේ එතනදි. ඊට පස්සේ ටිකින් ටික ....."

රාජු මදක් කහිමින් සිට නිහඬ විය.

මම ඔහුව උනන්දු කරවූයෙමි.

"ඉතින්? කියන්න මොකද වුනේ? ඒකට කමක් නෑ. කියන්න."

"දවසක් එයාව දැකගන්න මං ගහකට මුවාවෙලා හිටියා. ඒ වෙන කොට එයාව වැඩිය මුණ ගැහෙන්න අවස්ථාවක් ලැබිලා තිබුණේ නෑ. ඒ දවස්වල එයාට මංගල්ලෙකුත් කථා කරලයි තිබුණේ. ගෑනු ළමයි කට්ටිය සිංදු කිය කියා මගේ ළඟින් යන කොට එයා මාව දැක්කා. එයා ..... එයා ..... මා එක්ක හිනා වුණා. මාත් හිනා වුණා. මං ඉඟියෙන් කිව්වා ටිකක් පහුවෙලා යන්න කියලා. එයා අතින් ඇඟෙව්වා දැන් නෙවෙයි ආපහු යන කොට පහුවෙන්නං කියලා."

වයස අවුරුදු පනස් දෙකක් ගතවී ඇතත් ඒ විස්තරය කියන විට රාජුගේ මුහුණෙන් පිළිබිඹු වූයේ වයස අවුරුදු විස්සක තරුණ ප්‍රේමවන්තයෙකුගේ මෙන් ලැජ්ජාශීලී බවකි. දෙනෙත්වල සිහිනමය බැල්මක්ද විය. ජීවිතයේ කලකට පෙර, නව යොවුන් වියේ වාසනාවන්ත දිනවල ඒ තරුණිය දාහතර හැවිරිදි වූවාය. දැන් ඔහුගේ මැදි වයසේ පසුවන හුදකලා වූ ආත්මය තවමත් ඇය සොයා ඇදෙයි. වනාන්තරයක් මැදට වී තනියම වාසය කිරීමෙන් වෙහෙසට පත්වූ ඔහුගේ සිත නොඉවසිලිමත්ව ඇදෙන්නේ බොහෝ කලකට පෙර සිටි, දැනට මිහිපිට නැති, ඔහු බොහෝ ආදරය කළ සරයූ නමැති බාලිකාව දෙසටයි.

ඔහුගේ කථාව මට මහත් සේ ප්‍රිය විය.

"ඉතින්? ඉතින්?"

"ඊට පස්සේ ආපහු යනකොට එයා යාළුවො කට්ටිය මග ඇරලා පහුවුණා. මම කිව්වා සරයූ, මට ඔයා මුණ ගැහිලා කථා කරන්න ලැබෙන්නේ නැති එක ගැන හරි දුකයි. මට ඉගෙන ගන්න හිතෙන්නෙත් නෑ. මට හිතෙන්නේ මේ මාසේ අන්තිමට ඉගෙනීම අතහැරලා යන්න කියලයි. ඒක අහලා සරයූ අඬන්න පටන් ගත්තා. එයා ඇහැව්වා, මේ ගැන තාත්තට කියන්නේ නැත්තේ ඇයි කියලා. සරයූ අඬනව දැකලා මට ඉවසගෙන ඉන්න බැරිවුණා. ගුරුතුමාට

මේ ගැන කියන්න කොහොමටත් බැරුව හිටියේ. අන්තිමේදී මං ගුරුතුමාට මේ ගැන කිව්වා. අපේ කසාදෙට කිසිම බාධාවක් තිබුණේ නෑ. එකම කුලයේ එකම තත්ත්වයේ අය නිසා. අපේ කසාදේ සිද්ද වුණා."

ඔහුගේ ආදර කථාව ඉතා සරල, සාමාන්‍ය එකක් විය. නගරයේ කලබලය මැද හිඳිද්දී මේ කථාව ඇසුවා නම්, කිසිම වැදගත් කමක් නැති එකක් යැයි මා එය නොතකා හරිනවාට කිසිම සැකයක් නැත. එසේ වුවත් මේ පරිසරයේදී අසන විට එය නැවුම් වූද, සෞන්දර්යාත්මක වූද, කථාවක් ලෙස මට හැඟී ගියේය. ගැහැනියක හා පිරිමියකු තමන්ගේ ජීවිතයේදී එකිනෙකා ලබාගත් ආකාරය තුළ කිසියම් චමත්කාරයක් අන්තර්ගත වන බව එදින මට හැඟිණි.

තේ බීම අවසන් කළ විට රෑ බෝවී අහසේ සඳ නැග ආවේය. එදින පුරපස සයවක දිනයක් විය. මම තුවක්කුව රැගෙන නැගිට්ටෙමි.

"යමු රාජු, කුඹුරට වල් ඌරෝ එනවද කියල බලමු."

රාජු කුඹුර අයිනේ වූ ලොකු ගසක් මට පෙන්වීය.

"මේ ගහට නගින්න ඕනෑ සර්. මං අද උදේ ගහ උඩ මැස්සක් හැදුවා."

ගසට නැගීම අසීරු කටයුත්තක් බව මට පෙනී ගියේය. බොහෝ කලකින් මා ගසකට නැග නැත. රෑ බෝවූ පසු ගස් නැගීම වඩාත් අපහසු විය. එසේ වුවත් රාජු මා උනන්දු කරන්නට විය.

"අමාරු නෑ සර්. උණ පතුරු බැඳලා තියෙන්නේ. ළඟ ළඟ අතු බෙදිලත් තියෙනවා. නගින්න හරි ලේසියි."

මම රාජුගේ අතට තුවක්කුව දී ගසට නැග මැස්සේ හිඳ ගතිමි.

රාජු මා පිටුපසින් ගසට නැග්ගේය. අපි දෙදෙනා මැස්සේ හිඳගෙන පහළ වූ කුඹුරු දෙසට දෑස් යොමු කළෙමු.

සඳ එළිය පැහැදිළිව වැටෙන්නට විය. ගස මත හිඳගෙන සිටියදී ඉදිරියේ වූ වන සිරසෙහි සමහර තැන් පැහැදිලිවද නොපැහැදිලිවද දර්ශනය වන විට හිත තුළ අමුතුම හැඟීමක් ඇතිවිය. එයද මගේ ජීවිතයට අලුත් අත්දැකීමක් විය.

ටික වේලාවකට පසු සිවල් රංචුවල කෑගැසීම් හැම පැත්තෙන්ම ඇසෙන්නට විය. ඒ සමගම කිසියම් සතෙක් වනයේ දකුණු පැත්තේ සිට කුඹුරට ඇතුළු වනු අපි දුටුවෙමු.

"අර බලන්න සර්,"

මම තුවක්කුව එල්ල කළෙමි. ඌ යඳ එළිය ඇති තැනකට පැමිණි විට මා දුටුවේ ඒ නීලගායී නමින් හැඳින්වෙන ගෝනකු බවය.

ඌ මරන්නට උවමනාවක් නොවීය. රාජු "දුවපිය යන්න" යයි කී විට ඌ කැලය පැත්තට දිව්වේය. මම හිස් වෙඩිල්ලක් පත්තු කළෙමි.

පැය දෙකකින් පමණ දකුණු පැත්තේ කැලයෙන් වන සතකු කෑගසන හඬ ඇසිණ. උල් දත් සහිත ලොකු වල් ඌරෙකුට වෙඩි තබන්නට මා බලා සිටියත් ඌරු පැටියෙකුවත් දකින්නට ලැබුණේ නැත. හිස් වෙඩිල්ලක් පත්තු කිරීම මා කළ වැරැද්දක් බව මට පෙනී ගියේය.

"බැහැලා යමු සර්. තමුන්නාන්සේට කෑම ලෑස්ති කරන්නත් තියෙනවා."

"මොන කෑමද? මං දැන් ඔපීස් එකට යනවා. තවම රෑ දහය වුනේ නෑ. තවත් ඉන්න බෑ. හෙට උදෙන්ම සර්වේ එකට යන්න තියෙනවා."

"කෑම කාලා යන්න සර්."

"තව රෑ වුනාම බයිහාරයේ කැලේ මැද්දෙන් තනියම යන එක හරි නෑ. මං දැන්ම යන්න ඕනෑ. ඒ ගැන මොකුත් හිතන්න එපා."

මම අශ්වයා පිට නැග්ගෙමි.

"මං සැරෙන් සැරේ තේ බොන්න මෙහේ ආවට අමතාප වෙන්නේ නෑ නේද රාජු?" "මං තේ බොන්න කැමති හින්දා සර් සීනි තේ කොළත් අරගෙන ඇවිත් මාත් එක්ක තේ බොනවා. ඔය විදිහට කතා කරලා මට ලැජ්ජා කරන්න එපා සර්."

රාජු දෙස හොඳින් බැලූ විට මට සිතුණේ ඔහු තවමත් කඩවසම් පෙනුමක් ඇති අයෙකු බවය. තරුණ වයසේදී ඔහු කෙතරම් ලස්සනට සිටින්නට ඇද්ද? ගුරුතුමාගේ දියණිය වූ සැරයූ තමාගේ පියාගේ කඩවසම් ශිෂ්‍යයා දෙසට ආකර්ෂණය වීම ගැන පුදුමයක් නැත.

රාත්‍රිය ගතවෙමින් තිබිණ. මම තනිව තැනිතලාව හරහා පැමිණියෙමි. ඒ වෙලාවේ සඳ එළිය නොතිබුණු අතර කොතැනකවත් ආලෝකයක් පෙනෙන්නට නොවීය. එහි පැවැතියේ ගුප්ත නිහැඬියාවකි. මට දැනුණේ මා ජනශූන්‍ය ග්‍රහ ලෝකයක ගමන් කරන්නාක් මෙනි. කෂිතිජය රේඛාව පැත්තෙන් වෘශ්චික රාශියේ තාරකා පායා

දිලෙන්නට විය.මගේ හිසට ඉහළින් දිලෙන අසංඛ්‍ය වූ ලෝකත් පහළින් බයිහාරයේ නිහඬ වනාන්තරයත් දකිමින් මම ඉදිරියට ගමන් කළෙමි. කෂිණ වූ තාරකා එළියෙන් තුරු හිස් අඳුරු පැහැයෙන් දිස්විය. ඈත කොහේදෝ තැනකින් සිඟාලයින්ගේ ඝෝෂාවක් මතුවිය. ඈත මෝහනපුරා රක්ෂිත වනයේ මායිම් රේඛාව දීර්ඝ වූ කලු පැහැති පර්වත පෙළක් සේ අඳුරේ පෙනිණ. කිසියම් කෘමියෙකුගේ ඒකාකාරී වූ හඬක් දිගටම ඇසෙන්නට විය. ක්‍රී---ඊ.....ඊ.....ඊ.....හොඳින් කන් යොමා ඇසූ විට ඒ හඬත් සමග මුසුවූ තවත් කෘමීන් දෙතුන් දෙනෙකුගේ හඬවල් අසන්නට ලැබිණ. ස්වභාව ධර්මයා සමග දැඩි සබඳතාවක් ඇතිකර ගැනීමෙන් ලැබෙන සතුට කෙතරම් වේදැයි මට අවබෝධ විය. එහි විශේෂත්වය වූයේ එතුළ කිසියම් ඇපැහැදිලි රහසක් සැහවී තිබීමයි. ඒ රහස කුමක්දැයි මා නොදන්නා නමුත් එවැනි පරිසරයකින් පිටතට ගිය විට කිසිම දිනක එවැනි දෙයක් ගැන හැඟීමක් වත් සිතට නොඑයි.

ලොව මවන දෙවියන් විශ්වයේ ග්‍රහ තාරකා මැද සිට ඒ නිහඬ රාත්‍රියේ නිර්මාණය ගැන කල්පනාවේ නිමග්නව සිටින සේය. ඈත අනාගතයේ නව විශ්වයක් නිර්මාණය කිරීම ගැනත්, නව සෞන්දර්‍යයක් ඉපැදවීම ගැනත්, නව ජීවීන් ඉපැදවීම ගැනත් සිතන ඔවුන්ගේ සිතිවිලි තවම බීජ අවස්ථාවේ විය හැක. දැනුම ගැන නොඉවසිලිවන්ත පිපාසයෙන් යුතු වූද, නොනවතින අවකාශයක් හරහා පැමිණෙන ජීව විශේෂයන්හි විශාලත්වය හා ක්‍ෂුද්‍රභාවය පිළිබඳව අවධානයෙන් යුතු වූද, එයින් සතුටක් ලබන්නාවූද, අය පමණක් මේ රහස ග්‍රහණය කර ගනිති. ජන්ම ජන්මාන්තරවල සිට එන මගක් ඔස්සේ දීර්ඝ වූ ගමනක් එන, වර්තමානයේ ගතකරන කෙටි ජීවිතයේ දුක්ඛ දෝමනස්සයන් දිය බිඳක් සේ වියලවා හරින කෙනෙකුගේ ආත්මයකට පමණක් මේ රහස දැකිය හැක.

"නායමාත්මා බලහීනේන ලභ්‍යඃ"

එවරස්ට් කඳු මුදුනට නැගීමට ගොස් හිම ප්‍රවාහයකට හෝ කුණාටුවකට හෝ අසුවී ජීවිතය දුන් අයට මේ විශ්වයේ විශාල ස්වරූපය ගැන හැඟීමක් ඇතිවන්නට ඇත. කොලොම්බස් ආජෝරස් දූපතේ වෙරළේ සිට, මුහුදේ පාවී එන ලී කැබලිවලින් හා සමුද්‍රයෙන් එහා පිහිටි නොදන්නා මහා දේශයක තොරතුරු දැනගැනීමට උත්සාහ කරන විට විශ්වයේ මේ ස්වභාවය ගැන ඔහු තුළ හැඟීමක්

ඇතිවන්නට ඇත. තමාගේ නිවසේ සිට දුම් උරමින්, අසල්වැසියාගේ දියණියගේ විවාහය ගැන හෝ කුලයේ පිරිසිදුකම ගැන සිතමින් සිටින අයට මෙවැනි ස්වරූපයක් හෘදයංගම බවට පත්කර ගැනීමට කිසිසේත්ම නොහැකිය.

මිඟි නදියේ උතුරු ඉවුරෙන් එහාවූ පර්වත අතර මිණුම් කටයුතු පැවැත්වෙන්නට විය. එහි ගොස් දින දහයක පමණ කාලයක සිට කුඩාරම් ගසාගෙන සිටියෙමි. තවත් දින දහයක් දොළහක් මෙහි නැවතී සිටීමට සිදු වනු ඇත.

අපේ වත්තේ සිට බොහෝ දුරින් පිහිටි ඒ ස්ථානය දෝබරු පන්නා රජුගේ රාජධානිය අසල විය. මා රාජධානියක් ගැන සඳහන් කළත් ඔහු රාජ්‍යයක් නැති රජෙකි.

එය චමත්කාරජනක ස්ථානයක් විය. විවෘත තැනිතලාවේ පසුපස කෙළවර පර්වත පෙළ නිසා සංකීර්ණ බවට පත්වී තිබිණ. අශ්ව ලාඩමක හැඩය ගත් මිටියාවත අපිළිවෙළට හටගත් ගස් වැල්වලින් යුක්ත විය. සෑම පැත්තකම දකින්නට ලැබුණේ ලොකු හා කුඩා ගල් පර්වතය. කටු උන පඳුරු හා නානා ප්‍රකාර වූ වෘක්ෂලතා එහි දක්නට ලැබිණ. උතුරු දිශාවේ සිට කුඩා දොළපාරවල් බොහෝ ගණනක් නිදහස් මිටියාවත හරහා ගලා බසියි. දොර පාරවල් දෙපස වඩාත් ඝනව ගස්කොළන් වැවී තිබිණ. ඒ පළාතේ කලක් ගතකිරීමෙන් ලද අත්දැකීමක් අනුව මෙවැනි තැන්වල වලසුන් සිටිය හැකි බව දැන සිටියෙමි. එහි මුවෝද සිටියහ. රාත්‍රියේ දෙවැනි ප්‍රහරයේදී වලිකුකුළන්ගේ හඬද සිවලුන්ගේ කෑගැසීම් ද ඇසුණි. එහි ව්‍යාඝ්‍රයින් සිටින බවක් දැනගන්නට නොවීය.

අප සිටි තැනට නැගෙනහිර පැත්තේ වූ පර්වතය අසල විශාල ගල්ගුහාවක් විය. ගුහාව ඉදිරියේ වූයේ විශාල නුග ගසකි. දහවල් වරුවල නිල් අහස යට සිටිද්දී පාළු මිටියාවතත්, ගල්ගුහාවත්, පැරණි යුගයක දර්ශනයක් සිහිපත් කරවිය. දෝබරු පන්නාගේ මුතුන් මිත්තන් මෙන් පැරණි ආදිවාසීන්ගේ රජකු මේ පර්වතය තම වාසභවන බවට පත් කර ගන්නට ඇත. ගුහාවේ චිත්‍රයක් වැනි සටහනක් කොටා තිබිණ. කුමක්දැයි තේරුම් ගත නොහැකි තරමට ඒ වන විට එය අපැහැදිලි ව තිබිණ. වනගත ස්ත්‍රී පුරුෂයින් විඳි සැප දුක් ආදියත් වනචාරී සමාජයේ රළු බවින් පීඩාවට පත් අයගේ කඳුළු කතාවල නොලියූ ඉතිහාසයත් ගල් ගුහාවේ පොළොවේද, අවට

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

වාතයේද, ගල් බිත්තියේද, ලියැවී තිබිණ. ඒ ගැන සිතීමද ආස්වාදජනක අත්දැකීමක් විය.

ගුහාවට මඳක් ඈතින් වූ දොළ පාර අසල වූ තැනිතලා බිමක පැල්පත් දෙකක් විය. ඉන් එක පැල්පතක් අනිකට වඩා කුඩා විය. පැල්පත් ඉදිරියේ ගල් තුනක් තබා ළිපක් සාදා තිබිණ. ඒ අසල වූ ඉදි පඳුරක අතු මුළු මිදුලම සෙවණ කළේය. පිටතින් ආ පවුලක් එහි පදිංචිව සිටියහ. ගෙහිමියාගේ දියණියන්ගෙන් එක් අයෙක් අවුරුදු දහ අටක් පමණ වයස් වූ අතර අනික් ළමයා තුදුස් හැවිරිදි පමණ විය. ඔවුන් දෙදෙනා කළු පැහැති වුවත් නිරෝගී මටසිළුටු සිරුරෙන් යුක්ත වූ අතර ඔවුන්ගේ මුහුණුවල කිසියම් අහිංසක ගතියක්ද සුන්දරත්වයක්ද විය. හැමදිනම උදයේ මීහරකුන් දක්කාගෙන තණකොළ කැවීමට පර්වත ඇති දෙසට යන ගැහැනු ළමයි දෙදෙනා හැන්දෑවට පෙරළා නිවසට පැමිණෙති. මා අපේ කුඩාරමට පැමිණ සවස තේ බොන විට ගැහැනු ළමයින් දෙදෙනා මීහරකුන් දක්කාගෙන ආපසු ගෙදර යනු මට පෙනේ.

දිනක් වැඩිමහලු ගැහැනු ළමයා කුඩාරම අසල නැවතී තමාගේ නැගණිය මා අසලට එව්වාය.

"මහත්තයා මෙහේ බීඩි තියෙනවද? අපේ අක්කා ඉල්ලනවා."

"ඔයගොල්ලෝ බීඩි බොනවද?"

"මං බොන්නේ නෑ. අපේ අක්කා බොනවා. තියෙනවා නම් දෙන්න මහත්තයා."

"මං ළඟ බීඩි නෑ. සුරුට්ටු තියෙනවා. ඒ වුනාට ඒවා දෙන්න බෑ. හරි සැරයි. ඒවා බොන්න බෑ."

ගැහැනු ළමයා යන්නට ගියාය.

මම ටික වේලාවකට පසු ඔවුන්ගේ නිවසට ගියෙමි. මා දුටු ගෙහිමියා පුදුමයට පත් වූ නමුත් මා ගෞරවයෙන් පිළිගෙන හිඳගන්නට සැලැස්වූයේය. ගැහැනු ළමයි දෙදෙනා සල් කොළවලට ඉරිහු බත් බෙදාගෙන කෑමට සූදානම්ව සිටියාය. ඒවා කෑමට ලුනු හැරෙන්නට ව්‍යංජනයක් නොවීය. ඔවුන්ගේ මව කිසියම් ව්‍යංජනයක් ළිපේ තබා තිබුණාය. කුඩා දරු දැරියෝ සෙල්ලම් කරමින් සිටියහ.

ගෙහිමියාගේ වයස අවුරුදු පනහකට වැඩි වන්නට ඇත. ඔහු නිරෝගී ශක්තිමත් සිරුරක් ඇති කෙනෙක් විය. මා ඇසූ දෙයට පිළිතුරු වශයෙන්, ඔවුන් සිවුනි පළාතේ සිට පැමිණි බවත් මීහරකුන් ඇති කිරීමට සුදුසු පරිසරයක් හා බීමට පිරිසිදු ජලය ඇති නිසා

වසරකට පමණ පෙර මෙහි පැමිණ පදිංචි වූ බවත් ඔහු කීවේය. ඒ හැරෙන්නට කැලයේ ඇති උණ පතුරුවලින් කුඩා පෙට්ටි සහ හිසට ඉහළන වට්ටි ආදිය තැනීමට හැකි බවත් ඔහු කීවේය. මහා ශිව රාත්‍රි උත්සවය පැවැත්වෙන දිනවල අඹිලකුවාවේ පැවැත්වෙන සැණකෙළියේදී වට්ටි පෙට්ටි විකුණා මුදල් උපයාගත හැකිය.

"මෙහෙ කොච්චර කල් ඉන්න හිතාගෙන ඉන්නවද?" මම ඇසුවෙමි.

"ඔහේ හිතිච්ච කාලයක් ඉන්නවා. මේ පැත්ත හරි හොඳයි. වෙන කොතැනකවත් අපි අවුරුද්දක් ඉන්නේ නෑ. මෙහේ කරදරයක් නෑ. ගල් පර්වත තියෙන පැත්තේ කැලෑවේ හරියට අනෝද පලගන්නවා. වප් මාසේ දිහාවට මේ කෙල්ලෝ දෙන්නා කුඩා දෙක ගානේ ගහේ ඉදිච්ච අනෝද අරන් එනවා. අපි මාසයක් දෙකක් ඒවාම කනවා. අහන්න මේගොල්ලන්ගෙන්."

කෑම ගනිමින් සිටි ලොකු ගැහැනු ළමයා ආලෝකමත් වූ මුහුණින් යුතුව කථා කළාය.

"ශහ්. එක තැනක් තියෙනවා. මේපැත්තේ පර්වතයක් අයිනේ. අනෝදා ඉදිලා බිමත් වැටිලා තියනවා. කවුරුවත් ගේන්න යන්නේ නෑ. අපි කුඩා පුරෝලා අරන් එනවා."

මේ අවස්ථාවේ කිසියම් කෙනෙක් වනාන්තරය පැත්තේ සිට පැමිණ පැල්පත ඉදිරියේ සිට කථා කළේය.

"සීතාරම් දෙවි පිහිටයි! මට ගින්දර ටිකක් දෙන්න පුළුවන්ද?"

"එන්න තාපසතුමෝ එන්න. වාඩිවෙන්න."

ඒ දෙස බැලූ විට මා දුටුවේ හැඩපලු ගෙතුණ හිසකෙස් සහිත මහලු තාපසයෙකි. තාපසයා මා දැක පුදුමයට පත්වුවා සේම බියෙන් හැකිළී පැත්තකට විය.

"තාපසතුමාට නමස්කාර වේවා!" මම කීවෙමි.

මට ආශිර්වාද කළත් තවමත් ඔහුගේ බිය පහව ගොස් නැති බව මට පෙනී ගියේය. ඔහු ධෛර්‍යමත් කරනු පිණිස මම කථා කළෙමි.

"තමුන්නාන්සේ කොහේද ඉන්නේ?"

මගේ කථාවට පිළිතුරු දුන්නේ ගෙහිමියාය.

"තාපස තුමා ඉන්නේ රුස්ස කැලේ මැද. අර ඈත පේන පර්වත දෙක ළඟ කැලේ. හුග කල් ඉඳලා එහේ ඉන්නේ."

මහලු තාපසයා හිඳගත්තේය. මම ඔහු දෙස බලා "කොච්චර කල් ඉඳලද එහේ ඉන්නේ?" යනුවෙන් ඇසුවෙමි.

මේ වන විට තාපසයාගේ බිය පහවී ගොස් තිබිණ.

"අවුරුදු පහළොවක දහසයක ඉඳලා මහත්තයා."

"තනියමද ඉන්නේ? එහේ කොටි, ව්‍යාඝ්‍රයෝ එහෙම ඉන්නවලු නේද? බය නැද්ද?"

"වෙන කොහේ යන්නද මහත්තයා? පරමාත්මය ගැන සිහි කරගෙන ජීවත් වෙනවා බය වෙන්නේ මොකටද? මගේ වයස කියන්න පුළුවන්ද මහත්තයා?"

මම කල්පනා කර උත්තර දුන්නෙමි.

"හැත්තෑපහක් විතර?"

තාපසයා සිනාසුණේය.

"නෑ මහත්තයා අවුරුදු අනූවටත් වැඩියි. අවුරුදු දහයක් මං හිටියේ ගයාව කිට්ටුව කැලේක. ඉජාරාබාද් කැලේ ගස් කපලා මිනිස්සු පදිංචි වෙන්න පටන් ගත්තට පස්සේ මං එහෙන් ආවා. අපට මිනිස්සු මැද්දේ ඉන්න බැනේ."

"මෙහේ ගල් ගුහාවක් තියෙනවා. තමුන්නාන්සේ ඒකේ ඉන්නේ නැත්තේ මොකද?"

"එකක් නොවෙයි මහත්තයා ගල් ගුහා ගොඩක් තියෙනවා. මං ඉන්න තැනත් ගුහාවක් වගේ තමයි. ඒකේ ඉහළින් වහලක් තියෙනවා. දෙපැත්තේ බිත්ති තියෙනවා."

"තමුන්නාන්සේ මොනවද කෑමට ගන්නේ? පිණ්ඩපාතේ යනවද?"

"මං පිට කොහේවත් යන්නේ නෑ. මහත්තයෝ. දෙවියෝ කොහොම හරි මට ජීවත් වෙන්න මග සලස්සලා දෙනවා. උන ගොබ තම්බලා කනවා. කැලේ බතල වගේ පැණිරස අල ජාතියක් තියෙනවා. ඒවත් කනවා. නෙල්ලියි. අනෝදයි මේ කැලේ හරියට තියෙනවා. මං නෙල්ලි හුහක් කනවා. දවසගානේ නෙල්ලි කන මිනිස්සු ඉක්මනට වයස යන්නේ නෑ. හුහ දවසක් තරුණයෝ වගේ ඉන්න පුළුවන්. ගමේ මිනිස්සු සැරෙන් සැරේ ඇවිත් කිරි හකුරු, ධාන්‍ය එහෙම දීලා යනවා."

"කොටි වලස්සු හම්බවෙලා නැද්ද කවදාවත්?"

"කවදාවත් නෑ. ඒ වුනාට දවසක් භයානක පිඹුරෙක් නම් කැලේ ඉන්නවා දැක්කා. උෆ නල් කඳක් වගේ මහතයි. උගේ ඇහේ

කලු පාට, කොළ පාට, රතුපාට වයිරන් වැටිලා තිබුණා. ඇස් දෙක ගිනි පුළිඟු වගේ. තාමත් ඌ කැලේම ඉන්නවා. මං දකින වෙලාවේ ඌ දොළ අයිනේ මුවෙක් අල්ල ගන්න හිතාගෙන ඉන්න ඇත්තේ. දැන් කොහේ හරි ගුලක හැංගිලා ඇති. සවස් උනා. එහෙනම් මං යන්නම් මහත්තයා."

තාපසයා ගින්දර රැගෙන යන්නට ගියේය. ඔහු වරින් වර ගින්දර ගෙන යාමට අවුත් ටික වේලාවක් කථා බහ කරමින් සිට යන බව මට දැන ගන්නට ලැබිණ.

මිටියාවතට අඳුර වැටී සඳ එළිය මඳින් මඳ පැතිරෙන්නට විය. තැනිතලාවේ වනය අමුතු නිහඬතාවයකින් පිරී ගියේය. පසෙකින් ගලා බසින දොළ පාරේ හඬත් වනයේ වළිකුකුලන් දෙතුන් දෙනෙකුගේ හඬත් පමණක් ඇසෙන්නට විය.

මම කුඩාරමට ගියෙමි. අතර මග වූ කොට්ට ගසක් අසල කණාමැදිරි රංචු දිළිසි දිළිසී සිටිනු මට දක්නට ලැබිණ. උන් වක්‍රාකාරව යමින්ද ඉහළ සිට පහළට විවිධාකාර ජ්‍යාමිතික හැඩ අඳුරු පසුතලයේ අඳිමින්ද සැරිසැරූහ.

* * * * * *

දිනක් වෙන්කටේශ්වර් ප්‍රසාද් නම් කවියා මා හමුවීමට පැමිණියේය. උස් කෙට්ටු, සිරුරක් ඇති ඔහු කලු කෝට් එකක් සහ මදක් කිළිටි ධෝතියක් හැඳ සිටියේය. ඔහුගේ වියළි හිසකෙස් අවුල් වී තිබිණ. ඔහු වයස අවුරුදු හතළිහ පසු කළ කෙනෙකු යයි සිතිය හැකි විය.

මා සිතුවේ ඔහු රැකියාවක් ඉල්ලාගෙන පැමිණි කෙනෙකු කියාය.

"මොකද්ද උවමනාව?" මම ඇසුවෙමි.

"මහත්තයා දැක ගන්නයි ආවේ. (ඔහු මා ඇමතිමට 'සර්' යන වචනය භාවිතා කළේ නැත.)

මගේ නම වෙන්කටේශ්වර් ප්‍රසාද්. අපේ ගම පැට්නාව පැත්තේ. දැන් පදිංචි වෙලා ඉන්නේ චක්මකි ජනපදයේ, මෙහේ ඉඳලා හැතැප්ම තුනයි තියෙන්නේ එහාට."

"ආ. ඉතින් මෙහේ ආපු කාරණේ?"

"මහත්තයා කරුණාකරලා මට අවසර දෙනවා නම් කියන්නම්. මං තමුන්නාන්සේගේ වෙලාව නාස්ති කරන්නේ නෑ."

SL UNLIMITED The spirit of Sri Lankan e-community

මා සිතුවේ ඔහු රැකියාවක් බලාපොරොත්තු වෙන බවය. මට 'සර්' යයි ආමන්ත්‍රණය නොකළ හෙයින් ඔහු මගේ ගෞරවයට පාත්‍ර විය.

"ඉදගන්න. හුහක් දුර ඉඳලනේ පයින් ආවේ. මේ ග්‍රීෂ්ම වෙලාවේ."

මට පෙනී ගියේ ඔහුගේ හින්දි කතාව බොහෝ ඔප මට්ටම් වූ එකක් බවය. මට හින්දි බසින් ඒ ආකාරයට කථා කළ නොහැක. වත්තේ වැඩ කරන හටයින් හා ගමේ මිනිසුන් සමග වැඩ කිරීමෙන් මා උගත් හින්දිය ඔවුන්ගේ ගැමි බසත් මගේ බෙංගාලි බසත් මිශ්‍රවී කැඳ හැළියක් වී ඇත. මෙවැනි උසස් වූ, ඔප මට්ටම් වූ හින්දි බසක් මට අසන්නට වත් ලැබී තිබුණේ නැත. මම පරිස්සමින් බස හසුරුවාගෙන කතා කළෙමි.

"ආපු කාරණේ කියන්නකෝ."

"මං තමුන්නාසේට ඇහෙන්න කවි ටිකක් කියන්නයි ආවේ."

මම පුදුමයට පත්වුයෙමි. කැලේ මැද සිටින මට කවි කියන්නට ඔහු තුළ උනන්දුවක් ඇති වූයේ කෙසේද?

"මහත්තයා කවියෙක්ද? සන්තෝසයි දැනගත්ත එක ගැන. මං සතුටින් අහගෙන ඉන්නම්. මා ගැන දැනගත්තේ කොහොමද?"

"අපේ ගෙදරට මෙහේ ඉඳලා හැතැප්ම තුනයිනේ තියෙන්නේ. අර පර්වතේට එහා පැත්තේ අපි ඉන්නේ. අපේ ගමේ මිනිස්සු කිව්වා කල්කටාවේ ඉඳලා බෙංගාලි මහත්තයෙක් වත්තට ඇවිල්ල ඉන්නවා කියලා. තමුන්නාන්සේලා උගත් අය නිසා මේ වගේ දේ උසස්ය කියලා පිළිගන්නවා. කවියෙක් මෙහෙම කියලා තියෙනවානේ.

විද්වත්සු සත්කවිවාචා ලහතේ ප්‍රකාශං (විද්වතුන් කෙරෙහි යහපත් කවි වචන ආලෝකයක් ලබයි.)

වෙන්කටේශ්වර් මට ඇසෙන්නට කවි කීවේය. දුම්රිය සේවකයකු, ටිකට් පරීක්ෂකවරයෙකු ලිපිකරුවෙකු, දුම්රිය ස්ථානාධිපතිවරයෙකු, නියාමකවරයෙකු, ආදි වරිත සම්බන්ධ කොට ප්‍රබන්ධ කරන ලද දීර්ඝ වූ කවි පෙළක් ඔහු මට ඇසෙන්නට කියවීය. කවි පෙළ උසස් තත්වයේ එකක් යයි මට සිතුණේ නැත. එනමුත් මා වෙන්කටේශ්වර් ප්‍රසාද්ට අසාධාරණයක් කිරීමට සිතුවේ නැත. මට ඔහුගේ භාෂාව මුළුමනින්ම තේරුම් ගියේ නැත. ඇත්ත ප්‍රකාශ කළහොත් මට එයින් විශේෂ යමක් තේරුම් ගියේද නැත. එසේ වුවත් මම ඔහුගේ උනන්දුව ඇති කිරීම සඳහා වරින් වර වචනයක් දෙකක් පැවසුවෙමි.

බොහෝ වේලා ගතවිය. වෙන්කටේශ්වර් ප්‍රසාද් කවි කීම නවත්වන්නේ නැත. ආපසු ගෙදර යන පාටක් ද නැත.

පැය දෙකක් පමණ කවි කියා ටික වේලාවක් නිහඬව සිටි මහු සිනාමුසු මුහුණින් යුතුව කතා කළේය.

"කොහොමද මහත්තයා මගේ කවි?"

"හරි අපුරුයි. මෙහෙම කවි පෙළක් අහන්න ලැබෙන්නේ බොහොම කලාතුරකින්. ඇයි සහරාවකට එහෙම ඔය කවි යවන්නේ නැත්තේ?"

වෙන්කටේශ්වර් කණගාටුවෙන් යුතුව කථා කළේය.

"මහත්තයා. මේ පළාතේ මිනිස්සු මට පිස්සා කියල කියනවා. කවිවලින් කියන දේ තේරුම් ගන්න මිනිස්සු ලේසියෙන් හම්බ වෙයි කියලා හිතනවද? තමුන්නාන්සේට ඇහෙන්න කවි කියලා මම අද තෘප්තියක් ලැබුවා. තේරුම් ගන්න කෙනෙකුට තමයි මේවා කියන්න ඕනෑ. මං ඒක තමයි ඇවිත් තමුන්නාන්සේව හම්බවෙන්න කියලා හිතුවේ."

එදින ඔහු මගෙන් සමුගෙන ගියත් පසු දින දහවල් නැවත පැමිණ තමාගේ ගෙදරට යාමට මට පෙරැත්ත කළේය. ඔහුගේ ඉල්ලීම ඉවත දැමිය නොහැකි නිසා මම ඔහු සමග චක්මති ජනපදයට පයින් යාමට පිටත්වූයෙමි.

සවස් වී ගෙන ආවේය. මගදී හමු වූයේ බොහෝ ඈතට විහිදුණ තිරිඟු සහ යව කෙත්ය. පරිසරයේ එක්තරා ශාන්ත සහගත සන්සුන් බවක් පැතිර ගොස් තිබිණ. කොක්කු රැනක් උණ පඳුරු මත වසා සිටියහ. ගමේ දරු දැරියෝ කුඩා දොළ පාරක් අයිනේ මාළු ඇල්ලීමට උත්සාහ කරමින් සිටියහ.

ගමේ ගෙවල් එකිනෙකට ළඟින් තනා තිබිණ. බොහෝ නිවෙස් වලට මිදුලක් නොවීය. වෙන්කටේශ්වර් එහි වූ මධ්‍යම ප්‍රමාණයේ නිවසකට මා කැඳවාගෙන ගියේය. එය පිහිටා තිබුණේ පාර අයිනේය. මම ගෙතුළට ගොස් බංකුවක හිඳගත්තෙමි. ටික වේලාවකින් මම කවියාගේ බිරිඳ දුටුවෙමි. ඇය වඩේ සහ බදින ලද ඉරිහු රැගෙන අවුත් මා සිටි බංකුව මත තැබූ නමුත් කථා නොකළාය. අපේ බෙංගාලි කතුන් මෙන් සාරි පොටින් හිස සහ මුහුණ වසා නොසිටි ඇගේ වයස අවුරුදු විසිපහක් පමණ වන්නට ඇත. ඇය පැහැපත් කෙනෙකු නොවුවත් ප්‍රසන්න පෙනුමෙන් යුක්ත වූවාය. ඇයගේ මුහුණේ ශාන්ත

SL UNLIMITED The spirit of Sri Lankan e-community

සුන්දරත්වයක් වූ අතර හැසිරීමෙහිද චාම් ආචාරශීලී බවක් හා සෞන්දර්‍යයක් විය.

මම තවත් දෙයක් ඇය තුළ දුටුවෙමි. එය ඇයගේ නිරෝගී පෙනුමයි. ඒ පළාතේ කොතැනකට ගියත් බෙංගාලයේ ගැහැනු අයට වඩා සෞඛ්‍ය සම්පන්න ගැහැනුන් හමුවෙයි. උස්වූ මට සිලුටු සිරුරින් යුතුවූ ගැහැනු මෙහි සුලබව හමුවෙයි. කවියාගේ බිරිඳද එවැන්නියකි.

ටික වේලාවකට පසු ඇය මීකිරි බඳුනක් ගෙන මා පසෙකින් තබා දොර මුල්ලට වී සිටගත්තාය.

ඇය දොර අගුල හඬවන හඬ ඇසූ වෙන්කටේශ්වර් ප්‍රසාද් නැගිට බිරිඳ ළඟට ගොස් සිනා මුසු මුහුණින් යුතුව ආපසු ආවේය.

"අපේ පවුල කියනවා තමුන්නාන්සේ දැන් අපේ යාළුවෙක් නිසා යාළුවට ටිකක් සීතල කරන්න හිතාගෙන වඩේවලට වැඩිපුර මිරිස් දැම්මලු."

මම සිනාසුණෙමි.

"මං විතරක් සීතල වෙලා මොකටද? අපි තුන්දෙනාම කමු. එන්න."

කවියාගේ බිරිඳ දොර මුල්ලේ සිට සිනාසුණාය. මම කෙසේ හෝ ඇයටද ඒවා කන්නට දුන්නෙමි.

ටික වේලාවකට පසු ඇය ගෙතුළට ගොස් තවත් බඳුනක් ගෙන ආවාය.

"මහත්තයට කියන්න මේ පාර කට දැවිල්ල යන්න පැණි රස දෙයක් කන්න කියලා." ඇය කවියාට කීවාය.

ඇගේ හින්දි කථා ස්වරය ඉතා මිහිරි විය. ඒ පළාතේ ගැහැනු අය හින්දි කථා කරන ආකාරය ඇසීමට ප්‍රිය උපදවන සුළු විය. මට හරි හැටි හින්දි කථා කිරීමට නොහැකි වූ නිසා එහි වැඩි ආකර්ෂණයක් ඇතැයි මට දැනිණ. පොත්වල ඇති හින්දි භාෂාවෙන් නොවූ මෙය ගම්බද පර්වත ආශ්‍රිත වනගත පරිසරයේ ඈතට විහිදුණු හරිත වර්ණ යව හා තිරිඟු කෙත් ගැනත්, සෙවණැලි පිරුණු සවස් භාගයන්හිදී නිල්වන් පර්වත පෙළ දෙසට පියාඹන කොක් රැන් ගැනත්, ඈත දක්වා විහිදුණු පොළෝ තලය ගැනත් සිහිපත් කරවන සුළු බසකි. එය අඩ වශයෙන් බිඳුණු ක්‍රියා පදවලින් යුක්ත වූ බසකි. ගැහැනු අය කථා කරන විට ඔවුන් හුරුපුරුදු වූ විශේෂ ශෛලියක් ඇති බව පෙනේ. එය කෙරෙහි දැඩි ආකර්ෂණයක් මා තුළ විය.

"කරුණාකරලා කවියක් දෙකක් කියන්න." මම කවියාට කීවෙමි.

වෙන්කටේශ්වර් ප්‍රසාද්ගේ මුහුණ උනන්දුවෙන් විකසිත විය. ඔහු කවියට නැගූ ගම්බද ප්‍රේම කථාවක් මට ඇසෙන්නට කියවිය. කුඩා ඇලකින් එහා ඉවුරේ වූ ඉරිඟු කෙතක් මුරකරන තරුණයෙක් මෙහා ඉවුරේ කළයක් රැගත් තරුණියක දිනපතා දිය ගෙන ඒමට එනු දකියි. ඇය ඉතා රූමත් යයි තරුණයා සිතයි. ඔහු ඉවත බලාගෙන ගීතයක තාලයට සිවුරුහන් දෙයි. කෙතට එන හරකුන් එළවන ගමන් ඔහු වරින් වර තරුණිය දෙස බලයි. කීප වරක් ඔවුන්ගේ දෙතෙත් හමුවෙයි. තරුණිය ලැජ්ජාවෙන් රතුවී බිම බලා ගනියි. තරුණිය සමග ඊළඟ දිනයේ නම් කථා කරන්නෙමි යයි තරුණයා සිතයි. ගෙදර ගිය විටද ඔහු ඇය ගැනම සිතයි. කාලය ගමන් කරයි. ඔහුට තම සිතැඟි පැවසීමට නොහැකි වෙයි. දිනක් තරුණිය දිය ගෙනයාමට නොපැමිණෙයි. පසු දිනද නොපැමිණෙයි. දින සති, මාස ගෙවී යයි. ඔහු දැක හුරු පුරුදු තරුණිය නැත. තරුණයා දිනපතා බලාපොරොත්තු සුන්වී ආපසු පැමිණෙයි.

කුළුපටි පෙම්වතා ධෛර්‍යය උපදවාගෙන කිසිවෙකුගෙන් කිසිවක් විමසීමට සමත් වූයේ නැත. තරුණයා ගම අතහැර වෙනත් පළාතක රැකියාවක් සඳහා පිටත්ව ගොස් සෑහෙන කාලයක් ගෙවී ගොස් ඇතත් ඒ ඇළ අයිනේ දී දුටු රූමත් තරුණිය ඔහුට තවමත් අමතක කළ නොහැක.

ඇත නිල්වන් පර්වත පෙළ හා දිගන්තය තෙක් විහිදුණු ධාන්‍ය කෙත් දෙස බලාගෙන අඳුරු හැන්දෑවේ මේ කවි පෙළ අසද්දී මෙය වෙන්කටේශ්වර් ප්‍රසාද්ගේ ජීවිත අත්දැකීමක් දැයි මට සිතිණ. කවියාගේ ප්‍රියාවියගේ නම රුක්මා විය. ඒ නමින්ද ඔහු කවියක් ලියා ඇත. ඔහු එයද මට ඇසෙන්නට කියවා ඇත. මේ රූමත් ගුණවත් රුක්මා ලැබීමෙන් පසුවද ඔහුගේ දුක නිවී නැත්දැයි මට සිතිණ.

මා කුඩාරමට ඇරලන්නට එන අතර මගදී වෙන්කටේශ්වර් මට නුග ගසක් පෙන්වූවේය.

"මේ ගහ පේනවද මහත්තයා. ඔය ගහ යට එක පාරක් කවිකාරයෝ කීප දෙනෙක් එකතු වෙලා සම්මේලනයක් පැවැත්වුවා මටත් ආරාධනයක් ලැබුණා. මගේ කවි අහලා පැට්නාවලින් ආපු ඊශ්වර් ප්‍රසාද් මට හරියට ප්‍රශංසා කළා. ඊශ්වර් ප්‍රසාද්ව අඳුනනවද? එයා තමයි 'දූතයා' කියන සඟරාවේ සම්පාදකවරයා. හොඳ කවියෙක්."

SL UNLIMITED The spirit of Sri Lankan community

ඒ අසා මට සිතුණේ වෙන්කටේශ්වර්ට රැස්වීමකදී කවි කීමෙන් ආරාධනයක් ලැබුණු ඒ දිනය ඔහුට අමරණීය දිනයක් බවය. ඔහුට එවැනි සම්මානයක් වෙන කෙදිනක වත් ලැබී නැත.

13

මට වත්තට ආපසු යාමට ලැබුණේ මාස තුනකට පසුවය. මිනුම් කටයුතු නිමවීමට එපමණ දිනක් ගතවිය.

මට ආපසු යාමට සැතපුම් විසි දෙකක් පමණ තිබිණ. මා වරක් සැණකෙළියක් බැලීමට පැමිණියේද ඒ මාර්ගය දිගේමය. එවර දුටු සල් හා කැල වනයත්, ගල් තලාවලින් ගහන වූ නිදහස් මිටියාවතත්, උස් හා පහත් වූ ගල් පර්වත පෙළත් මට මෙවරද දකින්නට ලැබිණ. පැය දෙකක් පමණ ගිය විට ක්ෂිතිජය රේඛාව අසල ඇපැහැදිලි ලෙස දිස්වූයේ මෝහනපුරා රක්ෂිත වනයයි.

ඒ හුරු පුරුදු මග සලකුණ මම තුන්මාසයකින් නුදුටුවෙමි. එහි පැමිණි පසු ලොබ්ටුලියා සහ නාඑ බයිහාරය පිළිබඳ කොපමණ ඇල්මක් ඇතිවූවාදැයි කිව හොත් ඒ පරිසරය අතහැර කොහේ හෝ ගිය විට පිට දේශයකට ගියාක් මෙන් යාංකාවක් ඇතිවේ. මාස තුනකට පසු ඒ සීමා රේඛාව දැක දුරක සිට ආපසු ගමට පැමිණෙන්නෙකු ලබන සතුටක් ලැබුවෙමි. ලොබ්ටුලියාවේ මායිම හමුවීමට තවත් සැතපුම් හත අටක් යාමට සිදු වේ.

කුඩා කන්දක් පාමුල වනය එළි පෙහෙළි කර ඩයි සෑදීමට ගන්නා මල් වර්ගයක් වවා තිබිණ. ඒ වන විට මල් කපන කාලය පැමිණ තිබිණ. කම්කරුවෝ මල් නෙලමින් සිටියහ. ඒ අසලින් යන විට කිසිවකු මට අඬ ගසන හඬ ඇසිණ.

"මහත්තයෝ. මහත්තයෝ."

මා හැරී බැළූ විට පසුගිය වසරේ බයිහාරයේදී හමු වූ මංචි මා අමතමින් සිටින බව දුටුවෙමි. මම පුදුමයටද සතුටටද පත් වූයෙමි. අශ්වයා නවත්වන විට මංචි දෑකැත්තක් අතින් ගෙන සිනාමුසු මුහුණින් යුතුව මා අසලට දිව අවුත් සිටගත්තාය.

"මං දුර ඉඳලම දැනගත්තා මහත්තයා තමයි කියලා. මහත්තයා කොහේද ගියේ?"

මංචි පසුගිය වර දකිනවාටත් වඩා සෞඛ්‍ය සම්පන්නව ප්‍රබෝධමත්ව සිටියාය. මල් පෙති කැබලි නිසා ඇගේ දෑත්ද සාරියේ ඉදිරිපසද වර්ණවත් වී තිබිණ.

"බයිරාබුරු කන්ද පහළ වැඩක් තිබිලා මාස තුනක් එහේ හිටියා. මං මේ ආපහු යන ගමන්."

"ඔයගොල්ලෝ මෙහේ මොකද කරන්නේ?"

"මල් කපනවා මහත්තයා. දැන් හවස් වුනානේ. බැහැලා එන්න මහත්තයා. යමු අපේ ගෙදර. අපි ඉන්න තැන ළඟයි."

මම ඒ යෝජනාවට විරුද්ධ නොවීමි. මංචි වැඩ නවත්වා මා ඇගේ පැලට කැඳවාගෙන ගියාය. මංචිගේ සැමියා නක්ෂේදි හකත් මා ආ බව අසා කුඹුරේ සිට පැමිණියේය.

නක්ෂේදිගේ පළමු බිරිඳ පැල්පත තුළ කෑම පිසිමින් සිටියාය. ඇයද මා දැක සතුටු වූවාය. එසේ වුවද මංචිගේ උනන්දුව සියල්ලටම වඩා වැඩි විය. ඇය මට හිඳගැනීම සඳහා බිම පිදුරු අතුරා ආසනයක් පැනවූවාය. නැමට පෙර සිරුරේ ආලේප කිරීම සඳහා කුඩා භාජනයක තෙල් ගෙන අවුත් මට දී කෑම ගැනීමට පෙර නාගෙන එන්නට යයි කීවාය.

"එන්න මං එක්ක යන්නම්. මේ ගමේ කෙළවරේ හොඳ වැවක් තියෙනවා. හොඳ වතුර ටික."

"මං ඒ වැවේ නාන්නේ නෑ මංචි. මුළු ගමේම මිනිස්සු ඒ වතුරේ බැහැල රෙදි සෝදනවා. මූණ හෝදනවා. නානවා. හැලි වළං හෝදනවා. වතුර හොඳටම ජරා වෙලයි තියෙන්නේ. ඔයගොල්ලොත් ඒකේ වතුරද බොන්නේ? මං එහෙනම් යනවා. මං ඒ වතුර බොන්නේ නෑ."

මංචි කල්පනා කරන්නට වූවාය. වැව ඇරෙන්නට දිය ගෙන ඒමට වෙනත් තැනක් නැති නිසා ඒවා නොබී බැරි බව මට වැටහුණේය.

මංචිගේ කනස්සලු සහගත මුහුණ දුටු මා තුළ කණගාටුවක් ඇතිවිය. එවා අපිරිසිදු යයි නොසිතා ඔවුහු මෙතෙක් කලක් සතුටින් යුතුව ඒ දිය පානය කළහ. ජලය අපිරිසිදු කියා ඔවුන්ගේ ආගන්තුක සත්කාර භුක්ති නොවිඳ යන්නට ගිය හොත් අහිංසක තරුණියට ලොකු වේදනාවක් දැනෙනු ඇත.

"හා හොඳයි. වතුර හොඳට උතුරවලා ගන්න. මං බොන්නම්. නාන්න ඕන නෑ." මම කීවෙමි.

"මං බැරල් එකකට වතුර පුරවලා උණු කරලා දෙන්නම්. මහත්තයා ඒකෙන් නාන්න. තාම හොඳටම හවස් වෙලා නැති හින්දා මං වතුර අරන් එන්නම්."

මංචි වතුර ගෙනැවිත් කෑම පිසීමට වූවාය.

"අපේ අතින් කන්නේ නැතිනම් මහත්තයාම උයාගෙන කන්න." (බ්‍රාහ්මණයින් වෙනත් කුලවල අය පිසූ කෑම අනුභව කිරීම අපිරිසිදු වීමට හේතුවක් සේ සැලකේ.)

"මං මොකද කන්නේ නැත්තේ? පුළුවන් දෙයක් උයන්න. මං කන්නම්."

"එහෙම හොඳ නෑ මහත්තයා. මහත්තයම උයන්න. මේ එක දවසකට කුලේ අපිරිසිදු කර ගන්නේ මොකටද? මටත් පව් සිද්ධ වෙයි."

"මගේ කුලේට මොකුත් වෙන්නේ නෑ. මං කියන එක අහන්න. ඒකේ වැරැද්දක් නෑ." මංචි කෑම පිසීමට හිඳ ගත්තාය. එහි විශේෂ කිසිවක් නොතිබිණ. අතින් තැනූ මහත රොටී සහ වන ධුංධුල් හොද්දක් ඇය පිළියෙළ කළාය.නක්ෂේදී කොහෙන්දෝ මී කිරි සොයාගෙන ආවේය.

කෑම පිසින අතර තුර තමා පසුගිය දිනවල කොහේ කොහේ ගියාදැයි මංචි විස්තර කරන්නට වූවාය. කඳු පළාතේ ගොයම් කපන්නට ගොස් එහිදී එළු පැටියෙකු ඇති කළ බවත් පසුව එය නැතිවූ බවත් ඇය කීවාය.

"මහත්තයා. කංකෝයාඩාවල උණු දිය පොකුණක් තියෙනවා මහත්තයා දන්නවද? මහත්තයා ඒ ළඟටම ගියා නේද? ඒක බලන්න ගියේ නැද්ද?"

මට ඒ ගැන අසන්නට ලැබුණු නමුත් එහි යාමට නොලැබුණු බවත් මම ඇයට කීවෙමි.

"දන්නවද මහත්තයා. මං ඒකෙන් නාන්න ගිහිල්ලා ගුටි කෑවා. අපට ඒකෙන් නාන්න දෙන්නේ නෑ."

"ඒ මොකද?"

මංචි සැමියාට කතා කළාය.

"මේ ඇහුණාද? ඒ ගැන මහත්තයට කියන්නකෝ. මහත්තයා කල්කටාවට ලියලා අරියි, ඒ තක්කඩින්ට හොඳ පාඩමක් උගන්වන්නත් එක්ක."

නක්ඛේදි ඒ සිද්ධිය විස්තර කළේය.

"මහත්තයා ඒ උණු දිය පොකුණ හරි අපූරු තැනක්. මග යන එන අය එතැනින් නානවා. අපි ඒ කිට්ටුව තැනක ගොයම් කැපුවනේ. පෝය දවසක කුඹුරේ වැඩ ඉවර වෙලා මංචි එතැනට නාන්න ගියා. මට එදා උණ තිබුණ නිසා මං ගියේ නෑ. අනිත් එක්කෙනා, ඒ කියන්නේ තුලසීත් ගියේ නෑ. එයා ඔය වගේ දේ වලට උනන්දු නෑ. මංචි ගිහින් පොකුණට බහින්න හදනකොට එතැන හිටපු බ්‍රාහ්මණයෙක් අහලා තියෙනවා ඒයි උඹ පොකුණට බහින්නේ මොකටද කියලා. මෙයා කියලා තියෙනවා නාන්න කියලා. උඹ මොන කුලේද කියලා ඇහුවාම ගංගෝතා කුලේ කියලා කිව්වලු. ගංගෝතා ගෑනුන්ට අපි මෙතැන නාන්න දෙන්නේ නෑ. පලයන් යන්න කියලා, පන්නාගෙන තියෙනවා. දන්නවනේ මහත්තයා මෙයාගේ කටත් සැරයිනේ. කන්දේ ඉඳලා එන උල්පතෙන් ඕනෑ කෙනෙකුට නාන්න පුළුවන්. කොච්චර මිනිස්සු මෙතැනින් නානවද? ඔක්කොම ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ කුලවල අයද? මෙයා එහෙම කියලා දියට බහින කොට දෙන්නෙක් දුවගෙන ඇවිත් ගහලා පන්නලා තියෙනවා. මෙයා අඩ අඬා ගෙදර ආවා."

"ඊට පස්සේ මොකද වුනේ."

"මොනව කරන්නද මහත්තයා. අපි දුප්පත් අසරණ මිනිස්සුනේ. කවුද අපේ නඩුව අහන්නේ?"

මං කිව්වා උඹ අඬන්න එපා. මං උඹව මුංගේරවල සීතා වැවට නාන්න එක්ක යන්නම් කියලා."

මෙවර මංචි කථා කළාය.

"මහත්තයා මේ ගැන කල්කටාවට ලියලා අරින්න. බෙංගාලි මහත්තුරු ලියන්න හරි දස්සයිලු නේද? උන්ට හොඳ පාඩමක් උගන්වන්න පුළුවන් වෙයි."

"හොඳයි මං ලියලා අරින්නම්." මම උනන්දුවෙන් යුතුව කීවෙමි.

ඉන්පසු මංචි ඉතා උනන්දුවෙන් යුතුව මට කෑම බෙදුවාය. ඇගේ උනන්දුවත් සැලකිල්ලත් මා තුළ සතුටක් ඉපදවීය.

මා ඔවුන්ගෙන් සමුගෙන එද්දි මා ඇයට කීප වරක්ම කීවේ ඊළඟ වෙසක් මාසයේ තිරිඟු කපන විට අපේ ලොබ්ටුලියාවට එන ලෙසය.

"එනවා මහත්තයා. ඒක කියන්න දෙයක්ද?"

SL UNLIMITED The spirit of Sri Lankan e-community

මංචිගේ ආගන්තුක සත්කාර විඳ ආපසු එද්දී මට හැඟුණේ ඇය ස්ත්‍රියේ, ප්‍රබෝධයේ හා අහිංසක බවේ ප්‍රතිමූර්තියක් බවය. ඒ වනගත භූමියට ඇය වන ලක්ෂ්මියකි. ඇය මෝඩ, බොළඳ බාලිකාවක සේ හැසුරුණත් පරිපූර්ණ යෞවනයෙන්ද, ජීවයෙන්ද, ප්‍රබෝධයෙන්ද යුතු වූවාය.

බෙංගාලි මිනිසුන්ගේ ලිවීමේ ශක්තිය ගැන අසීමිත විශ්වාසයකින් යුතුවූ ඒ තරුණියට පොරොන්දු වූ පරිදි මා ඒ ගැන කල්කටාවට ලිවුවත් ඇයට එයින් කුමන ප්‍රයෝජනවක් අත්වූවා දැයි නොදනිමි. මේ වනවිට ඇය කොහේද, කෙසේ ජීවත්වේද නොදනිමි. ඒ තබා ඇය ජීවතුන් අතර සිටිද යන්න වත් නොදනිමි.

* * * * * *

එය නිකිනි මාසයයි. කීප වරක්ම වැසි වැස්සේය. නාඵා බයිහාරයේත් ලොබ්ටුලියාවේත් ග්‍රාන්ට් මහතාගේ නුග ගස යටත් අවට බැලූවිට හරිත වර්ණ සමුද්‍රයක් සේ අලුතින් දළු දැමූ සල් වනය පෙනෙයි.

දිනක් දෝබරු පන්නාගෙන් ලැබුණු ආරාධනය පරිදි නිකිනි පුර පෝය දිනයේ එහි පැවැත්වූ උත්සවයක් බැලීමට ගියෙමි. රාජු සහ මටුකනාථ පාංඩේටද මා සමග එහි යාමට උවමනා විය. පයින් යන නිසා ඔවුහු මට පළමු ගමනට පිටත් වූහ.

දහවල් එකහමාර වන විට මිජි නදියෙන් එගොඩ වූයෙමි. අනිත් දෙදෙනා එතැනට පැමිණෙන විට දහවල් දෙකහමාර විය. මම නැවත අශ්වයා පිට නැගී ඔවුන් පසුකර ගියෙමි.

බටහිර දෙසින් ඝන වැහි වළා මතු විය. ඉන්පසු 'සිරි' 'සිරි' ගා වැහි පොද වැටෙන්නට විය.

ඒ ආරණ්‍ය මිටියාවතට වැසි වැටෙන විට කෙතරම් අපූරු දර්ශනයක් මැවේද? වැහි අඳුර මැද ඈත වූ ගල් පර්වත පෙළ නිලට දිස්විය. විදුලිය සහවා ගත් වැහි වළාවලින් අහස පිරී ගොස් තිබිණ. අතර මග සල් හා කේංද් ගස්වල අතු මත පිල් විදහා ගත් මොනරුන් මට දකින්නට ලැබිණ. කන්දේ සිට ගලා එන දොළ පාරකට බැසගත් දරු දැරියෝ සල් පතුරු හා උන පතුරුවලින් ඇටවූ කෙමනක මාළු අල්ලමින් සිටියහ. අඳුරු පැහැයෙන් යුතුවූ ගල් තලා වැස්සට සේදී පැහැදිලි කලු පාටින් දිස්විය. ඒ මත හිඳගත් ගොපලු ළමයි අමු සල් කොළවලින් ඔතා ගත් බීඩි බොමින් සිටියහ. ඒ සන්සුන් පළාතේ

වනයේද, තණබිම්වලද, හැම තැනම දොළ පහරවල් හමුවිය. කඳු ආශ්‍රිත ගම්මානවල පොළව රතු පැහැති පසින් යුතු විය. තැනිත් තැන මලින් පිරුණු බක්මී ශාක හමුවිය.

මම රෑ බෝ වීමට පළමු දෝබරු පන්නාගේ රාජධානියට ළඟා වූයෙමි.

ඔහුගේ පිදුරු සෙවිලි කළ නිවස අමුත්තන් පිළිගැනීම සඳහා අපූරු අන්දමින් සායම් තවරා විසිතුරු කර බිත්තිවල නෙළුම් කොළ හා මල්ද මොනරුන්ද ඇඳ තිබිණ. සල් කණුවල මල් වැල් දවටා තිබිණ. මගේ බඩු බාහිරාදිය රැගත් අය ඒ වනවිටත් පැමිණ නොසිටියත් එයින් කිසිම අපහසුවක් නොවීය. ගෙතුළ අලුත් පැදුරු එළා ඒ මත කොට්ට දෙකක්ද දමා තිබිණ.

ටික වේලාවකින් හානුමති පිත්තල බන්දේසියක තැබූ පළතුරු ද උණු කළ කිරි බදුනක්ද රැගෙන පැමිණියහ. සල් කොළ ගොටුවල දැමූ බුලත් පුවක් හා බුලත් විටට අවශ්‍ය වෙනත් දේද රැගත් හානුමතීගේ වයසේ වෙනත් බාලිකාවක්ද ඇය පිටුපසින් පැමිණියාය.

හානුමති ඒ පළාතේ ගැහැනු ළමයින් අඳින ආකාරයට දම්පැහැති සාරියක් දණිස් දක්වා හැඳ සිටියාය. ඇගේ ගෙලෙහි කොළ හා රතු ඇට මාලයක් විය. ඇගේ හිසේ ලිලි මලක් ගසා තිබිණ. හානුමති පෙරටද වඩා ප්‍රබෝධයෙන්ද ලාවණ්‍යයෙන්ද යුක්තව සිටියාය. ඇගේ මටසිලිටු සිරුර යෞවනයේ සෞන්දර්‍යවෙන් පිරී ගොස් තිබුණත් ඇය අහිංසක කෙල්ලක් වූවාය.

"හානුමති හොඳින් ඉන්නවද?"

ආචාර කිරීමට දැන නොසිටි හානුමති සිනාසුණාය.

"මහත්තයට කොහොමද?"

"මං හොඳින් ඉන්නවා."

"මහත්තයා දැන් මොනවහරි හරි කනවා නේද? මුළු දවසේම අශ්වයා පිටින් ඇවිත් බඩගිනිත් ඇතිනේ."

මගෙන් පිළිතුරක් බලාපොරොත්තු නොවුන ඇය බිම දණ ගසා හිඳගෙන බන්දේසියෙන් පැපොල් කැබලි දෙකක් ගෙන මා අත තැබුවාය.

ඇයගේ අකුටිල හැසිරීම මට ප්‍රිය විය. බෙංගාලයේ සිට පැමිණි මට මෙය නුපුරුදු වූද, සුන්දර වූද, මිහිරි වූද, අත්දැකීමක් විය. බෙංගාලයේ සොළොස් වියේ තරුණියක් නම් නැයෙකු නොවන පිරිමියෙකු ඉදිරියට පැමිණ මේ අයුරින් සංග්‍රහ කරන්නේ නැත.

කවදත් ගැහැනු ළමයින් ඉදිරියේ මගේ සිත තරමක කුළැටි බවක් පළ කරයි. ඔවුන් සමග විවෘතව ආශ්‍රය කරන්ට හෝ මා ඔවුන් ගැන නිදහසේ සිතන්නට මා පුරුදුව සිටියේ නැත.

ඒ වනගත පරිසරයේ වැහි වළාවලද, ගල් පර්වත පේළි වලද, පවතින නිදහස් බවත් හානුමතීගේ හැසිරීමේ ඇති බාධා රහිත අකුටිල අහිංසක බවත් අතර සමාන කමක් ඇතැයි මට හැඟිණ. මෙවැනි හැසිරීමක් මංචි සහ වෙන්කටේශ්වර් ප්‍රසාද්ගේ බිරිඳ කෙරෙහිද දක්නට ලැබිණ. වනාන්තර හා පර්වත ඔවුන්ගේ හදවත්වලට නිදහස දී ඇත. ඔවුන්ගේ ළැදිකම් ද ඒ අනුසාරයෙන් නිදහස් උදාර බවක් ගෙන ඇත.

හානුමති මා ළඟින් හිඳගෙන අතට දුන් කෑම වෙනත් අයෙකු දුන් කෑමට සමාන වූයේ නැත. ගැහැනියකගේ අකුටිල පැවැත්මක මිහිර මම ජීවිතයේ පළමු වරට විඳිමි. ගැහැනියගේ සෙනෙහසින් පිරි සැලකිල්ලක් පෘථිවියේ සිටම ස්වර්ගයේ දොර හැර දීමක් වැනිය.

හානුමති තුළ වසන ආදිම ගැහැනිය ශිෂ්ට සමාජයේ සිටින ගැහැනියට වඩා වෙනස්ය. සමාජයේ සිරිත් විරිත් නිසා නාගරික ගැහැනියගේ ආත්මය මූර්ඡාවූ තත්වයක පවතී යයි මට සිතිණ. හැසිරීම නිසා ඇය මගේම ආදරණීය සොයුරියක යයි මට හැඟිණ.

බොහෝ කාලයක් ගතවී ඇතත් හානුමති පිළිබඳ මතකය නවමත් මගේ මනස්පටයේ දීප්තිමත්ව පවතී. වනගතව සිටි නුගත් අය කෙරෙහි දක්නට ලැබුණු සුහදතාව සමග සසඳන විට උගත් සමාජයේ බොහේ සැප සම්පත් වැඩක් නැති ඒවා සේ මට හැඟේ.

උත්සව කටයුතු සංවිධානය කිරීමේ නිතරව සිටි දෝබරු රජු මා අසලට පැමිණ හිඳගත්තේය.

"මෙහේ ජූලන් උත්සවය නිතරම පැවැත්වෙනවද?" මම ඇසුවෙමි.

"හුඟ කාලෙක ඉඳන් අපි පවත්වන උත්සවයක් තමයි මේක. ඇත ඉඳලා නැදෑයෝ එනවා, ඒකාලෙට පවත්වන නැටුමට එකතු වෙන්න. අපි හාල් සේරු සිය ගණනක බත් උයනවා මේ දවස්වලට."

මටුකනාථ බ්‍රාහ්මණ ගුරුවරුන් සඳහා දෙන දානය පිළිගැනීම පිණිස පැමිණ සිටියේය. ඔහු බලාපොරොත්තුව සිටියේ මාළිගාවක් දකින්නටය. ඔහුගේ මුහුණ දෙස බැලූ විට මට සිතුණේ ඔහුගේ බලාපොරොත්තු කඩවූ බවය. මේ රජගෙදරට වඩා ඔහුගේ පාසල් ගොඩනැගිලි හොඳ යයි ඔහුට සිතෙන්නට ඇත.

රාජුද තමා සිතූ දේ සැහවීමට නොහැකිව මා සමග කිවේ මෙයයි.

"මොන රජෙක්ද සර්. මේක නිකම් ගම් නායකයකුගේ ගෙයක් වගේනේ. මට මීහරක් කීප දෙනෙක් ඉන්නවා. මේ රජ්ජුරුවන්ට එව්වරත් නැතිලු සර්."

ඔහු මගදීම රජුගේ වත්කම් ගැනද සොයා බලා ඇත. ඒ පළාතේ හරකුන් හා මීහරකුන් අයිතිකරුවන් සිටීම කෙනෙකුගේ වත් පොහොසත්කම් පෙන්වන මිම්මකි. මීහරකුන් වැඩි ගණනක අයිතිකරුවකු වන තැනැත්තා පොහොසතෙකු ලෙස පිළිගැනේ.

මධ්‍යම රාත්‍රිය වන විට වනයේ විශාල ගස්වල අතු අතරින් සඳ පායා තිබෙන අයුරු දක්නට ලැබිණ. වනගත ගම්මානයේ ගෙම්දුල්වල ආලෝකය හා අඳුර එක්ව රටා වියා ඇති ආකාරයත් දිස්විය. ඒ මොහොතේ රජගෙදර පැත්තේ ගැහැනුන් සමූහයක් එක්ව ගායනා කළ අමුතු ආකාරයේ ගීතයක් ඇසෙන්නට විය. පුර පෝය දිනය හෙටයි. දුර බැහැර සිට රජ ගෙදරට පැමිණි අයත් රජ කුමරියෝත් එකතුව ඊළඟ දිනයේ පැවැත්වෙන උත්සවය සඳහා නැටුම් ගැයුම් ආරම්භ කර ඇත. ඔවුන්ගේ ගී හඬත් මද්දල බෙර හඬත් එක දිගටම ඇසෙන්නට විය. ගීත අසමින් මම නින්දට වැටුණෙමි. නින්දේදී ද වරින් වර මට ගී හඬ ඇසිණ.

* * * * * *

පෙර දිනයේ බලාපොරොත්තු කඩකර ගත්තත් පසු දිනයේ පැවැත්වුණු උත්සවය දැක මටුකනාථ, රාජු සහ මුනේශ්වර් සිංහ පවා පුදුමයට පත්වූහ.

පසුදින උදෑසන නැගිට බැලූ විට භානුමතීගේ වයසේ බාලිකාවන් තිස්දෙනෙකු පමණ කඳු ආශ්‍රිත ගම්වලින් පැමිණ ඇති බව පෙනී ගියේය. මෙපමණ නැටුම් ගැයුම් මැද ගෝත්‍රික ජනයාගෙන් ගැහැනු අය හෝ කිසිවෙකු වෙනත් නොදියුණු ගැහැනුන් මෙන් මත්පැන් පානය නොකර සිටීම හොඳ ලකුණකි. මම ඒ ගැන දෝබරූ පන්නා රජුගෙන් විමසූ විට ඔහු සිනා සී ආඩම්බරයෙන් පිළිතුරු දුන්නේය.

"අපේ වරිගේ ගැහුන්ට එහෙම පුරුද්දක් නෑ. මගේ දරුවන් ඉස්සරහ මත්වෙන දේවල් බොන්න මං කාටවත් අවසර දීලත් නෑ."

මටුකනාථ දවාලේ පැමිණ මට රහසින් කථා කළේය.

"මේ රජ්ජුරුවෝ මටත් වඩා දුප්පත් වගේ. උයන්න දීල තියෙන්නේ ගොරෝසු නිවුඩු හාලක්. කැලේ තියෙන ධුංධුල් හොදි වගේ දේවල් තමයි උයන්නේ. මිනිසුන්ට කන්න දෙන්නේ මේවද?"

එදා මුළු උදෑසනම භානුමතී දකින්නට ලැබුණේ නැත. මා කෑමට හිඳගත් විට ඇය කිරි භාජනයක් රැගෙන පැමිණ මා අසලින් හිඳගත්තාය.

"ඊයේ රෑ ඔයගොල්ලෝ කියපු සිංදු හරි ලස්සනයි."

"අපි කියපු සිංදුවල තේරුම දන්නවද?" භානුමතී සිනාමුසු මුහුණින් යුතුව ඇසුවාය.

"මොකද නැත්තේ. මේච්චර කල් ඔයගොල්ලන්ගේ පළාතෙ ඉදලත් මට භාෂාව තේරෙන්නේ නැද්ද?"

"අද ජූලත් උත්සවය බලන්න යනවද මහත්තයා."

"ඒකටමනේ ආවේ. කොච්චර දුර යන්න වෙනවද ඒක බලන්න?"

භානුමතී ධංජරී කඳු යාය දෙසට ඇහිල්ල දිගු කළාය.

"මහත්තයා ඒ කඳු පැත්තට ගිහින් තියෙනවද? අපේ දේවාලේ දැකලා තියෙනවද?"

ඒ වෙලාවේ භානුමතීගේ වයසේ බාලිකාවෝ පිරිසක් මා කෑම කමින් සිටි කාමරයේ දොර අසලට පැමිණ සිට ගත්හ. බෙංගාලි කාරයෙකු කන බොන අන්දම දෙස ඔවුහු කුතූහලයෙන් යුතුව බලා සිටියහ. ඔවුහු එකිනෙකාට කිසිවක් කොදුරනු මට පෙනිණ.

"පලයල්ලා යන්න මෙතැනින්. මෙතැනට ආවේ මොනවා බලන්නද?" භානුමතී ඔවුන්ට කීවාය.

ඔවුන් අතරින් අන්‍යයන්ට වඩා ධෛර්‍යමත් වූ කෙල්ලක් ඉදිරියට පැමිණ මෙසේ ඇසුවාය.

"උත්සවේ දවසේ මහත්තයට ලුණු දාපු කරඹ දෙන්නේ නැද්ද?"

ඇගේ කථාවට ඈ පිටුපස සිටි කෙල්ලෝ හඬ නගා සිනාසෙන්නට වූහ.

"ඒ ගොල්ලෝ හිනාවෙන්නේ මොකද?" මම භානුමතීගෙන් ඇසුවෙමි.

"මං දන්නේ නෑ. ඒගොල්ලන්ගෙන්ම අහන්න." භානුමතී ලැජ්ජාවෙන් යුතුව කීවාය.

වෙනත් කෙල්ලක් මිරිස් මුසු කොට අව්වාරු දැමූ කාමරංගා ගෙඩියක් ගෙනැවිත් මගේ පිහානේ තැබුවාය.

"මිරිස් දාපු ඒවත් කන්න මහත්තයා. හානුමති මහත්තයට පැණි රස දේවල් විතරයි දෙන්නේ. ඒක හොඳ නැතේ. ඒකයි මේවා ගෙනාවේ."

සියල්ලෝම නැවත සිනාසෙන්නට වූහ. එතරම් බාලිකාවන් සමූහයකගේ සිනහව මට දනවල් වරුවේ පැයු සඳක් සිහිපත් කරවීය.

රෑ බෝවීමට පෙර තරුණ තරුණියෝ පිරිසක් කන්ද දෙසට ගමන් කරන්නට වූහ. අපිද ඔවුන් පිටුපස ගියෙමු. එය විශාල වන්දනාගමනක් සිහිපත් කර විය. පෙරදිගින් පෙනුණේ නවාදා ලක්ෂ්මීපුරයේ ධංජරී කන්දයි. ඒ කන්ද පාමුලින් මිඹි නදිය ගලා බසියි. වන සිරසට ඉහළින් පුන් සඳ පායා තිබිණ. එක් පසෙකින් පහළින් වූ මිටියාවතත් හරිත වර්ණයෙන් බබලන වනාන්තරයත් පෙනිණ. අනිත් පැත්තේ ධංජරී කන්ද දිස්විය. සැතපුමක් පමණ පයින් ආ විට අපි කන්දක් පාමුලට පැමිණියෙමු. කන්දේ ටික දුරක් නැංග විට සමතලා ස්ථානයක තිබුණු පැරණි බක් මී ගසක් හමුවිය. ගසේ අතුවල මල් වැල් එති තිබිණ.

"මේ ගහ හුහක් පරණයි. ජූලන් උත්සවේ දවසට මේ ගහ යට කෙල්ලෝ නටනවා මං පොඩි කාලෙත් දැකලා තියෙනවා." යයි අප සමග පැමිණි දෝබරු පන්නා රජු කීවේය.

අපි ඒ අසල තල් කොළ පැදුරු එළා හිඳ ගත්තෙමු. තිහක් පමණ වූ තරුණියෝ පිරිසක් සඳ එළියෙන් නැහැවුණු වනාන්තරයේ බක් මී ගස වටා නටන්නට වූහ. මද්දල බෙර වයන තරුණයෝ පිරිසක් ඔවුන් සමග ගස වටා කරකැවෙන්නට වූහ. නටන තරුණියන් අතර ඉදිරියෙන්ම හානුමති සිටිනු මම දුටුවෙමි. තරුණියෝ ගෙලේ මල් මාලා පැළඳ සිටි අතර ඔවුන්ගේ හිසේද මල් ගසා තිබිණ.

රාත්‍රියේ බොහෝ වේලා යන තුරු එක දිගටම නැටුම් ගැයුම් පැවැත්වුණු අතර විටින් විට ඔවුහු විවේක ගත්හ. මද්දල බෙර හඬත්, සඳ පහනත්, වර්ෂාවෙන් සිහිල් වූ වනයත්, රහ දෙන හුරුබුහුටි තරුණ ලඳුන් කණ්ඩායමක් එකතුව නිර්මාණය කළ දර්ශනය උසස් කලා කරුවකු විසින් අඳින ලද සුන්දර චිත්‍රයක් සේ දිස් විය. මියුරු සංගීතයක පවනින ආකර්ෂණීය ස්වභාවය එහි ඇතැයි මට සිතිණ. ඈත අතීතයේ සිටි රජ කුමරියක් හා ඔවුන්ගේ පරිවාර ස්ත්‍රීන් ගැන

අසා ඇති කතාද ගොපලු කොලුවකු ඔවුන්ට මල් මාලයක් දුන් කතාවද මට සිහි විය.

ඊටත් ඔබ්බට ගිය ඈත අතීතයේ යටපත්ව ගිය සිදුවීම් එදින මගේ ඇස් ඉදිරියේ දිග හැරෙන්නට විය. භාරතයේ ආදි යුගවල පැවති සංස්කෘතිය හානුමති හා ඇගේ යෙහෙලියන්ගේ නැටුම් තුළින් මා ඉදිරියේ මූර්තිමත්ව පෙනෙන්නට විය. වසර දහස් ගණනකට පෙරද මෙවැනි වනාන්තර හා ගල් පර්වත පේළි, සඳපහන් රාත්‍රිවල හානුමති මෙන්වූ බාලිකාවන්ගේ නැටුම්වලින් වංචල වූ දෙපාවලින් ආකුලව තිබෙන්නට ඇත. ඔවුන්ගෙන් නැගුණු සිනා හඬ අද දක්වා වියැකී ගොස් නැත. ගුප්ත වූ පර්වත පේළි පිටුපස සැඟවී ඇති ඒ සිනා හඬ තමාගේ ඊළඟ පරම්පරාවල අය වෙත අදත් ප්‍රීතිය හා උද්යෝගය ඇති කරයි.

මධ්‍යම රාත්‍රියේදී ඈත වනය පිටුපසින් සඳ බැස ගියේය. අපි කන්දෙන් බැස ආවෙමු. එදින වැස්ස නොනිබීම අපට පහසුවක් වුවත් තෙතමනය සහිත සුළඟ දැඩි සීතලක් ඇති කරමින් ගත දැවටිණ. කෙතරම් රෑ වුවත් මා කෑමට හිඳගත් විට හානුමති කිරි සහ රසකැවිලි රැගෙන ආවාය.

"ඔයගොල්ලන්ගේ නැටුම් හරි ලස්සනයි."

ඇය ලැජ්ජාවෙන් සිනාසුණාය.

"මහත්තයා වගේ කෙනෙකුට ඔය වගේ නැටුමක් ලස්සනට පෙනෙයිද? කල්කටාවේ මිනිස්සු නම් ඔය වගේ නැටුම් බලන එකකුත් නෑ."

පසුදින අප ආපසු යාමට සැරසුණ විට හානුමති සහ ඇයගේ සියා වන දෝබරු රජු අප නවතාගැනීමට උත්සාහ කළහ. එසේ වුවද වැඩ ඇති නිසා කෙසේ හෝ එතැනින් පිටත්වී යාමට අපට සිදුවිය. හානුමති අප එන වේලාවේ මගෙන් ඉල්ලීමක් කළාය.

"මහත්තයා මට කල්කටාවෙන් කණ්ණාඩියක් ගෙනැත් දෙනවද? මගේ ළඟ කණ්ණාඩියක් තිබුණා. ඒක බිඳිලා ගියා."

සොළොස් හැවිරිදි සුන්දර යොවුන් තරුණියකට කණ්ණාඩියක් නැතිනම් එවැන්නකින් ඇති ප්‍රයෝජනය කුමක්දැයි මට සිතිණ. සතියක් ඇතුළත පූර්ණියා නගරයෙන් හොඳ කණ්ණාඩියක් ගෙන්වා ගෙන ඇයට යැවිවෙමි.

14

මාස කිපයක් ගත විය මැදින් මස එක් දිනක මම ලොබ්ටූලියාවේ කාර්‍යාලයේ සිට ආපසු එමින් සිටිද්දී වැව අසල තුරු ගොමුවක් දෙසින් පිරිසක් සිනාසෙන හඬත්, බෙංගාලි බසින් කථා බහ කරන හඬත්, ඇසී පුදුමයට පත් වූ මම අශ්වයා නතර කළෙමි. ඒ අසලට යත්ම මගේ පුදුමය තවත් වැඩි වූයේ ගැහැනු කට හඬවල් කිපයක් ද ඇසීමෙනි. එහි සිදුවන්නේ කුමක් දැයි දැන ගැනීමට දැඩි කුතුහලයක් ඇතිවූ නිසා මම අශ්වයා ගසක බැඳ වැව අයින දිගේ ඒ අසලට ගොස් බැලූ විට පදුරු අසල බිම පලස් එළාගෙන බෙංගාලි ජාතිකයින් දස දෙනෙක් පමණ කථා බහ කරමින් සිටිනු දුටුවෙමි.

ඒ අසල ගැහැනු අය පස් හය දෙනෙක් කෑම පිළියෙළ කරමින් සිටියහ. ළමයි හය හත් දෙනෙක්ද දුව පැන සෙල්ලම් කරමින් සිටියහ. මෙතරම් නාගරික මිනිසුන් පිරිසක් ළමා ළපටින් රැගෙන වනාන්තරයට විනෝද ගමනක් පැමිණියේ කෙසේදැයි තේරුම් ගැනීමට නොහැකිව මම නැවතී බලා සිටියෙමි. මේ අවස්ථාවේදී සියල්ලන්ගේම දෙනෙත් මා කෙරෙහි යොමු විය.

"මේකා මේ කැලේට කොහෙන් පාත් වුනාද දන්නේ නෑ?" එක් අයෙක් වංග බසින් කීය.

මම ඔවුන් ඉදිරියට ගියෙමි.

"ඔයගොල්ලේ බෙංගාලි වගෙයි පේන්නේ? කොහේ ඉඳලද ආවේ?"

ඔවුහු පුදුමයටද ලැජ්ජාවටද පත් වූහ.

"ආ මේ මහත්තයා බෙංගාලිද? හහ් ..... හහ්, මොකුත් හිතන්න එපා, අපි හිතුවේ.....හහ්.....හහ්....."

"නෑ....නෑ....ඒකට කමක් නෑ. ඔයගොල්ලෝ මේ ගෑනු උදවියත් එක්ක කොහේ ඉඳලද ආවේ?"

ඔවුහු මා සමග කථා බහට වැටුණෝය. ඔවුන්ගේ කණ්ඩායමේ සිටි වයස්ගත මහතා රායි බහදූර් නම් වූ විශ්‍රාම ලත් උප මහේස්ත්‍රාත් වරයෙකි. අනිත් අය ඔහුගේ දරුවෝ, මුණුබුරෝ නෑයෝ සහ යහළුවෝ වූහ. රායි බහදූර් කල්කටාවේ සිටියදී, පූර්ණියා දිස්ත්‍රික්කයේ වනාන්තරවලදී පහසුවෙන් සතුන් දඩයම් කළ හැකි යයි පොතක තිබී කියවා තිබිණ. ඒ ගැන සොයා බැලීමට ඔහු පූර්ණියා නගරයේ වෙසෙන රජයේ නිලධාරියෙකු වන තමාගේ සහෝදරයෙකුගේ නිවසට පැමිණ ඇත. ඔවුහු එදින උදයේ දුම්රියේ නැගී කටාරියාවලට පැමිණ එහි සිට කුශී නදිය දිගේ ඔරුවකින් පැමිණියහ. ලොබ්ටූලියා, බෝමයිබූරු, ථූලකියා බයිහාර් ආදී වනගත ප්‍රදේශ නොදැක්කොත් එවැනි වෙනත් වනාන්තර ඔවුන්ට දකින්නට නොලැබෙනු ඇතැයි සිතා ඔවුහු මෙහි පැමිණ ඇත. ඔවුන්ට කුශී නදියේ ඔරුව අසලට සැතපුම් හතරක් පමණ ආපසු පයින් යාමට සිදුවේ. ඔවුන් එදාම රාත්‍රියේ පූර්ණියා නගරයට යාමට පිටත්වනු ඇත.

ඇත්ත වශයෙන්ම මම ඔවුන්ගේ ක්‍රියාව ගැන පුදුමයට පත්වූයෙමි. ඔවුන් ළඟ තිබුණු කානු දෙකේ තුවක්කුව ගැන පමණක් විශ්වාසය තබා ළමා ළපටින්ද රැගෙන වන මැදට විනෝද ගමනක් සංවිධානය කරගෙන පැමිණ සිටි ඔවුන් තුළ ධෛර්‍යය ඇති බව නම් පිළිගත යුතු වුවත් රායි බහදූර් මේ ගැන මීට වඩා කල්පනාකාරී විය යුතුවන්නට තිබිණ යයි මට සිතිණ. මෝහනපුරා වනය අසලින් ඒ පළාතේ අය පවා සවස්වන විට නොයන්නේ කුළු මීහරකුන්ගෙන් වන අනතුරු නිසාය. මෙහිදී කොටි ව්‍යාඝ්‍රයින් පවා හමුවීමට ඉඩ ඇත. වල් ඌරන්ගෙන්ද, සර්පයින්ගෙන්ද, සිදුවන විපත්වලින් අඩුවක් නැත. මෙය අඹු දරුවන්ද රැගෙන විනෝද ගමනක් ඒමට කිසිසේත්ම සුදුසු තැනක් නොවේ.

රායි බහදූර් මට හිඳගන්නට යයි කියා තේ බොන්නට ආරාධනා කළේය. මා ලී වෙළඳාමට සම්බන්ධ වූ කෙනෙකු දැයි ඔහු විමසුවේය. මා ගැන විස්තර කියා ඔවුන්ට මා සිටින තැන රාත්‍රිය ගතකිරීමට පැමිණෙන ලෙස ආරාධනා කළෙමි. ඔවුන් එයට එකඟ වූයේ නැත. රාත්‍රි දහයට කටාරියාවෙන් පිටත් වන දුම්රියේ නැග එදින රාත්‍රියේ දොළහ වන විට පූර්ණියාවලට ළඟා වීමට ඔවුන්ට අවශ්‍ය විය. එදින නොගියහොත් එහි සිටින නෑදෑයින් කලබල වනු ඇතැයි ඔවුහු කීය. ඒ හැරත් වෙනත් වැඩ කටයුතු වගයක් ද ඇති නිසා එදිනම යා යුතු බව ඔවුහු පැවසූහ.

ඔවුන් මේ තරම් දුරක් වනය මැදට ආවේ ඇයි දැයි මට සිතාගත නොහැකි විය. ලොබ්ටූලියා බයිහාරයේ විවෘත නිදහස් මිටියාවත, තුරු ගොමු, ඈත වූ ගල්පර්වත ආදියෙන් මැවුණු අපූරු දර්ශනයත් හිරු බැස යාමේ දර්ශන, පඳුරු මත පිපී ඇති වසන්තයේ මල් පොකුරු ආදිය දැකීමටවත් කුරුලු කූජන ඇසීමටවත් ඔවුන්ට උවමනාවක් නැති බව මට පෙනී ගියේය. ඔවුහු කෑගසමින්. ගී ගයමින්, දුවපනිමින්, කෑම බීම පිළියෙළ කරමින් සිටියහ. ඔවුන් අතර වූ ගැහැනු ළමයි දෙදෙනෙක් කල්කටා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවෝ වූහ. අනෙක් අය පාසල්වල ඉගෙන ගන්නා අය වූ අතර පිරිමි ළමයින්ගෙන් එක් අයෙක් වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයෙක් විය. ස්වභාව ධර්මයාගේ මේ සුන්දර රාජ්‍යයට අහම්බෙන් පැමිණෙන්ට අවස්ථාව ලැබුණත් ඔවුන්ගෙන් කිසිවෙකුට එය දැකීමට දෑස් නැති සේය. ඔවුන් පැමිණ ඇත්තේ සතුන් දඩයම් කරනු බලන්නටය. හාවුන්, කුරුල්ලන්, මුවන් ආදී ඔවුන්ගේ තුවක්කුවේ වෙඩි පහර කෑමේ අපේක්ෂාවෙන් මග බලා සිටිනු ඇත.

පැමිණ සිටි ගැහැනුන්ද මඳක්වත් විචාරශීලී බවක් පළ නොකළහ. තැන තැන ඇවිද දර ඇහිඳගෙන ආ ඔවුහු එක දිගටම එකිනෙකාට දොස් කියමින් සිටියහ. කෙතරම් සුන්දර වන ගත පරිසරයක හිඳ තමන් පරිප්පු බත් පිළියෙළ කරන්නේ දැයි දෑස් යොමා බලන කෙනෙක් එහි සිටියේ නැත.

"මෙහේ ඉන්න කොට 'ටින් කටර්' ඕනෑ නෑ. උල් වෙච්ච ගල් පතුරු මෙහේ ඕන තරම් තියනවා." ගැහැනියක් කීවාය.

"මේ පළාතේ හොඳ හාල් ටිකක් වත් ගන්න තැනක් නෑ. ඊයේ මුලු ටවුමේම ඇවිද්දා. ගොරෝසු හාල් විතරයි තිබුණේ. ඔය ගොල්ලෝ කිව්වා නේද බුරියානි හදනවා කියලා?" තවත් එකියක් කීවාය.

ඔවුන් කෑම පිසින තැනට මඳක් ඈතින් රාත්‍රියේ සඳ එළිය ඇති විට සුරඟනුන් රඟදෙන බව ඔවුන් දන්නවාද?"

ඊළඟට ඔවුන් චිත්‍රපට ගැන කථා කරන්නට වූහ. පූර්ණියා නගරයේදී පෙරදින රාත්‍රියේ ඔවුන් චිත්‍රපටියක් නරඹා ඇත. කථාවේ හැටියට එය නිසැකයෙන්ම කමකට නැති එකක් බව පෙනිණ. ඔවුහු කල්කටාවේදී බැලූ චිත්‍රපට සමග එය සසඳන්නට වූහ. ඔවුන් මෙහි පැමිණියත් තමා හුරු පුරුදු ගති අත්හරිද? සවස පහට පමණ ඔවුහු ආපසු යාමට පිටත් වූහ.

ඔවුන් යද්දී හිස් කිරි ටින් සහ ජෑම් ටින් කිහිපයක් අතහැර දමා ගොස් තිබිණ. ලොබ්ටූලියා වනාන්තරයේ තුරු ගොමු යට විසිරුණු ඒ ටින් කබල් ඒ පරිසරයට කෙතරම් නොගැලපෙන බවක් පළ කරන්නේදැයි මම සිතුවෙමි.

වසන්තය අවසානයේදී ලොබ්ටූලියා බයිහාරයේ කෙත්වල තිරිඟු පැසිණ. ගිය වසරේ අපේ වතුයායේ අබ අස්වැන්න සරු විය. මෙවර තිරිඟු අස්වැන්න සරු බව පෙනිණ. කම්කරුවන් සඳහා පැවැත්වෙන සැණකෙළිය වෙසක් මස මුල භාගයේ පැවත්විණ.

මා සිතා සිටියේ මෙවර ශීත කාලය අවසානයේදී ඔවුන් නොඑනු ඇතැයි කියාය. කම්කරුවෝ කණ්ඩායම් වශයෙන් පැමිණ වනාන්තරය අයිනේද, මිටියාවතේද, තැන තැන පැල්පත් අටවාගෙන නැවතී සිටියහ. අක්කර දහස් ගණනක කුඹුරුවල අස්වනු නෙලන්නට කම්කරුවෝ දහස් ගණනින් පැමිණ සිටියහ.

උදේ වරුවේ අසු පිට නගින මට ආපසු බසින්ට සිදුවන්නේ සවස් වූ විටය. විවිධාකාර වූ මිනිස්සු එහි පැමිණෙති. ඔවුන් අතර හොරුද, තක්කඩිද, අසනීප කාරයෝද වූහ. හැම දෙනා ගැනම කල්පනාවෙන් නොසිටියොත් පොලිසියක් ළඟ නැති පළාතේ කුමක් සිදුවේදැයි කිව නොහැක.

දිනක් පිරිමි ළමයින් දෙදෙනෙක් හා ගැහැනු ළමයෙක් පාර අයිනේ හිඳගෙන හඬමින් සිටින බව එතැනින් යද්දී මගේ නෙත ගැටිණ.

මම අශ්වයා පිටින් බැස්සෙමි.

"මොකද වුනේ? ඔයගොල්ලන්ට මොකුත් කරදරයක් වුනාද?"

ළමයින් තිදෙනා පැවසූ අන්දමට ඔවුන්ගේ නිවස පිහිටියේ අපේ වත්තෙන් පිට පිහිටි නන්දලාල් ගබඩා කාරයාගේ ගමේය. සැණකෙළිය බැලීමට පැමිණි ඔවුහු ලී කණුවලට ලනුවලින් තොණ්ඩු දමන ක්‍රීඩාවකට සහභාගි වී ඇත. ක්‍රීඩාව කෙරුණේ සල්ලි ඔට්ටුවටය. බිම සිටුවා ඇති කණුවලට ඇත සිට තොණ්ඩු දැමූ විට ක්‍රීඩා කරන තැනැත්තා ඔට්ටු තබන මුදල වෙනුවට ක්‍රීඩා කරවන්නාගෙන් හතර ගුණයක මුදලක් ලැබේ.

වැඩිමහලු ළමයා ළඟ ඇනා දහයක මාරු කාසි තිබිණ. (පෙසා හැටක්) ඔහුට එක වරක් වත් ක්‍රීඩාවෙන් දිනීමට නොහැකි විය. ඔහු සියලු මුදල් පැරදී තමාගේ මල්ලීගේ ඇනා අටත් නංගීගේ

ඇනා හතරක් රැගෙන ක්‍රීඩා කර ඒ සියල්ලද පැරදී ඇත. ඔවුන්ට දැන් සැණකෙළිය බැලීමට තබා කුසගින්නට කෑමට දෙයක් ගැනීමට පවා මුදලක් නැත.

මම ඔවුන්ට නොහඬන ලෙස කියා සුදුව කෙරෙන ස්ථානයට ඔවුන් කැටිව ගියෙමි. මුලින්ම ඔවුන්ට ඒ ස්ථානය සොයාගැනීමට නොහැකි විය. පසුව අරළු ගසක් පෙන්වූ ඔවුහු මුදල් පැරදුණේ එතැනදී යයි කීය. එහි කිසිවෙක් නොසිටියහ. වත්තේ වැඩ කරන රූප සිං නම් සාජන්වරයාගේ සොහොයුරා අප අසල සිටියේය.

"ඔය සුදු කාරයෝ එක තැනක ඉන්නේ නෑ සර්. කොහොම හරි ලිස්සන්න ඇති." ඔහු කීවේය.

සවස් වන විට සුදු කරුවා අල්ලා ගත හැකි විය. ඔහු සැතපුම් තුනක් පමණ ඈත වූ ගමක සුදුව කරගෙන යනු දුටු අපේ වත්තේ හටයෝ ඔහු අල්ලාගෙන මා ඉදිරියට ගෙන ආවෝය. ළමයින් තිදෙනා ඔහුව හඳුනා ගත්තේය.

ළමයින්ගේ මුදල් ආපසු දෙන්නට කීවත් ඔහු එයට එකඟ වුයේ නැත. ඔහු ඔවුන්ගෙන් මුදල් බලෙන් නොගත් බවත් ඔවුන් කැමැත්තෙන්ම තමාට මුදල් දුන් බවත් කී ඔහු එහි වරද කුමක් දැයි ඇසුවේය. අන්තිමේදී ඔහුට ළමයින්ගේ මුදල් සියල්ලම ආපසු දීමට සිදුවිය. මම ඔහුව පොලිසියට බාර දෙන්නට යයි හටයින් කීවෙමි. ඔහු වැඳ වැටෙන්නට විය.

"නමුසෙගේ ගෙදර කොහෙද?"

"බාලියා දිස්ත්‍රික්කයේ මහත්තයෝ."

"ඇයි මෙහෙම මිනිසුන්ව රවටන්නේ? සල්ලි කියක් වංචා කළාද මිනිසුන්ට?"

"මං දුප්පත් මිනිහෙක් සර්. මට යන්න අරින්න. මේ දවස් තුනටම රුපියල් දෙකයි ඇනා තුනයි මට හම්බ වුනේ."

"ඒ කියන්නේ දවස් තුනට කම්කරුවෙකුට වඩා හම්බ කරලා තියෙනවා."

"අවුරුද්ද පුරාම ඔය වගේ හම්බ වෙන්නේ නෑ සර්. මුළු අවුරුද්දේම එකතු කළත් රුපියල් තිහ හතළිහකට වඩා ලැබෙන්නේ නෑ."

මම එදින ඔහුට යන්නට ඉඩ දුන්නේ එදිනම වත්තෙන් පිටවී යන බවට පොරොන්දු කරවා ගෙනය. නැවත කවදාවත් අපේ වත්තට නොඑන ලෙසද මම ඔහුට කීවෙමි.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

ප්‍රිටින් පැමිණි කම්කරුවන් අතර මෙවර මංචි නොදුටු මම පුදුමයටත් කණගාටුවටත් පත් වූයෙමි. ඇය තිරිඟු කපන කාලයට ආපසු එන බව කීප වරක්ම කීවාය. සැණකෙළිය අවසන් වන්නට ආසන්න වුවත් ඇය පැමිණියේ නැත්තේ ඇයි දැයි මට සිතාගත නොහැකි විය.

අනික් කම්කරුවෝද ඒ ගැන කීමට දැන නොසිටියහ. කුඹි නදියට දකුණින් වූ වතු යාය ඇරෙන්නට කුලී වැඩට යාමට වෙනත් වත්තක් ළඟ පාතක නොවීය. ඔවුන්ට මේ වත්තට නැවත් එතරම් දුර යාමට උවමනාවක් ද නැත.

අන්තිමේදී සැණකෙළිය අවසන් වීගෙන එද්දී කම්කරුවෙකුගෙන් ඔවුන් ගැන ආරංචියක් දැන ගන්න ලැබිණ. ඔහු නක්ඡේදී හා මංචි හඳුනයි. ඔහු නොයෙක් තැන්වල ඔවුන් සමග වැඩ කර ඇත. පසුගිය මැදින් මාසයේ අක්බර් පුරයේ රජයේ වතුයායක ඔහු ඔවුන් සමග කුඹුරුවල වැඩ කළ බවත් ඉන්පසු කොහේ ගියාදැයි දැනගන්නට නොලැබුණු බවත් ඒ කම්කරුවා කීවේය.

සැණකෙළිය අවසන් වීමෙන් පසු පොසොන් මස මැද භාගයේ දිනක් නක්ඡේදී හකත් මගේ කාර්‍යාලයට පැමිණි බව දැක මම පුදුමයට පත් වූයෙමි. නක්ඡේදී මගේ දෙපා අල්ලාගෙන හඬා වැටුණේය. මම පුදුමයට පත්වී ඔහුගෙන් දෙපා නිදහස් කර ගතිමි.

"මොකද වුනේ? ඇයි ඕගොල්ලෝ මේ පාර ආවේ නැත්තේ? මංචි කෝ? සනීපෙන් ඉන්නවද?"

මා ඇසූ දේවලට පිළිතුරු වශයෙන් ඔහු කියූ දේවල සාරාංශය මෙයයි. දැන් මංචි කොහේදැයි ඔහු නොදනියි. ඇය ඔවුන් දමා පලා ගොස් ඇත.

මම ශෝකයටද විස්මයටද පත්වූයෙමි. මහලු නක්ඡේදි පිළිබඳව අනුකම්පාවක් ඇතිවූයේ නැතත් ගැමි කෙල්ල පිළිබඳව මා තුළ සාංකාවක් ඇතිවිය. ඇය කොහේ ගොස් ඇද්ද? කිසිවකු ඇය රවටාගනෙ ගොස් ඇද්ද? දැන් ඇය මොන තත්වයක සිටීද? විසිතුරු බඩු පිළිබඳව ඇගේ ඇති ඇල්ම ප්‍රයෝජනයට ගන්නා කෙනෙකුට ඇය රවටා ගැනීම අපහසු නැත. සිදුවන්නට ඇත්තේ එවැනි දෙයකැයි මට සිතුණි.

"එයාගේ දරුවා කොහේද?"

"දරුවා දැන් නෑ. ගිය නවම් මහේ වසූරිය හැදිලා මැරුණා."

එය ඇසූ මා තුළ දැඩි දුකක් ඇති විය. ඒ අසරණිය තම පුතා මළ සොවින් කොහේ හෝ යන්නට ඇත්ද? මම ටික වේලාවක් නිහඬව සිටියෙමි.

"තුලසී කොහේද?"

"එයා මාත් එක්ක ඇවිත් ඉන්නවා. අපට ඉඩම් කැල්ලක් දෙන්න සර්. අපි දෙන්නා නාකියි. අපට ඉස්සර වගේ තැන තැන ගිහින් ගොයම් කපලා ජීවත් වෙන්න බෑ. මංචි ඉන්න කොට එයාගේ උදව්වෙන් තමයි අපි තැනින් තැන ගියේ. මංචි අපේ අත පය කඩා දාලා ගියා වගේ."

රෑ බෝවූ විට මම නක්ෂේදීගේ පැල්පතට ගියෙමි. තුලසී ඇයගේ දරුවන්ට කෑමට දීමට වීන තණහාල් ලිපේ තබා තිබුණි. මා දුටු තුලසී හඬන්නට වුවාය. මංචිගේ පිටවීම ගැන ඇයද බොහෝ දුක්වන බව පෙනිණ.

"මේ හැම එකක්ම වුනේ මේ නාකි මිනිහගේ වැරැද්දෙන්. ආණ්ඩුවෙන් කට්ටිය ආවා වසූරිය ට බේත් විදින්න. මේ මිනිහා බේත් විදින්න ආපු අයට ඇනා හතරක් දිලා පිටත් කළා . බේත් විද්දම වසූරිය හැදෙනවා කියලා කාටවත් බේත් විදින්න දුන්නේ නෑ. දවස් තුනක් ගියේ නෑ. මංචිගේ දරුවට වසූරිය හැදුණා. පස්සෙ මැරිලත් ගියා. මංචි ඒ දුකට පිස්සු වැටුණා වගේ වුණා. කෑවේ බීවේ නෑ. එක දිගටම ඇඩුවා."

"ඊට පස්සේ?"

"ඊට පස්සේ අපිව වත්තෙන් පන්න ගත්තා. වසූරිය හැදුණ ළමයෙක් අපේ පවුලේ හිටපු නිසා අපට එහේ ඉන්න දෙන්න බෑ කිව්වා. ඒ දවස්වල රාජ්පුත් කොල්ලෙක් මංචිට ඇහැ ගහගෙන හිටියා. අපි එහෙන් ආපු දවසේ රෑ ඉඳලා මංචි කොහේ ගියාද දන්නේ නෑ. මං එදා උදේ අර කොල්ලා අපේ ගේ ළඟ කැරකෙනවා දැක්කා. මේක උගේ වැඩක් තමයි සර්. මංචි කල්කටාව බලන්න ඕන කිය කියානේ හිටියේ. මං හිතන්නේ එහේ එක්ක යනවා කියලා රවට්ටගන්න ඇති."

මංචි පසුගිය වසරේදී කල්කටාව බැලීමට තමාගේ ඇති ආශාව ගැන කී බව මට සිහිවිය. කපටි රාජ්පුත් තරුණයා ඒ මෝඩ කෙල්ලට කල්කටාව පෙන්වන බව කියා රවටා ගන්නට ඇත.

මෙවැනි අවස්ථාවලදී පිටිසර පළාත්වලින් එන අයගේ අවසාන ඉරණම විසඳෙන්නේ නුදු පළාත්වල තේ වතුවල කම්කරුවන්

බවට පත්වීමෙනි. අවසාන කාලයේ ඇසැම්හි පර්වත ආශ්‍රිත තේ වත්තක හිරවී ජීවත් වීමට මංචිගේ ඉරණමේ ලියවී ඇත්ද?"

මහලු නක්ෂේදී ගැන මා තුළ තරහක් ඇති විය. මේ සියල්ලටම මුල්වූයේ ඔහුය. එතරම් මහලු වයසකදී ඔහු මංචිව විවාහ කරගත්තේ ඇයි? වසූරිය වැලැක්වීමට බෙහෙත් එන්නත් කිරීම සඳහා පැමිණි අයට අල්ලස් දී පිටත් කළේ ඇයි? ඔවුන්ට වත්තෙන් ඉඩම් ලබා දුන්නත් මා එසේ කරන්නේ ඔහුගේ පළමු බිරිඳ වන තුලසී සහ ඇගේ දරුවන් නිසාය

මම ඔවුන්ට ඉඩම් කොටසක් ලබා දුනිමි. ඉක්මනින් නාඩා බයිහාරයේ ජනයා පදිංචි කරවීමට යයි ප්‍රධාන කාර්යාලයෙන් දන්වා තිබිණ. එහි පළමුවෙන්ම පදිංචි කරවුයේ නක්ෂේදිය.

නවමත් එය ඝන කැලෑවකි. ටික දෙනෙක් කැලය කපා පැල්පත් තැනීම සඳහා වැඩ ආරම්භ කරමින් සිටියහ. නක්ෂේදි මුලින්ම කැලය දැක පසුබට විය.

"කොටි ඇවිල්ල මහ දවල් අපිව කාලා යයි සර්. ළමයිනුත් එක්ක මෙහෙම තැනක ඉන්නේ කොහොමද?"

මම ඔහුට පැහැදිලිවම කීවේ ඔහු එතැනට අකමැති නම් වෙනත් තැනකට යන ලෙසය.

කරන්නට දෙයක් නොමැති කමින් නක්ෂේදි එය බාර ගත්තේය.

* * * * * *

නක්ෂේදී එහි පදිංචි වූ පසු මට සෑහෙන කලකින් එහි යාමට නොහැකි විය. දිනක් සවස් වරුවක මම නාඩා බයිහාරයේ කැලය මැදින් එද්දී එළිකළ බිම් කොටසක් හමු විය. එක ළඟ තැනූ කුඩා පැල්පත් දෙකක් එහි විය. එක් පැල්පතක එළියක් දල්වා ඇති බව පෙනිණ.

එය නක්ෂේදිගේ පැල්පත බව මම කලින් දැන නොසිටියෙමි. අශ්වයාගේ හඬ අසා මැදි වියේ වූ ගැහැනියක් පිටතට පැමිණියාය.

ඇය තුලසී බව මම දුටුවෙමි.

"ආ. ඕගොල්ලෝ ඉඩම් ගත්තේ මෙහෙන් නේද? නක්ෂේදි කෝ?"

තුලසී මා දැක කලබල වී පැදුරක් බිම එළා මට කථා කළාය.

"බහින්න මහත්තයා. ගෙට ඇවිත් ඉඳගන්න. එයා ගියා ලුණු, තෙල් එහෙම ගේන්න ලොබ්ටූලියාවට. ලොකු ළමයත් එක්කයි ගියේ."

"මේ කැලේ මැද්දේ තනියම නේද ඉන්නේ?"

"ඒවා දැන් අපට පුරුදු වෙලා මහත්තයා. අපි වගේ දුප්පත් අය ඕවට බය වෙලා පුළුවන්ද? තනියමත් ඉන්න වෙනවනේ. මංවි ගියේ අපේ අවාසනාවට. මංවි ඉන්න කොට කිසි බයක් නෑ. කොයි තරම් දහිරියක් තිබුණ කෙල්ලක්ද? මංවි හරි සැරයිනේ මහත්තයා."

තුලසි ඇයගේ සැමියාගේ දෙවෙනි බිරිඳට ආදරය කරන බව පෙනිණ. මේ බෙංගාලි කාරයා මංවි ගැන අසන්නට කැමති බවද තුලසි දනියි.

තුලසිගේ දියණිය වන සූරතියා පැමිණ මට කථා කළාය.

"අපේ ගෙදර ගෝන පැටියෙක් ඉන්නවා.මහත්තයට පෙන්නන්නද? දවසක් හවසක අපේ ගේ පිටිපස්සේ කැලේ 'සර' 'සර' ගානවා ඇහිලා මමයි ජනියයි ගිහින් අල්ලාගෙන ආවා. හරි ශෝක් ගෝන පැටියා."

"ඌ මොනවද කන්නේ?"

"පිදුරු ඇරෙන්න ගස්වල දළු කොළ විතරයි කන්නේ. මං කේංද් ගස්වල දළු කඩලා ගෙනැත් දෙනවා."

"ඌව මහත්තයට පෙන්නපන් දුවේ."

සූරතියා මුව දෙනක් සේ දිව ගොස් පැල්පත පිටුපසින් නොපෙනී ගියාය. ටික වේලාවකින් ඇගේ කටහඬ ඇසිණි.

"අයියෝ ගෝන පැටියා අත ඇරුණා. අර. අර දුවන්නේ. ජනියා ඌව ඉක්මනට අල්ල ගනින්."

සොහොයුරියෝ දෙදෙනා එහාට මෙහාට දුව පැන ගෝන පැටියා අල්ලා ගෙන, හති දමමින් සිනාමුසු මුහුණින් යුතුව මා ඉදිරියට ගෙන ආවෝය. අඳුරට සතා හරි හැටි නොපෙනෙන නිසා තුලසී දැල්වෙන ගිනි පෙනෙල්ලක් ළිපෙන් ගෙන ඔසවාගෙන සිටියාය.

"මු හොඳයි නේද මහත්තයා? ඊයේ රෑ මූව වලහෙකුට අහුවෙන්න ගියානේ. ඊයේ රෑ මැද අර පේන මී ගහේ මල් කඩාගෙන කන්න වලහෙක් ආවා. ඒ වෙලාවේ අම්මයි නාත්තයි නිදි. මට තේරුණා වලහෙක් ආපු බව. ඊට පස්සේ ඌ අපේ ගේ පිටිපස්සට ආවා. මං මූව තුරුල් කරගෙන නිදාගෙන හිටියේ. වලහගේ සද්දේ ඇහුණට පස්සේ මං මුගේ ඔළුව තව ටිකක් ඇහට තද කරගෙන වහගෙන හිටියා.

"බය හිතුණේ නැද්ද සූරතියා?"

"ආ. බය වෙන්නේ මොකටද? මං බය නෑ. මං දර අහුලන්න ගියාම කොච්චර වලස්සු දැකලා තියෙනවද? එහෙමත් බය වෙලා පුළුවන්ද මහත්තයා?"

සූරතියා පණ්ඩිතයෙකු මෙන් එසේ කියා මා දෙස බැලුවාය.

පැල්පත වටා උස් කේංද් ගස් වැව් තිබුණේ කැලිෆෝනියාවේ ඇතැයි කියන රෙඩ්වුඩ් කැලයක් සේය. වවුලන් හා නිශාචර කොකුන් තටු ගසන හඬ තුරු වදුලු අතරින් ඇසිණ. අවට වූ පඳුරු මත අදුරේ තැනිත් තැන කණමැදිරි එළි දැල්වෙනු පෙනිණ. පැල්පත පිටුපස වනයේ සිවලුන් කෑ ගසන හඬ ඇසිණ. ළමා ළපටින් සමග ඔවුන්ගේ මව පාළු වන මිටියාවතේ කෙසේ සිටින්නීදැයි මට සිතා ගත නොහැකි විය. සියල්ල දත් දෙවියන් තුළ මෙවනි ගුප්ත වූ වනාන්තර ආශ්‍රිත ජනයා කෙරෙහි දැඩි කරුණාවක් ඇති සේය.

"මංවි එයාට අයිති දේවල් ඔක්කොම අරන් ගිහින්ද?" මම පසුව ඇසුවෙමි.

සූරතියා එයට පිළිතුරු දුන්නාය.

"පුංචි අම්මා කිසි දෙයක් අරන් ගිහිල්ලා නෑ. අර ගිය පාර මහත්තයට පෙන්නුව පෙට්ටියත් දාල ගිහින්. ඒක ගේන්නද?"

ඇය පෙට්ටිය ගෙනැවිත් මා ඉදිරියේ විවෘත කළාය. පතා, කණ්ණාඩි, ඇට මාල හා කොළ පැහැති ලේන්සුවක් යනාදිය එහි විය. එය කුඩා දැරියකගේ සෙල්ලම් බඩු එකතු කර දමන පෙට්ටියක් වැනි විය. සියල්ල තිබුණත් ඇය සැණකෙළියෙන් මිලදී ගත් ගිය වර මට පෙන්වූ වර්ණවත් පබළු මාලය එහි නොවිය.

ඇය තමාගේ ගේ දොර හැර පියා ගිහින් ඇත්ද? මොවුන් මෙපමණ කලකට පසු ඉඩම් ඉල්ලාගෙන එක් තැන පදිංචි වන විට ඇය පමණක් අහිකුණ්ඨික ජීවිතයක් ගත කරමින් සිටිනවාද?

මා ආපසු යාමට අශ්වයා පිට නගිද්දී සූරතියා මට කථා කළාය.

"ආයිත් එන්න මහත්තයා. අපි දැල් දාලා කුරුල්ලෝ අල්ලනවා. අපි අලුත් දැලක් වියලා තියනවා. අපි ඩාහුක් කුරුල්ලෙකුයි ගුඩ් ගුඩ් කුරුල්ලෙකුයි ඇති කරනවා. උන් කෑ ගැහුවම අනිත් කුරුල්ලෝ ඇවිත් දැලේ පැටලෙනවා. දැන් රෑ වෙලා. නැති නම් පෙන්වන්න තිබුණා."

නාඝා බයිහාරයේ මිටියාවත මැදින් වැටුණු පාරේ රෑ බෝ වුනාට පසු ගමන් කිරීම අනතුරු දායක විය. පාරේ වම්පසින් කුඩා දොළ පාරක් ගලා බසියි. තැනින් තැන පිපුණු වනමල් නිසා අඳුරු පරිසරය සුවඳින් පිරී පැවතිණ. අශ්වයාගේ පිටේ ඇති ලෝම වත් නොපෙනෙන තරමට අඳුර දැඩි විය. සමහර තැන්වලදී පමණක් මඳ තරු එළියක් දිස්විය.

නාඝා බයිහාරය නානාප්‍රකාර වූ වෘක්ෂ ලතාදියටත්, වන සිවුපාවුන්ටත්, කුරුල්ලන්ටත් සෙවණ දෙන තැනකි. ස්වභාව ධර්මයා වනයත් තැනිතලාවත් තමාගේ අසංඛ්‍යවූ ධන සම්පත්වලින් සරසා ඇත. බයිහාරයේ උතුරු කෙළවරේ සරස්වතී වැව පිහිටියේය. කුශී නදියේ අතු ගහක් ඒ ප්‍රදේශයේ තිබුණු බව පැරණි මිණුම් පිඹුරුවල සටහන් වී තිබේ. මේ වන විට එය ගොඩවී වනයෙන් වැසී ජලාශයක් පමණක් ඉතිරිවී තිබිණ.

පුරා යත්‍ර ස්‍රෝතඃ පුලින මධුනා තත්‍ර සරිතාම්, (පෙර යම් තැනක දිය පහරක් වීද දැන් එනන ඇත්තේ වැලි තලාවකි.)

නිහඬ රාත්‍රියේ ඒ වන භූමිය මා කෙතරම් ආකර්ෂණීය ලෙස දුටුවාද? එසේ වුවත් මගේ හිතේ තැවුලක් හට ගත්තේ නාඝා බයිහාරයේ ඒ වනාන්තරය වැඩි කල් නොගොස් විනාශ වී යන නිසාය. මා එතරම් ප්‍රිය කළ පරිසරය මා අතින්ම විනාශ වී යනු ඇත. ඊළඟ අවුරුදු දෙක ඇතුළත මුළු වතුයායම වගා සඳහා බෙදා දීමට සිදුවනු ඇත. එහි අපිරිසිදු ගම්මාන ගොඩනැගෙනු ඇත. වසර සිය ගණනක් පුරා සොබා දහම් මව විසින් තමාගේ දෑතින් සරසන ලද නාඝා බයිහාරයේ අනුපම වූ සෞන්දර්‍යයත්, දුර ඈත දක්වා විහිද ගිය මිටියාවතත්, නොදැනීම විනාශ වී යනු ඇත. ඒ වෙනුවට අප ලබන්නේ මොනවාද? අපිරිසිදු පැල්පත්, ගවගාල්, ඉරිගු කෙත්, ලනු ඇඳන්, හනුමාන් කොඩි, දුම්කොළ හප, කොළරා වසංගත යනාදියයි. පුරාණයේ සිට පවතින ආරණ්‍ය භූමිය! මට සමාවනු මැනවි.

* * * * * *

මම දිනක් සුරතියා කුරුල්ලන් අල්ලනු බැලීමට ගියෙමි.

සුරතියා හා ජනියා කුඩු දෙකකුත් රැගෙන බයිහාරයේ නිදහස් තැනිතලාව දෙසට මා සමග ගමන් කළෝය.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

සන්ධ්‍යා සමයේ මිටියාවතේ දිගු සෙවණැලි සාදමින් සූර්යයා කඳු වැටිය දෙසට පහත් විය. බාලිකාවෝ කොට්ට ගස් යට වැවී තිබුණු තණකොළ පඳුරු මත කුඩු දෙක තැබූහ. ඒ තුළ සිටියේ ඔවුන් ඒ ඇති කරන කුරුල්ලන් දෙදෙනාය. ඩාහුක් කුරුල්ලා අනික් කුරුල්ලන් ගෙන්වා ගැනීම සඳහා නාද කරන්නට විය.

අනිත් කුරුල්ලා ඒ සමග නාද කළේ නැත.

සුරතියා අසුරු සන් ගසා ඌට කථා කළේය.

"කුරුල්ලෝ කෝ උඹේ නාදේ ? නාද කරපන්" ඒ කුරුල්ලාද "ගුඩු.....ඩූ.....ඩූ" යයි නාද කරන්නට විය.

නිහඬ සන්ධ්‍යාවේ ඈත දක්වා විහිදී ගිය තැනිතලාවේ පාළුව අතර ඒ හඬ, කිසියම් චමත්කාරයක් ඇති කරමින් සවන් වැකිණ. එය දිගන්තය දක්වා විහිදුණු චිත්‍රයකට, නිදහස් සක්වල පිළිබඳ සිහිනයකට, එසේ නැතහොත් ඡායාරහිත සඳ එළියකට, උපමා කළ හැක.

අසල වූ තණ පඳුරු අතර කහ පැහැති දූඹිලි මල් රාශියක් පිපී තිබිණ. ජනියා ඒ මත සිහින් බට පතුරුවලින් තනා තිබුණු දැල දැමූ ඇය එයට යටින් ගුඩ් ගුඩ් කුරුල්ලාගේ කුඩුව තබා වැසුවාය.

"යමු මහත්තයා අපි අර පඳුරු අස්සේ හැංගිලා ඉඳිමු. අපිව දැක්කොත් කුරුල්ලෝ පැනලා යනවා."

අපි සල් ගස් ගොන්න අසල ඇන තියාගෙන හිඳගෙන සිටියෙමු.

වරින් වර ඩාහුක් කුරුල්ලාද නාද කරන්නට විය. ගුඩ් ගුඩ් කුරුල්ලාගේ හඬේ නැවතීමක් නොවිය. එය මට මිහිරි හඬක් විය.

"සුරතියා. ඔය ගුඩ් ගුඩ් කුරුල්ලා මට විකුණනවද? කීයටද දෙන්නේ?"

"සද්ද කරන්න එපා මහත්තයා. ඔය ඇහෙනවද? කුරුල්ලෝ එනවා."

ටික වේලාවක් නිහඬව සිටීමෙන් පසු උතුරු දෙසින් එවැනිම හඬක් ඇසෙන්නට විය.

මගේ සිරුරේ ලොමු දැහැ ගත්තේය. වනයේ කුරුල්ලෙක් කුඩුවේ සිටින කුරුල්ලාගේ හඬට පිළිතුරු දෙමින් සිටියි. ඒ හඬ කුඩුවේ සිටින කුරුල්ලා දෙසට ක්‍රමයෙන් ළඟා වන්නට විය.

ටික වේලාවක් යන තුරු කුරුල්ලන් දෙදෙනාගේ හඬ ළඟ ළඟ ඇසෙන්නට විය. ක්‍රමයෙන් කුරුලු හඬවල් දෙකම එකතු වී එක ස්වරයෙන් ඇසිණ. ඊළඟට කුඩුවේ කුරුල්ලාගේ හඬ පමණක් ඇසෙන්නට විය.

ජනියා සහ සූරතියා ඒ දෙසට දිව ගියහ. ඔවුන්ගේ උගුලට කුරුල්ලෙකු අසුවී සිටියි. මමද එදෙසට දිව ගියෙමි. කුරුල්ලාගේ දෙපා උගුලට හිරවී තිබිණ. ඌ දඟලමින් සිටියේය. උගුලට අසුවීමත් සමගම උගේ හඬ නැවතිණ. කෙතරම් පුදුම සහගතද? දැසින් නුදුටුවා නම් මට එය විශ්වාස කිරීමටද අපහසුය.

සූරතියා කුරුල්ලා අතට ගත්තාය.

"බලන්න මහත්තයා උගුලට කකුල් දෙකම අහුවෙලා තියෙන හැටි. මේ දැක්කද?"

"ඔය කුරුල්ලට මොකද කරන්නේ?"

"නාත්තා පොළට ගෙනියනවා විකුණන්න. මේ ජාතියේ එක කුරුල්ලෙක් පෙසා දෙකයි. අනිත් ජාතියේ කුරුල්ලෙක් පෙසා හතයි."

"ඔය කුරුල්ලා මට විකුණන්න. මං සල්ලි දෙන්නම්."

සූරතියා මට කුරුල්ලා දුන්නේ මුදල් නොගෙනය. ඇය මගෙන් මුදල් ගැනීමට කිසිසේත්ම එකඟ නොවූවාය.

* * * * * *

වප් මාසයේ දිනක දෝබරු පන්නා රජු මිය ගිය බව මට දැනගන්නට ලැබිණ. රජ පවුල කරදරයකට පත්වී ඇති බවත්, හැකි නම් ඇවිත් යන ලෙසත් ජගරු පන්නා මට දන්වා එවා තිබිණ.

මම එවේලේම යාමට පිටත් වූයෙමි. රෑ බෝවීමට පෙර චක්මකි ගමට ළඟා වීමට මට හැකි විය. රජුගේ වැඩිමහල් පුත්‍රයා සහ මුණුබුරා පෙර ගමන් කොට මා කැඳවාගෙන ගියෝය. දෝබරු රජු හරකුන්ට තණ කැවීමට ගිය අතරතුර වැටී දණහිස් බිඳිගිය බවත්, ඒ තුවාලයම මරණයට හේතු වූ බවත් මට දැනගන්නට ලැබිණ.

රජු මිය ගිය බව ඇසූ අසල ගමක සිටින ණයට මුදල් දෙන කෙනෙකු අවුත් රජුගේ ගවයින් ටික බැඳගත් බවද, ණයට ගත් මුදල් නුදුන්නොත්, උන් නිදහස් නොකරන බවද මට දැනගන්නට ලැබිණ. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා සේ වූ වැඩක් මෙතැන සිදුවී ඇත. අලුතෙන් පත්වන රජතුමාගේ අභිෂේක උත්සවය ළඟදීම සිදු

කිරීමට නියමිතය. ඒ සඳහාද වියදම් කිරීමට මුදල් අවශ්‍ය වන නමුත් ඔවුන් ළඟ මුදල් නැත. ණය දුන් තැනැත්තා හරකුන් ටික නමා හාරයේ තබාගත හොත් ඔවුන් තවත් අපහසුවට පත්වනු ඇත. දෙනුන්ගෙන් ලබා ගන්නා කිරි විකුණා රජ පවුලේ නඩත්තුව සඳහා අවශ්‍ය මුදලින් සෑහෙන කොටසක් ඔවුහු උපයා ගත්හ.

විස්තර ඇසූ මම පොළියට මුදල් දෙන තැනැත්තා ගෙන්වා ගෙන ඔහු සමග ඒ ගැන කථා කළෙමි. ඔහුගේ නම වීර්බල් සිං විය. ඔහු මා කියන දේ පිළිගැනීමට කිසිසේත්ම සූදානම් නොවීය. මුදල් ලැබෙන තුරු ගවයින් නිදහස් කිරීමට ඔහු කැමති නොවීය.

හානුමතී මා ළඟට පැමිණ අඬන්නට වූවාය. ඇය තමාගේ මුත්තණුවන් කෙරේ දැඩි ආදරයක් දැක්වූවාය. ඔහු සිටිද්දී ඔහුගේ පිහිට ඇයට පර්වතයක සෙවණක් සේ දැනිණ. ඔහු දෙනෙත් පියා ගත් පසු සියලු කලබගෑනි ආරම්භ විය. ඇය එවැනි දේ කියමින් නොනවත්වා හඬන්නට වූවාය.

"මාත් එක්ක කන්දට යමු මහත්තයා. සීයාගේ සොහොන බලන්න. මට මොකුත් කරන්න හිතෙන්නේ නෑ මහත්තයා. එහාට ගිහින් ඉඳගෙන ඉන්නමයි හිතෙන්නේ."

"ටිකක් ඉන්න. මේ ප්‍රශ්නේ ගැන මොනවා හරි කරන්න බලමු ඊට පස්සේ යමු."

එසේ වුවත් ණය දුන් තැනැත්තාගෙන් කිසිම සහනයක් ලබා ගත නොහැකි විය. දැඩි සිත් ඇති රාජපුත්වරයා කාගේ වත් ඉල්ලීමක් පිළිගැනීමට සූදානම් නොවීය. බොහෝ පෙරැත්ත කිරීමෙන් අනතුරුව ගවයින් එහිම බැඳ තැබීමට ඔහු එකඟ විය. එසේ වුවද කිරි ලබා ගැනීමට ඉඩ නොදෙන ලදී. ඔහුගේ ණය බේරීමට මාර්ගයක් පැදුණේ මාස දෙකක් ගත වූ පසුය.

හානුමතී ඔවුන්ගේ නිවස ඉදිරියේ මා එනතුරු නැවතී සිටියාය.

"සවස් වුණා මහත්තයා. තවත් පහු වුනොත් යන්න වෙන්නේ නෑ. යමු සොහොන බලන්න."

හානුමතී මා සමග තනිව කන්දට නැගීමට පැමිණියේ මා ඔවුන්ගේ පවුලේ කිට්ටුම මිතුරෙකු හෝ නෑයෙකු සේ සලකාගෙනය. ග්‍රෝනික ජනයාගෙන් කෙනෙකු වූ ඇයගේ සරල පැවැත්ම හා සුහදතාව දුටු මම පුදුමයට පත්වූයෙමි.

ඒ තැනිතලාව මත සවස් වරුවේ සෙවණැලි වැතිරී තිබිණ. හානුමතී බියපත් වූ මුව දෙනෙක සේ ඉක්මන් ගමනින් ගියාය.

"හානුමති ටිකක් හෙමින් යමු. සේපාලිකා මල් ගස් කොහේද තියෙන්නේ?"

ඒ පළාතේ සේපාලිකා මල් වෙනත් නමකින් හඳුන්වන නිසා ඇයගෙන් එයට උත්තරයක් ලබාගත නොහැකි විය.

කන්දට නගින විට බොහෝ ඈතට යනතෙක් අවට පරිසරය දිස්විය. නිල්වන් ධංජරී පර්වත පේළිය රාජධානියක් නැති දෝබරු පන්නාගේ පළාත වටකරගෙන තිබිණ. බොහෝ දුර සිට සුළං හමා එන්නට විය.

හානුමති ගමන නවතා මා දෙස බැලුවාය.

"නගින්න අමාරුද මහත්තයා."

"නෑ. අමාරුවක් නෑ. ඒ වුනාට හෙමින් යමු."

තවත් ටික දුරක් ගමන් කළ ඇය හැඩුම් ස්වරයෙන් යුතුව මෙසේ කීවාය.

"සීයා යන්න ගියා. මට කවුරුවත් නැතිවුණා මහත්තයා."

ඇයගේ කනාව ඇසූ මට සිත යටින් සිනා පහළ විය. මහලු සීයා මියගොස් ඇතත් ඇයගේ මව්පිය, සොහොයුරු, නැදැයින් ආදී සියල්ලෝම ජීවත්ව සිටිති. හතර වටේම සිටින්නේ ඇයගේ නෑදෑ පවුල්ය. ඒ කෙසේ වෙතත් හානුමති ගැහැනියකි. පිරිමින්ගේ අනුකම්පාව ලබා ගැනීම පිණිස ඇය අනිකුත් ගැහැනුන් මෙන් මෙවැනි දේ කිම ස්වභාවිකය.

"මහත්තයා සැරින් සැරේ මෙහේ ඇවිත් අපිවත් බලලා යන්න. අපිව අමතක කරන්න එපා."

ගැහැනිය හැම තැනම හැම අවස්ථාවේදීම එක ලෙස ක්‍රියා කරයි. වෙනත් තැන්වල ගැහැනුන් මෙන්ම හානුමතිද එකම ආකරයකට හැඩගැසී සිටියි.

"මට අමතක වෙන්නේ නෑ. මං සැරින් සැරේ මෙහේ එනවා."

හානුමති මඳ අමනාපයක් දක්වා තොළ පෙරලා ගත්තාය.

"ඔව්. බෙංගාලෙට ගියාම, කල්කටාවට ගියාම මේ කැලෑ පළාත ගැන මතක් වෙයිද මහත්තයට?"

ඇය නිහඬව සිට මෙසේ කීවාය.

"අපිව මතක් වෙයිද? මා ගැන....."

SL UNLIMITED The spirit of Sri Lankan e-community

මම සෙනෙහස රැඳි ස්වරයෙන් පිළිතුරු දුන්නෙමි.

"ඇයි මතක නැද්ද හානුමතී? මං කණ්ණාඩියක් එව්වේ. මට හානුමතිව අමතන වුණා නම් ඒක එවනවද?"

හානුමතිගේ මුහුණට එළියක් වැටිණ.

"ශහ්! හරි ගෝක් කණ්ණාඩිය. ඇත්තටම මට ඒක හම්බ වුණා කියලා කියන්නත් අමතක වුණා."

රජුගේ ස්මාරක පිහිටවූ නුග ගස ළඟට යන විට රෑ බෝවී තිබිණ. රක්ත වර්ණ සූර්යයා ඈත පර්වත පේළිය පිටුපසින් බැස ගියේය. කොයි වේලාවේ අඩ සඳ නැගී රාත්‍රියේ ගස යට රැස්වන අන්ධකාරය දුරු කරනු ඇත්දැයි බලාපොරොත්තුවෙන් පරිසරය බලා සිටින සේය.

සීයාගේ සොහොන් ගල මත තබන්නට වන මල් ටිකක් කඩාගෙන එන ලෙස මම හානුමතිට කීවෙමි. සොහොන් මත මල් තබා ගෞරව කිරීමේ සිරිතක් එහි නොවිය. මා උනන්දු කරවූ නිසා ඇය අසල වූ සේපාලිකා ගසක් යටින් මල් ටිකක් අහුලාගෙන ආවාය. ඉන්පසු අපි දෝබරු පන්නාගේ සමාධියේ මල් විසුරුවා හැරියෙමු.

ඒ වෙලාවේ නුග ගස මුදුනේ කොක්කු රංචුවක් තටු ගසා ඉගිළ ගියහ. ඒ හඬ ඇසූ මට සිතුණේ දෝබරු පන්නා රජු සහ හානුමති ඇතුළු පිරිසගේ, පිඬිත හා හෙළා දකිනු ලැබූ පැරණි මුතුන් මිත්තන් අප කළ සත්ක්‍රියාව ගැන සතුටට පත්ව එක හඬින් 'සාධු' 'සාධු' යැයි හඬ නැංවූ බවය. ආර්‍යීයන්ගෙන් පැවත එන කෙනෙක් අනාර්‍යීය වූ වනගත රජ කෙනෙකුගේ සමාධියකට මල්පිදූ ප්‍රථම අවස්ථාව මෙය වන්නට ඇත.

15

මේ අතර තුර ධාවතාල් සාහු නම් මුදල් ණයට දෙන තැනැත්තාට අත පෑමට මට සිදුවිය. වත්තේ ආදායම අඩු වූ අවස්ථාවක රුපියල් දහදාහක මුදලක් ප්‍රධාන කාර්‍යාලයට යැවීමට මට සිදු විය. අප ළඟ නිබුණු මුදල ඊට අඩු නිසා බනාරි ලාල් මට උපදෙස් දුන්නේ හිඟ මුදල ධාවතාල් සාහුගෙන් ණයට ගන්නා ලෙසය.

"සර්ට නම් මිනිහා යල්ලි නොදී ඉන්න එකක් නෑ." ඔහු මට කීය.

ධාවතාල් සාහු අපේ වතුයායට අයත් කෙනෙක් නොවීය. ඔහු පදිංචිව සිටියේ රජයට අයත් වතුයායකය. මා සමග ඔහුගේ කිසිම බැඳීමක් නැතිව තිබියදී මට රුපියල් තුන් හාර දහසක් ණයට දීමට ඔහු කැමති වේදැයි මා තුළ සැකයක් ඇති විය. එනමුත් අවශ්‍යතාව දැඩි වූ නිසා දිනක් බනවාරි ලාල් සමග ධාවතාල් සාහුගේ නිවසට ගියෙමි. ඒ ගමන හොර රහසේම සිදු කළේ වත්තේ ගනු දෙනු පිය වූයේ ණයට ගත් මුදලින් බව අන්‍යයින් දැන ගත යුතු නැති නිසාය.

ඔහුගේ නිවස පිහිටියේ ගමක ගෙවල් ගණනාවක් මැදය. ඉඩ කඩ ඇතිව තැනූ ඔහුගේ නිවස ඉදිරියේ ලනු ඇඳන් කීපයක් තිබිණ. ධාවතාල් සාහු වත්තේ එක් පසෙක තිබුණු දුම්කොළ පාත්තියක වල් පැළ ගලවමින් සිටියේය. අප දුටු ඔහු කලබල වී දුවගෙන ආවේය. අපට හිඳගන්නට කියන්නේ කොහේදැයි සිතා ගත නොහැකිව ඔහු ටික වේලාවක් බලා සිටියේය.

"තමුන්නාසේත් අපේ දුප්පත් පැලට ආවාතේ. එන්න. එන්න. ඉඳගන්න සර්. එන්න මේ මහත්තයත් ඇවිත් ඉඳගන්න."

ඔහුගේ නිවසේ මෙහෙකරුවන් සිටින බවක් පෙනෙන්නට නොවීය. රාම් ලඛියා නම් පුෂ්ටිමත් සිරුරක් ඇති මිණිබිරිය අප වෙනුවෙන් දුවපැන ඇවිද්දාය. ඔහුගේ නිවසේ ඇති බඩු මුට්ටු දකින කෙනෙකුට එය ලක්ෂපතියෙකුගේ නිවසක් යයි සිතීමට කිසිසේත්ම ඉඩක් නැත.

රාම් ලඛියා අශ්වයාගේ පිටේ තිබුණු සෑදලය ගලවා ඌ ගස් සෙවණක බැන්දාය. ඇය අපට දෙපා සේදීමට දිය ගෙනවිත් දුන්නාය. ධාවතාල් සාහු නල් කොළ අවානක් ගෙන අපට පවන් සලන්නට විය. ඔහුගේ තවත් මිණිබිරියක් අපට දුම් බීම සඳහා දුම් පයිප්පයට දැමීමට දුම්කොළ පිළියෙළ කිරීමට දිවිවාය. ඔවුන්ගේ උනන්දුව දැක මම කලබල වූයෙමි.

"මහන්සිවෙන්න ඕන නෑ සාහුජී. දුම්කොළ ගේන්නත් ඕන නෑ. මා ළඟ සුරුට්ටු තියෙනවා."

ඔහු අපට කෙතරම් සත්කාර සංග්‍රහ කළත් මා ආ කාරණය කීමට මම පැකුළුණෙමි.

"මැනේජර් මහත්තයා කුරුල්ලෝ දඩයම් කරන්නද මේ පැත්තේ ආවේ?" ධාවතාල් සාහු ඇසීය.

"නෑ. සාහුජී හම්බ වෙන්නමයි ආවේ."

"සර් ආවේ මාව හම්බවෙන්න? මොකද්ද උවමනාව කියන්නකෝ."

"අපේ ඔපිස් එකේ මුදලින් අඩුවක් වෙලා තියෙනවා. රුපියල් තුන්දාස් පන්සීයක හිඟයක් තියනවා. ඒ මුදල ණයට ඉල්ල ගන්න පුළුවන්ද බලන්නයි ආවේ."

කිව යුතුම වූ නිසා ලැජ්ජාවෙන් පැකිලෙමින් කෙසේ හෝ මා කාරණය කියා ගතිමි.

ඔහු වහා පිළිතුරු දුන්නේය.

"ඒ ගැන හිතන්න දෙයක් නෑ සර්. මං දැන්මම දෙන්නම්. ඕකට තමුන්නාන්සේම එන්න ඕනැයැ. පොඩි ලියුම් කෑල්ලක් ලියලා මේ මහත්තයා අතේ එව්වා නම් ඇතිනේ."

ඇත්තම තත්වය පැහැදිලි කරදීම හොඳ යැයි මම සිතුවෙමි. ඒ මුදල් පෞද්ගලික ණයක් ලෙස ගැනීමට මට සිදුවන බවත් වත්ත අයිතිකරුවාගේ නමින් මෙය ගැනීමට මට නෛතික බලතල නැති බවත් කීමෙන් පසුද ඔහු මුදල ණයට දීමට කැමති වනු ඇත්දැයි සැකයක් මා තුළ විය. ණය මුදල වෙනුවෙන් ඇපයට තැබීමට මා ළඟ වටිනා කිසිවක් නැත. මම අපහසුවෙන් එය ඔහුට පැවසුවෙමි.

"සාහුජී ණය දෙන කොට ලියන්න වෙන්නේ මගේ නමට. වත්ත අයිතිකාරයාගේ නමට නෙවෙයි."

ඔහු පුදුමයට පත්විය.

"මොන ලියවිල්ලක්ද? මුදලක් ඕනෑ වෙලා තමුන්නාන්සේ අපේ ගෙදරට ඇවිත් ඉල්ලුවා. තමුන්නාන්සේ නෑවිත් පණිවිඩයක් එව්වා නම් මං ඒත් දෙනවා. කොහේවත් ලියන්න ඕනේ නෑ. වත්තේ ආදායම එකතු කළාම මට එවන්න. එච්චරයි."

"මම හැන්ඩ් නෝට් එකක් දෙන්නම්. එහෙම නැති නම් පොත දෙන්නකෝ. මං අත්සන් කරලා සල්ලි ගන්නම්."

ඔහු දැත් එක්කොට වැඳ මෙසේ කීය.

"සමාවෙන්න සර්. ඔය විදිහට කතා කරන්න එපා. සල්ලි අරන් යන්න."

මා කෙතරම් පෙරැත්ත කළත් ඔහු ඒවා කනකටවත් ගත්තේ නැත. ඔහු ගෙට ගොස් නෝට්ටු කොළ කීපයක් ගෙනැවිත් මට දුන්නේය.

"සර්. එක ඉල්ලීමක් තියනවා."

"මොකද්ද?"

"දැන්මම යන්න එපා. ඉක්මනට උයන්න බඩු ලෑස්ති කරලා දෙන්නම්. කෑම කාල යන්න ඉන්න."

මා එයට විරුධ වුවත් ඒයින්ද පලක් වූයේ නැත. මා බ්‍රාහ්මණයෙකු නිසා කෑම පිසීමට සිදු වන්නේ ඊට සුදුසු කෙනෙකු ලවාම නිසා ඔවුන් මා වෙනුවෙන් කෑම පිසින්නට ඉදිරිපත් වන්නේ නැත.

"බනවාරි ලාල්ට කෑම උයන්න පුළුවන්ද? මට නම් හරියට ඒක කරන්න බෑ."

"එහෙම හරි නෑ සර්. මේ ගම්මැද්දේ ඉඳන් මං උයලා දෙන කෑම කැවොත් සර්ටමයි හොඳ නැත්තේ."

සාවතාල් සාහුගේ මිණිබිරිය බන්දේසියක ආහාර පිළියෙළ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය රැසක් ගෙන ආවාය. කෑම පිළියෙළ කරන අතරතුර සීයාත් මිණිබිරියත් එකතුව කෑම පිසීම ගැන මට නොයෙක් දේ කියා දෙන්නට වූහ.

සීයා පිටතට ගිය විට මිණිබිරිය ඔහු ගැන විස්තර කිවාය.

"මහත්තයා. මේ අපේ සීයා ඉන්නවා නේද? පොළියක් ගන්නේ නැතිව, කිසිම ඇපයක් තියා ගන්නේ නැතිව, බැදුම්කර ලියන්නේ නැතිව මිනිසුන්ට සල්ලි ණයට දෙනවා. සල්ලි ආපසු අයකර ගන්න පිළිවෙළක් ගැන හිතන්නේ නෑ. හැම දෙනාවම විශ්වාස කරනවා. ඒ වුනාට මිනිස්සු සීයට කොච්චර වංචා කරනවද?"

ගමේ මිතිහෙක් එහි පැමිණ සිටියේය. ඔහුද ඒ ගැන කියන්නට විය.

"කරදර වෙලාවක සාහුජී ළඟට ඇවිත් උදව් ඉල්ලලා හිස් අතින් යන කෙනෙක් නම් මං දැකලා නෑ මහත්තයා. පරණ තාලෙටමයි වැඩ කරන්නේ. මෙච්චර පොහොසතෙක් වෙලත් කවදාවත් කා එක්කවත් ගනුදෙනුවකට නඩු මගට බැහැලා නෑ. උසාවියට යන්නත් බයයි. සාහුජී හරි අහිංසක මනුස්සයෙක්."

එදින ධාවතාල් සාහුගෙන් රැගෙන ආ මුදල් ආපසු දීමට මාස හයක් පමණ ගතවිය. ඒ කාලය තුළ ඔහු අපේ වත්ත පළාතකවත් නොපැමිණියේ ඔහු ආවේ මුදල් ඉල්ලන්නට යයි සිතනු ඇතැයි කියාය. ඔහු වැදගත් මිනිසෙක් බව අමුතුවෙන් කිව යුතු නැත.

* * * * * *

SL UNLIMITED The spirit of Sri Lankan e-community

මිය ගිය බෙංගාලි ජාතික රාබාල් බාබුගේ නිවසට අවුරුද්දකින් පමණ මට යාමට නොහැකි විය. අස්වනු ලැබීමෙන් පසු පැවැත්වූ සැණකෙළිය අවසන් වූ පසු මම වරක් එහි ගියෙමි. රාබාල් බාබුගේ බිරිඳ මා දැක ඉතා සතුටු වූවාය.

"ඇයි මල්ලි මෙච්චර දවස් ආවේ නැත්තේ. මේ වගේ පළාතක බෙංගාලි කාරයෙකුගේ මුණ දකින්න ලැබෙන එකත් කොච්චර ලොකු දෙයක්ද."

ඇය මෙසේ කියා නිහඬව කඳුළු සලන්නට වූවාය.

මම වට පිට බැළුවෙමි. ඔවුන්ගේ ගෙදර දොර තත්වය දිළිඳු බවක් පළ කළත් පෙර මෙන් අවුල් සහගත තත්වයක නොතිබෙන බව මට පෙනී ගියේය. රාබාල් බාබුගේ වැඩිමහල් පුත්‍රයා ගෙදර බෙලෙක් බඩු සාදා සාමාන්‍ය මුදලක් උපයන බව පෙනිණ. නිවසේ විය හියදම් ඔවුන් එමගින් කෙසේ හෝ පියවා ගන්නවා ඇත.

"පොඩි ළමයාවත් බරණැස් නුවර ඉන්න මාමා ළඟට ඇරලා ටිකක් උගන්වන්න බලන්න."

"කොහේද මල්ලි මාමා උදව් කරන්නෙ? කරදර වෙච්ච වෙලාවේ සිද්ධ වෙච්ච දේවල් කියලා අපි ලියුම් දෙක තුනක්ම යැව්වට පස්සේ රුපියල් දහයක් විතරක් එවලා සද්ද නැතුව ඉන්නවා. ඊට පස්සේ අවුරුදු එකහමාරක් කිසිම ආරංචික් නෑ. මේ ගොල්ලෝ ගොයම් කපන්න හරි හරක් බලන්න හරි යැව්වත් මාමා ළඟට නම් යවන්නේ නෑ."

මා ආපසු එන්නට සූදානම් වුවත් අක්කා මට එන්නට ඉඩ නොදී කෑම පිළියෙළ කරන්න වූවාය.

ඉරිඟු පිටිද ගිතෙල් හා සීනිද මිශ්‍ර කර අග්ගලා සහ අළුවා සැදූ ඇය මට ඒවා කන්නට දුන්නාය. ඇය තමාගේ දිළිඳු පවුලේ හැටියට හැකි පමණින් හොඳින් මට සංග්‍රහ කළාය.

"බිනර මාසේ මං මල්ලිට දෙන්නට ඉරිඟු අරන් තිබ්බා. මල්ලි ඉරිඟු බැඳලා කන්න ආසා හින්ද."

"ඉරිඟු කොයින්ද? සල්ලිවලට ගත්තද?"

"නෑ. හේන්වල ඉරිඟු කපලා අරන් ගියාට පස්සේ කැඩිලා බිම වැටිලි ඉතුරු වෙච්ච ඒවා ගේන්න ගමේ ගෑනු යනවා. මාත් ඒගොල්ලෝ එක්ක යනවා. දවසට කූඩයක් විතර අහුලාගෙන එනවා."

මම පුදුමයට පත් වූයෙමි.

"ඉතිරි වෙව්ව ඒවා අහුලන්න යනවාද?"

"ඔව් රෑ වෙලා යනවා කාටවත් පේනවට. ගමේ ගැනු කොව්වර යනවද? මං ගිය බිනර මහේ ඉරිහු කුඩා දහයක් විතර අහුලා ගත්තා."

මා තුළ දුකක් ඇති විය. එය දිළිඳු ගංගෝතා කුළයේ ගැහැනුන් පමණක් කරන දෙයකි. ඒ පළාතේ රාජ්පුත්වරුන්ගේ හෝ ක්ෂත්‍රිය කුලවල ගැහැනු අය කුඹුරුවල ඉතිරි වූ ධාන්‍ය ඇහිළීමට නොයති. එසේ නිබියදී බෙංගාලී ගැහැනියක් එසේ කරන බව අසා මා තුළ දුකක් ඇති විය. නුගත් ගංගෝතා කුලයේ මිනිසුන් අතරේ කලක් වාසය කළ නිසා ඇයද ඔවුන් කරන දේ කරන්නට පුරුදුවී සිටියි. මම ඒ ගැන කිසිවක් නොකිවේ ඇයට දුකක් ඇති වේ යැයි සිතාය. මේ කාත් කවුරුත් නැති බෙංගාලි පවුලට බෙංගාලයේ අයගේ සිරිත් විරිත් හා සංස්කෘතිය අනුව හැඩ ගැසීමට මාර්ගයක් නැත. වසර කීපයක් ගතවූ පසු භාෂාවෙන්, හැසිරීමෙන් හා සිරිත් විරිත්වලින් ඔවුන් ගංගෝතා කුලයේ මිනිසුන් වැනි අය වනු ඇත. මේ වන විටද ඇයද ඒ මගට අවතීර්ණ වී නමාරය.

දුම්රිය පොළේ සිට බොහෝ ඈතින් වූ ගමක මෙවැනි බෙංගාලි පවුල් දෙක තුනක් ඇත. ඒ පවුල්වල ගැහැනු ළමයින්ට විවාහයට සුදුසු අය සෙවීම අති දුෂ්කර කටයුත්තකි. දකුණු බිහාරයේ ගමක වෙසෙන මෙවැනි බෙංගාලි බ්‍රාහ්මණ පවුලක් ගැන මම දැන සිටියෙමි. ඔවුන් ඉතා දිළිඳු අය වූ අතර නිවසේ ගැහැනු ළමයින් තිදෙනෙක් වූහ. වැඩිමහලු දියණිය එක් විසි වියේ වූ අතර අනිත් අය විසි හැවිරිදි හා දාහත් හැවිරිදි වියේ අය වූහ. ඒ පළාතේ ඔවුන්ට ගැලපෙන බෙංගාලි ජාතික මනාලයන් සෙවීම ඉතා දුෂ්කර වූ නිසා බෙංගාලි සිරිතට අනුව ඔවුන් අඩු වයසේ දී විවාහ කර දීමක් සිදු වූයේ නැත.

වයස විසි එකක් වූ තරුණිය ලස්සනය. ඇය බෙංගාලි වචනයක්වත් නොදනී. ඇගේ හැඩ රුව හා ගති ගුණ ද බිහාරයේ ගැමි යුවතියකගේ වැනිය. තැනිනලාවේ සිට පිදුරු මිටියක් හිස මත තබාගෙන එන ආකාරය දකින කෙනෙකුට සිතෙන්නේ ඇය බිහාරයේ ගැමි යුවතියක කියාය. ඇගේ නම ධ්‍රැවා විය. එයද බිහාරයේ නමකි.

ඇගෙ පියා ඒ ගමට පළමුවෙන්ම පැමිණියේ හෝමියෝපති වෙදකම කරගෙන යාම සඳහා වුවද එහි පැමිණි පසු ඔහු ගොවිතැන් කරන්නට පටන් ගත්තේය. ඔහු මිය ගිය පසු වැඩි මහලු පුත්‍රයා ගොවිතැන් බලා කියා ගෙන එහිම රැඳී සිටියේය. ඔහුගේ සොහොයුරියන්

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

විවාහ කරදීම ගැන උනන්දුවක් නිබුණත් ඔවුන් සඳහා දැවැදි සොයා දීමේ හැකියාවක් ඔහුට තිබුණේ නැත.

ධ්‍රැවා බංකිම්චන්ද්‍රගේ නවකථාවේ සඳහන්වන කපාලකුණ්ඩලාව සේ වූවාය. ඇය මට 'අයියා' යනුවෙන් ඇමතුවාය. ඇය පිටි කෙටීමට, කුඹුරු වැඩ කිරීමට ගවයින්ට තණ කැවීමට සහ ගෙදර දොර වැඩ කිරීමට දක්ෂ වූ ශක්තිමත් කඩිසර තරුණියක වූවාය. හොඳ මනාලයකු ලැබුණොත් තරුණියන් තිදෙනාම වුවත් ඔහුට දීමට සොහොයුරා කැමතිය. තරුණියන් තිදෙනා තුළද ඒ ගැන අකමැත්තක් නැත.

ඔහුගේ දෙවෙනි සොහොයුරිය මා සමග කථා කොට "බෙංගාලේ බලන්න අපි හරි ආසයි." යනුවෙන් කීවාය.

දිග යාම සඳහා වැඩිමහලු දියණිය තුළ දැඩි උනන්දුවක් ඇති බවද දැනගන්නට ලැබිණ. දිගයක ගියොත් දෙනුන්ගෙන් කිරි දෙවීමට හා පිටි කෙටීමට පිටින් කිසිවෙකු ගෙන්වීමට අවශ්‍ය නැති බව ඇය තවත් අය සමග පවසා ඇත. ඇයට එක පැයට තිරිඟු සේරු පහක් පමණ කෙටිය හැකිය.

අවාසනාවන්ත බෙංගාලි යුවතිය බොහෝ කලකට පසුව ද ගංගෝතා කෙල්ලක සේ සොහොයුරාගේ නිවසේ ධාන්‍ය කොටයි. කමතේ සිට ධාන්‍ය ගෙන එයි. මෙවැනි දිළිඳු ගැමි යුවතියක දෝලාවේ තබාගෙන මංගල සක් හඬ හා ආසිරි පැතුම් මැද තම නිවසට කැඳවාගෙන යන්නට ඉදිරිපත් වෙන කෙනෙකු නැත.

සන්සුන් නිදහස් මිටියාවතට කළුවර වැටෙන විට ඈත සත වනයෙන් වැසුණු කඳු අතරින් එන පටු මග යන්තමින් දිස් වෙයි. දිළිඳු ධ්‍රැවා අදත් ඒ මග ඔස්සේ දර මිටියක් හිස තබාගෙන කඳු අතරින් පහළට ගමන් කරන ආකාරය කල්පනා අතරින් මා කීප වරක් දැක ඇත. එලෙසම රාඛාල් බාබුගේ බිරිඳ මහලු ගංගෝතා ස්ත්‍රියක සේ කුඹුරුවල වියළී වැටුණු ඉරිහු කරල් කැබලි තවමත් රාත්‍රියට හොරෙන් ඇහිදිමින් සිටිනවා විය හැකිය.

නිකිණි මාසයේ මැද භාගයේදී හානුමතීලාගේ ගමේ සිට ආපසු එද්දී මහ වැස්සක් වැස්සේය. ඒ දිනවල දිවා රෑ එක දිගටම මහ වැසි ඇද හැලුණේය

අඳුරු පැහැති වැහි වැහි වළාවලින් අහස වැසී තිබිණ. බයිහාරයේ දිගන්න රේඛාවත් මහාලිබාරූප කන්දත් වැහි අඳුර නිසා අපැහැදිලි වී තිබිණ. මෝහනපුරා රක්ෂිත වනයේ තුරු හිස් යන්තමින්

දිස් වූ අතර විටෙක නොපෙනී ගියේය. කලින් නම් වැහි කාලයට කුශී නදිය සහ දක්ෂිණ කාරෝ නදිය පිටාර ගලන බව මට අසන්නට ලැබිණ.

සැතපුම් ගණනක් ඈතට විහිදී තිබුණු ඉඑක් සහ මානා පදුරු වැස්සට තෙත බරිත වී තිබිණ. මම කායස්ථාල කාමරයේ පිලේ පුටුවක් තබා හිදගෙන බලා සිටියෙමි. ඉදිරියේ වූ ඉඑක් පදුරු අතර තනිවූ පරවියෙක් තෙමී තෙමී සිටියේය. ඌ වරින් වර පියාපත් ගසා දමා වැසි දිය තම සිරුරෙන් ඉවත් කරන්නට උත්සාහ කළේය.

කායස්ථාල කාමරයේ හිරවී කල්ගත කිරීම අපහසු වූ නිසා මම අශ්වයා පිට සෑදලය දමා වැහි කබාය ඇඳගෙන පිටතට ආවෙමි. අපූරු නිදහස් ගතියක් හා උන්මාදනීය ජීවනාන්දයක ආස්වාදයක් විඳීමට මට හැකි විය. හරිත වර්ණ ගහ කොළ වැසි දියෙන් තෙමී ප්‍රබෝධමත් හා නැවුම් ගතියක් දැරුවේය. එක් පසෙකින් නාඨා බයිහාරයේ මායිම හා අනෙක් පසින් මෝහනපුරා රක්ෂිත වනයේ අපැහැදිලි නිල්වන් සීමා රේඛාව දක්වා විහිදුණු හරිත වර්ණ සමුද්‍රයක් සේ මිටියාවත දිස්විය. මේඝයන්ගෙන් යුක්ත වූ ආකාශය යටින් වූ දීර්ඝ තෘණ භූමිය තෙත් සහිත සුළඟ වැදී තරංග නැංවිය. මම ඒ හරිත වර්ණ සමුද්‍රය මතින් යාත්‍රා කරන නාවිකයෙකු සේ කිසියම් සිහින දේශයක වෙරළක් බලා ගමන් කළෙමි.

ඈත දක්වා විහිදුණු වැහි වළාවලින් නිල්වන් වූ නිදහස් තෘණ භූමිය මැදින් අශ්වයා පන්නා ගෙන සැතපුම් ගණනක් ගියෙමි. සරස්වති වැව අසල තුරු වදුළු අතරට වැදී බැළූ විට යුගල ප්‍රසාද්ගේ අතින් රෝපණය වූ නා නා විධ තුරු ලතාවල පිපුණු වනමල් නිසා එය තවත් හැඩ වී ඇති බව මට පෙනී ගියේය. මුළු භාරත වර්ෂයේම ඇවිද බැලුවත් සරස්වති වැව අසල වූ තුරු වදුළු ඇති ප්‍රදේශය තරම් සුන්දර වූ පෙදෙස් පහසුවෙන් හමු නොවන බව මට නිසැකවම කිව හැකිය. වැව අයිනේ 'රෙඩ් කැම්පියන්' මල් එක යායට පිපී තිබිණ. ජලජ ශාකයක් වූ 'වෝටර් ක්‍රොප්ට්' නමින් හැඳින්වෙන ශාක තිලට හුරු සුදු පැහැති විශාල ප්‍රමාණයේ මලින් ගැවසී තිබිණ. යුගල ප්‍රසාද් ළඟදී පැමිණ කුමක්දෝ මල් ඇට වර්ගයක් පැළකර ගිය බව දැන සිටියෙමු. ඔහු ආජමාබාද් කායස්ථාලයේ ලිපිකරුවෙකු ලෙස වැඩ කරනත් ඔහුගේ හදවත ඇත්තේ සරස්වති වැව අසල වන වදුළු හා මල් පොකුරු තුළය.

සරස්වති වැව අසලින් පිටතට ආ විට නිදහස් මිටියාවතත් බොහෝ ඈතට විහිදුණු වනාන්තරයත් දිස්විය. වනයේ තුරු හිස්වලට ඉහළින් අහසේ කළු වළා එකතු වී තිබිණ. ඒවා ජලයේ බරින් නිදහස් වීමට පෙර අලුතින් වළාකුළු රැට එක් වෙමින් පැවතිණ. අහසේ එක් පැත්තක් අමුතු නිල් පැහැයකින් දිස් විය. ඒ අතරට මැදි වූ වැහි වළාකුළු ටිකක් අවරට යන හිරුගේ රත් පැහැයෙන් වර්ණවත් වී දිගන්තයේ වූ ගිරි ශිඛරයක් සේ දිස්විය.

රෑ වීමට වැඩි වේලාවක් නැත. ථූලකියා බයිහාරය දෙසින් සිවලුන් කෑගසන හඬ ඇසිණ. වැහි අඳුරට රෑ අඳුරද එක්වන්නට ආසන්න විය. මම ආපසු හැරුණෙමි.

වැසි වළා සහිත සන්ධ්‍යාවන්හි නිදහස් මිටියාවතේ සිටිද්දී කිසියම් මැවුම් කාර දෙවියකු ගැන සිහිනයක් මම දුටුවෙමි. කෑකෝ ගසන කරන සිවල් රෑළ -සරස්වති වැව් ජලය මත පිපුණු මල් - මංචි-රාජු-පාංඩේ-භානුමතී-මහාලිඛාරූප කන්ද-මිනුම් කඳවුර අසල පදිංචිව සිටි දිළිඳු පවුල- අහස -අජටාකාශය යනාදී සියල්ල එතුමාගේ කල්පනා ලෝකයේ සැහවී තිබෙන්නට ඇත. ඒ නිල්වන් වළාකුළු මෙන්ම මුළු විශ්වයේම පැවැත්මද එතුමාගේ ආශිර්වාදයේ අමෘත ධාරාවෙන් තෙත් වී ඇත. ඒ වැසි සහිත සැඳෑව ඔහුගේම නිර්මාණයකි. ඒ නිදහස් ජීවනාන්දය ඔහුගේම ස්වරයයි. මේ ස්වරය මිනිසාගේ අභ්‍යන්තරය සවේතනික බවට පත් කරවයි. ඒ දෙවියන්ට බිය විය යුතු නැත. සුවිශාල වූ ථූලකියා බයිහාරයටත්, විශාල වැහි වළා සහිත ආකාශයටත්, වඩා පුළුල්වූ එතුමාගේ මෛත්‍රිය හා ආශිර්වාදය සීමා රහිතය. අනන්තය. ප්‍රාණියා නොවැදගත් වූ තරමට, කුඩා වූ තරමට ඒ දෙවියන්ගේ අනුකම්පාවද වැඩි වැඩියෙන් ලැබේ.

මගේ සිතේ පහළවූ මැවුම් කරුවා ප්‍රවීණ වූද, සාධාරණය ඉවූ කරන සුළු වූද, දඬුවම් කරන සුළු වූද, සදාකාලික වූද දාර්ශනික බවක් පළ කරනසුලු වූද කෙනෙක් නොවේ. නාඨා බයිහාරයේ හෝ ආජමාබාදයේ නිදහස් මිටියාවතේ හිරු බැස යන වෙලාවට රත්පැහැ ගන්නා වළාකුළු දකින විටත් සඳ එළියෙන් ආලෝකමත් වූ පාළු මිටියාවත දකින විටත් මට සිතෙන්නේ මෙවැන්නකි. ඒ මැවුම් කරුවා ආදරය, කවිය, සෞන්දර්ය, නිර්මාණාත්මක බව ආදියට ආදරය කරන, සිත් ගන්නා සුලු කලා කෘති මගින් තමාගේ ප්‍රිය වූ ජනයාගේ

සතුට සඳහා තමා සතු සියල්ල පරිත්‍යාග කරන, විද්‍යාඥයකු සතු විශාල ශක්තියක් හා දර්ශනයක් මගින්, ග්‍රහ, නක්ෂත්‍ර, නීහාරිකා ආදිය නිර්මාණය කරන කෙනෙකු බවය.

* * * * * *

නිකිනි මහේ වැසි දිනයක ධාතුරියා ඉස්මයිල් පුර පිහිටි කාර්‍යාලයට පැමිණියේය.

බොහෝ දිනකට පසු ඔහු දුටු මම සතුටු වූයෙමි.

"කොහොමද ධාතුරියා සැප සනීප?"

කුඩා පොට්ටනියක තමා සතු සියලු සම්පත් පොදි බැඳගෙන පැමිණි ඔහු එය බිම තබා දැන් එකතු කොට මට ආචාර කළේය.

"නැටුම් පෙන්නන්නයි ආවේ මහත්තයා. මේ දවස්වල හරි කරදරයි. මේ මාසේ කවුරුවත් නැටුම් බලන්න කැමති වුනේ නැහැ. මෙහේ ආවොත් මගේ නැටුම් බලන්න කැමති වෙන බව දන්න හින්දා මහත්තයා ගාවට එන්න හිතුණා. මං තව හොඳ නැටුම් ටිකක් ඉගෙන ගෙන තියෙනවා මහත්තයා."

ධාතුරියා පෙරට වඩා කෙට්ටු වී සිටියි. ඔහු දුටු විට මා තුළ දුකක් හටගත්තේය.

"මොනවා හරි කනවද ධාතුරියා?"

ඔහු ලැජ්ජාවෙන් හිස වනා කැමැත්ත පළ කළේය.

කුස්සියේ වැඩ කරන බ්‍රාහ්මණයාට කථා කොට ධාතුරියාට කෑමට යමක් දෙන්නට යයි කීවෙමි. ඒ වෙලාවේ බත් ඉතිරිව තිබුණේ නැත. ඔහු කිරි සහ කෑද ගෙනැවිත් දුන්නේය. ධාතුරියා ආහාර ගන්නා ආකාරය දුටු විට මට සිතුණේ ඔහුට දින දෙකකින් පමණ කිසිවක් කෑමට නොලැබෙන්නට ඇති බවය.

සවස් වූ විට ඔහු නැටුම් පෙන්වීය. නැටුම් බැලීමට අසල ගම්වලින් බොහෝ දෙනා පැමිණ මිදුලේ රැස්වී සිටියහ. ධාතුරියා පෙරට වඩා නැටුම් දැක්වීම අතින් දියුණු වී සිටියේය. ඔහු තුළ නියම කලාකරුවෙකු සතු උනන්දුවක්, ප්‍රතිභාවත් තිබිණ. ඔහුට මමද මුදලක් දුන්නෙමි. සේවකයෝද මුදල් සම්මාදම් කර දුන්හ. එයින් ඔහුට ටික කලක් ජීවත් විය හැක.

පසුදින උදෑසන ඔහු ආපසු යාමට සැරසී මා හමුවීමට පැමිණියේය.

"මහත්තයා. කල්කටාවට යන්නේ කවදාද?"

"ඇයි එහෙම ඇහුවේ ධාතුරියා?"

"මාවත් එහේ එක්ක යන්න මහත්තයා. මං කලිනුත් කිව්වේ යන්න ඕනෑ වෙච්ච කාරණේ."

"දැන් මේ කොහේ යන්නද හදන්නේ ධාතුරියා? කෑම කන්නේ නැද්ද?"

"නෑ මහත්තයා. බල්ලුටෝලාවේ බ්‍රාහ්මණ ගෙදරක මඟුල් උත්සවයක් තියෙනවා. එහේ ගියොත් නැටුම් පෙන්නන්න පුළුවන්. එහාට මෙහේ ඉඳලා හැතැප්ම දාසයක් විතර තියෙනවා. දැන්ම පිටත් වුනොත් දවල් වෙනකොට එතැනට යන්න පුළුවන්."

ධාතුරියාට යන්නට යයි කීමට මගේ සිත ඉඩ දුන්නේ නැත.

"මෙහෙන් ඉඩම් කෑල්ලක් දුන්නොත් ඒකේ මොනවා හරි වගා කරගෙන ඉන්න පුළුවන්නේද? ඇයි එහෙම කරන්න බැරි?"

මටුකනාථ ගුරුතුමාටද ළමයාව හිතට ඇල්ලූ බව මට පෙනී ගියේය. ධාතුරියාව තමාගේ පාසලේ ශිෂ්‍යයෙකු බවට පත් කර ගැනීමට ඔහුට උවමනා විය.

"මේ ළමයට මෙහේ නවතින්න කියන්න. මහත්තයා. අවුරුදු දෙකක් ඇතුළත මූලික පාඩම් කියල දීල ඉවර කරන්න පුළුවන්."

ධාතුරියා ඉඩමක් ගෙන වගා කිරීම ගැන තමාගේ අදහස පළ කළේය.

"මහත්තයා මගේ අයියා කෙනෙක් වගේ. මට මහත්තයා ආදරෙයි කියලා මං දන්නවා. ඒ වුනාට මට වගා කරගෙන එක තැනක නැවතිලා ඉන්න හිත දෙන්නේ නෑ. නැටුම් පෙන්නන්න. ලැබුණොත් විතරයි මං සන්තෝස වෙන්නේ. වෙන කිසි දේකට මං කැමති නෑ."

"හොඳයි සැරෙන් සැරේ ගිහිල්ලා නැටුම් පෙන්නලා එන්න. ඉඩමක් දුන්නා කියලා ඒකේ ධාතුරියා දම්වැල් දාලා හිර කර ගන්න කාටවත් ඕනෑ නෑ."

ධාතුරියා සතුටු විය.

"මහත්තයා කියන දෙයක් මං අහනවා. මං මහත්තයට හරි ආදරෙයි. මං බල්ලුටෝලාවට ගිහින් මෙහාට ආපහු එන්නම්."

මටුකනාථ කථා කළේය.

"ඒ ආවාම මගේ ඉස්කෝලේ නවතින්න. මාත් එක්ක රෑට පාඩම් කරන්න පුළුවන්. නුගතෙක් වගේ ඉඳලා වැඩක් නෑ. භාෂාවයි,

ව්‍යාකරණයි, කවි ගැනයි විතරක්වත් දැන ගන්න එක හරි ප්‍රයෝජනයි."

ධාතුරියා පිලේ හිඳගෙන නැටුම් කලාව ගැන බොහෝ දේවල් කීවේය. මට ඒ සියල්ලම තේරුම් ගියේ නැත. පූර්ණියාවල 'හෝ' 'හෝ' නැටුම් සහ ධරම්පුරයේ ඒ වර්ගයේ නැටුම අතර වෙනස ගැනත්, එහිදී නිරූපණය වන හස්ත මුද්‍රා ගැනත් ඔහු කථා කළේය.

"මහත්තයා බාලියා පළාතේ උත්සවවලදී ගෑනු අය නටනවා දැකලා තියෙනවද? ඒකයි කැරකෙන නැටුමයි අතර හුහක් සමාන කම් තියෙනවා. මහත්තයාලාගේ පළාතේ නැටුම් කොයි වගේද?"

පසුගිය වසරේ අස්වනු කපන කාලයේ පැවති සැණකෙළියේදී දුටු 'නනීවොර්' නැටුම ගැන මම ඔහුට කීවෙමි. ධාතුරියා සිනාසුණේය.

"ඒ නැටුමෙන් වැඩක් නෑ මහත්තයා. ඒක මුංගේර් පළාතේ ගැමි නැටුමක්. ගංගෝතා මිනිස්සු සතුටු කරවන්න ඒක හොඳයි. ඒකේ වැදගැම්මක් නෑ."

"ධාතුරියා දන්නවද ඒ නැටුම? නටලා පෙන්නනවද?"

ධාතුරියා තමා නිරතව සිටින කලාව ගැන හොඳින් දන්නා බව පෙනිණ. 'නනීවොර්' නැටුම ඔහු අපුරුවට රඟ දක්වා පෙන්වීය. ක්‍රිෂ්ණගේ බාල වියේදී වෙඩරු සොරකම් කර අසුවූ ආකාරයත් කුඩා දරුවකු වූ ක්‍රිෂ්ණ හුරතල් වෙමින් හඬන ආකාරයත් ඔහු රඟ දැක්වීය. ධාතුරියා ළමයෙකු වූ නිසා ඒ නැටුම ඔහුට හොඳින් ගැලපුණේය.

ධාතුරියා යන්නට ගියේය. යන අතර ඔහු මෙසේ කීය.

"මහත්තයා මට හුහක් කරුණාවයි. මාව එක සැරයක් කල්කටාවට එක්ක යන්නකෝ. එහේ නැටුම් පෙන්වන අයට හොඳ සැලකිල්ලක් තියෙනවලු."

ධාතුරියා මා සමග කථා කළ අන්තිම වතාව එය විය.

බී. එන්. ඩබ්ලිව්. දුම්රිය පාරේ කටාරියා දුම්රිය පොළට නුදුරින් ළමයෙකුගේ මළ සිරුරක් හමු වූ බව එයින් මාස දෙකක් ගිය පසු අසන්නට ලැබිණ. නැටුම් පෙන්වූ ධාතුරියාගේ මළ සිරුර එය යයි මිනිසුන් හඳුනාගෙන තිබිණ. මෙය හදිසි අනතුරක්ද, එසේ නැතහොත් දිවි නසා ගැනීමක් දැයි කිසිවෙකුට කිව නොහැකිවිය. ඔහුට දිවි නසා ගන්නට තරම් කාරණයක් තිබුණාද?

ඒ වනගත ප්‍රදේශයේ වසර දෙකක් ගත කරද්දී හමු වූ මිනිසුන් අතරින් ධාතුරියා සුවිශේෂ කෙනෙක් විය. ඔහු තුළ නිර්ලෝභී, ප්‍රීතිමත්

, චංචල, ලෞකික සැප සම්පතෙහි නොඇලෙන, විශේෂ වූ කලා ශිල්පියෙක් ජීවත් වූයේය. ඒ වනගත පළාතේ පමණක් නොව නාගරික සමාජයේද මෙවැනි අය සුලභ නැත.

* * * * * *

නවත් වසර තුනක් ගෙවී ගියේය.

නාඨා බයිහාරය සහ ලොබ්ටුලියාව වගා බිම් බවට පත් විය. පෙර මෙන් දැන් එය වනාන්තරයක් නොවේ. සොබා දහම් දිනිතිය වසර ගණනාවක සිට පාළුවේ තනිව හිඳ නිර්මාණය කළ ලතා මණ්ඩප හා තුරු වදුළුවලින් යුක්ත වූ ස්වප්න භූමිය කම්කරුවන්ගේ නිර්දය දෑත්වලින් කපා කොටා විනාශ කරනු ලැබිණ. වසර පනහක් තිස්සේ නිර්මාණය වූ දේ එක් දිනකදී විනාශ වී ගියේය. ඈත දක්වා විහිදුණු ගුප්ත ස්වභාවයෙන් යුතු වූ මිටියාවත දැන් නැත. සඳ එළිය ඇති විට රාත්‍රියට මායාකාරී සුරංගනාවන් පා තබන, මීහරකුන්ගේ දේවතාවා වන ටාංඩිබාරෝ තම දැත් ඔසවා මීහරකුන් රැක ගැනීමට පැමිණෙන ඒ මිටියාවත දැන් නැත.

නාඨා බයිහාරය හා ලොබ්ටුලියාව දැන් එකම ජනාවාසයකි. දැන් එය එක ළඟ තැනූ අපවිත්‍ර පැල්පත්වලින් යුක්ත වේ. තැනින් තැන මානා සෙවිළි කළ ගෙවල්ය. පැල්පත් නොමැති තැන්වල එක දිගටම ධාන්‍ය කෙත්ය. කුඹුරු වටා එනීමනසා ගස්වලින් තැනූ වැටවල්ය. නිදහස් ධරණී තලය කැබලි බවට පත් වී වැනසී ගොස්ය. අන්තිමේදී හෙළි පෙහෙළි නොකර ඉතිරි වූයේ සරස්වතී වැව අසල වූ බිම් කොටස පමණි.

රැකියාව රැක ගත යුතු නිසා ඉඩම් හිමියන්ගේ කීමට සියලු බිම් කොටස් බෙදා දුන්නත් යුගල ප්‍රසාද්ගේ දැතින් සැරසුණු සරස්වතී වැව් තීරයේ සුන්දර වන වදුළු සහිත බිම් කොටස කිසිවෙකුට බදු දීමට මට නොහැකි විය. වැව අසල වූ බිම් කොටස් බදු ගැනීමට බොහෝ දෙනා පැමිණියහ. සමහරු ඒ සඳහා වැඩිපුර සන්තෝසමක් දීමට වෑයම් කළහ. ඊට හේතුව ඒ කොටසේ පොළොව සරුසාර වීමත් ජලය ඇති හෙයින් වගා කිරීම පහසු වීමත්ය.

එසේ වුවත් එය තව කී දවසක් එලෙස තබාගත හැකිද? ඒ ඉඩම බදු දීම ප්‍රමාද වන්නේ ඇයි දැයි අසා ප්‍රධාන කාර්යාලයෙන් ලිපි එවන්නට පටන් ගෙන තිබිණ. මෙතෙක් කල් නිදහසට කරුණු

කියා එය රැක ගත්තත් වැඩි දවසක් එසේ කළ නොහැක. මිනිසාගේ තණ්හාව බලවත් බව මම දනිමි. තිරිඟු ටිකකට, වීන ධාන්‍ය ටිකකට ස්වභාව ධර්මයා විසින් නිර්මාණය කරන ලද සිහින දේශය විනාශ කිරීමට මිනිසා කිසිසේත්ම නොපැකිලෙයි. විශේෂයෙන්ම මේ කාලයේ මිනිස්සු ගහ කොළවල අගය හා සෞන්දර්‍යය ගැන තේරුම් නොගනිති. ඔවුන්ට රම්‍ය වූ ප්‍රකෘතිය දැකීමට දැස් නොමැත. සතුන් මෙන් කුස පුරවා ගැනීමට පමණක් ඔවුහු දනිති. වෙනත් රටක නම් මෙවැනි වනාන්තර සෞන්දර්‍යය පිළිබඳ පිපාසිත වූ ජනයා සඳහා නීති මගින් සුරක්ෂිත කොට තබනු ඇත.

කැලිපෝනියාවේ ජෝසේමායි, දකුණු අප්‍රිකාවේ කෲගර්, බෙල්ජියමේ ඇල්බට් ආදී වනාන්තර ජාතික උද්‍යාන බව පත් කර තිබේ. අපේ ඉඩම් හිමි ධනවතුන්ට භූමි දර්ශන ගැන වැටහීමක් නැත. ඔවුන්ට දැනුමක් ඇත්තේ එයින් උපයන මුදල ගැන පමණි. ඔවුන් තේරුම් ගන්නේ මුදල් ගනුදෙනු හා ගණන් මිනුම් තැබීම් පමණි. මේ ජාත්‍යන්ධ මිනිසුන්ගේ දේශයේ යුගල ප්‍රසාද් වැන්නකු ඉපදුණේ මන්දැයි මට සිතිණි. සරස්වති වැව අසල වන පියස ඔහු දෙස බලාගෙන අදත් නොවෙනස්ව පවතී.

එනමුත් එය තව කොපමණ කලක් ඵලෙස පවතිනු ඇද්ද?

මම අවුරුදු තුනකින් පමණ බෙංගාලයට නොගියෙමි. වරින් වර ගම රට මතක් වී මගේ සිත තුළ සාංකා සහගත බවක් ඇතිවේ. මුළු බෙංගාලයම මගේ නිවස වැනිය. තරුණ මනාලියක් තමාගේ අතින් සන්ධ්‍යා ප්‍රදීපයක් දල්වන ඒ දේශය, ළඳකගේ දැතක ස්පර්ශයක් නොමැති විනාශ වී යන වනාන්තරයක් සහිත අවාසනාවන්ත උදාසීන මිටියාවතකට වඩා හොඳ යැයි මට සිතෙන්නට විය.

හදිසියේ ආනන්දයේ ඇමතීමක් මගේ සිතට දැනුණේ ඇයිදැයි කිව නොහැක. වෙනත් තැන්වල වනාන්තරය බොහෝ දුරට විනාශ වී ඇති බැවින් මම සැදලය දමා අශ්වයා පිට නැග සරස්වතී වැව දෙසට ගියෙමි. නිහඬ වන අරණක සෝබාව තවමත් එහි ඇත. ඒ සතුට විඳීමට හැකි එකම තැන සරස්වතී වැවි තීරය අසල තුරු වදුළු යයි මට අවබෝධ වී තිබිණ.

වැවේ ජලය සඳ එළියට දිළිසෙමින් පැවතිණ. පාළු නිහඬ වනය තුන් පැත්තකින් වැවි ජලය වටකරගෙන තිබිණ. රතු හංසයින්ගේ

නාදයත්, සේපාලිකා මල්වල සුවඳත්. ඒ පරිසරයේ රැඳී තිබිණ. ඒ පොසොන් මාසයයි. වසරේ හැම කාලයේම එහිදී සේපාලිකා මල් දැකිය හැකිය

මම අශ්වයා පිට නැඟී ටික වේලාවක් යන තුරු වැවි තීරයේ ඒ මේ මතට ගමන් කළෙමි. වැවි දිය මත නෙළුම් පිපී තිබිණ. වැවි ඉවුර දෙසට වන්නට 'වෝටර් ක්‍රොප්ට්' සහ යුගල ප්‍රසාද් විසින් ගෙන එන ලද 'ස්පයිඩර් ලිලී' පඳුරු මලින් ගැවසී තිබිණ. බොහෝ කලකට පසු පාළු ආරණ්‍ය වාසයෙන් මිදී ගම රට බලා ගොස්, වංග ගැහැනියකගේ අතින් පිසින ලද කෑම කා, කල්කටාවේදී පෙන්වන තියටර් හා චිත්‍රපට බලා, යහළු මිත්‍රාදීන් මුණ ගැසෙන්නට මම සිතා ගත්තෙමි.

පෙර නොවූ විරූ සතුටක් ගෙන දුන් වන පියස ඒ වන විට මගේ සිත සන්ධිස්ථානයකට ගෙන ඒමට සමත් විය. බොහෝ දිනකට පසු ආපසු ගමට යාමේ අදහසක් මා තුළ පහළ වී ඇත. සරස්වතී වැවේ සඳ එළිය තැවරුණු දිය කඳ, අවට වන මල්වල සෞන්දර්‍යය, සඳ එළියට මුසු වූ සේපාලිකා මල් සුවඳ, ශාන්ත නිහඬතාව, අශ්වයාගේ නැලවිලි ගමන, හමා එන සුළං රොද, යන සියල්ල එකතුව මගේ මනසේ සිහිනයක් ඉපදවිය. සතුටින් පිරී මත්වූ බවක් මගේ හදවතේ ඇති විය. මා යොවුන් බවින් මත්වූ තරුණ දේවතාවකු සේ බාධා බන්ධන රහිත නිදහස් ස්වභාවයෙන් යුතුව කාලයේ සීමාව පසු කර ගමන් කරමි. එය මගේ ඉරණමත් වාසනාවත් පිළිබඳ ගමනකි. එය මා ගැන ප්‍රසන්න වූ දෙවියෙකුගේ ආශීර්වාදයකින් සිදුවන දෙයකි.

ගමට ගිය පසු මට ආපසු ඒමට නොලැබෙන්නට ඉඩ තිබේ. සමහර විට මා එහිදී මිය යා හැකිය. සරස්වතී වැව ඉතින් ඔබට ආයුබෝවන්! වැවි තීරයේ වූ රුක් පෙළටත් සඳ එළිය මුසුවූ නිදහස් තුරු වදුලුවලටත් ආයුබෝවන් ! කල්කටාවේ කලබල සහිත මහා මාර්ගය අයිනේ සිටියදී පවා ඔබ හැමදෙනා ගැනම මට සිහිපත් වනු ඇත. යුගල ප්‍රසාද් විසින් ගෙන එනු ලැබූ මල් පැළ ගැන, ජීවන වීණාවෙන් නික්මුණු නොපැහැදිලි ස්වරයක් සේ මට සිහිවනු ඇත. වැවේ පිපුණු නෙළුම් මල්-වැව අසල පිපුණු ස්පයිඩර් ලිලී මල්-වනයේ නිහඬ ගස් වැල් අතර හිඳ මධ්‍යාහ්නයේ නිහඬ බව බිඳින පරවි හඬ- හිරු අවරට යද්දී රන් පැහැය තැවරෙන ගස් වැල්-නිල්

වන් වැව් ජලයට ඉහළින් වූ නිල් අහසේ පියාඹන රතු හංස පෙළ-මඩ සහිත වැව් ඉවුරේ සලකුණු වූ මුව පැටවුන්ගේ පා සටහන් - හුදකලා සරස්වතී වැව ඉතින් ඔබ සැමට ආයුබෝවන්!

සරස්වතී වැව අසල වනයෙන් පිටවී සැතපුමක් පමණ ආ විට, වනය හෙළි පෙහෙළි කර පැල්පත තනා එහි කිසිවකු පදිංචි වී සිටිනු මම දුටුවෙමි. වතුයායේ ඒ කොටසට නව ලොබ්ටූලියාව යන නම භාවිතා කරනු ලැබේ. ඉඳක් සෙවිළි කළ කුඩා පැල්පත් තුනක් එහි විය. ඒ වන විටත් තෙත් ගතියෙන් යුක්ත වූ පැලේ, පොල් තෙල් හෝ අබ තෙල් දැමූ කට කැඩුණු බෝතලයක් විය. අත පය වකුටු කරගත් කෙසඟ සිරුරින් යුතුවූ නිරුවත් දරුවෝ කීප දෙනෙක් ද පළල රිදී පටියක් බාහුවේ පැළඳගත් කලුම කලු සිරුරින් යුතුවූ, රළු ස්වභාවයේ ගෘහිණියක් ද එහි වූහ. පිත්තල භාජන කීපයක් ද පිහියා සහ උදලු කීපයක් ද ඔවුන් සතුවූ බඩු බාහිරාදිය අතර විය. ලොබ්ටූලියාවේ පමණක් නොව ඉස්මයිල් පුරයේ සහ නාඝා බයිහාරයේ සෑම තැනම පදිංචිව සිටියේ මෙවැනි අයයි. මොවුන්ට නියමිත ගෙයක් දොරක් හෝ පරම්පරාවෙන් ලැබුණ ඉඩමක් කඩමක් නැත. ගම් වැසියන් වශයෙන් බැඳීමක් හෝ අසල් වැසියන් සමග දැඩි හිතවත් කමක් මොවුන්ට නැත. අද ඉස්මයිල් පුරයේ පදිංචිව සිටින මොවුන්ට හෙට මුංගේර් මිටියාවතේ ද අනිද්දා ජයන්ති කන්ද පාමුලද පදිංචිව සිටිනු ඇත. ඒ හැම තැනම මොවුන්ගේ නිවාස තිබේ.

හුරු පුරුදු කට හඬක් ඇසී බැලූ විට රාජු පාංඩේ ගෙයක් අසල හිඳගෙන ධර්මය ගැන කථා කරමින් සිටින බව දුටුවෙමි. මම ඔහු දැක අශ්වයා පිටින් බැස්සෙමි. නිවසේ අය ගරු සරු දක්වා මා පිළිගෙන හිඳගන්නට තැනක් පිළියෙළ කර දුන්හ. රාජු එතැනට පැමිණ ඇත්තේ වෙදකම් කිරීමටය. වෙදකමේ ගාස්තුව ලෙස යව හාල් සේරු හතරක්ද මුදලින් පෙසා අටක් ද ඔහුට ලැබී ඇත. එයින් ඉතා සතුටට පත්වූ ඔහු පිලේ හිඳගෙන ධර්මයේ අඩංගු දාර්ශනික කරුණක් විග්‍රහ කරමින් සිටියේය.

"මහත්තයා මට එක කාරණයක් පැහැදිලි කරලා කියන්න. මේ පොළවේ කෙළවරක් තියෙනවද? මං මේ ගොල්ලන්ට කිය කියා හිටියේ අහසේ කෙළවරක් නැතිව වගේම පොළොවේ කෙළවරක් නෑ කියක එකයි. එහෙම නේද මහත්තයා?"

ඇවිදින්නට පැමිණ මෙවැනි ගැඹුරු විද්‍යාත්මක කරුණක් ගැන විග්‍රහ කරන්න සිදුවේ යයි මා සිතුවේ නැත.

SL UNLIMITED The spirit of Sri Lankan e-commerce

රාජු පාංඩේගේ දාර්ශනික මනස සැමදාම ගැඹුරු කරුණු ගැන කරදර වන බව මම දනිමි. දේදුන්න වේ තුඹසකින් නැගෙන බව ඔහු වරක් කීවේය. තාරකා යනු යම රජුගේ සේනාව බවත්, මිනිසා කරන කියන දේවල් ගැන එවේලේම සොයා බලනු පිණිස යම රජු විසින් ඔවුන් යොදවනු ලබන බවත්, ඔහු කියා ඇත.

පෘථිවිය ගැන මා දන්නා දේ විස්තර කළ පසු ඔහු මෙසේ ඇසුවේය.

"ඉර නැගෙනහිරින් පායලා බටහිරින් බැහැලා යන්නේ ඇයි? ඉර මොන මූදෙන්ද මතුවෙන්නේ? මොන මූදෙද ගිලෙන්නේ? මට මේ ප්‍රශ්න නිරාකරණය කරලා දෙනවද මහත්තයා?"

රාජු සංස්කෘත දන්නා නිසා 'නිරාකරණය' යන වචනය පාවිච්චි කළේය. එය ඇසුණු ගංගෝත්තා පවුලේ අය ඔහු දෙස ප්‍රශංසාත්මක බැල්මක් හෙළූහ. ඔවුන්ගේ වෙද මහතා විසින් ඉංග්‍රීසි ඉගෙන ගත් බෙංගාලි බාබුව ගැඹුරු දියකට ඇද දමන ලද යයි ඔවුන් සිතන්නට ඇත.

"රාජු, ඉර කොහේ වත් යන්නේ නෑ. ඒ අපට පේන හැටි."

රාජු පුදුමයට පත්ව මගේ මුහුණ දෙස බලා සිටියේය. ගංගෝත්තා පවුලේ අය සිනාසෙන්නට වූහ. අහෝ ගැලිලියෝ! මේ විචාරයක් නැති නාස්තික පෘථිවි ජනයා විසින් ඔබව සිරගත කරනු ලැබුවා නේද?

තමාගේ පුදුමය මදක් මගහැරී ගියවිට රාජු කථා කළේය.

"හිරු දෙවියෝ උදා පර්වතයෙන් මතුවෙලා බටහිර මුහුදේ ගිලෙන්නේ නැද්ද?"

"නෑ" යයි මම පිළිතුරු දුනිමි."

"ඉංග්‍රීසි පොත්වල එහෙම ලියලා තියෙනවද?"

"ඔව්"

අහිංසක රාජු පාංඩේ උස් හඬින් කථා කරනු මින් පෙර මා කිසි විටෙක අසා නැත. ඔහු වේගයෙන් හා කෝපයෙන් කථා කරන්නට විය.

"උදය පර්වතයේ ගුහාවක ඉඳලා හිරු දෙවියෝ හැමදාම මතුවෙනවා. ඒ ගුහාව මුංගේර්වල ඉන්න තාපසයෙක් දැකලත් තියෙනවා. ඒ කියන තැනට මෙහේ ඉඳලා හුඟ දුරක් පයින් යන්න තියෙනවා. නැගෙනහිර පැත්තේ කන්දක තියෙන ඒ ගල්ගුහාවට ගල් දොරකුත් තියෙනවා. හිරු දෙවියන්ගේ වළාකුළු රථය තියෙන්නේ

ගුහාව ඇතුළේ. අපි ඒක දැක්කේ නැතිවට ලොකු ලොකු තාපසවරු දැකලා තියෙනවා. අර තාපසයා වළාකුළු රථයේ කෙන්දකුත් අරගෙන ආවාලු. ඒක දිලිසෙන කෙන්දක්ලු. ඒක කාමතා ප්‍රසාද් කියන මගේ ගුරුතුමා ඇස් දෙකෙන් දැකලා තියෙනවා."

එසේ කී රාජු ගර්වයෙන් යුතුව ගංගෝතා පවුලේ අයගේ මුහුණු දෙස බැලුවේය.

උදය පර්වතයේ ගුහාවකින් හිරු නැගෙන බවට දැසින් දුටු කෙනෙකුගේ එතරම් ප්‍රබල සාක්ෂියක් තිබියදී මට නිහඬ වීම හැර වෙන කළ හැකි දෙයක් නොවීය.

16

මහාලිබාපුර කන්දෙන් අලුත් මල්පැළ ටිකක් සොයාගෙන එන්න යමුද?" මම දිනක් යුගල ප්‍රසාද්ට කීවෙමි.

යුගල ප්‍රසාද්ගේ උනන්දුව ඇවිස්සුණේය.

"වෙන කොහෙවත් නැති වැල් ජාතියක් තියෙනවා කන්ද ළඟ කැලේ. මේ පැත්තේ ඒවයේ හැදෙන ගෙඩිවලට කියන්නේ විහඩි කියලයි. අපි යමු ඒවා හොයා ගන්නත් එක්ක."

නාඬා බයිහරයේ අලුත් ජනාවාසය මැදින් කන්දට යන පාර වැටී තිබිණ. ඒ අසල ඇති කඳුවල නම් අනුව ඒ ජනාවාස හැඳින්විණි. ජල්ලු ටෝලා, රූප්දාස් ටෝලා, බෙගම් ටෝලා, ආදිය ඉන් සමහරක් විය. සමහර ගෙවල්වල ගැහැනු ඇඹරුම් ගල්වල යව අඹරමින් සිටියහ. මැට්ටෙන් නැනූ ගෙවල්වල වහළ මුදුනින් දුම් රොටු ඉහළ නැගිණ. කෙසඟ සිරුරින් යුතුවූ නිරුවත් දරු දැරියෝ පාර අයිනේ බිම හිඳගෙන සෙල්ලම් කළහ.

නාඬා බයිහාරයේ උතුරු සීමාවේ සන තුරු වදුලු තවමත් ඇතත් ලොබ්ටූලියා බයිහාරයේ කොතැනකවත් එවැනි ගස් කොළන් නැත. නාඬා බයිහාරයේ හතරෙන් තුන් පන්ගුවක් පමණ ඒ වනවිට එළි කර තිබිණ. ඉතිරි වූයේ උතුරු සීමාවේ කුඩා කොටසකි. වනය විනාශ වී යාම ගැන යුගල ප්‍රසාද් දුක් වන බව පෙනිණ.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

"ගංගෝතා මිනිස්සු ඉඳගෙන ඔක්කොම විනාශ කරනවා සර්. උන් ගෙවල් දොරවල් නැති මිනිස්සු. අද මෙහේ. හෙට තව තැනක. උන් හැම තැනම විනාශ කරනවා."

"ඒ ගොල්ලන්ගේ වැරැද්දක් නෑ යුගල ප්‍රසාද්. ඉඩම් හිමියෝ නිකම් නියාගෙන ඉන්නේ නැනේ. හැමදාම ඒගොල්ලෝ ආණ්ඩුවට නිකම් බදු ගෙව ගෙවා ඉන්නෙත් නෑ. මිනිසුන්ට වගා කරන්න ඉඩම් දෙන්න වෙනවා. ඒක ඒ මිනිසුන්ගේ වැරැද්දක් නොවෙයි."

"සරස්වතී වැව ළඟ ඉඩම් නම් බෙදා දෙන්න එපා සර්. මං කොච්චර අමාරුවෙන්ද හොඳ හොඳ ගස්වැල් නොයාගෙන ඇවිත් හිටෙව්වේ."

"මගේ කැමැත්තෙන් නම් ඒක බෙදා දෙන්නේ නෑ. මෙච්චර කල් වත් පරිස්සම් කරගෙන හිටියා මදැයි? තවත් නම් තියාගන්න බැරිවෙයි. ඒ හරියේ පොළොව සරුසාර හින්දා මිනිස්සු වහ වැටිලා." අපේ ගමනට වත්තේ හටයෝ දෙතුන් දෙනෙක්ද සහභාගි වූහ. ඔවුන්ට අප කථා කළ දේ හරිහැටි වැටහුණේ නැත.

"බය වෙන්න එපා සර්. ලබන බක් මහේ කරල් කැපුවට පස්සේ සරස්වතී වැව ළඟ එක් බිම් කැල්ලක්වත් ඉතුරු වෙන්නේ නෑ."

මහාලිබාපුර කන්ද අප සිටි තැන සිට සැතපුම් නවයක් දුරින් පිහිටියේය. අපේ කායාලයේ ජනේලයෙන් බැලූවිට එය නොපැහැදිලිව දිස් වේ. කන්ද අසලට යන විට පෙරවරු දහය පමණ විය.

අපූරු හිරු රැසක් සහ නෙත්කළු නිල්වන් අහසක් එදින දක්නට ලැබිණ. අහසේ මෙබඳු නිල් පැහැයක් මා මීට පෙර දැක නැත. සමහර දිනවලට පමණක් අහස මෙබඳු පැහැයක් ගන්නේ ඇයි? හිරු රැස්වල අපූරු වර්ණයක් දිස්වන්නේ ඇයි? ඒ නිල් අහස මගේ හදවත මත් කරවයි. ගස්වල දළු පත් මතට හිරු රැස් වැටී දිළෙයි. නාඬා බහිහාරයේ හා ලොබ්ටූලියාවේ රැඳී සිටි නා නා වර්ගවල කුරුල්ලෝ ඒ වන විට තමාගේ වාසස්ථාන අහිමිවීම නිසා සරස්වතී වැව අසලටද මෝහනපුරා රක්ෂිත වනයටද, මහාලිබාපුර කන්ද දෙසටද, සංක්‍රමණය වී සිටිති. අප ගමන් කරද්දී කෙළවරක් නැති කුරුලු කූජන ඇසෙන්නට විය.

එවැනි පාළු සන ආරණ්‍ය භූමියකදී අපූරු සැනසීමක් හා නිදහස් ස්වාධීන හැඟීමක් සිතෙහි පහළ වේ. ගස්කොළන්. වන මල්. ගල් තලා කෙතරම් ප්‍රමාණයක් එහි වේද? ඒ පරිසරයේ කොහෝ හෝ

නැනක වැතිරී සිටියත්, හිඳගෙන සිටියත් දුවයක් ම ගෙන එයි. අලය කමින් පිරුණු වෙලාවක මලින් පිරුණු පියාල් ගසක සිහිල් සෙවණේ කිසිවකු හිඳ කල් ගත කළොත් විශාල වූ වනාන්තරය ඒ තැනැත්තාගේ ස්නායු පද්ධතිය ප්‍රබෝධමත් කරයි.

අපි කන්ද නැගීමට පටන් ගනිමු. විශාල වෘක්ෂයන් මත හිරු එළිය වැතිරී තිබිණ. ලොකු කුඩා දොළ පාරවල් 'කල' 'කල'හඬ නගමින් වනය මැදින් ගලා බැස්සේය. හරිතකී, බක්මී, තේක්ක වැනි ගස්වල පත්‍ර මතට සුළඟ වැදී 'සර' 'සර' හඬක් නැගුණි. වනය මැදින් මොණරකු කෑ ගසන හඬ ඇසිණ.

"යුගල ප්‍රසාද් විහඩි ගෙඩි තියෙන්නේ කොහෙද කියලා බලනවද?" මම කීවෙමි.

නවත් ඉහළට නැංග විට ඒ වර්ගයේ ගසක් හමු විය. ගොඩ මානෙල් කොළ මෙන්වූ පත්‍ර සහිත, මහත කටු සහිත වැලක් ගසක එතී තිබිණ. එහි වූ කරල් බෝංචි කරල් මෙන්වූ නමුත් එක් කරලක් සෙරෙප්පුවක් පමණ විශාල විය. තද පොත්තක් සහිත කරල් පළල් ඒවා විය. එය තුළ රවුම් හැඩයේ බීජ තිබිණ. අපි වියළි කොළ අතු දක්වා ඒ බීජ පුළුස්සා කෑවෙමු. අර්තාපල් අල පුළුස්සා කන විට මෙන් රසයක් දැනිණ.

අපි බොහෝ දිනක් ඉහළට නැංගෙමු. මෝහනපුරා වනය ඇත පෙනිණ. දකුණු පැත්තෙන් දිස් වූයේ අපේ වතුයායකි. සරස්වතී වැව අසල වනයද නොපැහැදිලි ලෙස දිස්විය. මෝහනපුරා රක්ෂිත වනයේ නැගෙනහිර සීමාව දිගේ කුශී නදිය ගලා බසිනු පෙනිණ. පහළින් වූ තැනිතලා බිමෙහි දර්ශනය අඳින ලද පින්තූරයක් සේ දිස්විය.

"මොණරෙක්! මොණරෙක්! සර් අර බලන්න."

විශාල මොණරෙක් අපට ඉහළින් වූ ගසක අත්තක වසා සිටියේය. ඔහු වෙඩි තැබීමට සැරසෙන විට මම ඔහු වැලක්වූයෙමි.

"මහත්තයා මේ කන්දේ ගල් ගුහාවක් තියෙනවා. ගුහාව ඇතුළේ රූප වගයකුත් තියෙනවා කොයි කාලේ ඇඳපු ඒවාද කියලා කියන්න කවුරුවත් දන්නේ නෑ. අපි ඒක හොයමුද?" යුගල ප්‍රසාද් ඇසිය.

ඒ සිතුවම් ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසා විසින් අඳින ලද හෝ ඔවුන් විසින් ගල මත කොටන ලද ඒවා විය හැක. එය හමු වුවහොත් පෘථිවියේ ඉතිහාසයේ වසර ලක්ෂ ගණනක් පැරණි තොරතුරක් අප ඉදිරියේ දිග හැරී යනු ඇත.

ගුහාවේ ඇති චිත්‍ර දැකීමේ දැඩි උනන්දුවක් මා තුළ ඇතිවූ නිසා කැලය පීරා එය සොයා ඇවිද්දෙමි. ගල් ගුහාව හමුවිය. එය තුළ සන අන්ධකාරයක් වූ නිසා එහි ඇතුළු වීමට අපි බිය වූයෙමු. ඇතුළු වුවත් "කළුවරේ මොනවා බලන්නද?" මට සිතිණ. වෙනත් දිනයක ඒ සඳහා සූදානම් වී ඒමට සිතා ගතිමි. අන්ධකාරයේ විසකුරු නයි පොළොහුන් ද සිටීමට හොඳටම ඉඩ ඇත. දෂ්ඨ කළොත් අපෙන් කෙනෙකු මිය යන්නටද ඉඩ තිබේ.

මම යුගල ප්‍රසාද්ට මෙසේ කීවෙමි.

"මේ කැලෑවේ නැති විදියේ අලුත් පැල ජාති මෙහේ ගෙනැවිත් හිටවන්න. කවුරුවත් මේ කන්දේ ගස් වැල් කපන්න එන එකක් නෑ. ලොබිටූලියාවත් ඉවරයි. සරස්වති වැව ළඟ කැලෙත් පරිස්සම් කරලා තියා ගන්න පුළුවන් වෙයි කියලා හිතන්න එපා."

"ඒක ඇත්ත මහත්තයා. ඒ වුනාට මහත්තයා එන්නෙත් නැනේ. මට තනියම තමයි ඒවා කරන්න වෙන්නේ."

"මං සැරින් සැරේ ඇවිල්ලා යන්නම්. යුගල ප්‍රසාද් පැල හිටවන්නකෝ."

මහාලිබාරූප කන්ද එතරම් දීර්ඝ නොවූ කඳු වැටියකි. එහි එක් තැනක්වත් අඩි එක්දහස් පන්සියකට වඩා උස් නොවිය. එය හිමාල කඳු වැටියේ පහළ මට්ටමේ වූ ශාඛාවක් ලෙස හැඳින්විය හැක. තරායි ප්‍රදේශයේ කැලය සහ නියම හිමාල කඳු වැටිය එහි සිට සැතපුම් සියයත් දෙසියක් පමණ ඈතින් පිහිටියේය. මහාලිබාරූපයේ කන්ද මත සිටගෙන, පහළින් වූ මිටියාවත දෙස බැලූ විට පුරාණ යුගයකදී මහා සමුද්‍රය ඒ චාලුකාමය උස් භූමියේ ගැටෙන්නට ඇතැයි සිතේ. මහාලිබාරූප කන්ද ඒ මහා සාගරයේ ඉවුරේ තිබෙන්නට ඇත. යුගල ප්‍රසාද් මා ඉන් පෙර දැක නැති ගස් වැල් වර්ග හත අටක් මට පෙන්වීය. තැනිතලා භූමියේ පිහිටි වනාන්තරවල එවැනි ශාක වර්ග දක්නට නොලැබේ. කන්දේ වැඩෙන ගස් වැල් තැනිතලාවේ ඒවාට වඩා වෙනස් ඒවා විය.

රෑ බෝ වීගෙන ආවේය. කිසියම් වන මලක සුවඳක් සවස් වන්නට, වන්නට වඩාත් තදින් දැනෙන්නට විය. ගස්වල අතු මත වසා සිටි පරෙවියන්, ගිරවුන් සහ හර්ට්ට් ආදී කුරුල්ලන්ගේ නාද ඇසෙන්නට විය.

රෑ බෝවූ නිසා ව්‍යාඝ්‍රයින්ට බියේ මා සමග ගිය අය නොසන්සුන් වී කන්දෙන් පහළට බසින්නට උත්සුක වූහ. එසේ නොවන්ට

ඒ වෙලාවේ ගස් පර්වත සහිත වන භූමියේ සුන්දරත්වය නොබලා එන්නට මගේ සිත ඉඩ නොදෙනු ඇත.

මුනේශ්වර් සිංහ කථා කළේය.

"සර්. මෝහනපුරා කැලේට වඩා මෙහේ කොටි ඉන්නවා. හවස් වුනාම කවුරුවත් දර අහුලන්න වත් මේ පැත්තට එන්නේ නෑ. කව්ටියක් එක්ක මිසක් කවුරුවත් මෙහේ එන්නේ නෑ. කොටිත් ඉන්නවා. සර්පයොත් ඉන්නවා. මේක මහා ඝන කැලෑවක්නේ."

අප පහතට බසිද්දී සිකුරු සහ බ්‍රහස්පති තාරකා දිලිසෙනු බක්මී ගස්වල ලොකු කොළ අතරින් දිස්විය

* * * * * *

දිනක් මා පිටතට යද්දී ජනපදයේ නිවසක පිලේ ගනෝරි තේවාරි ගුරු මහතා හිඳගෙන සිටිනු මම දුටුවෙමි. ඔහු සල් කොළ වලට බෙදූ කව්පි තලපයක් වැනි දෙයක් කමින් සිටියේය.

"ආ සර්. කොහොමද සැප සනීප?"

"හොඳින් ඉන්නවා. කවදද ආවෙ? කොහේද හිටියේ? මේ ගෙදර ඉන්නේ කවුද?"

මෙහේ ඉන්නේ මගේ කවුරුවත් නෙවෙයි. මෙතැනින් යන කොට දවල් වෙච්ච නිසා මෙහාට ආවා. මං බ්‍රාහ්මණයෙක් හින්දා මේ ගොල්ලෝ මට දානයක් දුන්නා. මීට කලින් මේ ගොල්ලන්ව අඳුනන්නේ නෑ. අදයි අඳුන ගත්තේ."

ගෙහිමියා ඉදිරියට පැමිණ මට ආචාර කළේය.

"එන්න සර්. ඇවිල්ලා ඉඳගන්න."

"ඉඳගන්න වෙලාවක් නෑ. කොච්චර කල් වෙනවද මෙහේ ඉඩම් අරගෙන?"

"මාස දෙකයි සර්. නාම මොකවත් වගා කරන්න බැරිවුනා."

කුඩා දැරියක් පැමිණ ගනෝරි තේවාරිට අමු මිරිස් කරල් කිපයක් දී යන්නට ගියාය. තම්බා තලපයක් සේ සාදා ලුනු ඉසින ලද කව්පි ඔහු අමු මිරිස් සමග කෑවේය. කෙසහ සිරුරක් ඇති ගනෝරිගේ කුසෙහි එතරම් ලොකු තලපයක් සඳහා ඉඩ ඇද්දැයි සිතීමට අපහසුය. ගනෝරි ඉබාගාතේ යන කෙනෙකි. ඔහු කෑම ගන්නා තැන පිලේ එක් පසෙක කිළිටි පොට්ටනියක් විය. එහි පැතලි

SL UNLIMITED The spirit of Sri Lankan e-community

කොට්ටයක් වැනි දෙයක් දුටු මම එය ගනෝරිගේ බව තේරුම් ගතිමි. ඔහුගේ සියලුම වස්තුව එපමණකි.

"දැන් මට වැඩ නියනවා. හවසට ඔපිස් එක පැත්තේ එන්න." යයි කියූ මම එතැනින් යන්නට ගියෙමි.

ගනෝරි සවස් වරුවේ කායර්ාලයට පැමිණියේය.

"මෙච්චර දවස් කොහේද හිටියේ ගනෝරි?"

"මුංගේර්වල කඳු පළාතේ ගම් ගණනාවක ඇවිද්දා."

"මොනවටද ඇවිද්දේ?"

"මං එහේ ඉස්කෝලයක් දාලා ළමයින්ට ඉගැන්නුවා."

"ඉස්කෝලේ පවත්වන්න යන්න බැරිවුනාද?"

"මාස දෙක තුනකට වඩා ඉස්කෝලේ පවත්වගෙන යන්න බැරිවුනා සර්. ළමයි සල්ලි ගෙව්වේ නෑ."

"දැන් ගනෝරිගේ වයස කීයද? කසාද බැන්දේ නැද්ද?"

"මටවත් ජීවත් වෙන්න බැරි කොට කසාද බඳින්නේ කොහොමද සර්. මගේ වයස අවුරුදු තිස් පහක් වෙනවා."

ගනෝරි මෙහි වාසය කරන අයටත් වඩා අන්ත දිළින්දෙකි. වරක් ඔහු ආරාධනයක් නොමැතිවම බත් කෑමට මගේ කායර්ාලය පැමිණි බව මට සිහි විය. ඔහුට හුහ දවසකින් බත් කන්නට නොලැබෙන්නට ඇත. ගංගෝතා නිවෙස්වලින් ලැබෙන කව්පි තලපවලින් ඔහු දිවි රැක ගන්නා බව පෙනේ.

"ගනෝරි අද රෑට මෙහෙන් බත් කන්න. කුස්සියේ වැඩ කරන කණ්ටු තමයි උයන්නේ. ඒ ගැන අකමැත්තක් නෑ නේද?"

ගනෝරි ඉතා සතුටු විය. ඔහු මුව පුරා සිනාසුණේය.

"කණ්ටු අපේ බ්‍රාහ්මණයෙක් නේ. එයා උයන ඒවා මීට කලිනුත් මං කාලා තියෙනවනේ."

පසුව ඔහු මෙසේ කීවේය.

"සර් කසාදයක් ගැන අහපු හින්දා මං මේ කියන්නේ. ගිය අවුරුද්දේ නිකිනි මහේ මං ගමක ඉස්කෝලයක් පවත්වන්න පටන් ගත්තා. ගමේ හිටිය බ්‍රාහ්මණ පවුලක් එක්කයි මං හිටියේ. ඒ ගෙදර හිටිය ගෑනු ළමයෙක් එක්ක විවාහය තීන්දු වුනා. මං මුංගේර් වලින් කමිසයකුත් ගත්තා. මං ජීවත්වෙන්න ක්‍රමයක් හරි හැටි නැති දුප්පත් ගුරුවරයෙක් නිසා මට දුව දෙන්න එපා කියලා ගමේ මිනිස්සු ඒ

ගෙදර අයට කියලා ඒ මංගල්ලේ කඩා දැම්මා. ඊට පස්සේ මං ඒ ගම අතඇරලා ආවා."

"ගෑනු ළමයා දැක්කද? එයා ලස්සනද?"

"මොකද දැක්කේ නැත්තේ? හරි අපූරු කෙල්ල සර්. මට කවුද ගෑනු දෙන්නේ? ඇත්තටම මට මොනවද තියෙන්නේ?"

ගනෝරි ඒ විවාහය කැඩී යාම ගැන බොහෝ දුක්වෙන බවද ඒ තරුණිය ඔහුගේ සිත්ගත් බවද මට පෙනී ගියේය.

ඔහු ඉන්පසු බොහේ වේලා යන තුරු මා සමග කථා කරමින් සිටියේය. ඔහුගේ කතාවෙන් මට තේරුම් ගියේ ජීවිතය ඔහුට කිසිවක් දී නැති බවය. බඩ වියත රැක ගැනීම සඳහා ගමින් ගමට ඇවිදින ඔහුට කෙතරම් ඇවිද්දත් විටෙක කෑමට දෙයක් හෝ නොලැබේ. ගංගෝතා මිනිසුන්ගේ ගෙයක් ගෙයක් පාසා ඇවිදීමටම ඔහුගේ ජීවිතයෙන් අඩක්ම ගෙවී ගොස් ඇත.

"මං හුඟ කාලෙකට පස්සේ ලොබ්ටුලියාවට ආවේ. මෙහේ හුඟක් ජනාවාස ඇතිවෙලා කියලා ආරංචි වුනා. වනාන්තරේ දැන් නෑ. මෙහේ ඉස්කෝලයක් විවෘත කරන්න හිතාගෙනයි ආවේ. කරගෙන යන්න පුළුවන් වෙයිද දන්නේ නෑ නේද සර්."

මා ඊට කලිනුත් සිතා ගත්තේ පාසලක් විවෘත කොට ගනෝරි තේවාරි එහි රඳවා ගැනීමටය. පිටින් ආ කුඩා ළමයි වතුයායේ බොහෝ සිටිති. ඔවුන්ට ඉගෙනීමට තැනක් පිළියෙළ කර දීම මගේ යුතුකමකි.

* * * * * *

එය සඳ එළිය සහිත අපූරු රාත්‍රියක් විය. යුගල ප්‍රසාද් හා රාජු පාංඩේ මා සමග කථා බහ කරමින් සිටියේය. ඔහුගේ කතාවෙන් මට තේරුම් ගියේ ජීවිතය ඔහුට කිසිවක් දී නැති බවය. බඩ වියත රැක ගැනීම සඳහා ගමින් ගමට ඇවිදින ඔහුට කෙතරම් ඇවිද්දත් විටෙක කෑමට දෙයක් හෝ නොලැබේ. ගංගෝතා මිනිසුන්ගේ ගෙයක් ගෙයක් පාසා ඇවිදීමටම ඔහුගේ ජීවිතයෙන් අඩක්ම ගෙවී ගොස් ඇත.

"මං හුඟ කාලෙකට පස්සේ ලොබ්ටුලියාවට ආවේ. මෙහේ හුඟක් ජනාවාස ඇතිවෙලා කියලා ආරංචි වුනා. වනාන්තරේ දැන් නෑ. මෙහේ ඉස්කෝලයක් විවෘත කරන්න හිතාගෙනයි ආවේ. කරගෙන යන්න පුළුවන් වෙයිද දන්නේ නෑ නේද සර්."

මා ඊට කලිනුත් සිතා ගත්තේ පාසලක් විවෘත කොට ගනෝරි තේවාරි එහි රඳවා ගැනීමටය. පිටින් ආ කුඩා ළමයි වතුයායේ බොහෝ සිටිති. ඔවුන්ට ඉගෙනීමට තැනක් පිළියෙළ කර දීම මගේ යුතුකමකි.

* * * * * *

එය සඳ එළිය සහිත අපූරු රාත්‍රියක් විය. යුගල ප්‍රසාද් හා රාජු පාංඩේ මා සමග කථා බහ කරමින් සිටීමට පැමිණියහ. කාර්‍යාලයට මඳක් දුරින්ද අලුතින් පැමිණි ජනයා පදිංචිව සිටියහ. ඡායාරූපදිස්ත්‍රික්කයේ සිට දින හතරකට පෙර පැමිණි කෙනෙක් ද ඒ වේලාවේ කාර්‍යාලයට පැමිණ සිටියේය.

ඔහු තමාගේ ජීවිත කථාව අප සමග කීවේය. අඹු දරුවන් සමග ඔහු කොහේ කොහේ ඇවිද ඇත්ද, කොපමණ තණ බිම් හා කැලෑ එළි පෙහෙළි කොට ගෙවල් තනා පදිංචිව සිටියාද යන්න ඔහු විස්තර කළේය. කුශී නදිය අසල තැනක වසර දහයක්ද තවත් තැනක වසර පහක්ද ආදී වශයෙන් ඔහු නොයෙක් තැන්වල පදිංචිව සිටියේය.

කොහේදීවත් ඔහුට දියුණුවක් ලැබීමට නොහැකි විය. මෙවර ඔහු දියුණු වීමට සිතාගෙන ලොබ්ටුලියාවට පැමිණ ඇත.

අහිකුණ්ඨිකයන් සේ තැනින් තැනට ගොස් ගත කරන ඔවුන්ගේ ජීවිත අමුතුය. ඒ ජීවිත බැඳීම්වලින් අඩුය. පවුල් අතර බැඳීමක් හෝ ඉඩකඩම් පිළිබඳ තණ්හාවක් හෝ ඔවුන් තුළ නැත. නිල් අහස යට කොහේ හෝ පවුල් කන ඔවුහු වනයේද, පර්වත අතරේද, තණ බිම්වලද, ගංගා අසලද වරින් වර නවාතැන් ගනිති. අද එක තැනක ජීවත්වන ඔවුහු හෙට තවත් තැනකට යති.

ඔවුන්ගේ ආදරය, විවාහය, ජීවිතය, මරණය යන හැම දෙයක්ම මට අමුතුවට දැනුණි. සියල්ලටම වඩා මට අමුතුවට දැනුණේ දියුණු වීමට ඔවුන්ගේ ඇති බලාපොරොත්තුවයි.

ලොබ්ටුලියාව වනයේ අක්කර දෙක තුනක් පමණ තිරිඟු වගා කර දියුණු වන්නේ කෙසේදැයි මට තේරුම් ගත නොහැකි විය.

බලහද්‍ර සේංගායි නමැති ඒ තැනැත්තාගේ වයස අවුරුදු පනහක් පමණ විය. ඒ වයසේදීත් දියුණු වීමට ඇති බලාපොරොත්තුව බලවත්ය.

"බලහද්‍ර කලින් හිටියේ කොහේද?"

"මුංගේර් පළාතේ වත්තක සර්. එහේ අවුරුදු දෙකක් හිටියා. අන්තිමේදී ඉරිඟු අස්වැන්න විනාශවෙලා ගියා. එහේ ඉඳලා දියුණු වෙන්න බෑ. හැමෝම දියුණු වෙන්න උත්සාහ කරනවනේ සර්. මේ පාර සර්ලාගේ උදව්වෙන් අපටත් දියුණු වෙන්න....."

"මං මෙහේ එන කොට මට හිටියේ මී හරක් භය දෙනයි. දැන් දහ දෙනෙක් ඉන්නවා. ලොබ්ටුලියාවට දියුණු වෙන්න කියාපු නැන. යයි රාජු කීවේය.

"මාත් මේ සැරේ අස්වැන්න ලැබුණහම මී හරක් ජෝඩුවක් සල්ලි දීල ගන්නවා. මී හරක් ජෝඩුවක් මටත් අරන් දෙන්න පාංඩේජී. ඒ නැතුව දියුණු වෙන්න බෑ."

ගනෝරිද ඔවුන්ගේ කථාව අසා සිට මෙසේ කීවේය.

"ඒ කථාව ඇත්ත තමයි. මටත් හිතිලා තියෙන්නේ කොහේ හරි නවතින්න පුළුවන් උනොත් මී හරක් දෙන්නෙක් විතර ගන්න කියලා."

සඳ රැස් වැටී මහාලිඛාරූප කන්ද සහ ඊට පිටුපසින් වූ ධංජලී පෙළ පැහැදිළිව දිස් විය. එදින තරමක් සීතල පැවති හෙයින් මිදුලේ

ගිනි ගොඩක් දල්වා තිබිණ. එහි එක් පසෙක රාජු පාංඩේ හා යුගල ප්‍රසාද් සිටි අතර අනිත් පසින් බලහදු සහ අලුතින් පැමිණි දෙතුන් දෙනෙක් වූහ.

ආර්ථික අතින් දියුණු වීම ගැන ඔවුන් කිවූ දේ මට අමුතුවට දැනිණ. දියුණු වීම ගැන ඔවුන් තුළ ඇති බලාපොරොත්තු සිදුවිය නොහැති තරම් ඉහළ මට්ටමක ඒවා නොවේ. ඔවුහු මී හරකුන් සය දෙනා, අට දෙනෙකු කර ගැනීමට හෝ දොළොස් දෙනෙකු කර ගැනීමට කල්පනා කරති. ඒ දුෂ්කර වූද දුර්ගම වූද ආරණ්‍යයේ ගල් පර්වතවලින් වටවූ වනගත දේශයේ සිටින මිනිසුන්ගේ සිත්වල පහළ වන බලාපොරොත්තු ගැන දැන ගැනීමට හැකිවීම නිසා ඒ සඳ පහන් රැය අපූරු ගුප්ත වූ එකක් ලෙස මට හැඟිණ. සඳ පහන් රැය පමණක් නොව මහාලිඛාරූප කන්දත්, ධංජලී පර්වත පෙළත්, ඊට ඉහළින් වූ වනාන්තරයත් ගුප්ත ඒවා සේ මට හැඟිණ.

යුගල ප්‍රසාද් පමණක් ලෞකික දියුණුව ගැන කථා බහට හවුල් නොවීය. ඔහු වෙනත් ආකාරයක කායික හාරයක් ඉටුකිරීමට මෙලොවට පැමිණි මිනිසෙකි. ඉඩ කඩම්, හරක බාන ආදිය ගැන කථා කිරීමට කැමති නැති ඔහු ඒවාට හවුල් වෙන්නේ නැත.

"සරස්වති වැවේ නැගෙනහිර පැත්තේ ඉවුරේ මං හිටවපු පරවිමල් හැදිලා තියෙනවා ලස්සන දැක්කද මහත්තයා. වැව අයිනේ ස්පයිඩර් ලිලී පදුරු සරුවට හැදිලා. හඳ එළියේ ඒ පැත්තේ ඇවිදින්න යමුද? යුගල ප්‍රසාද් ඇසීය.

ඔහු මෙතරම් සැලකිල්ලෙන් සැරසූ සරස්වති වැව අසල වනය තව කී දවසක් රැකී පවතීද යන්න ගැන සිහිවන විට මගේ සිතේ දුකක් ඉපදිණ. පරවිමල්වැල් හා සේපාලිකා ගස් ගොන්නක අතුරුදහන් වනු ඇත. ඒ වෙනුවට ඉරිඟු කෙත් හා පිලේ ඇඳන් සහිත පැල්පත් පේළි දකින්නට ලැබෙනු ඇත. ගොම සහ මඩ සහිත මිදුල්වල හරකුන් මා මී හරකුන් පිදුරු කමින් සිටිනු දක්නට ලැබෙනු ඇත.

ඒ වෙලාවේ මටුකනාථ ගුරුතුමා පැමිණියේය. ඒ වන විට ඔහුගේ පාසලේ ශිෂ්‍යයින් පහළොස් දෙනෙක් ඉගෙන ගනිමින් සිටියහ. දැන් ඔවුන්ගේ ආර්ථික තත්වයද හොඳය. පසුගිය අස්වනු නෙළන කාලයේ ඔහුට දායකයින් ගෙන් දාන වශයෙන් ලැබුණු තිරිඟු හා ඉරිඟු තැබීමට පාසල ඉදිරිපිට කුඩා ධාන්‍යාගාරයක් තැනීමට සිදුවිය.

අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් දක්වන අය දියුණු විය යුතුමය. මටුකනාථ ගුරුතුමා ඒ පිළිබඳව නිදසුනකි.

දියුණුව! නැවත දියුණුව යන වචනය භාවිත කළෙමි. ඒ ගැන කථා නොකර සිටිය නොහැක. මටුකනාථ දියුණු වූ බව මම ඇස් ඉදිරිපිටම දුටුවෙමි ඒ වන විට ඔහු හැමගේම ගෞරවයටද පාත්‍ර වී ඇත. කලින් මටුකනාථ පිස්සෙකු යයි හැඳින්වූ හටයෝ පවා පාසල දියුණු වූ පසු ඔහුට ගරු කරන්නට වූහ. දිනෙන් දින පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාවද වැඩිවන්නට විය. යුගල ප්‍රසාද් හෝ ගනෝරි තේවාරිට නවමත් ඔහු සිටින තැනට ළඟා විය නොහැකි විය. රාජු පාංඩේද අලුතින් පැමිණි මිනිසුන් අතර පිළිගැනීමට පාත්‍ර වූ කෙනෙක් විය. බෙහෙත් බඩු පොට්ටනිය අතින් ගත් ඔහු දොරින් දොරට ඇවිද්දේය. රෝගී දරුවන්ගේ නාඩි බැලුවේය. රාජු පාංඩේට මුදල් ගැන හැඟීමක් නොවීය. පිළිගැනීමට පාත්‍රවීමෙන් හා මිනිසුන් සමග කථා කිරීමට ඉඩ ලැබීමෙන් පමණක් ඔහු සතුටට පත්වෙයි.

මාස තුන හතරක් ඇතුළත මහාලිඛාරූප කන්දේ සිට ලොබිටූලියාව සහ නාඩා බයිහාරයේ උතුරු සීමාව දක්වා ජනයා පදිංචි වූහ. වතුයායේ ඉඩම් බෙදා දී මීට කලින් ගොවිතැන් ආරම්භ කර තිබුණත් මෙතරම් ජනගහනයක් සිටියේ නැත.

කෙතරම් විවිධාකාර වූ පවුල් එහි වීද? දිරාපත් වූ කෙට්ටු අශ්වයෙකු පිටේ ලී බඩු, පිත්තල බඩු, හැළි වළං, දේව රූප, යනාදිය පටවාගෙන එක පවුලක් එන විට මී හරකෙකු පිට හැළි වළං, බිදුණු ලන්තෑරුම්, ඇඳන් ආදිය පවා පටවා ගෙන ළමා ළපටින් ද සමග එන තවත් පවුලක් දකින්නට ලැබේ. සමහර පවුල්වල සැමියා සහ බිරිඳ එකතුව බඩුබාහිරාදිය හා ළමා ළපටින් දෙපැත්තේ එල්ලාගෙන හෝ කරේ තබාගෙන බොහෝ දුර සිටි පයින්ම පැමිණියහ.

ඔවුන් අතර වැදගත් යයි සම්මත මාන්නක්කාර මෛපීලි බ්‍රාහ්මණයෝ මෙන්ම ගංගෝතා දෝසාද ආදී පහත් යයි සම්මත කුලවල අයද වූහ.

"මේ ගොල්ලෝ මෙච්චර කල් ගෙවල් දොරවල් නැතුව හිටියද? මෙච්චර මිනිසුන් ගොඩක් ඇවිත් තියෙන්නේ කොහේ ඉඳලද? " මම යුගල ප්‍රසාද්ගෙන් ඇසුවෙමි.

ඔවුන්ගේ පැමිණීම ගැන ඔහු හිත හොඳ නැති බව පෙනිණ.

"මේ පැත්ත මිනිස්සු ඔය වගේ තමයි මහත්තයා. මෙහේ ලාබෙට ඉඩම් දෙනවා කියලා ආරංචි වෙලා රංචු පිටින් එනවා."

"මේ ගොල්ලන්ට තමන්ගේ මුතුන් මිත්තන්ගේ ඉඩම් ගැන හැඟීමක් නැද්ද?"

"ඒවා කොහෙන්ද මේ ගොල්ලන්ට? මේ ගොල්ලන්ගේ ජීවිකාව වෙලා තියෙන්නේ අලුතින් ඇති කරන ජනපදවල ගොවිතැන් කිරීම තමයි. අස්වනු ගන්න කල් අඩුවෙන් බදු අය කරන තැන්වල නවතිනවා.

"ඊට පස්සේ?"

"ඊට පස්සේ අලුතින් ඉඩම් දෙන වෙන තැනක් හොයාගෙන යනවා ඒක තමයි මේ ගොල්ලන්ගේ ජීවිතේ."

* * * * * *

එදින ග්‍රාන්ට් මහතාගේ නුග ගස යට ඉඩම් කොටස් මැනීම සිදු විය. මම අසු පිට හිඳගෙන මිනින්දෝරුවාගේ සහායකයා වූ අස්රපී ඉඩම මනිනු බලා සිටියෙමි. ඒ වෙලාවේ කුන්තා ජනපදය දෙසට ගමන් කරනු දුටුවෙමි.

කුන්තා බොහෝ දිනකින් මට දකින්නට ලැබුණේ නැත.

"කුන්තා මේ දවස්වල කොහේද ඉන්නේ? මං හුඟ කාලෙකින් දැක්කේ අද." මම අස්රපීට කීවෙමි.

"මහත්තයා ඒ ගැන දන්නේ නැද්ද? කුන්තා හුඟ දවසක ඉඳලා මෙහේ තමයි හිටියේ."

"මෙහාට ආවේ කොහොමද?"

"රාස බිහාරි සිං කුන්තාට කියලා තියෙනවා උඹ මගේ සහෝදරයගේ ගෑනිනේ. ඒ හින්ද අපේ ගෙදර ඇවිත් හිටපන් කියලා. පස්සේ කුන්තාව එහේ එක්ක ගියාලු."

"ඒක හොඳයි."

"එහේ ටික දවසක් හිටියට පස්සේ.....(කුන්තාගේ මුණ දැක්කද මහත්තයා. තාමත් දුක් කරදර එහෙමමයි.) .....ඊට පස්සේ රාස බිහාරි සිං මොනවාදෝ කුන්තාට කියලා තියෙනවා. බලහත්කාර කම් කරන්නත් ගිහිල්ලා තියෙනවා. මීට මාසෙකට විතර කලින් කුන්තා එහෙන් පැනලා ඇවිත් මෙහාට වෙලා ඉන්නවා. රාස බිහාරි සිං උල් පිහියක් පෙන්නලා බය ගන්නලත් තියෙනවා. කුන්තා මාත් එක්ක කිව්වා මාව මැරුවත් මගේ චරිතෙට හානි කරගන්නේ නෑ මහත්තයා කියලා."

"දැන් කොහේද කුන්තා ඉන්නේ."

"ජල්ලුටෝලාවේ ගංගෝතා ගෙදරක හරක් ගාල ළඟ පොඩි පැළක් තියෙනවා. ඒකේ තමයි දැන් ඉන්නේ."

"ජීවත් වෙන්නේ කොහොමද? ළමයිනුත් දෙතුන් දෙනෙක් ඉන්නවා නේද?"

"ඉල්ලගෙනත් කනවා. කුඹුරුවල වැටිච්ච නිරිඟු අනුලනවා. නිරිඟු කපනවා. කුන්තා හරි හොඳ ගෑනියෙක් සර්. බායිජී කෙනෙකුගේ දුවක් වුනාට වැදගත් ගෙදරක හැදුණු කෙනෙක් වගේ තමයි හිතන්නේ. කිසිම පහත් වැඩක් කරන්නේ නෑ."

ඉඩම් මැනීම අවසාන විය. බාලියා දිස්ත්‍රික්කයෙන් පැමිණි මිනිසුන් කණ්ඩායමකට ඉඩම කොටස් කර භාර දෙනු ලැබිණ. ඊළඟ දිනයේ සිට ඔවුන් එහි ගෙවල් තනනු ඇත. එවිට ග්‍රාන්ට් මහතාගේ නුග ගස අසල තිබුණු සෞන්දර්‍යයද අවසන් වෙයි.

මහාලිඛාරූප කන්ද මතවූ විශාල ගස්වලට ඉහළින් රතු පැහැයෙන් හිරු රැස් දිස්විය. කොක්කු රැනක් සරස්වතී වැව දෙසට පියාඹා ගියහ. රෑ බෝවීමට වැඩි වෙලාවක් ඉතිරිව තිබුණේ නැත.

විශාල ලොබ්ටූලියාවේ සහ නාඨා බයිහාරයේ තරම් එක යායට ඉතිරිවූ ඉඩම් ප්‍රමාණයක් මා කොහේවත් දැක නැත. නාදුනන බොහෝ දෙනා පැමිණ ඉඩම් බද්දට ගෙන එහි පදිංචි වූහ. ඒ ආරණ්‍ය භූමිය අවට එතෙක් ජීවත් වූ අවාසනාවන්ත අසරණ මිනිසුන් ඉඩම් බෙදා ගැනීමට මුදල් නැතැයි කියා ඉඩම් නොදී සිටිය යුතුද? අඩු තරමින් මා ප්‍රිය කරන කෙනෙකුටවත් එවැනි උපකාරයක් කළ යුතුය.

"අස්රපී; හෙට කුන්තාට ඔපීස් එකට එන්න කියන්න පුළුවන්ද? පොඩි උවමනාවකට."

"හා සර්."

පසුදින උදේ නමයට පමණ අස්රපී කුන්තා කැටුව කාර්‍යාලයට පැමිණියේය.

"කොහොමද සැප සනීප කුන්තා?"

ඇය දැත් එකතු කොට මට ආචාර කළාය.

"හොඳින් ඉන්නවා සර්."

"දරුවන්ට කොහොමද?"

"දෙයියන්ගේ පිහිටෙන් හොඳින් ඉන්නවා."

කුන්තා තවමත් ලස්සනය. ඇගේ අසරණ ජීවිතයේ දුක් කම්කටොළු ඇගේ මුහුණේ සළකුණු වී තිබිණ. ධෛර්‍යයත්, ජීවිතයේ

පිවිතුරු බවත් සතු දුර්ලභ ජයග්‍රහණයක සලකුණු ඇගේ මුහුණෙ පිළිබිඹු විය.

බරණැස් නුවර මුස්ලිම් බායිජීගේ දියණිය මැයයි. ප්‍රේමය නිසා දුක්පත් කුන්තා මැයයි. ප්‍රේමයේ දිලෙන ගිනිසිළුව තවමත් මේ ලලනාවගේ අතෙහි ගෞරවයෙන් යුතුව දැල්වෙයි. තවමත් ඇයට දුක් කරදර, හෙළා දැකීම්, අවමන්, විදීමට සිදුවී ඇතත් කුන්තා ඇගේ ප්‍රේමය ගෞරවය තවමත් රකියි.

"කුන්තා. ඉඩම් කැල්ලක් ගන්නවද?"

කුන්තාට මා කී දේ හොඳින් ඇසුණේ නැද්ද, එසේ නැතහොත් තේරුම් නොගත්තා දැයි කිව නොහැක. ඇය විස්මිත මුහුණින් යුතුව මා දෙස බැලුවාය.

"සර්. ඉඩම් කැල්ලක්?"

"ඔව් අලුතෙන් බෙදල දෙන ඉඩම් කැල්ලක්."

කුන්තා මඳක් කල්පනා කළාය.

"කලින් නම් අපටත් දේපොල තිබුණා. එයින් පස්සේ එකින් එක නැති වුනා. දැන් අපි මොනවා දීල ඉඩම් ගන්නද සර්."

"ඇයි සල්ලි ගෙවන්න බැරිද?"

"කොහෙන් දෙන්නද සර්? රෑට කුඹුරුවල තිරිඟු ඇට අහුලන්න යනවා. කවුරු හරි දැක්කොත් නින්දා කරන හින්දා දවාලට යන්නේ නෑ. ඒවා කොටලා පිටි කරලා මොනවා හරි හදලා දරුවන්ට කවනවා. වෙලාවකට මට කන්න දෙයක් ඉතුරු වෙන්නෙත් නෑ."

කුන්තා කතාව නවතා බිම බලාගෙන සිටියාය. ඇගේ දෑසින් සට' සට' ගා කඳුළු වැගිරෙන්නට විය

අස්රපී ඉවතට ගියේය තරුණයාගේ සිත මෘදුය. අනුන්ගේ දුක වේදනාව ඔහුට ඉවසා සිටිය නොහැක.

"සල්ලි අය කරන්නේ නැතුව ඉඩම් දෙනවා නම් මොකද කියන්නේ?"

කුන්තා කඳුළු පිරුණු විස්මිත දෑසින් මා දෙස බැලුවාය.

අස්රපී වහා ඇය ළඟට ආවේය.

"කුන්තාට ඉඩමක් නිකං දෙන්න යන්නේ. සර් ඉඩමක් නිකං දෙන්නේ. තේරුණේ නැද්ද?"

"ඉඩම් අරගෙන කුන්තා ගොවිතැන් කරන්නේ කොහොමද අස්රපි?"

"ඒක ඒ හැටි අමාරු දෙයක් නොවෙයි සර්. මිනිස්සු එයාට නගුලක් එහෙම දෙයි. මෙච්චර ගොඩක් ගංගෝතා ගෙවල් තියෙනවා. ඒවායේ මිනිස්සු කුන්තට උදව් කරයි. මං ඒ වගකීම බාර ගන්නවා සර්."

"මං ඉඩම් අක්කර තුනක් කුන්තාට දෙනවා. එකේ තියම විදිහට වගා කරලා කරල් කැපුවම බදු ගෙවන්න පුළුවන්ද? මුල් අවුරුදු දෙකේ බදු ගෙවන්න ඕන නෑ. තුන්වෙනි අවුරුද්දේ ඉඳලා බදු ගෙවන්න ඕනෑ."

කුන්තාට කිසිවක් වටහා ගත නොහැකි සේය. අපි ඇයට සිනාසුණෙමු. අප සිනාසෙන්නේ ඇයිදැයි යන්නවත් ඇයට තේරුම් ගත නොහැකි සේය.

ඇය මං මුලා වූවකු සේ කථා කළාය.

"ඉඩමක්? අක්කර තුනක ඉඩමක්?"

අස්රපී මා වෙනුවට කථා කළේය.

"ඔව් සර් කුන්තාට ඉඩමක් දෙනවා. අවුරුදු දෙකක් යනකල් බදු ගෙවන්න ඕන නෑ. තුන්වෙනි අවුරුද්දේ ඉඳලා බදු ගෙවන්න ඕනෑ. බාර ගන්න කැමතියි නේද?"

කුන්තා ලැජ්ජාව රැඳි මුහුණින් යුතුව මා දෙස බැලුවාය.

"මහත්තයා පිං සිද්ද වෙනවා."

මෙසේ කියූ ඇය එක වරම හඬා වැටුණාය.

මා ඉහියෙන් කී දෙය තේරුම් ගත් අස්රපී ඇය කැඳවාගෙන පිටතට ගියේය.

17

රෑ බෝවූ විට ලොබ්ටූලියාවේ අලුතින් තැනූ ජනපදය කදිමට පෙනේ. මීදුම නිසා සඳ එළිය තරමක් නොපැහැදිලි විය. මිටියාවත පුරා විහිදුණ කෙත් යාය අතරින් ඈත පිහිටි ගෙවල් වලින් ආලෝක ධාරා කිපයක් විහිදුණේය. පවුල් ගණනාවක්ම තම තමන්ගේ බඩ වියත රැක ගැනීම සඳහා වතුයායේ පදිංචියට පැමිණ සිටියෝය.

ඔවුහු කැලය කපා එහි ජනපද තනා ගොවිතැන් කිරීමට පටන් ගෙන සිටියහ. සඳ එළියෙන්, දුරින් හා ළඟින් පිහිටි ගෙවල් යන්තමින් දිස්විය. ඒවායේ වාසය කරන මිනිසුන්ගේ ජීවිත ගැන තොරතුරුද ඒ අයුරුන්ම අපැහැදිලි විය. ඔවුන්ගෙන් සමහරෙකු සමග මම කථා කර බැලුවෙමි. ජීවිතය පිළිබඳ ඔවුන්ගේ දෘෂ්ටියත් ඔවුන්ගේ ජීවන රටාවත් මට අමුතුවට දැනිණ.

අපේ වත්තේ තුන් වර්ගයක ධාන්‍ය වගා කරනු ලැබිණ. බිනර මාසයේ ඉරිහුද, දුරුතු මාසයේ කව්පිද, වෙසක් මාසයේ තිරිහු ද වගාකරනු ලැබිණ. ඉරිහු සඳහා එහි පොළොව එතරම් හොඳ නැති හෙයින් ඉරිහුවලින් සරු අස්වැන්නක් නොලැබිණ. අනිත් වර්ග දෙක නම් එහි හොඳින් වැඩිණ. මිනිසුන්ගේ ප්‍රධාන ආහාරය වූයේ කව්පිය.

වී වගාවට සුදුසු පසක් එහි නොවීය. ඒ නිසා එහි සිටින අයට බත් කෑමට ලැබුණේ කලාතුරකිනි. එහි මිනිසුන්ට බත් යනු විශේෂ භෝජනයකි. සමහරු තිරිහු ආදිය විකුණා නගරයෙන් සහල් ගෙන ආවත් එවැනි අයගේ සංඛ්‍යාව අතේ ඇඟිලිවලින් ගැණිය හැකි තරම් කුඩාය.

අපේ වතු යායේ අක්කර දහස් ගණනක් තුළ නිමක් නැති ජනපද ඇතිවී තිබුණත් ඒ හැම ජනපදයකම ගෙවල් තනා තිබුණේ එකම ආකාරයටය. ඉඑක් මානා ආදිය යොදා වහළ සෙවිළි කළ පැල්පත්වල බිත්තිද එකම අයුරකින් තනා තිබිණ. බිත්තිවලට මැටි ගසා තිබුණේ සමහර ගෙවල්වල පමණි. අනිත් ඒවායේ කොළ අතු ආදිය යොදා වැට බැඳ බිත්ති ආවරණය කර තිබිණ. උන ගස් හිඟ වූ නිසා කේන්ද හා පියාල් ගස්වලින් ලබා ගත් ලී ගෙවල්වල කණු සඳහා යොදා ගැනිණ.

ඔවුන් අදහන ආගම ගැන කීමෙන් පලක් නැත. තිස්තුන් කෝටියක් වූ දෙවිවරුන් අතරින් ඔවුන් පුද පූජා සඳහා හනුමන්තා තෝරා ගත්තේ ඇයිදැයි කිව නොහැක. හැම ජනපදයකම සිටවූ උස් කොඩි ගහක හනුමාන් කොඩිය ලෙලදෙයි. මේ කොඩියට සිරිත් පරිදි වනාවත් කරනු ලැබේ. රාම-සීතා දෙදෙනාටත් වඩා ඔවුන්ගේ සේවකයාවූ හනුමන්තාට මොවුන් තුළ ඇති ගෞරවයවැඩි බව පෙනේ. වෙනත් පළාත්වල මෙන් එහි විෂ්ණු, ශිව, දුර්ගා, කාලි ආදී දෙවි දේවතානුන්ට පුද පූජා පැවැත්වීමක් නැත. වෙනත් වතුවල එසේ කෙරෙන්නේදැයි මා නොදනිතත් අපේ වතුයායේ නම් එවැන්නක් පෙනෙන්නට නැත.

එසේ වුවත් මෙහිදී ශිව භක්තියෙකුද හමුවූ බව කිමට මට අමතක විය. ඔහු ද්‍රෝණ මහතෝ නම් වූ ගංගෝතා කුලයේ කෙනෙක් විය. කායිමාලය අසල හනුමාන් ධජය යට වසර ගණනකට පෙර සිටම ගලක් තබා තිබිණ. වත්තේ හටයෝ ඒ ගල මත වරින් වර සිංදූර තවරති. සමහරු වතුර කළ ගෙනවුත් එය නාවති. එසේ වුවද එය වැඩි කාලයක් පැවතුණේ කිසිවකු විසින් නොසලකා හරින ලද නත්වයේය.

කායිමාලයට මදක් දුරින් මාස දෙකකට පෙර ජනපදයක් ඇතිවී තිබිණ. ද්‍රෝණ මහතෝද එහි පැමිණ පදිංචි විය. ඔහුගේ වයස අවුරුදු හැත්තෑවක් පමණ විය. ද්‍රෝණ වැනි නම් දැන් කාලයේ ළමයින්ට තබන්නේ නැත. දැන් ඇත්තේ ඩෝමන්, මහාරාජ් වැනි නම්ය. දරුවන්ට මෙවැනි නම් තැබීමට එකල දෙමාපියෝ ලැජ්ජා වූහ.

ද්‍රෝණ වරක් කායිමාලයට ආ විට හනුමාන් ධජය යටවූ ගල් කැබැල්ල දුටුවේය. ඉන්පසු දිනපතා උදැසන කල්බලියා ගහෙන් නාගෙන එන ද්‍රෝණා දිය කළයක් ගෙනවුත් ගල මතට වත්කර සත් වරක් එය පැදකුණු කොට පසඟ පිහිටුවා වැඳීමට පුරුදුව සිටියේය.

"කල්බලියා ගහට මෙහේ ඉඳලා හැතැප්ම දෙකක් විතර තියෙනවා නේද? ළඟ තියෙන පොකුණෙන් වතුර ගේන එක ඊට වැඩිය ලේසි නැද්ද?" යි මම ඔහුගෙන් ඇසුවෙමි.

"ශිව දෙයියෝ ගලාගෙන යන වතුරට කැමතියි මහත්තයා. මට උන්නාන්සේව වතුර වත්කරලා නාවන්න ලැබිච්ච එක වාසනාවක්."

භක්තිය ඇති තැනැත්තා දෙවි කෙනෙකු නිර්මාණය කර ගනියි. ද්‍රෝණ මහතෝගේ ශිව පූජාව ගැන ආරංචි වී වෙනත් ජනපදවලින්ද ශිව භක්තික ස්ත්‍රී පුරුෂයෝ එහි පැමිණෙන්ට පටන් ගත්හ. එ පළාතේ සුවඳ හමන තෘණ වර්ගයක් ඇත. ඒවායේ කොළ සහ නැටිවලින් අපුරු සුවඳක් හමයි. වේලෙන විට ඒවායේ සුවඳ වඩාත් තීව්‍ර ලෙස දැනේ. කිසිවකු ඒ තෘණ වර්ගය ගල වටේ පැල කර තිබිණ.

දිනක් මටුකනාථ ගුරුතුමා පැමිණ ඒ ගැන මගෙන් විමසුවේය.

"ගංගෝතා කුලේ මිනිහෙක් ශිව පූජා පවත්වලා ගල නාවන එක හොඳ වැඩක්ද මහත්තයා?"

"ඒ මිනිහ තමයි දේවාලේ ගැන ප්‍රචාරය කරලා ඇරියේ. මටුකනාථ ජී හිටියට ඔව්වර දවසක් ඔතැනට වතුර කළයක්වත් වත්කරලා නැතේ."

මටුකනාථ කෝපයට පත්විය.

"ඔය ශිව දෙවියෝ නෙවෙයි මහත්තයා. දෙවි කෙනෙක් වඩම්වන්නේ නැතිව එතැනට පුද පූජා පවත්වන්න වටින්නේ නෑ. ඕක නිකං ගල් කැල්ලක් විතරයි."

"එහෙනම් මොනවද තවත් කථා කරන්නේ? නිකං ගල් කැල්ලකට කවුරුවත් වතුර වත්කළාට විරුද්ධ වෙන්න ඕනැද?"

එයින් පසු ද්‍රෝණ මහතෝ කායශාලය අසල වූ ශිව පූජා පවත්වන ස්ථානයේ නිල නොලත් කපුවා බවට පත් විය.

ඉල් මාසයේදී ඒ පළාතේ ඡට් - උත්සවය උත්කර්ෂවත් ලෙස පැවැත්වේ. විවිධ ජනාවාසවලින් එන ගැහැනු කහපාට ඩයි දැමූ සාරි ඇඳ ගී ගායනා කරමින් කල්බලියා නදියට ගොස් ඒ උත්සවයට විශේෂ වූ චාරිත්‍ර පවත්වති. දවස පුරාම උත්සවයේ ආන්දෝලනය පවතියි. සවස් භාගයේ නිවෙස් අසලින් යන විට එදිනට පිළියෙළ කරන විශේෂ රස කැවිල්ලක් වූ පියා නම් කැවුම් වර්ගය බදින අපූරු සුවඳ නැහැය දැනෙයි. රාත්‍රියේ බොහෝ වේලාවක් යන තුරු ගැහැනුන් ගී ගායනා කරන හඬද ළමා ළපටින් සිනාසෙන හඬද ඇසෙයි. පෙර දිනවලදී ඇසුණු ගෝන රංචු දුවන හඬත්, හයිනාවගේ සිනා හඬත්, ව්‍යාඝ්‍රයින් කහින හඬත්, (මිනිසුන් කහින හඬට සමාන හඬක් ව්‍යාඝ්‍රයිනට නැගිය හැක.) වෙනුවට දැන් ඇත්තේ සිනා කවට බස් හඬින් හා ගීත හඬින් ගිගුම් දෙන උත්සවාකාරයෙන් පිරී ගිය ජනපදයක හඬයි.

එදින රාත්‍රියේ කෑමට ආරාධනා ලැබ ජල්ලුටෝලාවට ගියෙමි. මා ඇතුළු කායශාලයේ සියලුම සේවකයෝ ජනපදයේ ගම් පහළොවකින් පමණ ආරාධනා ලැබ සිටියහ.

මම ජල්ලුටෝලාවේ ජල්ලු මහතෝගේ නිවසට පළමුවෙන්ම ගියෙමි. ඒ වන විටත් ඔහුගේ නිවස අයිනේ වනාන්තරය ඉතිරිවී තිබිණ. මිදුලේ ඉරී ගිය උඩු වියනක් එල්ලා තිබිණ. ඔහු වියන යට අසුන් පනවා ගෞරවයෙන් යුතුව අපට හිඳ ගැනීමට සැලැස්වූයේය. අවට සියලුම දෙනා පිරිසිදු ධෝති සහ කමිස ඇඳගෙන තණකොළ නැටිවලින් වියන ලද පැදුරවල හිඳගෙන සිටියහ.

"තව හුහක් තැන්වල යන්න තියෙන නිසා කෑමට නවතින්න නම් බැහැ." යයි මම කීවෙමි.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

"මොනවා හරි ඉඳුල් කරන්නම වෙනවා. නැති නම් කෑම හදපු ගැනු උදවිය කණගාටු වෙයි. තමුන්නාන්සේ එන නිසා ඒ ගොල්ලෝ හරි උනන්දුවෙන් කැවුම් හැදුවේ."

වෙන කරන්නට දෙයක් නොවූ නිසා ගෝෂ්ඨබාබු නම් ලිපිකරුවා සහ රාජු පාංඩේ සමග මම කෑමට හිඳ ගතිමි. සල්කොළවලට බෙදූ කැවුමක් අහලක් පමණ ඝනකම් වූ අතර ඒවා ගල් මෙන් තද ගතියෙන් යුක්ත විය. එවායින් කිසිවෙකුට දමා ගැසුවොත් තුවාල වෙන තරමට ඒවා තදය.

එතරම් උනන්දුවෙන් ගැහැනු අය තැනූ රස කැවිලි මට කෑමට අපහසු විය. ඉන් කොටසක් පමණක් ඉතා අපහසුවෙන් කෑවත් මට රසක් දැනුණේ නැත. ගංගෝතා ගැහැනුන් හරි හැටි රස කැවිලි පිළියෙළ කිරීමට නොදන්නා බව මට හැඟී ගියේය. රාජු පාංඩේ කැවුම් හතරක් පහක්ම කෑවේය. මා සිටි නිසා ලැජ්ජාවට පත් වූ ඔහු වැඩිපුර කැවුම් ඉල්ලන්නට ගියේ නැත.

ජල්ලුටෝලාවේ සිට ලොදායී ටෝලා, පර්වත ටෝලා, හීමදාස් ටෝලා, අස්රජී ටෝලා, ලඡමනියා ටෝලා ආදි නම් වලින් හැඳින්වුණු ජනපදවලටද අපි ගියෙමු. හැම ජනපදයකම නැටුම් ගැයුම් ආදිය පැවැත්විණි. ඔවුන් රාත්‍රිය පුරාම අවදිව සිටිනු ඇත. ඔවුන් ගෙයින් ගෙට යමින් රස කැවිලි කමින් නටමින් ගයමින් රාත්‍රිය ගත කරනු ඇත.

හැම ජනපදයකම ගැහැනු උදවිය ඉතා උනන්දුවෙන් අප සඳහා කෑම පිළියෙළ කර තිබීම සතුට දනවන කරුණක් විය. වත්තේ කළමනාකාර මහතා ආරාධනය පිළිගෙන එන බව අසා ඔවුහු තමාගේ උපරිම හැකියාව යොදවා රස කැවිලි පිළියෙළ කිරීමට උනන්දු වූහ. ඔවුන්ගේ ක්‍රියාව පිළිබඳව මා සිතින් කෘතඥ වුවත් ඔවුන්ගේ කෑම පිළියෙළ කිරීමේ හැකියාව ගැන නම් මට ප්‍රශංසා කිරීමට නොහැකි වීම කණගාටුවට කරුණකි. වෙනත් තැන්වලින් ලැබුණු රස කැවිලි ජල්ලු ටොලාවේ තිබුණු රස කැවිලි තරම් වත් හොඳ නැත.

කෑම ගන්නා බෙංගාලි මහතා දෙස හැම තැනකදීම ගැහැනුන් හොරෙන් බලනු දක්නට ලැබිණ. රාජු පාංඩේ නම් කිසිවෙකුගේ හිත නරක් කළේ නැත. ඔහු ක්‍රමයෙන් කැවිලි අනුභව කිරීමේ සීමාව ඉක්මවා යන තරමට ආ විට මම ඔහුට අනතුරු ඇඟවීම්. එසේ

නොවන්නට ඔහු තව කොපමණ රස කැවිලි අනුභව කරනු ඇත්දැයි කිව නොහැක.

රාජු පමණක් නොව ගංගෝතා මිනිසුන්ද ඒ ගල් මෙන් තද රසකැවිලි විස්ස තිහ බැගින් අනුභව කරනු දුටුවෙමි. ඒවා එපමණ කෑ හැකියයි දැසින් නුදුටුවා නම් මා විශ්වාස නොකරනු ඇත.

නාඝා බයිහාරයේ ජනියා සහ සූරතියා සිටි නිවසට මම ගියෙමි.

සූරතියා මා දැක දිවගෙන ආවාය.

"ඇයි මහත්තයා මෙච්චර රෑ වුනේ? මායි අම්මයි, මහත්තයට දෙන්නම කියලා වෙනමම කැවුම් හැදුවා. අපි බලන් හිටියා මෙච්චර පරක්කු මොකද කියලා. එන්න ඉඳගන්න."

නක්ජේදී අප සාදරයෙන් පිළිගත්තේය.

තුලසි මහත් උනන්දුවෙන් කෑම දීමට තැනක් පිළියෙළ කරනු දුටු මම හිත යටින් සිනාසුණෙමි.

"අම්මට කියන්න සූරතියා මෙච්චර කැවුම් එපා කියලා. කාටද මෙච්චර කන්න පුළුවන්?"

සූරතියා මා දෙස පුදුමයෙන් බැලුවාය.

"මේ ටික කන්න බෑ මහත්තයට? මායි ජනියයි කැවුම් පහළොවක් දහඅයක් විතර කෑවා. ඕවා මහත්තයට කියලා කිරි එහෙම දාලා වෙනම හැදුව ඒවා. නාත්තා හීම්දාස් ටෝලාවෙන් හොඳ පිටින් ගෙනාවා ඕව හදන්න."

මෙහි සිටින දරු දැරියන්ට වසර පුරාම එවැනි රස කැවිල්ලක් දකින්නට නොලැබේ. ඒ රස කැවිලි කෑමට ළමයි කෙතරම් ආශා කරත්ද? දැරිය සතුටු කිරීමට මම බොහෝ අමාරුවෙන් කැවුම් දෙකක් කෑවෙමි.

"මේවා හරි ශෝක් කැවුම්. ඒ වුනාට හැම තැනින්ම කාපු නිසා තවත් නම් කන්න බෑ. සූරතියා, මං තව දවසක එන්නම්කෝ."

රාජු පාංඩේගේ අතේ පොට්ටනියක් විය. හැම ගෙයකින්ම එකතු කරගත් රස කැවිලි එහි විය. එක් එක් නිවසකින් ලැබුණු කැවිලි ප්‍රමාණය ගණන් බැලූ විට එහි කැවිලි සේරු දහයක් පමණ වත් තිබෙන්නට ඇත.

රාජු සතුටින් සිටියේය.

"මේවා ඉක්මනට නරක් වෙන්නේ නෑ සර්. මට දවස් දෙක තුනක් යන කල් උයන්න වෙන්නේ නෑ. මේවා කාලා ඉන්න පුළුවන්."

SL UNLIMITED The spirit of Sri Lankan e-community

පසු දින උදයේ කුන්තා පිත්තල බන්දේසියක් රැගෙන ලැජ්ජාවෙන් යුතුව මා ඉදිරියට ආවාය. ඇය ගෙන ආ බඳුන පිරිසිදු පැරණි රෙදි කැබැල්ලකින් වසා තිබිණ.

"මේකේ මොනවද කුන්තා?"

"මේකේ තියෙන්නේ කැවුම්. ඊයේ රෑ මං දෙපාරක්ම ඇවිත් ආපහු ගියා."

කුන්තා ලැජ්ජාවෙන් යුතුව පිළිතුරු දුන්නාය.

"ඊයේ මං ආපහු එනකොට හුගක් රෑ වෙලා. කෑමට ආරාධනා හම්බ වෙලා කොලනිවලට ගිහින් හිටියනේ. ඕවා තියන්න. මං කන්නම්."

භාජනය ඇර බැලූවිට කැවුම් කීපයක්, සීනි ටිකක්. කෙසෙල් ගෙඩි දෙකක්, පොල් කැල්ලක් හා නාරං ගෙඩියක් එහි ඇති බව දුටුවෙමි.

"ශහ්! හරි ශෝක්නේ."

කුන්තා පෙර මෙන්ම ලැජ්ජාවෙන් යුතුව මෘදු ස්වරයෙන් කථා කළාය.

"මහත්තයා කරුණාකරලා ඔය ඔක්කොම කන්න. මහත්තයටමයි මං වෙනමම ඔය ටික හැදුවේ. කැවිලි උනුවෙන්ම කන්න දෙන්න බැරි වුනාට දුකයි."

"ඒකට කමක් නෑ කුන්තා. මං මේ ඔක්කොම කන්නම්."

කුන්තා මට ආචාර කොට යන්නට ගියාය.

* * * * * *

දිනක් මුනේශ්වර් සිං පැමිණ මට කථා කළේය.

"සර්. කැලේ ගහක් යට ඉරිච්ච රෙද්දක් එළාගෙන මිනිහෙක් හාන්සි වෙලා ඉන්නවා. මිනිස්සු ඒ මිනිහව ගෙවල්වලට වැද්ද ගන්නේ නෑ. එලවනවා. තමුන්නාන්සේ අවසර දෙනවා නම් මෙහාට එක්ක එන්නම්."

ඔහු කී දේ අසා මම පුදුමයට පත්වූයෙමි. රෑ වීමට වැඩි වේලාවක් නැත. ඉල් මාසයේ වැඩි සීතලක් නැතත් රාත්‍රියට පින්න වැඩිය. මධ්‍යම රාත්‍රිය වන විට සීතල ගතියද වැඩි වේ. මෙවැනි අවස්ථාවක මිනිසෙකු වනයේ ගසක් යට වැතිර සිටින්නේ මන්ද යන්නත් මිනිසුන් ඔහුව ගෙවල්වලට වැද්ද නොගන්නේ මන්ද යන්නත් මට සිතා ගත නොහැකි විය.

ග්‍රාන්ට් මහතාගේ නුග ගස අසල (තිස් වසරකට පෙර ග්‍රාන්ට් නම් මිනින්දෝරු මහතෙක් ලොබ්ටූලියාවේ වන ගත වතු යාය මැනීමට පැමිණ නුග ගස ළඟ කුඩාරම් ගසා ගෙන සිටි නිසා එයට ඒ නම භාවිතා කරන බව මම පසුව දැන ගතිමි.) කුඹුක් ගසක් යට එලන ලද වැරහැල්ලක් මත මිනිසෙක් නිදමින් සිටියේය. පැදුර යට වූ අඳුර නිසා මිනිහා හරිහැටි පෙනුණේ නැත.

"කවුද මෙතැන ඉන්නේ? කොයි පළාතේ ඉඳලද එන්නේ? එළියට එන්න ඔතනින්."

මිනිසා සෙමින් පිටතට ආවේ දෙකට නැමී ගෙනය. ඔහුගේ වයස පනහකට වැඩි යයි කිව හැක. දිරා පත් වූ සිරුරෙන් යුතුවූ ඒ මිනිසා ඉරි ගිය ඇඳුම් ඇඳ සිටියේය. පිටතට පැමිණි ඔහු දඩයක්කාරයෙකුට අසුවූ වන සතෙකු මෙන් බිය පත්ව ඉතා අසරණ ලෙස මා දෙස බැලුවේය. ඔහු ආලෝකය ඇති තැනකට පැමිණි විට මා දුටුවේ ඔහුගේ වම් අතේ සහ වම් පාදයේ ලොකු තුවාල දෙකක් ඇති බවය. ඒ නිසා ඔහුට හිඳගෙන හෝ වැතිරීගෙන සිට එක් වරම නැගිට සිටීමට අසීරු විය.

ඔය තුවාල නිසා තමයි කවුරුවත් ගමට එන්න දෙන්නේ නැත්තේ. වතුර ටිකක් ඉල්ලුවම දෙන්නෙත් නෑ. ගල් ගහලා එලවනවා."

මුනේශ්වර් සිං කීවේය.

ඒ මිනිසා හේමන්තයේ පිනි සහිත රාත්‍රියේ පවා වන සතකු මෙන් පදුරක් යටට වී සිටින්නේ මන්දැයි මට තේරුම් ගියේ එවිටය.

"තමුසෙගෙ නම මොකද්ද? ගෙවල් කොහේද?"

මිනිසා මා දැක බියපත් විය. ඔහුගේ දෑස්වල බියපත්, අසරණ, රෝගී පෙනුමක් විය. මා පිටුපස බැටන් පොල්ලක් අතින් ගත් හටයෙකුද සිටි නිසා තමා එතැන කැලයේ සිටීම ගැන විරුද්ධ වී අප ඔහු එතැනින් ඵලවීමට පැමිණියා යයි ඔහු සිතන්නට ඇත.

"මගේ නම? සර්. මගේ නම ගිරිධාරි ලාල්. ගෙවල් තියෙන්නේ තීන්ඩාංගාවල."

මෙසේ කියූ ඔහු ඊළඟ මොහොතේ බැගෑපත් ආයාචනාත්මක රෝගී ගතියක් පළ කරන අමුතු ස්වරයකින් යුතුව වචන කිපයක් කීවේය.

"මට වතුර ටිකක් දෙන්න. වතුර ටිකක්."

මට ඒ මොහොතේ මිනිහා හඳුනා ගැනීමට හැකි විය. පසු ගිය දුරුතු සැණකෙළියකදී බ්‍රහ්ම මහතෝගේ කුඩාරමේදී මට හමු වූ ගිරිධාරි ලාල් මොහු විය. ඔහුගේ බියපත් බැල්මත්, බැගෑපත් ස්වභාවයත් මට සිහි විය.

බියපත්, අසරණ , බැගෑපත් මිනිසුන්ට දෙවියන් මෙතරම් කරදර පමුණුවන්නේ ඇයි දැයි මට සිතිණ.

මම මුනේශ්වර් සිංට කථා කළෙමි.

"ඔපිස් එකට ගිහිල්ලා මිනිස්සු හතරපස් දෙනෙකුත් එක්කරගෙන ඇඳකුත් අරන් එන්න."

මුනේශ්වර් සිං කාර්‍යාලය දෙසට යාමට පිටත් විය.

"මොකද මේ වෙලා තියෙන්නේ? මං ගිරිධාරි ලාල්ව අඳුනනවානේ, මාව අඳුනන්න බැරිද? සැණකෙළිය වෙලාවේදී බ්‍රහ්ම මහතෝගේ කුඩාරමේදී දවසක් මාව හම්බ වුනා මතක නැද්ද? බය වෙන්න එපා. මොකද වුනේ කියලා කියන්න."

ගිරිධාරි ලාල් හඬා වැටුණේය. ඔහු තමාගේ අතත් පාදයත් මට පෙන්වීය.

"කැපිලා තුවාල වුණා සර්. තුවාල හොඳවෙන්න එක එක්කෙනා කියන කියන දේවල් කළා. තුවාල දවසින් දවස වැඩි වුණා මිසක් හොඳ වුනේම නෑ. මිනිස්සු කිව්වා මට හැදිලා තියෙන්නේ කුෂ්ඨයක් කියලා. මාස හතරක පහක ඉඳලා මේ විදිහට කරදර විඳින්න සිද්ධවුණා. මට ගමකට ඇතුල් වෙන්න දෙන්නේ නෑ. හිගා කලා තමයි ජීවත් වෙන්නේ. රෑට ඉන්න තැනක් කව්රුවත් දෙන්නේ නැති නිසා තමයි කැලේට වෙලා ඉන්නේ."

"මේ කොහේද යන්නේ? මේ පළාතට ආවේ ඇයි?"

ගිර්ධාරි ලාල් හති අරින්නට විය. ටික වේලාවකින් ඔහු නැවත කථා කළේය.

"පූර්ණියාවල ඉස්පිරිතාලෙට යනවා සර්. නැති නම් තුවාලෙ හොඳ කරගන්න බැරි වෙයි."

මට ඔහු ගැන පුදුම සිතිණ. ජීවත්ව සිටීමට මිනිසා තුළ කෙතරම් ආශාවක් ඇද්ද? ගිරිධාරි ලාල් වාසය කළ ගමේ සිට පූර්ණියා නගරයට සැතපුම් හතළිහක් පමණ වේ. මෝහන පුරා රක්ෂිත වනය මෙන් වූ අනතුරුදායක වනාන්තරයක් ඉදිරියේදී හමුවේ.

SL UNLIMITED The spirit of Sri Lankan community

තුවාලවලින් දුබල වූ අත පය ඇතිව සිටියදී කඳු පර්වත මැදින් වැටී ඇති මග දුර්ගම වූ ඔස්සේ ඔහු පූර්ණියා නගරයේ පිහිටි රෝහල වෙත ගමන් කරයි.

ඇඳක් ගෙන ආ විට ඔහු එහි තබා කායිකාලයට ගෙනයාමට හටයින්ට කීවෙමි. හටයින් ලැගුම් ගන්නා හිස් කාමරයක ඔහුට වැතිරී සිටින්නට සැලැස්වූයෙමි. ඔහුට බෝවෙන කුෂ්ඨ රෝගයක් ඇතැයි කියා හටයෝ ඒ කාමරය දීම ගැන විරුද්ධතාවක් දැක්වූහ. මම ඔවුන්ට එය එසේ නොවන බව පහදා දුන් විට ඔවුහු එය පිළිගත්හ.

ගිරිධාරි ලාල් තද කුසගින්නකින් සිටින බව මට තේරුම් ගියේය. බොහෝ දිනකින් ඔහුට බඩ පුරා කෑමට යමක් ලැබී නැත. උණු කිරි ටිකක් බොන්නට දුන් විට ඔහුගේ තත්වය මඳක් යහපත් විය.

රෑ බෝවූ පසු කාමරයට ගොස් බැලූ විට ඔහු හොඳටම නිදි බව දුටුවෙමි.

පසු දින මම ඒ පළාතේ හොඳම වෛද්‍යවරයා වූ රාජු පාංඩේව කැඳවීමි. ඔහු ගාම්භීර මුහුණින් යුතුව බොහෝ වේලාවක් යන තුරු රෝගියාගේ නාඩි පරීක්ෂා කළේය. තුවාලයද බැලුවේය.

"ලෙඩා සනීප කරන්න පුළුවන්ද කියලා බලන්නකෝ .බැරි වුනොත් පූර්ණියාවට යවමු."

ඒ කථාව රාජුගේ අභිමානයට පහරක් විය.

"දෙයියන්ගේ පිහිටෙන් මං හුඟ දවසක ඉඳලා වෙදකම් කරන නිසා කියන්නේ. දවස් පහළොවක් ඇතුළත මේ තුවාල හොඳ කරන්න මට පුළුවන්."

ප්‍රතිකාර කිරීම සඳහා ගිරිධාරි ලාල් නවත්වා ගත්තත් පසුවට මට හිතුණේ රෝහලට යැව්වා නම් හොඳ බවය. රාජු පාංඩේගේ දේශීය ඖෂධවල ගුණයෙන් දින පහක් හයක් ඇතුළත තුවාල හොඳ වෙන ලකුණු පෙනුණත් ඔහුට සාත්තු කිරීමට කෙනෙකු නැති කම ප්‍රශ්නයක් විය. සේවකයින් කිසිවකු ඔහුව ඇල්ලීමට වත් කැමති වූයේ නැත. තුවාලවලට බෙහෙත් ගැල්වීමට හෝ ඔහු පාවිච්චි කරන කෝප්ප පිඟන් සේදීමට හෝ කෙනෙකු ඉදිරිපත් වූයේ නැත.

ඒ අතර ඒ අසරණයාට තදින් උණ ගැනුණි.

කරන්නට දෙයක් නැති නිසා මම කුන්තා කැඳවූයෙමි.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

"මේ ලෙඩාව බලා ගන්න කොලනියෙන් ගංගෝතා ගෑනු කෙනෙක් හොයලා දෙන්න. මම සල්ලි දෙන්නම්."

කුන්තා මදකුදු ප්‍රමාද නොවී ඒ කාර්‍යය තමාම කිරීමට එකඟ වූවාය.

"ම‍ං ලෙඩාට සාත්තු කරන්නම් මහත්තයා. සල්ලි ඕනෑ නෑ."

කුන්තා අභිමානවත් රාජ්පුත්වරයකුගේ බිරිඳයි. ඇය ගංගෝතා කුලයේ රෝගියෙකුට සාත්තු කරන්නේ කෙසේද? මා කියූ දෙය ඇයට තේරුම් ගියේ නැතැයි මම සිතුවෙමි.

"මේ ලෙඩාගේ ඉඳුල් භාජන හෝදන්න වෙනවා. ලෙඩාට කෑම කවන්න වෙනවා. ලෙඩාට නැගිටින්න වත් බෑ. මේවා කරන්න කුන්තාට පුළුවන්ද?"

"මහත්තයා අවසර දෙනවා නම් මං ඒවා කරන්නම්. අපි රාජ්පුත්වරුද මහත්තයා? අපේ සහෝදරයෝවත් මා ගැන බලනවාද? මහත්තයා කියන දෙයක් මං කරන්නම්. මට රැක ගන්න කුලයක් තියෙනවද?"

රාජු පාංඩේ බේත්වලට යොදා ගත් ගස්වල පොතු හා මුල් ආදියේ ගුණය නිසාද, කුන්තාගේ සාත්තුව නිසාද, මාසයක් තුළ ගිරිධාරි ලාල්ගේ තුවාල සුව විය. කුන්තා ඒ වෙනුවෙන් කිසිම මුදලක් නොගත්තාය. මේ කාලය අතර තුර ගිරිධාරි ලාල්ට ඇය 'බාබා' යයි ඇමතීමට පටන්ගෙන තිබුණි.

"අනේ පව්. බාබා හරි අසරණයි. බාබාට සාත්තු කළාට සල්ලි ගන්න පුළුවන්ද? දෙවියන් බුදුන් නැද්ද?"

තුවාල සුවවූ පසු කාත් කවුරුවත් නැති ගිරිධාරි ලාල්ට නොමිළයේ ඉඩමක් ලබා දී ලොබ්ටුලියාවේ පදිංචි කරවීම මා ජීවිතයේ කර ඇති සත් කාර්‍යයන් කිපය අතරින් එකකි.

පසු දිනක මම ඔහුගේ පැල්පතට ගියෙමි

මා දුන් ඉඩම් කැබැල්ල එළි පෙහෙළි කොට ඔහු තිරිඟු සිටුවා තිබිණි. පැලපත වටේට ඔහු වැල් දෙහි වැල්වගයක් වගාකර තිබිණ.

"මෙච්චර දෙහි පැල මොකටද ගිරිධාරි ලාල්?"

"සර් ඕවා සරුවත් හදන දෙහි. මං ඒවා බොන්න හරි ආසයි. සිනි, සූකිරි එහෙම අපට ලැබෙන්නේ නෑ. සරුවත්වලට පැණි දාලා ගත්තම හරි අපූරුයි."

බලාපොරොත්තුවේ ආලෝකයෙන් ගිරිධාරි ලාල්ගේ දෑස් දීප්තිමත් වී ඇති බව මම දුටුවෙමි.

"හුඟ දවසක ඉඳලා මං හිතාගෙන හිටියේ වගා කරන්න තැනක් ලැබුණොත් ඔය ජාතියේ දෙහි පැල ටිකක් හිටවන්න ඕනෑ කියලා. අනුන්ගේ දෙහි ඉල්ලන්න ගිහින් මං කී පාරක් බැණුම් අහලා තියෙනවද? මීට පස්සේ නම් කාගෙන් වත් බැණුම් අහන්න වෙන්නේ නෑ."

18

මට වත්තෙන් පිටවී යාමට කාලය පැමිණ තිබේ. පිටත්ව යාමට පෙර හාතුමති හමුවී යා යුතු යැයි මට සිතිණ. ධංජරී පර්වත මාලාව සුන්දර සිහිනයක් සේ මගේ සිත අරක්ගෙන තිබිණ. ඒ අසලවූ වනාන්තරයත්. සඳ පහනින් එළියවූ රාත්‍රියත් මට නිතර සිහි විය.

මම යුගල ප්‍රසාද්වද ගමනට එක්කර ගතිමි. යුගල ප්‍රසාද්, බදු නිලධාරී සජ්ජන් සිංගේ අශ්වයා පිට නැංහේය. අපේ වතු යායේ මායිම පසු කරන විටම ඔහු මට මෙසේ කීවේය.

"සර්. මේ අශ්වයා එක්ක නම් යන්න බැරිවෙයි. කැලෑ පාරේ හයියෙන් යන කොට ඇදගෙන වැටෙන්නත් පුළුවන්. මගේ කකුලුත් කැඩෙයි එහෙම උනොත්. මං මූව දිලා වෙන එකෙක් අරන් එන්නම්."

සජ්ජන් සිං හොඳ අශ්වාරෝහකයකු බවත් ඔහු කීප වරක්ම පූර්ණියා උසාවියට නඩු සඳහා පෙනී සිටීමට ගියේ අශ්වයා පිට බවත් මම ඔහුට කීවෙමි. පූර්ණියා නගරයට යන මාර්ගය කෙබඳු එකක්දැයි යුගල ප්‍රසාද් දැන සිටින්නට ඇත.

අපි ඉක්මනින් කාරෝ නදිය පසු කළෙමු.

ඉන් පසු දිගටම හමු වූයේ ජනශූන්‍ය අපූරු සුන්දර වනාන්තරයයි. ඒ වනාන්තරයේ ගස් වැල් ඝනට එකට වෙළී තිබුණේ නැති බව කලින්ද සඳහන් කළෙමි. කේංද්, සල්, කැල, මී, මසං, ආදී ගස්වලින් යුතුවූ ඒ වනභූමිය උස් සහ පහත් බිම් වලින් සැදුණු එකක් විය. තැනින් තැන වල් අලින්ගේ අඩි සලකුණු අපට හමු විය. මිනිසුන්ගේ සලකුණක් වත් එහි නොවිය.

ලොබ්ටූලියාවේ අලුතින් තනන ලද, අපිළිවෙළට පිහිටියාවූද, අවලස්සන වූද, ජනපද ඒකාකාරී වූ කෙත් බිම් පසු කර වනගත පරිසරයට පැමිණි විට මට දැනුණේ සහනයකි. මෙවැනි වනයක් ලොබ්ටූලියාවේ නොවිය.

දහවල් දොළහවන විට අපි 'බුරුඩි' සහ 'කුලපාල්' යනුවෙන් හැඳින්වුණු වන ගම් දෙකක් පසු කළෙමු. එළිමහන් ස්ථාන පසු කළ විට අපට විශාල වනස්පතින්ගෙන් යුතුවූ ඝන වනාන්තරයක් හමු විය. ඉල් මස අග භාගය බැවින් සීතල සුළඟක්ද හැමීය. මඳ රස්නයක් වත් අපට දැනුණේ නැත. මඳ වේලාවකින් ඈත පිහිටි ධංජරී පර්වත පෙළ පැහැදිලිව දිස්වන්නට විය.

බීඩි සඳහා කොළ ගන්නා ගස් සහිත කැලය අපි කලින් වෙන්දේසි කළෙමු. වෙන්දේසියෙන් එය ලබාගත් තැනැත්තාට අයත් වූ කාර්‍යාලයක් එහි විය. රෑ බෝවන විට අපි එතැනට ළඟා වූයෙමි. අබ්දුල් වහිද් නම් මුස්ලිම් ජාතිකයෙක් එහි සිටියේය. ශාහබාද් දිස්ත්‍රික්කයේ කෙනෙක් වූ ඔහු මහත් සැලකිල්ලෙන් අපව පිළිගත්තේය.

"මේ වෙලාව වෙන කොටවත් මෙහෙ ආපු එක හොඳයි මහත්තයා. රෑ වුනාට කැලේ කොටි ඉන්නවා."

එය පාළු රාත්‍රියක් විය.

විශාල ගස්වල අතු කොළ සොලවමින් සුළං හැමීය.

අබ්දුල්ගේ කථාව ඇසූ පසු පිලේ හිඳගෙන සිටීමට සිත් දුන්නේ නැත.

අප ජනේලය හැර ගෙතුළ හිඳගෙන කථා කරමින් සිටියෙමු. හදිසියේ වන සතකු කෑගසන හඬක් ඇසිණ.

"ඒ මොකෙද්ද?" මම යුගල ප්‍රසාද්ගෙන් ඇසුවෙමි.

"ඒ වෙන මොකෙක්වත් නොවෙයි. වෘකයෙක්."

තවත් වරක් හයිනාවෙකුගේ සිනා හඬක් ඇසිණ. කාස රෝගියෙකුගේ සිනාවක් මෙන් වූ එය හදිසියේ ඇසෙන විට සිරුරේ ලේ මිදෙන තරම් බියක් ඇති වේ.

පසු දින පාන්දර නැගිට නැවත ගමන් ඇරඹූ අපි උදේ නවය වන විට දෝබරු පන්නාගේ රාජධානිය වන චක්මකිටෝලාවට ළඟා වූයෙමු. අපගේ බලාපොරොත්තු රහිත ආගමනය නිසා හාතුමතී සතුටින් ඉපිළී ගියාය. ඇගේ මුහුණෙන්ද දැසින්ද සන්තෝසය ඉහ වහා ගිය බවක් පළවිය.

"ඊයෙත් මට මහත්තයා මතක් වුණා. මෙච්චර කාලයක් ආවේ නැත්තේ ඇයි මහත්තයා?"

හානුමතී පෙරට වඩා උස ගොස් සිටියාය. ඇය මදක් කෙට්ටුව සිටි අතර ඇය වෙතින් පලවූ ලාවණ්‍යමය මනබඳන සුළු සුන්දරත්වය එලෙසම විය.

මහත්තයා දොළෙන් නානවද? නාන්න ඉස්සෙල්ලා ඇහේ ගාන්න මීතෙල් ගේන්නද? අබ තෙල් ගේන්නද? වැස්සට වතුර පිරිලා දොළ හරි ලස්සනයි."

හානුමතී සාංචනාල් කුලයේ ගැහැණු ළමයින්ට වඩා පිරිසිදුව හැඳ පැළඳ සිටියාය. ඇය හැඳ පැළඳ සිටි ආකාරයෙන් පළවූ සෞන්දර්‍යය පිළිබඳ වූ සහජ රුචිකත්වය, ඇය රජ පෙළපතකින් පැවත එන කෙනෙකු බව ප්‍රකට කළේය.

අප සිටි නිවස වටේ විශාල ලෙස වැඩුණු ආසාන් සහ කුඹුක් ගස් විය. කොළ පැහැති ගිරා රංචුවක් ගස්වල අතු මත නිද නද දෙන්නට වූහ. එය හේමන්තයේ මුල් භාගය වූ බැවින් සවස් වන විට සීතල සුළං හමන්නට විය. ඉදිරියේ වූ ධංජරී පර්වත පෙළ අප සිටි තැනට සැතපුම් භාගයකටත් වඩා අඩු දුරකින් පිහිටියේය. පර්වතවල සිට එන අඩි පාර අප සිටි තැනට පැහැදිළිව පෙනිණ. ඉතා ඈත වූ ගසා දිස්ත්‍රික්කයේ කඳු පෙළ නිල් වළාකුළු පෙළක් සේ දිස්විය.

බීඩි සඳහා කොළ ගන්නා ගස් සහිත භූමි භාගයක් බද්දට ගෙන ඒ ශාන්ත පරිසරයේ වූ පල්ලවයෙන් වැසුණු මිටියාවත කෙළවර දිය ඇල්ලක් අයිනේ කුටියක් තනා ගෙන ම්ය යන තුරු පදිංචි වී සිටින්නට මට සිතිණ. ලොබ්ටූලියාවේ මෙන් ඒ පළාතේ වනය විනාශ කිරීමට කිසිවකු නොඑනු ඇත. එහි වැලි සහ බොරළු සහිත පයිරයිට් බහුල පසෙහි ධාන්‍ය හොඳින් නොවැඩේ. එසේ නොවන්නට ඒ වනාන්තරය විනාශ වී යන්නේ මීට කලින්ය.

අපේ පළාතේ කර්මාන්ත ශාලා අසල පරිසරය මට සිහිවිය. එය දුම් කවුළු, ට්‍රොලි රථ ගමන් ගන්නා මාර්ග, කුලිකරුවන්ගේ මුඩුක්කු පේළි, අපිරිසිදු දිය සහිත කානු, ගල් අඟුරු ගොඩවල්, කඩ පේලි, තේ කඩ, (ජවානී භවා' ශේශ් ශම්ශේර්, ආදී චිත්‍රපට ලාභයට පෙන්වන, මැටිනි දර්ශන සඳහා ඇනා තුන බැගින් අය කරන) චිත්‍රපට ශාලා, රා කඩ, ට්ලර් සාප්පු, දිළිඳු රෝගීන් සඳහා නොමිළේ බෙහෙත් දෙන හොමියෝපති බෙහෙත් ශාලා, හින්දු හෝටල් ආදියෙන් සමන්විත පරිසරයකි.

දුම්රිය එංජිමකින් ඉවත දැමූ ගල් අඟුරු කුඩයක් පුරවා' හිස මත තබාගත් හානුමතී ඒවා විකිණීම සඳහා කඩපොළට ගෙන යන අයුරු මගේ සිතේ මැවී ගියේය." ගල් අඟුරු, ගල් අඟුරු. කුඩයක් පයිසා හතරයි."

* * * * * *

හානුමතී තෙල් රැගෙන පැමිණ මා ඉදිරියේ සිට ගත්තාය. ඇගේ නිවසේ අනික් සාමාජිකයෝද පැමිණ ආචාර කොට අප වටා සිටියෝය. හානුමතීගේ බාප්පා කෙනෙකු වන තරුණ ජගරූ අතු කැබැල්ලක් පොතු අරිමින් පැමිණ මා සමග සිනාසුණේය. ඒ තරුණයාට මම ඉතා ප්‍රිය කළෙමි. කළු පැහැ වුවත්, රජ කුමාරයෙකුට සරිලන දැකුම් කළු මුහුණක් ඔහු සතු විය. හානුමති හා ජගරූ දකින කෙනෙකුට මොවුන් සුවිශේෂ වූ පෙළපතකට අයත් අය යයි නොසිතා සිටීමට නොහැකිය.

"කොහොමද ජගරූ? දඩයම් එහෙම සරුද?"

ජගරූ සිනාසුණේය.

"මහත්තයලට දෙන්න අදත් දඩ මස් ගේන්නම්. මහත්තයා මොන මස්වලටද කැමති? ඉත්තෑ මස්, කොබෙයි මස්, වලි කුකුල් මස්, මේ ඕනෑ එකක් ගේන්නම්."

අපි දොළට ගොස් නාගෙන ආවෙමු. මා පූර්ණියා නගරයෙන් ගෙන්වා දුන් කණ්ණාඩියත්, හිස පිරිම සඳහා ලී පනාවකුත් හානුමතී ගෙනැවිත් දුන්නාය.

ආහාර ගැනීමෙන් පසු මා විවේක ගනිමින් සිටියදී හානුමතී පැමිණ කථා කළාය.

"මහත්තයා කන්දට නගින්නේ නැද්ද? මහත්තයා ආසයි නේද එහේ යන්න?"

නිදා සිටි යුගල ප්‍රසාද් අවදි වූ විට කන්ද පැත්තේ ඇවිදීම පිණිස පිටත්වූයෙමි. හානුමතීද, ඇයගේ ඥාති සොහොයුරෙක්ද, ජගරූ පන්නාගේ සොහොයුරාගේ දොළොස් හැවිරිදි වූ දියණියක්ද, යුගල ප්‍රසාද්ද, මා සමග ගමනට එකතු වූහ.

අපි සැතපුම් භාගයක් දුර ඇවිද කන්ද පාමුලට පැමිණියෙමු.

ධංජරි පර්වතය පාමුල සිට බලන විට වනයේ දර්ශනය කෙතරම් අපූරු දැයි කිවහොත් එහි නැවතී බලා සිටීමට කෙනෙකුට

සිතේ. බලන බලන පැත්තේ දිස් වූයේ වෘක්ෂ ලතාදියත් ගල් බොරළුවලින් ගහන දොළ පාරවලුත්, තැන තැන විසිරුණු ලොකු කුඩා ගල් පර්වතය. ධංජරී පර්වතයටත් වනයටත් මුවා වී ආකාශයෙන් පටු තීරයක් පෙනෙන්නට විය. රතු බොරළු සහිත අඩි පාරක් වනය මැදින් පර්වතය දෙසට වැටී තිබුණේය. අඩි පාරේ කොතැනක වත් තෙත් සහිත පසක් නොතිබිණ. දියපාරක් අසල තිබුණත් ඒ පස වියළි විය.

අපි වනය මැදින් කන්දේ තරමක් ඉහළට නැගෙන විට හමා ආ කිසියම් මිහිරි සුවඳකින් සිත පිනා ගියේය. එය මට ඉතා හුරු පුරුදු සුවඳක් වුවත් මුලින්ම මට එය කුමක්දැයි හඳුනා ගැනීමට නොහැකි විය. පසුව ධංජරී පර්වතයේ රුක් අත්තන ගස් දුටු විට ඒ රුක් අත්තන මල් සුවඳ බව මට සිහිවිය. කලින් වතාවේදී ඒවා මගේ නෙතට හමු නොවීය. හේමන්තය ආරම්භ වෙත්ම ඒ ගස්වල මල් හටගෙන තිබුණු හෙයින් අපට දැනුණේ ඒ සුවඳයි.

එහි වූයේ රුක් අත්තන ගස් එකක් නොවේ. එය සප්තපර්ණී නමින් හැඳින්වෙන රුක් අත්තන වනාන්තරයකි. එහි බක්මී ගස්ද විය. තේක්ක ගස්වල පත්‍ර මෙන් විශාල වූ කොළ සහිත ඒ ගස් අපූරු අතු කොළ සහිතව උස්ව වැඩී තිබිණ.

හේමන්ත සන්ධ්‍යාවක සිහිල් සුළං විදිමින් පුෂ්පිත සප්තපර්ණී තුරු වදුළක හිඳින නව යොවුන් වියේ සිටි සෞඛ්‍ය සම්පන්න හානුමති දෙස බැලූ විට මට ඇය වන දෙවිලියක් සේ පෙනුණි. ඒ වනගත පළාතත්, කඳුත්, මිඡී නදිය හා කාරෝ නදිය බැස යන මිටියාවතත්, ධංජරී පර්වතයත්, නවාදාවේ පර්වත පෙළත්, එක් සමයක මොවුන්ගේ රාජධානියට අයත්ව තිබිණ. ඇය එවැනි පෙළපතක රජ කුමරියකි. මේ වන විට වෙනත් යුගයක, විපරීත වූ ශිෂ්ටාචාරයකට මුහුණ දී රජ පෙළපත දිළිඳු වී ප්‍රභා රහිත තත්වයට පත්වී තිබිණ. හානුමති සංවනාල් කෙල්ලක් සේ දිස් වුවත් ඇය දකින විට ලේඛනගත නොවූ භාරතීය ඉතිහාස කථාවේ එක් කණගාටුදායක පරිච්ඡේදයක් මා ඉදිරියේ මැවී පෙනේ.

ඒ සන්ධ්‍යාව මට පෙරදින දී හමු වූ තවත් සුන්දර සන්ධ්‍යා භාගයන් සමග මුසුවී මිහිරි මතකයකින් වර්ණවත් වී ගියේය. එය සිහිනයක් සේ මධුර විය. සිහිනයක් සේම අස්වාභාවික ද විය.

"ඇයි තව උඩහට නගින්නේ නැද්ද?"

"අපූරු මල් සුවඳක් දැනෙනවා නේද? මෙතැන ටිකක් ඉඳගෙන ඉර බැහැගෙන යන හැටි බලමුද?"

හානුමති සිනාසුණේය.

"මහත්තයගේ කැමැත්තක්. ඉඳගන්න කියනවා නම් ඉඳ ගන්නම්. ඒ වුනාට සීයාගේ සොහොනට මල් තියෙන්නේ නැද්ද? මහත්තයනේ මට එහෙම කරන්න කියලා කියලා දුන්නෙත්. මං හැමදාම කන්දට නගිනවා සොහොනේ මල් තියන්න. මේ දවස්වල කැලේ මල් හරියට පිපෙනවා."

ඈත පර්වතයක් පාමුලින් මිඡී නදිය උතුරු දෙසට හැරී ගලා බසිනු පෙනිණ. නවාදාව පැත්තේ වූ නොපැහැදිලි කඳු පෙළ පිටුපසින් හිරු අවරට යමින් පැවතිණ. හමන සුළඟ ක්‍රමයෙන් සිතල ගතියක් ගෙන ආවේය. රුක් අත්තන මල්වල සුවඳ නවත් තදින් දැනෙන්නට විය. වනයෙන් වැසුණු මිටියාවත සහ මිඡී නදියේ එහා ඉවුරේ වූ පර්වත පේළිය පැත්තේ සෙවණැලි ඝන වෙමින් පැවතිණ.

හානුමති රුක් අත්තන මල් පොකුරක් කඩා ගෙන හිසේ ගසා ගත්තාය.

"ඉඳගෙන හිටියා ඇති නැගිටින්න මහත්තයා." ඇය කීවාය.

අපි නැව වරක් කන්දට නගින්නට පටන් ගනිමු. හැම කෙනෙකුගේම අතේ රුක් අත්තන මල් රිකිළි විය. අපි පර්වතය මතට නැග ගතිමු. පැරණි නුග ගසත්, රජ වරුන්ගේ ස්මාරකත් ඇති තැනට අපි ළඟා වූයෙමු. විශාල කුරහන් ගල් මෙන් වූ ගල් හැම තැනම ගොඩකර තිබිණ. දෝබරූ පන්නා රජුගේ සොහොන මත හානුමති හා ඇගේ ඥාති සොහොයුරිය මල් තැබුවෝය. යුගල ප්‍රසාද් සහ මමද ඒ මත මල් තැන්පත් කළෙමු.

හානුමති කුඩා දැරියක සේ සතුටින් සිටියාය.

"මෙතැන ටිකවේලාවක් ඉඳිමු මහත්තයා. කොහොමද මෙතැන? හරි හොඳයි නේද?"

එහි පැමිණෙන අවසන් වාරය එය බවත් මට නැවත එහි ඒමට නොලැබෙන බවත් මට සිහිවිය. ඒ සොහොන් බිමත් වනගත පළාතත් මට නැවත දකින්නට නොලැබෙනු ඇත. ධංජරී පර්වතය මත සුපුෂ්පිත වූ සප්තපර්ණී තුරු වදුලෙන්ද, හානුමතීගෙන්ද, සඳහටම සමු ගන්නට මට සිදුවේ. වසර හයක් දීර්ඝ වූ වනවාසී දිවිය අතහැර

කල්කටා නගරයට යාමට මට සිදුවී ඇත. වෙන්ව යාමේ දිනය ළං වෙත්ම මා මොවුන්ට වඩාත් ළං වන්නේ ඇයි?

හානුමතී සමග කථා කරන්නට මට සිතිණ. මා ආපසු නොඑන බව පැවසුවොත් ඇය කුමක් කියනු ඇත්දැයි දැනගැනීමට මා තුළ ආශාවක් ඇති විය. එනමුත් අහිංසක ගැමි කෙල්ලකට පලක් නැති දෙයක් ගැන කියා වැඩක් ඇත්ද?

රෑ බෝවත්ම තවත් සුවඳක් දැනෙන්නට විය. අප අසල සේපාලිකා ගස්වලින් සැදුණු තුරු වදුලක් විය. රෑ බෝවන විට සේපාලිකා මල් සුවඳ මඳ සුළඟට එක්වන්නට විය. ඒ ප්‍රදේශයේ රුක් අත්තන ගස් නිබුණේ නැත. රාත්‍රිය ළඟා වන විට පඳුරු මත කණු මැදිරි එළි දැල්වෙන්නට පටන් ගත්තේය. අවට වාතාවරණය ප්‍රබෝධමත් මිහිරි බවක් පළ කරන්නට විය. උදේ සවස, ඒ සුළඟ ගත දැවටේ නම් මිනිසාගේ ආයුෂ වර්ධනය නොවේද? ඉක්මනින් කන්දෙන් බැසයාමට මා තුළ කැමැත්තක් ඇතිවූයේ නැතත් වන සතුන්ගෙන් කරදර වීමට ඉඩ ඇති නිසාත්, හානුමතිලා කැඳවාගෙන ආ නිසාත් ඉක්මනින් ආපසු යා යුතුය. යුගල ප්‍රසාද් ඒ වනයෙන් අලුත් පැළෑටි වර්ග ගෙන ගොස් වෙනත් තැනක සිටුවීම පිළිබඳව කල්පනා කරමින් සිටිනවා විය හැක. ඔහුගේ සම්පූර්ණ අවධානය අලුත් අලුත් ගස් වැල්වල මල් සහ දැකුම් කලු පත්‍ර සහිත ශාක වර්ග ගැන යොමුවී නිබුණි. ඔහුට ඒ හැර වෙනත් දෙයක් පෙනුණේ නැත. යුගල ප්‍රසාද්ට ඇත්තේ වෙනත් අයට නැති අමුතු ආකාරයේ උමතුවකි.

නූර්ජහාන් පර්සියාවේ සිට කාශ්මීරයට චීන ශාක ගෙනවිත් රෝපණය කළා යයි කියනු ලැබේ. දැන් නූර්ජහාන් නැතත් මුළු කාශ්මීරයම සුන්දර වූ චීන ශාකවලින් ගහණ වී තිබේ. යුගල ප්‍රසාද් මිය ගොස් සිය වසක් ගත වුවද සරස්වතී වැව අසල හේමන්තයේදී පිපෙන 'ස්පයිඩර් ලිලී' මල්වල සුවඳ අවට වාතයට එක්වනු ඇත. කිසියම් පඳුරක එතී ගිය ලතාවක පරවියකුගේ හැඩය ගත් පරවි මල් පිපෙනු ඇත. යුගල ප්‍රසාද් ඒවා නාඨා බයිහාරයට උරුම කළ බව කිසිවෙකු හෝ පවසනු ඇත්ද?

"අර තියෙන්නේ ටාංඩිබාරෝගේ ගහ. මහත්තයට මතකද?" හානුමති ඇසුවාය.

අදුර නිසා මී ගවයින්ගේ ආරක්ෂකයාවූ ටාංඩිබාරෝගේ ගස මට හඳුනා ගත නොහැකි විය. එය අව පස සඳ ඇති රාත්‍රියක් විය.

පහළට බැස්ස විට මන් මත් කරවන සුවඳක් විහිදවූ සප්තපර්ණි තුරු වදුල නැවත හමු විය.

"මෙතැන ටිකක් නවතිමුද?" මම හානුමතිගෙන් ඇසුවෙමි.

පසුව ඒ කැලෑ පාර මැදින් පහළට බසින විට මට සිතුණේ මෙයයි. නාඨා සහ ථූලකියා බයිහාරය විනාශ වුවත් මහානිඛාරූප කන්දත්, හානුමතීලාගේ ධංජරී පර්වතය අසල වනයත් ඉතිරිවී තිබේ. ඉදිරි කාලයේ ඒ පළාතට එන මිනිසුන් ධාන්‍ය කුඹුර, හන කර්මාන්ත ශාලා, රෙදි නිෂ්පාදන කම්හල්වල දුම් කවුළු ආදිය හැර අන් කිසිවක් නොදකිනු ඇත. එවිට මිනිසුන් පූජා බිම්වලට වන්දනාවේ යන ආකාරයට මේ පාළු වනගත බිම්වලට එනු ඇත. මගේ පැතුම් නම් අනාගතයේදී මෙහි එන මිනිසුන් සඳහා වනාන්තරය විනාශ නොවී පවතිවා යන්නය.

* * * * * *

රාත්‍රියේදී ජගරූ පන්නා සහ ඔහුගේ වැඩිමහලු සොහොයුරාගෙන් ඔවුන් ගැන බොහෝ දේ කථා කර දැන ගතිමි. පොළී කරුවාගේ ණය තවමත් ගෙවා අවසන් වී නැත. ඔවුනට මී හරකුන් දෙදෙනෙකු විකිණීමට සිදුවිය. වෙළෙන්දෙක් ගිතෙල් මිලදී ගැනීමට ගයාවේ සිට එහි පැමිණීමට පුරුදුව සිටියේය. මාස තුන හතරකින් ඔහුද පැමිණියේ නැත. ගැනුම් කරුවකු නොමැති නිසා ගිතෙල් සෑහෙන ප්‍රමාණයක් ඉතිරිවී තිබේ.

හානුමතී පැමිණ පිලේ කොනක හිඳගත්තාය. යුගල ප්‍රසාද් තේ බීමට ඉතා කැමතිය. ඔහු තේ කොළ සහ සීනි ගෙනැවිත් ඇති බව මම දැන සිටියෙමි. තේ පිළියෙළ කිරීම සඳහා වතුර උණුකර දෙන්න යයි කීමට ඔහු ලැජ්ජාවෙන් සිටින බව ද දැන සිටියෙමි.

"හානුමති. තේ බොන්න වතුර ටිකක් උණු කරල දෙන්න පුළුවන්ද?" මම ඇසුවෙමි.

හානුමතිට තේ වත්කිරිමේ පුරුද්දක් නැත. එහි සිටින අයගේ තේ බීමේ සිරිතක්ද නොවීය. ඇයට වතුර උණු කරන ආකාරය කියා දුන් විට ඇය මැටි මුට්ටියක ජලය උණු කර ගෙන ආවාය. හානුමතීගේ බාල සොහොයුරිය මෘදු ගලින් සෑදූ භාජන කිපයක් ගෙන ආවාය. හානුමතීගෙන්ද තේ බොන ලෙස මා ඉල්ලා සිටියේය. ඇය ඊට කැමති වූයේ නැත. ජගරූ පන්නා ලොකු කෝප්පයකින් එකක් බී තවත් ටිකක් ඉල්ලාගෙන බීවේය.

තේ බිවූ පසු සියල්ලන්ම නැගිට ගියත් හානුමති ඉවත්ව නොගියාය.

"මෙහෙ කී දවසක් නැවතිලා ඉන්නවද මහත්තයා. මේ පාර ආවේ හුහ දවසකින් නේ. හෙට නම් ආපහු යන්න දෙන්නේ නෑ. හෙට මහත්තයව දිය ඇල්ල දිහාවේ එක්ක යන්නම්. ඒ පැත්තේ මහ රුස්ස කැලේ. වල් අලින් ඉන්නවා. මොණරු බලන්නත් පුළුවන් හරි අපුරු තැන. ආයිත් එහෙම තැනක් මේ පොළොවේ නම් දකින්න ලැබෙන්නේ නෑ."

හානුමති අප ජීවත්වන පෘථිවිය ගැන කොපමණ දුරට දනීදැයි දැනගැනීමට මා තුළ උනන්දුවක් ඇති විය.

"හානුමති නගරයක් දැකලා තියෙනවද?"

"නෑ මහත්තයා."

"නගර එකක දෙකක නම් කියන්න බලන්න."

"ගයා. පැට්නා, මුංගේර්."

"කල්කටාව ගැන අහලා නැද්ද?"

"අහලා තියෙනවා."

"ඒක තියෙන්නේ කොයි පැත්තෙද දන්නවද?"

"අපි දන්නේ කොහොමද ඒවා?"

"අපි ඉන්න රටේ නම කියන්න දන්නවද?"

"අපි ඉන්නේ ගයා දිස්ත්‍රික්කයේ."

"භාරත දේශය කියන නම අහලා නැද්ද?"

හානුමති නිස සොලවා නැතැයි හැඟවූවාය. ඇය චක්මකිටෝලාවෙන් එහාට ගමන් කර නැත. ඇය ටික වේලාවකට පසු මෙසේ කීවාය.

"අපේ සීයා එක පාරක් මී දෙනක් ගෙනාවා. ඌ දෙවේලට කිරි සේරු තුන බැගින් දුන්නා. ඒ කාලේ අපට මීට වැඩිය හොඳයි මහත්තයා. ඒ කාලේ මහත්තයා ආව නම් හැමදාම මුදවාපු කිරි දෙන්න තිබුණා. සීයා තමයි කිරි මුදවන්නේ. ඒවා හරි රසයි. දැන් ඒ වගේ කිරිත් නෑ. මුදවාපු කිරිත් නෑ."

ඇය අත ඔසවා අවට පරිසරය පෙන්වා ගර්වයෙන් යුතුව කතා කළාය.

"දන්නවද මහත්තයා. කාලයක් මේ පළාතම අපේ රාජධානිය. මුළු පොළොවම අපේ. ඔය කාලේ ඉන්න ශෝංඩි කුලේ අයත්

සංතාල් කුලේ අයත් අපේ කට්ටිය නෙවෙයි. අපි රාජ වංශයේ ඒ ගොල්ලො අපිව රජවරු කියලා සලකනවා."

ඇයගේ කථාව ඇසූ මා තුළ කණගාටුවක් ඇති විය. සිනාද පහළ විය. පොළී කරුවාගෙන් ලබා ගත් ණයවත් ගෙවා ගැනීමට නොහැකි සිටියදී රාජ වංශයේ උදාරම් කම ගැන කීමට ඇය අමතක නොකළාය.

"මං දන්නවා හානුමති ඔයගොල්ලෝ උසස් වංශයක කියලා....."

"ඉතින් මහත්තයා. මං අර කිව්ව මී දෙන කොටියෙක් අරං ගියානේ."

"ඒ කොහොමද?"

"සීයා ඌට තණකොළ කවන්න දවසක් අර කන්ද පාමුලට එක්ක ගිහින් ගහක් යට ඉඳගෙන ඉඳලා තියෙනවා. එහේදී තමයි කොටියා මී දෙනව ඩැහැගෙන ගිහින් තියෙන්නේ?"

"හානුමති කොටියෙක් දැකලා තියෙනවද?"

හානුමතී පුදුමයට පත්ව ඇගේ කාලවර්ණ ඇහි බැම් යුගලය ඉහළට එසවුවාය.

"කොටියෙක් දැකලා නෑ?" සීත කාලෙට කොටියා මිදුලට ඇවිත් වහු පැටව් ඇදගෙන ගිහින් තියනවා. සීත කාලෙට එන්නකෝ චක්මකිටෝලාවට-------නිඡනී--------නිඡනී-------"

ඇය කථාව අතර මගදී නැගණියට කථා කළාය. ඇය ආවිට හානුමති මෙසේ කීවාය.

"නිඡනී මහත්තයට කියාපන් ගිය අවුරුද්දේ සීත කාලයේ හැමදාම රෑට කොටියෙක් අපේ මිදුලට ආපු හැටි. ජගරූ බාප්පා උගුලක් ඇටෙව්වා. ඒ වුනාට කොටියා අහුවුනේ නෑ."

"ආ. මට දැන් මතක් වුනේ. ලියුමක් කියවලා දෙනවද මහත්තයා. කොහෙන්දෝ අපට ලියුමක් ඇවිත් තියෙනවා. මෙහේ කියවන්න කෙනෙක් නැති නිසා අරන් තිබ්බා. නිඡනි ඒ ලියුම අරන් වරෙන්. ජගරූ බාප්පාවත් එක්ක වරෙන්."

නිජනිට ලියුම සොයාගත නොහැකි විය. හානුමතී බොහෝ වේලාවක් ගත කොට එය සොයාගෙන ආවාය.

"කවදද මේක ආවේ?"

"මාස හයක් හතක් වෙනවා මහත්තයා. අපි ඒක අරන් තිබ්බා. මහත්තයා ආවාම කියව ගන්නම් කියලා. අපි කවුරුවත් අකුරු

දන්නේ නැනේ. නිජනි ජගරූ බාප්පාව එක්ක වරෙන්. ලියුම කියවනවා කියලා අනිත් අයටත් එන්න කියාපන්."

මාස හයක් හතක් තිස්සේ නොකියවන ලද ලිපිය යුගල ප්‍රසාද් විසින් දල්වන ලද ළිපේ එළියෙන් කියන්න පටන් ගතිමි. නිවසේ සියල්ලෝම ලිපියේ ඇති දේ අසා දැන ගැනීමට මා වටා රැස්වී සිටියහ. ලිපිය ලියා තිබුණේ කායස්ථ හින්දි බසිනි. එය ලියා තිබුණේ දෝබරූ පන්නා රජුගේ නමටය. පැට්නාවේ ධනවතෙක්, බීඩි සඳහා කොළ ලබා ගන්නා ගස් සහිත කැලයක් ඔවුන්ට ඇත්ද යන්නත් එය බදු දීමට කැමතිද යන්නත් දෝබරූ පන්නාගෙන් විමසා තිබිණ.

ඒ ලිපියෙන් ඔවුන්ට කිසිම පලක් නැත. දැන් ඔවුන්ට අයිති බීඩි කොළ සහිත වනයක් නැත. දෝබරූ නාම මාත්‍ර රජෙකි. චක්මකිටෝලාවේ පදිංචිව සිටි කොටස ඇරෙන්නට වෙනත් ඉඩමක් ඔවුන්ට අයත් නොවන බව දැන සිටියා නම් පැට්නාවේ සිටි ධනවතා තැපැල් ගාස්තු ගෙවාගෙන නිකරුණේ ලිපියක් එවීමට අදහස් නොකරනු ඇත.

පිල් කොනේ ළිපක් තනා යුගල ප්‍රසාද් කෑම පිසිමින් සිටියේය. ළිපේ එළියෙන් පිලට මඳ එළියක් වැටුණි. පිලේ කොටසකට අවපස තෙවක් සඳෙහි එළිය වැටී තිබිණ. මඳ වේලාවකට කලින් සිට ධංජරි පර්වතයට ඉහළින් ළා සඳ පෙනෙන්නට විය. අප ඉදිරියේ අඩ සඳක ආකාරයට පිහිටි පර්වත පේළියක් විය. චක්මකිටෝලාවේ නිවෙස්වල සිට කුඩා ළමයින් කෑ කෝ ගසන හඬ ඇසෙන්නට විය. ඒ වනගත ගමේදී ගෙවූ රාත්‍රිය අපූරු එකක් සේ මට හැඟිණ. හානුමතිගේ සාමාන්‍ය වූද නොවැදගත් වුද කථාබස් ඇසීමෙන් පවා මට ලැබුණේ නොමද ආස්වාදයකි. දිනක් බලහද්‍ර විසින් පවසන ලද දියුණුවීමේ බලාපොරොත්තු පිළිබඳ කථාව මට සිහි විය.

මිනිසාට අවශ්‍ය වන්නේ කුමක්ද? දියුණු වීමද? සතුටක් ලැබීමද? සිතට සතුටක් නොලැබේ. නම් දියුණු වී කුමක් කරන්නද? ජීවිතයේ දියුණුවක් ලැබුවත් තමාගේ සතුට නැතිකර ගත් බොහෝ දෙනා ගැන මම දනිමි.

රස විඳීමේ ශක්තිය ගෙවී ගොස් මොටවී ඇති නිසා ඔවුන්ට ජීවිතයේ සතුටක් නොලැබේ. ඔවුන්ට ජීවිතය යනු ඒකාකාරී වුද, එකම වර්ණයෙන් යුක්ත වූද, අර්ථ හීන වුද එකකි. ඔවුන්ගේ මොටවූ හදවත්වල රස විඳීමේ ශක්තියක් නැත.

SL UNLIMITED The spirit of Sri Lankan e-community

මට ඒ ප්‍රදේශයේ නැවතීමට හැකි වුවහොත් හානුමතිව විවාහ කර ගනිමි. සඳ එළිය තැවරුණු මැටි පිලේ හිඳ කෑම පිසිමින් ඒ අහිංසක ගැමි යුවතිය මෙලෙසම බොළඳ කථා පවසනු ඇත. මම හිඳගෙන ඒවාට සවන් දෙන්නෙමි. රාත්‍රියට වල් අලින්ගේ කෑංචි නාදයත්, හයිනාවන්ගේ සිනා හඬත්, මට ඇසෙනු ඇත. හානුමති කළු පැහැති වුවත් ඇය මෙන්වූ සෞඛ්‍ය සම්පන්න හුරු බුහුටි ගැහැනු ළමයෙකු බෙංගාලයේදී පහසුවෙන් සොයා ගත නොහැක. ඇයගේ ප්‍රබෝධමත් අහිංසක හදවතේ දයාව කරුණාව හා සෙනේහය නොඅඩුව ඇති බව දැක ඇත්තෙමි. එය කෙතරම් සුන්දර සිහිනයක් ද? ඒ ගැන සිතීම පවා ප්‍රිය උපදවන කරුණකි. දියුණු වීමෙන් කුමන ඵලයක්ද? බලහද්‍ර, රාස බිහාරි සිං වැනි අයට උවමනා නම් දියුණු වෙද්දෙන් යයි මම සිතුවෙමි.

කෑම පිළියෙළ කර අවසන් වූ බැවින් කෑම බෙදන්නදැයි යුගල ප්‍රසාද් මගෙන් විමසීය. හානුමතිලාගේ නිවසේ අමුත්තන්ට කිසිම අඩුවක් නැතිව සලකනු ලැබේ. ඒ පළාතේ එළවළු සොයා ගත නොහැකි වුවත් ජගරූ කොහෙන්දෝ අල සහ වම්බටු සොයාගෙන ආවේය. පරිප්පුද, කුරුලු මස්ද, මී කිරිද, මී කිරිවලින් තැනූ ගිතෙල්ද, භෝජනයට ඇතුළත් විය. යුගල ප්‍රසාද්ගේ ඉවුම් පිහුම් රසවත් විය.

හානුමති, ජගරූ, ජගරූගේ අයියා, නිජනි යන සියල්ලන්ටම යුගල ප්‍රසාද් පිළියෙළ කළ කෑම කෑමට මම ආරාධනා කළෙමි. මා එසේ කළේ මෙවැනි කෑම කෑමට ඔවුන්ට නොලැබෙන නිසාය. යුගල ප්‍රසාද්ට කෑම බෙදීම පහසුවනු පිණිස ඔවුන්ටද අප සමග හිඳගන්නට යයි මම කීවෙමි.

ඔවුහු එයට එකඟ නොවූහ. අප කෑම ගෙන අවසන්වන තුරු කෑම නොගන්නා බව ඔවුහු පැවසූහ.

පසු දින ආපසු වත්තට යද්දී හානුමති මගේ අත අල්ලාගෙන "අද නම් යන්න දෙන්නෙම නෑ මහත්තයට" යයි දැඩි ලෙස කියා සිටියාය.

මම පුදුමයට පත්ව ඇගේ මුහුණ දෙස බලා සිටියෙමි. මා තුළ ඇය ගැන දුකක් ඇති විය.

ඇයගේ බලවත් ඉල්ලීම නිසා අපට උදෑසනම එතැනින් පිටත් වීමට නොහැකි විය. එදින දහවල් ආහාරයද ගත් පසු අපි ඔවුන්ගෙන් වෙන්ව ආවෙමු.

* * * * * *

නැවත වරක් සෙවණැලිවලින් පිරුණු වනාන්තරය අපට හමු විය. අප ආ පසුද භානුමති කුමරිය මා දෙස බලා සිටින්නට ඇත. භානුමති නම් බාලිකාව නොව භානුමති නම් යුවතිය ගැන මම සිතුවෙමි.

අනාගතයේ දිනයක ඇගේ ආදරවන්තයා එනතුරු ඇය බලාපොරොත්තු සහගත බැල්මෙන් බලා සිටිනු ඇත. සමහර විට ඔහු කන්දෙන් එහා වනාන්තරයට දඩයමේ ගොස් සිටින්නට ඉඩ තිබේ. මම ඇයට සිතින් ආශිර්වාද කළෙමි. ධංජරී කන්දේ කණුමැදිරි එළි දැල්වෙන,නිහඬ, සප්තපර්ණි මල් වනය අසල ගෙවෙන අපූරු සන්ධ්‍යාවන්හිදී ඇගේ පෙම් පැතුම් ඉටුවේවා යයි මම පැතුවෙමි.

එහි සිට පැමිණ සතියක් ඇතුළත මම ලොබ්ටූලියාවේ වෙසෙන සියල්ලන්ගෙන්ම සමු ගත්තෙමි.

ආපසු එන විට රාජු පාංඩේ, ගනෝරි, යුගල ප්‍රසාද්, අස්රජි ආදිහු මා පැමිණි පල්ලැකිය වටකර ගෙන ලොබ්ටූලියාවේ පිහිටි මහාරාජ්ටෝලා නම් නව ජනපදය දක්වා පැමිණියහ.

"තමුන්නාන්සේ යන්න ගියාම මුළු ලොබ්ටූලියාවම පාළු වෙලා යයි." රාජු පැවසීය.

මා පිටත්ව එද්දී ගැහැනියක් හැඬුවාය. ඇය උදේම පැමිණ කායශ්‍යාලය මිදුලට වී සිටියාය. මගේ පල්ලැක්කිය ඔසවද්දී ඇයගේ දෑසින් කඳුළු ධාරා ඇද හැලුණි. ඒ ගැහැනිය කුන්තාය.

අසරණ කුන්තාට ඉඩමක් දී එහි පදිංචි කරවීම, මා වතු කළමණාකරුවකු වශයෙන් ගෙවූ කාලයේ සිදු කළ දානමය පුන්‍ය කර්මයකි. මංචිට කිසියම් උපකාරයක් කිරීමට මට නොහැකි විය. ඒ අවාසනාවන්තිය කිසිවකු විසින් රැවටනු ලැබුවාය. ඇය සිටියා නම් ඇයටද උපකාරයක් කිරීමට මට හැකි වනු ඇත.

නාඨා බයිහාරයේ මායිමේදී නක්ෂේදිගේ නිවස දකින විට මට ඇය නැවත වරක් සිහිවිය. සූරතියා ගෙයින් පිටත වැඩක් කරමින් සිටියාය. මගේ පල්ලැකිය දැක ඇය කෑ ගැසුවාය.

"මහත්තයා. මහත්තයා. පොඩ්ඩක් ඉන්න."

ඇය දිව අවුත් පල්ලැක්කිය අසල සිටගත්තාය. ඇය පිටුපසින් ජනියාද පැමිණියාය.

"මහත්තයා කොහේද යන්නේ?"

"හගර්පූර්වලට. කෝ ඔයගොල්ලන්ගේ නාත්තා?"

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

"ජල්ලු ටෝලාවට ගියා තිරිඟු ඇට ගේන්න. මහත්තයා කවදද ආපසු එන්නේ?"

"ආයිත් එන්නේ නෑ."

"ආ. යන්න. ඔය කියන්නේ බොරු."

නාඨා බයිහාරයේ සීමාව පසු කරද්දී මම හිස පිටතට දමා පිටපස බැලුවෙමි.

මගේ නෙත ගැටුණේ එකින් එක යාව පිහිටි පැල්පත්ය. මිනිසුන්ගේ කථා බහද දරු දැරියන්ගේ සිනා හඬද හා කෑකෝ ගැසීම්ද මට ඇසුණි. ගව මහිෂාදීන්ද ධාන්‍යාගාරද මගේ නෙතට හසු විය. ඝන වනාන්තර එළි පෙහෙළි කොට අවුරුදු හයක් ඇතුළත ධාන්‍යවලින්ද අඩුවක් නැති සිනා හඬින් පිරුණු ජනපදයක් ඇති කිරීමට වැඩ කටයුතු සංවිධානය කළේ මමයි.

"තමුන්නාන්සේ පසුගිය කාලේ කරපු වැඩ කොටස දැකලා අපි පුදුම වුණා මහත්තයා. නාඨා බයිහාරයේ ලොබ්ටූලියාව ඉස්සර තිබුණු විදියයි දැන් තියෙන විදියයි බලන්න." ඊයේ පැමිණි බොහෝ දෙනා එසේ කීවෝය.

මම ඒ ගැන කල්පනා කරමින් සිටියෙමි. නාඨා බයිහාරයේ පෙර තිබුණු ආකාරය, දැන් තිබෙන ආකාරය සමග සැසඳුවෙමි.

දිගන්තය දක්වා විහිදුණු මහාලිඛාරූප කඳු වැටියටත් මෝහනපුරා වනයටත් මම දුරින් සිට හිස නමා ආචාර කළෙමි.

ආරණ්‍යයට අරක් ගත් දෙව් දේවතාවනි, මා කළ වරදට මට සමාව දෙනු මැනවි! ඉතින් ඔබ සැමට ආයුබෝවන්!

* * * * * *

එයින් පසු බොහෝ කලක් , එනම් වසර පහළොවක් පමණ ගතවිය.

මම කොට්ටම්බා ගස අසල හිඳ මේ ගැන කල්පනා කරමින් සිටියෙමි.

සවස් වී ගෙන ආවේය.

මතකයෙන් ඇත්වීගෙන යන නාඨා බයිහාරයේ හා ලොබ්ටූලියාවේ වන ගත මිටියාවත මගේ අනුදැන්ම ඇතිව විනාශ වී ගියේය. සරස්වතී වැව අසල වූ ඒ අපූරු තුරු වදුළු පිළිබඳ මතකය සිහින ලෙසින් පැමිණ මා දුකට පත් කරයි. කුන්තා දැන් කෙසේ සිටීද, සූරතියා දැන් කොපමණ වැඩී ඇද්ද, මටුකනාථගේ පාසල තවමත්

පවත්වාගෙන යනවාද, භානුමති ගල්පර්වතවලින් වටවූ වනාන්තරයේ කුමක් කරනු ඇද්ද, රාඛාල් බාබුගේ බිරිඳ, ධ්‍රැවා, ගිරිධාරි ලාල් යනාදීහු කුමන තත්වයක සිටින්ද යනාදී දේ මට සිහිවෙයි.

වරින්වර මට මංචි ගැනද සිහිවේ. පසුතැවිල්ලට පත් මංචි නැවත ඇගේ සැමියා ළඟට එන්නට ඇද්ද? එසේ නැතිනම් ඇය ඇසෑමයේ තේ වත්තක තේ දළු නෙළනු ඇත්ද? ඔවුන් ගැන තොරතුරක් නොදැන මේ වන විට කොපමණ කලක් ගතවී ඇත්ද?

(සමාප්තයි)

SL UNLIMITED
The spirit of Sri Lankan e-community
Only From
SL-UNLIMITED.COM

SL-UNLIMITED
The spirit of Sri Lankan e-community

Only From
SL-UNLIMITED.COM

විභූතිභූෂණ බන්දෝපාධ්‍යාය

අරණ්‍යකට පෙම් බැඳ

වංගබසින් සිංහලයට නැඟුවේ

චින්තා ලක්ෂ්මී සිංහආරච්චි

මිනිසා හා පරිසරය අතර තිබෙන්නාවූ
ආධ්‍යාත්මික සබඳතාව හා එහි අසිරිය
පරිපූර්ණ අයුරින්ද ළඟන්නා සුළු රිද්මයකින්ද
මේ රමණීය ගද්‍ය කාව්‍යයෙන් වර්ණිතය.

විභූතිභූෂණ සිංහල පාඨකයා අභිමුවට
පැමිණියේ මාවතේ ගීතය. අපරාජිත පිළිනයක්
හා අපුගේ ලෝකය නම් වූ නවකතාත්‍රයෙන්.
එම කෘති සිංහලයට නැඟූ චින්තා ලක්ෂ්මී සිංහආරච්චියගේ
තවත් විශිෂ්ට පරිවර්තනයක් ලෙස
"අරණ්‍යකට පෙම් බැඳ" හැඳින්විය හැකිය.

ISBN 955 - 96254 - 2 - X

පිටකවරය කරුණාසිරි විජේසිංහ

දයාවංශ ජයකොඩි සහ සමාගම
[illegible]

රු. 220/-